අපගේ යුතුකම ඉටු කරමින්...

ප්‍රතිඥා ගරු කොට...
ඔබ හදට සුහදව

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

වාර්ෂික වාර්තාව 2020

අපගේ යුතුකම ඉටු කරමින්...

ප්‍රතිඥා ගරු කොට... ඔබ හදට සුහදව

මෑත කාලීන ඉතිහාසය තුල පැන නැගුණු අන් කිසිදු සිදුවීමකටත් වඩා ගෙවුණු වසර තුලදී කොවිඩ්-19 රෝග තත්ත්වය විසින් ජන ජීවිතය සහ ව්‍යවසාය පරිවර්තනයකට ලක් කරන ලදී.

පවතින තත්ත්වය තුල සිය ගනුදෙනුකරුවන් වෙත උපරිම සහයෝගය ලබාදීම සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය භූමිකාව මැනවින් ඉටු කිරීමට උත්සුක විය. අපගේ බැංකු සේවා හා නිමැවුම් ගනුදෙනුකරුවන්ගේ දොරකඩ වෙත රැගෙන යාම උදෙසා විවිධ පියවර රැසක් ක්‍රියාත්මක කරන අතරතුර රට පූර්ණ වශයෙන් වසා තැබුණු පසුබිමක වුවද අපගේ ශාඛා ජාලයේ සියළුම ශාඛා ඔස්සේ බැංකුව හා අපගේ නිමැවුම් වෙත ප්‍රවේශ වීමට ගනුදෙනුකරුවන්ට අවස්ථාව සලසා දීමට අපි කටයුතු කළෙමු. ගැටළු හා අවදානම නොතකා මෙවැනි පියවර සාර්ථකව ක්‍රියාවට නංවමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සමස්ථ කාර්ය මණ්ඩලය මෙම අභියෝගයට මුහුණ දුන් ආකාරය ප්‍රශංසනීය වන අතර ඔවුන්ගේ ප්‍රයත්නය අගය කළ යුතුය.

අප ලබාදුන් ණය පහසුකම් වලින් 90% කට වැඩි ප්‍රමාණයකට ණය සහනය හිමිකරදීම අප ගනුදෙනුකරුවන් ශක්තිමත් කිරීමට කටයුතු කළ බව විදහා දක්වන තවත් සාධකයකි. අපගේ තැන්පතු පදනම හා ණය කළඹ ආශ්‍රිතව අප ලැබූ ඉහළ වර්ධනය නිසාම ගනුදෙනුකරුවෝ අපගේ ශක්තිය කෙරෙහි විශ්වාසය තැබූහ.

මෙම "කොවිඩ්-19" සමය තුල ගනුදෙනුකරුවන් හා බැංකුව අතර ඇති සබඳතාවය, අපගේ නිමැවුම් හා සේවා සැපයීම කෙරෙහි ඇතිවිය හැකි බලපෑම අවම කිරීමට උපකාරී වන අයුරින් බැංකුව ඩිජිටල් බැංකුකරණය සම්බන්ධයෙන්ද වැඩිදුර ප්‍රගතියක් ළඟා කරගැනීමට සමත් විය.

එළඹෙන 2022 වර්ෂයේදී බැංකුව සිය 50 වන සංවත්සරය සමරන අතර අනාගතයේදී බැංකුව අභිමුවට පැමිණෙන නව ගනුදෙනුකරුවාගේ හා මෙරට ආර්ථිකයේ අවශ්‍යතා සපුරාලිය හැකි ආකාරයෙන් ව්‍යාපාරය වර්ධනය කරගැනීමට අප සූදානම්ව සිටින බව අපි තරයේ විශ්වාස කරමු.

දුන් ප්‍රතිඥා ගරු කරමින් හා අපගේ ගනුදෙනුකරුවන්ගේ හදවතට සමීප වෙමින් අපි අපගේ යුතුකම අඛණ්ඩව ඉටු කරමු.

NSB

පටුන

04

දළ විශ්ලේෂණය

වැදගත් තොරතුරු – **04**

සභාපතිතුමියගේ පණිවිඩය – **06**

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය – **08**

මෙහෙයුම් පරිසරය – **11**

උපායමාර්ග සහ සම්පත් වෙන්කිරීම – **19**

මූල්‍ය ප්‍රාග්ධන සමාලෝචනය – **24**

39

පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය – **40**

ආයතනික කළමනාකාරිත්වය – **45**

විධායක කළමනාකාරිත්වය – **46**

ප්‍රධාන කළමනාකරුවන් – **48**

ආයතනික පාලනය – **49**

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව – **78**

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව – **80**

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව – **82**

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව – **84**

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු වාර්තාව – **86**

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටු වාර්තාව – **88**

අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටු වාර්තාව – **90**

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය – **92**

අපගේ දැක්ම

ඔබගේ ඉතිරිකිරීම් සඳහා වඩාත් විශ්වසනීය හා වැඩිම ඉල්ලුමක් පවතින විකල්පය බවට පත්වීම.

අපගේ මෙහෙවර

ගනුදෙනුකරුවන්ගේ ඉතුරුම් හා ආයෝජන අවශ්‍යතා ප්‍රශස්ත ලෙස සපුරාලීමට අවශ්‍ය පරිපූර්ණ මූල්‍ය විසඳුම් සැපයීම හා බැංකුව පිළිබඳ උනන්දු වන සියළුම පාර්ශවයන්ගේ අපේක්ෂාවන් මුදුන් පැමිණවීම.

පටුන

115

මූල්‍ය වාර්තා

මූල්‍ය දින දර්ශන – **116**

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව – **117**

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය – **123**

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය – **125**

අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකවීමේ වාර්තාව – **127**

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (මුදල් හා සැලසුම්) වගකීම පිළිබඳ ප්‍රකාශය – **128**

විගණකාධිපති වාර්තාව – **130**

මූල්‍ය ප්‍රකාශ වල අන්තර්ගතය – **133**

ආදායම් ප්‍රකාශය – **134**

විස්තීරණ ආදායම් ප්‍රකාශය – **135**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය – **136**

හිමිකමේ වෙනස්වීමේ ප්‍රකාශය – **138**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය – **142**

මූල්‍ය ප්‍රකාශ වලට අදාළ සටහන් – **144**

283

අතිරේක තොරතුරු

ආදායම් ප්‍රකාශය - ඇමරිකානු ඩොලර් වලින් – **284**

විස්තීරණ ආදායම් ප්‍රකාශය - ඇමරිකානු ඩොලර් වලින් – **285**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - ඇමරිකානු ඩොලර් වලින් – **286**

2016 අංක 1 දරණ බැංකු පනත් නියාමනයේ III උපලේඛනය ප්‍රකාර බාසල් III හෙළිදරව්කිරීම් – **287**

දේශීය පද්ධති අනුව වැදගත් බැංකු තක්සේරු කිරීමේ ක්‍රියාකාරකම - 2020 – **301**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතා – **303**

සංඛ්‍යාලේඛනාත්මක දර්ශක 2011 – **310**

අනුරූප බැංකු – **312**

විදේශ විනිමය හුවමාරු සමාගම් – **313**

යුරෝජයිරෝ සාමාජිකත්වය – **315**

ආයතනික තොරතුරු – **316**

අපගේ වටිනාකම්

අපි ව්‍යාපාර කටයුතු මෙහෙයවීමේදී දැඩි විශ්වාසය, අන්‍යෝන්‍ය ගරුත්වය, අවංකභාවය සහ නිර්මාණශීලීත්වය කෙරෙහි තීරණාත්මකව ප්‍රතිචාර දක්වන්නෙමු.

වැදගත් තොරතුරු

වැදගත් මූල්‍ය තොරතුරු

වගුව 01

	බැංකුව			සමූහය		
	2020	2019	වෙනස %	2020	2019	වෙනස %
වර්ෂය සඳහා ප්‍රතිඵල (රු. මිලියන)						
දළ ආදායම	**127,547**	121,929	4.61	**130,039**	125,810	3.36
මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදුකරණයට පෙර ලාභය	**19,431**	15,659	24.09	**20,798**	18,487	12.50
බදුකරණයට පෙර ලාභය	**15,645**	10,462	49.54	**16,791**	13,092	28.26
ආදායම් බදු වියදම්	**5,537**	4,080	35.69	**5,970**	4,379	36.34
බදුකරණයට පසු ලාභය	**10,108**	6,381	58.40	**10,821**	8,713	24.20
වසර අවසානය වන විට මූල්‍ය තත්ත්වය (රු. මිලියන)						
කොටස්කරුවන්ගේ අරමුදල් (මුළු හිමිකම්)	**51,897**	45,925	13.00	**57,449**	49,382	16.34
අනෙකුත් ගණුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු/ ගනුදෙනුකරුවන්ගේ තැන්පතු වලින්	**1,237,124**	1,016,574	21.70	**1,237,669**	1,015,635	21.86
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය සහ වෙනත් උපකරණ (දළ)	**798,916**	647,777	23.33	**816,029**	662,272	23.22
දළ ණය සහ ලැබිය යුතු දෑ	**525,787**	458,662	14.63	**528,405**	462,440	14.26
මුළු වත්කම්	**1,363,808**	1,157,967	17.78	**1,383,221**	1,175,575	17.66
සාමාන්‍ය කොටස් මත තොරතුරු (රු.)						
ඉපයුම් (මූලික)	**10.75**	6.79	58.40	**11.51**	9.27	24.20
ඉපයුම් (diluted)	**10.75**	6.79	58.40	**11.51**	9.27	24.20
ශුද්ධ වත්කම් වටිනාකම	**55.21**	48.86	13.00	**61.12**	52.53	16.34
අනුපාතික (%)						
ශුද්ධ පොලී ආන්තිකය (NIM)	**2.77**	2.63	5.32	**2.83**	2.65	6.80
සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ආදායම (ROE)	**20.67**	14.25	45.07	**20.26**	18.52	9.36
සාමාන්‍ය වත්කම් මත ආදායම (ROA)	**1.24**	0.95	30.15	**1.31**	1.18	11.62
ඉපයීම් වල වර්ෂ අනුරූප වර්ධනය	**58.40**	41.80	39.72	**24.20**	93.61	(74.15)
ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාතික (%)						
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් - අවම අවශ්‍යතාවය 20%	**69.10**	60.2	14.78	**N/A**	N/A	–
රුපියල - අවම අවශ්‍යතාවය (2020 - 90%, 2019 - 100%)	**311.02**	278.12	11.83	**N/A**	N/A	–
සියළු මුදල් ඒකක - අවම අවශ්‍යතාවය (2020 - 90%, 2019 - 100%)	**307.22**	276.64	11.05	**N/A**	N/A	–
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතිකය - අවම අවශ්‍යතාවය (90%)	**168.54**	175.18	(3.79)	**N/A**	N/A	–
ව්‍යවස්ථාපිත ප්‍රාග්ධන අවශ්‍යතා - බාසල් III (%)						
ස්ථර - 1 - අවම අවශ්‍යතාවය (2020 - 8%, 2019 - 8.5%)	**13.65**	13.49	1.16	**15.57**	15.37	1.30
සමස්ත ප්‍රාග්ධනය - අවම අවශ්‍යතාවය (2020 - 12%, 2019 - 12.5%)	**16.45**	15.82	3.95	**18.30**	17.74	3.16
ද්‍රවශීලතා අනුපාතිකය - අවම අවශ්‍යතාවය (3%)	**6.64**	5.76	15.35	**7.21**	6.16	17.05

මූල්‍ය ඉලක්ක සහ ජයග්‍රහණ - බැංකුව

මූල්‍ය දර්ශකය	ඉලක්ක	ජයග්‍රහණය				
		2020	2019	2018	2017	2016
ශුද්ධ පොලී ආන්තිකය (%)	2.65	**2.77**	2.63	2.43	2.61	2.89
සාමාන්‍ය වත්කම් මත ආදායම ROA (%)	0.95	**1.24**	0.95	0.78	1.47	1.51
සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ආදායම ROE (%)	15.82	**20.67**	14.25	10.95	27.24	29.37
ආදායමේ වර්ධනය (%)	2.76	**4.61**	8.96	3.62	23.57	10.24
වර්ෂය සඳහා ලාභයේ වර්ධනය (බදු පසු ලාභය)	6.86	**58.40**	41.80	(53.68)	2.30	9.52
සමස්ත වත්කම් වල වර්ධනය (%)	14.22	**17.78**	11.68	2.56	10.89	7.50
ප්‍රාග්ධන අවශ්‍යතා - බාසල් III						
ස්ථර - 1 - අවම අවශ්‍යතාවය (2020 - 8%, 2019 - 8.5%)	8% හෝ ඊට වැඩි	**13.65**	13.49	13.08	11.93	11.31
සමස්ත ප්‍රාග්ධනය - අවම අවශ්‍යතාවය (2020 - 12%, 2019 - 12.5%)	12% හෝ ඊට වැඩි	**16.45**	15.82	15.90	15.31	13.86

වැදගත් තොරතුරු

ශුද්ධ පොලී ආදායම



ශුද්ධ පොලී ආන්තිකය



බදු පෙර ලාභය



සමස්ත වත්කම්



සමස්ත තැන්පතු



ණය හා අත්තිකාරම්



දළ අක්‍රීය ණය අනුපාතිකය



වත්කම් මත ප්‍රතිලාභ



හිමිකම් මත ප්‍රතිලාභ



ආදායමට සාපේක්ෂව වියදම් අනුපාතිකය



සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය



● සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය
○ අවම අවශ්‍යතාවය

ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය



● ද්‍රවශීලතා ආවරණ අනුපාතය (සියළුම මුදල්)
○ අවම අවශ්‍යතාවය

රූපසටහන 01

සභාපතිතුමියගේ පණිවිඩය

2020 වර්ෂයේදී සමස්ත ලෝකවාසීන්ට මහත් ව්‍යසනයකට මුහුණදීමට සිදුවිය. 2019 වසර අගභාගයේදී හිස එසවූ කොවිඩ්-19 වෛරසය, සමාලෝචනයට ලක්කෙරෙන වසරේ අවසානය වන විට ලොව පුරා සීඝ්‍රයෙන් පැතිර ගොස් මිනිසා මෙතෙක් මුහුණ නොදුන් ආකාරයේ වසංගතයක් බවට පත් විය. 2021 වසරේ මාර්තු මාසය වන විට වෛරසය ආසාධිත ජනගහනය මිලියන 115 ක්වූ අතර මිලියන 2.5 ක් මියගොස් තිබේ. මෙම වසංගත තත්ත්වය මත ලෝකව්‍යාප්ත ආර්ථික අවපාතයක් නිර්මාණයවූ අතර 2019දී එල්ලවූ පාස්කු ඉරිදා ප්‍රහාරය හේතුවෙන් ඒ වන විටත් දුෂ්කර කාල සීමාවක් පසුකර සිටි මෙරට ආර්ථිකයද එහි බලපෑමට නතු විය. 2020 පළමු කාර්තුව තුළදී මෙරට ආර්ථිකය 1.8% න් සංකෝචනය වීමෙන් පසුව දෙවන කාර්තුවේදී ශ්‍රී ලංකාව මෙතෙක් මුහුණදුන් විශාලතම ආර්ථික සංකෝචනය වාර්තාවූ අතර එහි අගය 16% ක් විය. කෙසේවුවත්, දෛනික ක්‍රියාකාරකම් නැවතත් සාමාන්‍ය තත්ත්වයට පත්වීමත් සමග තෙවන කාර්තුවේදී මෙරට ආර්ථිකය 3.1% න් වර්ධනය වෙමින් ආර්ථිකය යහපත් වන ලකුණු පෙනිණ. එම හිතකර ලකුණු මධ්‍යයේ වුවද වසර අවසානය වන විට මෙරට ආර්ථිකය 3.6% න් සංකෝචනය විය. සැබවින්ම එය අප රටට දුෂ්කර වසරක්වූ අතර ඉදිරි කාලයද බෙහෙවින් අභියෝගාත්මක වන බව නිසැකය.

මෙම අර්බුදකාරී වාතාවරණය තුල අපගේ අනන්‍යතාවය හා මෙහෙවර සමගින් අපි ඉදිරියට පැමිණියෙමු. සිය 50 වන වසර සම්පූර්ණ කරන ආයතනයක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව මෙරට විශාලතම හා සුරක්ෂිතම විශේෂිත බැංකුව ලෙස නැගී සිටී. එසේම, 100% ක සුවිශේෂී රාජ්‍ය ආරක්ෂාව හිමි දිවයිනේ එකම බැංකුවද ජාතික ඉතිරිකිරීමේ බැංකුව වේ. ඉතිරිකිරීමේ පුරුද්ද ප්‍රවර්ධනය කිරීම ඔස්සේ බැංකුව ධන උත්පාදනය දිරිමත් කරන අතර ජාතික පරිමාණයේ මූල්‍ය අතරමැදියෙක් ලෙස කටයුතු කරන අතරතුර එම ඉතුරුම් මෙරට ආර්ථික සංවර්ධනය සඳහා වන ආයෝජන කෙරෙහි ඵලදායීව යොමු කිරීමට උත්සුක වෙයි. ශ්‍රී ලංකාවේ විශාලතම නිවාස ණය සපයන්නන්ගෙන් කෙනෙකු ලෙස බැංකුව සිය දහස් ගණන් ගනුදෙනුකරුවන් හට ආර්ථික සුරක්ෂිතතාව හා සංචලතාව සඳහා මග විවර කරදෙමින් ජාතික නිවාස හිමිකාරීත්වය පුළුල් කිරීමට පහසුකම් සලසයි. බදු, අයබදු, ගාස්තු හා ලාභාංශ ලෙස මහා භාණ්ඩාගාරයට දක්වන දායකත්වය හා මෙරට දෙවන විශාලතම රාජ්‍ය සුරැකුම් හිමිකරු යන සාධකවලට අමතරව ජාතික ඉතිරිකිරීමේ බැංකුව රජයේ දිගු කාලීන යටිතල පහසුකම් හා සමාජ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති සඳහාද ඉහළ දායකත්වයක් සපයයි.

අපගේ අනන්‍යතාවය සකස් කරන මෙකී සුවිශේෂ ලක්ෂණ ආඩම්බරයට හේතුවකි. එහෙත් එම ආඩම්බරය පිටුපස තිබෙන්නේ රජයේ වැඩපිළිවෙල කෙරෙහි සහයෝගය දක්වමින් හා අපගේම මුලපිරීම් ඔස්සේ කොවිඩ්-19 වසංගත තත්ත්වයේ බලපෑමෙන් මෙරට ආර්ථිකය මුදාගැනීමෙහිලා අපගේ භූමිකාව ඉටුකිරීම වෙනුවෙන් අපගේ ගනුදෙනුකරුවන්, පාර්ශවකරුවන් සහ සමස්ත ජන සමාජය කෙරෙහි වන දැඩි වගකීමකි.

දූරදර්ශී ලෙස නියාමන අවශ්‍යතා ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකු ක්ෂේත්‍රයට පරිබාහිර වූ වසංගත තත්වය හමුවේ වුවද බැංකුවේ ප්‍රාග්ධන හා ද්‍රවශීලතා සීමා 2020 වසර මුළුල්ලේම නියාමන අවශ්‍යතාවයට වඩා ඉහළ මට්ටමක පවත්වා ගැනීමට බැංකුවට හැකිවිය.

සභාපතිතුමියගේ පණිවිඩය

කොවිඩ්-19 ව්‍යාප්තියේ බලපෑම පැවති පසුබිමක වුවද ශක්තිමත් හා ස්ථාවර කාර්යසාධනයක් වාර්තා කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවට හැකි විය. 2019 දෙසැම්බර් 31 දිනට රුපියල් ට්‍රිලියන 1.2 ක් ලෙස සටහන්වූ බැංකුවේ සමස්ත වත්කම් පදනම 17.8% ක වර්ධනයක් සමගින් 2020 දෙසැම්බර් 31 දිනට රුපියල් ට්‍රිලියන 1.4 ක් බවට පත් විය. 2019 වර්ෂයේ අගභාගයේදී රජය විසින් හඳුන්වාදෙන ලද ආර්ථික උත්තේජන මුලපිරීම් හේතුවෙන් 2020 වසර තුළදී බැංකුව එහි ඉතිහාසයේ මෙතෙක් වාර්තා කරන ලද ඉහළම බදු පෙර හා පසු ලාභය ළඟා කරගැනීමට සමත්විය. ඒ අනුව, බැංකුවේ බදු පෙර ලාභය 2019 වසරේදී සටහන්වූ රුපියල් බිලියන 10.5 ක අගයට සාපේක්ෂව 49.5% ක වර්ධනයක් සමග රුපියල් බිලියන 15.6 ක් බවට පත්විය. එහි ප්‍රතිඵලයක් ලෙස පෙර වර්ෂයේ සටහන්වූ රුපියල් බිලියන 6.4 ක අගයට සාපේක්ෂව 58.4% ක වර්ධනයක් සමගින් රුපියල් බිලියන 10.1 ක බදු පසු ලාභයක් වාර්තා විය. සමාලෝචනයට ලක් කෙරෙන මූල්‍ය වර්ෂය තුළදී ලාභාංශ වශයෙන් රුපියල් බිලියන 1.0 ක්ද ගෙවන ලදී.

අපගේ ගනුදෙනුකරුවන්ගේ සුරක්ෂිතභාවය හා ආරක්ෂාව, අප ආයතනයේ පදනම මෙන්ම අපගේ වටිනාකම් සැලැස්මේ ප්‍රධාන අංගය වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, අඛණ්ඩතාවය, නිවැරදි ආයතනික පාලනය, ඵලදායී අවදානම් කළමනාකරණය සහ ප්‍රාග්ධන හා ද්‍රවශීලතා කළමනාකරණය සමග ආචාරධර්ම වලට අනුකූලව අපගේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දීර්ඝ කාලීනව පවතින සංස්කෘතියක් බැංකුව සතුව තිබේ. සමාලෝචනයට ලක් කෙරෙන වර්ෂය තුළදී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, පැවති වසංගත තත්ත්වය හේතුවෙන් ඇතිවූ සීඝ්‍ර සමාජ ආර්ථික වෙනස්කම් කෙරෙහි අවධානය යොමු කරනු ලැබීම මෙන්ම නිසි මගපෙන්වීමක් හා අවබෝධයක් සපයනු ලැබීම අත්‍යවශ්‍ය කරුණක් විය. බැංකුව ක්‍රමිකව "නව සාමාන්‍ය" තත්ත්වයට අනුගත වන අතරතුර අභ්‍යන්තර පාලන හා නියාමන ප්‍රමිතීන්ට අනුකූලව සිදු වන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරන ලදී. ක්ෂේත්‍රයේ අවම අක්‍රිය ණය අනුපාතිකයකට හිමිකම් කියන ආයතනයක් ලෙස සහ බැංකුවේ විචක්ෂණශීලී අවදානම් අභිරුචියට අනුරූපව ඉහළ යන අක්‍රිය ණය කළමනාකරණය කරගැනීමෙහිලා අවශ්‍ය උපදෙස් හා නියාමනය ලබාදීම අධ්‍යක්ෂ මණ්ඩලයට ඉතා වැදගත් වේ.

දූරදර්ශී ලෙස නියාමන අවශ්‍යතා ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකු ක්ෂේත්‍රයට පරිබාහිර වූ වසංගත තත්වය හමුවේ වුවද බැංකුවේ ප්‍රාග්ධන හා ද්‍රවශීලතා සීමා 2020 වසර මුළුල්ලේම නියාමන අවශ්‍යතාවයට වඩා ඉහළ මට්ටමක පවත්වා ගැනීමට බැංකුවට හැකිවිය.

2021 වර්ෂයේදී සහ එළඹෙන වසරවලදී පශ්චාත් වසංගත තත්ත්වය තුළ මෙරට ව්‍යවසාය හා ව්‍යවසායකයන් යළි නගාසිටුවීම සඳහා වන රජයේ මුලපිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා වන මධ්‍යකාලීන උපායමාර්ගයක් කෙරෙහි අවධානය යොමු කිරීමට බැංකුව අපේක්ෂා කරන අතර එබැවින් අපගේ අරමුදල් සම්පාදන ප්‍රභව විවිධාංගීකරණය කරගැනීම සඳහා කටයුතු කෙරේ. සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළදී නිත්‍ය ණයකරයක් ඔස්සේ බැංකුව විසින් රුපියල් බිලියන 5.0 ක් උපයන ලදී. මෙම ස්වභාවයේ හා පරිමාණයේ දෙමුහුන් ණය උපකරණයක් ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළඳපොල තුල නිකුත් කෙරුණේ ඉතිරිකිරීමේ බැංකු ඉතිහාසයක ප්‍රථම වරට වේ. බැංකුවේ ස්ථර I ප්‍රාග්ධනය හා බැංකුවට යටිතල පහසුකම් සඳහා දිගු කාලීන අරමුදල් සම්පාදන හැකියාව මෙන්ම බැංකුවේ ශාඛා ණය ලබාදීමේ හැකියාව ඉහළ නැංවීමට මෙම නිකුතුව මගින් සම්පාදිත මුදල් ආධාර වනු ඇත. එයට අමතරව, එක්සත් ජනපද ඩොලර් මිලියන 35 ක ණය පහසුකමක් ලබාගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතු 2020 වසර තුළදී ආරම්භ කරන ලද අතර 2021 වර්ෂයේ මුල් භාගයේදී අවසන් වීමට නියමිතය. බැංකුව ඉක්‍රා ලංකා (ICRAA Lanka) ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයේ ත්‍රිත්ව "A" ණය ශ්‍රේණිගත කිරීම අඛණ්ඩව පවත්වාගැනීමටද සමත්වී තිබේ.

ඩිජිටල්කරණය බැංකුවේ අවධානය යොමු වන ප්‍රධාන ක්ෂේත්‍රයකි. වසංගත තත්ත්වය තුල ඩිජිටල් නිමැවුම් හා සේවා සඳහා පැවති ඉල්ලුම විසින් බැංකුවේ ඩිජිටල්කරණ පරිවර්තනය වේගවත් කරනු ලැබිණ. සමස්ත රටම හෝ යම් යම් ප්‍රදේශ අගුළු ලා පැවති අවස්ථාවලදී සිය නිවෙස් වල සුරක්ෂිතව හිඳිමින් අපගේ බැංකු සේවා අඛණ්ඩව ලබාගැනීමට අපගේ ඩිජිටල් නිමැවුම් භාවිත කිරීම ඔස්සේ ගනුදෙනුකරුවන්ට හැකියාව ලැබිණ. මේ තත්ත්වය මත ඩිජිටල්කරණ ක්‍රියාවලියට අදාළව වැඩි දියුණු කිරීම් සිදු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගන්නා ලද අතර ඉදිරි වර්ෂ වලදී අපගේ උපායමාර්ගය ඒ අනුව සකස් කිරීමට අපි කටයුතු කරන්නෙමු.

අප විශ්වාස කරන ආකාරයට අපගේ ඩිජිටල්කරණ ප්‍රතිඥාව හුදෙක් තාක්ෂණය සඳහා පවතින හා තාක්ෂණය පිළිබඳව කියවෙන්නක් නොවේ. අපගේ මෙහෙයුම් විධිමත් කිරීම, ඵලදායීතාවය ඉහළ නැංවීම සහ වියදම් කාර්යක්ෂමතාවය ළඟා කරගැනීම මගින් හිමිවන ප්‍රතිලාභයට වඩා අපගේ සන්නාමය ප්‍රවර්ධනය කරන මෙවලමක් ලෙස අපි ඩිජිටල්කරණය වෙත ප්‍රවේශ වන්නෙමු. ඒ, මූල්‍ය අන්තර්ග්‍රහණය හා ප්‍රජාතන්ත්‍රීයකරණය සඳහා වන උපකරණයක් වශයෙනි. ජංගම දුරකතනයේ ආගමනයත් සමග ඩිජිටල් අවකාශය තුළදී සමාජයේ තවත් ජන කාණ්ඩ සමග වැඩි වශයෙන් සම්බන්ධවීමට හා සම්බන්ධ කරගැනීමේ විභවතාවය පවතී. කුමන සමාජ ස්ථරයකට අයත් වුවද අපගේ සියළු පාර්ශ්වකරුවන්ට මේ වන විට ක්‍රියාවට නංවා තිබෙන සීඝ්‍ර තාක්ෂණික මුලපිරීම්හි ප්‍රතිලාභය ලබාගැනීම සඳහා අවස්ථාව ලබාදෙමින් අප විසින් සකස් කරනු ලබන ඩිජිටල් වටිනාකම් සැලැස්මෙහි, ඩිජිටල්කරණ ප්‍රවේශය පිළිබඳව පවතින මෙම ගැටළුව කේන්ද්‍රස්ථානය බවට පත්ව තිබේ.

එළඹෙන වසර තීරණාත්මකය. අපගේ ගනුදෙනුකරුවන්ට අත්වැලක් වන බවත් මෙරට ආර්ථිකය යළි නගා සිටුවීමෙහිලා දායකත්වය සැපයීමක් ලෙස අපගේ ණය හා ආයෝජන වර්ධනය වේගවත් කරගන්නා බවත් සහතික කිරීම සඳහා අපි රජය හා නියාමන ආයතන සමග සමීපව කටයුතු කරන්නෙමු. අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය මධ්‍යයේ වුවද වර්ධන අවස්ථා ඉලක්ක කරගැනීම සහ අපගේ ගනුදෙනුකරුවන්ගේ අභිලාෂ මල්ඵලගැන්වීම සඳහා අපගේ ශේෂ පත්‍රය ශක්තිමත්ව පවත්වා ගැනීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය අඛණ්ඩව අවධානය යොමු කරනු ඇත. අවදානම් හා ආයතනික පාලන පරිසරය සීඝ්‍රයෙන් වෙනස් වෙමින් තිබෙන අතර ආයතනික චර්යාව සන්නිරීක්ෂණය කිරීම ඉහළ යමින් තිබේ. ණය සහන කාලය අවසන්වූ පසු ක්ෂේත්‍රයේ සත්‍ය අක්‍රිය ණය තත්ත්වය විද්‍යමාන වන විට එළඹෙන වසරේදී අපගේ ණය ගුණාත්මකභාවය සහ අවදානම කළමනාකරණය කරගැනීම අපගේ ඉහළම ප්‍රමුඛතාවයක් බවට පත්වේ. ලාභ ආන්තික සංකෝචනය වන විට හා ක්ෂේත්‍රය වඩා තරඟකාරී වන විට අපගේ වටිනාකම් හා මෙහෙවර වෙනුවෙන් අඛණ්ඩව කැපවී කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. අප අදිටනින් යුතුව එළඹෙන වසරට මුහුණදෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලය ඒ සඳහා මනා නායකත්වයක් සැපයීමෙහිලා ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරනු ඇත.

බෙහෙවින් අභියෝගාත්මකවූ ගෙවුණු වසර තුළදී ලබාදුන් සහයෝගය සහ දැක්ම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ මාගේ හිතවත් සාමාජිකයන්ට කෘතඥතාව පළ කරමි. 2020 වසරේදී අපගේ ආයතනික කළමනාකාරීත්ව කණ්ඩායම හා කාර්යමණ්ඩලය විසින් හිතෛෂීභාවය හා කැපවීම යන්නෙහි සැබෑ අර්ථය මේ යයි ප්‍රකට කරමින් කටයුතු කරනු ලැබූ ආකාරය ප්‍රශංසනීය වේ. දුෂ්කර හා අසීරු අවස්ථාවලදී අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා කෙරෙහි අඛණ්ඩව ප්‍රතිචාර දැක්වීමට ඔවුන් උත්සුකවූ අතර එය කවදත් අපට ආවේණික හා සුපුරුදු ගතිලක්ෂණයක් බව කිව යුතුය. සැබවින්ම අපගේ සාර්ථකත්වයේ පදනම අපගේ සේවක මඩුල්ල වන අතර 2021 වර්ෂයේදී සාර්ථකත්වය ළඟාකරගැනීමෙහිලා අප ඔවුන් කෙරෙහි පූර්ණ විශ්වාසය තබන්නෙමු. අපගේ ගනුදෙනුකරුවන්ටද මම බෙහෙවින් කෘතඥ වෙමි. ඔවුන් අප කෙරෙහි තැබූ අඛණ්ඩ විශ්වාසය අපගේ අරමුණ යලි යලිත් සනාථ කරයි.

අප වෙත ලබාදුන් අඛණ්ඩ සහයෝගය හා උපකාරය වෙනුවෙන් ගරු අග්‍රමාත්‍ය හා මුදල් අමාත්‍යතුමාට හා මුදල් සහ ප්‍රාග්ධන වෙළඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය සංශෝධන පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍යතුමා වෙත මාගේ කෘතඥතාව පළ කරමි, එසේම, කොවිඩ්-19 වසංගතය හා ඒ හේතුවෙන් පළමු වරට රට අගුළු ලන ලද දුෂ්කර කාල සීමාව තුළදී බැංකුවට නායකත්වය සැපයූ හිටපු වැඩ බලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, දමිතා රත්නායක මහත්මියට ස්තුතිය පළ කිරීමට මා මෙය අවස්ථාව කරගනිමි. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා හා නිළධාරීන් මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා හා නිළධාරීන් අප වෙත ලබාදුන් සහයෝගය හා මගපෙන්වීම මම බෙහෙවින් අගය කරමි. දීපව්‍යාප්ත තැපැල් කාර්යාල ජාලය ඔස්සේ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත ලබාදුන් දායකත්වය වෙනුවෙන් තැපැල්පතිතුමා හා තැපැල් දෙපාර්තමේන්තුවේ නිළධාරීන් වෙත මාගේ කෘතඥතාව පුද කරමි. ගරු නීතිපතිතුමා හා විගණකාධිපතිතුමාටද මම ස්තුතිවන්ත වෙමි.

කේෂිලා ජයවර්ධන

සභාපතිනිය

2021 මාර්තු 19

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

2020 වසර පුරා පැවති අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය මධ්‍යයේ නොවෙනස් කාර්යසාධනයක් වාර්තා කිරීමට බැංකුවට හැකිවූ අතර එය අපගේ සුවිශේෂී ශක්තියේ හා මෙහෙවරෙහි විශිෂ්ට පිළිඹිබුවකි. සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළදී බැංකුව එහි ඉතිහාසයේ මෙතෙක් වාර්තා කරන ලද ඉහළම බදු පෙර හා පසු ලාභය ළඟා කරගැනීමට සමත්වූ අතර 2019 වසරේදී සටහන්වූ රුපියල් බිලියන 10.5 ක අගයට සාපේක්ෂව 49.5% ක වර්ධනයක් සමග රුපියල් බිලියන 15.6 ක බදු පෙර ලාභයක්ද පෙර වර්ෂයේ සටහන්වූ රුපියල් බිලියන 6.4 ක අගයට සාපේක්ෂව 58.4% ක වර්ධනයක් සමගින් රුපියල් බිලියන 10.1 ක බදු පසු ලාභයක්ද වාර්තා විය. ශුද්ධ පොලී ආදායම 21% කින් ඉහළ යාම සහ ජාතිය ගොඩනැගීමේ බද්ද හා ණය ආපසු ගෙවීමේ අයබද්ද ඉවත් කිරීම, ඉහත ප්‍රගතියට හේතු විය. කෙසේවුවත්, මෙතෙක් වාර්තා කරන ලද ඉහළම ලාභය වාර්තා කරන ලද්දේ 2019 වර්ෂයේදී සටහන්වූ රුපියල් මිලියන 566 ක අගයට සාපේක්ෂව 761.8% ක වර්ධනයක් සමගින් රුපියල් බිලියන 4.9 ක අගයක් ගත් හානිකරණ වෙන්කිරීම් වලින් පසුව වේ. ණය හා අත්තිකාරම් කළඹෙහි පැවති ඉහළ අවදානම සහ බැංකු ක්ෂේත්‍රයේ වත්කම් වල ගුණාත්මකභාවය පහල යාම, ඉහළ අගයක් ගෙන තිබෙන හානිකරණ වෙන්කිරීම් මගින් පිළිබිඹු වේ.

බැංකුව වසර තුළදී රුපියල් බිලියන 221.9 ක තැන්පතු සංචලනයක් වාර්තා කළ අතර එය 2019 දී පැවති රුපියල් බිලියන 171.4 ක අගයට සාපේක්ෂව 29.5% ක වර්ධනයක් පෙන්නුම් කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ තැන්පතු පදනම රුපියල් ට්‍රිලියන 1.2 ක් බවට පත් විය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බැංකුවේ අභිමතාර්ථය මත සිදු කරන වියදම් පහළ යාම සහ පොලී අනුපාත පහළ යාම මධ්‍යයේ බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයේ සිට බැංකු ක්ෂේත්‍රය වෙත තැන්පතු සංචලනය වීම වාර්ෂික තැන්පතු සංචලනයේ ඉහළ වර්ධනයට හේතුසාධක විය. වත්කම් පදනමද 17.8% ක වර්ධනයක් සමගින් රුපියල් ට්‍රිලියන 1.4 ක් බවට පත් විය.

වත්කම් ප්‍රතිමිලකරණය වන කාලයට වඩා අඩු කාලයක් තුල වගකීම් ප්‍රතිමිලකරණය හේතුවෙන් බැංකුවේ ශුද්ධ පොලී ආදායම ඉහළ ගිය අතර ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම සම්බන්ධයෙන්ද වර්ධනයක් ළඟා කරගැනීමට බැංකුවට හැකි විය. බැංකුවට අවම පිරිවැය සහිත අරමුදල් සම්පාදන ප්‍රභවයක් වෙත ප්‍රවේශය ලබාදෙමින්, 2019 දී 21.5% ක් ලෙස සටහන්වූ සමස්ත තැන්පතු වලට ඉතුරුම් තැන්පතු අනුපාතිකය 2020 දී 22.6% ක් දක්වා ඉහළ යාම මඟින් තැන්පතු මිශ්‍රය ආශ්‍රිතව සිදු වූ වෙනස්කම් වල ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ ලාභදායීතාවය ඉහළ ගියේය.

ඉහත සඳහන් සංඛ්‍යා මගින් බැංකුවේ ශක්තිමත් කාර්යසාධනය පැහැදිලි වන අතර ඒ පිළිබඳව ගැඹුරින් විමසා බැලීමේදී වසර තුල පැවති වාතාවරණය සැලකිල්ලට ගත යුතුය. 2020 මාර්තු මස අගභාගයේදී කොවිඩ්-19 පළමු රැල්ල හේතුවෙන් රට අගුළුලන ලද අවස්ථාවේදී අපගේ ගනුදෙනුකරුවන්ට අඛණ්ඩ සේවාවක් සැපයීම සඳහා බැංකුවේ සියළු ශාඛා විවෘත කර තැබිණ.

බැංකුව එහි ඉතිහාසයේ මෙතෙක් වාර්තා කරන ලද ඉහළම බදු පෙර හා පසු ලාභය ළඟා කරගැනීමට සමත්වූ අතර 2019 වසරේදී සටහන්වූ රුපියල් බිලියන 10.5 ක අගයට සාපේක්ෂව 49.5% ක වර්ධනයක් සමග රුපියල් බිලියන 15.6 ක බදු පෙර ලාභයක්ද පෙර වර්ෂයේ සටහන්වූ රුපියල් බිලියන 6.4 ක අගයට සාපේක්ෂව 58.4% ක වර්ධනයක් සමගින් රුපියල් බිලියන 10.1 ක බදු පසු ලාභයක්ද වාර්තා විය.

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

එසේම, ගනුදෙනුකරුවන්ට සිය නිවසේදීම බැංකු සේවා සැපයීම සඳහා ජංගම බැංකු ඒකක තුනක්ද ක්‍රියාත්මක කරන ලදී.

වසර ගෙවී යන විට සිය ගනුදෙනුකරුවන්ට මූල්‍ය සහන හා ණය මුදල් අයකරගැනීමේදී සහන සැපයීම බැංකු ක්ෂේත්‍රයේ ප්‍රමුඛ කාර්යයක් බවට පත්වීමත් සමග බැංකුව සිය ගනුදෙනුකරුවන් සියළුදෙනාට (එවැනි සහන අවශ්‍ය නොවන බව විශේෂයෙන් සඳහන් කළ ගනුදෙනුකරුවන් හැර) ණය සහන හා ගෙවීම් සඳහා සහන කාල සීමා ලබා දුන් අතර එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ සමස්ත ශාඛා ණය කළඹෙන් 90% ක් ණය සහනය (7% ක සහන පොලී අනුපාතයක් හා ණය වාරික ආපසු ගෙවීමේ කාල සීමාව අවසානය දක්වා කල් දැමීම) මගින් ආවරණය කර තිබිණ. එසේම, කලින් ලබාගත් ණය මුදල් ආශ්‍රිත පොලී අනුපාතය අඩු කරන ලෙස ඉල්ලුම් කළ ගනුදෙනුකරුවන් සඳහා 10% ක් දක්වා පොලී අනුපාත අඩුකිරීම් පිරිනමන ලදී. මෙම සහන හේතුවෙන් බැංකුවට රුපියල් බිලියන 3.6 ක පොලී ආදායමක් අහිමි විය.

2020 වසර තුළදී බැංකුව 100,000 කට වැඩි ගනුදෙනුකරුවන් පිරිසකට රුපියල් බිලියන 124 ක සමස්ත වටිනාකමක් සහිත නිවාස හා පුද්ගලික ණය පහසුකම් ලබාදී තිබේ. ලබාදුන් ණය පහසුකම් සංඛ්‍යාව මෙන්ම මුළු ණය ප්‍රමාණය හා සම්බන්ධයෙන් මෙතෙක් වාර්තා කරන ලද ඉහළම වාර්ෂික ණය ලබාදීම එමගින් නියෝජනය වන අතර 2019 වර්ෂයේදී සටහන්වූ අගයන් හා සැසඳීමේදී එය 100% ක පමණ වර්ධනයකි.

එසේම, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව මෙරට ජනතාවගේ නිවාස හිමිකාරීත්වය පුළුල් කිරීම සඳහා අත්වැලක් සැපයීම අරමුණු කරගෙන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ස්ථිර සේවකයන් සඳහා 7% ක අවම පොලී අනුපාතයක් යටතේ බැංකුව විසින් විශේෂ ණය ක්‍රමයක් හඳුන්වාදෙන ලදී. ශ්‍රී ලංකා රජයේ 2021 අයවැය යෝජනාවක් අනුව අදාළ රාජ්‍ය ආයතන විසින් ඉදි කරනු ලබන නිවාස සංකීර්ණ වලින් නිවාස මිලදී ගැනීම සඳහා අවම පොලී අනුපාත යටතේ "සොඳුරු කැදැල්ල" නිවාස ණය ක්‍රමයද බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

රාජ්‍ය බැංකුවක් හා මෙරට විශාලතම හා සුරක්ෂිතම විශේෂිත බැංකුව ලෙස අපගේ ගනුදෙනුකරුවන්ට හැකි සෑම ආකාරයකින්ම උපකාර කිරීමෙහිලා වන අපගේ වගකීම ඉටුකිරීම සඳහා අප දැඩි ලෙස කැපවන බව ඉහත සඳහන් කළ අපගේ කාර්යසාධනය පිළිබඳ කරුණු ඔස්සේ මනාව පැහැදිලි වේ. එබැවින්, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තිරසාරභාවය පිළිබඳ අපගේ සංකල්පය අත්‍යවශ්‍යයෙන්ම පුළුල් හා විවිධ පැතිකඩ වලින් සමන්විත වූවක් වන අතර කෙටි, මධ්‍ය හා දිගු කාලයේදී වටිනාකම් නිර්මාණය කිරීම සඳහා වන අපගේ ව්‍යාපාර ආකෘතිය හා ආයතනික උපායමාර්ගය සමග දැඩි ලෙස බද්ධ වූවකි. අපගේ මෙහෙයුම් තුල සමාජයීය හා පාරිසරක යහපරිච ප්‍රවර්ධනය කිරීම එම සංකල්පය තුල ගැබ්ව තිබෙන අතර ජාතික මූල්‍ය අතරමැදියෙක් ලෙස බැංකුවේ භූමිකාව නිසි ලෙස අවබෝධ කරගැනීමේ අවශ්‍යතාවයද එමගින් ඉස්මතු කෙරේ.

මනා ප්‍රාග්ධන හා ද්‍රවශීලතා කළමනාකරණය; වගකීම් සහගත ණය ලබාදීමේ ක්‍රමවේද භාවිතයට ගැනීම; සාධාරණත්වය; විනිවිදභාවයෙන් හා අවංකභාවයෙන් යුතුව ව්‍යාපාරය පවත්වාගෙන යාම; විශේෂයෙන් බැංකු සේවා ලබානොගන්නා හා ප්‍රමාණවත් පරිදි බැංකු සේවා ලබානොගන්නා පිරිස් සඳහා සමාජ අන්තර්ග්‍රහණය (Social Inclusion) ප්‍රවර්ධනය කිරීම ඔස්සේ ඵලදායී සමාජයීය බලපෑමක් ඇති කිරීම; රජයේ මහා පරිමාණ ව්‍යාපෘති සඳහා දිගු කාලීන ණය සැපයීම යනාදිය අපගේ මූලික මෙහෙවරට අනුගත වෙමින් අපි පෙරටත් වඩා කැපවී කටයුතු කරන්නෙමු. ඒ අනුව, වසංගත තත්ත්වයේ බලපෑමෙන් පසු මෙරට ආර්ථිකය හා ජනතාවගේ ජීවන තත්ත්වය යළි ගොඩනැගීමෙහිලා වැදගත් භූමිකාවක් ඉටු කිරීම තිරසාරභාවය නමැති සංකල්පයෙන් අදහස් වන බව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අපගේ විශ්වාසයයි.

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළදී මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික ජලාපවාහන හා ජලසම්පාදන මණ්ඩලය සහ ලංකා විදුලිබල මණ්ඩලය යන ප්‍රමුඛ රාජ්‍ය ව්‍යවසායයන් වෙත යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා බැංකුව රුපියල් බිලියන 31.4 ක ණය මුදල් ප්‍රමාණයක් ලබාදී තිබේ. 2020 වසර තුළදී ක්‍රියාත්මක කරන ලද බැංකුවේ අරමුදල් සම්පාදන ප්‍රභව විවිධාංගීකරණය කිරීමට හේතුවූ තවත් මුලපිරීම් දෙකක් ඔස්සේ බැංකුව විසින් තවදුරටත් දිගුකාලීන ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමේ හැකියාව ළඟා කරගන්නා ලදී. පළමුව, බැංකුව විසින් රුපියල් බිලියන 5 ක නිත්‍ය ණයකරයක් නිකුත් කරන ලද අතර ස්ථර I ප්‍රාග්ධනය ඉහළ නංවාගැනීම ඔස්සේ සිය රාජ්‍ය මෙන්ම පුද්ගල ණය ලබාදීම් සඳහා වන විභවතාව වැඩි කරගැනීමට එමගින් බැංකුවට හැකියාව ලැබිණි. දෙවනුව, එක්සත් ජනපද ඩොලර් මිලියන 35 ක ණය පහසුකමක් ලබාගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතු 2020 වසර තුළදී ආරම්භ කරන ලද අතර 2021 වර්ෂයේ මුල් භාගයේදී අවසන් වීමට නියමිත එමගින් බැංකුවේ වත්කම් වර්ධනය ශක්තිමත් කෙරෙනු ඇත.

වසර තුළදී කොවිඩ්-19 ව්‍යාප්තියත් සමග දුරස්ථ බැංකුකරණයේ අවශ්‍යතාව මතුවූ පසුබිමක ගනුදෙනුකරුවන්ගේ සුභසිද්ධිය උදෙසා ඩිජිටල් තාක්ෂණය හා සම්බන්ධ ආයෝජන අඛණ්ඩව සිදුකෙරුණු අතර බැංකුවේ ඩිජිටල් සහ අනෙකුත් ඩිජිටල් බැංකුකරණ සේවා පෙර නොවූ විරූ අයුරින් පුළුල්ව භාවිතයට ගන්නා ලදී. ඒ සඳහා පැවති ඉහළ ඉල්ලුම හා ගනුදෙනුකරුවන් ඩිජිටල් නිමැවුම් හා සේවා වැඩි වශයෙන් භාවිත කිරීම මගින් ඊට අදාළව වැඩිදියුණු කළ යුතු අංශ හා අනාගත අවශ්‍යතා පිළිබඳව හඳුනාගැනීමට බැංකුවට අවස්ථාව සැලසිණ. විශිෂ්ට ගනුදෙනුකාර අත්දැකීමක් සහතික කිරීම යන්නෙන් අදහස් වන්නේ ගනුදෙනුකරුගේ අන්තයෙන් ආකර්ෂණීය හා ප්‍රබල ඩිජිටල් වේදිකා (powerful front-end digital platforms) සකස් කිරීම පමණක් නොවේ. ඒ හා බැඳුණු පසුපෙළ ක්‍රියාවලියද ස්වයංක්‍රීය හා විධිමත් තත්ත්වයට පත් කිරීමට ආධාර වන මුල සිට අග දක්වා ආවරණය වන (end -to-end solution) කාර්යක්ෂම ඩිජිටල් විසඳුමක් නිර්මාණය කිරීම එහි සමස්තය වේ. මේ වසරේ පැවති ආපදාකාරී වාතාවරණය යටතේ තවත් ප්‍රධාන පෙළේ වෙනස්කම් කිහිපයක් සිදු කිරීමට බැංකුවට හැකියාව ලැබුණු අතර 2021 වර්ෂය සඳහා ප්‍රධාන උපායමාර්ගික අරමුණු සතරක් සාක්ෂාත් කරගැනීම සඳහා මූලික කටයුතු සම්පාදනය කිරීමට බැංකුව විසින් මෙම අවස්ථාව උපයෝග කරගන්නා ලදී.

(අ) ක්ෂේත්‍රයේ හා නියාමන අවශ්‍යතා වලට අනුරූප වන ආකාරයේ සියළුම සේවා නැවත සැලසුම් කිරීම සමග නව මධ්‍යගත බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීම;

(ආ) දත්ත මධ්‍යස්ථාන සඳහා ලබාදෙන ජාත්‍යන්තර ප්‍රමිතිය වන TIA 942 (ස්ථර III) මත පදනම්ව නවීන දත්ත මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම. තොරතුරු තාක්ෂණය මගින් බලගන්වන ලද බැංකු සේවා වල විශ්වසනීයභාවය හා උපයෝජ්‍යතාවය වැඩිදියුණු කිරීමට හා එහි ප්‍රතිඵලයක් ලෙස ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය හා අභ්‍යන්තර සේවා වල විශිෂ්ටත්වය ඉහළ නැංවීමට එය උපකාර වනු ඇත.

(ඇ) ක්ෂේත්‍රයේ මුල් තැන ගන්නා ජංගම බැංකුකරණ යෙදවුමක් හඳුන්වාදීම.

(ඈ) පූර්ණ ස්වයංක්‍රීය සුරක්ෂිත ඩිජිටල් වේදිකාවක් ක්‍රියාත්මක කිරීම.

මෙම අරමුණු සතර සාක්ෂාත් කරගැනීම හා ඊට අනුරූපව අභ්‍යන්තර කුසලතා හා හැකියා සංවර්ධනය සමග බැංකුව ඩිජිටල් බැංකුකරණ අවකාශයේ ඉදිරියට පැමිණෙන අතර එහි සුවිශේෂී අනන්‍යතාවයෙහි ඵල නෙළා ගැනීමට බැංකුවට හැකියාවට ලැබෙනු ඇත. විවිධ හේතු රැසක් මත ශ්‍රී ලංකාවේ විවිධ ස්ථර හා භූගෝලීය ස්ථාන ආශ්‍රිතව ඩිජිටල්කරණයට අනුගතවීමේ ක්‍රියාවලියේ විවිධ වෙනස්කම් පවතී. ඩිජිටල් බැංකුකරණය ජනතාව අතර ප්‍රචලිත කිරීම බැංකුවේ අවශ්‍යතාවය වන අතර එය ක්‍රියාත්මක කිරීමෙහිලා තීරණාත්මක සාධකයක් වන්නේ ජනතාවට එවැනි වෙනසක් අවශ්‍ය බවත් එවැන්නක් පිළිබඳව ජනතාව විශ්වාස කරන බවත් හඳුනාගැනීමයි. දිවයිනේ බොහෝ ප්‍රදේශ වල ජනතාව බැංකු ශාඛාවක් හෝ සේවා කවුළුවක් සමග භෞතිකව සම්බන්ධවීමම ඩිජිටල් වෙනසකට අනුගතවීමේ මූලික ප්‍රථම පියවරක් ලෙස හඳුන්වාදිය හැකිය. දිවයින පුරා විසිරි ශාඛා, තැපැල් හා උපතැපැල් කාර්යාල, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සහ මුදල් ප්‍රතිචක්‍රීයකරණ යන්ත්‍ර (CRM) සහිත 4000 කට අධික සේවා කවුළු ජාලය සමග වැඩි වේගයකින් ඩිජිටල්කරණය වෙත පිවිසීමට බැංකුව සූදානම්ව සිටී.

සමාලෝචනයට ලක් කෙරෙන වර්ෂය තුලදී බැංකුවේ දත්ත මධ්‍යස්ථානයට ස්ථර III සහතිකකරණය (Tier III Certification) හිමිවූ අතර ඒ අනුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව එම සහතිකකරණය හිමිවූ මෙරට බැංකු ක්ෂේත්‍රයේ පළමුවැන්නා බවට පත් විය. ගනුදෙනු වල විශ්වසනීයත්වය හා වේගය ඉහළ නැංවීම හා බැංකුවේ දෛනික තොරතුරු තාක්ෂණ ගනුදෙනු සඳහා ශූන්‍ය කාල පරාසයක් පවත්වාගැනීම සඳහා වන ඉදිරි පියවරක් ලෙස එම දත්ත මධ්‍යස්ථානය හඳුන්වාදිය හැක. බැංකුවේ මධ්‍යගත බැංකු පද්ධතිය ඕනෑම වෙලාවක අපගේ ගනුදෙනුකරුවන්ට හා

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

කාර්යමණ්ඩලයට විවෘතව තැබීම ඔස්සේ එම සේවා වල උපයෝගීතාවය ඉහළ නැංවීමට ස්ථර III දත්ත මධ්‍යස්ථානය දායක වන බව අපේක්ෂා කෙරේ. ක්ෂේත්‍රය තුල පවතින අභියෝග වලට මුහුණදීමට හා ඉදිරි වසර වලදී මතුවිය හැකි විවිධවූ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීමට අපගේ දත්ත මධ්‍යස්ථානය සතු හැකියාව, අප ලද සහතිකකරණයෙන් සනාථ වේ.

ගනුදෙනුකරුවන්ගේ හැසිරීම හා බැංකුකරණ රටාව කෙරෙහි නව තාක්ෂණයේ බලපෑම දිනෙන් දින ඉහළ යමින් තිබේ. මෙම වෙනස්කම් වලට අනුගත විය හැකි නිරන්තරයෙන් නව දැනුමෙන් පෝෂණය වන ශ්‍රම බලකායක් සිටීම මෙහිදී තරඟකාරී වාසියක් වන අතර එබැවින්, බැංකුවට සිය අදාළ බව ආරක්ෂා කරගැනීම සඳහා සිය කාර්යමණ්ඩලය නව දැනුමෙන් හා කුසලතා වලින් පිරිපුන් පිරිසක් බවට පත් කරගැනීම ඉතා වැදගත් වනු ඇත. බැංකු හා මූල්‍ය සේවා බලගන්වන ෆින්ටෙක් තාක්ෂණය (Fintechs) වැනි තරඟකරුවන් හා දුරස්ථ බැංකුකරණ සේවා සැපයීම සඳහා මධ්‍යගත බැංකු ක්‍රමය සහ අනෙකුත් ඩිජිටල් විසඳුම් වෙත සංක්‍රමණය වීම ආදිය සඳහා දැරිය යුතු නව වියදම් හා සිදු කළ යුතු ආයෝජන පිළිබඳව බැංකුව අඛණ්ඩ අවබෝධයකින් කටයුතු කරයි. මේ පසුබිම තුල අභ්‍යන්තර ක්‍රියාවලි හා ආකල්ප ඩිජිටල්කරණ පරිසරයකට පරිවර්තනය කරගැනීම සඳහා මූලික වශයෙන් ඵලදායී හා නිවැරදි වෙනස්කම් කළමනාකරණය කරගැනීමේ ක්‍රමවේදයක් එවැනි තාක්ෂණික පරිවර්තනයක් සමග බද්ධවී තිබිය යුතුය. ඒ අනුව, අපගේ ඩිජිටල් උපායමාර්ගයේ නව පිම්මක් පිළිබිඹු කිරීමෙහිලා එළඹෙන වසර තීරණාත්මක වනු ඇත.

නිසැකවම 2021 වසර බැංකුවට මෙන්ම රටටද අභියෝගාත්මක වසරක් වනු ඇත. මෙම දුෂ්කර අවස්ථාවේදී අපගේ ගනුදෙනුකරුවන්ට අවැසි සියළු සහය ලබාදෙන බව සහතික කිරීම සඳහා බැංකුව, රජය හා නියාමන ආයතන සමග එක්ව කටයුතු කිරීමට සූදානම්ව සිටී. අඩු පොලී අනුපාත සහ නව ණය ක්‍රම මෙන්ම එන්නත්කරණය සමග අවම වෙමින් තිබෙන වසංගත තත්ත්වය සමග ආර්ථිකයේ සියළු ක්ෂේත්‍ර ආශ්‍රිතව ණය වර්ධනයක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ. එමගින් කෙටි කාලීන ණය සඳහා වන ඉල්ලුම ඉහළ යනු ඇති අතර බැංකුවේ අඩු පිරිවැය ඉතුරුම් පදනම පුළුල් කරමින් තැන්පතු සංචලනයද ඉහළ යාමේ ප්‍රවණතාවයක්ද පවතී.

කෙසේවුවත්, ක්ෂේත්‍රයේ ණය ගුණාත්මකභාවය හා අක්‍රිය ණය තත්ත්වය පිළිබඳ පැහැදිලි අදහසක් ලබාගත හැකි වන්නේ 2021 වසරේදී පමණි. එබැවින්, ණය පාඩු හා වෙනත් අහිතකර තත්ත්වයන්ට මුහුණ දීමට බැංකුව සූදානම් විය යුතුය. අක්‍රිය ණය ඉහළ යාමෙන් ගම්‍ය වන්නේ බැංකුවේ ණය අයකරගැනීමේ උපායමාර්ගය සහ ගනුදෙනුකරුවන් වෙත දක්වන සහයෝගය, බැංකුව මුහුණ දෙන කීර්ති නාමය ආශ්‍රිත අවදානම, වෙනස් වන පරිසරය සහ බැංකුවේ ශේෂ පත්‍රයේ අවසන් සමස්තය යන සාධක අතර මනා තුලනයක් පවත්වා ගත යුතු බවයි. පොලී අනුපාත පහළ මට්ටමක පැවතීම හෝ තව දුරටත් පහළ යාමේ හැකියාව මත ශුද්ධ පොලී ආන්තිකය තව දුරටත් සංකෝචනය වී තිබෙනු ඇති අතර පොලී අනුපාත වල ඕනෑම වෙනසක් සමග ප්‍රතිමිලකරණ අවදානම ඉහළ යනු ඇත. සිල්ලර වෙළඳාම ආශ්‍රිතව පාරිභෝග වියදම් පහළ යාම හේතුවෙන් සේවා ගාස්තු ආදායම පහළ යනු ඇති බව අපේක්ෂා කෙරෙන අතර එහෙත් බැංකුවේ අභ්‍යන්තර ක්‍රියාවලි ඔස්සේ වර්ධනය ළඟා කරගැනීම නැතහොත් ඓන්ද්‍රීය වර්ධනය අරමුණු කරගෙන අරමුදල් නොවන ආදායම් කෙරෙහි අවධානය යොමු කරනු පිණිස බැංකුව සිය ව්‍යාපාරික ආකෘතිය සංශෝධනය කරනු ඇත. ඉදිරියේදී මතු විය හැකි ඕනෑම අභියෝග යක් ජයගැනීම සඳහා බැංකුව එහි ව්‍යාපාරික සහ මෙහෙයුම් ස්ථාවරත්වය සහ දිගුකාලීන කාර්යසාධනයක් සඳහා සැලසුම් සකස් කිරීම වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට සූදානමින් සිටියි.

වඩාත් වැදගත් කරුණ වන්නේ ව්‍යාපාරික පරිසරයේ වෙනස්කම් සහ අවදානම් මධ්‍යයේ වුවද ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය අත්‍යවශ්‍ය වටිනාකම් හා මෙහෙවර විසින් මගපෙන්වනු ලැබීමයි. බැංකුකරණයේ හැඩය වෙනස් විට අප එයට අනුගත වුවද අපගේ වගකීම් හා අපගේ අරමුණ කෙරෙහි අපගේ කැපවීම නොවෙනස්ව පවතිනු ඇත.

වසංගත තත්ත්වය මත අපගේ මෙහෙයුම් සම්බන්ධයෙන් ගත යුතු පියවර පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා අපගේ කාර්යමණ්ඩලයේ සහයෝගය අත්‍යවශ්‍යවූ අතර වසර මුළුල්ලේ අපගේ කාර්යමණ්ඩලය විසින් ප්‍රකට කරන ලද කැපවීම හා ධෛර්යය ඉහළින් අගය කරමි. සිය පෞද්ගලික හා රාජකාරී කටයුතු වලට බාධා එල්ලවීම හේතුවෙන් මෙරට ජන සමාජයේ ඕනෑම පුද්ගලයෙක් මෙන්ම අපගේ කාර්යමණ්ඩල සාමාජිකයන්ද පීඩාවට පත්වූ අතර අවිනිශ්චිතාවයට මුහුණ පෑමට සිදු විය. කෙසේවුවත්, ඔවුහූ අපගේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් නොවෙනස්ව කැපවෙමින් ගනුදෙනුකරුවන් වෙනුවෙන් අඛණ්ඩ සේවාවක් සැපයූහ. ඒ පිළිබඳව ජාතික ඉතිරිකිරීමේ බැංකුව කීර්තියක් උසුලන බව කිව යුතුය.

එයට ප්‍රතිචාර වශයෙන් අපගේ කාර්යමණ්ඩලය සවිබලගැන්වීම සඳහා ආතතියකින් තොර කාර්යාලයීය පරිසරයක් බැංකුව තුල නිර්මාණය කිරීම සඳහා හැකි සෑම පියවරක්ම ගන්නා ලදී. ඇතැම් අවස්ථාවල නිවසේ සිට රාජකාරී කිරීම සඳහා පහසුකම් සලසන ලද අතර රාජකාරී කටයුතු සඳහා කාර්යමණ්ඩල සාමාජිකයන් බැංකු පරිශ්‍රය වෙත පැමිණිය යුතුවූ විට හුදෙකලා ප්‍රදේශවල ශාඛා කාර්යමණ්ඩල සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම හෝ ප්‍රවාහන වියදම් ප්‍රතිපූරණය කිරීමට අවස්ථාව ලබාදීම සිදු කෙරිණ. කාර්යමණ්ඩලයට මුහුණු ආවරණ හා විෂබීජ නාශක දියර ලබාදුන් අතර අපගේ ශාඛා ජාලය ඔස්සේ සාමජ දුරස්ථභාවය පවත්වාගැනීම හා වෙනත් සෞඛ්‍යාරක්ෂක යහපරිච ක්‍රියාත්මක කිරීම සිදු කෙරිණ. භෞතික සහභාගීත්වය සහිත පුහුණු වැඩසටහන් සීමා කෙරුණු අතර ඒ වෙනුවට මාර්ගගත පුහුණු වැඩසටහන් පවත්වන ලදී. එසේම, අපගේ කාර්යමණ්ඩල සාමාජිකයන් අපගේ සාර්ථකත්වයේ කේන්ද්‍රය බව තහවුරු කරමින් වසර මුළුල්ලේම අපගේ සේවක මඩුල්ලට අදාළ මුළු වැටුප් හා වැටුප් නොවන ප්‍රතිලාභ ගෙවන ලද අතර ඉදිරියටත් ඔවුන් වෙනුවෙන් අපගේ යුතුකම් අඛණ්ඩව ඉටු කිරීමට කැපවෙමු.

ගෙවී ගිය අසීරු වසර තුල අපගේ ගනුදෙනුකරුවන් අප කෙරෙහි තැබූ විශ්වාසය හා දැක්වූ සහයෝගය වෙනුවෙන් ඔවුන් වෙත මාගේ ස්තූතිය පළ කරමි. මේ අර්බුදකාරී පසුබිම හමුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ලබාදුන් විශිෂ්ට සහයෝගය, මගපෙන්වීම හා නායකත්වය අපගේ සාර්ථකත්වයේ පදනමවූ අතර ඔවුන්ගේ ඒ මෙහෙවර කෘතඥතාපූර්වකව අගය කරමි. බැංකුවේ අභිවෘද්ධිය උදෙසා ලබාදුන් වටිනා දායකත්වය වෙනුවෙන් හිටපු වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, දමිතා රත්නායක මහත්මිය වෙත මාගේ ස්තූතිය පිරිනමමි. බැංකුවේ කළමනාකරණ කණ්ඩායම හා සෙසු සේවක මණ්ඩලය ඉමහත් කැපවීමෙන් සිදු කළ සේවය බෙහෙවින් අගය කරමි. දිවයින පුරා විහිදුන ජාතික ඉතිරිකිරීමේ බැංකු ශාඛාවලට ලබා දුන් සහයෝගය වෙනුවෙන් තැපැල්පතිතුමා හා තැපැල් දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පුදකරමි. ගරු අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍යතුමා, මුදල්, ප්‍රාග්ධන වෙළඳපොල හා රාජ්‍ය ව්‍යවසාය සංශෝධන පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍යතුමා, මුදල් අමාත්‍යංශයේ ලේකම්තුමා, ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා හා නිලධාරීන්, ගරු නීතිපතිතුමා, විගණකාධිපතිතුමා සහ එම දෙපාර්තමේන්තුවල නිළධාරීන්, අනෙකුත් නියාමන ආයතනවල ප්‍රධානීන් සහ ඔවුන්ගේ කණ්ඩායම් අප වෙත ලබාදුන් අඛණ්ඩ සහයෝගය හා මගපෙන්වීම වෙනුවෙන් මාගේ ගෞරවපූර්වක ස්තූතිය පුද කරමි.



අජිත් පීරිස්

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී

2021 මාර්තු 19

මෙහෙයුම් පරිසරය

ගෝලීය ආර්ථිකය

පෙර නොවූ විරූ අවදානමක්

2020 වර්ෂයේ කැපී පෙනෙන සාධකය වූයේ පරම්පරාවකට වරක් මුහුණපෑමට සිදුවන අන්දමේ ව්‍යසනකාරී සිද්ධිදාමයක් වූ කොවිඩ්-19 ගෝලීය වසංගතයයි. 2019 වසරේ නොවැම්බර් මස චීනයේ මුලින්ම සොයා ගැණුනු බවට විශ්වාස කරන මෙම වෛරසය, 2020 වසරේ පළමු කාර්තුව වන විට ලොව පුරා වේගයෙන් ව්‍යාප්ත විය. 2021 මාර්තු මස වන විට මිලියන 115 කට අධික පුද්ගලයින් සංඛ්‍යාවක් වෛරස ආසාදිතයන් බවට පරීක්ෂණ මගින් සනාථ වුණු අතර, මියගිය සංඛ්‍යාව මිලියන 2.5 ඉක්මවීය. එසේ වුවද, ඇස්තමේන්තු කරනු ලබන ආකාරයට සැබෑ මරණ සංඛ්‍යාව මෙම අගයට වඩා බෙහෙවින් වැඩි විය හැකි බව අනුමාන කරයි.

වසංගතය මගින් ජනනය වූ සෞඛ්‍ය අර්බුදය, ගෝලීය ආර්ථිකයට හිටිහැටියේම එල්ල වූ මහා පරිමාණ කම්පනයක් වූ අතර මීට ප්‍රථම සියවසේ සිදු වූ ලෝක සංග්‍රාම ද්විත්වය හා මහා ආර්ථික අවපාතයට පසුව බිහි වුණු දරුණුම ආර්ථික පසුබැස්මට හේතු විය. වෛරසය ව්‍යාප්තිය අවම කිරීමේ පියවර ලෙස සමාජ දුරස්ථභාවයට හා සංක්‍රමණ සීමාකිරීම ආදී මහජන සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමෝපායන් අවශ්‍ය වන අතර, එවන් වාතාවරණයක් තුළ සමස්ත ඉල්ලුම් ක්‍රියාවලිය බලගැන්වීම අසීරු වැයමකි. තවද, මුහුණට මුහුණ අන්තර්සමාජ සම්බන්ධතා මත ක්‍රියාත්මක වන සේවා ක්ෂේත්‍ර උදා: පාරිභෝගික ව්‍යාපාර, කලා හා විනෝදාස්වාද, සංචාරක ක්ෂේත්‍රය යනාදිය වඩාත් සැලකිය යුතු සීමාවන්ට බඳුන් වී ඇත. ගමනාගමන සීමාවන්, ගුවන් තොටුපළ වසා දැමීම හේතුකොට ගෙන ගෝලීය සංචාර හා සංචාරක සේවා ඇණහිටියේ සංචාරක සේවා මත පදනම්ව තිබූ ආර්ථිකයන්ට බරපතල පහරක් එල්ල කරමිනි.

රජයන් විසින් සේවකයින් රඳවා ගැනීමට විවිධ මුලපිරීම් ගනු ලැබුවද වසංගත කාලසීමාව තුළ රැකියා වියුක්තිය ශීඝ්‍ර ලෙස ඉහළ යන ලදී. ජාත්‍යන්තර කම්කරු ආයතනය ඇස්තමේන්තු කරන පරිදි 2019 වර්ෂාවසානයේදී වසංගතයට පෙර කාලරාමුව හා සසඳන විට පූර්ණ කාලීන සේවකයින් මිලියන 255 කට සමාන 8.8% ක වැඩ කරන පැය අහිමිවීමක් දක්නට ලැබෙයි.

ආර්ථිකයන්ට මෙලෙස බාහිරින් එල්ල වූ හදිසි බලපෑම් තත්ත්වය හේතු කොට ගෙන ඒ ඒ රටවල ආර්ථිකයන්ට ඒ ඒ රටවලට ආවේණික ගැටළුකාරී ස්වභාවයන් මතුවිණි. මීට පෙර ආර්ථික පසුබැසීම් වලදී ආර්ථික අවපාතය පැවති කාලසීමාව පුරාවට ක්‍රමක්‍රමයෙන් විරැකියා තත්ත්වය වැඩි වී නැවත අඩුවීමට පෙර උත්සන්න වූ බව පෙන්නුම් කරයි. එනමුත් වත්මන් අර්බුදය හමුවේ එක්සත් ජනපදය තුළ විරැකියා අනුපාතය 2020 වසරේ පෙබරවාරි සිට අප්‍රේල් වන විට 3.5% සිට පෙර නොවූ විරූ ලෙස 14.7% ක මට්ටමට උත්සන්න විය. එය 2007 දෙසැම්බර් සිට 2009 ජූනි දක්වා අතර කාලයේ පැවති මහා ආර්ථික පසුබැසීමද අබිබවා යාමක් විය. අනතුරුව එය වර්ෂයේ සෙසු කාලසීමාව තුළ ක්‍රමක්‍රමයෙන් අඩුවී දෙසැම්බර් වන විට 6.7% ක අගයක් ගත්තද එය පූර්ව වසංගත මට්ටමට වඩා ඉහළ ප්‍රතිශතයකි.

මෙම අර්බුදයේ ප්‍රධානතම තර්ජනය, ඒ වනවිටත් අසීරුතාවන්ට වැඩි වශයෙන් ලක්වීමේ හැකියාව ඇති කාන්තාවන්, යෞවන හා තාවකාලික වෘත්තිකයන්, ශාරීරික සමීපතාවයක් සහිතව කටයුතු කළ යුතු වෘත්තිකයන් (ජාත්‍යන්තර කම්කරු ආයතනයේ දත්ත අනුව ගෝලීය ශ්‍රම බලකායෙන් 60% ක් සමන්විත) වෙත එල්ල වූ අතර ආදායම් අහිමිවීම් හා රැකියා අහිමිවීම්වලට වැඩි වශයෙන් ලක්වීමටද ඔවුන්ට සිදු විය.

ලොව පුරා බහුල වශයෙන් පාසල් වසා දැමීම හේතුවෙන් මානව ප්‍රාග්ධන සංවර්ධනය පසුගාමී තත්ත්වයකට මුහුණපාන ලදී. එමෙන්ම මෙම තත්ත්වය අනාගත පරම්පරා මත ඇති කරනු ලබන බලපෑම අපට දැකගත හැකි වනුයේ තවත් ඉදිරියටයි. ප්‍රක්ෂේපිත අගයන් අනුව පෙන්නුම් කරන්නේ දුගීබව තුරන් කිරීම අතින් අත් කරගත් දශක ගණනාවක ප්‍රගතිය අතුගා දමමින් සහ ආර්ථිකමය හා ව්‍යුහාත්මක පරතරයන් වඩා තීව්‍ර කරමින් මිලියන 100 ක් පමණ පිරිස අන්ත දුගීබවට පත් වනු ඇති බවයි.

එන්නත් නිෂ්පාදනයේ හා බෙදා හැරීමේ සුබවාදී පුවත් මගින් 2021 වර්ෂයේදී වසංගතයට ඉක්මනින් සමුදීමට හැකි වේය යන අපේක්ෂාවන් ගොඩ නැගෙයි. එවන් අපේක්ෂාවන් හමුවේ වැඩි වන ඉල්ලුමට සරිලන පරිදි පාරිභෝජනය ඉහළ නැංවීමේ හැකියාව හා ඒ හා සමගාමීව ආයෝජන හා රැකියා අවස්ථා වැඩි කිරීමේද අවස්ථාව ඇත.

කෙසේ වුවද ආර්ථිකය සාර්ථක අන්දමින් යථා තත්ත්වයට පත්වීමට නම්, කොවිඩ්-19 එන්නත ගෝලීය වශයෙන් බෙදී යායුතු අතර සියලුම රටවල් එකවර වසංගත තත්ත්වය පාලනය කිරීමට සමත්විය යුතුය. අසමතුලිත ලෙස එනනත් තොග බෙදීයාම, ලොව පුරා බිලියන ගණනින් එන්නත් බෙදාදීමේ ප්‍රායෝගික ගැටළු සහ විවිධ රටවල එන්නත්කරණ වැඩසටහන් වලදී භාවිත එන්නත් වර්ගයන්හි ගුණාත්මක බව යනාදිය ජයගත යුතු බාධාවන්ය. තවද දකුණු අප්‍රිකාව, එක්සත් රාජධානිය හා සෙසු කලාප වලින් කොවිඩ්-19 වෛරසයෙහි නව ප්‍රභේද හට ගැනීම තුළින් වසංගත හා ආර්ථික පුරෝකථන වඩාත් සංකීර්ණ වී තිබේ. අවසාන වශයෙන් යථා තත්වයට පත්වීමේ කාලවකවානුව මෙන්ම ආර්ථික පසුබැසීම යන සාධක හේතුවෙන් මතුවන පසුබෑම්වල ස්වභාවය හා රඳාපැවැත්ම කෙබඳුවේදැයි යන්න අවිනිශ්චිතව පවතී.

මෙහෙයුම් පරිසරය

ගෝලීය වර්ධනය

ගෝලීය ආර්ථික වර්ධනය 2020 වර්ෂයේ දෙවන භාගයේ අපේක්ෂිත වේගයට වඩා ශක්තිමත් වීමෙන් පසු, 2020 දී ගෝලීය ආර්ථික වර්ධනය 3.5% කින් සංකෝචනය වී ඇති බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇස්තමේන්තු කර ඇති අතර එය පසුගිය වසරේ තුන්වන කාර්තුවේ ප්‍රක්ෂේපණවලට වඩා 0.9% ක ඉහළ යාමකි. (මෙය 2020 වර්ෂයේදී ගෝලීය ආර්ථිකය 3.3% කින් වර්ධනය වනු ඇති බවට තිබූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 2020 ජනවාරි මස වසංගත පූර්ව සටහන් පුරෝකථනවලට ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි.) 2021 වර්ෂයේදී ගෝලීය ආර්ථිකය 5.5% කින් යළි වර්ධනය වී (0.3% ක උඩුකුරු සංශෝධනයක්) 2022 දී 4.2% ක ප්‍රතිශතයකට සීමා වන බවට පුරෝකථනය කර ඇත.

2021 ග්‍රීෂ්ම සෘතුව වන විට එන්නත් ලබා ගැනීමේ හැකියාව බහුල වශයෙන් පවතිනු ඇතැයි යන අපේක්ෂාව හා දැඩි ප්‍රතිපත්තිමය සහයෝගය අඛණ්ඩව හිමිවීම යන සාධක මත වෙනත් රටවලට වඩා දියුණු ආර්ථිකයක් සහිත රටවල කොවිඩ් වසංගතයට පෙර පුරෝකථනය කළ නිෂ්පාදන අලාභය අඩු කරනු ඇතැයි සැලකේ. 2019 වසරාවසානයේ පැවති මට්ටමට යළි පිබිදීම රටින් රටට වෙනස් වනු ඇති අතර. 2021 දෙවන භාගය වන විට ජපානය හා ඇ.එ.ජ. ඒ වෙත ළඟා වනු ඇති බවත් ඒ සඳහා යුරෝපාකරයට හා එක්සත් රාජධානියට 2022 තෙක් ගතවනු ඇති බව සැලකේ. කෙසේ වුවද වඩාත් දියුණු ආර්ථිකයන්හි ආර්ථික කටයුතුවල පිබිදීම එම රටවල් හා ගනුදෙනු කරන සෙසු වෙළඳ පාර්ශ්වයන්ගේ ආර්ථික කටයුතුවලට ද හිතකර තත්ත්වයක් උදා කරවනු ඇතැයි අපේක්ෂිතය.

නැඟී එන වෙළඳපළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් එකිනෙකට වෙනස් ප්‍රතිසාධන ගමන්පථවලට එළඹෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. එහිදී චීනය හා සෙසු සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් අතර සැලකිය යුතු වෙනසක් දැකිය හැකි වනු ඇති බවට අපේක්ෂිතය. ශක්තිමත් රාජ්‍ය ආයෝජන, මනා සීමා පැනවීමේ ක්‍රියාපිළිවෙත් හා මහ බැංකු ද්‍රවශීලතා සහාය මගින් චීනයේ කැපී පෙනෙන ප්‍රතිසාධනයට පහසුකම් සපයන ලදී. කෙසේ වුවද නිෂ්පාදනය, අපනයනය හා සංචාරක කර්මාන්තය ආදී බාහිර ප්‍රභව මත වැඩි බරක් තබන ආර්ථිකයන්හි ප්‍රතිසාධනය අල්ප වනු ඇත.

ගෝලීය ආර්ථික වර්ධනය

ප්‍රස්තාරය 01



මූලාශ්‍රය: වර්ල්ඩ් ඉකොනොමික් අවුට්ලුක් අප්ඩේට් (World Economic Outlook Update) - 2021 ජනවාරි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

ගෝලීය ණය

2020 දී රාජ්‍ය මූල්‍ය, ගෝලීය වශයෙන් අසීරු මාර්ගයක ගමන් ගන්නා ලදී. ආර්ථික ක්‍රියාකාරකම් වලට එල්ලවූ පීඩාවන් අයවැයෙහි ආදායම් වියදම් යන දෙපාර්ශ්වයටම බලපාන ලදී. කලක සිට ගොඩ නැගෙමින් තිබූ සංවර්ධනය වෙමින් පවතින රටවල මූල්‍ය අවදානම, වසංගතය සමඟ වඩාත් ඉහළ යන ලද අතර විශේෂයෙන්ම අඩු ආදායම් ලබන රටවල තත්ත්වය මෙහිදී කැපී පෙනිණි.

කොරෝනා වසංගතය හේතුවෙන් තාවකාලිකව බිඳ වැටුණු ආර්ථිකයට රුකුල් සපයනු වස් රජයන් විසින් සෞඛ්‍ය අංශවලට ලබාදෙන අනුග්‍රාහක අරමුදල් ඉහළ නැංවීම සහ කුටුම්භ හා ව්‍යාපාර සඳහා ආධාර සැපයීම, හේතු කොට ගෙන ගෝලීය රාජ්‍ය ණය 2020 දී ඇ.ඩො.ට්‍රි. 77.8 ක් දක්වා ඇ.ඩො.ට්‍රි. 10 කින් පමණ ඉහළ ගොස් ඇති බව ෆිච් වෙතින් ඇස්තමේන්තු කර ඇති අතර එය ලෝක දළ දේශීය නිෂ්පාදිතයෙන් 94% ට සමාන වේ. විශාලතම ණය වැඩිවීම් වාර්තා කර ඇත්තේ දියුණු ආර්ථිකයන් වන අතර ඉන්පසුව නැඟී එන වෙළඳපළ හා මධ්‍ය ආදායම් ආර්ථිකයන් ද අඩු ආදායම්ලාභී සංවර්ධනය වන රටවල් ද පෙළට සිටියි. වසංගතය ආශ්‍රිත ක්‍රියාමාර්ගවල පසුබෑම හා ඉදිරියේදී ප්‍රක්ෂේපිත ප්‍රකෘතිය සැලකිල්ලට ගත් විට රාජ්‍ය ණය සාමාන්‍යයෙන් 2021 දී මධ්‍යස්ථව ඉහළ යනු ඇති අතර මධ්‍ය කාලීනව එය ස්ථාවර වනු ඇත. ඒ හා බැඳී පවතින විශාල ණය ප්‍රමාණ හේතුවෙන් ආර්ථික පසුබෑම් පවතින වකවානුවලදී රජයන්, ආයතන හා කුටුම්භ ඉහළ අවදානමකට ලක් කරවයි.

නැඟී එන වෙළඳපළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ණය ප්‍රමාණයේ ශීඝ්‍ර වර්ධනයක් ඇති කරලීමට කොවිඩ්-19 ගෝලීය අවපාතය හා ආර්ථික ප්‍රතිපත්ති හේතු වී ඇත. වසංගතයට පෙර පවා පැවති තත්ත්වය එතරම් සුබදායී නොවිණි. නැඟී එන වෙළඳපළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි සමස්ත ණය, 2019 වසරේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 176% ක් දක්වා වර්ධනය වූයේ ප්‍රධාන වශයෙන්ම දළ දේශීය නිෂ්පාදිතයෙන් 123% ක් දක්වා ඉහළ ගිය පෞද්ගලික ණය හේතුවෙනි. 2019 දී ගෝලීය ණය වාර්තාගත ලෙස වැඩි වුණු අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 230% ක් ලෙස සටහන් විණි. එමෙන්ම රාජ්‍ය ණය ද දළ දේශීය නිෂ්පාදිතයෙන් 83% ක් තෙක් වාර්තාගත ලෙස වර්ධනය විය.

වසංගත තත්ත්වය මඟින් සිදුවූයේ, මෙලෙස ණය එකතුවීම අතින් "සිව්වන රැල්ලක්" නිර්මාණය වී, ණයවල තිරසාරභාවය පිළිබඳ සහ මූල්‍ය අර්බුදයක් නිර්මාණයවීමේ හැකියාව පිළිබඳ බිය සැක මතුවීමයි. 2020 දී නැඟීඑන වෙළඳපළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි රාජ්‍ය ණය, දළ දේශීය නිෂ්පාදිතයෙන් 9% ක් දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂිතය. එය, වසර 30 කින් සිදු වූ විශාලතම වර්ධනයයි. ඉහළ ණයගැති නැඟී එන වෙළඳපළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් ද ඔවුන්ගේ බැඳුම්කර ප්‍රතිලාභ පරතරයෙහි තියුණු වර්ධනයක් වාර්තා කරනු ලැබුවේ ප්‍රාග්ධන පිටතට ගලායෑම්වලට තුඩු දෙමිනි.

මූලාශ්‍රය: Global Economic Prospects - ජනවාරි 2021 ලෝක බැංකුව

ආධාරක මූල්‍ය කොන්දේසි

2020 වර්ෂයේ පැවති ප්‍රවණතාව අවසන් කිරීමට වේගවත් සහ ප්‍රබල තත්ත්වානුරූපී මූල්‍ය, හා මූල්‍යමය ක්ෂේත්‍ර ප්‍රතිපත්ති මුල් විය. පෙර නොදුටු විරූ වසංගත තත්ත්වයක් මත උද්ගත වූ අවිනිශ්චිතතාවය ද්‍රවශීලතාවය සඳහා වූ අවශ්‍යතාව ඉහළ නංවන ලදී. මෙම අවශ්‍යතාවය සැපිරීමට ප්‍රතිචාර ලෙස ලොව පුරා මහ බැංකු විසින් රාජ්‍ය ආයතන හා සම්බන්ධීකරණය වෙමින් මූල්‍ය වෙළඳපළ හා ආර්ථිකයට ආධාර සලසනු පිණිස අවැසි පියවර ගැනීමට වෑයම් කරන ලදී.

මනාව ක්‍රියාත්මක වෙළඳපළ සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතා සැපයීමට අනුග්‍රහය සැලසෙන මූල්‍ය ප්‍රතිපත්ති තවදුරටත් ක්‍රියාත්මක කිරීමට බොහෝ මහ බැංකු පියවර ගනු ලැබිණි. ගෝලීය වෙළඳපළ තත්ත්වයන් හමුවේ මෙකී ද්‍රවශීලතා අභියෝග ජය ගැනීමට ගනු ලැබූ වැදගත් පියවර අතරට අඩු ප්‍රතිපත්තිමය අනුපාත හා බැඳුම්කර මිලදී ගැනීමේ වැඩසටහන් හා විශේෂ ආපදා සහන/පහසුකම් සැපයීමට මහ බැංකු විසින් මෑතකදී ගනු ලැබූ ක්‍රියාමාර්ගද ඇතුළත් වේ. සමස්තයක් වශයෙන් ගත් කල, මුළු ලොවම අගුළු දමා තිබූ අවස්ථාවක 2020 දී ආර්ථිකයන්ට උපකාර කිරීමට මහ බැංකු විසින් ප්‍රතිපත්තිමය අනුපාත අඩු කිරීම් 207 ක් ක්‍රියාවට නැංවිණි.

වසංගත තත්ත්වය හේතුවෙන් පාඩු ලැබූ ව්‍යාපාර සඳහා ණය ආපසු ගෙවීමට අදාළ සහන, රාජ්‍ය මැදිහත්වීම මත අඩු පිරිවැය ණය පහසුකම් ලබාදීම හා ජීවන වියදම් පාලනය කරනු වස් පාලන මිල පැනවීම් යනාදිය ලොව පුරා ක්‍රියාත්මක වූ අනෙකුත් ආර්ථික උත්තේජන මුලපිරීම් විය. සමස්තයක් ලෙස ගත් විට, මෙම ප්‍රතිපත්ති සියල්ල ව්‍යාපාරික ආත්ම විශ්වාසය ගොඩ නැංවීමට, ණය ව්‍යාප්තිය වර්ධනය කිරීමට, පාරිභෝගික වැය දිරිගැන්වීම හා බුන්වත්වීම් රැසක් වැළැක්වීමට ඉවහල් විය.

මීට අමතරව ප්‍රතිචක්‍රීය ප්‍රාග්ධන අවරෝධක අඩුකර උචිත පරිදි, නම්‍යශීලි අයුරින් අර්බුදකාරී සමයෙන් අනතුරුව නියාමන මෙවලම් උපයෝගී කරගන්නා මෙන් ජාත්‍යන්තර නියාමන අධිකාරීන් වෙත දැනුම් දී තිබේ. මහජන බැංකු පහසුකම් හෝ රාජ්‍ය ණය හෝ ඇපකර මගින් ලැබෙන මුදල් හරහා සහ එවැනි ක්‍රියාමාර්ග මගින් අඩු කරන ලද ප්‍රාග්ධන අවරෝධක වලින් වැඩි ශේෂපත්‍ර ධාරිතාවක් භාවිත කිරීමේ හැකියාව පිළිබඳ මූල්‍ය අංශයට විශ්වාසය දැනවිය හැකිය. එමගින් කොවිඩ්-19 හි ආර්ථික බලපෑම් හේතුවෙන් ව්‍යාපාර මුහුණදිය හැකි බුන්වත්වීමේ ගැටළු සඵලදායී ලෙස විසඳා ගැනීමට හැකි වනු ඇත.

ඉදිරි කාලසීමාව තුළ ප්‍රධාන මහ බැංකු විසින් තම වත්මන් ප්‍රතිපත්ති අනුව අනුපාත එලෙසම පවත්වා ගනු ඇතැයි අපේක්ෂිතය. ඒ හේතුවෙන්, නැගීඑන වෙළඳපළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් ක්‍රමයෙන් දියුණු වන අතරම, දියුණු ආර්ථිකයන් සඳහා මූල්‍ය කොන්දේසි ස්ථාවරව පවතිනු ඇතැයි ප්‍රක්ෂේපිතය.

උද්ධමනය	ගෝලීය වෙළඳාම
2021 - 22 අතර කාලය තුළ දියුණු ආර්ථිකයන්හි 1.5% ට අඩු නැගී එන හා දියුණු වෙමින් පවතින ආර්ථිකයන්හි 4.0% මඳක් ඉක්මවූ (එනම්, අතීත දත්ත අනුව මෙම කාණ්ඩයේ සාමාන්‍යයට වඩා පහළ අඩු උද්ධමනයක් අපේක්ෂිතය	ගෝලීය ආර්ථිකය ප්‍රකෘතිමත් වන විට ගෝලීය වෙළඳාම් 2021 දී 8.0% කින් පමණ වර්ධනය වෙතැයි අපේක්ෂිතය. කොවිඩ්-19 ව්‍යාප්තිය අඩුවී යනතුරු ලොව පුරා සංචාරක හා දේශීය සංචාරවලට බලපාන බැවින් සේවා සැපයුම් අංශයේ ප්‍රකෘතියට පත්වීම වඩාත් මන්දගාමී වනු ඇත.

මූලාශ්‍රය: වර්ල්ඩ් ඉකොනොමික් අවුට්ලුක් අප්ඩේට් (World Economic Outlook Update) - 2021 ජනවාරි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

භාණ්ඩ වෙළඳපළ

සංචාරක තහංචි හා ව්‍යාපාර වසා දැමීම හේතුවෙන් 2020 වසරේදී ඉන්ධන ලෙස තෙල් සඳහා වූ ඉල්ලුම අධික ලෙස පහත වැටිණි. 2020 වසරේ පළමු භාගය තුළ කොවිඩ් 19 වසංගතයට දැක්වූ ප්‍රතිචාර මත ගෝලීය පෙට්‍රොලියම් ඉල්ලුම අතිශයින් පහළ වැටුණේ බොරතෙල් වෙළඳපළ අසීරුවට ලක් කරමිනි. පෙට්‍රොලියම් ඉල්ලුම පහළ යාමත් එ.ජ. බොරතෙල් සංචිතයෙහි ඉහළ යාමත් සමඟ වෙස්ට් ටෙක්සාස් ඉන්ටර්මීඩියම් 2020 අප්‍රේල් මස බොරතෙල් මිල සෘණ අගයට වැටිණි. එය 1983 එම සමාගම ආරම්භ කළ පසුව එතරම් අඩු අගයක් ගත් ප්‍රථම අවස්ථාවයි. ඊට පසු දින ගෝලීය තෙල් වෙළඳපළෙහි මිල සටහන් කරන්නෙකු වූ බ්‍රෙන්ට් කෘඩ් ඔයිල් මිල දශක ගණනාවක් පුරාවට වාර්තා කළ අඩුම දෛනික තෙල් බැරලයකද මිල වූ ඩොලර් 9.12 ක් දක්වා පහත වැටිණි.

අප්‍රේල් මාසයෙන් අනතුරුව ඉල්ලුම ඉහළ යාමත් සමඟ බොරතෙල් මිල ඉහළ යන ලදී. 2020 වසරාවසානයේ කොවිඩ්-19 එන්නත් වර්ග කිහිපයක් නිපදවීමත් සමඟ හා 2021 දී තමන් නිෂ්පාදනය සීමා කරන බවට ඔපෙක් (OPEC+) නිවේදනය කිරීමත් බොරතෙල් මිල ඉහළ යාමට හේතු විය. 2020 ට සාපේක්ෂව 2021 දී තෙල් මිල වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරනුයේ 20% කින් පමණ වන නමුත් 2019 වසරේ සාමාන්‍යයට වඩා බෙහෙවින් අඩු මට්ටමක රඳා පවතිනු ඇත.

වසංගතයේ ප්‍රතිඵල වූ අවිනිශ්චිතතාවයන් ආරක්ෂිත වත්කම් වෙත ජනතාව යොමු කරවීමට හේතු විය. එහි ප්‍රතිඵල ලෙස රන් මිල 24% ක් ඉක්මවා ඉහළ ගිය අතර ඇ.ඩො.1,769.64/අවුන්ස සාමාන්‍යයකට විකුණුම් මිල පවතී. තෙල් නොවන භාණ්ඩ මිල විශේෂයෙන්ම ලෝහ වර්ගවල මිලද 2021 දී ආර්ථිකය ප්‍රකෘතිමත් වීමත් සමඟ ඉහළ යාමට නියමිතය.

ස්කන්ධ වෙළඳපොළ

2020 වර්ෂයේදී ස්කන්ධ වෙළඳපළ සැලකිය යුතු විපර්යාසයකට බඳුන් විය. ගෝලීය කොටස් වෙළඳපළ එහි ඉතිහාසයේ වේගවත්ම පහළවැටීම පෙබරවාරි, මාර්තු යන මාස වල පෙන්නුම් කළ අතර ප්‍රධාන පෙළේ මහ බැංකුවල සහනදායී මූල්‍ය ප්‍රතිපත්ති හේතුකොට ගෙන මෙම තත්ත්වය මඟහැරී යථා තත්ත්වයට පෙරළිණි.

එ.ජ.ස්කන්ධ යුරෝපීය වෙළඳපළ අභිබවන ලදී. "ද ඩොව් ජෝන්ස් 30 ඉන්ඩස්ට්‍රියල්" දෙසැම්බර් මස 3.3% ක්ද, 2020 පුරාවට 7.2% ක්ද වර්ධනය වූ අතර, එන්ඒඑස්ඩීඒකිව් (NASDAQ) දෙසැම්බර් මස 5.7% කින්ද, 2020 පුරාවට 43.6% ක්ද වර්ධනය විය. යුරෝ කලාපයේ යුරෝ STOXX 50 දෙසැම්බර් මස 1.7% ක් වර්ධනය වූ මුත් වසර අවසානයේදී 2019 අවසානයට වඩා 5.1% කින් අඩු විය.

2020 දී ආසියා ශාන්තිකර වෙළඳපළ මිශ්‍රඵල සහිත විය. කොවිඩ්-19 එන්නත් සොයා ගැනීම හා එ.ජ.ජනාධිපතිවරණ ප්‍රතිඵල හේතුකොට ගෙන 2020 වසරේ 4 වන කාර්තුවේදී නැගී එන වෙළඳපළ ප්‍රකෘතිමත්වීම වේගවත් විය. තවද, 2020 දී එම්එස්සීඅයි නැගී එන වෙළඳපළ දර්ශකය, ගෝලීය සංවර්ධිත වෙළඳපළ ස්කන්ධ ඉක්මවීය. (14.9%)

මෙහෙයුම් පරිසරය

ශ්‍රී ලංකා ආර්ථිකය

පාස්කු ඉරිදා ප්‍රහාරයත් සමඟින් 2019 වසරේදී ඇති වූ අහිතකර වාතාවරණය මත ශ්‍රී ලංකාවට පසුගිය වසර කිහිපය පුරාවට වාර්තා කළ හැකි වූයේ ශක්‍යතාවට වඩා අඩු තරාතිරමක ආර්ථික කාර්යසාධනයකි. 2019 නොවැම්බර් මස පවත්වන ලද ජනාධිපතිවරණයත් 2020 මුල් භාගයේ පැවැත්වීමට නියමිතව තිබූ මුත් පසුව අගෝස්තු තෙක් පමා කරන ලද පාර්ලිමේන්තු මැතිවරණයත් හේතුවෙන් ප්‍රතිපත්ති සම්පාදනයේ පෙරකීම් හා ස්ථාවර බවත් මත ව්‍යාපාරික හා ආයෝජන විශ්වාසය ගොඩ නැගෙනු ඇතැයි බලාපොරොත්තුවක් පැවතිණි. 2019 අගභාගය වන විට ඉල්ලුම හා පරිභෝජනය ඉහළ නැංවීමේත් නිෂ්පාදනය හා ආර්ථික වර්ධනය ඉහළ නැංවීමේත් අරමුණ පෙරදැරිව නව රජය විසින් මහා පරිමාණ මූල්‍ය උත්තේජක පැකේජයක් හඳුන්වා දෙන ලදී. ඊට අමතරව, පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් බැට කෑ සංචාරක ක්ෂේත්‍රය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ඉදිකිරීම් යනාදිය ඇතුළත්ව වැඩි වශයෙන් අයහපත් බලපෑමට ලක් වූ අංශ නඟා සිටුවීමට ණය සහන කාලසීමා ඇතුළු ආර්ථික දිරි ගැන්වීම් ගොන්නක් ඉදිරිපත් කරන ලදී.

කෙසේ වුවද, 2020 ආරම්භයේදී ආර්ථිකය යළි ක්‍රමක්‍රමයෙන් නැගී සිටින විට ගෝලීය වසංගත තර්ජන එල්ල විය. ශ්‍රී ලංකාව තුළ ප්‍රථම කොවිඩ්-19 රෝගියා වාර්තාවීම 2020 පෙබරවාරි මස 15 දින සිදු වන ලදුව වර්ෂය අවසානවූයේ රෝගීන් 43,299 ක් වාර්තා කරමිනි. පළමු රැල්ල තුළදී කොවිඩ්-19 වෛරසය ආසාදනය වීම ඉතාමත් අඩු මට්ටමක පැවතිය ද 2020 වසරේ සිව්වන කාර්තුව වන විට එහි ව්‍යාප්තිය ඉතා ඉහළ විය. ප්‍රථම රැල්ලේදී කොවිඩ්-19 වෛරසය ව්‍යාප්තිය මැඩලීමට ගනු ලැබූ මුළු දිවයිනම අගුළු දැමීම, සංචරණ සීමා සහ සමාජ දුරස්ථභාවය පිළිබඳ නීතිරීති යනාදිය නිෂ්පාදනය හා ඵලදායීතාවට බාධාවක් විය. මෙලෙස දේශීය ආර්ථිකයට එල්ල වූ අවහිරතා තවදුරටත් ඉහළ යාමට ගෝලීය ආර්ථිකයේ පසුබැසීම් ප්‍රවණතා තුඩුදුන් අතර ශ්‍රී ලංකාව මුහුණ දුන් විශාලතම ආර්ථික සංකෝචනය වූ 16.4%, 2020 දෙවන කාර්තුව තුළ අත් දකින ලදී. (පළමු කාර්තුව තුළ 1.8% කට පසුව)

ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දුන් පෙර නොවූ විරූ මූල්‍ය උත්තේජන හා මූල්‍යමය සහන මුලපිරීම් හේතුකොට ගෙන පිළිවෙලින් විදෙස්ගත ශ්‍රම බලකාය වෙතින් ලද අපේක්ෂිත සීමාව ඉක්මවූ විදෙස් ප්‍රේෂණ හා ලෝක වෙළඳපළෙහි තෙල් මිල අඩුවීම යන කරුණු මත තෙවන කාර්තුව වන විට අපේක්ෂා කළ පමණට වඩා ප්‍රගතියක් වූ 1.3% ක වර්ධනයක් ළඟාකර ගත හැකි වූ අතර, සියලුම අංශ යළි පිබිදීමක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවද යළි පැන නැගුණු කොවිඩ් රැල්ල, සිව්වන කාර්තුව වන විට ඉහත කී ඉදිරි ගමනට බාධා පමුණුවාලීය. සිව්වන කාර්තුවේ ආර්ථික වර්ධනය 1.3% ක් වූයේ 2019 දී පැවති 2.3% වර්ධනයට සාපේක්ෂව 2020 වර්ෂය තුළ 3.6% ක සමස්ත ආර්ථික සංකෝචනයක් පෙන්නුම් කරමිනි. 2021 වසර වන විට, ශ්‍රී ලංකා මහ බැංකුව 6% ක ශක්තිමත් ආර්ථික වර්ධනයක් අපේක්ෂා කරයි.

උද්ධමනය

2020 තුළදී අඩු වූ ඉල්ලුම හා උද්ධමන ප්‍රවණතා මනා පාලනයක තිබීම හේතුවෙන් ඉලක්කගත පරිදි සාමාන්‍යයෙන් 4% - 6% ත් අතර උද්ධමන තත්ත්වය පවත්වා ගැනීමට ඉවහල් විය. මෙම තත්ත්වය වෙනස් කරමින් ආහාර මිල ගණන්වල ඉහළ යාම හේතුකොට ගෙන 2019 වසර අවසානය වන විට කොළඹ පාරිභෝගික මිල දර්ශකය මගින් මනිනු ලැබූ පරිදි උද්ධමනය පෙබරවාරි මස 4.8% සිට 6.2% දක්වා ඉහළ නැගිනි.

2020 දෙවන භාගය වන විට උද්ධමන පීඩනය සමනය කරමින් 4% - 4.2% ක පරාසයක ස්ථාවර ලෙස උද්ධමනය රැඳී පැවතිණි. (2020 දෙසැම්බර් අවසානය වන විට එය 4.2% ක් විය.) ශ්‍රී ලංකා මහ බැංකුවේ මධ්‍යකාලීන සාර්ව ආර්ථික ආකෘතිය ප්‍රකාර 2021 හා 2022 වර්ෂය සඳහා ප්‍රක්ෂේපිත වාර්ෂික උද්ධමන සාමාන්‍ය පිළිවෙලින් 5% හා 5.8% විය.

උද්ධමනය ප්‍රස්තාරය 02



මූලාශ්‍රය: සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

බාහිර ක්ෂේත්‍රය - වෙළඳ ශේෂය

විදේශ විනිමය අවදානමෙන් මිදී ශ්‍රී.ල.රු. රැකගැනීම පිණිස මුදල් අමාත්‍යංශය විසින් 2020 අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි ආනයන භාණ්ඩ රැසක් මත සීමා පනවන ලදී. එහි ප්‍රතිඵල ලෙස අපනයන ඉපයීම් අඩුවීම මඟහරවා ගැනීමට ආනයන වියදම් අඩුවීම ඉවහල් විය. (2020 දී ආනයන 14.4% කින් අඩු වූ අතර අපනයන 3.5% කින් පහත වැටිණි.) මෙමඟින් 2020 අවසානය වන විට වෙළඳපරතරය සැලකිය යුතු ලෙස ඇ.ඩො.මි.562 කට සංකෝචනය විය. එය 2019 අවසානයේ පැවති අගය වූ ඇ.ඩො.මි. 784 සිට ඇ.ඩො.මි. 222.29 ක් දක්වා (28.3% ක) අඩුවීමකි.

අප්‍රේල් මස වන විට අපනයන කර්මාන්තය ඉතාම අවම මට්ටමක පැවති අතර 2020 ජූලි වන විට ඇ.ඩො.බි. 1 ඉක්මවූ අපනයන හේතු කොට ගෙන මාස 4 ක කාලසීමාව තුළ "V" හැඩැති ප්‍රකෘතියක් අත්කර ගන්නා ලදී. කෙසේ වුවද, ඔක්තෝබර් මුල සිට යළි කොවිඩ් වෛරසය හිස එසවීමෙන් උපකාරක සේවා හා දේශීය නිෂ්පාදනයට එල්ල වූ බාධා මෙන්ම විදෙස් ගැනුම්කරුවන්ගේ ඉල්ලුම මන්දගාමීවීම මත වසරේ ඉදිරි කාලසීමාව තුළ අපනයන ආදයම අඩුවිය.

එසේ වුවද වසර අවසානය වන විට වෙළඳ ශේෂය විස්තාරණයවීම ඇරඹිණි. ශ්‍රමික ප්‍රේෂණ ඉහළයාම, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කිරීම්, දේශීය ඉල්ලුම සීමාවීම, ජාත්‍යන්තර තෙල් මිල ගණන් පහළයාම මඟින් වෙළඳ පරතරය අඩුවීම නිසාවෙන් බාහිර ක්ෂේත්‍රය වෙත එල්ල වූ පීඩනය අඩු වූ බව පෙනෙන්නට තිබේ.

2021 දී ජාත්‍යන්තර තෙල් මිල, සහල් ආනයනය සහ අතරමැදි ආනයන වියදම් (නිෂ්පාදකයින් සඳහා පොහොර හා අමුද්‍රව්‍ය) යනාදිය ඉහළයාමේ ප්‍රවණතාවයක් ඇති හෙයින් 8.2% ක් දක්වා වෙළඳ පරතරය ඉහළයනු ඇතැයි යන්න ශ්‍රී ලංකා මහ බැංකු මධ්‍ය කාලීන සාර්ව ආර්ථික ආකෘතියට අනුව පෙන්නුම් කරයි. එසේ වුවද වසංගත බිය තුරන්වීමත් සමඟ දේශීය සේවා (උදා: ප්‍රවාහන) සහ සේවා අපනයන (උදා: තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලීන් බාහිර සේවා සැපයුම් ආයතන වෙතින් සපයනු ලබන) යන ක්ෂේත්‍ර ද්විත්වයේම දියුණුව මෙන්ම සංචාරක කර්මාන්තය යළි ප්‍රකෘතිමත්වීම හා නිෂ්පාදනය හා අපනයනය දිරිගන්වන සුළු දේශීය ප්‍රතිපත්ති සම්පාදනය ද ඇතුළුව ගෝලීය ඉල්ලුම ඉහළ යාම හේතු කොට ගෙන මධ්‍ය කාලීනව ශ්‍රී ලංකාවේ බාහිර සේවා ක්ෂේත්‍රය ශක්තිමත් වනු ඇති බවට අපේක්ෂිතය.

බාහිර වාණිජ ක්ෂේත්‍රය

ප්‍රස්තාරය 03



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

දළ නිල සංචිත

රටෙහි දළ නිල සංචිත 2020 වර්ෂය තුළ ක්‍රමක්‍රමයෙන් අඩු වී යනු ලැබුවේ වර්ෂය ආරම්භයේ පැවති ඇ.ඩො.බි. 7.6 සිට වසර අවසානයේ වූ ඇ.ඩො.බි. 5.7 තෙක් වන අතර එමගින් මාස 4.2 ක ආනයන ආවරණයක් ලැබිණි. සෙසු නැගී එන ආර්ථිකයන්ට සමානව ශ්‍රීලංකාවේ සෘජු විදේශ ආයෝජන ගලාඒම්හි අඩුවීමක් ද රුපියල් වලින් නම් කරන ලද රාජ්‍ය සුරැකුම්පත් හා ස්කන්ධ වෙළඳපළ මගින් පිටතට ගලායෑම් ද වාර්තා විය. 2020 මාර්තු සිට 2021 අප්‍රේල් අතරතුර සංචාරකයන් සඳහා මෙරට ගුවන්තොටුපළ වසා තිබීම මත සංචාරක කර්මාන්තයෙන් ලද ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස අඩුවීමක් සිදු වූ අතර 2020 වර්ෂය පුරාවට සංචාරක ක්ෂේත්‍රය ඇණහිටීමට එය හේතු විය. සංචාරක අංශයෙන් ලද ඉපයීම් 2019 වර්ෂයේ ඇ.ඩො.මි. 3,607 ක සිට පසුගිය වසර තුළ ඇ.ඩො.මි. 957 ක් දක්වා 73.5% කින් පහත බසින ලදී. 2020 ඔක්තෝබර් 02 වන දින ඇ.ඩො.බි. 1.0 ක රාජ්‍ය බැඳුම්කර ආපසු ගෙවීම ද සංචිත තවදුරටත් පහත හෙළීමට හේතු විය. එමෙන්ම ආනයන මාස අතින් ගත් විට දළ නිල සංචිත 2021 දී තවදුරටත් මාස 3.7 කට අඩු වනු ඇති බවට ප්‍රක්ෂේපිතය.

සංචිතවල තත්ත්වය

ප්‍රස්තාරය 04



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහෙයුම් පරිසරය

විදේශ විනිමය

ඒ වන විටත් පීඩනයට පත්ව සිටි බාහිර සේවා ක්ෂේත්‍රය, 2020 මාර්තු මස ඇරඹුණු වසංගත තර්ජනයත් සමග ශ්‍රී ලංකා රුපියල මත තව දුරටත් පීඩනයක් ඇති කරන ලදී. කෙසේ වුවද ආනයන සීමා පැනවීම මගින් ශ්‍රී ලංකා රුපියල වෙත ඇති විය හැකිව තිබූ උග්‍ර පහත බැසීම වැළකෙන ලදී. වසරකට පෙර පටන් රුපියල 3.3% කින් සැලකිය යුතු ලෙස පහත බසින ලදී. රජය මගින් හඳුන්වා දෙනු ලැබූ ආනයන සීමා සහ දේශීය විනිමය වෙළඳපළ තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත්වීම මත රුපියල මත ඇති වන පීඩනය අඩු වූ අතරම 2020 දෙසැම්බර් අග වන විට විනිමය අනුපාතිකය ඇ.ඩො. 187.18ක ස්ථාවර විය.

මූල්‍ය ක්ෂේත්‍රය

වසංගතය මගින් උදා වූ බලපෑම අවම කිරීමට ශ්‍රී ලංකා රජයේ ෆිස්කල් ප්‍රතිපත්තිවල අවධානය යොමුවූ බැවින් දේශීය ආර්ථිකය සම්බන්ධයෙන් පෙර වර්ෂයේ නොගෙවූ බිල්පත් සහිතව ෆිස්කල් ඒකාබද්ධවීම් තර්ජනයක් විය. 2020 වසරේ ප්‍රථම මාස 11 තුළ රාජ්‍ය ආදායම සහ දීමනා 2019 වසරේ සමරූපී කාලසීමාවට සාපේක්ෂව 28% කින් ශ්‍රී.ල.රු.බි. 1262.1 දක්වා අඩු විය. 2020 වසරේ ප්‍රථම මාස 11 තුළ බදු ආදායම 30.0% කින් අඩුවීම, මෙම තත්ත්වයට තුඩුදුන් ප්‍රධානතම සාධකය විය.

2019 වසරේ අවසන වාර්තා වූ රු.බි. 13,031.5ට සාපේක්ෂව 2020 නොවැම්බර් මස අවසන වන විට රාජ්‍ය ණය ප්‍රමාණය රු.බි.14,817.8 ක් දක්වා 13.7% කින් ඉහළ යන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය හා 2015 - 2019 අතර කාලසීමාව තුළ මන්දගාමී ආර්ථික සංවර්ධනය හේතුවෙන් උද්ගත සාර්ව ආර්ථික තත්ත්වය මත 2020 අවසානය වන විට ණය, දළ දේශීය නිෂ්පාදිතයෙන් 94.3% දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය.

මධ්‍යකාලීන සාර්ව මූල්‍ය ආකෘතිය තුළ 2025 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් 4.0% ක් දක්වා මූල්‍ය පරතරය සීමා කිරීමටත්, ණයට දළ දේශීය නිෂ්පාදිතය අනුපාතය 75.5% දක්වා සීමා කිරීමටත් ශ්‍රී ලංකා රජය කටයුතු කරයි. මීට අමතරව, 2015 - 2021 දක්වා ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතා අතර විරැකියාව 4.0% ක මට්ටමක හෝ ඊට අඩුවෙන් රඳවා ගනිමින් 6.0% ක ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමටත් මූලික අතිරික්තයක් අත්පත් කර ගනිමින් පොලී අනුපාත තනි ඉලක්කමක පවත්වා ගැනීමට වගබලා ගැනීමත් අයත් වේ.

ණය ශ්‍රේණිගත කිරීම්

කොවිඩ්-19 හා බැඳුණු ගැටළු හේතුවෙන් රටෙහි දළ දේශීය නිෂ්පාදිතයට ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය ශීඝ්‍ර ලෙස වර්ධනය වෙතැයි ද සීමාසහිත වන මූල්‍යමය විකල්ප මත ණය තිරසාර අවදානම උග්‍රවනු ඇතැයි යන තර්ක අනුව ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන විසින් 2020 වර්ෂය තුළ රටෙහි ණය ශ්‍රේණිගත කිරීම් පහළ හෙළන ලදී. 2021 - 2025 කාලසීමාව තුළ රජයේ බාහිර ණය බැඳීම් ඇ.ඩො.බි. 23.2 ක අගයක් ගත් අතර වාර්ෂිකව එම අගය ඇ.ඩො.බි. 4.0 කි. මෙකී නියෝජිතායතනවල මූලික අදහස නම්, දැනට පවතින මූල්‍ය ව්‍යුහය අනුව ශ්‍රී ලංකාවේ මූල්‍යකරණය හා ණය සේවා අභියෝග වඩාත් උත්සන්න වන බවත්, එහි ප්‍රතිඵල ලෙස රාජ්‍ය පොලියට ආදායම් අනුපාතය ඉතා ඉහළ අගයක් ගනු ලබන බවයි. 2016 - 2020 අතර කාලය තුළ පොලී සාමාන්‍යයට ආදායම් අනුපාතය 50% ක් පමණ විය. ශ්‍රී ලංකා රජයේ ණය ශ්‍රේණිගත කිරීම් අඩු කිරීම, රටෙහි බාහිර ණය ගැනීම් පිරිවැය ඉහළ දැමීමට හේතු වෙයි. කෙසේ වුවද, සැලකිය යුතු කරුණක් වන්නේ රජය විසින් මෙකී ශ්‍රේණිගත කිරීම් පහළ දැමීම අභියෝගයට ලක් කර ඇති බව හා එවැනි මත ඉදිරිපත් කිරීම හමුවේ වුවද 2020 ඔක්තෝබර් මස කල් පිරුණු ජාත්‍යන්තර බැඳුම්කර ද ඇතුළුව සියලු බැඳීම්වල කල්පිරීම් වගකීම් නිසි පරිදි ගෙවීමට පියවර ගනු ලැබූ බවයි.

ශ්‍රේණිගත කිරීමේ ආයතන	2020 අවසානය වන විට ශ්‍රේණිගත කිරීම	මීට ඉහත ශ්‍රේණිගත කිරීම
ෆිච්	2020 නොවැම්බර් - CCC	B (-) (සෘණ)
එස් ඇන්ඩ් පී	2020 දෙසැම්බර් - CCC+ (ස්ථාවර)	B (-) (ස්ථාවර)
මූඩීස්	2020 සැප්තැම්බර් - CAA1 (ස්ථාවර)	B2 (සෘණ)

මූල්‍ය ක්ෂේත්‍රය →

පෞද්ගලික අංශයට තවදුරටත් ණය සැපයීමේ මාර්ගයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්තිමය අනුපාතික ඉතිහාසගත ලෙස අඩු මට්ටමකට ගෙන එමින් වර්ෂය පුරාම සහනශීලී මූල්‍ය ප්‍රතිපත්ති පවත්වාගනු ලැබිණි. වර්ෂය තුළ ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාත සහ ස්ථාවර ණයදීම් පහසුකම් අනුපාත යන ද්විත්වයම මුළු පදනම් ලකුණු 250 කින් එනම් වසර තුළ 5 වරක් අඩු කෙරිණි. (වසරාවසානයේ පිළිවෙලින් 4.5% ක් හා 5.5% ක්) එමෙන්ම ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය දෙවරක් මුළු පදනම් ලකුණු 300 කින් අඩු විය. (වසර අවසානයේ 2.0% ක්)

මෙමගින් බැංකුවලට යම් සහනයක් අත්කර ගැනීමට අවකාශ සැලසුණු අතර බැංකු පද්ධතියට සිය ණය කළඹ වර්ධනය කර ගැනීමට හැකි විය. තවද බැංකු පද්ධතියට තව දුරටත් අඩු පිරිවැයට අරමුදල් සහය සපයමින් වර්ෂය තුළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 15% සිට 8.5% දක්වා පදනම් ලකුණු 650 කින් අඩු කෙරිණි. මීට අමතරව මූල්‍ය ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය වේගවත් කරනු පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තෝරාගත් ණය නිමැවුම් මත පොලී අනුපාත කඩයිම් යොදා, සහනදායී පොලී අනුපාත යටතේ විශේෂ ණය යෝජනා ක්‍රම හා ණය ගෙවීමේ සහන කාලසීමා හඳුන්වාදීම සිදු කෙරිණි. එමෙන්ම 2020 අගෝස්තු සිට ණය කාඩ්පත්, (18%) පෙර සුදානම් කළ තාවකාලික බැංකු අයිරා, (16%) උකස් (10%) සහ දඩ පොලී වැනි වෙනත් පොලී අනුපාතික ද අඩු කරන ලදී. වර්ෂය පුරාම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය ආර්ථිකයට සහය පිණිස වෙළඳපළ ණය අනුපාතික අඩු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරිණි. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වර්ෂය තුළ අභිමතය පරිදි ගෙවීම් සිදු කිරීමේ සීමා පනවමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විධානයක් නිකුත් කෙරිණි.

2020 වසර පුරාම මෙවැනි මූල්‍යමය සහන ස්ථාවරව සැපයුවද පෞද්ගලික අංශයට ණය වර්ධනය දෙසැම්බර් අවසානය වන විට අපේක්ෂිත මට්ටම වන 6.5%ට වඩා අඩු අගයක පැවතිණි. රටෙහි ආර්ථිකය ප්‍රකෘතියට පත්වීම දිරි ගැන්වීමට සරිලන සහනදායී මූල්‍ය ප්‍රතිපත්තියක් අඛණ්ඩව පවත්වා ගැනීම ශ්‍රී ලංකා මහ බැංකුවේ දැක්මයි. අඩු උද්ධමන, අඩු පොලී අනුපාතික වාතාවරණයක් තුළ පෞද්ගලික අංශයට ලබා දෙන ණය ප්‍රමාණය 2021 දී 14.0% කින් පමණ ඉහළ යනු ඇතැයි ද මධ්‍ය කාලීනව වාර්ෂිකව 12.0% - 12.5% අතර ප්‍රතිශතයකින් වැඩි වනු ඇතැයි ද අපේක්ෂා කරයි. රටේ ආර්ථිකයේ හදවත බඳු වන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර කෙරෙහි විශේෂ අවධානය යොමු වනු ඇත.

මූල්‍ය ප්‍රතිපත්ති සමාලෝචන ක්‍රියාත්මක දිනය	ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාතිකය	ස්ථාවර ණය පහසුකම් අනුපාතය	ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව	බැංකු අනුපාතය
2020 ජනවාරි 30	6.50	7.50	5.00	15.00
2020 මාර්තු 17	6.25	7.25	4.00	15.00
2020 අප්‍රේල් 03	6.00	7.00	4.00	15.00
2020 අප්‍රේල් 16	6.00	7.00	4.00	10.00
2020 මැයි 06	5.50	6.50	4.00	9.50
2020 ජූනි 16	5.50	6.50	2.00	9.50
2020 ජූලි 09	4.50	5.50	2.00	8.50
2020 අගෝස්තු 20	4.50	5.50	2.00	8.50

වගුව 02 මූල්‍ය ප්‍රතිපත්ති සමාලෝචනය

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

මෙවන් පසුබිමක් යටතේ වර්ෂය තුළ රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රතිලාභ ද සැලකිය යුතු ලෙස අඩුවීමක් පෙන්නුම් කෙරිණි. 2020 දෙසැම්බර් මස අවසානය වන විට ප්‍රාථමික වෙළෙඳපළ භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රතිලාභ ද දින 91, දින 182 හා දින 364 කල්පිරීම් කාල සීමා සඳහා පදනම් ලකුණු 282කින්, පදනම් ලකුණු 322කින් හා පදනම් ලකුණු 340කින් පිළිවෙලින් 4.69%, 4.80% සහ 5.05% දක්වා අඩුවිය.

2020 වර්ෂය පුරාවට භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපළ තුළ ඉතිහාසගත ලෙස අඩු ප්‍රතිලාභ අනුපාතික නිරීක්ෂණය විය. ප්‍රාථමික වෙළෙඳපළෙහි සියලු කල්පිරීම් අවස්ථාවලදී අඩු ප්‍රතිලාභ විද්‍යාමාන වීමට අනුව අනුගතව රාජ්‍ය සුරැකුම්පත් මත ද්විතීයික වෙළෙඳපළ ප්‍රතිලාභ වක්‍රය ද 2019 වසරාවසානයට සාපේක්ෂව 2020 වසරාවසානය වන විට පහළ වැටීමකට ගළපන ලදී. වසංගත තත්ත්වය හා බැඳුණු අවිනිශ්චිතතාවය හේතුකොටගෙන කෙටිකාලීන. අවදානම් රහිත ආයෝජන කෙරෙහි වැඩිවන කැමැත්ත පිළිඹිබු කරමින් කෙටිකාලීන කල්පිරීම් ප්‍රතිලාභ අඩුවීම, දිගුකාලීන කල්පිරීම් ප්‍රතිලාභවලට සාපේක්ෂව වැඩිවිය. මූල්‍ය වෙළෙඳපළ තුළ 2020 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා ඒක්ෂණ සහ ප්‍රතිමිලදී ගැනීම් අනුපාතික පැහැදිලිවම අඩුවීමේ ප්‍රවණතාවයක් දක්වයි. 2020 දෙසැම්බර් අවසානය වන විට ඊට පෙර වර්ෂාවසානයේ වාර්තා කළ 7.40% - 7.55% ප්‍රතිශතය හා සසඳන විට ඉහත අනුපාත 4.53% - 4.55% අතර ප්‍රතිශතයක රැඳී පැවතුණි.

ශ්‍රී ලාංකික බැංකු ක්ෂේත්‍රය

2020 අවසානය වන විට බැංකු ක්ෂේත්‍රය බලපත්‍රලාභී වාණිජ බැංකු 24 කින් හා බලපත්‍රලාභී විශේෂිත බැංකු 6 කින් සමන්විත විය. බැංකු ක්ෂේත්‍රය තුළ මුළු වත්කම් පදනම 2019 දෙසැම්බර් අවසානයට වාර්තා කළ රු.ට්‍රි.12.5 ට සාපේක්ෂව 17.1% ක වර්ධනයක් වාර්තා කරමින් 2020 අවසානයට රු.ට්‍රි. 14.7 දක්වා වැඩි වී ඇත. වත්කම්වල වැඩිවීම සඳහා ආයෝජනයන්හි 39.7% ක පුළුල්වීම මෙන්ම ණය හා අත්තිකාරම් අතින් 11.9% ක වර්ධනය ප්‍රධාන වශයෙන්ම හේතු විණි. එසේ වුවද අහිතකර ගොලීය හා දේශීය ආර්ථික තත්ත්වය මත හටගත් ඉහළ ණය අවදානම, 2020 දී ලාභදායීතාව හා වත්කම්වල ගුණාත්මකබව පරිහානියට පත් කරවන සුළු විය.

ණය වර්ධනය

2020 වර්ෂය තුළ බැංකු ක්ෂේත්‍රය, ණය සම්බන්ධයෙන් සමස්තයක් වශයෙන් ගත් විට පුළුල්වීමක් පෙන්නුම් කරනු ලැබුණු මුත් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන්ම තුඩු දුන්නේ රජයට හා රජයට අයත් ආයතන වෙත ලබා දුන් ණය හා අත්තිකාරම් බව පෙනී යයි. පෙර වර්ෂයට සාපේක්ෂව එකම දිනට මෙම වර්ෂයේ ණය වර්ධනය 2019 දෙසැම්බර් මස පැවති 5.6% ක් වූ අවම අනුපාතිකයේ සිට 2020 දෙසැම්බර් වන විට 11.9% දක්වා වැඩිවිමක් පෙන්වා ඇත.

2019 වසරාවසානයට වාර්තා කළ 6.4% ක හා 5.4% ක වර්ධනයට සාපේක්ෂව පෙර වර්ෂයේ එම දිනට එනම්, 2020 වසරාවසානයට රුපියල් ණය හා විදේශ විනිමය ණය (ඇ.ඩො.වලින්) 10.1% ක් හා 12.4% ක් බැගින් පිළිවෙලින් වර්ධනය විය.

ණය ගුණාත්මකභාවය

2020 වසරේදී බැංකු ක්ෂේත්‍රයට අදාළව බලපෑ බලවත්ම සාධකයක් වූයේ අඩුවෙමින් පැවති ණය ගුණාත්මකභාවය හා ඒ සමඟ බැඳුණු අත්‍යන්ත අවදානමයි. 2017 වසර අවසානයේ සිට ණය හා අත්තිකාරම් ආපසු ගෙවීම් පැහැර හැරීමේ ඉහළ ප්‍රවණතාවයක් ක්ෂේත්‍රය තුළ ක්‍රමිකව දක්නට ලැබිණි. 2020 වසර පුරා ව්‍යාප්ත වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය මෙන්ම 2019 දී එල්ල වූ පාස්කු ඉරුදින ප්‍රහාරය ද හේතුවෙන් ව්‍යාපාරික ලෝකය තුළ ඇති වූ අහිතකර වාතාවරණය මෙම තත්ත්වය තවදුරටත් බැරෑරුම් කිරීමට තුඩු දෙන ලදී.

වසංගත තත්ත්වය මත බලපෑමට බඳුන් වූ පුද්ගලයන් හා ව්‍යාපාර සඳහා ලබාදුන් ආපසු ගෙවීමේ සහන කාලසීමා හේතුකොට ගෙන ණය හා අත්තිකාරම් වර්ගීකරණය අත්හිටුවනු ලැබුවද 2020 වසර අවසානය වන විට බැංකු ක්ෂේත්‍රයේ සමස්ත අක්‍රීය ණය ප්‍රතිශතය 4.9% ක් ලෙස ඉහළ යනු ලැබුවේ 2019 දෙසැම්බර් අගය වූ 4.7% ට වඩා මද වර්ධනයක් සමගිනි. නිෂ්පාදන ක්ෂේත්‍රය ඉහළම අක්‍රීය ණය ප්‍රතිශතය වූ 8.7% ක් වාර්තා කළ අතර ඉන් අනතුරුව පිළිවෙලින් වෙළඳ ක්ෂේත්‍රය (7.4%), කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය (6.9%), සංචාරක ක්ෂේත්‍රය (6.8%) සහ ඉදිකිරීම් ක්ෂේත්‍රය (6.4%) දක්නට ලැබිණි. 2019 සැප්තැම්බර් මස අවසානයේ 38.2%ක ප්‍රතිශතයක සිට 2020 වසරේ සැප්තැම්බර් අවසානය වන විට නිශ්චිත ප්‍රතිපාදන ආවරණ අනුපාතය 45.9% ක් දක්වා ඉහළ යනු ලැබිණි. වත්කම්වල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් උද්ගතවූ සමස්ත බලපෑම නිසි ලෙස හඳුනාගත හැකි වනුයේ ණය ආපසු ගෙවීමට ලබා දී ඇති සහන කාලසීමාව අවසන් වීමෙන් අනතුරුවය.

මෙහෙයුම් පරිසරය

අරමුදල් සැපයීම

දිගින් දිගටම බැංකු ක්ෂේත්‍රය සඳහා අරමුදල් සපයන ප්‍රධානතම මූලාශ්‍රය, තැන්පතු වූ අතර සමස්ත වත්කම් කළඹින් 76.0% ක අගයක් ගන්නා තැන්පතු, වර්ෂය තුළ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරන ලදී. වසංගත තත්ත්වය මත අභිමත පරිදි සිදු කළ හැකි වියදම්වල පහත බැසීම මෙන්ම බැංකු නොවන මූල්‍ය ආයතන ක්ෂේත්‍රයේ සිට බැංකු ක්ෂේත්‍රයට තැන්පතු ගලාඒම මෙම වර්ධනයට මූලික වශයෙන්ම බලපාන්නට ඇති බව පෙනී යයි. 2019 සිට 2020 දක්වා අතර කාලසීමාව තුළ 7.9% සිට 21.6% දක්වා තැන්පතුවල වර්ධනයක් වාර්තා කෙරිණි. මෙකී වර්ධනය තැන්පතු වෙතින් විද්‍යමානවීමත් සමඟ තැන්පතු වර්ධනයට සාපේක්ෂව ණය වර්ධනයෙහි අඩුවක් සනිටුහන් කරමින් 2019 දෙසැම්බර් මස ණයට තැන්පතු අනුපාතය 88.7% සිට 2020 අවසානය වන විට 81.6% දක්වා පහත වැටිණි.

ලාභදායීතාව

2020දී බැංකු ක්ෂේත්‍රයේ සමස්ත ලාභදායීතාව පහත වැටිණි. මෙයට බොහෝ දුරට හේතුවී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ යුක්තිසහගත හා සහනදායී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් ඇති වූ ශුද්ධ පොලී ආන්තිකයයි. මෙය පොලී නොවන ආදායමේ වැඩිවීමක් සහ පෙර වසරට සාපේක්ෂව 2020 තුළ පොලී නොවන වියදම් සහ බදු අඩුවීම් නිසා තරමක් දුරට වෙනස් විය. පෙර වර්ෂයේ වාර්තා වූ 8.1% ක වර්ධනයට සාපේක්ෂව සමාලෝචනයට බඳුන් වූ වර්ෂය තුළ ශුද්ධ පොලී ආදායම 0.9% කින් පහත වැටිණි. ඒ අනුව, 2019 වසරේ පැවති 3.6% ක ප්‍රතිශතයට සාපේක්ෂව ශුද්ධ පොලී ආන්තිකය ද 2020 දී 3.1% දක්වා පහත යන ලදී. ක්ෂේත්‍රයේ වත්කම් මත ප්‍රතිලාභ 2019 වසරේදී 0.9% සිට 2020 වසර සඳහා 1.0% දක්වා ඉතා සුළු ප්‍රමාණයකින් වර්ධනය විය. ඒ අතර ස්කන්ධය මත ප්‍රතිලාභ 2020 වසරාවසානය වන විට 10.3% සිට 11.3% දක්වා ඉහළ නැගිණි.

ප්‍රාග්ධනය හා ද්‍රවශීලතාව

සැබවින්ම ගත් විට, වසංගත තත්ත්වය මත මූල්‍ය ක්ෂේතයට එල්ල වූ කම්පනය බාහිරින් එල්ල වුණු තර්ජනයකි. (උදාහරණ වශයෙන් එය 2007 - 2008 යුගයේ පැවති ගෝලීය මූල්‍ය අර්බුදය මෙන් ක්ෂේත්‍රය තුළින් පැන නැගුණක් නොවේ.) දූරදර්ශී නියාමන කොන්දේසි ක්‍රියාවට නැංවීමත් සමඟ එහි ප්‍රතිඵල ලෙස වසංගත තත්ත්වය ආරම්භයේදීම ප්‍රාග්ධන හා ද්‍රවශීලතා අතින් අවදානම් හා අවහිරතා වලට මුහුණදීමට හැකි තලයක බැංකු ක්ෂේත්‍රය පැවතිණි.

පෙර නොපැවති මූල්‍ය සහන සැලසීම, නියාමන සීමා ලිහිල් කිරීම් සහ ණය හා අත්තිකාරම් සඳහා වූ අඩු ඉල්ලුම හා බැඳුණු කැපී පෙනෙන තැන්පතු වර්ධනය මෙන්ම ද්‍රවශීල වත්කම් යන්නෙහි නිර්වචනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංශෝධනය කිරීම යනාදිය මගින් 2020 වර්ෂය තුළ බැංකු ක්ෂේත්‍රය සතුව ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගන්නා බවට වගබලා ගන්නා ලදී. අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාව වූ 20.0% මනාව ඉක්මවමින් 2020 දෙසැම්බර් අවසානය වනවිට බැංකු ක්ෂේත්‍රයේ දේශීය බැංකු ඒකකවල ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය 37.3% ක්ව පැවතීමට ඉහත සාධක හේතු විය.

බැංකු ක්ෂේත්‍රය 2020 අවසානය වන විට 13.0% ක ස්ථර 1 ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකයක් ද 16.5% ක සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකයක් ද සමගින් සාර්ථක ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකයක් පවත්වා ගැනීමට සමත් විය. මෙම අගයන් ද්විත්වයම දේශීයව මූල්‍ය පද්ධතියට වැදගත් මෙන්ම දේශීයව මූල්‍ය පද්ධතියට වැදගත් නොවන බැංකු සඳහා පිළිවෙලින් 8.5% / 9%. සහ 12.5% / 13.0% බැගින් වූ බාසල් III යටතේ සපුරාලිය යුතු අවම අවශ්‍යතා සීමාවන් වන 8.0% හා 12.0% යන මට්ටම් මැනවින් ඉක්මවාලීය.

ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඉදිරි දැක්ම

ඉදිරි වර්ෂය බැංකු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අභියෝගාත්මක වර්ෂයක් වනු ඇත. ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය කිරීම සඳහා වන රජයේ උත්තේජක මුලපිරීම් සහ ණය අනුපාතිකයන් අඛණ්ඩව පහත හෙළීම, විශේෂ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ ආයෝජකයන්ගේ අපේක්ෂා ඉහළ යාම යනාදිය මගින් ණය සඳහා ඇති ඉල්ලුම ඉහළ නැංවීමට බලාපොරොත්තු වන අතර කෙටිකාලීනව හා මධ්‍යකාලීනව දැකිය හැකි ණය වර්ධනයක් අපේක්ෂිතය. එසේ වුවද බැංකු ක්ෂේත්‍රයේ අක්‍රීය ණය පොලී අනුපාත තත්ත්වය පිළිබඳ සම්පූර්ණ අදහසක් ලබාගත හැකි වන්නේ 2021 වසරේදීය. දිග් ගැස්සුණු අඩු පොලී අනුපාත පරිසරයක් තුළ ශුද්ධ පොලී ආන්තික කෙරෙහි අඛණ්ඩව පීඩනයක් යෙදෙන අතර බැංකුවල ව්‍යාපාරික ආකෘතීන් ඒවායේ ලාභදායීතාව අනුව නැවත ඇගයීමට ලක් කළ යුතුය.

ඒ සඳහා වෙළඳපළ මෙහෙයවන ඒකාබද්ධ ක්‍රියාවලියක් වෙනුවෙන් පහසුකම් සැලසීමේ ස්ථාවරය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගෙන යන අතර, ලාභදායීතාව සහ ඔරොත්තුදීමේ හැකියාව අතින් සැලකිය යුතු ලෙස අභියෝගයට ලක් වන කුඩා බැංකු වලට තනි තනිව හෝ විශාල බැංකු හා ඒකාබද්ධ වී වඩාත් ශක්‍ය හා කල් පවත්නා මූල්‍ය ආයතන බිහි කිරීමට එමගින් අවස්ථාව උදා වේ. අර්බුදකාරී වාතාවරණයකට මුහුණදීමට තිබිය යුතු සූදානම පිළිබඳව ද කොවිඩ්-19 වසංගතය මගින් අවධාරණය කෙරිණි. එමෙන්ම එබඳු අවිනිශ්චිතතාවයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ දැක්වෙන ප්‍රතිසාධන සැලසුම් යාවත්කාලීන කිරීමට බලපත්‍රලාභී බැංකුවලට අවශ්‍ය වනු ඇත. මෙහිදී බැංකු ක්ෂේත්‍රය තුළ හටගත් සාධනීය විපර්යාසයක් වන්නේ වසංගත සමය තුළ දුරක සිට සැපයිය යුතු සේවා වලට අදාළව උද්ගත වූ ශීඝ්‍ර ඉල්ලුමට සරිලන පරිදි ඩිජිටල් බැංකුකරණ වියදම් වේගවත්ව ක්‍රියාත්මක වීමයි. ඩිජිටල් බැංකුකරණයට සහායවීම සඳහා නියාමන පරිසරය තුළ අපේක්ෂිත වෙනස්කම් හා බැංකුවල සයිබර් ආරක්ෂාව සහතික කිරීම සඳහා අධීක්ෂණ රාමුවක් සමඟ 2021 දී ඩිජිටල්කරණය වඩාත් ඉදිරියට යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

උපායමාර්ග සහ සම්පත් වෙන්කිරීම

ශක්තිමත් වටිනාකම් මත ගොඩනගන ලද අපගේ උපායමාර්ග තුළින් මෙහෙයුම් සංදර්භය පිළිබඳ අපගේ තියුණු අවබෝධය පිළිබිඹු කරන අතර එය අපගේ සියලුම පාර්ශ්වකරුවන්ට තිරසාරාත්මක ප්‍රතිඵල ලබාදෙමින් පාලන සහ අවදානම් කළමනාකරණ හැකියාවන් වර්ධනය කිරීම කරා මෙහෙයවයි.

උපායමාර්ගික සැලසුම් කිරීමේ ක්‍රියාවලිය

අපගේ උපායමාර්ග අප, අපගේ හැකියාවන්, වර්තමාන සහ අනාගත අවශ්‍යතා, අපගේ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් සහ අපගේ මෙහෙයුම් පරිසරය පිළිබඳ සලකා බලන ඒකාබද්ධ චින්තනය තුළින් ව්‍යුත්පන්න වේ. අපගේ ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම් කිරීමේ ක්‍රියාවලියේ වැදගත් අංගයක් වන්නේ කෙටි, මධ්‍ය සහ දිගුකාලීනව අප බැංකුවේ වටිනාකම් නිර්මාණය කිරීමේ හැකියාවට බලපාන සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට බලපාන සයවදෑරුම් ප්‍රාග්ධනය අතර සම්බන්ධතාවය, අන්‍යෝන්‍ය රඳාපැවැත්ම සහ විභව සමතුලිතතාවයයි. අපගේ ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම් කිරීමේ ක්‍රියාවලිය උපායමාර්ගික සංවර්ධනය සහ කෙටි, මධ්‍ය සහ දිගුකාලීන සංවර්ධනය ක්‍රියාවට නැංවීම ප්‍රේරණය කරයි.

අපගේ ඒකාබද්ධ උපායමාර්ගික සැලසුම් කිරීමේ ක්‍රියාවලියේ අංග තුන.

රූපසටහන 02

උපායමාර්ගික සංවර්ධනය

අපගේ උපායමාර්ගයන් පැහැදිලිවම අපගේ දැක්ම, මෙහෙවර සහ වටිනාකම් හා සම්බන්ධ කර ඇත. උපායමාර්ගික සංවර්ධන ක්‍රියාවලිය බාහිර සහ අභ්‍යන්තර ව්‍යාපාරික පරිසරය, අවස්ථාවන්, අභියෝග සහ අතීත ඉගෙනුම් සැලකිල්ලට ගනිමින් සිදු කරයි.

අපගේ උපායමාර්ගික සැලසුම් කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස, බැංකු ක්ෂේත්‍රය කෙරෙහි බාහිර නැමියාවන් බලපාන ආකාරය අවබෝධ කරගැනීම සඳහා අපි බාහිර පරිසරය සුපරීක්ෂණය කරමු. සක්‍රීය පාර්ශ්වකාර සහභාගිත්වය සමඟ අපගේ ව්‍යාපාර ආකෘතිය සහ මෙහෙයුම් පරිසරය තක්සේරු කිරීම මගින් වටිනාකම් එකතු කරන හෝ වියවුල් කරන අපගේ වැදගත් ගැටළු සහ අංග හැඩ ගස්වයි. වැදගත් කරුණු වලින් ඇතිවන අවදානම් සහ අවස්ථා කෙටි, මධ්‍ය සහ දිගුකාලය සඳහා අපගේ උපායමාර්ගික පරමාර්ථ වෙන්කිරීමට යෙදවුම් ලබා දේ.

උපායමාර්ගික යෙදවීම සහ සම්පත් වෙන්කිරීම

අපගේ ඒකාබද්ධ සැලසුම් කිරීමේ ක්‍රියාවලිය මගින් අපගේ උපායමාර්ග සහ ප්‍රධාන සම්පත් යෙදවීම් අපගේ මූල්‍ය සහ ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වලට එකතුකරන බව සහතික කරයි. අනාගත වර්ධනය සහ වගකීම් සහගත අවදානම් කළමනාකරණය අතර තුලනය කළ ප්‍රවේශයක් සහතික කිරීම සඳහා ඇතිවියහැකි අවස්ථාවන් අපගේ අවදානම් අභිරුචි රාමුව තුළ තක්සේරු කෙරේ.

අදාළ කළමනාකරණ කමිටු මගින් ඇගයීම් සිදුකර අනුමත කරන අපගේ දිගුකාලීන උපායමාර්ගික ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීම සඳහා දිගුකාලීන සැලසුම් කිරීමේ ක්‍රියාවලියට ඇතුළත් කර ඇත. කෙටි කාලීන හා මධ්‍ය කාලීන උපායමාර්ගයන් සහ ඉලක්ක දිගුකාලීන උපායමාර්ගික පරමාර්ථවලට සම්බන්ධකර බැංකුව තුළ ක්‍රියාත්මක කෙරේ. මෙම උපායමාර්ගයන් සහ සැලසුම් පැහැදිලිව දක්වා ඇති වගකීම් සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක සමඟ එක් එක් අංශ සඳහා බෙදා වෙන් කර ඇත.

අපගේ උපායමාර්ගික ව්‍යාපාරික සැලසුම් වැඩපිළිවෙල මගින් ප්‍රකාශිත උපායමාර්ගික පරමාර්ථ අත්කර ගැනීමට අවශ්‍ය කරන සම්පත් (තොරතුරු තාක්ෂණය, මානව සම්පත, මූල්‍ය සම්පත) හඳුනා ගැනීමට අපට හැකියාව ඇති කරයි. කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා සකසා ඇති අපගේ ක්‍රියාකාරී සැලැස්ම තුළින් දක්වා ඇති අපගේ අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය සම්පත් ඇති බවට ක්‍රියාකාරී කණ්ඩායම් විසින් සහතික කරනු ලබයි. සම්පත් ලබාගැනීමේ හැකියාව සහ පවත්නා සහ අපේක්ෂිත අවශ්‍යතා මත පදනම් වී, වැඩපියවර සහ නව ව්‍යාපෘති නැවත ප්‍රමුඛතාවයට පත්කරන සමහර විභව සමතුලිතතා සිදු කෙරේ.

අධීක්ෂණ අදියර

පරිසරය තුළ වෙනස්වීම්වලට ප්‍රබල ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීමට බැංකුව ශක්තිමත් කිරීම සඳහා, ක්‍රමෝපායන් සහ සැලසුම්වල ප්‍රගතිය කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ වාර්තා තුළින් කලින් කළ පසුවිපරම් කරන අතර, නිශ්චිත කාලපරාසයන් හි දී සමාලෝචනය කෙරේ. මෙම ක්‍රියාවලිය අත්කරගත් ප්‍රගතියට අනුව අපගේ උපායමාර්ගික වැඩපියවරවල ශක්තිමත්භාවය හඳුනාගැනීමට සහ පරීක්ෂා කිරීමට මෙන්ම අනාගතය තුළ සිදුවියහැකි සිදුවීම් පරීක්ෂා කිරීමට අපට හැකියාව ඇති කරයි.

කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS)/දර්ශක විශ්ලේෂණය තුළින් මාසික පදනමක් මත අයවැය සහ පෙර කාලපරිච්ඡේදවල කාර්යසාධනයට අනුව අපගේ කාර්යසාධනය ඇගයීමට ලක් කෙරේ. කාර්තුමය විශ්ලේෂණයක් තුළින්, ප්‍රධාන ව්‍යාපෘතිවල තත්ත්වය ඉලක්කවලට අනුව අපගේ උපායමාර්ගික කාර්යසාධනය නියාමනය කරන අතර අවශ්‍යනම් ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය තුළින් උපායමාර්ගික ඉදිරි දැක්ම මත පදනම් වී සමාලෝචන සිදුකරමු.

අපගේ කාර්යසාධනය සමාලෝචනය කිරීම සඳහා තුලනය කළ මිනුම් දර්ශකය මත පදනම් වී අපගේ ප්‍රධාන කාර්යසාධන දර්ශක නිර්වචනය කොට ඇත. ඒවාට මූල්‍ය සහ මූල්‍ය නොවන දර්ශක මෙන්ම ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සාධකද ඇතුළත් කර ඇත. අඛණ්ඩ නියාමනය මගින් මෙහෙයුම් ගැටළු ක්ෂේත්‍ර හඳුනාගැනීමට, වෙළෙඳපොළ ප්‍රවණතා සමාලෝචනය කිරීමට, ගනුදෙනුකාර අවශ්‍යතා සහ අපේක්ෂාවන් තක්සේරු කිරීමට, ව්‍යාපාරික ප්‍රතිඵල සහ ඉහළම ප්‍රමුඛතා විශ්ලේෂණය කිරීමට සහ අදාළ සහ තරඟකාරී ආකාරයෙන් රැඳී පැවතිම සඳහා අපගේ උපායමාර්ග සහ ව්‍යාපාර ආකෘතිය නැවත සකස් කිරීමට අපට හැකියාව ලබා දේ.

උපායමාර්ග සහ සම්පත් වෙන්කිරීම

දිගුකාලීන උපායමාර්ගික අරමුණු

ගනුදෙනුකරු මත පදනම්වීම

ජාතික ඉතිරි කිරීමේ බැංකුව තුළ, ගනුදෙනුකරුවන් අපගේ "ඉහළම වස්තුව" වන අතර ඔවුන්ගේ ප්‍රතිඵල අප කරන සෑම දෙයක්ම මෙහෙයවයි. තෝරාගත් බැංකුව බවට පත්වීමේ අපගේ උත්සාහයන්හී අපගේ ගනුදෙනුකාර මැදහත්වීම් තුළ සුපිරි ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදීමට අපි කැප වී සිටිමු. ගනුදෙනුකාර අවශ්‍යතා සමඟ අපගේ සම්පත් වෙන්කිරීමේ ක්‍රමෝපාය පෙළ ගස්වමින්, අපි නිරන්තරව ගනුදෙනුකරු මත පදනම් බැංකුවක් වන අතර ඉන් අපගේ ගනුදෙනුකරුවන්, ඔවුන් සමඟ අපගේ සම්බන්ධතා සහ ඔවුන් කෙරෙහි අපගේ කැපවීම අගය කරමු.

ශක්තිය සහ තිරසාරභාවය

අප තරඟකාරී, ලාභදායී සහ වගකීම් සහගත වටිනාකම මත අවධානය යොමු කරමින් ශක්තිමත්. තිරසාර සහ තුලනය කළ වර්ධනයක් අත්කර ගනී. මේ සම්බන්ධයෙන් මූල්‍ය නුබුන්වත්කම්, ප්‍රාග්ධන තත්ත්වය, ආදායම් මාර්ග වැඩි කිරීම, නව්‍යකරණය සහ තිරසාරභාවය ශක්තිමත් කිරීම මගින් දිගුකාලීන වටිනාකම උපරිම කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරමු.



පාලනය තුළ විශිෂ්ටත්වය

ආයතනික පාලනය තුළ ඉහළම ප්‍රමිති පවත්වා ගනිමින් අනුකූලතාව සහ අවදානම් කළමනාකරණය පිළිබඳ සංස්කෘතියක් අපි පෝෂණය කරමු. ව්‍යාපාර ක්‍රියාවලිය සහ බැංකුව තුළ පාලන පරීක්ෂාවන් කාර්යක්ෂම, ශක්තිමත් සහ ජාත්‍යන්තර යහ පරිචයන් හා සමගාමීබව සහතික කිරීම මගින් උපාය මාර්ග සහ තරඟකාරී වෙන්ස්කිරීම් කරන්නෙක් ලෙස පාලනය මෙහෙයවීම.

පරිවර්තනීය නායකයා

රජයට අයත් විශේෂිත බැංකුවක් ලෙස ආදර්ශය, මෙහෙයුම් අනර්ඝත්වය, මූල්‍ය අන්තර්කරණය, ගනුදෙනුකාර සේවාව, සහ ව්‍යාපාර ආචාරධර්ම හා අවංකකම පිළිබඳ නියමයන් සැකසීම තුළින් සැමවිටම අපි මෙහෙයවා ඇත. අපගේ සේවා සහ සියලුම ව්‍යාපාර ක්‍රියාවලීන්, බෙදාහැරීමේ මාර්ගවල නව්‍යකරණය ප්‍රවර්ධනය තුළින් සහ මතුවන අවස්ථාවන් හී ප්‍රාග්ධනීයකරණය මගින් සියලුම ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත අපි අඛණ්ඩව ඉහළ නංවමු.

කෙටිකාලීන හා මධ්‍යකාලීන සඳහා අපගේ උපායමාර්ග

ගනුදෙනුකරුවන්ගේ සේවා අත්දැකීම ඉහළ නැංවීම

ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නැංවීම අපගේ ප්‍රමුඛතාවන් එකකි. සමස්ථ ගනුදෙනුකාර අත්දැකීම වැඩි කිරීමට විවිධ ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලීම සඳහා අපි බහු -නාලිකා ප්‍රවේශයක් ගනිමු. අපගේ සන්නාමය සමඟ ගනුදෙනුකරු නිරතවන සෑම ස්ථානයකදීම අද්විතීය ගනුදෙනුකාර අත්දැකීමක් ලබාදීමට අපි බැඳී සිටිමු. තාක්ෂණය, පුද්ගලයින්, ක්‍රියාවලි, නිෂ්පාදන සහ සේවා කොටස තුළ අපගේ ආයෝජනයන් තුළින් ඒකාබද්ධ සහ වෙනස්කළ ගනුදෙනුකාර අත්දැකීම් ලබාදීම සඳහා අපගේ උත්සාහයන් තහවුරු කරයි. අපගේ ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කරන අතරම, අපි අපගේ භෞතික පිවිසුම් ස්ථාන පවත්වාගෙන වර්ධනය කරන බැවින් මාර්ග අතර වඩා පහසු සංක්‍රාන්තියක් අපගේ ගනුදෙනුකරුවන්ට ඇති කරයි.

සේවක සහභාගිත්වය වැඩි කිරීම

වඩා යහපත් ගනුදෙනුකාර ප්‍රතිඵල සහ අත්දැකීම් ලබාදීම සඳහා අපගේ සේවකයින් මත අපි රැඳී සිටිමු. නිවැරදි දක්ෂතා සහිත සේවයේ නිරත අභිප්‍රේරිත සේවක කණ්ඩායම් නිර්මාණය කිරීම අපගේ ව්‍යාපාරය ඵලදායී ආකාරයෙන් මෙහෙයවීමට මෙන්ම අපගේ පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කිරීමට අත්‍යවශ්‍යය. එමනිසා, ආරක්ෂිත සහ අගනා ප්‍රතිඵල ලබාදෙන පරිසරයන් නිර්මාණය කිරීම සහ ආදර්ශය මගින් මෙහෙයවන ඉහළින් දක්ෂ, අභිප්‍රේරිත, මනා සන්නිවේදනය, නිපුණතා සහිත ප්‍රතිග්‍රාහී සහ වගකීම් සහගත සේවයෙහි නියැලුනු සේවක කණ්ඩායම් පෝෂණය කිරීම මගින් නිවැරදි සේවකයින් ආකර්ෂණය කර රඳවාගැනීමට අපි කැප වී සිටිමු.

උපායමාර්ග සහ සම්පත් වෙන්කිරීම

අවදානම් සංස්කෘතියක් සවිබලගැන්වීම

නිරන්තරයෙන් වෙනස්වන පරිසරයක් තුළ ඇතිවන විවිධ අවදානම් ඵලදායි ආකාරයෙන් අපේක්ෂාකර පාලනය කිරීමට යහපත් අවදානම් සංස්කෘතියක් ස්ථාපිත කිරීම සඳහා අපි උත්සාහ කරන්නෙමු. අවදානම් විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම සඳහා අපගේ උපාය මාර්ග සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීම සහ අපගේ ව්‍යාපාර ආකෘතියට අනුව පෙළගස්වමින් එය වැඩිදියුණු කළ හැකි ආකාරය ගවේෂණය කරමු. අදාළ සියලුම රෙගුලාසි, ප්‍රමිති සහ මනා පරිචයන් සමඟ සම්පූර්ණයෙන් අනුකූලවීම මගින් සහ අපගේ අවදානම් හැකියාවන් ශක්තිමත් කිරීමට නව තාක්ෂණයන් යොදා ගනිමින් සදාචාරාත්මකව මෙහෙයවීමට සහ යහපත් අවදානම් සංස්කෘතියක් සවිබලගැන්වීමට අපි තවදුරටත් බැඳී සිටිමු.

ආදර්ශය මගින් මෙහෙයවීම

සමාජ-ආර්ථික සහ පාරිසරික අභියෝග ආමන්ත්‍රණය කරන විසඳුම්වලට දායකවීම මගින් බැංකුවේ ධනාත්මක බලපෑම විශාල කිරීමට අපි අරමුණු කරමු. ව්‍යාපාර මෙහෙයුම්වල සෑම ක්ෂේත්‍රයක් තුළම තිරසාරභාවය ඒකාබද්ධ කරන අතර එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDGs) අත්කර ගැනීමට අපි බැඳී සිටිමු. සමාජය සහ පරිසරය කෙරෙහි අපගේ බලපෑම පිළිබඳ අප දැනුවත් අතර වගකීම් සහගත සහ තිරසාර ව්‍යාපාර ව්‍යවහාරයන්හි සහභාගී වෙමින් සාමාජීය වටිනාකම නිර්මාණය කිරීමට අපි අඛණ්ඩව කැප වෙමු. දැඩි සමාජීය මූලයක් සහිත රජයේ ආයතනයක් ලෙස, ජාතික ඉතිරි කිරීමේ බැංකුවට ආදර්ශවත් ආයතනික පුරවැසියෙක් වීමේ සහ ආදර්ශය මගින් මෙහෙයවීමේ වගකීම ඇත.



ඓන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය

අපගේ ආරම්භයේ සිට, ශ්‍රී ලංකාව තුළ ඉතුරුම් සංස්කෘතියක් ඇති කිරීම සඳහා අපගේ විධි නියෝගය අත්කර ගැනීමට අපගේ ක්‍රම, මෙහෙයුම් සහ උපාය මාර්ගික ප්‍රමුඛතා අපි මෙහෙයවා ඇත. වසර 48ක මෙහෙයුම තුළ, සියලුම ශ්‍රී ලාංකිකයින් විසින් විශ්වාස කරන ආයතනය බවට අප පත්ව ඇත. මූල්‍ය ස්ථාවරත්වය සහ ඓන්ද්‍රීය වර්ධනය අත්කර ගැනීමට අපගේ ක්‍රම සහ ක්‍රියාවලි අපි උපයෝගී කර ගනිමු. බැංකුව තුළ බහු මාර්ගික උත්සාහ තුළින්, අපගේ පාර්ශ්වකරුවන්ට තිරසාර ප්‍රතිඵල වර්ධනය කර නිර්මාණය කිරීමට ගනුදෙනුකාර අත්දැකීම, සේවක සහභාගිත්වය සහ විචක්ෂණ අවදානම් කළමනාකරණය වර්ධනය කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරමු.



ඩිජිටල්කරණය වේගවත් කිරීම

ඩිජිටල් නවෝත්පාදනයන් අපට සැලකිය යුතු අවදානම් සහ අවස්ථාවන් ඉදිරිපත් කරයි. ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් සහ තෘප්තිය වැඩිදියුණු කිරීම, නව ආදායම් මාර්ග ගවේෂණය කිරීම සහ පිරිවැය අඩු කිරීම සඳහා අපි නව ඩිජිටල් නිෂ්පාදන සහ සේවාවන් ලබාදීම වේගවත් කරමු. කොවිඩ්-19 වසංගතයේ චර්යාත්මක ප්‍රතිඵල හේතුවෙන් ඩිජිටල් භාවිතයේ ඉහළයාමට හේතු වී ඇති අතර, ඉහළ නම්‍යශීලී වැඩපිළිවෙත් ප්‍රවර්ධනය වී ඇත. එබැවින් නවෝත්පාදනය, කඩාකප්පල් කිරීම් සහ සයිබර් ආරක්ෂාව පිළිබඳ අපගේ අවධානය අත්‍යවශ්‍ය වී ඇත.

උපායමාර්ග සහ සම්පත් වෙන්කිරීම

අපගේ උපායමාර්ගික මිණුම් පුවරුව

වගුව 03

උපායමාර්ගික අරමුණු	2020 වර්ෂය සඳහා ප්‍රමුඛතා	2020 වර්ෂය සඳහා ප්‍රධාන බෙදාහැරීම්	තත්ත්වය	අදහස්	අනාගත ප්‍රමුඛතා
ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම ඉහළ නැංවීම	ප්‍රවේශ්‍යතාවය සහ පහසුව වැඩි කිරීම	ඉලක්කගත ස්ථානවල නව ශාඛා විවෘත කිරීම	◑ ⏸	කතරගම, කටුවන, වැලිවේරිය යන ස්ථානයන්හි නව ශාඛා 03 ක් විවෘත කිරීම	• පාරිභෝගික අපේක්ෂාවන්ට සහ වෙනස්වන අවශ්‍යතාවන්ට අනුකූලව අපගේ නිෂ්පාදන, සේවා සහ නාලිකා අඛණ්ඩව දියුණු කිරීම • අපගේ අඩිපාර ශක්තිමත් කිරීම සඳහා තැපැල් ජාලය ක්‍රමාතනය කිරීම • ශාඛා තුළ පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීමට උත්සහ කිරීම • ස්වයං සේවා නාලිකා සක්‍රීය කිරීම සහ ගනුදෙනුකරුවන්ගේ පොරොත්තු කාලය අඩු කිරීම
	ස්වයං සේවා නාලිකා සක්‍රීය කිරීම සහ ගනුදෙනුකාරුවන්ගේ පොරොත්තු කාලය අඩු කිරීම	ඉහළ ජනාකීර්ණ ප්‍රදේශවල මුදල් ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම	✖ ⏸	ඉදිරි වසරවලට කල් දමන ලදී.	
		ශාඛා තුළ මුදල් ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම	✔	මුදල් ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍ර 24 ක් ස්ථාපිත කිරීම	
		අන්තර්ජාල බැංකුකරණයට ගනුදෙනුදරුවන් ආකර්ශණය කරගැනීම	✔	100%ට වැඩි වර්ධනයක් ළඟාකර ගැනීම	
	නිෂ්පාදන සංවර්ධනය	ළමුන් සඳහා නව නිෂ්පාදනයන් සංවර්ධනය කිරීම	✖ ⏸	ඉදිරි වසරට කල් දමන ලදී	
	පාරිභෝගික දැනුවත්භාවය, ඇසුර සහ පක්ෂපාතීත්වය වැඩි දියුණු කිරීම	ශ්‍රී ලංකාවේ සන්නම් නාම වටිනාකම ශ්‍රේණිගත කිරීම	✖	2020 - ඇ.ඩො.මි. 156 (6 වන ස්ථානය) 2019 - ඇ.ඩො.මි. 215 (5 වන ස්ථානය)	
ඓන්ද්‍රීය වර්ධනය ප්‍රවර්ධනය	ඓන්ද්‍රීය ප්‍රදේශවල වර්ධනය	කර්මාන්ත ක්ෂේත්‍රයට සාපේක්ෂව තැන්පතුවල වර්ධනය	✔	ජාඉබැ - 21.7% ක්ෂේත්‍රය - 21.6%	• විවිධ ඩිජිටල්කරණ මුලපිරීම් තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම • ගාස්තු පදනම් කරගත් ආදායම වැඩිදියුණු කිරීම සඳහා නව මාර්ග ගවේෂණය • ශේෂපත්‍රයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ උපායමාර්ගික නොවන වත්කම් අඩු කිරීම • අරමුදල් පිරිවැය අඩු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම • වෙළඳපල කොටස වැඩි දියුණු කිරීම • ප්‍රාග්ධන පිරිවැය ඉක්මවා ලාභදායීතාවය වැඩි කිරීම • පසුපෙළ කාර්යාල ක්‍රියාවලිවල කාර්යක්‍ෂමතාවය වැඩි දියුණු කිරීම
		කර්මාන්ත ක්ෂේත්‍රයට සාපේක්ෂව ණයදීමේ වර්ධනය	✔	ජාඉබැ - 13.7% ක්ෂේත්‍රය - 11.3%	
	පහත වැටෙන තැන්පතු වෙළඳපල කොටස පාලනය	වෙළඳපල කොටස රඳවා ගැනීම හෝ වැඩි කිරීම	✔	2020 - 10.82% 2019 - 10.75%	
	කොටස්හිමියන් සඳහා වටිනාකම වැඩි කිරීම	මධ්‍යකාලීන කොටස් මත ප්‍රතිලාභ අනුපාතය 10% සිට 15% දක්වා ඉහළ නැංවීමෙන් කොටස් හිමියන්ගේ ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම	✔	2020 - 20.6% 2019 - 14.3%	
		පිරිවැය ඵලදායී ලෙස කළමනාකරණය	✔	ආදායමට පිරිවැය අනුපාතය 2020 - 39.12% 2019 - 49.35%	
	ඉපැයීම් අස්ථාවරත්වය සහ පොලී ආදායම මත යැපීම අඩු කිරීම	ගාස්තු පදනම් කරගත් ආදායම වැඩි කිරීම	✔	2020 - රු.බි.2.7 2019 - රු.බි.1.3 (114.9% වැඩිවී ඇත.)	
ඩිජිටල්කරණය වේගවත් කිරීම	තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	ජංගම ගෙවීම් App විසඳුම ක්‍රියාත්මක කිරීම	◑ ⏸	ඉදිරි වසරට කල් දමන ලද අතර සංශෝධිත ඉලක්කගත කාලසීමාව සාක්ෂාත් කර ගැනීම සඳහා කඩිනම් කිරීම	• ගනුදෙනුකරුවන්ගේ පුද්ගලික තොරතුරු සහ ලිහිල් කිරීමේදී පෞද්ගලිකත්වය නොසලකා නව්‍ය, ප්‍රවේශ විය හැකි සහ දැරිය හැකි ඩිජිටල් ලෙස ක්‍රියාත්මක කළහැකි විසඳුම් සංවර්ධනය • දුරස්ථ හා ඩිජිටල් පාරිභෝගික සේවා ආකෘතිය වැඩි දියුණු කිරීම
		මානව සම්පත් කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම	◑ ⏸		
		මූලික බැංකු විසඳුම් අභිරුචිකරණය සහ පරීක්ෂා කිරීම	◑ ⏸		
	සයිබර් ආරක්ෂණ තර්ජන අවම කිරීම සඳහා පද්ධති ක්‍රියාත්මක කිරීම	දත්ත ගලායාම වැලැක්වීමේ පද්ධතිය, වෙබ් ප්‍රවේශ සහ සේවාදායක සහ දත්ත සමුදායන් සඳහා අන්ත ලක්ෂ්‍ය ආරක්ෂාව ක්‍රියාත්මක කිරීම	✔		

✔ සාක්ෂාත් කර ඇත ◑ අර්ධ වශයෙන් සාක්ෂාත් කර ඇත ✖ සාක්ෂාත් කර නැත ⏸ කොවිඩ්-19 නිසා විරාමයක් හෝ බලපෑමක් වී ඇත

උපායමාර්ග සහ සම්පත් වෙන්කිරීම

උපායමාර්ගික අරමුණු	2020 වර්ෂය සඳහා ප්‍රමුඛතා	2020 වර්ෂය සඳහා ප්‍රධාන බෙදාහැරීම්	තත්ත්වය	අදහස්	අනාගත ප්‍රමුඛතා
සේවක සහභාගිත්වය වැඩි කිරීම	සේවක යෝජනා වටිනාකම් වැඩි කිරීම	සේවකයන් උදෙසා වියදම් කිරීම	අර්ධ වශයෙන් සාක්ෂාත් කර ඇත; කොවිඩ්-19 නිසා විරාමයක් හෝ බලපෑමක් වී ඇත	2020 - රු.බි. 9.97 2019 - රු.බි. 11.16	• රැකියාවේ සතුට සහ පක්ෂපාතිත්වය සමඟ රැකියා ජීවිතයේ සමතුලිතතාවය වැඩිදියුණු කිරීම • සේවක සංවර්ධනය සහ සහභාගිත්වය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ධනාත්මක සංස්කෘතියක් ඇති කිරීම • විද්‍යුත් ඉගෙනුම් සංස්කෘතියක් ඇති කිරීම • ඩිජිටල් පරිණාමනය දෙසට කළමනාකරණය වෙනස් කිරීම • උසස් තත්වයේ පාරිභෝගික සේවාවක් සහ කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා පුහුණු කිරීම • තෝරා ගැනීමේ සහ අභ්‍යන්තර උසස්වීම් ක්‍රියාවලින්හිදී වෘත්තීය සංවර්ධනය සහ කුසලතා පදනම් කරගත් නිර්ණායක ප්‍රවර්ධනය කිරීම
		ස්ථිර සේවකයන්ගේ ස්ත්‍රී පුරුෂ විවිධත්වය	අර්ධ වශයෙන් සාක්ෂාත් කර ඇත	පුරුෂ - 4.5% ස්ත්‍රී - 55%	
		ඵලදායීතාවය සහ අභිප්‍රේරණය වැඩි කිරීම සඳහා ඉලක්කගත කාර්යසාධන ඇගයීම් පද්ධතියක් හඳුන්වාදීම	අර්ධ වශයෙන් සාක්ෂාත් කර ඇත; කොවිඩ්-19 නිසා විරාමයක් හෝ බලපෑමක් වී ඇත	වසංගතය හේතුවෙන්, මානව සම්පත් පද්ධතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීම.	
	ඉගෙනුම් සහ සංවර්ධනය	පුහුණුව සහ සංවර්ධන වියදම්	කොවිඩ්-19 නිසා විරාමයක් හෝ බලපෑමක් වී ඇත	2020 - රු.බි. 8.8 2019 - රු.බි. 39.4	
		වාර්තාගත ඉගෙනුම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	සාක්ෂාත් කර ඇත	වෙබිනාර් 17 ක් සඳහා සේවකයින් 1029 ක සහභාගිත්වය (2019 - වෙබිනාර් 9)	
		වෙනස්වීම් කළමනාකරණය උදෙසා මූලික බැංකුකරණය ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණුව	සාක්ෂාත් කර නැත; කොවිඩ්-19 නිසා විරාමයක් හෝ බලපෑමක් වී ඇත		
අවදානම් සංස්කෘතිය සවිබල ගැන්වීම	ශක්තිමත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මක මට්ටම් පවත්වා ගැනීම	CAR - ස්ථර 1 - බාසල් III අනුකූලතා	සාක්ෂාත් කර ඇත	2020 - 13.59% අවම නියාමන අවශ්‍යතාව 8%	• විචක්ෂණශීලී හා විනයගරුක ලෙස ව්‍යාපාර වර්ධනයට පහසුකම් සැලසීම සඳහා ශක්තිමත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මක මට්ටම් පවත්වා ගැනීම • පාරිසරික, සාමාජීය සහ පාලන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපාර මෙහෙයුම් සඳහා ඒකාබද්ධ වීම • අක්‍රමිකතා වැලැක්වීමට සහ හඳුනා ගැනීමට ඩිජිටල් හැකියාවන් යොදා ගැනීම • සයිබර් ආරක්ෂණ තර්ජනවලට එරෙහිව සටන් කිරීම සඳහා පද්ධති, ක්‍රියාවලි, සහ පාලනයන්හි ශක්තිමත් බව පවත්වා ගැනීම • විනයගරුක ණය අවදානම් කළමනාකරණය තුළින් ශක්තිමත් වත්කම්වල ගුණාත්මකභාවය පවත්වා ගැනීම
		මුළු ප්‍රාග්ධන අනුපාත - බාසල් III අනුකූලතා	සාක්ෂාත් කර ඇත	2020 - 16.45% අවම නියාමන අවශ්‍යතාව 12%	
	විචක්ෂණශීලී ණය අවදානම් කළමනාකරණය	අක්‍රීය ණය අනුපාතය කර්මාන්තයේ සාමාන්‍යයට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීම	සාක්ෂාත් කර ඇත	2020 - 2.79% කර්මාන්තයේ සාමාන්‍ය 4.93%	
	සයිබර් ආරක්ෂාව	බැංකුව සඳහා 24/7 අරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම	සාක්ෂාත් කර ඇත		
		2019 දී ලබාගත් PCIDSS සහතික පවත්වා ගැනීම	සාක්ෂාත් කර ඇත		
		ISO 27001 සහතිකය ලබා ගැනීම	සාක්ෂාත් කර නැත; කොවිඩ්-19 නිසා විරාමයක් හෝ බලපෑමක් වී ඇත		
	අනුකූල නොවීමට ශුන්‍ය ඉවසීම	නියාමන දඩ සහ දණ්ඩන	සාක්ෂාත් කර ඇත	ශුන්‍ය දඩ	
ආදර්ශය මඟින් මෙහෙයවීම	දේශීය ප්‍රජාව නඟාසිටුවීම සහ ප්‍රජාව ගොඩනැගීමේ වැඩසටහන්වලට සහයවීම	ප්‍රජා සම්බන්ධතා වැඩසටහන් සඳහා මුළු ආයෝජනය	අර්ධ වශයෙන් සාක්ෂාත් කර ඇත; කොවිඩ්-19 නිසා විරාමයක් හෝ බලපෑමක් වී ඇත	2020 - රු.මි. 18.1 2019 - රු.මි. 30	• මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය, අධ්‍යාපනය, රැකියා අවස්ථා සහ ආර්ථික වර්ධනය වැනි සමාජ අභියෝගයන්ට මුහුණදීම • ප්‍රජා සංවර්ධනයේ උපායමාර්ගික හවුල්කාරිත්වයට අරමුදල් සැපයීම • ණයදීමේ පිළිවෙත්වල පාරිසරික හා සමාජීය බලපෑම් කළමනාකරණය • පාරිසරික අඩිපාර කළමනාකරණය • මූල්‍ය ඇතුළත් කිරීම සඳහා කැපවීම
		දේශීය සැපයුම්කරුවන් සඳහා දේශීය සැපයුම්කරුවන්ට වියදම් කිරීමේ අනුපාතය (%)	සාක්ෂාත් කර ඇත	100%	
	ආර්ථිකමය සහයෝගීතාවය	ගෙවූ සෘජු හා වක්‍ර බදු	සාක්ෂාත් කර ඇත	2020 - රු.බි. 9.32 2019 - රු.බි. 9.28	
		ගෙවූ ලාභාංශ	අර්ධ වශයෙන් සාක්ෂාත් කර ඇත	2020 - රු.බි.1.0 2019 - රු.බි.2.0	
	අඩු කාබන් ආර්ථිකයකට සහයවීම	ලබාදී ඇති පරිසර ණය (Eco loans) ප්‍රමාණය	සාක්ෂාත් කර නැත; කොවිඩ්-19 නිසා විරාමයක් හෝ බලපෑමක් වී ඇත	2020 - 222 2019 - 8	
		ස්ථාපිත කළ සූර්ය පැනල ප්‍රමාණය - 42 මනු කියවීම සඳහා සම්බන්ධ කළ ශාඛා ගණන - 40	සාක්ෂාත් කර ඇත		

සාක්ෂාත් කර ඇත | අර්ධ වශයෙන් සාක්ෂාත් කර ඇත | සාක්ෂාත් කර නැත | කොවිඩ්-19 නිසා විරාමයක් හෝ බලපෑමක් වී ඇත

මූල්‍ය ප්‍රාග්ධන සමාලෝචනය

ආදායම් ප්‍රකාශයේ සාරාංශය

වගුව 04

		වාර්ෂික වෙනස (2019 එදිරිව 2020) %	2020 රු. මිලියන	2019 රු. මිලියන	2018 රු. මිලියන
A	ශුද්ධ පොලී ආදායම	21.01	**34,890**	28,832	24,885
B	ශුද්ධ පොලී නොවන ආදායම	59.11	**4,881**	3,067	1,254
	මුළු මෙහෙයුම් ආදායම	24.68	**39,771**	31,899	26,139
C	හානිකරණ ගාස්තු	761.80	**4,874**	565	871
	ශුද්ධ මෙහෙයුම් ආදායම	11.37	**34,897**	31,334	25,268
D	මෙහෙයුම් වියදම්	-1.34	**15,466**	15,675	14,097
	මෙහෙයුම් ලාභය	24.09	**19,431**	15,659	11,171
E	මූල්‍ය සේවා මත බදු	-27.14	**3,787**	5,197	3,230
F	බදු පෙර ලාභය	49.54	**15,645**	10,462	7,941
E	බදු වියදම	35.69	**5,537**	4,080	3,441
F	වර්ෂය සඳහා ලාභය	58.40	**10,108**	6,381	4,500

A ශක්තිමත් පොලී ආදායම් වර්ධනය

ශුද්ධ පොලී ආදායම සහ ශුද්ධ පොලී ආන්තිකය ප්‍රස්තාරය 05



බැංකුව 2020 දී රුපියල් බිලියන 127.5 ක දළ ආදායමක් වාර්තා කරන ලද අතර, එය 2019 ට සාපේක්ෂව 4.6% ක වර්ධනයක් වන අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විශාලතම සංරචකය වන පොලී ආදායම රුපියල් බිලියන 118.7 සිට රුපියල් බිලියන 122.5 දක්වා 3.2% කින් වර්ධනයවීම සහ 2019 දී පැවති රුපියල් බිලියන 1.3 ට සාපේක්ෂව ගාස්තු හා කොමිස් ආදායම රුපියල් බිලියන 2.7 දක්වා 114.9% කින් වර්ධනය වීමයි.

පොලී ආදායම අතින් ද පසුගිය වසර තුළ වාර්තා වූ රු.බි. 118.7ට සාපේක්ෂව 2020 දී රු.බි. 122.5 ක් පෙන්නුම් කරමින් පොලී ආදායම 3.2% ක වර්ධනයක් වාර්තා කරන ලදී. ණය හා අත්තිකාරම් වලින් ලත් පොලී ආදායමෙහි 13.2% ක අඩුවක් තිබියදී වුව 2019 වර්ෂය තුළ පෙන්නුම් කළ රු.බි. 58.0ට සාපේක්ෂව ණය හා වෙනත් උපකරණ වෙතින් ලද ආදායම රු.බි.70.3 දක්වා 21.1% කින් ඉහළයාම මීට ප්‍රධාන වශයෙන්ම හේතු කාරණා විය. ගනුදෙනු හා ව්‍යාපාර මත කොවිඩ්-19 මගින් ඇති කරන ලද බලපෑම, ණය හා අත්තිකාරම් මගින් ලද පොලී ආදායම පහත බැසීමට හේතු විණි. තවද වර්ෂය තුළදී ණය, ණය උපකරණයක් ලෙස වර්ගීකරණය කිරීම අදාළ කාලසීමාව තුළ ණය උපකරණ මත උපයන පොලී ආදායම ඉහළ යාමට ද ඒ ඔස්සේ ණය හා අත්තිකාරම් මත පොලී ආදායම අඩුවීමට හේතු සාධක විය.

අනෙක් අතට 2019 වර්ෂයේදී තිබූ රු.බි. 89.9 අගයේ සිට 2.5% ක අඩුවීමක් පෙන්නුම් කරමින් සමාලෝචනයට බඳුන් වූ වසර තුළ පොලී වියදම් රු.බි. 87.6 දක්වා පහත වැටිණි. මීට බලපාන ලද ප්‍රධානතම සාධකය වූයේ 2019 වසරේ වූ රු.බි. 6.4 සිට 71.5% ක විශාල ප්‍රතිශතයකින් රු.බි. 1.8 දක්වා පහළ ගිය ප්‍රතිමිලදී ගැණුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්වල පොලී වියදමයි. බැංකු ක්ෂේත්‍රය තුළ පසුගිය වර්ෂයේ පුරාවට දක්නට ලැබුණු අතිරික්ත ද්‍රවශීලතාවය මෙයට හේතු විය. කොවිඩ් 19 වෛරසයේ වසංගත ව්‍යාප්තිය හමුවේ මූල්‍ය ප්‍රතිපත්ති අනුපාතික අඩුකරන ලද පසුබිමක වුවද තැන්පත්කරුවන්ට ගෙවිය යුතු පොලී වියදම් 2019 දී වාර්තා වූ රුපියල් බිලියන 79.6ට සාපේක්ෂව 3.3% ක වර්ධනයක් සමගින් 2020 දී එය රුපියල් බිලියන 82.3 ක් දක්වා ඉහළ යාමට හේතු වූයේ වර්ෂය තුළදී සිදුවූ තැන්පතු පදනමේ සැලකිය යුතු වර්ධනයයි.

පොලී වියදම අඩුවීමත් සමඟ පොලී ආදායම ඉහළයාම හේතුවෙන් පසුගිය වර්ෂය තුළ වාර්තා වූ රු.බි. 28.8 හා සසඳන විට 2020 වර්ෂයේදී ශුද්ධ පොලී ආදායම රු.බි.34.9 දක්වා 21.0% කින් ඉහළ යන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ ශුද්ධ පොලී ආන්තිකය 2.63% සිට 2.77% දක්වා වර්ධනය විණි.

ණය ආපසු ගෙවීමට ලබාදුන් සහන කාලසීමාව මගින් පොලී ආදායම මත ඇති කරලන ලද බලපෑම

කොවිඩ්-19 ව්‍යාප්තිය හා කොවිඩ්-19 මගින් බලපෑම් එල්ල වූ ව්‍යාපාර සඳහා ලබාදෙන ණය ප්‍රවාහ වැඩිදියුණු කිරීම උදෙසා දේශීය ආර්ථික ක්‍රියාවලීන්ට කඩිනමින් සහය දැක්වීම් පිණිස "සෞභාග්‍යා" ආර්ථික සහන පහසුකම ඇතුළත්ව පුළුල් උත්තේජක පැකේජ හඳුන්වාදීමටද කොවිඩ්-19 මගින් බලපෑමට ලක් වූ පුද්ගලයින් හා ව්‍යාපාර සඳහා ණය ආපසු ගෙවීමේ කාලසීමා යෝජනා ක්‍රම හඳුන්වාදීමට ද ශ්‍රී ලංකා මහ බැංකුව යොමු විය. ඒ අනුව, ණය ආපසු ගෙවීම් කාලසීමා දීර්ඝ කිරීම් හෝ ගෙවීම් කල් දැමීම් ප්‍රතික්ෂේප කළ ගනුදෙනුකරුවන් හැර සෙසු සියලු ගනුදෙනුකරුවන් හට ණය ආපසු ගෙවීමේ කාලසීමාව දීර්ඝ කිරීම හෝ ගෙවීම් කල්දැමීමේ අවස්ථාව බැංකුව විසින් පිරිනමා ඇත.

ණය ආපසු ගෙවීමේ කාල පරිච්ඡේදය අවසානය වන තෙක් ගෙවීම් කල් දැමීමට සහ පාරිභෝගික ණය කළඹ 7.0% ක සහනදායී අනුපාතිකයක් 90% ක් ගනුදෙනුකාර හවතුන් හට පිරිනමන ලදී. ණය ආපසු ගෙවීම් සහන කාලය මාස 02 සිට මාස 06 දක්වා වෙනස් වූ අතර, ඉතාම සීමා සහිත සංසිද්ධීන් ඇතුළත එය මාස 06 ඉක්මවූ කාලසීමාවකට දීර්ඝ කෙරිණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කළ පරිදි පොලී අනුපාත ගිවිසුම්ගත අගයේ සිට 7% දක්වා අඩු කිරීමත් සමග රු.බි. 2.2 ක අලාභයක් බැංකුවට සිදු විය. තවද, මහ බැංකු නියෝගයට අනුකූල වනු පිණිස බැංකුව විසින් 7% සීමාවට අදාළව ලැබිය යුතු පොලිය ණය කාලසීමාව අවසානය තෙක් කල් තබන ලදී. එහෙයින් බැංකුවට තව දුරටත් පොලී ආදායම් මත රු.බි. 1.4 ක පළමු දින අලාභයක් (Day one loss) අත් විය. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් පැන වූ ණය ආපසු ගෙවීම් සහන කාලසීමාව හේතුවෙන් රු.බි. 3.6 ක සමස්ත අලාභයක් බැංකුවට දැරීමට සිදුවිය.

B ශුද්ධ පොලී නොවන ආදායම් ඉපයීම් වර්ධනය

පොලී නොවන ආදායම් විශ්ලේෂණය

ප්‍රස්තාරය 06



පසුගිය වර්ෂය තුළ වාර්තා කළ රු.බි. 3.1 ට සාපේක්ෂව, 2020 වර්ෂය තුළ 59.1% ක වර්ධනයක් සමගින් ගාස්තු හා කොමිස් මත පදනම් වූ ශුද්ධ ආදායම, වෙළඳාම මගින් ලත් ශුද්ධ ලාභ/අලාභ, මූල්‍ය වත්කම් හඳුනා නොගැනීම මත ලද ශුද්ධ ලාභ/අලාභ සහ වෙනත් ශුද්ධ මෙහෙයුම් ආදායම් ඇතුළත්ව පොලී නොවන ශුද්ධ ආදායම, රු.බි. 4.9 ක් විය. මෙකී පොලී නොවන ආදායම් පදනම, සමස්ත මෙහෙයුම් ආදායමෙන් 12.3% කට (2019 - 9.6%) හේතු විය.

ආනයනය මත පනවන ලද සීමා සහ අඩු ක්‍රියාකාරී මට්ටමක පැවති ආර්ථික ක්‍රියාකාරකම්වල අහිතකර බලපෑම ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම වෙත එල්ල විය. එසේ වුවද සෞඛ්‍ය මාර්ගෝපදේශ සහ සමාජ දුරස්ථභාවය යටතේ ගනුදෙනුකරුවන් ඩිජිටල් පහසුකම් වෙත මාරුවීම හරහා ලැබුණු ආදායම සහ ප්‍රතිව්‍යුහගත කරන ලද ණය හා අත්තිකාරම් හා ගාස්තුවලින් ජනනය වූ ගාස්තු ආදායම, ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම වර්ධනය වීමට තුඩු දෙන ලදී.

2019 දී වාර්තා වූ රු.බි. 1.5 ට සාපේක්ෂව 2020 දී වෙළඳාම්වලින් ලත් ශුද්ධ ලාභය රු.බි. 1.3 දක්වා 14.6% කින් පහත වැටිණි. 2020 වසරේ අගභාගයේදී භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතිකවල ආන්තික වර්ධනය හේතුවෙන් ස්ථාවර ආදායම් සුරකුම් මත උපචිත නොවූ ලැබීම්වලින් ලද ආදායම අඩුවීම, ඉහත කරුණු සඳහා හේතු සාධක විය. කෙසේ වුවද 2019 තුළදී ස්කන්ධ සුරකුම්වලින් ලත් ලැබීම් රු.බි. 0.2 සිට රු.බි. 0.4 දක්වා වර්ධනය විය.

පරිපාලිත වෙතින් ලද ලාභාංශ ආදායම මෙන්ම විදේශ විනිමය යළි තක්සේරුකරණය මත ලද ලාභය හේතුකොට ගෙන 2019 දී වාර්තා වූ රු.බි. 0.4 හා සසඳන විට සමාලෝචිත වසර තුළ රු.බි. 0.8 දක්වා 90.8% කින් ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම් වර්ධනය වූ බව නිරීක්ෂණය විය.

C සැලකිය යුතු ලෙස වර්ධනය වූ හානිකරණ ගාස්තු

ප්‍රතිපාදන ආවරණය

ප්‍රස්තාරය 07



2019 දී වාර්තා වූ රු.බි. 0.6 අටගුණයකින් ඉහළ ගොස් 2020 දී හානිකරණ ගාස්තු රු.බි. 4.9 ක් ලෙස වාර්තා විය. දුර්වල ආර්ථික තත්ත්වයන්ගේ බලපෑම හේතුවෙන් තනි පුද්ගල මට්ටමේදී මෙන්ම සාමූහික මට්ටමෙන් ණය හා අත්තිකාරම් කළඹ තුළ ඇති වූ වර්ධිත අවදානම, පසුගිය වර්ෂයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ හානිකරණ ප්‍රතිපාදන වෙන් කිරීමට හේතු සාධක විය. උද්ගතවිය හැකි මුදල් ප්‍රවාහ ප්‍රමාදවීම් සැලකිල්ලට ගෙන, ලැබී ඇති තොරතුරු මත අතිරේක ප්‍රතිපාදන වෙන් කරන ලදී.

තවද ඉහළ පරිමාවෙන් යුතු පෞද්ගලික ණය හා අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීමේදී අයහපත්ම සාර්ව ආර්ථික සංසිද්ධිය මත වැඩිවන බර තැබීමත් යනාදිය ඉහළ හානිකරණ ගාස්තුවලට හේතු විය. රටෙහි ණය ශ්‍රේණිගත කිරීම් පහළ යාමත් සමඟ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල සිදු කළ ආයෝජනවලට එරෙහිව සාපේක්ෂව ඉහළ හානිකරණ ප්‍රතිපාදන වෙන් කිරීමට ද බැංකුව යොමු විය.

D ආයෝජන අතරතුර මැනවින් කළමනාකරණය කළ පිරිවැය

පිරිවැය හා ආදායම් වර්ධනය

ප්‍රස්තාරය 08



පිරිවැය ඉතිරිකිරීමේ විවිධ උපායමාර්ග හා මුලපිරීම් ඔස්සේ 1.3% ක ආන්තික අඩුවීමක් පිළිඹිබු කරමින් 2019 වර්ෂය සඳහා අදාළ වූ රු.බි. 15.7 ට සාපේක්ෂව පිරිස් පිරිවැය, ක්ෂයවීම් හා ක්‍රමක්ෂය සහ වෙනත් පොදු කාර්ය වියදම් ඇතුළත් මෙහෙයුම් වියදම් වසර තුළ රු.බි. 15.5 කට අඩු විය. පෙර වර්ෂය හා සසඳන විට වැටුප් නොවන ගෙවීම් අඩුවීම හරහා පසුගිය වර්ෂයේ රු.බි. 10.2 ක සිට 1.3% කින් අඩු වී රු.බි. 10.0 ක් ලෙස වාර්තා වූ පිරිස් වියදම්, මෙහෙයුම් වියදම් වලින් 64.4% ක් සපුරාලයි.

මෙහෙයුම් වියදම් වලින් 8.0% ක අගය ගන්නා ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වියදම් පසුගිය වසරේ වාර්තා වූ රු.බි.1.0 සිට රු.බි.1.2 දක්වා 18.9% කින් වර්ධනය විය. සුහුරු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/සීආර්එම් කලාප පහසුකම් සහිත ජාල සංඛ්‍යාව 27 දක්වා ඉහළ නංවා, නව ශාඛා ත්‍රිත්වයක් විවෘත කිරීම මෙන්ම සයිබර් ආරක්ෂාව තර කරවන අතර ඩිජිටල් තාක්ෂණය ඔස්සේ ගනුදෙනුකාර අත්දැකීම් ඔප් නැංවීමට නව තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කෙරෙහි දරන ලද ආයෝජන මීට ප්‍රධාන වශයෙන්ම හේතු විය.

මූල්‍ය ප්‍රාග්ධන සමාලෝචනය

පරිපාලන හා ස්ථාපිත කිරීමේ වියදම් සහ අධ්‍යක්ෂවරුන්ගේ වැටුප් ද ඇතුළුව වෙනත් මෙහෙයුම් වියදම් 2020 වර්ෂය තුළ 4.8% කින් රු.බි. 4.3 දක්වා පහත වැටිණි. ඒ අනුව, බැංකුව විසින් එහි පිරිවැය ආදායම අනුපාතය (බදු හැර) 2019 වසරේ වාර්තා වූ 49.4% සිට 2020 දී 39.1% දක්වා සාර්ථකව වර්ධනය කර ගන්නා ලදී.

E සඵල බදු අනුපාතික සාපේක්ෂව ඉහළ මට්ටමක රැඳී පැවතීම

ලාභදායීතාවට බදු බලපෑම

ප්‍රස්තාරය 09



- ගෙවන ලද සමස්ත බදු ප්‍රමාණය (රු.මි.)
- බදු පසු ලාභය (රු.මි.)
- සඵල බදු අනුපාතිකය (මෙහෙයුම් ලාභය මත පදනම්ව) (%)
- සඵල ආදායම් බදු අනුපාතිකය (බදු පෙර ලාභය මත පදනම්ව) (%)

වර්ෂය තුළ බදු මගින් ජාතියට බැංකුවේ දායකත්වය ඊට පෙර වර්ෂයේ මෙන්ම රු.බි. 9.3 ක්වා පැවතිණි. සමස්ත බදු එකතුවට මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු සහ ආදායම් බදු ද ඇතුළත් විය.

මෙම වර්ෂය තුළ ආදායම් බදු ප්‍රමාණය රු.බි. 5.5 ක් ලෙස සනිටුහන් වූයේ පසුගිය වර්ෂයේ අගය වූ රු.බි. 4.1 ට සාපේක්ෂව 35.7% කින් ඉහළ යමිනි. මේ අතර 2020 දී මූල්‍ය සේවා මත බදු පසුගිය වර්ෂයේ හා සසඳන විට රු.බි. 5.2 සිට රු.බි. 3.8 දක්වා 27.1% ක් පහත වැටිණි. මූල්‍ය සේවා මත බදු අඩුවීමට තුඩු දුන් ප්‍රධානතම සාධකය වූයේ මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ඉවත් කිරීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස, සඵල පොලී අනුපාතිකය (මෙහෙයුම් ලාභය මත ගණනය කරන ලද) පසුගිය වර්ෂයේ පැවති 59.3% ක ප්‍රතිශතය 2020 දී 48.0% දක්වා අඩු විය.

F වාර්තාගත ඉහළම ප්‍රතිලාභ

වාර්තාගත ඉහළම ප්‍රතිලාභ

ප්‍රස්තාරය 10



A – බදු පසු ලාභය 2019
B – ශුද්ධ පොලී ආදායම
C – ශුද්ධ පොලී නොවන ආදායම
D – හානිකරණය
E – පරිපාලන හා වෙනත් පොදු කාර්ය වියදම්
F – බදු
G – බදු පසු ලාභය 2020

සමාලෝචිත වසර තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුව රු.බි. 15.6 ක බදු පෙර ලාභයක් වාර්තා කළ අතර, එය 2019 වසරේ අගය වූ රු.බි. 10.5 ට වඩා 49.5% ක වර්ධනයකි. මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ඉවත් කිරීම ද ශුද්ධ පොලී ආදායම 21.0% කින් ඉහළ යාමද මීට ප්‍රධාන ලෙසම හේතු විණි. 2019 වසරේ බදු පසු ලාභය වූ රු.බි. 6.4 ට සාපේක්ෂව 58.4% ක වර්ධනයක් පෙන්වමින් බැංකුව විසින් කොවිඩ්-19 බලපෑම හමුවේ වුවද රු.බි. 10.1 ක සැලකිය යුතු බදු පෙර ලාභයක් අත්කර ගන්නා ලදී. 2019 ට සාපේක්ෂව සාමාන්‍ය කොටසක් මත ඉපයීම ද රු.6.8 සිට රු.10.7 තෙක් ඉහළ නැංවිණි.

බැංකුවේ කාර්ය සාධනය හා සමගාමීව වර්ෂය සඳහා වත්කම් මත ප්‍රතිලාභ ද 2019 වසරේදී වාර්තා වූ 0.95% සිට 1.24% දක්වා වැඩිදියුණු විය. ඒ හා සමානව, ස්කන්ධය මත ප්‍රතිලාභ ද 2019 වසරේ සිට 2020 වසර වන විට 14.25% සිට 20.67% දක්වා වර්ධනය විය.

බැංකුවේ තිරසාර මෙහෙයුම් කාර්ය සාධනයෙහි දර්ශකයක් ලෙස බදු පසු ලාභය අපි සලකනු ලබන්නෙමු. 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ ඉපයීම් කාර්යසාධනය පහත ප්‍රස්තාරය මගින් සංක්ෂිප්තව විදහා දැක්වෙයි.

විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශයෙහි වෙනස්වීම්

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි දැක්වෙන ඉහළ අලාභය ට තුඩු දුන් ප්‍රධානතම හේතුසාධකය නම් ආදායම් ප්‍රකාශයෙහි යළි වර්ගීකරණය නොකෙරෙන අයිතමයන්ය. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් යළි මිනීමේ ප්‍රතිඵලයක් ලෙස රු.බි. 6.7 ක අලාභයක් සනිටුහන් විය. යළි තක්සේරු කිරීම් හි අතිරික්ත මත වූ වෙනස්කම් හේතුවෙන් රු.බි. 1.5 ක ලාභයක් බැංකුව විසින් වාර්තා කෙරිණි.

කොටසක් මත ඉපයීම්

ප්‍රස්තාරය 11



මූල්‍ය තත්ත්ව පිළිබඳ සාරාංශගත වාර්තාව

		(2019 එදිරිව 2020) වාර්ෂික වෙනස %	2020 රු. මිලියන	2019 රු. මිලියන	2018 රු. මිලියන
A	මුළු වත්කම්	17.78	**1,363,808**	1,157,967	1,036,846
E	මුදල් හා මුදලට සමාන දෑ	20.74	**6,492**	5,377	3,435
	බැංකුවල ඇති තැන්පතු	7.19	**13,253**	12,364	17,588
C	ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	71.20	**20**	12	4,740
	ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්				
	– සාධාරණ අගයට ගණනය කළ	(2.08)	**11,222**	11,460	16,680
	ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්	–	–	–	–
B	– ණය සහ අත්තිකාරම්	13.73	**516,795**	454,395	422,895
C	– ණය සහ වෙනත් උපකරණ	22.51	**754,233**	615,634	518,948
	වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්	339.00	**15,272**	3,479	6,184
	පරිපාලිත සමාගම්වල ආයෝජන	0.00	**4,811**	4,811	1,700
	දේපල, පිරියත සහ උපකරණ	12.99	**16,004**	14,163	13,466
	භාවිතයට අයිතිය ඇති වත්කම්	14.22	**1,226**	1,074	–
D	විලම්බිත බදු වත්කම්	100.00	**1,446**	–	–
	වෙනත් වත්කම්	(34.56)	**23,034**	35,198	31,209
F	මුළු වගකීම්	17.97	**1,311,911**	1,112,041	993,750
G	බැංකු වලට ගෙවිය යුතු	(63.30)	**12,862**	35,045	77,119
	ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	–	–	2
	ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම්				
H	– තැන්පත්කරුවන්ට ගෙවියයුතු	21.70	**1,237,124**	1,016,574	839,574
G	– අනෙකුත් ණයකරුවන්ට	(61.52)	**8,160**	21,203	14,805
I	කල්බදු වගකීම්	19.48	**1,275**	1,067	–
G	නිකුත්කළණය සුරැකුම්පත්	19.04	**31,774**	26,692	52,389
I	සේවාවසාන ප්‍රතිලාභ බැඳීම්	116.59	**10,885**	5,026	3,831
	විලම්බිත බදු වගකීම්	(100.00)	–	482	583
	වෙනත් වගකීම්	12.56	**6,699**	5,951	5,447
	පාලිත සමාගම්වලට ගෙවියයුතු	585.25	**4**	1	1
J	මුළු කොටස් හිමියන්ගේ ස්කන්ධය	13.00	**51,897**	45,925	43,095
	ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	0.00	**9,400**	9,400	9,400
	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	14.19	**4,068**	3,563	3,228
	රඳවාගත් ඉපයීම්	45.01	**11,883**	8,195	3,985
	වෙනත් සංචිත	7.18	**26,546**	24,768	26,483
I	මුළු හිමිකම් සහ වගකීම්	17.78	**1,363,808**	1,157,967	1,036,846
	අසම්භාව්‍ය බැරකම් සහ බැඳීම්	129.71	**23,787**	10,355	4,481

වගුව 05

A ශක්තිමත් ශේෂපත්‍ර වර්ධනය

අභියෝග මධ්‍යයේ වුවද බැංකුව විසින් අඛණ්ඩව සිය තැන්පතු පදනම 17.8% කින් ඉහළ නංවා ගනිමින් 2019 වර්ෂයේ රු. ට්‍රිලියන 1.2 ක් වූ තැන්පතු පදනම 2020 දෙසැම්බර් 31 දිනට රුපියල් ට්‍රිලියන 1.4 ක් දක්වා ළඟා විය.

2019 වර්ෂයේ රු.බි. 454.4 ක් වූ ශුද්ධ ණය සහ අත්තිකාරම් 2020 වර්ෂයේදී රු.බි. 516.8 දක්වා 13.7% ක වර්ධනයක් පෙන්නුම් කරමින් ද, 2019 වර්ෂයේ රු.බි. 647.8 ක් වූ ආයෝජන 2020 වර්ෂය තුළ රු.බි. 798.8 ක් දක්වා 23.3% ක වර්ධනයක් පෙන්නුම් කරමින්ද ශේෂපත්‍රයේ වර්ධනය සඳහා උපකාරී විය.

B අභියෝග මධ්‍යයේ වුවද ණයදීමේ වර්ධනයක් පවත්වා ගැනීම

ණය හා අත්තිකාරම් සමන්විත වන්නේ කාලීන ණය, එනම් නිවාස හා දේපල ණය, පුද්ගල ණය, වාහන ණය (Auto Loans), ආයතනික ණය, ණය පියවීමේ ණය (Syndication Loans), වෙනත් බැංකු හා මූල්‍ය ආයතනවලට ණය ලබාදීම් මෙන්ම උකස් ණය, සේවක ණය, රජයට ණයදීම් සහ ප්‍රතිවිකුණුම් මත සුරැකුම්පත් මිලදී ගැනීමේ ගිවිසුම් මගින් (Reverse REPO).

කොවිඩ්-19 ව්‍යාප්තියත් සමඟ ලබාදුන් පහසුකම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකරන ලද පොලී අනුපාත කපාදැමීමේ ප්‍රතිපත්තියත් සමඟ ණය ඉල්ලුමේ වැඩිවීමක් සිදුවන කාර්තුව තුළ සිදුවීමත් වාර්තාගත කාලපරිච්ඡේදය අවසානයේදී පාරිභෝගික ණය (Retail Lending) කළඹ සැලකිය යුතු පරිදි වැඩිවීමට හේතු විය. එසේ වුවද රු.බිලියන 26.9 වටිනාකමකින් යුත් ආයතනික ණය, ආයතනික ණය උපකරණ බවට නැවත වර්ගීකරණය කිරීම මගින් 2019 වසරේ රු.බි. 454.4 ක් වූ මුළු ණය හා අත්තිකාරම් 2020 වසරේදී රු.බිලියන 516.8 ක් දක්වා 13.7% කින් වාර්තාගත වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඒ අනුව 2020 වර්ෂය අවසානයේදී පුද්ගල පාරිභෝජන (41%) යටිතල පහසුකම් (21.0%) සහ උකස් (17.9%) ආධිපත්‍ය තුළින් දළ ණය සහ අත්තිකාරම් කළඹේ ශුද්ධ වැඩිවීමක් පෙන්නුම් කරන ලදී.

මූල්‍ය ප්‍රාග්ධන සමාලෝචනය

කොවිඩ්-19 ව්‍යාප්තිය නිසා ගනුදෙනුකරුවන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳ ඇතිවූ අහිතකර බලපෑම නිසා රජය මගින් හඳුන්වාදුන් ආර්ථික උත්තේජන පැකේජ මධ්‍යයේ වුවද 2019 වර්ෂයේ 1.57% ක් වූ බැංකුවේ අක්‍රීය ණය අනුපාතය 122bps වැඩිවීමක් සමඟ 2020 වර්ෂයේදී 2.79% දක්වා සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කරමින් වත්කම්වල ගුණාත්මකභාවයේ පිරිහීමක් දක්නට ලැබුණි. තවද, අක්‍රීය ණය අනුපාතය ගණනය කිරීමේදී හරය වශයෙන් භාවිතා කරනු ලබන ණය හා අත්තිකාරම් ශේෂය වර්ෂය තුළදී රු.බි. 26.9 ක් වූ ණය හා අත්තිකාරම් ණය උපකරණ වශයෙන් නැවත වර්ගීකරණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ද මෙම තත්ත්වය ඇතිවීමට හේතු වුණි. කෙසේ වුවද කර්මාන්තයේ ණය ගුණාත්මකභාවය පිළිබඳ අනුපාතය වූ 4.93% හා සසඳන කළ බැංකුව විසින් අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වාගෙන යන ලදී.

C ආයෝජන සඳහා උත්තේජන අවස්ථාවන්

ණය සහ හිමිකම් සුරැකුම්පත්හි ආයෝජනයන්

බැංකුවේ මුළු හිමිකම් හා ණය උපකරණ ආයෝජන කළඹ 2019 වර්ෂයේ රු.බිලියන 620.9 ක් වූ අතර එය 2020 වර්ෂයේදී රු.බි. 758.7 ක් දක්වා ළඟාවෙමින් 22.9% ක වර්ධනයක් පෙන්වීය. ණය කළඹින් 99.4% රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB), ආයතනික ණය උපකරණ සහ ට්‍රස්ට් සහතික යන ණය උපකරණ වලින් නියෝජනය වූ අතර, ඉතිරිය සමන්විත වන්නේ හිමිකම් සුරැකුම්පත් වලිනි. හිමිකම් වෙළඳපොලේ ඇති වූ පසුබෑම හේතුවෙන් 2019 වර්ෂයේ රු.බි. 5.3 ක් වූ හිමිකම් කළඹ 2020 වසරේදී රු.බි. 4.4 දක්වා 15.5% කින් පහත වැටුණි.

ණය හා වෙනත් උපකරණ බැංකුවේ වත්කම් වර්ධනයෙහි ලා ප්‍රධාන වශයෙන් දායක වූ ආකර්ශනීය ආයෝජනයක් වූ අතර, ණය හා අත්තිකාරම් වලින් ආයතනික ණය "ණය සහ වෙනත් උපකරණ" බවට පරිවර්තනය කිරීම ණය වර්ධනයට අර්ධ වශයෙන් හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස 22.5% ක ආකර්ශණීය වර්ධනයක් සමඟින් ණය සහ වෙනත් උපකරණවල දක්නට ලැබෙන අතර, ඒ අනුව 2019 වසරේ රු.බි. 615.6 හා සසඳන කළ 2020 වසර අවසානයේදී රු.බි. 752.2 ක් වාර්තා කරන ලදී.

රජයේ අවශ්‍යතා සඳහා මූල්‍ය දායකත්වය ලබාදෙමින් බැංකුව සිය වරම අඛණ්ඩව ඉටුකරමින් සිටී. ඒ අනුව පසුගිය වසර හා ගත් කළ එම වසරේ රු.බි. 612.7 ක් වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වලින් සමන්විත වූ රජයේ සුරැකුම්පත් කළඹ 2020 වසර අවසානය වන විට රු.බි. 740.8 ක් දක්වා රු.බිලියන 128.1 කින් වැඩි විය. ඒ අනුව බැංකුව විසින් 2020 වසරේදී මුළු තැන්පතු වලට රජයේ සුරැකුම්පත් අනුපාත මට්ටම 2019 වසරේ 60.9% ක ප්‍රතිශතය 2020 වසර අවසානයේදී 62.7% දක්වා වැඩි කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පොලී උපයන ආයෝජන විවිධාංගීකරණය කිරීමත් ඒ තුළින් ලාභදායිත්වයට හිතකර බලපෑමක් ඉදිරි වසරේදී ඇති කිරීමටත් බැංකුව අපේක්ෂා කරයි.

ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

පසුගිය වර්ෂය අවසානය හා සසඳන කළ රු.මි. 11.6 ක් වූ බැංකුවේ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ 2020 දෙසැම්බර් වන විට රු.මි. 19.9 ක් වශයෙන් වාර්තා විය. මෙමගින් නියෝජනය වන්නේ ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගම වෙත ලබාදී ඇති කාලීන ණය සඳහා ලබාගත් ශ්‍රී ලංකා සංවර්ධන බැංකුව සමඟ එළඹුනු රු. බිලියන 02 ක පොලී අනුපාත අවදානම වෙනුවෙන් ලබාගත් හුවමාරුවයි.

දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ වල ලියාපහල වටිනාකම 2020 වසර හා සසඳන කල 2019 වසරේ රු.බි. 14.2 සිට රු.බි. 16.0 දක්වා 13% කින් වැඩිවූ අතර එය ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලැබුවේ ප්‍රත්‍යාගණන ලාභයේ වූ වැඩිවීම මෙන්ම තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල වැඩිවීමයි.

භාවිතයට අයිතිය ඇති වත්කම්

2019 දී ක්‍රියාවට නංවන ලද (SLFRS 16) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 16 "කල්බදු" සඳහා යම් යම් කෙටිකාලීන කල්බදු ගිවිසුම් සහ අඩු වටිනාකම් සහිත වත්කම් සහිත කල්බදු ගිවිසුම් හැර මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇති සියළුම කල්බදු ගිවිසුම් බදුකරු විසින් හඳුනාගත යුතුය. ඒ අනුව බැංකුව විසින් සියළුම කල්බදු ගිවිසුම් සඳහා රු.බි. 1.2 ක් වන අනුරූප වත්කම් සඳහා අයිතියක් ලෙස 2020 දෙසැම්බර් 31 දිනට සිය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට හඳුනාගෙන ඇත.

පරිපාලිත සමාගම්වල ආයෝජනයන්

සලකා බලන වර්ෂය තුළදී කිසිදු නව අත්පත් කර ගැනීමක් හෝ ඒකාබද්ධ කිරීමක් සිදුවී නොමැති බැවින් පරිපාලිත සමාගම්වල ආයෝජනයන් අඛණ්ඩව රු.බි. 4.8 ක් ලෙස 2020 වසර අවසාන වන විට පැවතිණ. මෙම ශේෂයෙහි ඇතුලත් වන්නේ පූර්ණ අයිතිය සතු එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් පුද්ගලික සමාගමෙහි ආයෝජනය වන රු.බිලියන 1.7 ක් සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ ආයෝජිත මුදල වූ රු.බි. 3.1 ක් වන පරිපාලිත වල ආයෝජනයයි.

D වෙනත් වත්කම්වල අඩුවීම

වෙනත් වත්කම්

2020 වර්ෂය අවසානයේදී වෙනත් වත්කම්වල ඇතුළත් ලැබියයුතු දෑ, පෙර ගෙවීම්. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ගෙවූ පොලී මත භාණ්ඩාගාරයෙන් ලැබියයුතු දෑ, භාණ්ඩාගාරයට ගෙවූ අත්තිකාරම් සහ කාර්ය මණ්ඩල ණය සඳහා ක්‍රමක්ෂය නොකළ පිරිවැය 2019 වසරේ පැවති රු.බි. 35.2 සිට 34.6% කින් පහළ ගොස් 2020 වසරේදී රු.බි. 23 ක් විය. භාණ්ඩාගාරයෙන් වසරකට පෙර ලැබියයුතු පොලී අඩු කිරීම සඳහා 7.84% ක ඵලදායී අනුපාතයක් සහිත රු.බි. 19.2 ක භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරන ලද අතර, මෙම පොලී රහිත වත්කම් 2019 දී මුළු වත්කම් වලින් 3% ක් නියෝජනය කරන ලදී. එය 2020 අවසාන වන විට 1.7% දක්වා අඩු විය.

E මුදල් හා මුදල් සමාන දෑ කළමනාකරණය

මුදල් හා මුදල් සමාන දෑ සහ බැංකුවල ඇති තැන්පතු

මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අතැති මුදල්, බැංකු වල ඇති තැන්පතු සහ ඇමතුමේ මුදල් හා කෙටි දැනුම්දීම් මුදල් වලිනි. බැංකු වල ඇති තැන්පතු මුදල් ප්‍රමාණය වැඩිවීම හේතුකොට ගෙන 2020 වසර අවසානය වන විට බැංකුව සතුව මුදල් හා මුදල් සමාන දෑ රු.බි. 6.5 ක් වූ අතර එය 20.7% කින් ඉහළ අගයක් 2019 වසර සමග සසඳන විට පෙනීයයි. මුදල් හා මුදලට සමාන දෑ බැංකු විසින් ඒවායේ කෙටිකාලීන බැඳීම් පියවීම සඳහා භාවිතා කරන අතර ඒවා ද්‍රවශීල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පහසුව සලසයි.

F මුළු වගකීම්

පසුගිය වසර තුළ 36.3% කින් මුළු ණය ගැනීම්වල අඩුවීම් හමුවේ වුවද ගනුදෙනුකාර තැන්පත්වල වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන මුළු වගකීම් 2019 වසරේ තිබූ රු.ට්‍රිලියන 1.1 සිට රු.ට්‍රිලියන 1.3 දක්වා 18.0% කින් වැඩිවී ඇත.

G විචක්ෂණ ලෙස අපගේ ණය කළඹ කළමනාකරණය

අනෙකුත් මූල්‍ය ආයතනවලින් ලබාගත් ණය සහ ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ අලෙවි කරන ලද සුරකුම්පත් අපගේ මුළු ණය තුළ අන්තර්ගතය. නිකුත් කරන ලද ණය සුරකුම්පත් වසරකට පෙර වාර්තා කළ රු.බි. 82.9 හා සැසඳීමේදී 2020 දෙසැම්බර් 31 දිනට රු.බි. 52.8 දක්වා 36.3% ක සැලකිය යුතු පහත වැටීමක් පිළිඹිබු කරයි. අතිරේක ස්ථර 1 ප්‍රාග්ධනය ඉහළ දැමීම සඳහා සහ බැංකුවේ ණයදීමේ ක්‍රියාකාරකම් මූල්‍යනය කිරීම සඳහා නිකුත් කරන ලද රු.බි.5 වටිනා නිත්‍ය ණයකරවල වර්ධනය හමුවේ වුවද වසර පුරාවට පැවති අතිරික්ත ද්‍රවශීලතාවයේ ප්‍රතිඵලයක් ලෙස ණය ආපසු ගෙවීම් නිසා බැංකුවේ ණය ගැනීම් සැලකිය යුතු ලෙස පහත වැටී ඇත.

බැංකුවලට ගෙවියයුතු දෑ

අයිරා, ඇමතුම් මුදල් ණයගැනීම්, බැංකුවලින් ණයගැනීම් සහ ප්‍රති මිලදී ගැනුම් ගිවිසුම් යටතේ අලෙවි කරන ලද සුරකුම්පත් යනාදිය බැංකුවලට ගෙවිය යුතු දෑ වල අන්තර්ගත වන අතර 2019 වාර්තා වූ රු.බි. 35.0 අගය 63.3% කින් අඩුවී රු.බි. 12.9ක් විය. මෙයට හේතු වූයේ විදේශ විනිමය ණය ආපසු ගෙවීම සහ ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ අලෙවිකරන කල සුරකුම්පත් කල්පිරීමයි.

අනෙකුත් ණයකරුවන්ට ගෙවියයුතු දෑ

ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ අනෙකුත් අලෙවි කරන ලද සුරකුම්පත් වලින් බැංකු වලට අලෙවි කරන ලද සුරකුම්පත් හැර අනෙකුත් ඒවා අයත් වන අතර පෙර වර්ෂයේ වාර්තා කරන ලද රු.බි. 21.2 ට සාපේක්ෂව 61.5% ක අඩුවීමක් සමඟ එය 2020 දී රු.බි. 8.2 ක් ලෙස වාර්තා විය.

නිකුත්කළ ණය සුරැකුම්පත්

නිකුත්කළ ණය සුරැකුම්පත්, සුරැකුම් නොකළ නිදහස් කළ හැකි ද්විතියික ණයකර, ජ්‍යෙෂ්ඨ සුරැකුම් නොකළ නිදහස් කළ හැකි ණයකරවලින් සහ සුරැකුම් නොකළ ද්විතියික නිත්‍ය ණයකර වලින් සමන්විත වේ. අතිරේක ස්ථර 1 ප්‍රාග්ධනය ඉහළ දැමීම සඳහා සහ බැංකුවේ ණයදීමේ ක්‍රියාකාරකම් මූල්‍යනය කිරීම සඳහා නිකුත් කරන ලද රු.බි.5 ක් වටිනා නිත්‍ය ණයකර නිකුතුව හේතුවෙන් බැංකුවේ ණය සුරැකුම් කළඹ 2019 වසරේ වාර්තා කළ රු.බි. 26.7 සිට 2020 වසරේ දෙසැම්බර් දක්වා රු.බි. 31.8 දක්වා 19% කින් ඉහළ ගොස් ඇත. තවද, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය වැඩිකිරීම සහ බැංකුවේ වත්කම් සහ වගකීම් කළඹ අතර කල්පිරීම තුළ නොගැළපීම අඩු කිරීම පිණිස බැංකුවේ ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහා 2016 දී නිකුත්කළ රු.බි.6.0ක් වටිනා වසර පහේ ද්විතියික ණයකරවලින් මෙම කළඹ සමන්විත විය. ශ්‍රී ලංකා රුා/ ඇළුඩො හුවමාරු ගිවිසුම් අවලංගු කිරීමේ මූල්‍ය අවශ්‍යතා සඳහා මුදල් යෙදවීමේ අරමුණ ඇතිව නිකුත් කරන ලද ජ්‍යෙෂ්ඨ ණයකර ද මේ තුළ අන්තර්ගතය.

H ඉතිහාසය තුළ ඉහළම වාර්ෂික තැන්පතු සංචලනය ළඟා කර ගැනීම

වසර තුළ රු.බිලියන 221.9 ක ඉතුරුම් සංචලනය කර ඇත. වසරක් තුළ මේ දක්වා ඉහළම අගය වාර්තා කරමින් බැංකුවේ තැන්පතු පදනම 2019 වාර්තා කළ රු.ට්‍රිලියන 1.0 ට සාපේක්ෂව, 2020 වසර අවසානයට රු. ට්‍රිලියන 1.2 දක්වා 21.7% කින් වර්ධනය වී ඇත. වසර තුළ පැවති පහළ පොලී අනුපාත හමුවේ වුවද ඉතුරුම් හා ස්ථාවර තැන්පත් පදනම පිළිවෙලින් රු.බි.280 සහ රු.බි. 957.1 දක්වා ඉහළ යමින් ඊට අදාළව පිළිවෙලින් 28.1% සහ 19.9% සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරයි. පැවති වසංගත තත්ත්වය හමුවේ කුටුම්බ ඉතුරුම් ඉහළයාම ඊට ප්‍රධාන හේතුවයි. මුළු තැන්පතුවලට සාපේක්ෂව ඉතුරුම් තැන්පතු අනුපාතය පසුගිය වසරේ වාර්තා කළ 21.5% සිට 22.6% දක්වා ඉහළ යමින් ඉතුරුම් මුසුවේ ඇතිවූ වාසිදායක වෙනසේ ප්‍රතිඵලය අවම පිරිවැය අරමුදල්කරණයට හේතු විය.

තැන්පතු සංචලනය හා වර්ධනය

ප්‍රස්තාරය 12



I අනෙකුත් වගකීම්වල ඉහළයාම

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම පසුගිය වසරේ අනුරූප කාලසීමාව තුළ වාර්තාකළ රු.බි. 5 ට සාපේක්ෂව රු.බි. 10.9 දක්වා 116.6%කින් 2020 දෙසැම්බර් අවසානයේදී ඉහළ ගොස් ඇත. වට්ටම් අනුපාතවල වෙනස්වීම් සහ විශ්‍රාමිකයින්ගේ වෛද්‍ය සහන යෝජනා ක්‍රමය තුළ සිදුකළ සංශෝධන සමඟ ලබාදෙන ලද විශ්‍රාම වැටුප් ප්‍රමාණයේ වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

කල්බදු වගකීම

රු.බි. 1.3 ලෙස හඳුනාගත් කල්බදු වගකීම 2019 1.3ක් වාර්තා කළ රු.බි. 1.1 ට සාපේක්ෂව 19.5%ක වර්ධනයකි.

අනෙකුත් වගකීම්

ගාස්තු සහ වියදම් මත කරන ලද ප්‍රතිපාදන, මූල්‍ය සේවා මත බදු සහ විවිධ ණයහිමියන් යනාදියෙන් සමන්විත අනෙකුත් වගකීම් 2019 වාර්තා වූ රු.බි. 6.0 ට සාපේක්ෂව 12.6% ක වැඩිවීමක් සමගින් 2020 දී රු.බි. 6.7 ක් ලෙස වාර්තා විය.

මූල්‍ය ප්‍රාග්ධන සමාලෝචනය

අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම් →

වසර තුළ, බැංකුව විසින් එහි මුළු බැඳීම් සහ අසම්භාව්‍යතා පසුගිය වසරේ රු.බි. 10.4ට සාපේක්ෂව රු.බි. 23.8 දක්වා 129.7%ක වැඩිවීමක් වාර්තා කරන ලදී. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ භාවිතා නොකළ ණය පහසුකම් ඉහළයාමයි.

J අපගේ ප්‍රාග්ධනය ශක්තිමත්ව පැවතීම

කොටස් හිමියන්ගේ ස්කන්ධය →

මුළු කොටස් හිමියන්ගේ ස්කන්ධය පසුගිය වසර තුළ රු.බි. 45.9 සිට 2020 දී රු.බි. 51.9 දක්වා ඉහළ ගියේය. වසර තුළ, කොටසක ඉපයීම කොටස් හිමියන්ට වෙන් කරන ලද ලාභය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස 2019 දී තිබූ රු. 6.79 සිට රු. 10.75 දක්වා වැඩිවිය. බැංකුවට එහි ප්‍රාග්ධන පදනම් වැඩි කිරීම සඳහා ලබාගත හැකි අවස්ථාවන් සීමිත නිසා, 9.9% දක්වා ලාභාංශ ගෙවීම ක්‍රම ක්‍රමයෙන් අඩුකිරීමට අප පොළඹවන ලද අතර ඒ තුළින් වසර තුළ අභ්‍යන්තරව උත්පාදනය කළ ප්‍රාග්ධනයේ වැඩිවීමකට මඟ පෑදුණි.

ප්‍රාග්ධන කළමනාකරණය

බැංකුවේ ප්‍රාග්ධන කළමනාකරණය තුළින් බැංකුවේ දිගු කාලීන සහ කෙටි කාලීන ඉලක්ක අත්කර ගැනීම සඳහා පහසුකම් ඇති කරමින් කොටස්හිමියා සඳහා වටිනාකම නිර්මාණය කිරීමට අපේක්ෂා කෙරේ. ජාතික ඉතිරිකිරීමේ බැංකුව ගනු ලබන අවදානම් මට්ටම පිළිබඳ අපගේ අභ්‍යන්තර ඇගයීම, ශ්‍රේණිගතකරණ ආයතවල අපේක්ෂාවන්, නියාමකයින්ගේ අවශ්‍යතා සහ කොටස් හිමියා විසින් අපේක්ෂිත ප්‍රතිලාභ ඇතුළත් සාධක ගණනාවකට අනුව එහි ප්‍රාග්ධන මට්ටම් කළමනාකරණය කරයි. මූල්‍ය කාර්යක්ෂමතාවය වැඩි කිරීම සහ පාඩු අවශෝෂණය කිරීම සඳහා ප්‍රාග්ධන පදනමේ හැකියාව ප්‍රශස්තකරණය සඳහා ප්‍රාග්ධන ව්‍යුහය හා ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රියා පටිපාටිය තුළින් පූර්ණ වාසිය ලැබෙන බවට ජාතික ඉතිරිකිරීමේ බැංකුව තහවුරු කරයි.

ප්‍රාග්ධන කළමනාකරණ අරමුණු →

ප්‍රාග්ධන කළමනාකරණයේ ප්‍රධාන අරමුණු වන්නේ බැංකුවේ ව්‍යාපාර ක්‍රමෝපායට සහයවීම සහ නියාමන අවශ්‍යතා කඩකිරීමක් නොමැතිව බරපතල පහත වැටීමකදී පවා රඳා පැවතීමට තරම් ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටමක් සහතික කිරීමයි.

බැංකුවේ ප්‍රාග්ධන කළමනාකරණ පරමාර්ථ පහත පරිදි සාරාංශ කළ හැකිය:

- අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් ප්‍රාග්ධනය පවත්වා ගැනීම
- බැංකුවේ අවදානම් රුචියට සහයවීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනය රඳවා ගැනීම
- බැංකුවේ උපාය මාර්ගික අරමුණු වලට සහායවීමට ව්‍යාපාරයට ප්‍රාග්ධනය වෙන්කිරීම.
- ණය ශ්‍රේණිගතකරණ අරමුණු අත්කරගැනීම සහ විභව ආතති සිදුවීම් වලට ඔරොත්තු දීම පිණිස බැංකුවේ ප්‍රාග්ධනය කළමනාකරණය කරන බව සහතික කිරීම.

ක්‍රියාවලිය

අධ්‍යක්ෂ මණ්ඩලය (මණ්ඩලය) අපගේ ප්‍රාග්ධන කළමනාකරණ පරමාර්ථ සකස් කිරීම සඳහා වගකීමට බැඳී සිටී. අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රාග්ධන ඉලක්ක ආකාරයෙන් මෙම පරමාර්ථය ප්‍රකාශ කරයි. කොටස් හිමියාට ප්‍රතිඵල ලබාදෙමින් සහ ව්‍යාපාරයේ වර්ධනය සහ ආයෝජන අවස්ථාවන් සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන සම්පත් ලබාගත හැකි බව සහතික කරමින් සහ අපගේ ක්‍රමෝපායික සැලසුම් සහ අවදානම් රුචිය සැලකිල්ලට ගනිමින් අහිතකර තත්ත්වයන්ට ඔරොත්තු දෙමින් මෙම පරමාර්ථ නොනැවතී කරගෙන යයි. අපගේ ලාභාංශ ප්‍රතිපත්තිය වන්නේ අපගේ ප්‍රාග්ධන කළමනාකරණ පරමාර්ථවලට සහ දිගු කාලීන වර්ධන අපේක්ෂාවන්ට අනුරූපව කාලය පුරා තිරසාර ලාභාංශ ගෙවීමයි. අපගේ ලාභාංශ ප්‍රතිපත්තියට අනුකූලව, බැංකුව 2020 වසර තුළ රු.බි. 1.0ක අවසාන ලාභාංශයක් ගෙවන ලදී

අපගේ ප්‍රග්ධන කළමනාකරණ පරමාර්ථ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) තුළින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රාග්ධන කළමනාකරණය සහ සැලසුම් කිරීමේ ක්‍රියාවලියක් හරහා ක්‍රියාත්මක කරන අතර වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) මගින් අධීක්ෂණය කෙරේ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවේ මූලසුන දරයි. මෙම කමිටුව වර්තමාන සහ ප්‍රක්ෂේපිත ප්‍රාග්ධන තත්ත්වය පිළිබඳ යාවත් කිරීම් නිතිපතා ලබා ගනී.

ප්‍රාග්ධනය සැලසුම් කිරීම සඳහා ප්‍රධාන මෙවලම වාර්ෂික අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ඇගයීම් ක්‍රියාවලිය (ICAAP) වන අතර මේ තුළින් අපගේ ප්‍රක්ෂේපිත ප්‍රාග ්ධන සැපයුම් සහ නියාමන අවශ්‍යතාවන්ට අදාළ ඉල්ලුම සහ අපගේ ප්‍රාග්ධන ඉලක්ක අපි තක්සේරු කරමු. වාර්ෂික අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ඇගයීම් ක්‍රියාවලිය වසර තුනක සීමාවක් සඳහා විවිධ විෂය පථයන් සහ එහි දැඩිබව පිළිබඳ ආතති අවස්ථා ඇතුළුව විවිධ සිදුවීම් පෙළ ආවරණය කරයි.

වසර තුළ, ණය සඳහා සම්මත ප්‍රවේශය, වෙළෙඳපොළ අවදානම සඳහා සම්මත මැනුම් ප්‍රවේශය සහ මෙහෙයුම් අවදානම සඳහා මූලික දර්ශක ප්‍රවේශය භාවිතා කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි ස්ථරය 1 යටතේ වාර්ෂික අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීම් ක්‍රියාවලිය අනුව එහි ප්‍රාග්ධන අවශ්‍යතා බැංකුව තක්සේරු කළ අතර, ක්ෂේත්‍රය් මනා පරිචයන්ට අනුව පුළුල් පරාසයක අවදානම් සහ බැංකුවේ අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණ හැකියාවන් පිළිබඳ සැලකිල්ලට ගනිමින් 2 වන ස්ථරයේ අවදානම් තක්සේරු කිරීමට අභ්‍යන්තරව ඇතිකළ ආකෘතියක් භාවිතා කරන ලදී. අයවැයකරණ ක්‍රියාවලියේ කොටසක් ලෙස ව්‍යාපාර මාර්ග මගින් ප්‍රාග්ධන වෙන්කිරීම් සිදු කෙරෙන අතර ඒවා වසර පුරා නිරීක්ෂණය කරයි. බැංකුවේ ආයතනික කළමනාකරණය ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහ අනෙකුත් ප්‍රාග්ධන ආශ්‍රිත ගැටළු තක්සේරු කිරීමට සහ ක්‍රමෝපායන් මගින් ක්‍රියාත්මක කිරීම සඳහා එහි යෝජනාවන් ක්‍රමයෙන් වැඩි කිරීමට කලින් කල හමුවිය. සමාලෝචිත වසර තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් පුළුල් ආතති පරීක්ෂාව සිදුකර ඇති අතර බැංකුව එහි ව්‍යාපාර කටයුතු, අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ක්‍රමෝපායික සැලැස්ම, අවදානම් රුචිය, අවදානම් පැතිකඩ සහ එය ක්‍රියාත්මක වන බාහිර පරිසරයට අදාළව මනාව ප්‍රාග්ධනකරණයවී පවත්නා බවට නිගමනය කරන ලදී.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත පහසු මට්ටමක පැවතීම →

අපගේ අවදානම මත බරතබන ලද වත්කම් (RWA) 2019 දී වාර්තාකළ රු.බි. 255.6 සිට රු.බි. 309.4 දක්වා 21.0%කින් වැඩිවිය. මෙය වත්කම් වර්ධනය සමග අනුකූල වන අතර, මෙම වැඩිවීමට බොහෝ දුරට හේතු වූයේ ණය අවදානම මත බර තබන ලද වත්කම්වල 22.0% ක වර්ධනය සහ මෙහෙයුම් අවදානම මත බර තබන ලද වත්කම්වල 18.2% ක වර්ධනයයි (අවදානම මත බරතබන ලද වත්කම් පිළිබඳ වැඩිදුර විස්තර සඳහා පිටු 92 සිට 114 දක්වා අවදානම් හා ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාව සහ බාසල් III යටතේ ස්ථර 3 අනාවරණය පිටු අංක 287 සිට 300 දක්වා බලන්න).

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ ලකුණු පදනමක් මත බැංකු හඳුනාගනිමින් 2019 දෙසැම්බර්වල දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකු (D-SIBs) සමග ගනුදෙනුකිරීම සඳහා වැඩරාමුවක් පිළිබඳ නියෝගයක් නිකුත් කරන ලදී. ඒ අනුව වත්කම් ප්‍රමාණය රු.ට්‍රි.1.0 ඉක්මවා ගියද ස්ථර 1 සහ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයන්හි අවම අවශ්‍යතාවයන් පිළිවෙලින් 8.5% ක් හා 12.5% ක් වෙමින් බැංකුව දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් නොවන බැංකුවක් ලෙස හැඳින්විණි. කෙසේ නමුත් ශ්‍රී ලංකා මහ බැංකුව කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා දේශීයව පද්ධතිමය වැදගත් නොවන බැංකු වලට ලබාදුන් සහනයක් ලෙස

මූල්‍ය ප්‍රාග්ධන සමාලෝචනය

නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවය පදනම් ලකුණු 50 කින් පහළ දමනු ලැබුවේය. තවදුරටත් ශ්‍රී ලංකා මහ බැංකුව අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරා ගතයුතු බලපත්‍රලාභී බැංකුවල ප්‍රාග්ධන වර්ධනය කිරීම 2020 සිට 2022 දක්වා කල් දමනු ලැබූ අතර, බැංකුවල අභිමත වියදම් සීමා කරන ලදී. කොවිඩ් 19 වසංගතයෙන් පසුව දුන් සහනයක් ලෙස නියාමන ස්ථර 1 අනුපාතය 8.5% සිට 8.0% දක්වා පහත දමන ලද අතර මුළු ප්‍රාග්ධන අනුපාතය 12.5% සිට 12% දක්වා පහත දමන ලදී.

අවදානම මත බර තැබූ වත්කම්

ප්‍රස්තාරය 13



අ – 2019 දෙසැම්බර් 31
ආ – ණය අවදානම
ඇ – මෙහෙයුම් අවදානම
ඈ – වෙළෙඳපළ අවදානම
ඉ – 2020 දෙසැම්බර් 31

බාසල් III ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව

ප්‍රස්තාරය 14



- අවදානම මත බර තැබූ සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (බදු පෙර)
- ස්ථර 1 ප්‍රාග්ධනය
- මුළු ප්‍රාග්ධනය

බැංකුවේ ප්‍රාග්ධන තත්ත්වය, කොවිඩ් 19 වසංගතය හේතුවෙන් නියාමන අධිකාරිය විසින් සංශෝධනය කරන ලද අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට වඩා ඉහළින් පැවතුනි. පිළිවෙලින් 8.0% සහ 12.0% වන ස්ථර 1 සහ මුළු ප්‍රාග්ධන අවම අවශ්‍යතා අනුපාතයන් පිළිවෙලින් 13.65% සහ 16.45% වශයෙන් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට ඉහළින් 2020 දෙසැම්බර් අවසානයේදී තිබිණි. තෝලන අනුපාතයද අවම අවශ්‍යතාවය වන 3.0% කට වඩා ඉහළ අගයක් ගනිමින් 6.64% ක් විය.

මුදල් ප්‍රවාහ කළමනාකරණය →

වගුව 06

	2020 රු. මිලියන	2019 රු. මිලියන
ආරම්භක මුදල් ශේෂය	**5,293.9**	3,352.0
මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය	**20,835.3**	16,462.8
මෙහෙයුම් වත්කම්වල (ඉහළයාම)/පහළ යාම	**(193,524.2)**	(114,421.5)
මෙහෙයුම් වගකීම්වල ඉහළයාම/(පහළ යාම)	**186,754.7**	108,707.7
බදු ගෙවීම්	**(2,889.0)**	(3,798.6)
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	**11,176.8**	6,950.4
ආයෝජන කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	**(13,516.6)**	(2,228.5)
මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ	**3,220.0**	(2,780.0)
අවසාන මුදල් ශේෂය	**6,174.1**	5,293.9

2020 දෙසැම්බර් 31 දිනට රු.බි.6.2 ක් වූ බැංකුවේ මුදල් හා මුදල් සමාන දෑ පසුගිය වසරේ තිබූ රු.බි.5.3ට වඩා 16.6% ක වැඩිවීමක් වන අතර මෙය මෙහෙයුම් කාර්යන්වලින් ලද මුදල් ප්‍රවාහයන්හි වැඩිවීම නිසා සිදු විය. මෙයට හේතු වූයේ රු.බි. 5 ක් වටිනා නිත්‍ය ණයකර නිකුත් කිරීමයි.

අරමුදල් මූලාශ්‍ර සහ උපයෝජනය

බැංකුව ගනුදෙනුකරුවන්ගේ තැන්පතු සහ අනෙකුත් මූලාශ්‍ර රාශියකින් මූලිකවම අරමුදල් ලබාගැනීම සමඟ ඉදිරියට යන පදනමක් මත ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වයක් ඇති බව සහතික කිරීමට ණය අවස්ථාවන්හි වාසිය ලබා ගනිමින් එහි මූල්‍ය තත්ත්වය සක්‍රියව කළමනාකරණය කරමින් සිටී.

බැංකුව අරමුදල් පිරිවැය අවම මට්ටමේ පවත්වා ගනිමින් පවත්නා සහ අනාගත වත්කම් පදනමට සහාය වීමට සුදුසු අරමුදල් මූලාශ්‍ර ප්‍රමාණයක්, කාලසීමාවක් සහ විවිධාංගීකරණයක් ඇති බවත් අඛණ්ඩව සහතික කරයි. සුදුසු අරමුදල් පවතින බව තහවුරු කිරීම සඳහා තරඟකාරී සහ නියාමන පරිසරය අනුව අරමුදල් රැස් කිරීමේ මූලාශ්‍ර නිරන්තරයෙන් ඇගයීමට ලක් කරයි. බැංකුව තම අරමුදල් සම්මිශ්‍රණය තුළ ප්‍රධාන සංරචකයක් ලෙස එහි තැන්පතු පදනම ගොඩනැගීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරයි.

බැංකුව එහි එහි මූලික අරමුදල් මූලාශ ලෙස ගනුදෙනුකරුවන්ගේ තැන්පතු, ණය සුරැකුම්පත්, කාලීන ණය සහ ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ අලෙවිකළ සුරැකුම්පත් මත විශ්වාසය තබයි. ගනුදෙනුකරුවන්ගේ තැන්පතු සාමාන්‍යයෙන් කෙටිකාලීන කල්පිරීම් ඇති ඒවා වන අතර, ඒවායින් විශාල කොටසක් ඉල්ලුම මත ගෙවිය යුතුය. මෙම තැන්පතුවල කෙටි කාලීන ස්වභාවය වත්කම් වගකීම් කල්පිරීම්වල ඇති නොගැලපීමෙන් බැංකුවේ ද්‍රවශීලතා අවදානම වැඩි කරන අතර තරඟකාරී මිලකරණය සහ වෙළෙඳපොළ ප්‍රවණතා දැඩි ලෙස නියාමනය තුළින් බැංකුව මෙම අවදානම කළමනාකරණය කරයි.

මූල්‍ය ප්‍රාග්ධන සමාලෝචනය

අරමුදල් මූලාශ්‍ර

ප්‍රස්තාරය 15



අරමුදල් උපයෝජනය

ප්‍රස්තාරය 16



අරමුදල් මූලාශ්‍ර

වගුව 07

	2020 රු. මිලියන	2019 රු. මිලියන	2018 රු. මිලියන
මෙහෙයුම් කටයුතු වලින් ලද ආදායම	**125,470**	117,998	110,454
තැන්පතු	**221,910**	170,677	101,634
ණය ගැනීම්	**5.000**	6,288	31,086
කල්පිරුණු ආයෝජන	**665**	18,132	43,245
වෙනත්	**11,010**	15	7
මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**364,055**	313,110	286,426

අරමුදල උපයෝජනය

වගුව 08

	2020 රු. මිලියන	2019 රු. මිලියන	2018 රු. මිලියන
ණය සහ අත්තිකාරම්	**96,178**	31,734	48,291
ණය සහ අනෙකුත් උපකරණ	**122,222**	94,261	15,976
ණය ආපසු ගෙවීම්	**35,016**	67,873	107,553
පොලී ගෙවීම්	**87,823**	83,363	86,068
සේවකයන්ට ගෙවීම්	**9,574**	9,576	8,944
අනෙකුත් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ගෙවීම්	**4,212**	4,450	3,732
ප්‍රාග්ධන වියදම්	**1,366**	1,505	1,742
පාලිත සහ ආශ්‍රිතයන්හි ආයෝජන	**–**	3,111	800
ලාභාංශ	**1,000**	2,000	500
බදු ගෙවීම්	**6,525**	8,725	6,738
වෙනත්	**138**	6,512	6,082
	364,055	313,110	286,426

මුළු තැන්පතුවලට ණය අනුපාතය 2020 අවසානයට 41.8% ක් වූ අතර, එය පසුගිය වසරේ වාර්තා කළ 44.7% ට වඩා අඩු අගයකි. මේ සඳහා විශාල වශයෙන් රු.බි. 26.9 ණය සහ අත්තිකාරම්, ණයකර යටතේ නැවත වර්ගීකරණය කිරීම හේතු විය. එසේම, ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයට අනුව සංචලනය කරන ලද තැන්පතු වලින් 60% රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළයුතු අතර ඒවා අවදානම් රහිත හෙයින් අඩු ඉපයීමක් ජනිත වේ. 2019 දි වාර්තාකළ 60.9% සිට ඉහළ යමින් 62.7%ක මුළු තැන්පතු අනුපාතයට රජයේ සුරැකුම්පත් පවත්වා ගැනිමට බැංකුවට හැකි විය.

ණය ආකෘතිය →

වගුව 09

	2020 රු. මිලියන	2019 රු. මිලියන	2018 රු. මිලියන
කෙටි කාලීන (වසර 1 ට අඩු)	**27,796**	50,994	126,281
මධ්‍ය කාලීන (වසර 1 -3)	**13,677**	25,623	12,032
දිගු කාලීන (වසර 3 ට වැඩි)	**11,323**	6,323	6,000
	52,796	82,940	144,313

අපගේ දිගුකාලීන ප්‍රාග්ධනය පුළුල් කිරීමේ ව්‍යාපෘති සඳහා අරමුදල් සපයනු ලබන්නේ පාවෙන සහ ස්ථිර අනුපාත සහිත දිගුකාලින ණය මෙන්ම අභ්‍යන්තරව උත්පාදනය කරන අරමුදල්වල සංයෝගයකිනි.

වගුව 10 ණය කළඹ තුළ සංයුතිය

	2020 රු. මිලියන	2019 රු. මිලියන	2018 රු. මිලියන
Repo ණයගැනීම්	**14,532**	44,142	73,658
FC ණයගැනීම්	**6,173**	12,023	64,566
නිකුත් කළ ණය සුරැකුම්පත්	**31,773**	26,692	6,006
වෙනත්	**318**	84	83
	52,796	82,940	144,313

ණය ශ්‍රේණිගත කිරීම →

අපගේ ණය ශ්‍රේණිගතකරණය අපටම ආවේනික වූ අවදානම් මගින් පමණක් නොව ශ්‍රී ලංකාවේ ස්වෛරී ණය ශ්‍රේණිගතකරණය තුළ වෙනස් වීම වැනි පද්ධතිමය අවදානම් මගින් ද බලපෑමට ලක්වේ. කොරෝනා වසංගතය පැතිරීමේ තීව්‍රතාවය මත ශ්‍රී ලංකා ආර්ථිකයට ඇතිවූ බලපෑම හේතුකොට ගෙන 2020 අප්‍රේල් මාසයේදී සිදු කරන ලද ස්වෛරී ණය ශ්‍රේණිගතකරණය පහත හෙළීම මත පදනම්ව ෆිච් රේටින්ග්ස් (Fitch Ratings) ආයතනය 2020 මැයි මාසයේදී බැංකුවේ දිගුකාලීන දේශීය හා විදේශීය නිකුතු ණය පැහැර හැරීමේ ශ්‍රේණිගත කිරීම සෘණාත්මක දැක්මක් සහිතව ‘B’ සිට ‘B-’ දක්වා පහත දමන ලදී.

කෙසේ වුවද, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත මඟින් එහි තැන්පතු සහ එයට අදාළ පොලිය සඳහා රජය විසින් ප්‍රකාශිත 100% ක වගකීමේ ප්‍රතිඥාව මත පදනම්ව ඉක්රා ලංකා (ICRA Lanka) සමාගම විසින් ස්ථාවර දැක්මක් සහිතව නිකුතු ණය ශ්‍රේණිගතකරනය (SL) AAA ලෙස ලබා දී ඇත. තවද, බැංකුවට සිය තැන්පතු වලින් අවම වශයෙන් 60% ක් රජයේ සුරැකුම්පත්වල තැන්පත් කිරීමට ඇති ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය හේතු කොට ගෙන එහි ආයෝජන කළඹ අඩු අවදානම් සහිත එකක් ලෙස වර්ගීකරණය කෙරේ.

ලාභාංශ →

2020 තුළ රජයට ලාභාංශය ලෙස රු.බි. 1.0 ක් බැංකුව ගෙවන ලද අතර එය පසුගිය වසරේ ගෙවන ලද රු.බි. 2 ක ලාභාංශයට වඩා අඩුවීමකි. කොටසක ලාභාංශය 2019 දී පැවති රු. 2.13 ට සාපේක්ෂව 2020 දී රු.1.07 ක් විය. ලාභාංශ ආවරණ අනුපාතය, ලාභාංශ ගෙවීම් අනුපාතයෙහි අඩුවීම හේතු කොට ගෙන පසුගිය වසරේ වාර්තා කළ වාර 03 සිට වාර 10 දක්වා 2020 දී ඉහළ ගියේය.

ඵලදායී ලාභාංශ අනුපාතය සහ ලාභාංශ ආවරණය

ප්‍රස්තාරය 17



ද්‍රවශීලතා කළමනාකරණය →

දැඩි ආතති වෙළෙඳපොල අවස්ථා තුළ ද්‍රවශීලතා අවදානම තක්සේරු කිරීමට අනුව සුදුසු ද්‍රවශීලතා ස්වාරක්ෂක රඳවන ලදී. උච්ඡාවචනය සහ දැඩිව බලපාන ලද ද්‍රවශීලතා පරිසරයන් හමුවේ සක්‍රිය ද්‍රවශීලතා කළමනාකරණ ක්‍රියාමාර්ග තුළින් ශේෂ පත්‍ර වර්ධනයට සම්පූර්ණයෙන් සහයවීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාව පවත්වා ගනු ලැබිය.

නියාමන සහ පිළිගත හැකි ආතති තත්ත්වයන්ට මුහුණදීම සඳහා අලෙවි කළහැකි සහ ද්‍රවශීල උපකරණ කළඹ, මුදල් ප්‍රවාහයන් හි අපේක්ෂා නොකළ බාධාවන්ගෙන් ආරක්ෂාකාරී වීම සඳහා පවත්වා ගනු ලැබිය. මෙම කළඹ, විවිධාංගීකරණය සහ ද්‍රවශීලතාව මත නිශ්චිත සීමා තුළ කළමණාකරණය කෙරේ. කළමනාකරණය කරන ලද ද්‍රවශීලතාව නියෝජනය කරන්නේ බාසල් III ද්‍රශීලතා ආවරණ අනුපාතය යටතේ සුදුසුකම් ලත් උසස් තත්වයේ ද්‍රවශීල වත්කම් ඇතුළුව ණය වශයෙන් තබා නොමැති අලෙවිකරණ උපකරණ වන අතර ඒ මගින් ආතති තත්වයක් තුළ ද්‍රවශීලතා ප්‍රභවයන් සැපයිය හැකිය.

ආතති පරිසරයක් තුළ වියහැකි පිටතට ගලායෑම් සපුරාලීමට ඉහළ තත්ත්වයේ ද්‍රවශීල වත්කම් ප්‍රමාණවත් ලෙස ඇති බව සහතික කරමින් බැංකුවේ ලිත් දින 30 ද්‍රවශීල අවදානම් කළඹේ කෙටිකාලීන ස්ථාවරත්වය බාසල් III යටතේ ද්‍රවශීල ආවරණ අනුපාතය මගින් ප්‍රවර්ධනය කරයි. බාසල් III ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතයේ (NSFR) පරමාර්ථය වන්නේ වත්කම් සහ ශේෂ පත්‍රයෙන් බැහැර කටයුතුවල සංයෝජනයට අදාළව ස්ථාවර අරමුදල් කළඹක් පවත්වා ගැනීම බැංකුවට අවශ්‍ය කරමින් බැංකු ක්ෂේත්‍රය තුළ ස්ථාවරත්වය සහ ස්වශක්තතාවට අරමුදල් ලබාදීම ප්‍රවර්ධනය කිරීමයි. ලබාගතහැකි ස්ථාවර අරමුදල් NSFR විසින් සලකා බලන වසරක කාලය පුරා ලබාගැනීමට අපේක්ෂිත ප්‍රාග්ධනය සහ වගකීම්වල කොටස ලෙස නිර්වචනය කෙරේ.

අපගේ ද්‍රවශීල කළඹ ද දේශීය බැංකු සඳහා අදාළ අවම ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (SLAR) වන 20% වඩා ඉහළ අගයක් වසර පුරා පවත්වා ගනිමින් වසර අවසානයේ 69.1% ක් ලෙස යහපත් අයුරින් පැවතිණි. දින 30 ශුද්ධ මුදල් පිටතට ගලායාම් මත මුළු ඉහළ තත්ත්වයේ ද්‍රවශීල වත්කම් මගින් අගය කරන ද්‍රවශීල ආවරණ අනුපාතය වසර පුරා 90% ට වැඩියෙන් අඛණ්ඩව පවත්වාගනු ලැබිය. 2020 අවසානයට, සියළු මුදල් වර්ග සලකා බැලූවිට අපගේ ද්‍රවශීල ආවරණ අනුපාතය 307.22% ක්ව පැවතිණ. 2019 අවසානයේ අපගේ ද්‍රවශීල ආවරණ අනුපාතය අවම සීමාවට වඩා ඉහළින් පැවතිණි. බැංකුවේ දිගුකාලීන අරමුදල් ස්ථාවරත්වය මැනීමට භාවිතා කරන NSFR ද 100% අවම අවශ්‍යතාවන්ට අනුකූල වෙමින් 2020 අග වනවිට 168.5% දක්වා වර්ධනය විය.

මූල්‍ය ප්‍රාග්ධන සමාලෝචනය

අරමුදල් සහ ද්‍රවශීලතා අවදානම කළමනාකරණය

මූල්‍යමය අන්තර්මැදිහත්වය අනුව බැංකුවේ මූලික කාර්ය භාරය වන්නේ කෙටි කාලින තැන්පතු වඩා දිගු කාලීන තැන්පතු බවට හැරවීමයි. මෙම කාර්යභාරය ඉටු කිරීමේදී, බැංකුව ද්‍රවශිලතා සහ කල්පිරීම් නොගැලපීම් වලට ලක්වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අරමුදල් සහ වෙළෙඳපොල ද්‍රවශීලතා අවදානම්වලට ලක් වේ. ශක්තිමත් ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව තුළින්, සාමාන්‍ය තත්ත්වයේ සහ ආතති තත්ත්වයන් යටතේ බැංකුකරණ මෙහෙයුම් බාධා රහිතව පවත්වාගන්නා බවට සහතික කිරීමට බැංකුව එහි අරමුදල් සහ වෙළෙඳපොල ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරයි. ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව මගින් තහවුරු කරන ප්‍රධාන පරමාර්ථවලට සෑම අවස්ථාවකම මූල්‍ය වෙළෙඳපොල විශ්වාසය පවත්වාගැනීම, ප්‍රධාන පාර්ශවකාර බැඳියාවන් ආරක්ෂා කිරීම සහ නියාමන ද්‍රවශීල අවශ්‍යතා සපුරාලිම ඇතුළත් වේ.

බැංකුවට තිරසාර අරමුදල් මූලාශ්‍ර ඇති බවට සහ බැංකුව කෙරෙහි ජනතා විශ්වාසය සහ මූල්‍ය සේවා ක්‍රමය පවත්වා ගැනීමට සෑම අවස්ථාවකදිම ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටම් පවත්වා ගන්නා බව සහතික කිරීම සඳහා අරමුදල්කරණය සහ ද්‍රවශීලතාවයේ වැදගත්කම පිළිගනී. ජාතික ඉතිරි කිරීමේ බැංකුව පාර්ශ්වකරුවන් සඳහා ප්‍රතිලාභ ලබාදීම සඳහා එහි වැඩපිළිවෙල තුළ ද්‍රවශීලතාව කිසිවිටක අඩු කිරීමට සම්මුති වලට එළඹෙන්නේ නැත.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට වත්කම් සහ වගකීම් කමිටුව විසින් විධිමත් ද්‍රවශීලතා තත්ත්වය විශ්ලේෂණය සහ නියාමනය සහ වෙළෙඳපොල පිවිසීම පවත්වා ගැනීම ඇතුළත්ය. නිතිපතා මුදල් ප්‍රවාහ පුරෝකථන. ද්‍රවශීලතා අනුපාත, සහ කල්පිරීමේ පරතර විශ්ලේෂණ මෙම අරමුණ සඳහා භාවිතා කරන විශ්ලේෂණාත්මක මෙවලම් වේ. ද්‍රවශිලතා සහ අරමුදල් අවදානම ද්‍රවශිලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය ඇතුළුව මිණුම් රාශියක් භාවිතයෙන් අගය කරනු ලැබේ. ද්‍රවශීලතා අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණ පිළිබඳ වැඩි විස්තර සඳහා 92 සිට 114 දක්වා පිටුවල අවදානම් හා ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාව බලන්න.

ආර්ථික කාර්ය සාධනය →

සෘජු ආර්ථික වටිනාකම උත්පාදනය සහ බෙදාහැරීම

වගුව 11

	2020 රු. මිලියන	2019 රු. මිලියන
සෘජු ආර්ථික වටිනාකම් ජනනයට	**127,547**	121,929
මෙහෙයුම් වියදම්	**10,207**	5,894
තැන්පතුකරුවන්	**87,622**	89,898
සේවකයන්	**9,967**	10,158
ප්‍රාග්ධන සපයන්නන්	**1,000**	2,000
ලාභාංශ හැර රජය	**9,745**	9,665
සෘජු ආර්ථික වටිනාකම් රඳවා ගැනීම්	**9,007**	4,314
සෘජු ආර්ථික වටිනාකම් බෙදාහැරීම්	**118,540**	117,615

සෘජු ආර්ථික වටිනාකම උත්පාදනය සහ බෙදාහැරීම (රු. මිලියන)

ප්‍රස්තාරය 18



	2020	2019
අ – මෙහෙයුම් වියදම්	**8.00%**	4.83%
ආ – තැන්පතුකරුවන්	**73.73%**	68.70%
ඇ – සේවකයන්	**7.81%**	8.33%
ඈ – ප්‍රාග්ධන සපයන්නන්	**0.78%**	1.64%

	2020	2019
ඉ – ලාභාංශ හැර රජය	**14.71%**	11.47%
ඊ – සෘජු ආර්ථික වටිනාකම් රඳවා ගැනීම්	**7.07%**	3.54%
උ – සෘජු ආර්ථික වටිනාකම් බෙදාහැරීම්	**7.64%**	7.93%

වගුව 12 ▸ ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාත

විස්තරය	බැංකුව 2020 %	2019 %	වෙනස %
SLAR – අවම අවශ්‍යතාවය 20%	**69.10**	60.20	14.8
රුපියල් LCR – අවම අවශ්‍යතාවය (2019 – 100%, 2020 – 90%)	**311.02**	278.12	11.8
සියලුම මුදල්වල LCR – අවම අවශ්‍යතාවය (2019 – 100%, 2020 – 90%)	**307.22**	276.64	11.1
NSFR – අවම අවශ්‍යතාවය (2019 - 100%, 2020 – 90])	**168.54**	175.18	(-3.8)

ප්‍රධාන ව්‍යාපාරික කටයුතු පිළිබඳ සමාලෝචනය

ශාඛා බැංකුකරණය

නිෂ්පාදන හා සේවා
තැන්පතු භාර ගැනීම, පාරිභෝගික ණයදීම, බැංකු ඇපවීම්, කාඩ්පත් විසඳුම් සහ ගනුදෙනුකාර බැංකුකරණය ඇතුළුව පුළුල් පරාසයක සේවා ලබාදීම.

ගනුදෙනුකරුවන්
ස්වභාවික පුද්ගලයින් සහ නෛතික පුද්ගලයින්.

බෙදාහැරීමේ මාර්ග
ශාඛා, ස්වංයක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs), තැපැල් කාර්යාල. උප තැපැල් කාර්යාල, මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර (CDM/CRM), මාර්ගගත බැංකුකරණය. දුරකථන, ඇමතුම් මධ්‍යස්ථානය

මෙහෙයුම් පරිසරය

- කොවිඩ්-19 වසංගතය පැතිරියාම සහ එහි බලපෑම
- වසංගතය නිසා බලපෑමට ලක්වූ පුද්ලයින් හා ව්‍යාපාරවලට සහයදීම සඳහා රජය ගන්නා පියවර
- ණය පුළුල් කිරීමේ වර්ධනය

උපායමාර්ගික අවධානය යොමු කළයුතු අංශ

- අපගේ ගනුදෙනුකරුවන් රඳවා ගැනීම සහ නව ගනුදෙනුකරුවන් අත්කරගැනීම කෙරෙහි අවධානය
- සේවකයන්ගේ සහ ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතභාවය
- රජයෙන් ලබාදුන් සෞඛ්‍යාරක්ෂිත පියවර අනුව මෙහෙයුම්වල නිරත වෙමින් අඛණ්ඩව සේවාවක් පවත්වාගෙන යාම
- සම්බන්ධතා අපගේ හරය ලෙස අවධානය යොමු කිරීම හේතුවෙන් නිෂ්පාදන අවධානයේ සිට ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ජීවිතයේ අදියරයන් තුළින් සේවය කිරීමේ පදනමට යොමුවීම
- ශුද්ධ පොළී ආදායම සහ ගනුදෙනු සංඛ්‍යාව කෙරෙහි ශක්තිමත් අවධානය
- ණය ප්‍රතිපත්තිය ආරක්ෂා කිරීම සහ අයකර ගැනීම සහ හානිකරණ කෙරෙහි අවධානය
- පිරිවැය කාර්යක්ෂමතා ඉදිරියට ගෙනයාම
- සමහර වර්ගවල සැලකිය යුතු වර්ධනයක් සමඟ වෙළෙඳපොළ කොටස පවත්වා ගැනීම
- ඉතුරුම් මිශ්‍රණය ඉහළ නංවමින් අවම පිරිවැයක් සහිත ඉතුරුම් සංචලනය
- වත්කම්වල ගුණාත්මකභාවය අඛණ්ඩව වර්ධනය කිරීම

2020 වසරේදී වූ ප්‍රධාන සංවර්ධනයන්

- ශාඛා සහ තැපැල් ජාලය තුළින් රු. බිලියන 218.4ක මේ දක්වා ඉහළම තැන්පතු සංචලනය කරමින් 2019 වසරට සාපේක්ෂව 28.2% ක වර්ධනයක් අත්කර ගැනීම
- නව ශාඛා සහ ATM, යන්ත්‍ර 03 විවෘත කිරීම සහ CRMs යන්ත්‍ර 24ක් වසර තුළ ස්ථාපනය කරන ලදී
- වසර තුළදී ශාඛා 09 ක් නැවත ස්ථානගත කරන ලදී
- නව ගනුදෙනුකරුවන් 16,000 කට වඩා පිරිසක් අන්තර්ජාල බැංකුකරණය සඳහා එකතු කර ඇත
- CRM යන්ත්‍ර මගින් පසුගිය වසරට වඩා 50% කින් තැන්පත් ගනුදෙනු වර්ධනය කර ගැනීම
- තැපැල් කාර්යාලවල තැන්පතු සංචලනය 68.0%කින් වර්ධනය
- පාරිභෝගික ණයවල 24%ක වර්ධනය
- 2019 දී 10.75% ක්ව තිබූ තැන්පතුවල වෙළෙඳපොළ කොටස මෙම වසරේදී 10.80%ක් දක්වා වර්ධනය වීම
- 2.79%ක දළ අක්‍රීය ණය අනුපාත බැංකු ක්ෂේත්‍රයේ සාමාන්‍ය අනුපාතය වන 4.9%ට වඩා අඩුවීම

ඉදිරි ගමන්මග

- ඩිජිටල් පාරිණාමනය වේගවත් කිරීම සහ ඩිජිටල් හැකියාවන් හි ආයෝජනය
- ආරක්ෂණ පැතිකඩ මඟහැර ගැනීමකින් තොරව ස්වයං සේවා මාර්ග කෙරෙහි ඩිජිටල් ගනුදෙනුකාර අත්දැකීම වර්ධනය කිරීම
- වෙළෙඳපොල කොටස පවත්වා ගනිමින් හඳුනාගත් ප්‍රදේශවල හා නිෂ්පාදිතවල අපේක්ෂිත වර්ධනයක් ළඟාකර ගැනීම
- මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉදිරියට ගෙන යාමට පිරිවැය ප්‍රශස්ථකරණ උපායමාර්ගයන් සහ තාක්ෂණයේ උපකාර කිරීම් ලබා ගැනීම
- ග්‍රාමීය තැන්පතු සහ අවම පිරිවැය සහිත මූල්‍යනය ඉහළ නංවා ගැනීම
- බැංකු ක්ෂේත්‍රයේ සාමාන්‍ය අනුපාතයට වඩා අඩුවෙන් පාරිභෝගික ණයවල අක්‍රීය ණය අනුපාතය කළමනාකරණය කිරීම

මූල්‍ය ප්‍රාග්ධන සමාලෝචනය

ආයතනික ණය

නිෂ්පාදන සහ සේවා

- මූල්‍ය ආයතන සහ ඒවායේ පරිපාලිත සමාගම්වලට සෘජු ණයදීම
- මූල්‍ය පහසුකම් ව්‍යුහගතකරණය (සේවාදායකයින් සඳහා ව්‍යුත්පන්න නිෂ්පාදන)
- ණය දෙන්නන් සහ ණය ගන්නන් අතර ගනුදෙනු සම්බන්ධීකරණය හා පියවීම් සිදු කරන සම්මේලන/ඒකාබද්ධ පහසුකම් සඳහා නියෝජිත කාර්යභාරයන් ඉටු කිරීම
- භාර සහතික, පුද්ගලික කොටස් නිකුතු සහ ණයකරවල ආයෝජනය කිරීම
- යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා අරමුදල්කරණය තුළ ක්ෂේත්‍රයේ ප්‍රවීනත්වය ඉදිරියට ගෙන යාම
- ණය සුරැකුම්පත් නිකුතුව මගින් ව්‍යවස්ථාපිත ප්‍රාග්ධනය සහතික කිරීම සහ ණය සහ ආයෝජන සඳහා පහසුකම් සැපයීම

ගනුදෙනුකරුවන්

ආයතන, රජයට අයත් ව්‍යවසාය, මූල්‍ය ආයතන සහ පුද්ගලික ආයතන

බෙදා හැරීමේ මාර්ග

සෘජු ප්‍රවේශය

මෙහෙයුම් පරිසරය

- සාර්ව-ආර්ථික මූලධර්ම දුර්වලවීම සහ අඩු ආර්ථික වර්ධනය
- ඉදිකිරීම, සංචාරක කර්මාන්තය සහ ප්‍රසම්පාදන වැනි සමහර අංශ මන්දගාමී වීම
- ආයෝජකයින්ගේ විශ්වාසය අඩුවීම සහ ප්‍රාග්ධන ගලායාම් වැඩිවීම
- පැවති අඩු පොලී අනුපාත තන්ත්‍රය
- රුපියලේ අගය අඛණ්ඩ පහත වැටීම
- ස්වෛරී ශ්‍රේණිගත කිරීම පහළ වැටීම

උපායමාර්ගික අවධානය යොමු කළ යුතු අංශ

- නව සේවාදායකයින් අත්කරගැනීම
- ගාස්තු පදනම් ආදායම් උත්පාදන කටයුතු කෙරෙහි අවධානය
- ඉහළ අවදානම් ආවරණ අංශයන් කෙරෙහි විමසිල්ලෙන් සිටීම තුළින් ඉහළ වර්ධන වාණිජකරන හැකියාවන් සහිත ක්ෂේත්‍ර කෙරෙහි අවධානය (විදුලිබලය. උපයෝගිතා, යටිතල පහසුකම්. පුනර්ජනනීය බලශක්තිය. හරිත ව්‍යාපාර සහ මූල්‍ය ආයතන)
- ශ්‍රී ලංකාව තුළ අපගේ පියසටහන් පුළුල් කිරීම සඳහා සම්බන්ධතාව ශක්තිමත් කිරීම සහ හවුල්කරුවන් උත්තේජනය කිරීම
- ණයවල ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම
- මිල ආකෘති ප්‍රාග්ධනය බෙදීම ප්‍රශස්ථ ලෙස සිදු කිරීමට සුදුසු ලෙස සැකසීම

2020 දී වූ ප්‍රධාන සංවර්ධනයන්

- රු.බි. 5.0 ලැයිස්තුගත නොකළ, සුරක්ෂිත නොකළ යටත් නිත්‍ය ණයකර සාර්ථකව නිකුත් කිරීම
- වසර තුළ ව්‍යාපෘති මූල්‍යකරණය යටතේ ආයතනික ගනුදෙනුකරුවන්ට රු. බිලියන 35.0ක පමණ ණය මුදලක් ලබාදීම
- රාජ්‍ය මූල්‍ය සඳහා දුන් රු.බි. 35.0 ණයවලින් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය වෙත රු.බි. 31.4ක ණය මුදලක් ලබාදීම
- ආයතනික ණය ලබාදීම 72.9% කින් වර්ධනය

ඉදිරි ගමන්මඟ

- ණයවල කළඹෙහි ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම
- ක්‍රියාවලි වැඩි දියුණු කිරීම සහ ස්වයංක්‍රීයකරණය
- වෙළෙඳපොල ප්‍රවණතා නියාමනය කිරීමෙන් දුරදර්ශී ණයදීමේ ප්‍රවේශය
- ඉහළ වර්ධනයක් ඇති මුත් අඩු මට්ටමේ සිට මධ්‍යම ප්‍රමාණයේ අවදානම් ආකෘති ඇති අංශ සඳහා ණය ලබාදීම
- යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ණය දීම තුළින් රජයේ මූල්‍යයන කටයුතුවලට සහයවීම

ජාත්‍යන්තර බැංකුකරණය

නිෂ්පාදන සහ සේවා

- USD, EUR, GBP, AUD සහ JPY යන විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු (ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු)
- ආමුඛ සහ ප්‍රතිමුඛ ප්‍රේෂණ
- විදේශ ව්‍යවහාර මුදල් හුවමාරුව
- ආනයනය ණයවර ලිපි නිකුතුව
- ආනයන බිල්පත් සම්බන්ධව කටයුතු හැසිරවීම
- නෞහාර සහ ගුවන් ඇප නිකුත් කිරීම

ගනුදෙනුකරුවන්

ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්, රටින් බැහැර ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන්, ශ්‍රී ලංකාව තුළ පදිංචි විදේශිකයින්.

බෙදාහැරීමේ මාර්ග

ශාඛා, මාර්ගගත බැංකුකරණය. අනුරූප බැංකු, විදේශ විනිමය හුවමාරු ආයතන, ලොවවටා මුදල් හුවමාරු සමාගම, යුරෝජයිරෝ තැපැල් ජාලය, සහ විදේශිය නියෝජිතයින් සහ දුරකථන සහ ඇමතුම් මධ්‍යස්ථානය

මෙහෙයුම් පරිසරය

- ගෝලීය වෙළෙඳ කටයුතුවල මන්දගාමී විම
- ආනයන අධෛර්යමත් කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග
- ප්‍රධාන වෙළඳපොළ මූලාශ්‍ර (උදා - මැද පෙරදිග) වලින් විදේශ විනිමය ඉපයීම් පහත වැටීම
- රුපියලේ අගය අඛණ්ඩව පිරිහීම
- කොවිඩ්-19 හේතුවෙන් රටට විදේශ විනිමය ලැබෙන මාර්ගවලට ඇතිවූ බලපෑම
- විවිධ ඩිජිටල් තාක්ෂණික සමාගම් සහ වෙනත් මුදල් හුවමාරු කරන ආයතනවල වර්ධනය

උපායමාර්ගික අවධානය යොමු කළ යුතු අංශ

- ප්‍රේෂණ සඳහා ප්‍රධාන වෙළෙඳපොල තුළ වෙළෙඳපොල වලට ඇතුළුවීම සහ වෙළෙඳපොල සංවර්ධනය
- මැදපෙරදිග වෙළෙඳපොල කෙරෙහි යැපීම අඩු කිරීමට වෙනත් වෙළෙඳපොළවල් සොයා බැලිම
- රජයේ ආයතන/වෘත්තීය සමිති/නව මෝටර්රථ අළෙවිකරුවන් සමඟ ඇති වැඩපිළිවෙල තුළින් බැංකුවට අවසර දී ඇති වෙළෙඳ සේවා සඳහා වෙළෙඳපොල ප්‍රවේශය
- ගාස්තු පදනම් ආදායම වැඩි කිරීම

2020 දී වූ ප්‍රධාන සංවර්ධනයන්

- රු.බි. 56.2ක විදේශීය ප්‍රේෂණ වාර්තා කිරීම
- ජපන් රෙමිට් මූල්‍ය සමාගම සහ වෙස්ටන් යුනියන් සමාගම LLC යන විදේශ විනිමය හුවමාරු ආයතන සමඟ නව සම්බන්ධතා ස්ථාපිත කිරීම
- රු.බි. 15.4 ක් සහිත විදේශීය ව්‍යාපාර මුදලින් ක්‍රියාත්මක තැන්පතුවල 29.7% ක වර්ධනය අත්කර ගැනීම
- 4.24% දක්වා පදනම් ලක්ෂයන් 95 කින් ප්‍රේෂණවල වෙළෙඳපොල කොටස වැඩිවීම

ඉදිරි ගමන්මඟ

- මෙහෙයුම් විශිෂ්ඨත්වය - (උදා: කාර්යක්ෂම මුදල් හුවමාරුව)
- ඉහළ වර්ධිත ප්‍රෙෂණ වෙළඳපළක් කරා පියවර තැබීම
- අපනයන වෙළෙඳ මූල්‍ය ව්‍යාපාරයට වඩාත් නැඹුරුවිම
- ගනුදෙනුකාර අත්දැකීම වැඩිදියුණු කිරීම
- විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු හා ප්‍රේෂණවල අංක දෙකේ ප්‍රතිශත වර්ධනක් කරා ළඟාවීම
- ප්‍රේෂණ වෙළෙඳපොල තුළ වෙළෙඳපොල කොටස වැඩිදියුණු කිරීම

මූල්‍ය ප්‍රාග්ධන සමාලෝචනය

භාණ්ඩාගාරය

නිෂ්පාදන සහ සේවා

රජයේ සුරැකුම්පත්වල ආයෝජනය, හිමිකම් සහ විදේශ විනිමය, ප්‍රතිමිලදී ගැනීම් මගින් ණය ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ණය දීම

ගනුදෙනුකරුවන්

මූල්‍ය ආයතන, මූල්‍ය නොවන ආයතන, පුද්ගලයින්, රාජ්‍ය ව්‍යවසායන්

බෙදාහැරීමේ මාර්ග

සෘජු පිවිසීම, මාර්ගගත වෙළෙඳ අවකාශ

මෙහෙයුම් පරිසරය

- වෙළෙඳපොළ ද්‍රවශීලතාවයෙහි පැවති අතිරික්තය
- පැවති අඩු පොළී අනුපාත මට්ටම
- රජයේ සුරැකුම්පත්වල අඩු ඉපයීම්
- රජයේ සුරැකුම්පත් වෙළෙඳපොලින් ආයෝජන ප්‍රවාහ පිටතට ගලායෑම

උපායමාර්ගික අවධානය යොමු කළ යුතු අංශ

- ස්ථාවර ආදායම් සුරැකුම්පත් වලින් ලැබෙන ආදායම යථා තත්වයට පත් කිරීම සහ සුරැකුම කළඹෙහි ප්‍රතිලාභ ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒම
- අදාළ ව්‍යවස්ථාපිත අනුපාතයට අනුකූලව සුරැකුම්පත් වල ආයෝජනය පවත්වා ගැනීම
- ද්‍රවශීලතාව හා ආයෝජනය කළමනාකරණය
- ගනුදෙනුකරුවන්ගේ තැන්පතු භාවිතා කරමින් අනිවාර්ය අවශ්‍යතාවයක් වන රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම හා ණයදීම අතර සමතුලිතතාවයක් ඇති කිරීම
- ප්‍රාග්ධන ලාභ සහ පදනම් ආදායම් වර්ධනය කර ගැනීමේ අරමුණින් විදේශ මුදල් ගණුදෙනු වැඩි කිරීම

2020 දී වූ ප්‍රධාන සංවර්ධනයන්

- තැන්පතුවලින් රජයේ සුරැකුම්පත් ආයෝජන අනුපාතය 62.65% ක ප්‍රශස්ථ මට්ටමේ පවත්වා ගැනීම
- මුළු පොළී ආදායමෙන් 55%ක් රජයේ සුරැකුම්පත්වල පොළී ආදායමෙන් දායකවීම
- රජයේ සුරැකුම්පත්වලින් ඉපයීම් 10.16%ක ස්ථාවර මට්ටමක පැවතීම

ඉදිරි ගමන්මග

- දේශීය හා විදේශීය සිදුවීම්වල බලපෑම, වෙළඳපොළ තුළ ආයෝජන හා ප්‍රාග්ධන ප්‍රවාහ හා ආයෝජකයින්ගේ විශ්වාසය ඇති කරන ප්‍රතිපත්ති වල බලපෑම
- බැංකුවේ ශේෂ පත්‍රයේ කල්පිරීම් නොගැලපීම අවම කිරීම පිණිස ඵලදායී ද්‍රවශීලතා කළමනාකරණය කෙරෙහි අවධානය
- නව ක්‍රම සහ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම තුළින් ඉදිරි-මධ්‍යම-පසු කාර්යාලවල මෙහෙයුම් අනර්ඝත්වය
- රාජ්‍ය බැඳුම්කරවල ආකර්ෂණීය වෙළඳ විකුණුම් අවස්ථාවලින්, හිමිකම් කොටස් වලින්, බැංකුවේ ශේෂපත්‍රය තුළ ඇති විදේශ විනිමය වෙළඳ ගනුදෙනු වලින් ප්‍රශස්ත ප්‍රතිඵල ලැබීම
- උපරිම ප්‍රතිලාභ සඳහා සංචලනය කරගත් අරමුදල් යෙදවීම සහ ආයෝජනය

පාලනය

39

අධ්‍යක්ෂ මණ්ඩලය – **40**

ආයතනික කළමනාකාරිත්වය – **45**

විධායක කළමනාකාරිත්වය – **46**

ප්‍රධාන කළමනාකරුවන් – **48**

ආයතනික පාලනය – **49**

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව – **78**

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව – **80**

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව – **82**

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව – **84**

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු වාර්තාව – **86**

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටු වාර්තාව – **88**

අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටු වාර්තාව – **90**

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය – **92**

අධ්‍යක්ෂ මණ්ඩලය

කේෂිලා ජයවර්ධන මිය

සභාපතිනිය
ස්වාධීන නොවන
විධායක නොවන අධ්‍යක්ෂක

පත්කරන ලද දිනය

2020 ජනවාරි 2

නිපුණතා සහ අත්දැකීම්

ශාස්ත්‍රඥයෙක්/විශ්වවිද්‍යාල කථිකාචාර්යවරියක් වූ ජයවර්ධන මහත්මිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ කථිකාචාර්යවරියක් ලෙස වසර 15 ක් සේවය කර ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් සහ ශාස්ත්‍රපති උපාධියක් ඇය සතුය. ඇය මෙරට සංවර්ධන බැංකු දෙකක සභාපතිතුමිය ලෙස වසර 7 ක් කටයුතු කර ඇත.

වෙනත් වර්තමාන තනතුරු

සභාපතිනි, NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්, සභාපතිනි, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

මීට පෙර දැරූ තනතුරු

සභාපතිනි, කඳුරට සංවර්ධන බැංකුව, සභාපතිනි, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, පළාත් පාලන ආයතන සාමාජිකා.

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකත්වය

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව*, අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව* අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ග කමිටුව* යන කමිටුවල සභාපතිනිය වේ.

*2021 පෙබරවාරි 08 වන දින සිට ක්‍රියාත්මක නොවේ.

එරංග ජයවර්ධන මහතා

ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ
ස්වාධීන විධායක නොවන
අධ්‍යක්ෂක

පත්කරන ලද දිනය

2020 ජනවාරි 23

ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ

2020 ජුනි 15

නිපුණතා සහ අත්දැකීම්

ජයවර්ධන මහතා ඇමරිකා එක්සත් ජනපදයේ රෙන්සෙලර් පොලිටෙක්නික් අධ්‍යාපන ආයතනයෙන් (Rensselaer Polytechnic Institute) විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ විදුලි ඉංජිනේරු විද්‍යාව (Electrical Engineering) පිළිබඳ විද්‍යාපති උපාධියක් හදාරා තිබේ.

ජයවර්ධන මහතා ඇපල් ඉන්කෝපරේෂන් ආයතනය (AppleInc.Cupertino, CA, USA) සහ සිස්කෝ සිස්ටම් සැන් ලෝස් (Cisco Systeme, San Iose, CA.USA) ආයතනවල සේවා කාලය තුළදී නායකත්වය පිළිබඳ බොහෝ ඇගයීම් වලට ලක්වී ඇත..

ජයවර්ධන මහතා ද බිල් සහ මෙලින්ඩා ගේට්ස් අධි සම්මානයෙන් පිදුම් ලැබූ පළමු ශ්‍රී ලාංකිකයා වීමද ඔහුගේ වෘත්තීය ජීවිතයේ ලද තවත් එකතුවක් වන අතර, එමගින් ඔහුට ඇමරිකාවේ ස්ටැන්ෆර්ඩ් සරසවියේ විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ දර්ශණවේදී උපාධියක් හැදෑරීම සඳහා පූර්ණ ශිෂ්‍යත්වයක් ලබාදීමට ඉවහල් විය.

ජයවර්ධන මහතා කතුවරයෙකු වන අතර ඔහුගේ පර්යේෂණ වාර්තා වාර්ෂික අන්තර්ජාතික දෘශ්‍ය ඉංජිනේරු සංගමයේ වාර්ෂික ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලදී ඉදිරිපත් කරනු ලැබ ඇත. (SPIE). පර්යේෂණ මූලික වශයෙන් අවධානය යොමු කරනු ලැබ ඇත්තේ ක්ෂුද්‍ර ලිතෝග්‍රැෆි (Micro lithography) පාලන ක්‍රියාවලිය පිළිබඳව වන අතර, එය පවත්වනු ලැබුවේ ඇමරිකා එක්සත් ජනපදයේ ගයිතස්බර්ග්හි පුද්ගලික සමාගම, ජාතික ප්‍රමිති තාක්ෂණික ආයතනය විසිනි (National Institute of Standard and Technology, Gaithersburg ,MD,USA).

ඔහු සිලිකොන් වැලි ප්‍රදේශයේ ආරම්භ කරන ලද සමාගමක (Silicon Valley based) ආරම්භක සාමාජිකයෙකු වන අතර එය 2010 වර්ෂයේදී පේපැල් නවෝත්පාදන සම්මානය දිනාගත්තා ලදී. මෙය එම සම්මානයට පාත්‍රවීම පිළිබඳව වයර්ඩ්, නිව්යෝර්ක් ටයිම්ස්, බොස්ටන් ග්ලෝබ්, සීඑන්බීසී සහ සැන් ප්‍රැන්සිස්කෝ ක්‍රොනිකල් (WIRED, NY Times, Boston Globe, CNBC and San Francisco Chronicle) යන සඟරාවලද ඒ පිළිබඳ විස්තර දක්වා තිබුණි.

ජයවර්ධන මහතාට දේශීය හා අන්තර්ජාතික සංවිධානවල අත්දැකීම් ඇති අතර ඔහු දේශීය මෙන්ම අන්තර්ජාතික සම්මන්ත්‍රණ වලද ආමන්ත්‍රණය කරන ලදී.

වෙනත් වර්තමාන තනතුරු

ගිගා ෆුඩ්ස් පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී.

මීට පෙර දැරූ තනතුරු

අධ්‍යක්ෂ - ඩිජිටල්කරණ, මාස් ඉන්ටිමේට්ස් පුද්ගලික සමාගම, ප්‍රධාන විධායක නිලධාරී සිලුටා (Silueta) පුද්ගලික සමාගම, සාමාන්‍යාධිකාරී/අධ්‍යක්ෂ, මාස් ඉනෝවේෂන්ස් (MAS Innovations), සාමාන්‍යාධිකාරී - මූලාශ්‍ර සහ සැපයුම් දාමය (Sourcing & Supply Chain), මාස් ඉන්ටිමේට්ස් පුද්ගලික සමාගම, ජ්‍යෙෂ්ඨ කළමනාකරු, සැපයුම් දාම, සැලසුම්කරණය හා ප්‍රසම්පාදන, ඇපල් කෙයා (Apple Care), ඇපල් ඉන්කෝපරේෂන් ආයතනය (Apple Inc. Cupertino, CA, USA), ඉල්ලුම සැලසුම්කරණ කළමනාකරු, සිස්කෝ සිස්ටම්ස් ආයතනය (Cisco Systems, San Jose, CA, USA) පර්යේෂණ විද්‍යාඥ, පර්යේෂණ විද්‍යා ජාතික ප්‍රමිති හා තාක්ෂණික ආයතනය, ගයිතස්බර්ග්, ඇමරිකා එක්සත් ජනපදය (Gaithersburg , MD,USA)

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකත්වය

සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, සාමාජික අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව, සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ග කමිටුව* සහ අධ්‍යක්ෂ මණ්ඩල අලෙවිකරණ උපායමාර්ග කමිටුවේ* සාමාජික

*2021 පෙබරවාරි 08 දින සිට ක්‍රියාත්මක නොවේ.

යූ ජී ආර් ආරියරත්න මහතා

නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂක ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂක

පත්කරන ලද දිනය

2018 අගෝස්තු 31

නිපුණතා සහ අත්දැකීම්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙක් වන ආරියරත්න මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වසර 26 කට වැඩි අත්දැකීම් සමුදායකට හිමිකම් කියයි. ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධිය, සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය සහ ප්‍රාදේශීය සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා ඇත. එසේම, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ඔහු විසින් සම්පූර්ණ කර තිබේ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන රාජ්‍ය පරිපාලනය, පොදු කළමනාකරණය සහ නිපුණතා සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලා ද ඒ මහතා විසින් සාර්ථකව හදාරනු ලැබ ඇත.

වෙනත් වර්තමාන තනතුරු

තැපැල්පති, තැපැල් දෙපාර්තමේන්තුව, NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් හි අධ්‍යක්ෂ, ණය තොරතුරු කාර්යාංශයේ අධ්‍යක්ෂ

පෙර දැරූ තනතුරු

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ලේකම්, අතිරේක ලේකම් (සමාජ සංවර්ධන), සමාජ සවිබලගැන්වීම සහ සුභසාධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන) , රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ අතිරේක රජයේ මුද්‍රණාලාධිපති (පරිපාලන), පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ඉඩම්), ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විධායක අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (පරිපාලන සහ මුදල්), තැපැල් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය තැපැල්පති (වයඹ පළාත සහ මධ්‍යම පළාත), මාවතගම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්, කෘෂිකර්ම සේවා දෙපාර්තමේන්තුවේ සහකාර/නියෝජ්‍ය කොමසාරිස් (කුරුණෑගල), සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පළාත් කොමසාරිස් (වයඹ පළාත), තිරප්පනේ රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස්

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකත්වය

අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සාමාජික සහ තොරතුරු තාක්ෂණ හා උපායමාර්ග කමිටුවේ සාමාජික*

*2021 පෙබරවාරි 08 දින සිට ක්‍රියාත්මක නොවේ.

ආචාර්ය එම් කේ සී සේනානායක මහතා

නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂක ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂක

පත්කරන ලද දිනය

2020 ජනවාරි 11

නිපුණතා සහ අත්දැකීම්

වෘත්තියෙන් සිවිල් නිලධාරියෙකු වන ආචාර්ය එම් කේ සී සේනානායක මහතා ශාස්ත්‍රඥයෙකු ලෙස ඔහුගේ ප්‍රවීණතාවයට අදාළව විවිධ ජාත්‍යන්තර හා දේශීය ප්‍රකාශන සඳහා ශාස්ත්‍රීය ලිපි සපයා ඇති අතර ලොව වටා පැවති ජාත්‍යන්තර සමුළු හා සම්මන්ත්‍රණ රැසකදී විවිධ කරුණු සම්බන්ධයෙන් දේශන පවත්වා තිබේ. ඔහු ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙසද කටයුතු කර ඇත. ආචාර්ය එම් කේ සී සේනානායක මහතා ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක්, ජපානයේ හිතොත්සුභාෂි විශ්වවිද්‍යාලයේ ව්‍යාපාරික උපායමාර්ග පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ පශ්චාත් උපාධියක්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සමග වාණිජවේදී (විශේෂ) උපාධියක් හිමි කරගෙන ඇත. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් (SLIDA) මෙහෙයවන කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලා ඒ මහතා විසින් සාර්ථකව සම්පූර්ණ කරනු ලැබ තිබේ.

වෙනත් වර්තමාන තනතුරු

අධ්‍යක්ෂ ජෙනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, නිරීක්ෂක (භාණ්ඩාගාර නියෝජිත) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, පාලක ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලයේ අධ්‍යක්ෂ

පෙර දැරූ තනතුරු

අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැඩබලන) සහ සහකාර අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ සහකාර අධ්‍යක්ෂ, ජාතික සැලසුම්කරණ දෙපාර්තමේනතුව, මුදල් හා සැලසුම් අමාත්‍යංශය, කොමිෂන් සභා සාමාජික (භාණ්ඩාගාර නියෝජිත), විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ පශ්චාත් ඉංග්‍රීසි උපාධි ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලය, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකත්වය

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ සාමාජික

මනෝහරි අබේසේකර මිය

අධ්‍යක්ෂ
ස්වාධීන නොවන
විධායක නොවන අධ්‍යක්ෂ

පත්කරන ලද දිනය

2020 ජනවාරි 14

නිපුණතා සහ අත්දැකීම්

අබේසේකර මහත්මිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක් (පළමු පන්තියේ සාමාර්ථයක් සමග) සහ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් රන් සම්මාන තුනක් සමඟින් (MBA) හදාරා තිබේ. ඇය එක්සත් ජනපදයේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CIMA-UK) අධි සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CA Sri Lanka) ද අධි සාමාජිකත්වය දරයි. ඇය ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරී අවසන් අදියරේ ත්‍යාගලාභිනියක වන අතර, වසර 2019 දී CIMA ශ්‍රී ලංකා ජාලයේ සභාපතිනිය විය. අබේසේකර මිය 2021 වසරේ ජුනි මාසයේ සිට වසර තුනක කාලයක් සඳහා CIMA ගෝලීය කවුන්සිලයට තේරී පත් විය. අබේසේකර මිය KPMG හි ආදි ශිෂ්‍යාවකි. ඇය වසර 20 ක පශ්චාත් සුදුසුකම් අත්දැකීම් වලට හිමිකම් කියයි. ඇය බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික පුහුණු ආයතනය විසින් මෙහෙයවන ලද පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව වර්නන් මෙන්ඩිස් අනුස්මරණ සම්මානයද දිනා ගනිමින් සාර්ථකව සම්පූර්ණ කර තිබේ. එමෙන්ම, ඉන්දියාවේ හයිද්‍රාබාද්හි පිහිටි ඉන්දියානු ව්‍යාපාරික පාසැල (Indian School of Business), මැනිලාහි පිහිටි ආසියානු සංවර්ධන බැංකුව, ජර්මනියේ බීඑච්එෆ් බැංකුව (BHF Bank) යන ආයතන වෙතින් ඇය විධායක මට්ටමේ අධ්‍යාපනයක් ලබාගෙන ඇත. ඇය 2019 - 2020 කාල පරිච්ඡේදය තුළ කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධාරීන්ගේ ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිත්වය දරන ලදී. ඇය ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ කමිටු සාමාජිකාවක ලෙස කටයුතු කර තිබේ.

වෙනත් වර්තමාන තනතුරු

NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් හි අධ්‍යක්ෂක, එක්සත් ජනපදයේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ සංගමයේ ගෝලීය ගිවිසුම් කමිටුවේ කමිටු සාමාජික

මීට පෙර දැරූ තනතුරු

2002 - 2020 දක්වා වූ අවුරුදු 18 ක කාල පරාසය තුළ හේලීස් සමූහ ව්‍යාපාරයේ බහු නායකත්ව තනතුරු දරා ඇත. ගණකාධිකාරී, දීර්ඝ පරාස සැලසුම්කරණ ඒකකය (Long Range Planning Unit), සීමාසහිත හේලීස් පොදු සමාගමේ උපායමාර්ගික ව්‍යාපාර සංවර්ධනයේ ප්‍රධානී, 2020 ඔක්තෝබර් 31 දක්වා හේලීස් සමූහ සේවයේ සහ ෆෙන්ටන්ස් සමාගමේ අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකත්වය

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපතිනි, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවේ* සහ අධ්‍යක්ෂ මණ්ඩල අලෙවිකරණ සහ උපායමාර්ගික කමිටුවේ* සාමාජික

*2021 පෙබරවාරි 08 දින සිට ක්‍රියාත්මක නොවේ.

එම් ටී ජේ පෙරේරා මයා

ස්වාධීන නොවන
විධායක නොවන අධ්‍යක්ෂක

පත්කරන ලද දිනය

2020 අප්‍රේල් 11

නිපුණතා සහ අත්දැකීම්

පෙරේරා මහතා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ දශක හතරකට වඩා සේවය කර ඇති අතර ඔහු 2017 වර්ෂයේ ප්‍රධාන කළමනාකරුවෙකු වශයෙන් විශ්‍රාම ලබා ඇත. ඔහු පුළුල් වශයෙන් ශාඛා මෙහෙයුම් කටයුතුවලට සම්බන්ධ වූ අතර ඒ පිළිබඳ හසල දැනුමක් ලබා ගනිමින් අදාළ කටයුතු වලට දායක වුනි.

වෙනත් වර්තමාන තනතුරු

NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්.
අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

මීට පෙර දැරූ තනතුරු

2010 සිට 2013 කාලපරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකත්වය

සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, සාමාජික, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව* සහ අධ්‍යක්ෂ මණ්ඩල අලෙවිකරණ සහ උපායමාර්ගික කමිටුව*

*2021 පෙබරවාරි 08 දින සිට ක්‍රියාත්මක නොවේ.



එච් කේ ඩී ලක්ෂ්මන් ගාමිණී මහතා

ස්වාධීන නොවන
විධායක නොවන අධ්‍යක්ෂක

පත්කරන ලද දිනය

2021 ජනවාරි 07

නිපුණතා සහ අත්දැකීම්

ගාමිණී මහතා අත්දැකීම් බහුල බැංකුකරුවකු වන අතර ඔහු මහජන බැංකුවේ දශක 03කට වැඩි කාලයක් සේවය කර 2014 වසරේදී විශ්‍රාම ලබා ඇත. ඔහු සිය සේවා කාලය තුළ පුළුල් වශයෙන් සම්බන්ධවී ඇත්තේ ශාඛා බැංකු කටයුතු හා ජාත්‍යන්තර බැංකු කටයුතු සඳහා වේ.

වෙනත් වර්තමාන තනතුරු

අධ්‍යක්ෂ, ත්‍රී ස්ටාර් ලොජිස්ටික් පුද්ගලික සමාගම, නම් කරන ලද අධ්‍යක්ෂ, NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්.

මීට පෙර දැරූ තනතුරු

උප සභාපති, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව, අධ්‍යක්ෂ, නිපුණතා සංවර්ධන අරමුදල, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකත්වය

සාමාජික අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, සාමාජික අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව, සහ අධ්‍යක්ෂ මණ්ඩල අලෙවිකරණ සහ උපායමාර්ගික කමිටුව*

*2021 පෙබරවාරි 08 දින සිට ක්‍රියාත්මක නොවේ.

විශ්‍රාමික බ්‍රිගේඩියර් (ආචාර්ය) තිරාන් ද සිල්වා

ස්වාධීන නොවන
විධායක නොවන අධ්‍යක්ෂ

කාලපරිච්ඡේදය

2020 ජනවාරි 17 සිට
2020 ඔක්තෝබර් 09 දක්වා

නිපුණතා සහ අත්දැකීම්

ආචාර්ය තිරාන් ශ්‍රී ලංකා හමුදා ඉතිහාසයේ ළබාලතම බ්‍රිගේඩියර්වරයා, ශ්‍රී ලංකා හමුදාවේ අධ්‍යක්ෂ ධූරයකට පත් කරන ලද ළබාලතම නිළධාරියා සහ ආරක්ෂක අමාත්‍යාංශයේ සේවය කළ ළබාලතම අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ලෙස ඉතිහාසයට එක්වේ. එසේම, ඔහු ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ ප්‍රධාන තොරතුරු නිළධාරියෙකු ලෙස කටයුතු කළ ළබාලතම පුද්ගලයාද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

ඕස්ට්‍රේලියාවේ මධ්‍යම ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයේ (Central Queensland University) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධියක් (2006) ඕස්ට්‍රේලියාවේ චාර්ල්ස් ස්ටර්ට් විශ්වවිද්‍යාලයේ (Charles Sturt University) තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් (2004) සහ ඕස්ට්‍රේලියාවේ ස්වින්බර්න් විශ්වවිද්‍යාලයේ (Swinburne University) තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික උපාධියක් ඔහු සතුය. ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ තොරතුරු පිළිබඳ දර්ශනවේදී උපාධියක ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටී (Doctor of Philosophy Degree in Geo Informatics). ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ මයික්‍රොසොෆ්ට් ආයතනයේ සර්වර් කළමනාකරණය (Server Management) පිළිබඳ මයික්‍රොසොෆ්ට් සහතිකලත් වෘත්තිකයෙක් (Microsoft Certified Professional on Server Management) වන අතර ශ්‍රී ලංකාවේ කෘතිම බුද්ධිය පිළිබඳ සහතිකලත් ස්නායුක ජාල (Certified Artificial Neural Networks on Artificial Intelligence) පිළිබඳ පාඨමාලාවක් හදාරා ඇත.

ආචාර්ය තිරාන් මහතා සයිබර් ආරක්ෂණ, අයිසීටී අධ්‍යාපනය දුරස්ථ අවදානම් විශ්ලේෂණය සහ ජියෝ සිටිසන් තොරතුරු පද්ධතිය යන මාතෘකාවලට අදාළව විවිධ පර්යේෂණ ප්‍රකාශනයන් මෙන්ම බොහෝ අන්තර්ජාතික වැඩසටහන්/සම්මන්ත්‍රණවල ඉදිරිපත් කිරීම් ද සිදුකර ඇත. තවද, ඔහු රට නියෝජනය කරමින් බොහෝ අන්තර්ජාතික සම්මන්ත්‍රණ වලට දේශක මණ්ඩලයේ සාමාජික, ප්‍රධාන සම්පත් දායක මෙන්ම දේශක වශයෙන් ද සහභාගි වී ඇත.

වෙනත් වර්තමාන තනතුරු

සභාපති/ප්‍රධාන විධායක නිලධාරී, සෙල්ටා ටෙක් පුද්ගලික සමාගම (Celata Tech (Pvt) Ltd),

මීට පෙර දැරූ තනතුරු

තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යක්ෂක, ශ්‍රී ලංකා යුද හමුදාව, තොරතුරු තාක්ෂණ/භූගෝලීය තොරතුරු පද්ධති (IT/AIS) ප්‍රධානී, පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ආරක්ෂක අමාත්‍යාංශය, අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව, අධ්‍යක්ෂ, MCSL ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් (MCSL Financial Services Ltd), අධ්‍යක්ෂ ජෙනරාල්, ආරක්ෂක අමාත්‍යාංශයේ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වන මධ්‍යස්ථානය, සයිබර් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයේ නිර්මාතෘ සහ ප්‍රධානී, ප්‍රධාන තොරතුරු නිලධාරී/තොරතුරු තාක්ෂණ ප්‍රධානී, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, අධ්‍යක්ෂක ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව, අධ්‍යක්ෂ MSCL ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් සහ අධ්‍යක්ෂ ට්‍රිලියම් රෙසිඩන්සීස් සහ අධ්‍යක්ෂ ජනරාල් ආරක්ෂක අමාත්‍යාංශයේ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වන මධ්‍යස්ථානය

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සාමාජිකත්වය

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව, සාමාජික අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව* සහ අධ්‍යක්ෂ මණ්ඩල අලෙවිකරණ සහ උපායමාර්ගික කමිටුව*

*2021 පෙබරවාරි 08 දින සිට ක්‍රියාත්මක නොවේ.

අජිත් පීරිස් මහතා

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

පත්කරන ලද දිනය

2020 ඔක්තෝබර් 12

නිපුණතා සහ අත්දැකීම්

අජිත් පීරිස් මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ පළමු පන්තියේ ගෞරව උපාධි ලාභියෙකු වන අතර, වෘත්තීය බැංකුකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනය සහ ශ්‍රී ලංකා සංවර්ධන හා පුහුණුවීම් ආයතනය යන ආයතනවල සාමාජිකයෙකු ද වේ.

වෙනත් වර්තමාන තනතුරු

අධ්‍යක්ෂ, NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්. අධ්‍යක්ෂ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL) අධ්‍යක්ෂ ශ්‍රී ලංකා බැංකු සංගමය (SLBA), අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් (FOSL)

මීට පෙර දැරූ තනතුරු

පීරිස් මහතා වෘත්තීය සුදුසුකම් ලත් බැංකුකරුවෙකු වන අතර සිය වෘත්තියෙහි නිපුණයෙකු වේ. 1988 කළමනාකරණ පුහුණුවන්නෙකු ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අනුයුක්ත වූ ඔහුගේ බැංකු සේවා කාලය වර්ෂ 32 ක් දක්වා විහිදීයයි. මෙම කාල පරිච්ඡේදය තුළ ඔහු බැංකුවේ බොහෝ අංශවල සේවය කළ අතර, ශාඛා මෙහෙයුම්, ශාඛා පරිපාලන, පාරිභෝගික ණය (Retail Credit), ජාත්‍යන්තර බැංකු, තැපැල් බැංකු වැනි අංශ වල ශාඛා කළමනාකරු, කලාප කළමනාකරු, සහකාර සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරුවල සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් ඔහු පත්කිරීමට පෙර කටයුතු කර ඇත.

අනුපමා මුහන්දිරම් මිය

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

පත්කරන ලද දිනය

2016 දෙසැම්බර් 06

නිපුණතා සහ අත්දැකීම්

නීතිඥවරියක් වන අනුපමා මුහන්දිරම් මහත්මිය එක්සත් රාජධානියේ කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් නීතිපති උපාධියක්, ඉන්දියාවේ මනිපාල් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ නීති අධ්‍යාපනය පිළිබඳ ශ්‍රී ලංකා සංස්ථාපිත කවුන්සිලයෙන් පශ්චාත් නීතිඥ පාඨමාලාවක් හදාරා ඇත. දැනට ඇය වරලත් ආයතනික ලේකම්වරයෙකු ලෙස සුදුසුකම් ලැබීම සඳහා අවශ්‍ය සුදුසුකම් හදාරමින් සිටියි.

2016 දෙසැම්බර් 6 වන දින ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුරට පත්වීමට ප්‍රථම ඇය 2015 නොවැම්බර් මස සිට 2016 දෙසැම්බර් මස දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සහකාර ලේකම්වරයා ලෙස කටයුතු කළාය. එසේම, ඇය 2015 සිට 2017 දක්වාවූ කාල සීමාව තුලදී එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්හි සමාගම් ලේකම් වශයෙන්ද කටයුතු කළාය. ඒ මහත්මියගේ වසර 24 කට වැඩි බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් අතුරින් වසර 18 කට වැඩි කාල සීමාවක් ඇය මහජන බැංකුවේ නීති නිලධාරියෙකු හා අධ්‍යක්ෂ මණ්ඩල සහකාර ලේකම්වරියක ලෙස සේවය කර ඇත.

මුහන්දිරම් මහත්මිය සබරගමුව විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරියක් (වාණිජ නීතිය) ලෙසද සේවය කරන අතර ශ්‍රී ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල/සමාගම් ලේකම්වරුන්ගේ සංගමයේ නිර්මාතෘ වේ.

ආයතනික කළමනාකාරිත්වය

එම් පී ඒ ඩබ්ලිව් පීරිස් මහතා

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

කේ රවීන්ද්‍රන් මහතා

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

සී එස් ජේසුඩියන් මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය සහ අන්තර් ජාතික)

ජී වී ඒ ඩී ඩී සිල්වා මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (භාණ්ඩාගාර)

කේ කේ වී වී එල් ඩබ්ලිව් කරුණාතිලක මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අලෙවි, පරිපාලන සහ අයකර ගැනීම්)

ජී ඩබ්ලිව් ඊ ජයවීර මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන)

කේ පී ඩී එම් ද සිල්වා මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(පාරිභෝගික ණය සහ තැපැල් බැංකු)

එම් ටී ඒ ජේ එෆ් ගෝමිස් මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)

එම් එන් ඒ ප්‍රනාන්දු මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන)

ආචාර්ය ඒ කේ එල් ඉලේසිංහ මහතා

වැ.බ.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)/
ප්‍රධාන තොරතුරු නිලධාරී

විධායක කළමනාකාරිත්වය

කේ එම් ඩබ් එච් කරුණාරත්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)

එම් ඒ ගෝමස් මිය
සහකාර සාමාන්‍යාධිකාරී (සැලසුම්)

ජේ එච් ටී චන්ද්‍රරත්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)

එච් එම් එස් එල් ප්‍රනාන්දු මිය
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)

ඒ එල් ඒ හලීම් මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)

ඩබ්ලිව් පී යූ ඒ ද සිල්වා මිය
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)

ආර් ඒ එන් එන් විජේසිංහ මිය
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)

කේ එස් වීරසේන මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන)

අයි කේ එල් සසී මහේන්ද්‍රන් මිය
අනුකූලතා නිලධාරී

ආර් පී ඒ එම් පී රාජනායක මිය
ප්‍රධාන අවදානම් නිලධාරී

ඩබ් එම් ආර් බී වීරකෝන් මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ශාඛා සංවර්ධන)

ඩී ඩී වික්‍රමසිංහ මිය
සහකාර සාමාන්‍යාධිකාරී (ශාඛා ණය)

විධායක කළමනාකාරිත්වය

සී ඩබ් පතිරණ මිය
සහකාර සාමාන්‍යාධිකාරී (උපකාරක සේවා)

එම් සී රාජපක්ෂ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්‍ෂණ)

එස් ඩබ් ඒ වීරසිංහ මිය
සහකාර සාමාන්‍යාධිකාරී (භාණ්ඩාගාර)

එල් සී සේනානායක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්‍ෂණ)

එම් ඒ පී මුහන්දිරම් මිය
අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ලේකම්

එම් ඩී සුරන්ජන මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (විගණන)

ටී එච් එස් අතපත්තු මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

ප්‍රධාන කළමනාකරුවන්

එච් ආර් කරුණාමුනි මිය
කලාප කාර්යාල (බස්නාහිර 2)
කලාප කළමනාකරු

ඩී සී ඔලබොඩුව මයා
කලාප කාර්යාලය (වයඹ)
කලාප කළමනාකරු

සී එන් ඒකනායක මිය
කලාප කාර්යාලය (බස්නාහිර 1)
කලාප කළමනාකරු

ඒ එම් සී අත්තනායක මිය
කලාප කාර්යාලය (සබරගමුව)
කලාප කළමනාකරු

එස් සිවසෝරූපන් මයා
කලාප කාර්යාලය (නැගෙනහිර)
කලාප කළමනාකරු

එන් බහීරදන් මයා
කලාප කාර්යාලය (උතුර)
කලාප කළමනාකරු

එස් බී සුරංග මයා
කලාප කාර්යාලය (දකුණ)
කලාප කළමනාකරු

ජී හපුආරච්චි මිය
කලාප කාර්යාලය (මධ්‍යම)
කලාප කළමනාකරු

එච් එම් ජී පී ජේ හේරත් මයා
ණය අංශය
ප්‍රධාන කළමනාකරු

ඒ බී සී ආර් විජයපාල මයා
ශාඛා කළමනාකරණ අංශය
ප්‍රධාන කළමනාකරු - උකස්

එම් වී ජී සුසිල් කුමාර මයා
ජාත්‍යන්තර බැංකු අංශය
ප්‍රධාන කළමනාකරු

කේ ටී එස් එස් ගුණවර්ධන මයා
ආරක්ෂක අංශය
ප්‍රධාන කළමනාකරු

ඩී එල් පී අබයසිංහ මයා
සීමාසහිත එන්එස්බී අරමුදල්
කළමනාකරණ සමාගම
ප්‍රධාන විධායක නිලධාරී

එම් ඩබ්ලිව් කේ සී ද සිල්වා මයා
භාණ්ඩාගාර අංශය
ප්‍රධාන කළමනාකරු

කේ ඩී කේ කේ විජයවර්ධන මයා
කාඩ් මධ්‍යස්ථානය
ප්‍රධාන කළමනාකරු

ඩී එම් සී පී බී දිසානායක මයා
සාමාන්‍යාධිකාරී අංශය
ප්‍රධාන කළමනාකරු

ඒ පී ආර් ද සොයිසා මයා
තොරතුරු තාක්ෂණ අංශය
ප්‍රධාන කළමනාකරු
(තොරතුරු පද්ධති ආරක්ෂාව)

එස් එස් ජේ පී එස් ද සිල්වා මිය
මුදල් හා සැලසුම් අංශය
ප්‍රධාන කළමනාකරු

එච් එස් පී රණවීර මයා
මුදල් හා සැලසුම් අංශය
ප්‍රධාන කළමනාකරු

එස් ඒ එම් ඒ සී ජේ එස් කේ සේනාරත්න මිය
නීති අංශය
ප්‍රධාන කළමනාකරු

එස් ඒ ඒ බටුවන්තුඩාව මයා
ණය අංශය
ප්‍රධාන කළමනාකරු

ඩී ඒ වී විජේවන්ත මිය
කිරිබත්ගොඩ ශාඛාව
ශාඛා කළමනාකරු

එස් එච් ඒ එස් කුමාරි මිය
සේවාවසාන ප්‍රතිලාභ අංශය
ප්‍රධාන කළමනාකරු

එන් අයි ගුණතිලක මිය
ණය අංශය
ප්‍රධාන කළමනාකරු

එච් ඩී යූ සුසන්ත කුමාර මයා
මහනුවර ශාඛාව
ශාඛා කළමනාකරු

පී ඒ ජී එල් හේමාල් මයා
වෙන්නප්පුව ශාඛාව
ශාඛා කළමනාකරු

ජේ එම් ඒ කේ ජයසිංහ මිය
නගර ශාඛාව
ශාඛා කළමනාකරු

කේ බී එන් සී කුමාරි මිය
මුදල් හා සැලසුම් අංශය
ප්‍රධාන කළමනාකරු

ඒ එම් ජී අලහකෝන් බණ්ඩා මයා
ගම්පහ ශාඛාව
ශාඛා කළමනාකරු

ටී ඩී පී පෙරේරා මයා
මානව සම්පත් අංශය
ප්‍රධාන කළමනාකරු (පිරිස්)

එම් ටී හුසේන් මයා
තොරතුරු තාක්‍ෂණ අංශය
ප්‍රධාන කළමනාකරු
(තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මෙහෙයුම්)

කේ සී ත්‍යානන්දන් මිය
චුන්නාකම් ශාඛාව
ශාඛා කළමනාකරු

එම් ඩී ටී පෙරේරා මිය
අලෙවි අංශය
ප්‍රධාන කළමනාකරු

ඩබ් ඊ සී පෙරේරා මිය
අවදානම් කළමනාකරණ අංශය
ප්‍රධාන කළමනාකරු

ජේ එල් පී මංජුල මයා
අවදානම් කළමනාකරණ අංශය
ප්‍රධාන කළමනාකරු

ඕ ජී ඩබ් එම් ගෞරවවංශ මිය
භාණ්ඩාගාර පසුපෙළ කාර්යාල ඒකකය
ප්‍රධාන කළමනාකරු

ආයතනික පාලනය

ආයතනික පාලනය කෙරෙහි අපගේ ප්‍රවේශය

ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුල පාලනය පිළිබඳ අපගේ ප්‍රවේශය අනුකූලතාවයෙන් ඔබ්බට විහිදේ. අපගේ ව්‍යාපාරයේ පාලනය සහ නායකත්වය පිළිබඳ අපගේ ප්‍රවේශය, වර්ධනය කරන ලද වගකීම, ඵලදායී නායකත්වය, ශක්තිමත් අවදානම් කළමනාකරණය, පැහැදිලි කාර්යසාධන කළමනාකරණය සහ ඉහළ විනිවිදභාවයකින් යුතු ප්‍රතිචාරාත්මක චින්තනය හා වගකීම් සහගත හැසිරීම් වලට යටත්ව හවුල් වටිනාකම් නිර්මාණය කරන බවට අපි තරයේ විශ්වාස කරමු. තිරසාර වටිනාකම් අත් කරගැනීමේ අපගේ ඉදිරි ගමනේදී පාලනය අපි පිළිගන්නේ වර්තමානයේදී සහ අනාගතයේදී අපගේ පාර්ශවකරුවන් සමග විශ්වාසය පවත්වාගෙන යාම සඳහා උපකාර වන සක්‍රීය ව්‍යාපාරික ක්‍රියාකාරිකයෙක් වශයෙනි.

නිරන්තරයෙන් පරිණාමය වන සහ සංකීර්ණ නියාමන වටපිටාවක බැංකු නියාමන පරිසරයේ සිදුවන වෙනස්කම් වලට ප්‍රතිචාර දක්වන අතරම යහපාලන පරිචයන් ආරක්ෂා කරගැනීම සඳහා එම වෙනස්කම් වලට අනුවර්තනය වනු ඇති බවට අපේක්ෂා කෙරේ. අපගේ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා ඉටුකරදීම උදෙසා ක්‍රියා කිරීමට අපට උපකාර වන ජාත්‍යන්තර මට්ටමේ බැංකු පරිචයන් සහ ශක්තිමත් ආයතනික රාමු අප විසින් භාවිතයට ගන්නා ලද බව සහතික කිරීම සඳහා අපි අපගේ ආයතනික ව්‍යුහය නිරන්තරයෙන් සමාලෝචනය කරන්නෙමු.

අපි ඉහළම මට්ටමේ පාලනයක් වෙනුවෙන් කැපවී සිටින අතර, ආදර්ශවත් ආචාර ධර්ම ප්‍රමිති, පුද්ගලික හා ආයතනික අඛණ්ඩතාව සහ අන් අයට ගරු කිරීම අගයන සහ ප්‍රතිලාභ සලසන සංස්කෘතියක් පෝෂණය කිරීමට යත්න දරන්නෙමු. වගකිව යුතු ආයතනික පුරවැසියෙක් වීමේ අපගේ අභිලාෂයේදී අපි බැංකුවට අදාළ වන නියාමන අවශ්‍යතා, ස්වේච්ඡා සංග්‍රහ සහ ආයතනික පාලනයේ අභ්‍යන්තර අංග අනුග මනය කරන්නෙමු.

අපගේ උපාය මාර්ගයට පාලනයේ සහය ලැබේ

යහපරිච අනුගමනය කරමින් මනා ලෙස පාලනය වන බැංකුවක් පාර්ශවකරුවන්ගේ විශ්වාසය ඉහළ නංවන බව, පිරිවැය අඩු කරන බව, සහභාගිත්ව පාලන ව්‍යුහයක් ගොඩ නංවන බව හා තිරසාර වීමට අපේක්ෂා කරන බව අධ්‍යක්ෂ මණ්ඩලය අවබෝධ කරගෙන සිටී. බැංකුවේ හැඩය හා අපේක්ෂා සහ දිගු කාලීන ශක්‍යතාව තීරණය වන්නේ බැංකුව පාලනය කරන අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ හා ක්‍රියාපටිපාටිය මතය. අදාළ නීති, නියාමන සහ පාලනයේ යහපරිච සමග අනුකූලවීමට බැංකුව පූර්ණ වශයෙන් බැඳී සිටින බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. උපායමාර්ග ක්‍රියාවට නංවමින් ඉදිරියට යන අතර වගකිව යුතු ආයතනික පුරවැසියෙක් බවට පත් වීමට බැංකුවට එමගින් සහය ලැබෙනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපායමාර්ග ක්‍රියාත්මක කරන හා උපායමාර්ග ක්‍රියාවට නැංවීමේදී එහි ජයග්‍රහණ හා අවදානම් පිළිබඳව දැනුවත් කෙරෙන ක්‍රියාකාරී සැලැස්මක් තුළින් බැංකුවේ උපායමාර්ග ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කරනු ලබයි. දිගු කාලීන තිරසාරබව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු වන ප්‍රධාන කරුණක් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආර්ථික, සමාජයීය, පාලන හා පාරිසරික ප්‍රතිඵල අඛණ්ඩ පදනමක් යටතේ අධීක්ෂණය කරනු ලබයි.

බැංකුවට අදාළ වන ප්‍රධාන නියාමන අවශ්‍යතා සහ ස්වේච්ඡා නීති සංග්‍රහ හා ආයතනික පාලන රාමුවේ අභ්‍යන්තර අංග

නියාමන රාමුව මෙන්ම ස්වේච්ඡා සංග්‍රහ මගින් බැංකුවේ ආයතනික පාලන රාමුව අනිවාර්යය කර ඇත.

නියාමන අවශ්‍යතා →

- 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන
- 1988 අංක 30 දරන බැංකුකරණ පනත සහ එහි සංශෝධන
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කර ඇති සියළු නියාමන, විශේෂයෙන් ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනය
- 2017 අංක 24 දරණ දේශිය ආදායම් පනත සහ එහි සංශෝධන
- 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල පනත
- ශ්‍රී ලංකාවේ පොදු ව්‍යවසාය සඳහා ආයතනික පාලනයේ යහපරිච සංග්‍රහය

බැංකුවට අදාල ස්වේච්ඡා නීති සංග්‍රහ →

- 2017 දී ආයතනික පාලනය සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද යහපරිච සංග්‍රහය

අභ්‍යන්තර උපාංග →

- අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය
- අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු ප්‍රඥප්ති
- ආයතන සංග්‍රහය
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති හා ක්‍රමවේද

පාලන ව්‍යුහය

මනා ලෙස සැලසුම් කරන ලද පාලන ව්‍යුහය හා ක්‍රමවේද මගින් බැංකුව මනා ලෙස කළමනාකරණය කෙරෙන හා පාලනය වන බවට සහතික වේ. පැහැදිලිව බෙදා වෙන් කරන ලද අධිකාරී සීමා සමග මනාව නිර්වචනය කරන ලද ආයතනික රාමුවක් බැංකුව සතුය. වර්තමානයේදී සහ ඉදිරියේදී බැංකුව සහ එහි පාර්ශවකරුවන්ට වටිනාකම් නිර්මාණය කිරීම උදෙසා මෙම උපායමාර්ගයට අනුකූලව බැංකුව ක්‍රියාකරන බව අප විසින් ක්‍රියාත්මක කරන ලද පාලන ක්‍රියාවලිය මගින් සහතික වේ. පාලනයේ භාරකරුවන් වන අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ තීරණ ගැනීමේ ඉහළම අධිකාරිය ලෙස ක්‍රියා කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු, කළමනාකරණ කමිටු සහ කළමනාකාරීත්වය වෙත ගලා යයි. අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවල සහයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ උපායමාර්ගය සාක්ෂාත් කරගැනීම සඳහා සදාචාරාත්මක හා ඵලදායී නායකත්වයක් සපයන අතර එකඟවූ අවදානම් අභිරුචිය යටතේ බැංකුව කළමනාකරණය කෙරෙන බවට සහතික වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද හා අනුමත කරන ලද උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කළමනාකාරීත්වය සහ කළමනාකරණ කමිටු වගකිව යුතුය. එකඟවූ අවදානම් මට්ටම් මත පදනම්ව අවදානම උපකල්පනය කරමින් මෙහෙයුම් ඉදිරියට ගෙනයාමේ වගකීම උපායමාර්ගික ව්‍යාපාරික මාර්ග වෙත පැවරේ.

බැංකුවේ පාලන ව්‍යුහය සඳහා පිටු අංක 50 බලන්න.

ආයතනික පාලනය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පාලන ව්‍යුහය

රූපසටහන 03



→ පත්කිරීම් ප්‍රවාහය
→ වගකීම් ප්‍රවාහය
⇢ පරිපාලන ප්‍රවාහය
→ සංවාදය

CMC	ආයතනික කළමනාකරණ කමිටුව
ALCO	වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව
CC	ණය කමිටුව
IC	ආයෝජන කමිටුව
EC	සමකොටස් කමිටුව
TNIC	ටෙන්ඩර් සහ නව ආයෝජන කමිටුව
PRC	කාර්යසාධන සමාලෝචන කමිටුව
BOSC	ශාඛා මෙහෙයුම් නියාමන කමිටුව
ITSC	තොරතුරු තාක්ෂණ නියාමන කමිටුව
MKTC	අලෙවිකරණ කමිටුව
ORMC	මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව
PDC	නිමැවුම් ප්‍රවර්ධන කමිටුව
HRC	මානව සම්පත් කමිටුව
CPC_{Major}	ආයතනික ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)
CPC_{Minor}	ආයතනික ප්‍රසම්පාදන කමිටුව (සුළු පරිමාණ)
EPC	විධායක ප්‍රසම්පාදන කමිටුව
CSRSC	ආයතනික සාමාජයීය වගකීම් සහ තිරසාරත්ව කමිටුව
SMC	ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව

*2021 පෙබරවාරි මස 8 වෙනිදා සිට ක්‍රියාත්මක නොවේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

බැංකුව තුල ආයතනික පාලනයට සහ එකඟවූ අවදානම් අභිරුචියට යටත්ව බැංකුවේ උපායමාර්ගික ජයග්‍රහණ සාක්ෂාත් කර ගැනීම සඳහා සදාචාරාත්මක හා ඵලදායී නායකත්වය සැපයීමේ වගකීම දරන අවසාන අධිකාරිය වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයයි. අධ්‍යක්ෂ මණ්ඩල විග්‍රහ ආශ්‍රිතව විවිධත්වය ඇති කරමින් සහ කළමනාකාරිත්වයට ඵලදායී ලෙස අභියෝග කිරීම තුලින් තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ පෙර ගමනට අර්ථවත් ලෙස දායක වෙති. පැහැදිලිව වෙන් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්, තීරණ ගැනීමේදී කිසිදු අධ්‍යක්ෂවරයෙකුට අසීමිත බලයක් හිමි නොවන බවට සහතික වේ. බැංකුවේ මෙහෙයුම් කාර්යසාධනය, මූල්‍යමය කාර්යසාධනය සහ ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමවේද අධීක්ෂණය හා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතන කළමනාකාරිත්වයට පවරා ඇති අතර, කළමනාකාරිත්වය විවෘත හා විනිවිද භාවයෙන් කටයුතු කරමින් සියළු වැදගත් කරුණු එහි අවධානයට යොමු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ ආයතනික කළමනාකාරිත්වය අතර පවතින ගැඹුරු අන්තර් ක්‍රියාකාරිත්වය බැංකුවේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කරන අතර මනා බල තුලනයක් සහතික කරයි. මේ කටයුතු සිදු වන්නේ අන්‍යෝන්‍ය ගෞරවයෙන් හා අවංක භාවයෙන් යුක්තය.

අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් සාමූහික වගකීමක් දරයි.



එසේම, එහි පාලන කාර්යයන් සහ වගකීම් ඉටු කිරීමේ දී පාර්ශවකරුවන් ඇතුළත් ප්‍රවේශයක් අනුගමනය කරයි.

රූපසටහන 04

අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව සහ වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව, වගකීම් හා බලතල පහත පරිදි වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල →

- අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මගින් පනවා ඇති සීමා හෝ බල පැවැත්වෙන නීති/ නියාමන වලට යටත්ව බැංකුවට අදාළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණ ගැනීමේ අධිකාරිය ලෙස කටයුතු කිරීම.
- බැංකුවේ අනුමත ප්‍රසම්පාදන සංග්‍රහයේ විධිවිධාන හා බලපැවැත්වෙන වෙනත් අදාල නීති/නියාමන වලට යටත්ව මූල්‍යමය කරුණු සම්බන්ධයෙන් සුදුසු තීරණ වලට එළඹීම.
- සෑම මට්ටමකදීම වඩාත් වාසිදායක ව්‍යාපාරික ප්‍රවේශ අනුගමනය කර ඇති බවට සහතික වීම සඳහා බැංකුවේ සියළුම කටයුතු පාලනය කිරීම උදෙසා ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සම්පාදනය.
- වාර්තා කැඳවීම, කමිටුවක් පත් කිරීම හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ බැංකුවේ කාර්යසාධනය, කළමනාකරණය හෝ පරිපාලනයට අදාල ඕනෑම කරුණක් විමර්ශනය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව සහ වගකීම් →

- අධ්‍යක්ෂ මණ්ඩලයේ මගපෙන්වීම/ මාර්ගෝපදේශකත්වය අවශ්‍ය කෙරෙන ඕනෑම සාර්ව මට්ටමේ කටයුත්තක නිරත වීම
- බැංකුවේ සමස්ත ක්‍රියාවලිය පිළිබඳ නිරන්තර අධීක්ෂණය හා පිරික්සුම
- ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක්, ඕනෑම අධ්‍යක්ෂවරයෙක්, සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිළධාරී හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරනු ලැබ ඇති බලතල ක්‍රියාත්මක කරන වෙනත් ඕනෑම කමිටුවක් විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත පදනම්ව සුදුසු පියවර ගැනීම.
- බැංකුවේ කාර්යසාධනය සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී ඇතුළු ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්ගේ කාර්යසාධනය අධීක්ෂණය කිරීම හා ඇගයීම.
- සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී පත් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ යොමු කිරීමේ අනුදේශ වලට අනුකූලව ස්ථානගත කිරීම හා උසස්වීම් සිදු කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය පිහිටුවා ඇත්තේ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාරවය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇති වගකීම් හා කාර්යභාරය අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මගින් විස්තර කෙරේ. තමන් තෝරාගත් ප්‍රවීණතා ක්ෂේත්‍රයෙහි කැපීපෙනෙන වෘත්තීයවේදීන් වන සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන කරුණු පිළිබඳව විචාරය කිරීමේ නිපුණතාවයෙන් යුත් අධ්‍යක්ෂවරු සත්දෙනෙකුගෙන් වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. සමාලෝචනයට ලක් කෙරෙන මූල්‍ය වර්ෂය තුලදී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් සයදෙනෙකුගෙන් සමන්විතවූ අතර ඉන් එක් අධ්‍යක්ෂවරයෙක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වූ අතර සෙසු අධ්‍යක්ෂවරු ස්වාධීන නොවන හා විධායක නොවන අධ්‍යක්ෂවරු වූහ. අධ්‍යක්ෂ මණ්ඩලයේ නායකත්වය සහ එහි කාර්යක්ෂමතාව සහතික කිරීමේ සමස්ත වගකීම පැවරෙන්නේ සභාපතිවරයාටය. බැංකුව ඵලදායී ලෙස අවදානම් කළමනාකරණය කරන බව, මූල්‍ය කාර්යසාධන හා වර්තාකරණය නිරීක්ෂණය කරන බව සහ සාධනීය අභ්‍යන්තර පාලන හා ක්‍රමවේද ක්‍රියාත්මක කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලබයි. මෙම රාමුව යටතේ බැංකුව තුල ව්‍යවසායකත්ව නායකත්වය සැපයීම හා දිරිමත් කිරීමද සිදුකෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සුදුස්කම් හා නිපුණතා, වෙනත් කැපී පෙනෙන පත් කිරීම් සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල සාමාජිකත්වය ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තර පිටු අංක 40 සිට 44 දක්වා සඳහන් වේ.

අධ්‍යක්ෂ මණ්ඩල නිපුණත්වය හා ප්‍රවීණතාව

මූල්‍ය අතරමැදියෙක් වශයෙන් සියළු පාර්ශවකරුවන්ගේ යහපත උදෙසා වටිනාකම් නිර්මාණය කිරීමට උපකාර වන පුළුල් පරාසයක විහිදුනු කුසලතා සමූහයකින් බැංකුව සමන්විත විය යුතුය. වේගයෙන් වෙනස් වන පරිසරයකට සහ බැංකුවේ දිගු කාලීන උපාය මාර්ගයන්හි

ආයතනික පාලනය

විතැන්වීම් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය වන නිපුණතා සංයුතිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබයි. නිපුණත්වයේ හා ප්‍රවීනත්වයේ මනා සංකලනය, එක්සත් කණ්ඩායමක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ ඉදිරි උපායමාර්ග සහ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාදාමයට මගපෙන්වීමේ හා ඉදිරියට ගෙනයාමේ හැකියාවෙන් සන්නද්ධ බව තහවුරු කරයි. අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය, විශේෂයෙන් බැංකුකරණය, මූල්‍ය, ආර්ථික, පර්යේෂණ, සැලසුම්, උපායමාර්ග, සංවර්ධන, තොරතුරු තාක්ෂණ, සයිබර් ආරක්ෂණය, මානව ශාස්ත්‍ර, කළමනාකරණය, පරිපාලනය සහ ජාත්‍යන්තර සබඳතා යන අංශයන්හි නිපුණත්වයෙන් හා ප්‍රවීණත්වයෙන් යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රමවේදය

ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව එකඟවූ රැස්වීම් කාලසටහනක් මත අවම වශයෙන් සති හයකට වරක් අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වේ. අවශ්‍යතාවය මත පදනම්ව අමතර රැස්වීම් කැඳවනු ලැබේ. විධිමත් ලෙස රැස්වීම් වලට සහභාගි වන අධ්‍යක්ෂකවරු සාකච්ඡාවලට සක්‍රීයව එක් වෙති. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහභාගිත්වය පිළිබඳ විස්තර පිටු අංක 53 හි දැක්වේ. සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිළධාරී සමග සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ සහයෝගයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල න්‍යාය පත්‍රය තීරණය කිරීමේ වගකීම සභාපතිට පැවරී ඇත. රැස්වීමේ න්‍යාය පත්‍රය අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සමගින් රැස්වීමට සතියකට පෙර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර බෙදා හරිනු ලැබේ. එළඹෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා නිසි පරිදි සූදානම්වීම සහ සාකච්ඡා කළ යුතු කරුණු දැන ගැනීම මත පදනම්වූ තීරණ ගැනීමේ ක්‍රියාවලියක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට එමගින් අවස්ථාව හිමිවේ. විශේෂ අවස්ථා වලදී කෙටි දැනුම් දීමකින් හදිසි අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා භාරදීම හෝ රැස්වීම අතරතුර සභාගත කිරීම සිදු කරනු ඇත. රැස්වීම් පිළිබඳ ප්‍රමාණාත්මක විස්තර සහිත වාර්තා සහ එහිදී ගනු ලබන තීරණ අධ්‍යක්ෂකවරුන්ගේ පරිශීලනය සඳහා පවත්වාගෙන යනු ලැබේ. සාකච්ඡා කිරීම සහ තීරණ ගැනීම සඳහා ඇතැම් කරුණු න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලෙසට ද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට ඉල්ලා සිටිය හැක.

ගැටෙන අභිලාෂ

බැංකුවේ අභිලාෂ වෙනුවෙන් මනා විශ්වාසයෙන් යුතුව ක්‍රියා කිරීමටත් මූල්‍ය හෝ වෙනත් අභිලාෂ හේතුවෙන් ඇති වන ගැටුම් වලින් වැළකී සිටීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටිති. යම් ව්‍යාපාරික අයිතමයකට අදාල අභිලාෂ ගැටුමක් හෝ එසේ ගැටුමක් ඇති වීමේ විභවතාවයක් වෙතොත් ඒ සම්බන්ධව අධ්‍යක්ෂවරු කඩිනමින් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කළ යුතුය. තමන් තුල අභිලාෂ ගැටුමක් පවතින ඕනෑම කරුණකට අදාල තීරණ ගැනීමේ සාකච්ඡා වලට සහභාගි නොවී සිටීමට අධ්‍යක්ෂවරු බැඳී සිටිති. න්‍යාය පත්‍රයේ ඇතුළත් වන සහ ඒ අනුව රැස්වීම් වාර්තාවට ඇතුළත් කරන ලද කිසියම් කරුණක් සම්බන්ධයෙන් ඔවුන්ට කිසියම් ගැටෙන අභිලාෂයක් වෙතොත් ඒ බව ප්‍රකාශ කිරීමට සම්මත න්‍යාය පත්‍ර අයිතමයක් ඇතුළත් කර ඇත. අධ්‍යක්ෂවරුන්ට සලසා ඇති සෑම බැංකුකරණ පහසුකමක්ම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කරනු ලැබ ඇති බලතල වලට අනුකූල වේ. අධ්‍යක්ෂවරු වාර්ෂිකව සිය අභිලාෂ ප්‍රකාශයට පත් කරන අතර අභිලාෂ ගැටුමක් නොමැති බව සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේද ක්‍රියාත්මක වේ.

239 පිටුවේ දැක්වෙන මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 49.5.2 හි දක්වා ඇති පරිදි හැර, 2020 වර්ෂය තුල බැංකුව හෝ එහි පරිපාලිත සමාගම් විසින් අත්සන් කරන ලද කිසිදු කොන්ත්‍රාත්තුවක් හෝ විධිවිධානයක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරු කිසිවෙකුට සැලකිය යුතු අභිලාෂයක් නොතිබුණි.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂ රැස්වීම් ඇතුළුව වර්ෂය තුල නියමිත රැස්වීම් 19 ක් පවත්වන ලදී. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ විධිවිධාන අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවම වශයෙන් සති හයකට වරක් පැවැත්වෙන අතර අවශ්‍යතාවය අනුව විශේෂ රැස්වීම් පැවැත්වේ. උපායමාර්ගය සාක්ෂාත් කරගැනීමේ පාලන ක්‍රියාවලියේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදුව අනුමත කරන ලද බැංකුවේ තුන් අවුරුදු උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම සකස් කිරීමේදී ආයතනික කළමනාකාරිත්වයට පැහැදිලි නියාමනයක් සැපයීමට අධ්‍යක්ෂ මණ්ඩලය සිය කාලය කැප කළේය. වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රාග්ධනය කළමනාකරණය සඳහා කාලය කැප කළ අතර, කාර්යසාධනය සහ උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම සමාලෝචනය කිරීමද සිදු කරන ලදී. එසේම, තවදුරටත් අවධානය යොමු විය යුතු කරුණු, එනම් අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ ආයතනික පාලනය ආදිය පිළිබඳවද සාකච්ඡා කරන ලදී.

2020 වර්ෂයේදී අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය

නිපුණත්වය සහ අත්දැකීම්

ප්‍රස්තාරය 19



- අ - නායකත්වය
- ආ - ආර්ථික, බැංකුකරණය, මූල්‍ය
- ඇ - පර්යේෂණ, සැලසුම්, උපාය මාර්ගික සංවර්ධනය
- ඈ - කළමනාකරණය, පරිපාලනය
- ඉ - තොරතුරු තාක්ෂණය, සයිබර් ආරක්ෂණය
- ඊ - මානව ශාස්ත්‍ර, සමාජයීය විද්‍යා, ජාත්‍යාන්තර සබඳතා

වයස් විවිධත්වය

ප්‍රස්තාරය 20



- අවු. 60 ට අඩු
- අවු. 60 ට වැඩි

වයස් විවිධත්වය

ප්‍රස්තාරය 21

වයස් සාමාන්‍යය

අවුරුදු 51



අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

ස්වාධීන විනිශ්චයක් ප්‍රවර්ධනය කිරීම, නිසි බලතුලනයක් පවත්වාගැනීම සහ වගකීම් ඵලදායීව ඉටු කිරීම සඳහා බලතල බෙදාහැරීම උපකාර වන බව සහතික කිරීමේ හැකියාව ඇති සුදුසු යැයි හැඟෙන ඕනෑම කමිටුවක් හෝ කමිටු කිහිපයක් වෙත සිය බලතල, අභිමතය සහ අධිකාරිය පැවරීමට අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය බලගන්වනු ලැබ ඇත. සිය යොමුකිරීමේ අනුදේශ මගින් පවරන ලද එක් එක් ක්ෂේත්‍රය හා සම්බන්ධ කරුණු පිළිබඳව අධීක්ෂණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වෙත පැවරේ. කෙසේවුවත්, අධ්‍යක්ෂ මණ්ඩලය, අනු කමිටු වල තීරණ පිළිබඳව වගකීම අඛණ්ඩව සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුව යන අනිවාර්යය කමිටු සතර 2017 අංක 12 දරණ බැංකු පනත් නියාමනය ප්‍රකාරව ස්ථාපිත කර ඇති අතර අනෙකුත් කමිටු තුන ස්ථාපිත කර ඇත්තේ නිරන්තරයෙන් වෙනස්වන ව්‍යාපාරික, පාලන අවශ්‍යතා, අවදානම් කළමනාකරණ සහ ක්ෂේත්‍රයේ පාලන යහපැවැ සැලකිල්ලට ගැනීමෙනි. අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් එක් අනු කමිටුවේ කාර්යයන් හා වගකීම් නිශ්චිතව දක්වනු ලැබ ඇති අතර එම කමිටුවල මෙහෙයුම් වලට අදාළව නිශ්චිත අධිකාරී මට්ටම් සපයනු ලැබ ඇත. එම කමිටු සත අතුරින් කමිටු සයක ලේකම් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කටයුතු කරන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි, පරිපාලන හා අයකරගැනීම්) අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි. තොරතුරු දැන ගැනීම, සමාලෝචනය, අදහස් දැක්වීම සහ අවශ්‍ය අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත රැස්වීම් වර්තා ඉදිරිපත් කෙරේ.

යොමු කිරීමේ අනුදේශ, සංයුතිය, කාර්යභාරය හා වගකීම්, සාමාජිකයන්ගේ පැමිණීම, 2020 වසර තුල සිදුකළ ක්‍රියාකාරකම් අදාළ කමිටු වාර්තා යටතේ පිටු අංක 78 සිට 91 දක්වා සඳහන් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල/අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සංයුතිය හා පැමිණීම

වගුව 13

අධ්‍යක්ෂවරයාගේ නම	අධ්‍යක්ෂ තත්ත්වය	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව	අධ්‍යක්ෂ දමණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනා-කරණ කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපාය මාර්ගික කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපාය මාර්ගික කමිටුව
කේශිලා ජයවර්ධන මිය - සභාපති	විධායක නොවන/ ස්වාධීන නොවන අධ්‍යක්ෂ	19/19		6/6			1/1	1/2	6/6
එරංග ජයවර්ධන මහතා - ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ	විධායක නොවන/ ස්වාධීන අධ්‍යක්ෂ	18/18		0/0	0/0	1/1	4/4	6/6	4/6
යූ ජී ආර් ආරියරත්න මහතා - නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ	විධායක නොවන/ ස්වාධීන නොවන අධ්‍යක්ෂ	18/19		1/1	2/2			4/4	
ආචාර්ය එම් කේ සී සේනානායක මහතා - නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ	විධායක නොවන/ ස්වාධීන නොවන අධ්‍යක්ෂ	19/19	6/6		2/2	3/5			
මනෝහරී අබේසේකර මිය - අධ්‍යක්ෂ	විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ	19/19	6/6			4/4	4/4	1/1	6/6
ආචාර්ය තිරාන් ද සිල්වා මහතා - අධ්‍යක්ෂ (2020 ඔක්තෝබර් 09 දක්වා)	විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂ	13/15		5/5	2/2		2/3	2/2	0/2
එම් ටී ජේ පෙරේරා මහතා - අධ්‍යක්ෂ	විධායක නොවන/ ස්වාධීන නොවන අධ්‍යක්ෂ	14/14	5/5	5/5		3/4		3/3	6/6

අධ්‍යක්ෂවරු පත් කිරීම, නැවත පත් කිරීම සහ ඉල්ලා අස්වීම

රාජ්‍ය හිමිකාරිත්වය සහිත බැංකුවක් ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අධ්‍යක්ෂවරු පත් කිරීම 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන අනුව සිදු කෙරේ. ඒ අනුව, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාරව අධ්‍යක්ෂවරුන් සත් දෙනාගෙන් පස් දෙනෙකු රාජ්‍ය බැංකු සඳහා වගකිවයුතු විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරන අතර අනෙකුත් අධ්‍යක්ෂවරු දෙදෙනාගෙන් එක් අයෙක් භාණ්ඩාගාර ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක් විය යුතු අතර අනෙක් පුද්ගලයා අනුව තැපැල්පති හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙක් විය යුතුය. යෝග්‍යතාව හා හිමිකම සඳහා අවශ්‍ය නිර්නායක සපුරා ඇත්නම්, කරන ලද පත්වීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කෙරේ. ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරණ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂවරයෙක්ට සිය ධූරය දැරිය හැකි උපරිම කාලය වසර නමයකට සීමා වේ.

අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලා අස්වීම හා නැවත පත් කිරීම සිදු කෙරෙන්නේ ද 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව වන අතර ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිසි පරිදි දැනුවත් කෙරේ.

ආයතනික පාලනය

අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රේරණය හා පුහුණුව

අධ්‍යක්ෂ මණ්ඩලයේ විචාරයන්ට පූර්ණ ලෙස දායකවීමේ අවස්ථාව අධ්‍යක්ෂවරුන්ට හිමි කරදෙමින් නව අධ්‍යක්ෂවරු ප්‍රමාණවත් ලෙස දැනුවත් කර ඇති බවට හා බැංකුවේ මෙහෙයුම් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් අධ්‍යක්ෂවරුන් සතුව ඇති බව සහතික කර ගැනීම සඳහා මනා ලෙස අවධානය යොමු කරන ලද ප්‍රේරණයේ හා පුහුණුවේ අවශ්‍යතාවය බැංකුව විසින් හඳුනාගනු ලැබ ඇත. එමගින් අධ්‍යක්ෂවරුන්ගේ විශ්වාසනීය සහ ව්‍යවස්ථාපිත රාජකාරි තව දුරටත් විස්තර කෙරෙන අතර, නෛතික හා පාලනය හා සම්බන්ධ සියළු වගකීම් සඳහා මග පෙන්වයි. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට, පත්වීම ලැබීමෙන් පසු පුහුණුව හා 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත හා එහි සංශෝධන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබ ඇති නියාමන, අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය, අධ්‍යක්ෂ මණ්ඩල කමිටු ප්‍රඥප්ති, අනෙකුත් අදාල ව්‍යවස්ථා, චක්‍රලේඛ හා අනෙකුත් අදාල ලියවිලි අන්තර්ගත බෝර්ඩ් පැක් පරිගණක විසඳුම සහ අධ්‍යක්ෂ මණ්ඩල අත්පොත වෙත ප්‍රවේශය සපයනු ලැබේ. ආර්ථික, නියාමන හා ක්ෂේත්‍රයේ ප්‍රවණතා පිළිබඳ යාවත්කාලීන දැනුමක් ලබා ගැනීමට සහය වන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගෙන් අධ්‍යක්ෂවරු තම ධුර කාලය පුරා තොරතුරු යාවත්කාලීන කිරීම් හා පුහුණුව ලබා ගනිති. නියාමන හෝ වෙනත් බලධාරීන් විසින් සංවිධානය කරනු ලබන පුහුණු/ දැනුම් වර්ධන වැඩසටහන් වලට අධ්‍යක්ෂවරු සහභාගී වෙති.

තොරතුරු වෙත ප්‍රවේශය

අධ්‍යක්ෂවරුන්ට සිය කාර්යයන් හා වගකීම් ඉටු කිරීමට අවශ්‍ය තොරතුරු මෙන්ම සම්පත් වෙත සීමා නොකළ ප්‍රවේශයක් පවතී. 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන ප්‍රකාරව ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීම සම්බන්ධයෙන් බැංකුවේ වියදමෙන් බාහිර විශේෂඥ උපදෙස් ලබාගැනීමේ හැකියාව අධ්‍යක්ෂවරුන්ට ඇත. අවශ්‍ය සාකච්ඡා සඳහා ප්‍රමාණවත් කාලයක් අධ්‍යක්ෂවරුන්ට ලබාදෙමින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා බෙදා හරින ක්‍රමවේදයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල විද්‍යුත් පත්‍රිකා ක්‍රමයක් හඳුන්වාදී තිබේ.

කළමනාකරණ කමිටු

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වලට අමතරව බැංකුව විසින් කළමනාකරණ කමිටු කිහිපයක් ස්ථාපිත කරනු ලැබ තිබේ. යොමු කිරීමේ අනුදේශ (Terms of Reference) ප්‍රකාරව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සියළු කළමනාකරණ කමිටු වල සභාපති වශයෙන් කටයුතු කරයි. පහත වගුවේ දක්වා ඇති පරිදි කළමනාකරණ කමිටු විසින් බැංකුවේ මෙහෙයුම්වලට සම්බන්ධ තීරණාත්මක කරුණු පිළිබඳව සාකච්ඡා කරනු ලබයි.

කළමනාකරණ කමිටුව	අරමුණ සහ වගකීම්	සංයුතිය
ආයතනික කළමනාකරණ කමිටුව	ප්‍රතිපත්ති හා උපායමාර්ග සැකසීම හා සම්බන්ධ කරුණු අධීක්ෂණය, මෙහෙයුම් මට්ටමේදී ප්‍රතිපත්ති හා උපායමාර්ග ක්‍රියාවට නැංවීම	බැංකුව තුල නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර හා ඊට ඉහළ තනතුරු හොබවන සියළු නිලධාරීන්
වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව	ආදායම් ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා බැංකුවේ වෙළඳපොළ සහ ද්‍රවශීලතා අවදානම පූර්ව නිශ්චිත අවදානම් අභිරුචි මට්ටමක් තුල පවත්වා ගැනීම	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන, ජාත්‍යන්තර බැංකු, මෙහෙයුම්, ණය, භාණ්ඩාගාර සහ අවදානම් කළමනාකරණ අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
ණය කමිටුව	බැංකුවේ ණය ප්‍රතිපත්තිය කලින් කලට සමාලෝචනය කිරීම, ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සහ ආදායම් ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා බැංකුවේ අවදානම් අභිරුචි මට්ටම තුල සිට හිතකර ණය කළඹක් පවත්වාගෙන යාමෙහි නිරතවීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන, මෙහෙයුම්, ණය, භාණ්ඩාගාර, නීති සහ අවදානම් කළමනාකරණ අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
අයෝජන කමිටුව	බැංකුවේ ආයෝජන ප්‍රතිපත්තිය කලින් කලට සමාලෝචනය කිරීම සහ බැංකුවේ සමස්ත අවදානම් අභිරුචි මට්ටම තුල සිට බැංකුවේ ආයෝජන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන, ජාත්‍යන්තර බැංකු, ණය, භාණ්ඩාගාර, නීති සහ අවදානම් කළමනාකරණ අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
කාර්යසාධන සමාලෝචන කමිටුව	මූල්‍ය කාර්යසාධනය, දැනට ක්‍රියාත්මක ක්‍රියාකාරකම් වල ප්‍රගතිය, ඉවත් කරනු ලබන කටයුතු සහ කාර්යසාධනයට පහසුකම් සපයන වෙනත් ඕනෑම උපකාරක සේවාවක් සමාලෝචනය කිරීම	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, සියළුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරුන්, සියළු උපදේශකවරුන් සහ අංශ ප්‍රධානීන්, සියළුම සහකාර සාමාන්‍යාධිකාරවරුන්, අනුකූලතා නිළධාරී සහ කමිටුව විසින් පත් කරන ලද වෙනත් ඕනෑම සාමාජිකයෙක්.
ශාඛා මෙහෙයුම් නියාමන කමිටුව	පවරා ඇති මූල්‍ය අධිකාරිය තුල සිට ශාඛා මෙහෙයුම් බලාත්මක කිරීම අධීක්ෂණය කිරීම	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන, නීති සහ පරිශ්‍ර අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
තොරතුරු තාක්ෂණ නියාමන කමිටුව	තොරතුරු තාක්ෂණ උපායමාර්ගය බැංකුවේ ව්‍යාපාරික උපායමාර්ගවලට අනුරූප බව සහතික කිරීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන, ජාත්‍යන්තර බැංකු, මෙහෙයුම්, ණය, භාණ්ඩාගාර, නීති, මානව සම්පත් සංවර්ධන, අලෙවි, තොරතුරු තාක්ෂණ, අනුකූලතා සහ අවදානම් කළමනාකරණ අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්

කළමනාකරණ කමිටුව	අරමුණු සහ වගකීම්	සංයුතිය
අලෙවි කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ආයතනික කළමනාකාරීත්වයට අලෙවිකරණ උපදෙස්, විශේෂඥතාව සහ සහය ලබාදීම සහ බැංකුවේ සියළු අලෙවිකරණ කටයුතු සමාලෝචනය කිරීම සහ ඒ සඳහා මග පෙන්වීම	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, මෙහෙයුම් සහ අලෙවි අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව	මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රමවේදය ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කරන අතරම බැංකුවේ මෙහෙයුම් අවදානම කළමානාකරණය කිරීම සහ අදාළ ක්‍රියාමාර්ග ගැනීම ඔස්සේ අභ්‍යන්තර පාලනයන්හි අඛණ්ඩභාවය පවත්වා ගැනීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, පර්යේෂණ හා සංවර්ධන, මෙහෙයුම්, මානව සම්පත් සංවර්ධන, තොරතුරු තාක්ෂණ, උපකාරක සේවා, පරිශ්‍ර, නීති, අවදානම් කළමනාකරණ, අනුකූලතා සහ තොරතුරු ආරක්ෂණ අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
නිමැවුම් සංවර්ධන කමිටුව	ඉහළ යන තරඟකාරීත්වයට මුහුණදීම සඳහා නවෝත්පාදක නිමැවුම් සංවර්ධනය ඔස්සේ දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම අධීක්ෂණය කිරීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, පර්යේෂණ හා සංවර්ධන, මෙහෙයුම්, ජාත්‍යන්තර බැංකු, තොරතුරු තාක්ෂණ, ශාඛා ණය, අලෙවි සහ සැලසුම් අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
මානව සම්පත් කමිටුව	බැංකුවේ උපායමාර්ගික අරමුණු වලට අනුකූලව මානව සම්පත් සංවර්ධනය කිරීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා සැලසුම්, මානව සම්පත් සංවර්ධන, ණය සහ නීති අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්
ආයතනික ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)	බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි පවත්වා ගැනීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, මූල්‍ය හා සැලසුම් හා මෙහෙයුම් අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් හා මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක්
ආයතනික ප්‍රසම්පාදන කමිටුව (සුළු පරිමාණ)	බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි පවත්වා ගැනීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, මූල්‍ය හා සැලසුම් සහ මෙහෙයුම් අංශ වල ප්‍රධාන කළමනාකරණ නිළධාරීන් හා මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක්
විධායක ප්‍රසම්පාදන කමිටුව	බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි පවත්වා ගැනීම.	ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය), ප්‍රධාන කළමනාකරු (මූල්‍ය)
ආයතනික සමාජ වගකීම හා තිරසාරභාවය පිළිබඳ කමිටුව	තිරසාර කාර්යසාධනය හා සංවර්ධනය හා සම්බන්ධ ආයතනික අරමුණු මගින් අර්ථ දක්වා ඇති ආකාරයට ආචාරධර්මීය, සමාජයීය හා පාරිසරික වගකීම අපගේ දෛනික ව්‍යාපාර මෙහෙයුම් සමග ඒකාබද්ධ කිරීම ඔස්සේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කිරීමට දායකවීම.	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, සියළුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරුන්, සියළු උපදේශකවරුන්, අංශ ප්‍රධානීන් සහ සියළුම සහකාර සාමාන්‍යාධිකාරවරුන්
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව	මානව සම්පත ආශ්‍රිත කරුණු සලකා බැලීම	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන)

වගුව 14 කළමනාකරණ කමිටු

අවදානම් කළමනාකරණයේදී අධ්‍යක්ෂ මණ්ඩල කාර්යභාරය

අවදානම් කළමනාකරණය බැංකුවේ ව්‍යාපාරික උපායමාර්ග වල අනිවාර්ය අංගයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකනු ලබයි. අවදානම් කළමනාකරණයේදී දූරදර්ශී අධීක්ෂණය අධ්‍යක්ෂ මණ්ඩලය තුල මුල් බැසගෙන ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවන ලදුව බැංකුවේ අවදානම් කළමනාකරණය හා අදාළ සිය වගකීම් ඉටු කිරීමේ බලය එය වෙත පවරනු ලැබ ඇත. ඒ අනුව, බැංකුව විසින් ශක්තිමත් අවදානම් කළමනාකරණ කාර්යරාමුවක්, අවදානම් අභිරුචි සීමා සහ බැංකුවේ අවදානම් පැතිකඩ නිරීක්ෂණය කිරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් සකස් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් නිතිපතා ඉදිරිපත් කරනු ලබන වාර්තා මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ අවදානම් පැතිකඩ නිරීක්ෂණය කරනු ලබයි. එකඟවූ අවදානම් අභිරුචි මට්ටම් අභිබවන අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් කළමනාකාරීත්වයෙන් විමසනු ලබන අතර එවැනි අවස්ථා වළක්වා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය මගපෙන්වීම සැපයේ. උපායමාර්ගික ව්‍යාපාර සැලැස්ම පිළිබඳව සාකච්ඡා කිරීමේදී ව්‍යාපාර ආශ්‍රිත අවදානම් සැලකිල්ලට ගැනීම හා ඒ පිළිබඳව ගැඹුරින් සලකා බැලීම හා සමාලෝචනය කිරීම සිදු කෙරෙන අතර දිගු කාලීන උපායමාර්ගික සැලැසුම් ක්‍රියාවලිය ආශ්‍රිත අවදානම මැනවින් ආමන්ත්‍රණය කෙරෙන බව එමගින් සහතික කෙරේ.

සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරය

1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන, ශ්‍රී ලංකා මහ බැංකු නියාමන සහ ආයතනික පාලන යහපරිච වලට අනුකූලව කළමනාකරණ නිලධාරීන් පත් කිරීම හා බලතල බෙදාහැරීම ඔස්සේ තනතුරු වල සුපැහැදිලි බව සහ අධිකාරී බලය හා වගකීම ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට බැංකුව කටයුතු කරයි. ඒ අනුව, සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරය එකිනෙකින් වෙන්ව පවතින අතර ඔවුන්ට අදාළ වගකීම් නිශ්චිතව අර්ථ දක්වා ඇත. එලෙස එක් එක් තනතුර

ආයතනික පාලනය

සඳහා අදාළ වගකීම් වෙන් වෙන්ව දක්වා ඇත්තේ කිසිදු පුද්ගලයෙකුට නිර්බාධිත තීරණ ගැනීමේ හැකියාවක් නොපවතින බවත් සුදුසු බලතුලනයක් හා අධිකාරියක් පවතින බවත් සහතික කිරීම සඳහාය. සභාපතිවරයා විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙක් වේ. එහෙත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් නොවේ. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මගින් සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම් පැහැදිලිව විග්‍රහ කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායී ක්‍රියාකාරීත්වයට පහසුකම් සැලසීම, ක්‍රමානුකූලබව පවත්වාගෙන යාම, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵළදායීතාවය පවත්වා ගැනීම සහ බැංකුව තුල ආයතනික පාලනය ආශ්‍රිත ඉහළම ප්‍රමිතීන් පවත්වාගැනීම සභාපතිවරයා වෙත පැවරෙන වගකීම් වේ. සාමාන්‍යාධිකාරී/විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සමග සාකච්ඡා කොට සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රය සකස් කරනු ලබයි. සිය කාර්යයන් ඉටු කිරීමේදී තොරතුරු මත පදනම්වූ තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රමාණවත් පරිදි තොරතුරු ලැබෙන බවට සභාපතිවරයා සහතික වන අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා එහි සාමාජිකයන්ගේ ඵලදායී සහභාගීත්වය සහතික කිරීම, පාර්ශවකරුවන් සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීම සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග විවෘත සන්නිවේදනයක් පවත්වා ගැනීම යන වගකීම්ද ඉටු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දී ඇති පරිදි අනුමත කරන ලද අවදානම් අභිරුචි මට්ටම් වලට යටත්ව බැංකුවේ උපායමාර්ගය සහ දෛනික ව්‍යාපාරික කළමනාකරණ කාර්යයන් සකස් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියා වෙත පැවරී තිබේ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියා ආයතනික කළමනාකරණ සාමාජිකයන් වෙත නායකත්වය ලබාදෙන අතර ආයතනික පාලන රාමුවට අනුකූලව සිය අධිකාරිය යටතේ පවතින ඇතැම් වගකීම් ආයතනික කළමනාකරණ කණ්ඩායම වෙත පවරයි. එසේම, ඔහු කළමනාකරණ කමිටුව වල සභාපතිත්වය දරණ අතර බැංකුවේ කාර්යසාධනය පිළිබඳව නිවැරදි, කාලීන හා පැහැදිලි තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලැබෙන බව සහතික කරයි. බැංකුවේ කටයුතු පවත්වාගෙන යාමේදී යහපත් ආයතනික පාලනයක් සහ ප්‍රශස්ත ප්‍රමිතීන් පවත්වා ගන්නා බවද සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් සහතික කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ කාර්යභාරය

බැංකුව තුල මනා ආයතිනක පාලනයක් පවතින බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටි අනුගමනය කරන බව සහ නිතිපතා සමාලෝචනය කෙරෙන බව සහතික කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වෙත පැවරී තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ කාර්යභාරය කෙටියෙන් පහත දක්වා ඇත.

- සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු රැස්වීම් වල වාර්තා පවත්වා ගැනීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමන සහ ව්‍යවස්ථාපිත අනුකූලතාවය පවත්වාගෙන යන බවට සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ ඵලදායී ක්‍රියාකාරීත්වය සහතික කිරීම.
- අදාළ නීති හා රෙගුලාසි සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වෘත්තීය උපදෙස් ලබාදීම සහ ආයතනික පාලන ප්‍රතිපත්ති සහ වෙනත් ආශ්‍රිත කාර්ය රාමු සමග අනුකූල වන බව සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු විසින් ගනු ලබන තීරණ සහ ඒවායේ ප්‍රතිඵල පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය මනා ලෙස දැනුවත් බව සහතික කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් යනු ප්‍රධාන කළමනාකරණ පිරිසට ඇතුළත් තනතුරක් වන හෙයින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් පත්කිරීම හෝ ඉවත් කිරීම යනු අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ උපදෙස් මත සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයම සම්බන්ධ වන කරුණකි.

අධ්‍යක්ෂවරුන්ගේ මට්ටම සහ වේතන සකස් කිරීම

1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එහි සංශෝධන ප්‍රකාරව අධ්‍යක්ෂවරුන්ගේ වේතනය තීරණය කරනු ලබන්නේ විෂයයභාර අමාත්‍යවරයා විසිනි. කිසිදු අධ්‍යක්ෂවරයෙකු සිය වේතනය තීරණය කිරීම සඳහා සම්බන්ධ නොවේ. වසර තුනකට වරක් සමාලෝචනය කෙරෙන සාමූහික ගිවිසුම මගින් නිර්දේශිත වැටුප් මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විසින් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකරණ පිරිසට අදාළ වේතන පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. බැංකුව ප්‍රධාන කළමනාකරණ පිරිස සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වැටුප් ප්‍රතිපත්තියක් අනුගමනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ නිර්දේශ මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ විධිවිධාන සහ එහි සංශෝධන වලට අනුකූලව අවසාන අනුමැතිය ලබාදෙන, රාජ්‍ය බැංකු සම්බන්ධයෙන් වගකීම පැවරෙන අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු ඇගයීම

2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනය සහ වෙනත් අදාළ වන නීති හා රෙගුලාසි මෙන්ම ආයතනික පාලනය පිළිබඳ යහපරිච මගින් ඉදිරිපත් කෙරෙන වගකීම් ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වගකීම් ඉටු කරනු ලබන බවට සහතිකවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වාර්ෂිකව ස්වයං-ඇගයීමක නිරත වේ. ඇගයීම් ක්‍රියාවලියේදී සෑම අධ්‍යක්ෂවරයෙක්ම අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධන ඇගයීම් පත්‍රිකාවක් සම්පූර්ණ කරන අතර ඒවා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව වෙත භාරදෙනු ලැබේ.

ප්‍රධාන විධායක නිළධාරී ඇගයීම

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ සහය ඇතිව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යසාධනය ඇගයීම සිදු කෙරේ.

වර්ෂය ආරම්භයේදී සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සමග එකඟවූ පරිදි ව්‍යාපාරික උපායමාර්ගික සැලැස්මේ මූල්‍ය හා මූල්‍ය නොවන ඉලක්ක වලට අනුකූල නිර්නායක මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ සහය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යසාධනය ඇගයීම සිදු කරනු ලබයි. එලෙස ඔහුගේ කාර්යසාධනය ඇගයීමේදී මෙහෙයුම් පරිසරයේ සිදු වන වෙනස්කම් සැලකිල්ලට ගැනේ. සභාපතිවරයා මේ සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සමග සාකච්ඡා කරන අතර ඔහුගේ/ඇයගේ නිල හා නිල නොවන ප්‍රතිපෝෂණය ලබාදෙයි. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යසාධන ඇගයීම අනුමත කිරීමට පෙර ඒ සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ ප්‍රතිචාර නිසි පරිදි සලකා බැලේ.

බැංකු පනත් නියාමනය සමග අනුකූලතාවය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනය සහ එහි පසුකාලීන සංශෝධන

වගුව 15

		2020 දී අනුකූලතා මට්ටම
3 (1)	**අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වගකීම**	
3 (1) (i)	අධ්‍යක්‍ෂ මණ්ඩලය පහත කරුණු පිළිබඳව සහතික වෙමින් බැංකුවේ සුරක්ෂිතභාවය සහ ස්ථාවරත්වය ශක්තිමත් කළ යුතුය.	
3 (1) (i) (අ)	බැංකුවේ උපායමාර්ගික අරමුණු හා ආයතනික වටිනාකම් අනුමත කිරීම හා අධීක්ෂණය කිරීම සහ මේ පිළිබඳව තොරතුරු බැංකුවේ සියළු පිරිස් වෙත සන්නිවේදනය වන බව සහතික කිරීම.	අනුකූලවී ඇත. පිටු අංක 51 හි සඳහන් පරිදි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් බැංකුවේ උපාය මාර්ගික අරමුණු හා ආයතනික වටිනාකම් තීරණය කරනු ලබයි. මේවා අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2021 - 2023 තුන් අවුරුදු උපාය මාර්ගික සැලසුමට අන්තර්ගත කර ඇති අතර සැලසුම් කරන ලද රැස්වීම්හිදී ඒ පිළිබඳව සියළු ශ්‍රේණිවල සේවකයන් දැනුවත් කර ඇත. ආයතනික වටිනාකම් බැංකුවේ නිල වෙබ් පිටුවේ සහ පිටු අංක 2 හි සහ 3 හි සඳහන් වේ.
3 (1) (i) (ආ)	අවම වශයෙන් ඉදිරි වසර තුන සඳහා බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ගය, සමස්ත අවදානම් ප්‍රතිපත්තිය සහ කළමනාකරණ ක්‍රියාපටිපාටි හා මැනිය හැකි ඉලක්ක සහිත යාන්ත්‍රණ අනුමත කිරීම.	අනුකූලවී ඇත. ආයතන කළමනාකාරීත්වය සමග සවිස්තරාත්මකව සාකච්ඡා කිරීමෙන් අනතුරුව අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2021 - 2023 තුන් අවුරුදු ව්‍යාපාරික උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාර්ගෙ ්පදේශකත්වය හා නියාමනය සපයන ලදී. උපායමාර්ගික ව්‍යාපාරික සැලැස්ම බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යරාමුව, ක්‍රියාවලි, සහ අවදානම් අභිරුචිය සමග අනුකූල වේ. ව්‍යාපාරික උපායමාර්ගික සැලැස්ම ඉදිරි වසර තුන සඳහා මැනිය හැකි ඉලක්ක සහිත ක්‍රියාකාරී සැලසුමක් ඔස්සේ ක්‍රියාත්මක කෙරේ. ව්‍යාපාරික උපායමාර්ගික සැලැස්ම, වාර්ෂිකව යාවත්කාලීන හා සමාලෝචනයට ලක් කෙරෙන සැලසුමකි.
3 (1) (i) (ඇ)	ප්‍රධාන අවදානම් හඳුනාගැනීම සහ දූරදර්ශී ලෙස අවදානම් කළමනාකරණය කරගැනීම සඳහා ගැළපෙන පද්ධති ක්‍රියාත්මක වන බව සහතික කිරීම.	අනුකූලවී ඇත. බැංකුවේ අවදානම් ප්‍රතිපත්තිය අනුමත කිරීම, බැංකුවට මුහුණ පෑමට සිදුවන මූලික අවදානම් හඳුනාගැනීම, පාලන ව්‍යුහ ස්ථාපිත කිරීම සහ මූලික අවදානම් තක්සේරුව, නිරීක්ෂණය හා කළමනාකරණය කිරීමේ වගකීම අධ්‍යක්‍ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරනු ලැබ ඇත. පහත වාර්තා මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර සපයයි. පිටු අංක 92 සිට 114 දක්වා වන අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණ වාර්තාව පිටු අංක 84 සිට 85 දක්වා වන අධ්‍යක්‍ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව
3 (1) (i) (ඈ)	තැන්පත්කරුවන්, ණය ගැතියන්, ණය හිමියන්, කොටස්කරුවන් ඇතුළු සියළු පාර්ශවකරුවන් සමග සන්නිවේදනය කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම අනුමත කිරීම.	අනුකූලවී ඇත. ඵලදායී හා කාලීන සන්නිවේදනයක් සහතික කිරීම සඳහා සියළු පාර්ශවකරුවන් ආවරණය කෙරෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද හා ක්‍රියාත්මක කරන ලද සන්නිවේදන ප්‍රතිපත්තියක් බැංකුව සතුව ඇත.
3 (1) (i) (ඉ)	බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති හා කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත්භාවය හා විශ්වාසනීයත්වය සමාලෝචනය කිරීම.	අනුකූලවී ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති හා කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත්භාවය හා විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. විගණන අංශය සහ රාජ්‍ය විගණක විසින් මේ පිළිබඳව වර්ෂය තුළදී සමාලෝචනය කරනු ලබන අතර එම සමාලෝචන මෙන්ම ඊට අදාළ කළමනාකරණ ප්‍රතිචාරද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කෙරේ. එම සොයාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කර ඇත.

ආයතනික පාලනය

		2020 දී අනුකූලතා මට්ටම
3 (1) (i) (ඊ)	ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතිවල නිර්වචනය කර ඇති පරිදි ප්‍රධාන කළමනාකරණ පිරිස් හඳුනාගැනීම හා තනතුරු සඳහා පත් කිරීම.	අනුකූලවී ඇත. ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතිවල නිර්වචනය කර ඇති පරිදි ප්‍රතිපත්ති, සෘජු ක්‍රියාකාරකම් කෙරෙහි සැලකිය යුතු ආකාරයෙන් බලපෑම් කළ හැකි සහ ව්‍යාපාර කටයුතු, මෙහෙයුම් හා අවදානම් කළමනාකරණය පිළිබඳව පාලනය කළ හැකි පුද්ගලයන් ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස හඳුනාගැනේ. සියළුම ප්‍රධාන කළමනාකරණ පිරිස් පත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව විසින් නිර්දේශ කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ. ආයතන පාලනය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකු නියාමනයට අනුකූලව බැංකුව විසින් ප්‍රධාන කළමනාකරණ පිරිස් හඳුනාගනු ලැබ ඇත.
3 (1) (i) (උ)	අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අධිකාරී ක්ෂේත්‍ර සහ ප්‍රධාන වගකීම් නිශ්චය කිරීම.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරී ක්ෂේත්‍රය ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 7 වගන්තිය යටතේ පාලනය වේ. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව සකස් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ විෂයය ක්ෂේත්‍රය හා වගකීම් සවිස්තරාත්මකව දැක්වේ. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විසින් ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා වන අධිකාරී ක්ෂේත්‍ර හා ප්‍රධාන වගකීම් නිශ්චය කර ඇත. එම වගකීම් ප්‍රධාන කළමනාකරණ පිරිසෙහි සෑම සාමාජිකයෙකුගේම රැකියා විස්තරයෙහි අන්තර්ගත වේ.
3 (1) (i) (ඌ)	ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තියට ගැළපෙන පරිදි බැංකු කටයුතු යෝග්‍ය ලෙස අධීක්ෂණය කෙරෙන බව සහතික කිරීම.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ උපායමාර්ගික ව්‍යාපාර සැලැස්මට අනුකූලව බැංකුවේ කාර්ය සාධනය සාමාලෝචනය කරන අතර අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වෙතින් මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය සහ එම කමිටුවලට පවරා ඇති අනෙකුත් අදාළ කරුණු පිළිබඳ වාර්තා ලබා ගනී. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ විෂයය පථයට අයත් කරුණු පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය පරිදි ඔවුන් කැඳවනු ලබයි.
3 (1) (i) (එ)	අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම, නාමයෝජනා කිරීම සහ පත්කර ගැනීම; අභිලාෂ ගැටුම් කළමනාකරණය; සහ දුර්වලතා නිර්ණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී වෙනස්කම් ක්‍රියාත්මක කිරීම ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලන පරිච වල ඵලදායීතාවය කලින් කලට ඇගයීම.	අනුකූලවී ඇත. සිය පාලන පරිච ඇගයීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය සාධනය සම්බන්ධයෙන් ස්වයං ඇගයීමක් වාර්ෂිකව සිදු කෙරේ. අභිලාෂ ගැටුම් කළමනාකරණය සඳහා සම්බන්ධිත පාර්ශව පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර ඇත. අභිලාෂ ගැටුම් පවතී නම් ඒවා නිරීක්ෂණය කිරීම සඳහා සිය සම්බන්ධිත පාර්ශව සහ අභිලාෂ පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගෙන් වාර්ෂිකව ප්‍රකාශ ලබාගැනේ. සිය පාලන පරිච ඇගයීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය පිළිබඳව ස්වයං ඇගයීමක් වාර්ෂිකව සිදු කෙරෙන අතර 2020 වසර සඳහාද එය සිදු කර ඇත.
3 (1) (i) (ඒ)	ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා යෝග්‍ය අනුප්‍රාප්තික සැලැස්මක් බැංකුවට තිබෙන බව සහතික කිරීම.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් බැංකුව තුල ක්‍රියාත්මක වේ.
3 (1) (i) (ඔ)	ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම සහ ආයතනික අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය අධීක්ෂණය සඳහා අවශ්‍යතාවය මත ප්‍රධාන කළමනාකරණ පිරිස් නිරතුරුව හමුවීම.	අනුකූලවී ඇත. කාර්යසාධනය, උපායමාර්ගය, ප්‍රතිපත්තිය සහ තම විෂයය පථයට අදාළ වෙනත් ඕනෑම කරුණක් ආශ්‍රිත ප්‍රගතිය ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් අධ්‍යක්ෂ මණ්ඩල හා ඒවායේ අනු කමිටු රැස්වීම් වලදී සාකච්ඡා කෙරේ. කළමනාකරණය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ විවෘත හා විනිවිද භාවයකින් යුක්තව සියලුම කරුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරයි. ඊට අමතරව, න්‍යාය පත්‍රයේ ඇතුළත් සිය අධීක්ෂණය යටතේ පවතින ප්‍රධාන කරුණු පිළිබඳව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් කරුණු ඉදිරිපත් කරනු ලබන අතර ආයතනික අරමුණු හා අදාළ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කරුණු දැක්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු විසින් ඔව්හු කැඳවනු ලබති.

		2020 දී අනුකූලතා මට්ටම
3 (1) (i) (ඕ)	නියාමන පරිසරය අවබෝධ කරගැනීම සහ බැංකුව විසින් නියාමන ආයතන සමග ඵලදායී සම්බන්ධතාවයක් පවත්වාගෙන යන බව සහතික කිරීම.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂවරුන් ලෙස පත්වීමෙන් පසු සියළු නියාමන අවශ්‍යතා පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයට සිය කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීමේ හැකියාව ලබාදෙමින් අනුකූලතා නිළධාරී විසින් නියාමන ප්‍රවණතා පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ලබයි. ඊට අමතරව, අනුකූලතා නිලධාරී විසින්, මාසිකව නියාමන ආයතනය වෙත වාර්තා කරන ලද තොරතුරු පිළිබඳව අනුකූලතා වාර්තාව මගින් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ලබයි.
3 (1) (i) (ළ)	බාහිර විගණකවරුන්ගේ සේවය ලබාගැනීමේදී හා අධීක්ෂණය කිරීමේදී අවශ්‍ය සුපරීක්ෂාකාරී බවින් යුතුව කටයුතු කිරීම.	අනුකූලවී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුව රාජ්‍ය බැංකුවක් වන හෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය සහ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 37 වන වගන්තියේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ. එසේම, විගණන ක්‍රමවේදයේ ස්වාධීනත්වය, විෂයය මූලිකත්වය සහ ඵලදායීතාවය සමාලෝචනය කිරීම සහ නිරීක්ෂණය කිරීම සහ විගණකාධිපතිවරයාට සහය වීම සඳහා විගණකාධිපතිවරයා විසින් බාහිර විගණකවරයෙක් පත් කරගන්නේ නම් එසේ පත් කරගනු ලබන එවැනි ඕනෑම බාහිර විගණකවරයෙක් සම්බන්ධයෙන් විගණන අධිකාරී හරහා විගණකාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත පැවරී තිබේ.
3 (1) (ii)	මෙම නිර්දේශවල නිර්දේශ අංක 3 (5) ප්‍රකාරව සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීම සහ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී සතු කාර්යභාරය හා වගකීම් නිශ්චිතව දැක්වීම හා අනුමත කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරනු ලබයි.	අනුකූලවී ඇත. 1995 වසරේ අංක 28 දරණ පනතින් සංශෝධනය කරන ලද 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව සභාපතිවරයා පත්කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 26 (1) වගන්තියෙන් දක්වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා යෝග්‍ය හා නිසි පුද්ගලයෙකු පත්කරනු ලබන අතර එම තැනැත්තා බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියාද වේ. සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යභාරය හා වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්වචනය කිරීම හා අනුමත කිරීම සිදු කරනු ලැබ තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ ඇතුළත් මෙම නිර්දේශවල නිර්දේශ අංක 3 (5) ප්‍රකාරව සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරය සහ වගකීම් නිශ්චිතව දැක්වීම හා අනුමත කිරීම සිදුකර ඇත.
3 (1) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය නිති පතා හමුවිය යුතු අතර ආසන්න වශයෙන් මසකට වරක් ලෙස වර්ෂයක් තුළ අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දොළොසක් පැවැත්විය යුතුය. එසේ පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගීවීමට සුදුසුකම් ඇති අධ්‍යක්ෂවරුන් බහුතරයකගේ ක්‍රියාකාරී සහභාගීත්වය අත්‍යවශ්‍ය වේ. රැස්වීමකින් තොරව ලිඛිත යෝජනා හෝ ලියවිලි සංසරණය කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් හැකිතාක් දුරට වැළකීමට කටයුතු කෙරේ.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ සක්‍රිය සහභාගීත්වයෙන් සෑම මසකම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත්ව පැවැත්වෙන අතර පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව සහ අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පිටු අංක 53 හි දැක්වේ. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සංසරණය කිරීම ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම අවම කිරීමට බැංකුව හැකි සෑම පියවරක්ම ගෙන ඇති අතර, සුවිශේෂී අවස්ථාවන්හිදී සිදුකරන එවැනි යෝජනා ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ.
3 (1) (iv)	සියළුම අධ්‍යක්ෂවරුන්ට බැංකුවේ ව්‍යාපාර ප්‍රවර්ධනය හා අවදානම් කළමනාකරණයට අදාළ කරුණු හා යෝජනා නිතිපතා පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රවලට ඇතුළත් කිරීමේ අවස්ථාව සහතික කිරීමට පියවර ගෙන ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වග බලා ගැනෙයි.	අනුකූලවී ඇත.

ආයතනික පාලනය

		2020 දී අනුකූලතා මට්ටම
3 (1) (v)	සියළුම අධ්‍යක්‍ෂවරුන් හට සහභාගිවීමේ අවස්ථාව සලසමින් අවම වශයෙන් නිතිපතා පැවැත්වෙන අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් සඳහා දින හතක පූර්ව දැනුම් දීමක් ලබා දෙන බවට අධ්‍යක්‍ෂ මණ්ඩල කාර්ය පටිපාටිය මගින් සහතික වෙයි. සියළුම අනෙකුත් අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාධාරණ කාලසීමාවක් තුල දැනුම් දීමක් සිදු කරනු ලැබේ.	අනුකූලවී ඇත. රැස්වීම පිළිබඳ නිවේදනය, න්‍යාය පත්‍රය හා සාකච්ඡා කිරීමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සමගින් රැස්වීමට දින සතකට පෙර අධ්‍යක්ෂවරුන් වෙත යොමු කෙරෙන අතර අදාළ කරුණු පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කිරීමට හා අත්‍යාවශ්‍ය යෝජනා තිබේ නම් ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් අධ්‍යක්ෂවරුන්ට ලබාදීම එමගින් අපේක්ෂා කෙරේ.
3 (1) (vi)	නොකඩවා පූර්වගාමී රැස්වීම් තුනකට සහභාගී නොවූ හෝ මාස දොළහක කාලපරිච්ඡේදය තුල පවත්වන ලද පූර්වගාමී රැස්වීම්වලින් අවම වශයෙන් රැස්වීම් තුනෙන් දෙකක් සඳහා සහභාගී වී නොමැති අධ්‍යක්ෂවරුන්ගේ අධ්‍යක්ෂ ධුරය අවලංගු වන බවට අධ්‍යක්‍ෂ මණ්ඩල කාර්ය පටිපාටිය මගින් වගබලා ගැනෙයි.	අනුකූලවී ඇත. 2007 අංක 12 දරණ බැංකු පනත් නියමය ප්‍රකාරව අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ඔවුන්ගේ සහභාගීත්වයට අදාළව ඇගයීම සිදු කෙරේ. අධ්‍යක්‍ෂවරුන්ගේ සහභාගිත්වය පිටු අංක 53 හි දක්වා ඇත. ගත වූ මාස 12 තුල පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට සහභාගි නොවූ හෝ අඛණ්ඩව රැස්වීම් තුනකට සහභාගි නොවූ කිසිදු අධ්‍යක්‍ෂවරයෙක් නොමැත.
3 (1) (vii)	1988 අංක 30 දරණ බැංකු පනතෙහි 43 වන වගන්තියේ විධිවිධාන සපුරාලන ලේකම්වරයෙකු අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පත් කෙරෙයි.	අනුකූලවී ඇත. 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා නීතිඥයෙකි. අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ ලේකම්වරයෙකු විසින් ඉටු කරනු ලැබිය යුතු වගකීම් සහ ව්‍යවස්ථා සහ අනෙකුත් රෙගුලාසි වල නිශ්චිතව සඳහන් වන කාර්යයන් ඉටු කිරීම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ මූලික වගකීම වේ.
3 (1) (viii)	අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය පටිපාටිය සහ අදාළ සියළු නීති හා රෙගුලාසි අනුගමනය කෙරෙන බව සහතික කිරීමේ අරමුණින් අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් හා සේවය ලබා ගැනීමට සියළු අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසා තිබිය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රමවේද අනුගමනය කරන බව සහ අදාළ නීති හා රෙගුලාසි සමග අනුකූල වන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ උපදෙස් හා සේවය ලබාගැනීමේ පූර්ණ අවස්ථාව සියළු අධ්‍යක්ෂවරුන්ට හිමිවේ.
3 (1) (ix)	අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පවත්වාගෙන යා යුතු අතර එකී වාර්තා ඕනෑම අධ්‍යක්‍ෂවරයෙකුට සාධාරණ කාල පරාසයක් තුල සාධාරණ දැනුම් දීමක් මත පරීක්ෂා කිරීම සඳහා විවෘතව තිබිය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට අදාළ වාර්තා සකස් කරනු ලබන අතර ඒවා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර සංසරණය කරනු ලබයි. අධ්‍යක්ෂවරුන් විසින් යෝජනා කරන ලද සංශෝධන සිදු කිරීමෙන් පසු ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පෙර රැස්වීමට අදාළ වාර්තාව සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම සිදුවේ.
3 (1) (x)	අධ්‍යක්‍ෂ මණ්ඩලය සිය රාජකාරි කටයුතු ඉටුකිරීමේදී සැලකිලිමත් බවින් යුතුව හා විචක්ෂණශීලීව ක්‍රියා කරන්නේද යන්න රැස්වීම් වාර්තාවලින් දැන ගත හැකි වන පරිදි අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳව ප්‍රමාණවත් පරිදි විස්තර සහිත අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වාර්තා තබාගත යුතුය. එමෙන්ම, අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වාර්තා, නියාමන හා අධීක්ෂණ අධිකාරීන්ට අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්වල දී සිදුකරන විවරණවල ගැඹුර ඇගයීම පිණිස පවතින මූලාශ්‍රයක්ද වේ. එබැවින්, අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තාවන් හි පහත කරුණු පැහැදිලිව ඇතුළත් විය යුතු වේ. (අ) සිය විවරණයන්හිදී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් භාවිත කරන ලද දත්ත හා තොරතුරුවල සාරාංශයක් ; (ආ) අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සලකා බලනු ලැබූ කරුණු ;	අනුකූලවී ඇත. ලබාදී ඇති නිර්නායක ආවරණය කෙරෙන පරිදි රැස්වීම් වාර්තා පවත්වාගෙන තිබේ.

		2020 දී අනුකූලතා මට්ටම
3 (1) (x)	(ඇ) නියමිත අවධානයෙන් හා විචක්ෂණශීලී බවින් යුතුව අධ්‍යක්ෂ මණ්ඩලය සිය වගකීම් ඉටුකර ඇත්දැයි විදහාපාන කරුණු විමර්ශනය කෙරෙන සාකච්ඡා සහ විසංවාදී හෝ එකඟ නොවන කරුණු ; (ඈ) අධ්‍යක්ෂ මණ්ඩල උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සහ අදාල නීති හා රෙගුලාසි කෙරෙහි අනුකූලතාවය පිළිබිඹු කෙරෙන සාක්ෂි සහ අදාළ විධායකයන්ගේ තහවුරු කිරීම්; (ඉ) බැංකුව නිරාවරණය වී සිටින අවදානම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇති දැනුවත්භාවය හා අවබෝධය සහ සම්මත කරගෙන ඇති අවදානම් කළමනාකරණ පියවර පිළිබඳ දළ විශ්ලේෂණය ; සහ (ඊ) තීරණ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්මුති ;	
3 (1) (xi)	සාධාරණ ඉල්ලීමක් මත සුදුසු වාතාවරණයක් යටතේ බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තිමය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසන අධ්‍යක්ෂ මණ්ඩලය එකඟවූ කාර්ය පටිපාටියක් පැවතිය යුතුය. බැංකුව වෙනුවෙන් ඉටු විය යුතු සිය රාජකාරී ඉටු කිරීම සඳහා යම් අධ්‍යක්ෂවරයෙකුට/ අධ්‍යක්ෂවරුන්ට සහාය වනු පිණිස ස්වාධීන වෘත්තිමය උපදෙස් ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ විය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට සිය වගකීම් ඉටු කිරීමේදී අවශ්‍යතාවය අනුව වෘත්තිමය උපදෙස් ලබා ගැනීමට හැකියාව තිබෙන බව ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 27 වන වගන්තියේ සඳහන් වේ. සාධාරණ ඉල්ලීමක් මත සුදුසු වාතාවරණයක් යටතේ බැංකුවේ වියදමෙන් ස්වාධීන වෘත්තිමය උපදෙස් ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මගින්ද අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසාදී තිබේ.
3 (1) (xii)	සම්බන්ධිත පාර්ශ්ව හෝ වෙනත් ආයතන සමග කටයුතු කිරීමේදී හා එම ආයතන සමග ගිවිසුම්වලට එළඹීමේදී ආයතනය පිළිබඳව ඇති වගකීම් සම්බන්ධයෙන් මතුවිය හැකි අභිලාෂ ගැටුම් හෝ එවැන්නක් පවතින බවට හැඟෙන පරිදි කටයුතු කිරීමෙන් වැළකීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය.	අනුකූලවී ඇත. පත්වීම ලබාගන්නා අවස්ථාවේදී හෝ වෙනස්කමක් සිදුවන අවස්ථාවකදී අධ්‍යක්ෂවරු සිය අභිලාෂ පිළිබඳ ප්‍රකාශයක් සිදු කරති. අභිලාෂ ගැටුම් සහ එවැන්නක් ඇතිවූ අවස්ථාවකට අදාළ කරුණු හා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සම්බන්ධිත පාර්ශව පිළිබඳ හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය මගින් විස්තර කෙරේ. අභිලාෂ ගැටෙන අවස්ථාවලදී අධ්‍යක්ෂවරු සාකච්ඡාවලට සහභාගීවීමෙන්, තම අදහස් ප්‍රකාශ කිරීමෙන් හෝ එවැනි සිදුවීමක් අනුමත කිරීමෙන් වැළකී සිටීමට කටයුතු කරති.
3 (1) (xiii)	බැංකුවේ පාලනය හා එය යා යුතු දිශාව අධ්‍යක්ෂ මණ්ඩලයේ දැඩි බලාධිකාරිය යටතේ පවතින බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ සඳහා නිශ්චිතව වෙන් කෙරුණු කටයුතු පිළිබඳ විධිමත් උප ලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුවිය යුතුය.	අනුකූලවී ඇත. බැංකුවේ කටයුතු අධීක්ෂණය සම්බන්ධයෙන් වගකියන ප්‍රධාන අධිකාරිය ලෙස, බැංකුවේ පාලනය හා එය යා යුතු දිශාව අධ්‍යක්ෂ මණ්ඩලයේ දැඩි බලාධිකාරිය යටතේ පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලබයි. සිය වගකීම් ඵලදායීව ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට වෙන් කර ඇති බලතල පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙන් විස්තර කෙරේ. එසේම, සිය වගකීම් ඉටු කිරීමෙහිලා පහසුකම් සලසන ක්‍රමවේද සහ පාලන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබ තිබේ.
3 (1) (xiv)	බැංකුව බුන්වත්වීමට ආසන්න හෝ එහි වගකීම් ඉටු කිරීමට අපොහොසත්වීමට හෝ එසේ වීමට ඉඩ ඇති බවට හෝ එහි තැන්පත්කරුවන්ට හා වෙනත් ණය හිමියන්ට ගෙවිය යුතු ගෙවීම් අත්හිටුවීමට සිදුවන බව පෙනී යන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ සම්බන්ධ කිසිදු තීරණයක්/ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙරාතුව ඒ බව වහාම ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ වෙත දැන්විය යුතුය.	අනුකූලවී ඇත. බැංකුව නුබුන්වත් වන අතර අදාළ වර්ෂය තුළදී බැංකුවේ නුබුන්වත්භාවයට අභියෝග කරන කිසිදු අවස්ථාවක් වසර තුළදී පැන නැගුණේ නැත.

		2020 දී අනුකූලතා මට්ටම
3 (1) (xv)	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය සහ වෙනත් ආරක්ෂාකාරී පදනම් මත මූල්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලැබ ඇති මට්ටම් වලදී බැංකුව ප්‍රාග්ධනිත බව තහවුරු කර ගැනීමට අධ්‍යක්‍ෂ මණ්ඩලය වගබලා ගතයුතුය.	අනුකූලවී ඇත. නියාමන අවශ්‍යතා හා බැංකුවේ තීරණය කරන ලද අවදානම් අභිරුචිය සමග අනුකූලතාවය සහතික කිරීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය හා අනෙකුත් විචක්ෂණශීලී පියවර අධීක්ෂණය කෙරෙනු ලැබේ. බැංකුව අවම ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වී ඇත.
3 (1) (xvi)	මෙකී නියමයන්හි තෙවන නියමය හා බැංකුවේ අනුකූලතාවය දැක්වෙන වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි ප්‍රකාශයට පත් කළ යුතුය.	අනුකූලවී ඇත. මෙම වාර්තාව වාර්ෂික වාර්තාවේ පිටු අංක 39 සිට 91 දක්වා දැක්වෙන ආයතනික පාලන වාර්තාවේ කොටසකි.
3 (1) (xvii)	එක් එක් අධ්‍යක්ෂවරයෙකු විසින් වාර්ෂිකව සිදු කළ යුතු ස්වයං ඇගයීමේ පටිපාටියක් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අනුගමනය කළ යුතු අතර එවන් ඇගයීම් වල වාර්තා පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.	අනුකූලවී ඇත. බැංකුව එක් එක් අධ්‍යක්ෂවරයෙකු විසින් වාර්ෂිකව සිදු කළ යුතු ස්වයං ඇගයීමේ පටිපාටියක් අනුගමනය කරන අතර එය අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් පවත්වාගෙන යනු ලබයි. සෑම අධ්‍යක්ෂවරයෙක්ම තනි තනිව හා සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස සිය ඵලදායීතාවය පිළිබඳව ස්වයං - ඇගයීමක් සිදු කරයි.
3 (2)	**අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සංයුතිය**	
3 (2) (i)	අධ්‍යක්‍ෂ මණ්ඩලයට අයත් අධ්‍යක්‍ෂවරුන් සංඛ්‍යාව 7 ට වඩා අඩු හෝ 13 ට වඩා වැඩි නොවිය යුතුය.	ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 (1) වගන්තිය ප්‍රකාරව අධ්‍යක්‍ෂ මණ්ඩලය සභාපතිවරයා ඇතුළුව අධ්‍යක්‍ෂවරුන් 7 දෙනෙකුගෙන් සමන්විත වෙයි. අධ්‍යක්‍ෂවරුන් පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ පිටු අංක 40 සිට 44 දක්වා පිටුවල දැක්වේ.
3 (2) (ii) (අ)	ප්‍රධාන විධායක නිලධාරී තනතුර හොබවන අධ්‍යක්‍ෂවරයෙකු හැරුනු කොට වෙනත් අධ්‍යක්‍ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර 9 නොඉක්මවිය යුතුය.	අනුකූලවී ඇත. වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය එම තනතුරට පත්ව වසර නවයක් ගතවී නොමැත. ඔවුන්ගේ සේවා කාලය පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 40 සිට 44 දක්වා පිටු වල ද දැක්වේ.
3 (2) (ii) (ආ)	2008 ජනවාරි මස 01 දිනට වසර 09 සම්පූර්ණ කර ඇති හෝ 2008 දෙසැම්බර් මස 31 දිනට ප්‍රථම ඕනෑම අවස්ථාවකදී එවන් සේවා කාලයක් සම්පූර්ණ කරන අධ්‍යක්‍ෂවරයෙකු හට 2009 ජනවාරි මස 01 දින සිට ඇරඹෙන ඉදිරි වසර 3 ක උපරිම කාලයක් සඳහා සේවය කළ හැකිය.	අනුකූලවී ඇත.
3 (2) (iii)	අධ්‍යක්‍ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්‍ෂවරුන් සංඛ්‍යාව මුළු අධ්‍යක්ෂ අධ්‍යක්‍ෂවරුන්ගේ සංඛ්‍යාවෙන් 1/3 නොඉක්මවන්නේ නම් බැංකුවේ සේවකයෙකු බැංකුවේ අධ්‍යක්‍ෂවරයෙක් ලෙස (මෙහි මින් මතු විධායක අධ්‍යක්‍ෂ ලෙස හැඳින්වෙන) පත් කිරීමට, තෝරා පත් කිරීමට හෝ නම් කිරීමට හැකිය. එවන් අවස්ථාවකදී විධායක අධ්‍යක්‍ෂවරුන්ගෙන් එක් අයෙකු බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා විය යුතුය.	අනුකූලවී ඇත. 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ සහ එහි සංශෝධන වල, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සඳහා විධායක අධ්‍යක්ෂවරයෙක් පත්කිරීමේ විධිවිධාන ඇතුළත්ව නැත.
3 (2) (iv)	අවම වශයෙන් විධායක නොවන ස්වාධීන අධ්‍යක්‍ෂවරුන් තිදෙනෙකු හෝ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ මුළු අධ්‍යක්‍ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් හෝ මින් කවර හෝ ඉහළ අගයට සරිලන අධ්‍යක්‍ෂවරුන් සංඛ්‍යාවක් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සිටිය යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් අධ්‍යක්ෂවරයෙක් ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් වන අතර, අනෙක් පස්දෙනා ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් වේ. අධ්‍යක්ෂවරුන්ගේ වර්ගීකරණයට අදාළ විස්තර පිටු අංක 40 සිට 44 දක්වා සහ 53 පිටු වල දැක්වේ.
3 (2) (v)	ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙකු නියෝජනය කිරීමට විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලබන අවස්ථාවකදී එසේ පත් කරන ලද පුද්ගලයාද ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙකුට අදාළ වන නිර්නායක සපුරන අයෙකු විය යුතුය.	අදාළ නොවේ.

		2020 දී අනුකූලතා මට්ටම
3 (2) (vi)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් පිළිගත හැකි වෘත්තිමය පසුබිමක් ඇති සහ/හෝ උපායමාර්ග, කාර්යසාධනය හා සම්පත් ආදී කරුණු සම්බන්ධව ස්වාධීන තීරණයන්ට එළඹිය හැකි අත්දැකීම් හා සුදුසු කුසලතාවයන්ගෙන් සපිරි පිරිසක් විය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂවරුන් පිළිබඳ තොරතුරු පිටු අංක 40 සිට 44 දක්වා පිටු වල දැක්වේ.
3 (2) (vii)	සනපූරණයට අවශ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සපිරුණද සපැමිණි විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සපැමිණි මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් අඩක් නොඉක්මවයි නම් එවන් අවස්ථාවකදී නියමාකාරයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පැවැත්විය නොහැකිය.	අනුකූලවී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සනපූරණය හතරකි. එය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් අඩකට වඩා වැඩි වන අතර අධ්‍යක්ෂවරුන් සත්දෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3 (2) (viii)	බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙළිදරව් කෙරෙන සියළු ආයතනික සන්නිවේදනයන්හීදී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් විශේෂයෙන් හඳුන්වා දිය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළත් කෙරෙන සියළු ආයතනික සන්නිවේදනයන්හී බැංකුවේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් විශේෂිතව හඳුන්වාදී ඇත. සභාපතිවරයාගේ, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ, ස්වාධීන හා ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළුව අධ්‍යක්ෂවරු කාණ්ඩය අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පිටු අංක 40 සිට 44 හි දැක්වේ.
3 (2) (ix)	අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා විධිමත්, සැලකිල්ලට භාජනයවූ හා විනිවිද භාවයෙන් යුත් කාර්ය පටිපාටියක් පැවතිය යුතුය. එමෙන්ම ක්‍රමවත්ව අනුප්‍රාප්තිකයන් පත්කිරීම පිණිස ද පටිපාටියක් තිබිය යුතුය.	අනුකූලවී ඇත. බැංකුවේ අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 (1) (අ) වගන්තිය ප්‍රකාරවය. ඒ අනුව, බැංකුවේ විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරු පස් දෙනෙක් පත් කෙරේ.එක් අධ්‍යක්ෂවරයෙක් භාණ්ඩාගාර ලේකම් හෝ ඔහු විසින් නම් කරනු ලැබූ තැනැත්තෙක් විය යුතු අතර තවත් අධ්‍යක්ෂවරයෙක් තැපැල්පති හෝ ඔහු විසින් නම් කරනු ලැබූ තැනැත්තෙක් විය යුතුය.
3 (2) (x)	ක්ෂණික ලෙස පුරප්පාඩුවක් පිරවීම පිණිස පත් කරනු ලබන සියළු අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ පත්වීමෙන් අනතුරුව පවත්වනු ලබන පළමු මහා සභා රැස්වීමේදී පාර්ශවකරුවන්ගේ ඡන්ද වීමසීමකට භාජනය විය යුතුය.	අදාළ නොවේ. විෂයභාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කිරීම සිදු කරන හෙයින් මෙවැනි තත්ත්වයක් පැන නොනගී.
3 (2) (xi) (අ)	අධ්‍යක්ෂවරයෙකු සිය තනතුරින් ඉල්ලා අස්වන්නේ නම් හෝ ඉවත් කරනු ලබන්නේ නම්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්; එම අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම, එවන් ඉල්ලා අස්වීමකට හෝ ඉවත් කරනු ලැබීමකට බලපෑ හේතුද, එසේ කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාට බැංකුව සමග යම් එකඟතාවයකට නොපැමිණීමට හේතුවක් තිබේ නම් එයද ඇතුළුව නිවේදනය කිරීම සහ	අනුකූලවී ඇත. බැංකුවේ එකම කොටස් හිමිකරු වන ශ්‍රී ලංකා රජය, බැංකුව සිය විෂයය පථයට අයත් වන විෂයයභාර අමාත්‍යවරයා මගින් අධ්‍යක්ෂවරු පත් කිරීම මෙන්ම ඉවත් කිරීමද සිදු කරනු ලබයි. ඕනෑම ඉල්ලා අස්වීමක් යොමු කෙරෙන්නේද විෂයයභාර අමාත්‍යවරයා වෙතය. ඉල්ලා අස්වීම් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව දැනුවත් කෙරේ.
(ආ)	හිමිකරුවන්ගේ අවධානයට යොමු කළ යුතු කරුණු වේද/නොවේද යන්න සහතික කරමින් ප්‍රකාශයක් නිකුත් කළ යුතුය.	බැංකුවේ කොටස් හිමිකරුවා ශ්‍රී ලංකා රජය වන අතර නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂවරුන් හැර අනෙකුත් අධ්‍යක්ෂවරු පස්දෙනාගේ වෙනස්වීම් සිදු කරනු ලබන්නේ රජය විසින් අදාළ විෂය භාර අමාත්‍යවරයා හරහාය.
3 (2) (xii)	බැංකු අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු වෙනත් බැංකු අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම, තෝරා පත් කර ගැනීම හෝ නම් කිරීම එකී බැංකුව, පළමුව සඳහන් කළ බැංකුවේ පරිපාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් වන්නේ නම් පමණක් හැර සිදු නොකළ යුතුය.	2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කොටස් හිමිකාරීත්වය නියෝජනය කරමින් බැංකුවේ සේවකයෙකු වන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම හැර ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂවරු හෝ සේවකයන් වෙනත් බැංකුවල අධ්‍යක්ෂවරු ලෙස පත්කර නොමැත.

ආයතනික පාලනය

		2020 දී අනුකූලතා මට්ටම
3 (3)	**අධ්‍යක්‍ෂවරුන්ගේ හැකියා හා යෝග්‍ය බව ඇගයීමේ නිර්ණායක**	
3 (3) (i) (අ), සහ (ආ)	අධ්‍යක්‍ෂවරයෙකු ලෙස කටයුතු කරන තැනැත්තෙකුගේ වයස අවුරුදු 70 නොඉක්මවා තිබිය යුතුය.	අනුකූලවී ඇත. වයස අවුරුදු 70 ඉක්මවූ අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂ මණ්ඩලයේ නොමැත.
3 (3) (ii)	යම් පුද්ගලයකු බැංකුවේ පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම්ද ඇතුළුව සමාගම්/ආයතන 20 කට වඩා වැඩි සංඛ්‍යාවක අධ්‍යක්‍ෂ ධුර නොදැරිය යුතුය.	අනුකූලවී ඇත. කිසිදු අධ්‍යක්ෂවරයෙක් බැංකුවේ පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම්ද ඇතුළුව සමාග ම්/ආයතන 20 කට වඩා වැඩි සංඛ්‍යාවක අධ්‍යක්‍ෂ ධුර දරන්නේ නැත.
3 (4)	**අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පවරන ලද කළමනාකරණ කාර්යභාරය**	
3 (4) (i)	අධ්‍යක්‍ෂවරුන් විසින් දැනට ක්‍රියාත්මක වන බලතල පැවරීමේ ක්‍රියා පිළිවෙත සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කර පැහැදිලිව අවබෝධ කර ගත යුතුය.	අනුකූලවී ඇත. බලය පැවරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ කටයුතු හා වගකීම් පැවරීමේ ක්‍රමවේදය කලින් කලට සමාලෝචනය කරනු ලබයි. කිසිදු බාධාවකින් තොරව කාර්යක්ෂමව සිය කාර්යයන් ඉටු කිරීමේ අවස්ථාව අධ්‍යක්ෂ මණ්ඩලයට ලබාදෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පැවරීමේ පටිපාටිය සමාලෝචනය හා අනුමත කරන අතර බලතල පැවරීම බැංකුවේ අවශ්‍යතා ආමන්ත්‍රණය කරන බවට සහතික වේ.
3 (4) (ii)	සමස්තයක් ලෙස අධ්‍යක්‍ෂ මණ්ඩලය සතු කාර්යභාරය ඉටු කිරීමේ හැකියාව අවම කිරීමට හෝ ඊට සැළකිය යුතු ආකාරයෙන් බාධාවක් වන මට්ටමකට අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සිය කටයුතු අධ්‍යක්‍ෂ මණ්ඩල කමිටුවකට, ප්‍රධාන විධායක නිළධාරියාට හෝ ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ පිරිස් වලට පැවරීම නොකළ යුතුය.	
3 (4) (iii)	බැංකුවේ අවශ්‍යතාවලට අදාළ වන ලෙස බලතල පැවරීමේ කාර්ය පටිපාටිය පවතින බවට සහතික කරගැනීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වරින්වර එය සමාලෝචනය කරනු ලබයි.	
3 (5)	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී**	
3 (5) (i)	සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන භූමිකා වෙනම පැවතිය යුතු අතර, එකම පුද්ගලයෙකු විසින් ඉටු නොකළ යුතුය.	අනුකූලවී ඇත. සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරීගේ භූමිකා අතර පැහැදිලි කාර්යභාර වෙන්කිරීමක් ඇත. සභාපතිවරයාගේ සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ වගකීම් විග්‍රහ කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියක් ක්‍රියාත්මකය.
3 (5) (ii)	සභාපති, විධායක නොවන අධ්‍යක්‍ෂවරයෙකු විය යුතු අතර ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙකු වන්නේ නම් වඩාත් සුදුසුය. සභාපතිවරයා, ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙකු නොවන අවස්ථාවකදී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සුදුසු පරිදි සීමා නිර්ණ ලේඛනගත කිරීමෙන් අනතුරුව ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්‍ෂවරයෙක් ලෙස පත් කළ යුතුය. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්‍ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවේ අනාවරණය කළ යුතු වේ.	අනුකූලවී ඇත. බැංකුවේ සභාපතිවරයා විධායක නොවන සහ ස්වාධීන නොවන අධ්‍යක්‍ෂවරයෙකි. ඊට අදාළ නියාමනය සමග අනුකූල වීම සඳහා එරංග ජයවර්ධන මහතා ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කර ඇත.

		2020 දී අනුකූලතා මට්ටම
3 (5) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි ආයතනික පාලන වාර්තාවෙහි, සභාපතිගේ හා ප්‍රධාන විධායක නිළධාරියාගේ අනන්‍යතාවයද, ඔවුන් අතර පැවතිය හැකි යම් සම්බන්ධතාවයක ස්වභාවයද හෙළිදරව් කළයුතුය.	අනුකූලවී ඇත. සභාපතිවරයාගේ හා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ අනන්‍යතාවය පිළිබඳ තොරතුරු වාර්ෂික වාර්තාවේ පිටු අංක 55 සහ 56 හි සඳහන් කර ඇත. සභාපතිවරයා සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී අතර කිසිදු භෞතික, මූල්‍ය, ව්‍යාපාරික හෝ පවුල් සබඳතාවයක් නොමැති බවට අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ව සිටී. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් අතරද එවැනි සබඳතා නොමැත.
3 (5) (iv)	සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීම; අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි වගකීම් ඉටු කරන බව හා කාර්යක්ෂමව කටයුතු කරන බව සහතික කිරීම; හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියළු ප්‍රධාන හා අවශ්‍ය කරුණු කාලෝචිතව සාකච්ඡාවට බඳුන් කරන බවට වගබලා ගත යුතුය.	අනුකූලවී ඇත. සභාපතිතුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි වගකීම් කාර්යක්ෂමව ඉටු කරන බවට වගබලා ගනියි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියළුම ප්‍රධාන කරුණු කාලීන අයුරින් සාකච්ඡාවට ගැනෙයි.
3 (5) (v)	සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහාම න්‍යාය පත්‍රය සැකසීමේ හා අනුමත කිරීමේ මූලික වගකීම සභාපති සතුය.	අනුකූලවී ඇත. සභාපතිවරයාගේ උපදෙස් අනුව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් රැස්වීම් න්‍යාය පත්‍රය සකස් කරනු ලබයි.
3 (5) (vi)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සාකච්ඡාවට ගැනෙන කරුණු සම්බන්ධයෙන් සියළු අධ්‍යක්ෂවරුන් නිසි ලෙස දැනුවත් කර ඇති බවට මෙන්ම අධ්‍යක්ෂවරුන් වෙත කලට වේලාවට ප්‍රමාණවත් තොරතුරු සැපයෙන බවටද සභාපති විසින් වග බලා ගත යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සාකච්ඡාවට ගැනෙන කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් පරිදි දැනුවත් කර ඇති බවට සභාපති සහතික වේ. ඒ බව සහතික කිරීමෙහිලා පහත දැක්වෙන ක්‍රමවේදය භාවිතයට ගැනේ. • සමාලෝචනය කිරීම, වැඩිමනත් තොරතුරු ලබාගැනීම සහ පැහැදිලි කරගැනීම සඳහා සහ රැස්වීමෙන් අනතුරුව රැස්වීමේදී සාකච්ඡා කළ කරුණු පිළිබඳව පසු විපරම් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට දින හතකට පෙර කලින් රැස්වීමේ වාර්තා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා බෙදා හැරීම. • අවශ්‍යවූ විටෙක ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් පැහැදිලි කරගැනීම් ලබාගැනීම.
3 (5) (vii)	සභාපති අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා පූර්ණ හා සක්‍රිය දායකත්වයක් ලබාදීමට සියළුම අධ්‍යක්ෂවරුන් දිරිමත් කිරීම සහ බැංකුවේ උපරිම යහපත පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරන බවට වගබලා ගැනීම සඳහා ප්‍රමුඛත්වය ගැනීම සභාපති විසින් කළ යුතුය.	අනුකූලවී ඇත.
3 (5) (viii)	විශේෂයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙතින් කාර්යක්ෂම දායකත්වයක් ලබා ගැනීම උදෙසා සභාපති විසින් පහසුකම් සැලසිය යුතු අතර, විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර සඵලදායි සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට වගබලා ගත යුතුය.	අනුකූලවී ඇත. සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයම විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.
3 (5) (ix)	සභාපතිවරයා ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් සම්බන්ධව හෝ කිසිදු ආකාරයකින් අනෙකුත් විධායක රාජකාරී කටයුතු සෘජු අධීක්ෂණයට ලක්කිරීමෙහි නොයෙදිය යුතුය.	අනුකූලවී ඇත සභාපතිවරිය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරියක් වන අතර ඇය ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අධීක්ෂණය කිරීම හෝ වෙනත් කිසිදු ආකාරයක විධායක කාර්යයන්හි නියුක්ත නොවේ.

		2020 දී අනුකූලතා මට්ටම
3 (5) (x)	කොටස්හිමිකරුවන් සමග සඵලදායි සන්නිවේදනයක් පවත්වා ගැනීමට යෝග්‍ය පියවර ගන්නා බවට හා කොටස් හිමිකරුවන්ගේ මත/අදහස් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සන්නිවේදනය කෙරෙන බවට සභාපති වග බලා ගත යුතුය.	අනුකූලවී ඇත. බැංකුව සිය කොටස් හිමිකරු වන ශ්‍රී ලංකා රජය සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යයි. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂ මණ්ඩලය කොටස් හිමිකරු අතර සන්නිවේදන මාර්ගය ලෙස ක්‍රියා කරයි.
3 (5) (xi)	ප්‍රධාන විධායක නිලධාරියා, බැංකුවේ එදිනෙදා සිදුකෙරෙන මෙහෙයුම් හා ව්‍යාපාර කළමනාකරණයේ මුදුන් මට්ටමේ භාරකාරත්වය දරන විධායක ලෙස කටයුතු කරයි.	අනුකූලවී ඇත. බැංකුවේ එදිනෙදා කටයුතු සාමාන්‍යාධිකාරී/විධායක නිලධාරී වෙත පවරා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි සාමාන්‍යාධිකාරී/විධායක නිලධාරියාට පැවරෙන එවැනි බලතල පිළිබඳව විශේෂයෙන් කරුණු ඉදිරිපත් කර ඇත.
3 (6)	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ කමිටු**	
3 (6) (i)	මෙම නියමන්හි 3 (6) (ii), 3 (6) (iii) 3 (6) (iv) සහ 3 (6) (v) යන නියමයන් මගින් දක්වා ඇති පරිදි සෑම බැංකුවක්ම අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු හතරක් පිහිටු විය යුතුය. සියළුම අනු කමිටු සඳහා ලේකම්වරයෙකු පත් කළ යුතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය වාර්ෂික මහා සභා රැස්වීමේදී එක් එක් අනු කමිටුවේ කාර්යසාධනය, වගකීම් සහ කාර්යභාරය පිළිබඳව වාර්තාවක් සැපයිය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටු හතක් ස්ථාපනය කරන ලද අතර ඉන් කමිටු හයක් ලිඛිත යොමු කිරීමේ අනුදේශ සමග ස්ථාපිත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අලෙවිකරණ උපාය මාර්ගික කමිටුවේ යොමු කිරීමේ අනුදේශ සකස් කිරීම සිදුවේ. මෙම කමිටු හතෙන් සතරක් (අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුව) 2017 අංක 12 දරණ බැංකු පනත් නියාමනය ප්‍රකාරව අනිවාර්යය වන අතර අනෙකුත් කමිටු සතර ස්ථාපිත කර ඇත්තේ බැංකුවේ ව්‍යාපාරික අවශ්‍යතා සපුරාගැනීම සඳහාය. සියළුම කමිටු අදාළ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සභාපතිවරුන් හරහා සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. කෙසේවුවත්, 2021 පෙබරවාරි 08 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් අනුව අත්‍යවශ්‍ය නොවන කමිටු අහෝසි කෙරිණ. අධ්‍යක්ෂ මණ්ඩල අලෙවිකරණ උපායමාර්ගික කමිටුවේ හැර අනෙකුත් කමිටු සයෙහිම ලේකම් ලෙස කටයුතු කරන්නේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වන අතර ඇය අදාළ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සභාපතිගේ අධීක්ෂණය යටතේ රැස්වීම් සංවිධානය කිරීම සහ රැස්වීම් වාර්තා තබාගැනීම ආදිය සිදු කරයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි, පරිපාලන සහ අයකරගැනීම්) අධ්‍යක්ෂ මණ්ඩල අලෙවිකරණ උපායමාර්ගික කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරන අතර ඔහු රැස්වීම් සංවිධානය කිරීම සහ රැස්වීම් වාර්තා තබාගැනීම සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වල වාර්තා පිටු අංක 78 සිට 91 දක්වා ඇති පිටුවල ඇතුළත් වේ. බැංකුවේ එකම කොටස් හිමිකරු රජය වන හෙයින් බැංකුවේ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සහ බැංකුව භාරව තිබෙන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කෙරේ.
3 (6) (ii)	විගණන කමිටුව සම්බන්ධයෙන් පහත සඳහන් නීති අදාළ වේ.	
3 (6) (ii) (අ)	කමිටුවේ සභාපතිවරයා ගණකාධිකරණයේ සහ/හෝ විගණනයෙහි සුදුසුකම් හා අත්දැකීම් සහිත ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති, විධායක නොවන සහ ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති අවශ්‍ය සුදුසුකම් හා අත්දැකීම් ඇති අයෙකි. කමිටුවේ සභාපතිවරයා පිළිබඳ තොරතුරු 42 පිටුවේ දැක්වේ.

		2020 දී අනුකූලතා මට්ටම
3 (6) (ii) (ආ)	කමිටුවේ සියළුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතුය.	අනුකූලවී ඇත. බැංකුවේ සියළු අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. එහෙයින්, කමිටුවේ සියළුම සාමාජිකයෝ විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති.
3 (6) (ii) (ඇ)	පහත කරුණු සම්බන්ධයෙන් කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය. (i) අදාළ නීතිවලට අනුකූල වෙමින් විගණන සේවා සඳහා බාහිර විගණකවරයෙකු පත් කිරීම; (ii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින්වර විගණකවරුන් හට නිකුත් කරන ලද උපදෙස් ක්‍රියාත්මක කිරීම; (iii) අදාල ගිණුම්කරණ ප්‍රමිති භාවිතයට ගැනීම සහ; (iv) විගණන කොටස්කරුවන් සමග බැඳීම වසර 5 නොඉක්මවයි නම් සහ පූර්ව කාලසීමාව සම්පූර්ණ කළ දින පටන් වසර 3 ක් ඉකුත්වීමට ප්‍රථම අදාළ විගණන කොටස්කරුවන් හා යළි විගණන බැඳීමකට ඇතුළු නොවන්නේ නම් සේවා කාලය, විගණන ගාස්තු හා විගණකවරයාගේ ඉල්ලා අස්වීම හෝ සේවයෙන් පහකිරීම.	අදාළ ප්‍රඥප්ති වලට අනුව විගණකාධිපති බැංකුවේ බාහිර විගණකවරයා වශයෙන් කටයුතු කරයි. එබැවින්, බාහිර විගණකවරයා සම්බන්ධයෙන් කමිටුවට වගකීමක් නොපැවරේ. අනුදේශය අනුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කරයි. • ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින්වර විගණකවරුන් හට නිකුත් කරන ලද උපදෙස් ක්‍රියාත්මක කිරීම. • අදාල ගිණුම්කරණ ප්‍රමිති භාවිතයට ගැනීම.
3 (6) (ii) (ඈ)	අදාළ වන ප්‍රමිති සහ යහපරිච අනුව විගණන ක්‍රියාවලින්හිදී බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, විෂයය මූලිකත්වය සහ කාර්යක්ෂමතාවය කමිටුව විසින් සමාලෝචනය හා නිරීක්ෂණය කළ යුතුය.	අනුකූලවී ඇත. විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා ලෙස කටයුතු කරන බැවින් ස්වාධීනත්වය සහ විෂයය මූලිකත්වය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කොට පවත්වාගැනීම සිදු වෙයි. විගණන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම්වලදී රජයේ විගණන අධිකාරී සමග සාකච්ඡා කරනු ලැබේ.
3 (6) (ii) (ඉ)	විගණන නොවන සේවා ලබාදීම සඳහා බාහිර විගණකවරයෙකු යොදා ගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් කමිටුව විසින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.	අදාළ නොවේ. විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා ලෙස කටයුතු කරයි. කෙසේවුවත්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රඥප්තිය ප්‍රකාරව, තමාට සහයවීම සඳහා විගණකාධිපතිවරයා තවත් බාහිර විගණකවරයෙකු පත් කරන්නේ නම් එමගින් විගණන සේවා සපයන ආයතනයේ ස්වාධීනත්වය, විෂයය මූලිකත්වය සහ කාර්යක්ෂමතාවය කෙරෙහි බලපෑමක් ඇති නොකරන බවට කමිටුව තහවුරු කරයි. 2020 වර්ෂයේ විගණනය සඳහා අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගම (Messrs Ernst and Young) තෝරාපත් කරගන්නා ලදී.
3 (6) (ii) (ඊ)	කමිටුව විසින් විගණනය ඇරඹීමට ප්‍රථම විගණනයේ ස්වභාවය හා විෂයය පථය පිළිබඳ බාහිර විගණකවරුන් සමග සාකච්ඡා කර අවසන් නිගමනයකට පැමිණිය යුතුය.	අදාළ නොවේ. විගණනයේ විෂයය පථය හා සීමාව බාහිර විගණකවරයා ලෙස කටයුතු කරන විගණකාධිපති විසින් නිර්ණය කරනු ලබයි.

ආයතනික පාලනය

		2020 දී අනුකූලතා මට්ටම
3 (6) (ii) (උ)	බැංකුවේ මූල්‍ය ප්‍රකාශවල, වාර්ෂික වාර්තාවේ ගිණුම්වල හා හෙළිදරව් කිරීම පිණිස සකසා ඇති ත්‍රෛමාසික වාර්තාවන්හි විශ්වසනීය බව හා ඒවායෙහි අන්තර්ගතය, සැලකිය යුතු මූල්‍ය වාර්තාකරණ තීරණ අධීක්ෂණය කරනු පිණිස කමිටුව විසින් බැංකුවේ මූල්‍ය තොරතුරු සාමාලෝචනය කරනු ලැබිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම බැංකුවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් හා ත්‍රෛමාසික වාර්තා සමාලෝචනය කිරීමේදී කමිටුව පහත කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය. (i) ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍ර; (ii) ගිණුම්කරණ ප්‍රතිපත්ති හා යහපරිච වල කිසියම් වෙනස්වීමක්; (iii) විගණනයෙන් පැන නගින සැලකිය යුතු ගැළපීම්; (iv) ව්‍යාපාර අඛණ්ඩතා උපකල්පනය සහ (v) අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් නීතිමය අවශ්‍යතා වලට අනුකූලවීම.	අනුකූලවී ඇත. හෙළිදරව් කිරීම සඳහා පිළියෙල කරන ලද කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තාව ප්‍රකාශනය සඳහා සූදානම් අවස්ථාවේදී සමාලෝචනය කරන ලදී. මෙම සෑම අවස්ථාවකදීම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ අවධානය පිණිස අභ්‍යන්තර විගණන අංශය විසින් ලබාදෙන සමාලෝචන වාර්තාවෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි වෙනස්කම්, ප්‍රධාන තීරණාත්මක ක්ෂේත්‍රයන්හි වෙනස් වීම් ආදිය පිළිබඳ වෙනම සමාලෝචන වාර්තාවක් අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කෙරේ. ඉහත කරුණ මත පදනම්ව, අවශ්‍යතාවය අනුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි.
3 (6) (ii) (ඌ)	අවසන් හා අතුරු විගණනවලින් පැන නගින කරුණු, ගැටළු හා සීමා සහ එම කරුණු ඇතුළුව විගණකවරයා විසින් සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන කරුණක් කමිටුව විසින් සාකච්ඡා කළ යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අවසන් හා අතුරු විගණනවලින් පැන නගින කරුණු, ගැටළු හා සීමා සාකච්ඡා කරනු ලබයි. විගණකාධිපතිවරයාගේ නියෝජිතයෝ වසර පුරාම කමිටු රැස්වීම් සඳහා සහභාගී වූහ.
3 (6) (ii) (එ)	කමිටුව විසින් බාහිර විගණකවරයාගේ කළමණාකරණ ලිපිය හා ඊට කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය සමාලෝචනයට ලක් කළ යුතුය.	අනුකූලවී ඇත. මුදල් පනතේ 14 (2) (ඇ) සහ 13 (7) (අ) යන වගන්ති යටතේ ඉදිරිපත් කරන ලද බාහිර විගණකවරයාගේ වාර්තාව සහ ඊට අදාළව කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.
3 (6) (ii) (ඒ)	බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යභාරය සම්බන්ධයෙන් කමිටුව විසින් පහත සඳහන් පියවර ගත යුතුය.	
	(i) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සම්පත්, කාර්ය භාරය හා විෂයය පථය ආදියෙහි ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම සහ එහි කටයුතු කරගෙන යාමට අවශ්‍ය අධිකාරී බලය දෙපාර්තමේන්තුව සතුව පවතින බවට තෘප්තිමත් වීම.	අනුකූලවී ඇත. අභ්‍යන්තර විගණන අංශය විසින් සකස් කරන ලද වාර්ෂික විගණන සැලැස්ම අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලැබී ඇත. සැලැස්මට අදාළ විෂයය පථය, කාර්යයන් සහ සම්පත් අවශ්‍යතා එහි ඇතුළත් වේ.
	(ii) අභ්‍යන්තර විගණන වැඩසටහන් සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අවශ්‍ය විටෙක අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත යෝග්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව සහතික කිරීම.	අනුකූලවී ඇත. අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන ක්‍රමවේදයන්හි ප්‍රතිඵල සමාලෝචනය කරනු ලබන අතර වැඩි දියුණු කිරීම් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති බවට සහතික වේ.
	(iii) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ හා ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ යම් කාර්යසාධන ඇගයීමක් සමාලෝචනය කිරීම.	අනුකූලවී ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යසාධනය ඇගයීම සහ අභ්‍යන්තර විගණන කාර්යයේ ක්‍රියාවලිය හා ප්‍රතිඵල ඇගයීම සාමාන්‍යයෙන් සිදු කරනු ලබන්නේ විගණන කමිටුව විසිනි. ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීම සිදු කෙරෙන්නේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් සකස් කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ඇගයීමේ ක්‍රමවේදයට අනුකූලවය. 2020 වර්ෂයට අදාළ ඇගයීම් සිදුකර තිබේ.

		2020 දී අනුකූලතා මට්ටම
	(iv) අභ්‍යන්තර විගණන කාර්යභාරය සඳහා පත්කළ ප්‍රධානියාගේ, ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ පත්වීමක් හෝ සේවය අවසන් කිරීමක් නිර්දේශ කිරීම හා කුලී පදනම මත සේවය සපයන ආයතන පත් කිරීම/ ඉවත් කිරීම නිර්දේශ කිරීම.	අනුකූලවී ඇත. වසර තුළදී එවැනි සිදුවීමක් පැන නැගුනේ නැත
	(v) අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සහ වෙනත් සමාගම් හරහා සේවා සපයන්නන් ද ඇතුළුව ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුව දැනුවත් කෙරෙන බවට වග බලා ගැනීම සහ එලෙස ඉල්ලා අස්වූ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්හට සහ බාහිර සමාගම් හරහා සේවා සපයනු ලබන සේවකයින්හට ඔවුන්ගේ ඉල්ලා අස්වීම් සම්බන්ධ හේතු සැපයීමට අවස්ථාව සැපයීම.	අනුකූලවී ඇත. වසර තුළදී එවැනි සිදුවීමක් පැන නැගුනේ නැත.
	(vi) අභ්‍යන්තර විගණන කාර්යයන් ස්වාධීනව සිදුකරනු ලබන බවට සහතිකවීම වස් එහි කටයුතු අපක්ෂපාතීව, ප්‍රවීනත්වයකින් හා නිසි වෘත්තීමය සැලකිල්ලකින් යුතුව සිදුකිරීම.	අනුකූලවී ඇත. බැංකුවේ පාලන ව්‍යුහය අනුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඍජුව වාර්තා කරන අතර බැංකුවේ වෙනත් මෙහෙයුම් වලින් ස්වාධීන වේ.
3 (6) (ii) (ඔ)	සිදුකරන අභ්‍යන්තර විමර්ශනවල මූලික හෙළිදරව් කිරීම් සහ ඊට කළමණාකාරිත්වයේ ප්‍රතිචාර කමිටුව විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතුය.	අනුකූලවී ඇත. කමිටුව විසින් අභ්‍යන්තර විමර්ශනවලදී සිදු කරන ලද මූලික හෙළිදරව් කිරීම් සහ ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කර ඇත. එවැනි පරීක්ෂණ වල නිර්දේශ ක්‍රියාත්මකවූ බවද සහතික කෙරේ.
3 (6) (ii) (ඕ)	ප්‍රධාන මූල්‍ය නිලධාරියා, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා සහ බාහිර විගණකවරුන්ගේ නියෝජිතයෙක් සාමාන්‍යයෙන් රැස්වීම් වලට සහභාගී වෙති. විධායක අධ්‍යක්ෂවරුන් නොමැතිව කමිටුව විසින් බාහිර විගණකවරුන් සමග අවම වශයෙන් රැස්වීම් 2 ක් පවත්වා ඇත.	අනුකූලවී ඇත. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන) සාමාන්‍යයෙන් රැස්වීම් සඳහා සහභාගී වෙති. 2020 වර්ෂයේදී රැස්වීම් 6 ක් පවත්වා ඇති අතර, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සමග විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු රැස්වීම් සයටම සහභාගිවී ඇත.
3 (6) (ii) (ක)	කමිටුවලට, (i) කමිටුවේ විෂයය ක්ෂේත්‍රයට අයත් ඕනෑම කරුණක් පිළිබඳව විමර්ශනය කිරීමේ පැහැදිලි බලයක් ; (ii) ඒ සඳහා අවශ්‍ය සම්පත් ; (iii) තොරතුරු ලබාගැනීමේ පූර්ණ හැකියාව; සහ (iv) අවශ්‍ය විටෙක අදාළ අත්දැකීම් සහිත බාහිර පාර්ශ්වයන්ට ආරාධනා කිරීමේ හා බාහිර පාර්ශ්වයන් වෙතින් වෘත්තීමය උපදෙස් ලබා ගැනීමේ අධිකාරිය තිබිය යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය අනුව කමිටුවට පහත බලතල ඇත. • සිය යොමු කිරීමේ අනුදේශයට අනුකූලව ඕනෑම කරුණක් විමර්ශනය කිරීමේ පැහැදිලි බලය • එසේ කිරීමට අවශ්‍ය සම්පත් • තොරතුරු ලබාගැනීමේ පූර්ණ හැකියාව • බාහිර වෘත්තිය උපදෙස් ලබාගැනීමේ සහ අවශ්‍ය වෙතොත් සහභාගී වීම සඳහා අදාළ සුදුසුකම් සහිත පුද්ගලයන්ට ආරාධනා කිරීමේ බලය පිටු අංක 78 සිට 79 දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව බලන්න.

ආයතනික පාලනය

		2020 දී අනුකූලතා මට්ටම
3 (6) (ii) (ග)	සාකච්ඡා කළ යුතු කරුණු සම්බන්ධයෙන් නිසි දැනුම්දීමකින් පසුව නිරතුරුව කමිටුව රැස්ව, එහි වගකීම් හා රාජකාරී ඉටු කිරීම සම්බන්ධ නිගමන වාර්තාකර තබා ගත යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව නිතිපතා රැස්වීම් සැලසුම් කර ඇත. අවශ්‍යවූ විට අමතර රැස්වීම් සංවිධානය කෙරේ. වර්ෂය තුල කමිටුව සය වතාවක් රැස් වී තිබේ. සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සාමාජිකයන්ට නිසිලෙස පෙර දැනුම්දීමක් සිදුකරනු ලබන අතර එහි රාජකාරී හා වගකීම් ඉටු කිරීමට අදාළ නිගමන අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ලේකම්/ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා වල සටහන් කෙරේ.
3 (6) (ii) (ච)	අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පහත කරුණු විස්තරාත්මකව හෙළිදරව් කළ යුතුය. (i) විගණන කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු; (ii) වර්ෂය තුළ පවත්වන ලද විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව; සහ (iii) එම රැස්වීම් සඳහා එක් එක් අධ්‍යක්‍ෂවරයාගේ සහභාගීත්වය පිළිබඳ විස්තර	අනුකූලවී ඇත. පිටු අංක 78 සිට 79 දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ පහත කරුණු අඩංගු වේ. • විගණන කමිටු ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර • 2020 වසර තුල පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් ගණන • එම රැස්වීම් වලට අදාළ එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගීත්වය පිළිබඳ තොරතුරු
3 (6) (ii) (ඡ)	කමිටුවේ ලේකම්, සමාගමේ ලේකම් හෝ අභ්‍යන්තර විගණන කාර්යයෙහි ප්‍රධානියා වන අතර, කමිටු රැස්වීම් පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම කළ යුතුය.	අනුකූලවී ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම් කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරන අතර විස්තරාත්මක කමිටු වාර්තා පවත්වාගෙන යාම සිදු කෙරේ.
3 (6) (ii) (ට)	මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය හෝ වෙනත් කටයුතුවලදී සිදුවිය හැකි විෂමාචාර සම්බන්ධයෙන් සේවකයින්ට සිය රහස්‍යභාවය රැකගනිමින් කරුණු දැක්විය හැකි ආකාරය පිළිබඳ කමිටුව විසින් සමාලෝචනය කළ යුතුය. ඒ අනුව, එවන් කරුණු සම්බන්ධයෙන් ස්වාධීන හා සාධාරණ විමර්ශන පැවැත්වීම සඳහා සුදුසු පියවර ගන්නා බවටත්, බාහිර විගණකවරුන් සමග බැංකුව පවත්වන සබඳතා අධීක්‍ෂණය සඳහා වන ප්‍රධාන නියෝජිත අධිකාරිය ලෙස ක්‍රියා කිරීමටත් කමිටුව වග බලා ගත යුතුය.	අනුකූලවී ඇත. මෙම සියළු අංශ ආවරණය කරන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත වංචා අවදානම් කළමනාකරණ සහ පෙර දැනුම්දීමේ (විස්ටිල් බ්ලෝවර්) ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇත. සුදුසු පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා වැදගත් අනාවරණ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත වාර්තා කර ඇත. සාධාරණ හා ස්වාධීන විමර්ශනයක් පැවැත්වීම හා බැංකුවේ සේවකයන් ඉදිරිපත් කරන ලද කරුණු මත පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා ක්‍රියාවලියක් හා නිසි යාන්ත්‍රණයක් ක්‍රියාත්මකය. බාහිර විගණක නිලධාරියා සමග බැංකුවේ පවතින සබඳතා අධීක්ෂණය කිරීමේ ප්‍රධාන නියෝජිත ආයතනය වශයෙන් ක්‍රියා කරන්නේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවයි.
3 (6) (iii)	මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සම්බන්ධයෙන් පහත නීති අදාළ වේ.	
3 (6) (iii) (අ)	බැංකුවේ අධ්‍යක්‍ෂවරුන්ට, සමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කළමණාකාරිත්වයට අදාළ පිරිස් වලට අදාළ පාරිශ්‍රමික පිළිබඳ ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා හා වෙනත් මූල්‍ය ගෙවීම්) තීරණය කිරීම.	අධ්‍යක්ෂවරුන්ගේ වේතනය තීරණය කරනු ලබන්නේ මුදල් අමාත්‍යාංශය විසිනි. 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 10 වන වගන්තිය හා එහි සංශෝධන අනුව අධ්‍යක්ෂවරුන්ගේ වේතනය විෂයයභාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබයි. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් වල වේතන සාමූහික එකඟතා ගිවිසුම සහ බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතිය මත අධ්‍යක්‍ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව විසින් තීරණය කරනු ලබයි.

		2020 දී අනුකූලතා මට්ටම
3 (6) (iii) (ආ)	කමිටුව විසින් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියා හා ප්‍රධාන කළමණාකාරීත්වයට අදාළ පිරිස් සඳහා අරමුණු හා ඉලක්ක ලබාදිය යුතුය.	අනුකූලවී ඇත. 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 වන වගන්තිය හා එහි සංශෝධන අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සත්දෙනෙක වන අතර ඉන් පස්දෙනෙක් පත් කරන්නේ විෂයයභාර අමාත්‍යවරයා විසිනි. අනෙක් දෙදෙනා නිල බලයෙන් පත් වන අධ්‍යක්ෂවරු වෙති. එබැවින්, නිශ්චිත අරමුණු හා ඉලක්ක ඔවුන් වෙත පවරා නැත. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා වූ ඉලක්ක හා අරමුණු සකස් කරන්නේ උපාය මාර්ගික ව්‍යාපාර සැලසුම පදනම් කරගෙන වන අතර ඒ පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීමක් බැංකුවේ ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා ඇත. ඒවා ප්‍රධාන කාර්යසාධන දර්ශක හා සම්බන්ධ වේ.
3 (6) (iii) (ඇ)	කමිටුව විසින්, දෙන ලද ඉලක්ක වලට අනුව ප්‍රධාන විධායක නිලධාරීගේ හා ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් වල කාර්යසාධනය කලින් කලට ඇගයීම සිදු කළ යුතු අතර වේතන, ප්‍රතිලාභ හා කාර්යසාධනය මත ලබාදෙන වෙනත් දිරිදීමනා සංශෝධනය කිරීමේදී මූලික කරගත යුතු පදනම තීරණය කළ යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, දෙන ලද ඉලක්ක වලට අනුව ප්‍රධාන විධායක නිලධාරීගේ හා ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් වල කාර්යසාධනය ඇගයීම සඳහා වන නිර්නායක කමිටුව වෙත ලබාදෙන ලදී.
3 (6) (iii) (ඈ)	ප්‍රධාන විධායක නිලධාරි හා සම්බන්ධ කරුණු සාකච්ඡා කරනු ලබන රැස්වීම් හැරුණුවිට අනෙකුත් සෑම කමිටු රැස්වීමකටම ප්‍රධාන විධායක නිලධාරියා සහභාගී විය යුතුය.	අනුකූලවී ඇත. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරි හා සම්බන්ධ කරුණු සාකච්ඡා කරනු ලබන රැස්වීම් හැරුණුවිට අනෙකුත් සෑම කමිටු රැස්වීමකටම සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරියා සහභාගී වී තිබේ.
3 (6) (iv)	නාමයෝජනා කමිටුව සම්බන්ධයෙන් පහත නීති අදාළ වේ.	
3 (6) (iv) (අ)	කමිටුව විසින් නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියෙකු සහ ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් තෝරා ගැනීම/පත් කිරීම සඳහා කාර්ය පටිපාටියක් ක්‍රියාත්මක කළයුතුය.	ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගෙන් සත්දෙනෙක් පත් කරන්නේ විෂයයභාර අමාත්‍යවරයා විසින් වන අතර අනෙක් දෙදෙනා නිල බලයෙන් පත් වන අධ්‍යක්ෂවරු වෙති. 11 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ එක් අධ්‍යක්‍ෂවරයෙකු එහි සභාපති වශයෙන් පත් කළ යුතු වේ. 26 වන වගන්තිය ප්‍රකාරව අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සුදුසු හා යෝග්‍ය පුද්ගලයෙකු බැංකුවේ සාමාන්‍යාධිකාරී ලෙස පත් කළ යුතු අතර එම තැනැත්තා බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරීද වේ. අධ්‍යක්‍ෂ මණ්ඩල නාමයෝජනා කිරීමේ කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් පත් කරනු ලැබේ.
3 (6) (iv) (ආ)	වත්මන් අධ්‍යක්ෂවරුන් යළි තෝරා පත් කිරීම, කමිටුව විසින් සලකා බලා නිර්දේශ කිරීම (හෝ නොකිරීම) සිදු කරනු ලබයි.	අදාළ නොවේ. ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගෙන් පස්දෙනෙක් පත් කරන්නේ විෂයයභාර අමාත්‍යවරයා විසින් වන අතර අනෙක් දෙදෙනා නිල බලයෙන් පත් වන අධ්‍යක්ෂවරු වෙති.

ආයතනික පාලනය

		2020 දී අනුකූලතා මට්ටම
3 (6) (iv) (ඇ)	ප්‍රධාන විධායක නිලධාරී තනතුරට සහ ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ තනතුරු සඳහා තෝරා පත් කිරීමේ හෝ උසස්කිරීමේ සුදුසුකම් සලකා බැලීමේ නිර්නායක, කමිටුව විසින් සකස් කළ යුතුය.	අනුකූලවී ඇත. 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට හා එහි සංශෝධන වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පිළිගත් ක්‍රමවේදයක් මත පදනම්ව සාමාන්‍යාධිකාරී/විධායක නිලධාරී පත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උසස්වීම් ක්‍රමයක් බැංකුව තුල ක්‍රියාත්මක කර තිබෙන අතර ප්‍රධාන කළමනාකරණ තනතුරු වලට පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා එහි සඳහන් කර ඇත.
3 (6) (iv) (ඈ)	3 (3) නියාමනයෙහි අන්තර්ගත නිර්නායක මගින් නිශ්චිත ලෙස දක්වා ඇති පරිදි, අධ්‍යක්‍ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ තනතුරු හොබවන පිරිස ඊට සුදුසු හා යෝග්‍ය බවට කමිටුව විසින් සහතික විය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්‍ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරීගේ අත්සන් සහිත දිව්රුම් ප්‍රකාශ සහ සහතික කිරීමේ ප්‍රකාශ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ලේකම් විසින් භාරගනු ලබන අතර ප්‍රධාන කළමනාකාර පිරිසෙහි එම ප්‍රකාශ මානව සම්පත් සංවර්ධන අංශය විසින් ලබාගෙන යෝග්‍යතාව ඇගයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කෙරේ.
3 (6) (iv) (ඉ)	විශ්‍රාම යාමට නියමිත අධ්‍යක්‍ෂවරුන් /ප්‍රධාන කළමණාකාරිත්වයට අදාළ පිරිස් සඳහා අනුප්‍රාප්තික වැඩ පිළිවෙලක් සහ නව විශේෂඥතාවය/අතිරේක අවශ්‍යතා පිළිබඳව සලකා බලා කමිටුව විසින් වරින්වර නිර්දේශ ඉදිරිපත් කළයුතුය.	අනුකූලවී ඇත. සභාපති, අධ්‍යක්‍ෂවරුන් හා ප්‍රධාන විධායක නිලධාරියාගේ පත්වීම් සිදුකෙරෙන්නේ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතට හා එහි සංශෝධන වලට අනුවය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලැස්මක් ක්‍රියාත්මක කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ නිර්දේශය මත අනුප්‍රාප්තික වැඩපිළිවෙලට අනුව අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් පත් කරනු ලබයි.
3 (6) (iv) (ඊ)	ස්වාධීන අධ්‍යක්‍ෂවරයෙකු කමිටුවේ සභාපති ධූරය දැරිය යුතුය. ආරාධනය පිට ප්‍රධාන විධායක නිලධාරී හට රැස්වීම් වලට සහභාගි විය හැකිය.	කමිටුවේ සභාපතිත්වය දරන්නේ ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්‍ෂවරයෙකු විසිනි.
3 (6) (v)	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව:	
3 (6) (v) (අ)	ණය, වෙළඳපොළ ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම වැනි පුළුල් අවදානම් කාණ්ඩ අධීක්ෂණය කිරීම සඳහා අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් වලින් කමිටුව සමන්විත විය යුතුය. කමිටුව ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග සමීපව කටයුතු කළ යුතු අතර කමිටුව වෙත පවරා ඇති අධිකාරිය සහ වගකීම යන රාමුව තුල අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගත යුතුය.	අනුකූල වී ඇත. ණය, වෙළඳපොළ ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම වැනි පුළුල් අවදානම් කාණ්ඩ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක්, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන අවදානම් නිලධාරියාගෙන් කමිටුව සමන්විත වේ. ආරාධනය මත අනුකූලතා නිලධාරියා සියළුම රැස්වීම් වලට සහභාගී වේ. අවශ්‍යතාවය මත ඕනෑම ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකු හෝ සේවක මණ්ඩලයේ නිලධාරියෙකුට ආරාධනා කෙරේ. කමිටුව වෙත පවරා ඇති අධිකාරිය හා වගකීම් රාමුව තුල ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග කමිටුව සමීපව කටයුතු කරයි.
3 (6) (v) (ආ)	කමිටුව විසින්, බැංකුව මුහුණදෙන සියළු අවදානම්, එනම්, ණය, වෙළඳපොළ ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම, දර්ශක හා කළමනාකරණ තොරතුරු මත පදනම්ව මාසිකව ඇගයිය යුතුය. පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් වල අවදානම් කළමනාකරණය, බැංකු පදනම හා සමූහ පදනම යන දෙයාකාරයෙන්ම සිදු කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ණය අවදානම් කළමනාකරණය, වෙළඳපොළ හා ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය හා මෙහෙයුම් අවදානම් කළමනාකරණය හා සම්බන්ධ ප්‍රතිපත්ති අනුමත කරනු ලැබ ඇත. එය බැංකුවේ අවදානම් ඇගයීම හා කළමනාකරණ රාමුව සකස් කරනු ලබයි. කමිටුව විසින් සමාලෝචනය කරනු ලබන පූර්ව නිශ්චිත අවදානම් අභිරුචි මට්ටම මත පදනම්ව අවදානම් කළමනාකරණ අංශය විසින් බැංකු පදනමෙන් හා සමූහ පදනමෙන් අවදානම් දර්ශක පිළිබඳ මාසික වාර්තා ඉදිරිපත් කරනු ලබන වාර්තා කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

		2020 දී අනුකූලතා මට්ටම
3 (6) (v) (ඇ)	යම් නිශ්චිත අවදානම් ආමන්ත්‍රණය කිරීම සහ කමිටුව විසින් නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක සීමා යටතේ එම අවදානම් කළමනාකරණය කිරීම සඳහා ණය කමිටුව, වත්කම් හා වගකීම් කමිටුව ආදී සියළු කළමනාකරණ කමිටුවල ප්‍රමාණාත්මකභාවය හා ඵලදායීතාවය කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.	අනුකූල වී ඇත. කලින් කලට සමාලෝචනය කෙරෙන බැංකුවේ අවදානම් අභිරුචි මට්ටම යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා ඇතුළත යම් නිශ්චිත අවදානම් කළමනාකරණය කෙරෙන බව සහතික කරගැනීම සඳහා එම නිශ්චිත අවදානම් ආමන්ත්‍රණය කිරීමේ ප්‍රමාණාත්මකභාවය හා ඵලදායීතාවය තක්සේරු කිරීම සඳහා ණය කමිටුව, ආයෝජන කමිටුව සහ වත්කම් හා වගකීම් කමිටුව ආදී කළමනාකරණ මට්ටමේ කමිටු වල වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. සියළුම කළමනාකරණ මට්ටමේ කමිටු වල ප්‍රමාණාත්මකභාවය හා ඵලදායීතාවය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් වාර්ෂිකව සමාලෝචනය කරනු ලබයි.
3 (6) (v) (ඈ)	නිශ්චිත අවදානම් වලින් ඇතිවන ප්‍රතිඵල අවම කිරීම සඳහා කමිටුව විසින් කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබයි.	අනුකූල වී ඇත. කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලද දූරදර්ශී මට්ටම් ඉක්මවන ආකාරයේ අවදානම් පැන නගින අවස්ථාවලදී නියාමන හා ප්‍රතිපත්ති මට්ටමේ අවශ්‍යතා මත පදනම්ව එවැනි අවදානම් අවම කිරීම සඳහා කමිටුව විසින් ක්ෂණික නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබයි.
3 (6) (v) (ඉ)	යාවත්කාලීන කළ ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම්ද ඇතුළුව අවදානම් කළමනාකරණයේ සියළු අංශ ඇගයීම සඳහා කමිටුව අවම වශයෙන් ත්‍රෛමාසිකව රැස්විය යුතුය.	අනුකූලවී ඇත. අදාළ වර්ෂය තුල කමිටුව රැස්වීම් පහක් පවත්වා තිබේ. රැස්වීම් පිළිබඳ විස්තර හා පැමිණීම පිටු අංක 84 හි දක්වා ඇත.
3 (6) (v) (ඊ)	කමිටුව විසින් නිර්දේශ කර ඇති පරිදි සහ/හෝ බැංකු අධීක්ෂණ අංශයේ අධ්‍යක්‍ෂ විසින් නියම කර ඇති පරිදි නිශ්චිත අවදානම් හඳුනාගැනීමට හා ඒ සම්බන්ධයෙන් නිසි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වන නිළධාරීන්ට එරෙහිව කමිටුව විසින් යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	අනුකූලවී ඇත. එවැනි ගැටළු විසඳීම සඳහා බැංකුව විසින් විනය ක්‍රියාපටිපාටියක් ස්ථාපනය කර ඇත. වසර තුල එවන් අවශ්‍යතාවයක් පැන නොනැගුණි.
3 (6) (v) (උ)	කමිටුව විසින් සෑම රැස්වීමක්ම පවත්වා සතියක් ඇතුළත අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාවය සහ/හෝ උපදෙස් සඳහා අවදානම් ඇගයීම් වාර්තාවක් අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.	අනුකූලවී ඇත. කමිටුවේ නිර්දේශ සහ අවදානම් කළමනාකරණ වාර්තා සමග රැස්වීමට අදාළ සවිස්තරාත්මක වාර්තාව රැස්වීමෙන් පසුව ඊළඟට පැවැත්වෙන පළමු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කෙරේ.
3 (6) (v) (ඌ)	බැංකුවේ සියළු මෙහෙයුම් ක්ෂේත්‍ර ආශ්‍රිතව නීති, රෙගුලාසි, නියාමන උපදෙස්, අභ්‍යන්තර පාලන සහ අනුමත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් බැංකුවේ අනුකූලතාව ඇගයීම පිණිස කමිටුව විසින් අනුකූලතා ක්‍රියාවලියක් ස්ථාපිත කළ යුතුය. ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ පිරිස අතුරෙන් තෝරාගන්නා ලද කැපවීමෙන් කටයුතු කරන අනුකූලතා නිලධාරියෙකු විසින් අනුකූලතා ක්‍රියාවලිය ක්‍රියාවට නැංවිය යුතු අතර, ඒ පිළිබඳව වරින්වර කමිටුවට වාර්තා කළ යුතුය.	අනුකූලවී ඇත. බැංකුවේ සියළු මෙහෙයුම් ක්ෂේත්‍ර ආශ්‍රිතව නීති, රෙගුලාසි, නියාමන උපදෙස්, අභ්‍යන්තර පාලන සහ අනුමත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් බැංකුවේ අනුකූලතාව ඇගයීම පිණිස අනුකූලතා ක්‍රියාවලිය ස්ථාපිත කර තිබේ. මෙම කාර්යය පිළිබඳව ප්‍රධානත්වය දරනු ලබන්නේ අනුකූලතා නිලධාරියා විසිනි. අනුකූලතා නිලධාරියා විසින් කලින් කලට අධ්‍යක්‍ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව/අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව/අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කරනු ලබයි.

		2020 දී අනුකූලතා මට්ටම
3 (7)	**සම්බන්ධිත පාර්ශවවල ගනුදෙනු**	
3 (7) (i)	කිසියම් පුද්ගලයෙකු හා බැංකුව අතර කිසියම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් පැන නැගිය හැකි ඕනෑම ආකාරයේ අනිසි සට්ටනයක් වැළැක්වීමට අවශ්‍ය පියවර අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ගනු ලැබිය යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය අභිලාෂ ගැටීම වළක්වාලීම අරමුණු කරගෙන සම්බන්ධිත පාර්ශවයන්ට වඩා වාසිදායක ලෙස සැලකීම සීමා කිරීම සඳහා සම්බන්ධිත පාර්ශව, ඔවුන්ගේ ගණුදෙනු සහ ඒ ආශ්‍රිත සීමා ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශව වල ගණුදෙනු පිළිබඳ ප්‍රතිපත්තියක් බැංකුව තුල ක්‍රියාත්මක වේ. ඔවුන්ට ආදාළ සම්බන්ධිත පාර්ශව වල ගණුදෙනු තනි තනිව ප්‍රකාශ කරන ලෙස අධ්‍යක්ෂවරුන් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර තිබේ. ස්වයංක්‍රිය පද්ධතියක් ඔස්සේ මෙම ගණුදෙනු නිරීක්ෂණය කෙරේ.
3 (7) (ii)	සම්බන්ධිත පාර්ශව සමග සිදු කරන ගනුදෙනු වල ස්වභාවය මේ නියාමනය තුලින් ආවරණය විය යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශව සමග සිදු කරන ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්තිය මගින් පහත දැක්වෙන ගනුදෙනු ආවරණය වේ. • ප්‍රදානයේ උපරිම සීමාව පිළිබඳව මූල්‍ය මණ්ඩල නියාමනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ඕනෑම ආකාරයක ප්‍රදානයක් ලබාදීම. • තැන්පතු, ණය ගැනීම් හා ආයෝජන ලෙස බැංකුවේ ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම. • මූල්‍ය හෝ මූල්‍ය නොවන ඕනෑම සේවාවක් බැංකුවට සැපයීම හෝ බැංකුවෙන් ලබාගැනීම. • එවැනි සම්බන්ධිත පාර්ශව වලට එළදායී විය හැකි හිමිකාරීත්ව විභවතාවයකින් යුත්, රහස්‍ය නැතහොත් වෙනත් ආකාරයකින් සංවේදී තොරතුරු බෙදාගැනීමට මගපාදන, බැංකුව හා සම්බන්ධිත පාර්ශව අතර වාර්තාකරණ ක්‍රමවේදයක් සහ තොරතුරු ප්‍රවාහයක් පවත්වාගැනීම. සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම් යටතේ මේ පිළිබඳ තොරතුරු පිටු අංක 239 හි සටහන් අංක 49.5 හි දක්වා ඇත.
3 (7) (iii)	ඉහත 3 (7) (ස) නියමයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි ඒ හා සමාන ව්‍යාපාරික කටයුතු සිදු කරනු ලබන බැංකුවේ වෙනත් පාර්ශ්වයන්ට ලබා දෙන සැලකීමට වඩා වැඩි සැලකීමක් එවන් පාර්ශව වෙත පිරිනැමෙන ආකාරයෙන් ආශ්‍රිත පාර්ශව සමග ගනුදෙනුවල නියැලීමෙන් වළකින බවට අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගත යුතුය.	අනුකූලවී ඇත. බැංකුවේ ගනුදෙනුකරුවන්ට ලබා දෙන සැලකීමට වඩා වැඩි සැලකීමක් එවන් පාර්ශව වෙත පිරිනැමෙන ආකාරයේ ගනුදෙනු බැංකුවේ සම්බන්ධිත පාර්ශව වල ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්තිය මගින් තහනම් කර තිබේ. එවැනි ගනුදෙනු හඳුනාගැනීමට කටයුතු කරන බවට අධ්‍යක්‍ෂවරුන්ගෙන් වාර්ෂිකව ප්‍රකාශ ලබා ගැනේ. ඒ හා සමාන ව්‍යාපාරික කටයුතු සිදු කරනු ලබන බැංකුවේ වෙනත් පාර්ශවයන්ට වඩා වැඩි සැලකීමක් ලබාදෙන ගනුදෙනු ග්‍රහණය කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ඇති අතර අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත නිතිපතා ඒ පිළිබඳව වාර්තා කරනු ලබයි. සාමාන්‍ය ව්‍යාපාරික පිළිවෙලට අනුව අදාළ පාර්ශව සමග කරන ලද ගනුදෙනු (ඇතොත්) ඒ පිළිබඳ පිටු අංක 239 හි ඇතුලත් මූල්‍ය ප්‍රකාශනයේ සම්බන්ධිත පාර්ශ්වයන්ගේ හෙළිදරව් කිරීම් මැයෙන් සටහන් අංක 49.5 මගින් දක්වා ඇත.
3 (7) (iv)	අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමකදී අදාළ අධ්‍යක්‍ෂවරයා හැර අනෙකුත් අධ්‍යක්‍ෂවරුන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු පිරිසකගේ ඡන්දයෙන් අනුමැතිය ලැබී ඇති විට හැර බැංකුවක් එහි අධ්‍යක්‍ෂවරයෙකුට හෝ එවැනි අධ්‍යක්‍ෂවරයෙකුගේ සමීප ඥාතියෙකුට කිසිදු ආකාරයක ප්‍රදානයක් ලබාදීමට කටයුතු නොකළ යුතුය.	අනුකූලවී ඇත. එවැනි සිදුවීම් වාර්තා වී නොමැත.

		2020 දී අනුකූලතා මට්ටම
3 (7) (v) (අ)	බැංකුවක් මගින්, යම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයෙකුගේ සමීප ඥාතියෙකුට හෝ පුද්ගලයෙකුගේ සැලකිය යුතු උනන්දුවක් ඇති අරමුණක් වෙනුවෙන් කිසියම් ප්‍රදානයක් ලබාදී ඇති විටක, පසු කාලීනව එකී පුද්ගලයා බැංකුවේ අධ්‍යක්‍ෂවරයෙකු ලෙස පත් වුවහොත් එම පුද්ගලයා අධ්‍යක්‍ෂවරයෙකු ලෙස පත්වීමෙන් වසරක් ඇතුළත ඒ සඳහා මූල්‍ය මණ්ඩලයේ අනුමැතිය ලද හැකි වන පරිදි සුදුසු ඇපකරයක් ලබා ගැනීමට බැංකුව කටයුතු කළ යුතුය.	අනුකූලවී ඇත. අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීම් ලැබීමට පෙර සියළුම අධ්‍යක්ෂවරුන් වෙතින් ප්‍රකාශ ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කටයුතු කරන අතර එයට වැඩිමනත් ගනුදෙනු ඇත්නම් ඒවාද ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටී. අවශ්‍ය වුවහොත්, මුදල් මණ්ඩලය විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි, අධ්‍යක්ෂවරුන් වෙතින් ඇපකරයක් ලබාගැනීමේ අවශ්‍යතාව පිළිබඳව බැංකුවේ සේවකයන් දැනුවත්ව සිටී. අනුකූලතා අංශය විසින් මෙම නියාමනය සම්බන්ධ ක්‍රියාවලිය නිරීක්ෂණය කරනු ලබන අතර ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ත්‍රෛමාසික වාර්තාවක් ඉදිරිපත් කෙරේ.
3 (7) (v) (ආ)	3 (7) (v) (අ) නියාමනයෙන් එවැනි ඇපකරයක් ලබාදී නොමැති විටක එවැනි ප්‍රදානයක් ලබාදෙන අවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව තුල හෝ පත්වීම් ලද දින සිට මාස දහඅටක කාලයක් ඉකුත්වී ඇති විට හෝ ඉහත අවස්ථා දෙකෙන් කලින් යෙදෙන අවස්ථාවට අනුව ඕනෑම ප්‍රදානයක් හේතුවෙන් ගෙවිය යුතු ඕනෑම මුදලක් පොලිය සමග එම අධ්‍යක්ෂවරයාගෙන් අයකරගැනීමට බැංකුව පියවර ගත යුතුය.	
3 (7) (v) (ඇ)	ඊහත උප නියාමන වලට අනුකූලවීමට අපොහොසත් වන ඕනෑම අධ්‍යක්ෂවරයෙක් අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත්වූ බවට සැලකෙන අතර බැංකුව එවැන්නක් පිළිබඳ කරුණු මහජනතාවට හෙළි කළ යුතුය.	
3 (7) (v) (ඈ)	කෙසේවෙතත්, ප්‍රදානය කරන අවස්ථාවේදී බැංකුවේ සේවකයෙක්වූ සහ එම බැංකුවේ සියළු සේවකයන්ට අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ ප්‍රදානය ලබාදුන් අධ්‍යක්ෂවරයෙකුට මෙම උපනියාමනය අදාළ නොවේ.	
3 (7) (vi)	බැංකුවේ කාර්යමණ්ඩලයට අදාළ වන යෝජනා ක්‍රමයක් හැරුණු කොට වෙනත් කිසිදු ආකාරයක ප්‍රදානයක් හෝ "වඩා වාසිදායක සැලකීමක්" ලබාදීමට බැංකුවක් කටයුතු නොකළ යුතුය.	අනුකූලවී ඇත. කාර්යමණ්ඩල ප්‍රතිලාභ හැරුණු විට බැංකුවේ සේවකයන්ට වඩා වාසිදායක ලෙස සැලකීම හෝ ප්‍රදාන ලබාදීම සිදු කර නොමැත. වෙනත් සේවකයන්ට හෝ සමීප ඥාතීන්ට විශේෂ සැලකීම් ලබාදීමෙන් වළකින ලෙස චක්‍රලේඛ උපදෙස් මගින් බැංකුවේ සේවකයන් දැනුවත් කර ඇත.
3 (7) (vii)	ඉහත 3 (7) (v) සහ 3 (7) (vi) යන නියමන් යටතේ බැංකුවක් විසින් ලබාදෙන ලද ප්‍රදානයක් හෝ එවැනි ප්‍රදානයක කිසිදු කොටසක් හෝ ඊට අදාළ වන කිසිදු පොලියක් හෝ මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතියෙන් තොරව ප්‍රේෂණය නොකළ යුතු අතර එවැනි අනුමැතියකින් තොරව සිදු කරනු ලබන ඕනෑම ප්‍රේෂණයක් බල රහිත හා ඵල රහිත වේ.	අනුකූලවී ඇත. එවැනි සිදුවීම් වාර්තා වී නොමැත.

ආයතනික පාලනය

		2020 දී අනුකූලතා මට්ටම
3 (8) 3 (8) (i)	**හෙළිදරව් කිරීම්** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත කරුණු සම්බන්ධයෙන් සහතික විය යුතුය.	
3 (8) (i) (a)	අධීක්ෂණ හා නියාමන අධිකාරීන් විසින් නිර්දේශ කරනු ලබන ආකෘති වලට අනුකූල වන ලෙස සහ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අදාළ වන පරිදි වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශන සහ ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ප්‍රකාශයට පත් කිරීම.	අනුකූලවී ඇත.
3 (8) (i) (b)	එවන් ප්‍රකාශ සංක්ෂිප්තව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පුවත්පත්හි පළ කිරීම.	අනුකූලවී ඇත.
3 (8) (ii)	පහත සඳහන් අවම හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාවෙහි සිදුකර ඇති බවට සහතික කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගත යුතුය.	
3 (8) (ii) (අ)	නිශ්චිත හෙළිදරව් කිරීම් ඇතුළුව, අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන උපදෙස් වලට අනුව විගණිත වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බවට සඳහන් කෙරෙන ප්‍රකාශයක්.	අනුකූලවී ඇත. වාර්ෂික විගණන මූල්‍ය වාර්තාව සකස් කිරීමේදී අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන අවශ්‍යතා වලට අනුකූලවීම පිළිබඳ හෙළිදරව් කිරීම් පිටු අංක 123 සිට 124 දක්වා ඇති "මූල්‍ය වාර්තාකරණය සඳහා වන අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය" සහ පිටු අංක 128 සිට 129 දක්වා ඇති "සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (මූල්‍ය හා සැලසුම්) වගකීම් පිළිබඳ ප්‍රකාශනයෙහි" ඇතුළත් වේ.
3 (8) (ii) (ආ)	මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වාසනීය බව සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් සැපයීම අරමුණු කරගනිමින් මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇති බවට සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා නියාමන උපදෙස් වලට අනුකූලව සිදු කෙරෙන බව තහවුරු කිරීම සඳහා වන බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක්.	අනුකූලවී ඇත. මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වාසනීය බව සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇති බව සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා නියාමන උපදෙස් වලට අනුකූලව සිදු කර ඇති බව වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති බව පහත දැක්වෙන වාර්තා ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සනාථ කරනු ලැබ ඇත. • පිටු අංක 117 සිට 122 හි ඇති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව • පිටු අංක 123 සිට 124 දක්වා වන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය • පිටු අංක 125 සහ 126 හි ඇති මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය
3 (8) (ii) (ඇ)	2008 දෙසැම්බර් 31 දිනෙන් පසුව පිළියෙල කරන ලද හෝ ප්‍රකාශයට පත් කරන ලද කිසියම් ප්‍රකාශයක් සම්බන්ධයෙන් ඉහත 3 (8) (ii) (ආ) නියාමනයෙහි සඳහන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයෙහි ඵලදායීතාවය පිළිබඳ බාහිර විගණකවරයාගේ සහතිකය.	අනුකූලවී ඇත. මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීතාව පිළිබඳව පිටු අංක 125 සිට 126 හි දැක්වෙන සහතිකය බැංකුව විසින් ලබාගෙන ඇත.
3 (8) (ii) (ඈ)	අධ්‍යක්ෂවරුන් පිළිබඳ තොරතුරු (i) නම්, නිසි යෝග්‍යතාවය සහ දේපල (ii) බැංකුව සමග ඇති ගනුදෙනු සහ; (iii) බැංකුව විසින් ගෙවන ලද මුළු ගාස්තු/පාරිශ්‍රමික	අනුකූලවී ඇත. අධ්‍යක්ෂවරුන් පිළිබඳ පසුබිම් තොරතුරු පිටු අංක 40 සිට 44 හි දක්වා ඇත. පිටු අංක 239 හි ඇති මූල්‍ය ප්‍රකාශනයන්හි අංක 49.5 සටහනට යොමුවන්න. පිටු අංක 239 හි ඇති මූල්‍ය ප්‍රකාශනයන්හි අංක 49.5 සටහනට යොමුවන්න.

		2020 දී අනුකූලතා මට්ටම
3 (8) (ii) (ඉ)	3 (7) (iii) හි නියම කර ඇති පරිදි, සම්බන්ධිත පාර්ශවයන්ගේ එක් එක් කොටසකට ලබාදී ඇති සමස්ත ශුද්ධ ප්‍රදාන. අදාළ පාර්ශවවල එක් එක් කොටසකට ප්‍රදානය කර ඇති සමස්ත ශුද්ධ ප්‍රදාන බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස හෙළිදරව් කළ යුතුය.	අනුකූලවී ඇත බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස පිරිනමා ඇති ශුද්ධ ප්‍රදාන පිළිබඳව පිටු අංක 239 හි දැක්වෙන මූල්‍ය ප්‍රකාශ යටතේ සටහන මගින් ඉදිරිපත් කර ඇත.
3 (8) (ii) (ඊ)	බැංකුව විසින් එහි ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් වෙත ගෙවන ලද වේතන වල සමුච්චිත අගය සහ වේතන ආදී පුළුල් වර්ගීකරණ යටතේ දක්වා ඇති බැංකුව හා එහි ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පිරිස් අතර සිදු කෙරුණු ගනුදෙනුවල සමුච්චිත අගය.	අනුකූලවී ඇත. පිටු අංක 239 හි දැක්වෙන මූල්‍ය ප්‍රකාශ යටතේ අංක 49.5.1 සටහන මගින් අදාළ විස්තර දක්වා ඇත.
3 (8) (ii) (උ)	ආයතනික පාලන වාර්තාවේ මෙම නියාමන සමග අනුකූලවීම සම්බන්ධයෙන් බාහිර විගණකවරයාගේ වාර්තාව	අනුකූලවී ඇත. බැංකුව 2007 අංක 12 දරන ආයතනික පාලන නියාමනයට අනුකූලවන වන මට්ටම පිළිබඳව බැංකුව විගණකවරයා වෙතින් සහතිකයක් ලබාගෙන ඇත. විගණකවරයාගේ සියළු හෙළිදරව් කිරීම් මෙම ආයතනික පාලන වාර්තාවට ඇතුළත් කර ඇත.
3 (8) (ii) (ඌ)	විචක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීති, අභ්‍යන්තර පාලන සහ කිසියම් සැළකිය යුතු අනුකූල නොවීමේ අවස්ථාවක් නිවැරදි කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ග යනාදිය ඇතුළත් වාර්තාවක්	අනුකූල වී ඇත. පිටු අංක 123 හා 124 හි සඳහන් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම යටතේ විචක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීති, අභ්‍යන්තර පාලන සමග අනුකූලවීම පිළිබඳ තොරතුරු පැහැදිලිව දක්වා ඇත.
	බැංකුවේ අවදානම් කළමනාකරණයේ අඩුලුහුඩුකම් පිළිබඳ නියාමන හා අධීක්ෂණ කරුණු හෝ බැංකු අධීක්ෂණ අංශයෙහි අධ්‍යක්‍ෂ විසින් පෙන්වා දෙන ලද, මෙකී නියාමයන්ට අනුකූල නොවන අවස්ථා සහ එසේ මූල්‍ය මණ්ඩලය විසින් මහජනතාවට හෙළිදරව් කළ යුතු යැයි නියම කරන ලද එවැනි කරුණු මෙන්ම එම කරුණු සම්බන්ධයෙන් බැංකුව විසින් ගනු ලැබූ පියවර ඇතුළත් ප්‍රකාශයක්	අදාළ නොවේ. බැංකුවේ අවදානම් කළමනාකරණය ආශ්‍රිතව අඩුලුහුඩුකම් හෝ මෙම නියාමන සමග අනුකූල නොවීමක් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් කිසිදු අධීක්ෂණ කරුණක් මතු නොකෙරුණි. එබැවින්, අදාළ වර්ෂය තුළදී මූල්‍ය මණ්ඩලය විසින් මහජනතාව වෙත කිසිදු හෙළිදරව්වක් කළ යුතු බවට උපදෙස් දී නොමැත.
3 (9)	සංක්‍රාන්තික හා වෙනත් පොදු ප්‍රතිපාදන	අනුකූල වී ඇත. බැංකුව විසින් අදාළ සංක්‍රාන්තික ප්‍රතිපාදන සමග අනුකූල වී ඇත.

වගුව 15

2007 අංක 12 දරන ආයතනික පාලන නියාමනය හා අනුකූලවීමේ අවශ්‍යතාව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 12 දරන නියාමනය හා අනුකූලවීමේ අවශ්‍යතාවය සපුරනු වස් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද සම්බන්ධිත සේවා 4,400 - ක්‍රියාත්මක කිරීම සඳහා එකඟවූ මූල්‍ය තොරතුරු පිළිබඳ ක්‍රියාපටිපාටිය පිළිබඳ නියුක්තවීම් හා සම්බන්ධ ශ්‍රී ලංකා ප්‍රමිති මගින් දක්වා ඇති මූලධර්ම ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් අදාළ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කරනු ලැබ තිබේ. 2021 අප්‍රේල් 09 දිනැති ඔහුගේ වාර්තාව මගින් දක්වා ඇති කරුණු හා ඉහත හෙළිදරව් කරන ලද කරුණු අතර සැලකිය යුතු වෙනස්කම් නොවූ අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත වාර්තා කරන ලද කරුණු හා සැලකිය යුතු පරස්පරතා හඳුනානොගැනුණි.

අනුපමා මුහන්දිරම්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

කේෂිලා ජයවර්ධන
සභාපතිනිය

2021 අප්‍රේල් 09
කොළඹදී

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

කමිටුවේ සංයුතිය

2020 දී

සංශෝධනය කරන ලද පරිදි 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8 (1) වගන්තිය යටතේ පිහිටුවා ඇති ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් සත් දෙනෙකුගෙන් සමන්විත වන අතර එම අධ්‍යක්ෂවරුන් සත්දෙනා අතුරින් කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය සුදුසුකම්, නිපුණතා සහ අත්දැකීම් වලින් පරිපූර්ණ අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සාමාජිකයන් ලෙස පත් කෙරේ.

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පහත නම් සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය :

මනෝහරී අබේසේකර මිය
සභාපති/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ආචාර්ය එම් කේ සී සේනානායක මහතා
සාමාජික/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එම් ටී ජේ පෙරේරා මහතා
සාමාජික/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සාමාජිකයන් පිළිබඳ කෙටි විස්තරයක් ආයතනික පාලන වාර්තාව යටතේ පිටු අංක 40 සිට 44 දක්වා ඇතුළත් වේ.

2021 දී

වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පහත නම් සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.

මනෝහරී අබේසේකර මිය
සභාපති/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ආචාර්ය එම් කේ සී සේනානායක මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එච් කේ ඩී ලක්ෂ්මන් ගාමිණී මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ආරාධනය මත නිතිපතා රැස්වීම් වලට සහභාගී වන නිලධාරීන්
බැංකුවේ මූල්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වගකියන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විගණන)

කමිටුවේ ලේකම්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරයි.

රැස්වීම්

නම	සහභාගීවීමට සුදුසුකම් ලත් රැස්වීම් ගණන	සහභාගීවූ රැස්වීම් ගණන
මනෝහරී අබේසේකර මිය	06	06
එම් කේ සී සේනානායක මහතා	06	06
එම් ටී ජේ පෙරේරා මහතා	05	05

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ මූල්‍ය වර්ෂය තුල කමිටුව විසින් රැස්වීම් සයක් පවත්වන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය ප්‍රකාරව කමිටු රැස්වීමක ගණපූරණය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකි.

නිරීක්ෂකයෙකු ලෙස විගණකාධිපතිවරයා නියෝජනය කරමින් විගණන දෙපාර්තමේන්තුවේ විගණන පාලක අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් සයකට සහභාගී වී තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සාමාජිකයෝ, විගණකාධිපතිවරයා නියෝජනය කරමින් විගණන දෙපාර්තමේන්තුවේ විගණන පාලක අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරියද එම රැස්වීම් වලට සහභාගී වූහ.

අවශ්‍යතාවය පරිදි බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ආරාධනය මත කමිටු රැස්වීම් වලට සහභාගී වූහ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සහ නිතිපතා අළුත් කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රඥප්තිය කමිටුවේ විෂයය පථය පැහැදිලිව දක්වයි. බැංකු ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් 2018 වර්ෂයේදී කමිටුවේ ප්‍රඥප්තිය අවසන් වරට සමාලෝචනය කෙරිණ.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව ස්ථාපිත කරන ලද්දේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරණ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ බැංකු නියාමනයේ 3 (6) (ii) වගන්තිය හා එහි පසුකාලීන සංශෝධන, යහපාලනය සඳහා වන පොදු ව්‍යවසාය මාර්ගෝපදේශ වල විධිවිධාන සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහපරිච සංග්‍රහයට අනුකූලවය.

කමිටුවට ඇති වගකීම්

කමිටුවට එහි වගකීම් ඉටු කිරීමෙහිලා මෙන්ම පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් අධීක්ෂණ වගකීම් ඉටු කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුව බලගන්වනු ලැබ තිබේ.

(අ) බැංකුවේ මූල්‍ය ප්‍රකාශන වල අඛණ්ඩතාවය ;

(ආ) බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යයෙහි ඵලදායීතාවය ;

(ඇ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යයෙහි කාර්යසාධනය ; සහ

(ඈ) බැංකුවේ බාහිර විගණන කාර්යයෙහි කාර්යසාධනය ;

කමිටුවේ කාර්යයන් සහ වගකීම් මෙන්ම අධිකාරී බලතලද කමිටු ප්‍රඥප්තියේ දැක්වේ. කමිටුවේ කටයුතු සහ වගකීම් ඉටු කිරීමේදී ප්‍රඥප්තිය කෙරෙහි වන අනුකූලතාවය මැන බැලීම සඳහා කමිටුවට සහයවීම පිණිස ප්‍රඥප්ති පිරික්සුම් ලැයිස්තුව උපයෝගී කරගන්නා ලදී.

සිය ක්‍රියාකාරකම් පිළිබඳව රැස්වීම් සටහන් සමගින් කමිටුව සෘජුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අභ්‍යන්තර විගණනය, බාහිර විගණනය සහ අධ්‍යක්ෂ මණ්ඩලය අතර විවෘත සන්නිවේදන මාර්ගයක් සහතික කරයි. කමිටුවේ යොමුකිරීමේ අනුදේශ සියළු ප්‍රමාණාත්මක ක්ෂේත්‍ර යටතේ අනුකූල වන බව කමිටුව විශ්වාස කරයි.

2020 වර්ෂයේ ක්‍රියාකාරකම්

2020 වර්ෂය තුළදී කමිටුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

- 2020 වසර සඳහා වන විගණන සැලැස්ම අනුමත කරන ලදී.
- කළමනාකරණ ලිපි හා විගණකාධිපතිගේ වාර්තා සහ ඒ සම්බන්ධ කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර විගණන වාර්තා (සවිස්තරාත්මක ශාඛා විගණන, ප්‍රධාන කාර්යාලයේ අංශ හා සම්බන්ධ විගණන, අනපේක්ෂිත විගණන සහ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන අංශය වෙත පවරන ලද විශේෂ කාර්යයන්.) එමගින් හඳුනාගත් ගැටළු හා අඩුපාඩු නැවත ඇතිවීම වළක්වාගැනීම සඳහා කමිටුව විසින් වැඩිමනත් මාර්ගෝපදේශ සපයන ලදී.
- මූල්‍ය ප්‍රකාශ (ත්‍රෛමාසික හා වාර්ෂික) කෙටුම්පත සමාලෝචනය කොට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කරන ලදී.
- සවිස්තරාත්මක විගණන මත පදනම්ව ශාඛා වල අවදානම් වර්ගීකරණය සමාලෝචනය කරන ලදී.
- ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම විගණනය
- බැංකුව තුළ සිදුවූ මහා පරිමාණ වංචනික ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරන ලද අතර ඒ සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව පසුවිපරම් කිරීම.
- සම්පත් උපයෝජන විගණන සමාලෝචනය කිරීම
- බැංකුවේ සියළු මෙහෙයුම් ක්ෂේත්‍ර ආශ්‍රිතව අඛණ්ඩතාවයක් හා විනයක් පවත්වා ගැනීමෙහිලා මාර්ගෝපදේශකත්වය සපයන අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්තිය ඇතුළු ප්‍රධාන ප්‍රතිපත්තිමය කරුණු සමාලෝචනය කරන ලදී.
- බැංකුව විසින් දරන ලද පාඩු කපා හැරීම

එසේම, කමිටුව වෙත නිතිපතා ඉදිරිපත් කෙරෙන වාර්තා වල ආකෘති සම්බන්ධයෙන් කමිටුව විසින් වැඩිදුරටත් විශේෂ අවධානය යොමු කරන ලද අතර එවායේ ආකෘතිය හා අන්තර්ගතය ආශ්‍රිතව වෙනස්කම් සිදුකිරීමේ අවශ්‍යතාවය සටහන් කරගන්නා ලදී. ඒ අනුව, වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් අදාළ නිළධාරීන් වෙත ලබාදෙන ලදී.

වසර තුළදී ඇතිවූ කොවිඩ්-19 වසංගත තත්ත්වය සැලකිල්ලට ගෙන ඒ හේතුවෙන් මතුවූ අභියෝග සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගෙන් සමන්විත විශේෂ කාර්ය බලකායක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීමටද කමිටුව විසින් කටයුතු කරන ලදී.

කමිටුවේ කාර්යසාධනය ඇගයීම

කමිටුව ස්වකීය ඵලදායිතාවය පිළිබඳව වාර්ෂික ඇගයීමක් සිදු කරන අතර එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දෙයි. ප්‍රඥප්ති පිරික්සුම් ලැයිස්තුව සහ ස්වයං-ඇගයුම් මාර්ගෝපදේශ මත පදනම්ව කාර්යසාධනය ඇගයීම සිදු කෙරේ.

කමිටුව 2020 වසර සඳහා වන ස්වයං-තක්සේරුව සමග ඇගයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කළ අතර එහි කාර්යසාධනය ඵලදායී බවට තීරණය කරන ලදුව ඇගයීම් ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම්දී තිබේ.

මනෝහරී අබේසේකර මිය

සභාපතිනි

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

2021 මාර්තු 19

කොළඹදී.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

කමිටුවේ සංයුතිය

2020 දී

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව පහත නම් සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය :

කේෂිලා ජයවර්ධන මිය
සභාපති/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

යූ ජී ආර් ආරියරත්න මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 ජනවාරි 17 සිට 2020 අප්‍රේල් 22/ 2020 ඔක්තෝබර් 28 සිට)

ආචාර්ය තිරාන් ද සිල්වා මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 ඔක්තෝබර් 09 දක්වා)

එම් ටී ජේ පෙරේරා මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 අප්‍රේල් 22 සිට 2020 ඔක්තෝබර් 28 දක්වා)

එරංග ජයවර්ධන මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 ඔක්තෝබර් 28 සිට 2021 ජනවාරි 08 දක්වා)

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයන් පිළිබඳ කෙටි විස්තරයක් ආයතනික පාලන වාර්තාව යටතේ පිටු අංක 40 සිට 44 දක්වා ඇතුළත් වේ.

2021 දී

වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව පහත නම් සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.

කේෂිලා ජයවර්ධන මිය
සභාපති/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

යූ ජී ආර් ආරියරත්න මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එච් කේ ඩී ලක්ෂ්මන් ගාමිණී මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ආරාධනය මත නිතිපතා රැස්වීම් වලට සහභාගී වන නිලධාරීන්
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් කමිටුවට අවශ්‍ය තොරතුරු සපයන අතර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී හා සම්බන්ධ කරුණු සාකච්ඡා කෙරෙන අවස්ථාවන්හිදී හැර අනෙකුත් සියළුම රැස්වීම් වලට සහභාගී වේ.

අවශ්‍යතාවය මත හා ආරාධනය මත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන) ඇතුළු ජොෂ්ඨ කළමනාකාරීත්වය රැස්වීම් වලට සහභාගී වූහ.)

කමිටුවේ ලේකම්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරයි.

රැස්වීම්
ත්‍රෛමාසිකව හා අවශ්‍යතාවය මත පදනම්ව කමිටුව රැස්විය. ඒ අනුව, 2020 වසර තුළ රැස්වීම් 06 ක් පවත්වා තිබෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ ප්‍රඥප්තිය ප්‍රකාරව කමිටු රැස්වීමක ගණපූරණය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකි.

වසර තුළදී රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ සහභාගීත්වය පහත පරිදි වේ.

නම	සහභාගීවීමට සුදුසුකම් ලත් රැස්වීම් ගණන	සහභාගීවූ රැස්වීම් ගණන
කේෂිලා ජයවර්ධන මිය	06	06
යූ ජී ආර් ආරියරත්න මහතා	01	01
ආචාර්ය තිරාන් ද සිල්වා මහතා	05	05
එම් ටී ජේ පෙරේරා මහතා	05	05
එරංග ජයවර්ධන මහතා	00	00

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සංවර්ධන හා පාරිශ්‍රමික කමිටු ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සංවර්ධන හා පාරිශ්‍රමික කමිටුව සංස්ථාපනය කරන ලද්දේ 1988 අංක 30 දරණ සංශෝධිත බැංකු පනතේ 76 J (1) වගන්තිය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනයේ 3 (6) (i) හා (iii) වගන්තිය යටතේ වන විධිවිධාන වලට අනුකූලවය. කමිටුව ඍජුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන අතර කමිටු රැස්වීම් පටිපාටි නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඇත.

කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

ප්‍රඥප්තිය අනුව කමිටුවේ කාර්යභාරය සහ වගකීම් පහත කරුණු වලින් සමන්විත වේ.

- සාමූහික ගිවිසුම මත තීරණය කරනු ලබන වේතන හැර බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ වේතන ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) තීරණය කිරීම.
- බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත ඉලක්ක සහ අරමුණු ලබාදීම.
- එසේ ලබාදුන් ඉලක්ක හා අරමුණ වලට සාපේක්ෂව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යසාධනය නිතිපතා ඇගයීම.
- වේතන, දීමනා සහ කාර්යසාධනය මත පදනම්ව අනෙකුත් දීමනා ප්‍රතිශෝධනය කිරීමේ පදනම තීරණය කිරීම.

ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ කාර්ය මණ්ඩලයට අදාළ වගන්ති හා කොන්දේසි වලට අමතරව කමිටුව සියළුම වැදගත් මානව සම්පත් ප්‍රතිපත්ති, ප්‍රවේශ සහ වැටුප් ආකෘති සමාලෝචනය කරයි. එහිදී අවශ්‍ය තොරතුරු හා නිර්දේශ බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙතින් ලබාගැනේ.

2020 වසර තුල කමිටුවේ ක්‍රියාකාරකම්

- උසස්වීම්, විනය කරුණු, කාර්යමණ්ඩලය පුහුණු කිරීම හා කුසලතා සංවර්ධනය සම්බන්ධයෙන් තීරණ වලට එළඹීම.
- 2020 වසර සඳහා මානව සම්පත් සැලැස්ම සකස් කර අවසන් කිරීම.
- බැංකුව සඳහා අනුප්‍රාප්තික සැලැස්මක අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කිරීම.
- 2020 වසර සඳහා වන පුහුණු සැලැස්ම සඳහා අනුමැතිය ලබාදීම.
- හඳුනාගත් බඳවාගැනීමේ පටිපාටිය හා සම්බන්ධ සංශෝධන
- හඳුනාගත් අංශ සඳහා ව්‍යුහාත්මක වෙනස්කම්
- දැනට ක්‍රියාත්මක උසස්වීම් පටිපාටි සමාලෝචනය කිරීම සඳහා කළමනාකාරීත්වය යොමු කිරීම.
- දැනට ක්‍රියාත්මක ස්ථානමාරු පටිපාටි සමාලෝචනය කිරීම සඳහා කළමනාකාරීත්වය යොමු කිරීම.
- අනුමත වැටුප් රහිත නිවාඩු මත අධ්‍යාපනය/රැකියා සඳහා විදෙස් ගත වන සේවා නියුක්තිකයන් ආපසු පැමිණෙන තෙක් ඔවුන් අනුයුක්ත අංශයේ/ශාඛාවේ අදාළ තනතුරු පුරප්පාඩුව තබාගැනීමේ ක්‍රමවේදය අත්හිටුවන ලදී.

දෛනික කාරණා වලට අමතරව බැංකුවේ ආයතනික කළමනාකාරීත්වයට අයත් වන ප්‍රධාන අලෙවි නිලධාරී සහ ප්‍රධාන නීති නිලධාරී තනතුරු සඳහා බඳවාගැනීම කෙරෙහි කමිටුව විසින් අවධානය යොමු කරන ලදී.

කමිටුවේ කාර්යසාධනය ඇගයීම

කමිටුව 2020 වසර සඳහා වන ස්වයං-තක්සේරුව සමග ඇගයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කළ අතර එහි කාර්යසාධනය ඵලදායී බවට තීරණය කරන ලදුව ඇගයීම් ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම්දී තිබේ.



කේෂිලා ජයවර්ධන

සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සංවර්ධන හා පාරිශ්‍රමික කමිටුව

2021 මාර්තු 19
කොළඹදී.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව

කමිටුවේ සංයුතිය

2020 දී

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව පහත නම් සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනාගෙන් සමන්විත විය.

යූ ජී ආර් ආරියරත්න මහතා
සභාපති/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ආචාර්ය එම් කේ සී සේනානායක මහතා
සාමාජික/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ආචාර්ය තිරාන් ද සිල්වා මහතා
සාමාජික/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 ජනවාරි 17 වන දින සිට
2020 ඔක්තෝබර් 09 දක්වා)

එරංග ජයවර්ධන මහතා
සාමාජික/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 ඔක්තෝබර් 28 සිට)

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ සාමාජිකයන් පිළිබඳ කෙටි විස්තරයක් ආයතනික පාලන වාර්තාව යටතේ පිටු අංක 40 සිට 44 දක්වා ඇතුළත් වේ.

2021 දී

වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව පහත නම් සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.

යූ ජී ආර් ආරියරත්න මහතා
සභාපති/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ආචාර්ය එම් කේ සී සේනානායක මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එරංග ජයවර්ධන මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ආරාධනය මත නිතිපතා රැස්වීම් වලට සහභාගී වන නිලධාරීන්
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී කමිටුවට අවශ්‍ය තොරතුරු සපයන අතර ආරාධනය මත රැස්වීම් වලට සහභාගී වේ.

කමිටුවේ ලේකම්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරයි.

රැස්වීම්
2020 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු රැස්වීම් 02 ක් පවත්වා තිබෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු ප්‍රඥප්තිය ප්‍රකාරව කමිටු රැස්වීමක ගණපූරණය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකි.

වසර තුළදී රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ සහභාගීත්වය පහත පරිදි වේ.

නම	සහභාගීවීමට සුදුසුකම් ලත් රැස්වීම් ගණන	සහභාගීවූ රැස්වීම් ගණන
යූ ජී ආර් ආරියරත්න මහතා	02	02
ආචාර්ය එම් කේ සී සේනානායකමහතා	02	02
ආචාර්ය තිරාන් ද සිල්වා මහතා	02	02
එරංග ජයවර්ධන මහතා	00	00

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව

කමිටුවේ ප්‍රඥප්තිය

1988 අංක 30 දරණ සංශෝධිත බැංකු පනතේ 76 J (1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනයේ දැක්වෙන බලපත්‍රලාභී විශේෂිත බැංකු වල ආයතනික පාලන මාර්ගෝපදේශ ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තේරීමේදී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය සහ පාලනය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව ස්ථාපිත කරන ලදී.

කමිටුවේ කාර්යභාරය හා වගකීම

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරාගැනීමට/පත් කිරීමට සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමේ සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරී තනතුරු සඳහා පත් කිරීමට හෝ උසස්වීම් ලබාදීම සඳහා සපුරාලිය යුතු මූලික සුදුසුකම්, අත්දැකීම් සහ මූලික ගුණාංග තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුවේ වගකීම වේ.

එසේම, 3 (3) නියාමනයේ සඳහන් කර ඇති හා ව්‍යවස්ථා ඔස්සේ සලසා ඇති විධිවිධාන වලට අනුකූලව අධ්‍යක්ෂවරු, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් එම තනතුරු දැරීම සඳහා සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බව කමිටුව විසින් සහතික කරනු ලැබිය යුතුය. එසේම, අතිරේක/නව විශේෂඥතාව ලබාගැනීමේ අවශ්‍යතාව සහ විශ්‍රාම යන කළමනාකරණ නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික වැඩපිළිවෙලක් පවත්වාගැනීමේ අවශ්‍යතාව කමිටුව විසින් කලින් කලට සලකා බලනු ලබයි.

2020 වසර තුළ කමිටුවේ ක්‍රියාකාරකම්

වසර තුළදී කමිටුව විසින් සිදු කරන ලද වැදගත්ම කාර්යය වන්නේ බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා සුදුසු අයදුම්කරුවෙකු බඳවාගැනීම/තෝරාගැනීමයි. බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී පත්කරගැනීම සඳහා තෝරාගැනීමේ/ඇගයීමේ නිර්නායක කමිටුව විසින් සකස් කරන ලදී.

සහකාර සාමාන්‍යාධිකාරවරුන් තිදෙනෙකු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ධුරයට උසස් කිරීමද සිදු කෙරුණි.

කමිටුවේ කාර්යසාධනය ඇගයීම

කමිටුව 2020 වසර සඳහා වන ස්වයං-තක්සේරුව සමග ඇගයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කළ අතර එහි කාර්යසාධනය ඵලදායී බවට තීරණය කරන ලදුව ඇගයීම් ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම්දී තිබේ.

යූ පී ආර් ආරියරත්න

සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව

2021 මාර්තු 19

කොළඹදී.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

කමිටුවේ සංයුතිය

2020 දී

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය.

2020 වසර තුළදී පහත නම් සඳහන් අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කළහ.

ආචාර්ය එම් කේ සී සේනානායක මහතා
සභාපති/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ

මනෝහරී අබේසේකර මිය
සාමාජික/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 ජනවාරි 17 සිට
2020 ඔක්තෝබර් 28 දක්වා)

එම් ටී ජේ පෙරේරා මහතා
සාමාජික/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 අප්‍රේල් 22 සිට)

එරංග ජයවර්ධන මහතා
සාමාජික/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 ඔක්තෝබර් 28 සිට)

අධ්‍යක්ෂ මණ්ඩල නොවන සාමාජිකයන්:
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී
ප්‍රධාන අවදානම් නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවධානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් පිළිබඳ කෙටි විස්තරයක් ආයතනික පාලන වාර්තාව යටතේ පිටු අංක 40 සිට 44 දක්වා ඇතුළත් වේ.

2021 දී

වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පහත නම් සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.

ආචාර්ය එම් කේ සී සේනානායක මහතා
සභාපති/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එරංග ජයවර්ධන මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එම් ටී ජේ පෙරේරා මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ආරාධනය මත නිතිපතා රැස්වීම් වලට සහභාගී වන නිලධාරීන්
අවශ්‍ය අවස්ථාවන්හිදී රැස්වීම් වලට සහභාගී වන ලෙසට කමිටුව අනෙකුත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරු, සහකාර සාමාන්‍යාධිකාරවරු, අනුකූලතා නිළධාරී සහ ප්‍රධාන කළමනාකාරවරුන්ට ආරාධනා කරන ලදී.

කමිටුවේ ලේකම්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරයි.

රැස්වීම්
ත්‍රෛමාසිකව හා අවශ්‍යතාවය මත පදනම්ව කමිටුව රැස්විය. 2020 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් 05 ක් පවත්වා තිබෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ප්‍රඥප්තිය ප්‍රකාරව කමිටු රැස්වීමක ගණපූරණය තුනෙන් දෙකකි.

වසර තුළදී රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ සහභාගීත්වය පහත පරිදි වේ.

නම	සහභාගීවීමට සුදුසුකම් ලත් රැස්වීම් ගණන	සහභාගීවූ රැස්වීම් ගණන
ආචාර්ය එම් කේ සී සේනානායකමහතා	05	03
මනෝහරී අබේසේකර මිය	04	04
එම් ටී ජේ පෙරේරා මහතා	04	03
එරංග ජයවර්ධන මහතා	01	01

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

කමිටු ප්‍රඥප්තිය

1988 අංක 30 දරණ බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පවරන ලද බලතල අනුව මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනයේ දැක්වෙන බලපත්‍රලාභී විශේෂිත බැංකු වල ආයතනික පාලන මාර්ගෝපදේශ ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ස්ථාපිත කරන ලදී.

කමිටුවේ කාර්යභාරය හා වගකීම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද යොමු කිරීමේ අනුදේශය අනුව කමිටුවේ කාර්යභාරය හා වගකීම පහත පරිදිවේ.

- බැංකුව සඳහා අවදානම් අභිරුචිය සහ දරා ගැනීමේ මට්ටම් ස්ථාපිත කිරීම.
- බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම.
- බාසල් III සහ ශ්‍රී ලංකා මහ බැංකු නියාමන/මාර්ගෝපදේශ සමග අනුකූලතාවය සහතික කිරීම.
- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවට අනුව අවදානම් කළමනාකරණ උපායමාර්ගය, රාමුව හා ක්‍රමවේදය බැංකුව පුරා ක්‍රියාත්මක කරන බව/භාවිතයට ගන්නා බව සහතික කිරීම.
- අවදානම් කළමනාකරණ අංශයේ විෂයය පථය තීරණය කිරීම සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව ඵලදායී ලෙස ක්‍රියාත්මක කෙරෙන බව සහතික කිරීමට අවදානම් කළමනාකරණ අංශයේ කාර්යය සඳහා මගපෙන්වීම.
- අවදානම් කළමනාකරණ කාර්යයන් ඵලදායීව සිදු කිරීම සඳහා අවශ්‍ය විශේෂඥතාවයෙන් යුක්ත කාර්යමණ්ඩලයක් අවදානම් කළමනාකරණ අංශයේ සිටින බව හා ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම් සපයා ඇති බව සහතික කිරීම.
- අවශ්‍ය නම් බාහිර අවදානම් කළමනාකරණ විශේෂඥයන් හා උපදේශකවරුන්ගේ සේවය ලබාගැනීම නිර්දේශ කිරීම.
- අවදානම් කළමනාකරණය ආශ්‍රිත අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් ඉටු කිරීමෙහිලා අවශ්‍ය උපදෙස් ලබාදීම.
- කලින් කලට ඉදිරිපත් කෙරෙන වාර්තා ඔස්සේ බැංකුවේ ස්ථර I සහ ස්ථර II අවදානම් සහ සීමා නිරීක්ෂණය, ව්‍යාපාරික අඛණ්ඩතා සැලැස්ම, තොරතුරු ආරක්ෂණ සැලැස්ම ආදී අවදානම් කළමනාකරණ/වළක්වාගැනීමේ ප්‍රවේශ පරීක්ෂා කිරීම.
- බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය සමාලෝචනය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, එය වෙත පවරා ඇති වගකීම් වලට යටත්ව ඉදිරිපත් කෙරෙන යෝජනා සඳහා අනුමැතිය ලබාදෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමසුමට ලක් කළ යුතු යෝජනා/වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සිය වගකීම් ඉටුකිරීමෙහිලා අවදානම් කළමනාකරණ අංශය, අනුකූලතා අංශය සහ අනෙකුත් මෙහෙයුම් අංශ සහය වේ.

2020 වසර තුල කමිටුවේ ක්‍රියාකාරකම්

- තෝරාගත් අංශ හා සම්බන්ධ අනුකූලතා තක්සේරුව, අර්ධවාර්ෂිකව ඉදිරිපත් කෙරෙන අනුකූලතා සහතිකය, බැංකුවේ අනුකූලතා වැඩසටහන ඇතුළු අනුකූලතා අංශය විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සමාලෝචනය කරන ලදී.
- බැංකුවේ ද්‍රවශීලතා සැලැස්මෙහි ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.
- බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාලෝචනය කරන ලද අතර ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.
- බැංකුවේ ප්‍රධාන කළමනාකරණ කමිටු වල ප්‍රඥප්ති/යොමු කිරීමේ ආදේශ සමාලෝචනය කරන ලද අතර ඒවා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.
- අවදානම් අභිරුචි රාමුව සහ අවදානම් දරාග ැනීමේ සීමා පිළිබඳ වාර්තා හා බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳ ත්‍රෛමාසික වාර්තාව සමාලෝචනය කරන ලදී.
- අවදානම් පාලන ස්වයං-තක්සේරුව පිළිබඳ වාර්තාව සමාලෝචනය කරන ලදී.
- බැංකුවේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය සමාලෝචනය කරන ලද අතර එය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.
- දේශපාලනමය වශයෙන් නිරාවරණයවූ පුද්ගලයන්ගේ ගිණුම් සම්බන්ධයෙන් පුළුල් ලෙස අවධානය යොමු කිරීම.
- බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තක්සේරු ක්‍රියාවලිය පිළිබඳ ලේඛනය සමාලෝචනය කරන ලදී.
- කළමනාකරණ කමිටු වල ප්‍රමාණාත්මකභාවය සහ ඵලදායීතාවය සමාලෝචනය කරන ලදී.
- බැංකුවේ සුරක්ෂිත තැන්පතු සේප්පු සම්බන්ධයෙන් අනුකූලතා තක්සේරුව

කමිටුවේ කාර්යසාධනය ඇගයීම

කමිටුව 2020 වසර සඳහා වන ස්වයං-තක්සේරුව සමග ඇගයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කළ අතර එහි කාර්යසාධනය ඵලදායී බවට තීරණය කරන ලදුව ඇගයීම් ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම්දී තිබේ.

ආචාර්ය එම් කේ සී සේනානායක මහතා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2021 මාර්තු 19
කොළඹදී.

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු වාර්තාව

කමිටුවේ සංයුතිය

2020 දී

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය.

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළදී පහත නම් සඳහන් අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කළහ.

කේෂිලා ජයවර්ධන මිය
සභාපති/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 ජනවාරි 17 දින සිට 2020 අප්‍රේල් 22 දක්වා/2020 ඔක්තෝබර් 28 දින සිට)

ආචාර්ය තිරාන් ද සිල්වා මහතා
(2020 අප්‍රේල් 22 සිට
2020 ඔක්තෝබර් 09 දක්වා)

එරංග ජයවර්ධන මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 ජනවාරි 17 සිට
2020 ඔක්තෝබර් 28 දක්වා)

මනෝහරී අබේසේකර මිය
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එම් ටී ජේ පෙරේරා මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 ඔක්තෝබර් 28 දින සිට)

අධ්‍යක්ෂ මණ්ඩල නොවන සාමාජිකයන්:
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී
ප්‍රධාන අවදානම් නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවේ සාමාජිකයන් පිළිබඳ කෙටි විස්තරයක් ආයතනික පාලන වාර්තාව යටතේ පිටු අංක 40 සිට 44 දක්වා ඇතුළත් වේ.

2021 දී

2021 පෙබරවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව අහෝසි කරන තෙක් 2021 වසර තුළදී එම කමිටුව පහත නම් සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

කේෂිලා ජයවර්ධන මිය
සභාපති/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

මනෝහරී අබේසේකර මිය
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එම් ටී ජේ පෙරේරා මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ආරාධනය මත නිතිපතා රැස්වීම් වලට සහභාගී වන නිලධාරීන්
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) ආරාධනය මත වසර තුළදී කමිටුවේ රැස්වීම් වලට සහභාගී වූහ.

කමිටුවේ ලේකම්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරයි.

රැස්වීම්
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු රැස්වීම් 04 ක් පවත්වා තිබෙන අතර කමිටු රැස්වීමක ගණපූරණය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකි.

වසර තුළදී රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ සහභාගීත්වය පහත පරිදි වේ.

නම	සහභාගීවීමට සුදුසුකම් ලත් රැස්වීම් ගණන	සහභාගීවූ රැස්වීම් ගණන
කේෂිලා ජයවර්ධන මිය	01	01
මනෝහරී අබේසේකර මිය	04	04
එරංග ජයවර්ධන මහතා	04	04
ආචාර්ය තිරාන් ද සිල්වා මහතා	03	02

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු වාර්තාව

කමිටු ප්‍රඥප්තිය

1988 අංක 30 දරණ සංශෝධිත බැංකු පනතේ 76 J (1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනයේ දැක්වෙන බලපත්‍රලාභී විශේෂිත බැංකු වල ආයතනික පාලන මාර්ගෝපදේශ සහ 1971 අංක 30 දරණ සංශෝධිත ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාරව බැංකුවේ ණය ප්‍රතිපත්තිය සහ ආයෝජන ප්‍රතිපත්තිය පිළිබඳව කලින් කලට සමාලෝචන සිදු කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී පවරන ලද අනුමත කිරීමේ බලතල වලට යටත්ව ණය පහසුකම් හා ආයෝජන අනුමත කිරීමෙහි නියුක්ත වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව ස්ථාපිත කරන ලදී.

කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

ප්‍රතිපත්ති, පටිපාටි සහ වෙනත් ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති මට්ටමේ ලේඛණ ඇතුළු ණය හා ආයෝජන සම්බන්ධ බැංකුවේ උපාය මාර්ගික අරමුණු සමාලෝචනය කිරීම හා නිර්දේශ කිරීම සිදු කරයි.

මනා, ශක්තිමත් සහ හිතකර ණය අවදානම් පිළිගැනීමක් සහ කළමනාකරණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකුවේ ණය ප්‍රතිපත්තිය සහ ආයෝජන ප්‍රතිපත්තිය ආශ්‍රිතව කාර්යක්ෂම හා ඵලදායී කළමනාකරණයක් පවත්වා ගැනීම තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවීම.

වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවේ නිර්දේශ වලට අනුකූලව ණය හා අත්තිකාරම් සහ ආයෝජන වල මිලකරණය අනුමත කරන අතර ඒ පිළිබඳව උපදෙස් ලබා දෙයි.

බැංකුවේ ණය අංශයට අදාළව සුදුසු අවදානම් කළමනාකරණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම සහ අභ්‍යන්තර පාලන සහ කළමනාකරණ තොරතුරු පද්ධති ශක්තිමත් කිරීම සිදු කරයි.

2020 වසර තුළ කමිටුවේ ක්‍රියාකාරකම්

කමිටුව වෙත පවරා ඇති අධිකාරී මට්ටමට යටත්ව ණය යෝජනා සමාලෝචනය, අනුමත කිරීම හා නිර්දේශ කිරීම සිදු කරන ලදී.

බැංකුවේ ණය පහසුකම් වලට අදාළව අවලංගු කිරීමේ ඔප්පු සහ නිදහස් කිරීමේ ඔප්පු සඳහා අනුමැතිය ලබාදීම

කමිටුව වෙත පවරා ඇති අධිකාරී මට්ටමට යටත්ව ණය අයකරගැනීම ආශ්‍රිත කරුණු සමාලෝචනය, අනුමත කිරීම හා නිර්දේශ කිරීම සිදු කරන ලදී.

කමිටුවේ කාර්යසාධනය ඇගයීම

කමිටුව 2020 වසර සඳහා වන ස්වයං-තක්සේරුව සමග ඇගයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කළ අතර එහි කාර්යසාධනය ඵලදායී බවට තීරණය කරන ලදුව ඇගයීම් ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම්දී තිබේ.

කේෂිලා ජයවර්ධන

සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව

2021 මාර්තු 19

කොළඹදී.

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටු වාර්තාව

කමිටුවේ සංයුතිය

2020 දී

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය.

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුලදී පහත නම් සඳහන් අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කළහ.

කේෂිලා ජයවර්ධන මිය
සභාපති/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 ජනවාරි 17 සිට 2020 පෙබරවාරි 7 දක්වා/2020 ඔක්තෝබර් 28 දින සිට)

ආචාර්ය තිරාන් ද සිල්වා මහතා
(2020 ජනවාරි 17 සිට 2020 මැයි 15 දක්වා) සභාපති (2020 පෙබරවාරි 07 සිට 2020 මැයි 15 දක්වා)

මනෝහරී අබේසේකර මිය
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 පෙබරවාරි 07 සිට 2020 අප්‍රේල් 22 දක්වා)

යූ ජී ආර් ආරියරත්න මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(සභාපති 2020 මැයි 15 සිට 2020 ඔක්තෝබර් 28 දින දක්වා)

එරංග ජයවර්ධන මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එම් ටී ජේ පෙරේරා මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 ඔක්තෝබර් 28 දින සිට)

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුවේ සාමාජිකයන් පිළිබඳ කෙටි විස්තරයක් ආයතනික පාලන වාර්තාව යටතේ පිටු අංක 40 සිට 44 දක්වා ඇතුළත් වේ.

2021 දී

2021 පෙබරවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව අහෝසි කරන තෙක් 2021 වසර තුල එම කමිටුව පහත නම් සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

කේෂිලා ජයවර්ධන මිය
සභාපති/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

යූ ජී ආර් ආරියරත්න මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එරංග ජයවර්ධන මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ආරාධනය මත නිතිපතා රැස්වීම් වලට සහභාගී වන නිලධාරීන්
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී කමිටුව වෙත තොරතුරු ලබාදෙන අතර ආරාධනය මත වසර තුලදී කමිටුවේ රැස්වීම් වලට සහභාගී විය.

කමිටුවේ ලේකම්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුවේ ලේකම් ලෙසද කටයුතු කරයි.

රැස්වීම්
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ මූල්‍ය වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටු රැස්වීම් 06 ක් පවත්වා තිබෙන අතර අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටු ප්‍රඥප්තිය ප්‍රකාරව කමිටු රැස්වීමක ගණපූරණය තුනෙන් දෙකකි.

වසර තුලදී රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ සහභාගීත්වය පහත පරිදි වේ.

නම	සහභාගීවීමට සුදුසුකම් ලත් රැස්වීම් ගණන	සහභාගීවූ රැස්වීම් ගණන
කේෂිලා ජයවර්ධන මිය	02	01
ආචාර්ය තිරාන් ද සිල්වා මහතා	02	02
එරංග ජයවර්ධන මහතා	06	06
මනෝහරී අබේසේකර මිය	01	01
යූ ජී ආර් ආරියරත්න මහතා	04	04
එම් ටී ජේ පෙරේරා මහතා	03	03

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටු වාර්තාව

කමිටුවේ ප්‍රඥප්තිය

1988 අංක 30 දරණ සංශෝධිත බැංකු පනතේ 76 J (1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරණ බැංකු පනත් නියාමනයේ දැක්වෙන බලපත්‍රලාභී විශේෂිත බැංකු වල ආයතනික පාලන මාර්ගෝපදේශ ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව ස්ථාපිත කරන ලදී.

තොරතුරු තාක්ෂණය කෙරෙහි බැංකුව විසින් විශ්වාසය තබනු ලැබීම සහතික කිරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අනුකූලව බැංකුවේ උපායමාර්ගික අරමුණු අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ නියාමන කමිටුව ස්ථාපිත කරන ලදී.

කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

නායකත්ව සහය, මෙහෙයුම් ව්‍යුහය හා බැංකුවේ තොරතුරු තාක්ෂණ ක්‍රමවේදය, වටිනාකම් බෙදාහැරීම, තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය, සම්පත් කළමනාකරණය හා කාර්යසාධන කළමනාකරණය සහතික කිරීම සඳහා තොරතුරු තාක්ෂණ පාලන ව්‍යුහ ස්ථාපනය කිරීම හා අධීක්ෂණය කිරීම සිදු කිරීම.

බැංකුවේ ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණයේ සහ ආපදා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධතීන්හි ප්‍රමාණාත්මකභාවය සහ ඵලදායීතාවය තහවුරු කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකු නියාමන හා අන්තර්ජාතික යහපරිචයන්ට අනුකූලව තොරතුරු තාක්ෂණ පද්ධති වල සුරක්ෂිතභාවය පිළිබඳ ප්‍රමාණවත්භාවය හා ඵලදායීතාවය සහතික කිරීම.

2020 වසර තුලදී කමිටුවේ ක්‍රියාකාරකම්

- බැංකුවේ මධ්‍යගත බැංකු විසඳුම ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය සමාලෝචනය කිරීම හා සකස් කර අවසන් කිරීම සිදු කරන ලදී.
- තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ප්‍රසම්පාදන අනුමත කිරීම හා නිර්දේශ කිරීම සිදු කරන ලදී.
- බැංකුවේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීම හා නිර්දේශ කිරීම සිදු කරන ලදී.

කමිටු ඇගයීම

2020 වසර සඳහා වන ස්වයං-තක්සේරුව සමග ඇගයීම් ක්‍රියාවලිය කමිටුව විසින් සම්පූර්ණ කරන ලද අතර එහි කාර්යසාධනය ඵලදායී බවට තීරණය කරන ලදුව ඇගයීම් ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම්දී තිබේ.

කේෂිලා ජයවර්ධන

සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ගික කමිටුව

2021 මාර්තු 19
කොළඹදී.

අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටු වාර්තාව

කමිටුවේ සංයුතිය

2020 දී

අධ්‍යක්ෂවරුන් සත්දෙනෙකුගෙන් සමන්විත හා 1995 අංක 28 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 8(1) වගන්තිය හා එහි උපවගන්තිය යටතේ පත් කරන ලද ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළු සාමාජිකයන් අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටුවේ සාමාජිකයන් ලෙස පත් කරන ලද අතර ඔවුන් සියළුදෙනාම අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම්, කුසලතා හා අත්දැකීම් වලින් යුක්ත වේ.

සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළදී පහත නම් සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කළහ.

කේෂිලා ජයවර්ධන මිය
සභාපති/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ආචාර්ය තිරාන් ද සිල්වා මහතා
සාමාජික/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ
(2020 අප්‍රේල් 22 සිට 2020 ඔක්තෝම්බර් 09 දක්වා)

එරංග ජයවර්ධන මහතා
සාමාජික/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ

මනෝහරී අබේසේකර මිය
සාමාජික/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එම් ටී ජේ පෙරේරා මහතා
සාමාජික/විධායක නොවන/
ස්වාධීන නොවන අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටුවේ සාමාජිකයන් පිළිබඳ කෙටි විස්තරයක් ආයතනික පාලන වාර්තාව යටතේ පිටු අංක 40 සිට 44 දක්වා ඇතුළත් වේ.

2021 දී

2021 පෙබරවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටුව අහෝසි කරන තෙක් 2021 වසර තුළ එම කමිටුව පහත නම් සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය.

කේෂිලා ජයවර්ධන මිය
සභාපති/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ආචාර්ය තිරාන් ද සිල්වා මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එරංග ජයවර්ධන මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

මනෝහරී අබේසේකර මිය
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එම් ටී ජේ පෙරේරා මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

එච් කේ ඩී ලක්ෂ්මන් ගාමිණී මහතා
සාමාජික/විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

ආරාධනය මත නිතිපතා රැස්වීම් වලට සහභාගී වන නිලධාරීන්
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

කමිටුවේ ලේකම්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි, පරිපාලන සහ අයකරගැනීම්), අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම්
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටු රැස්වීම් 06 ක් පවත්වා තිබේ.

වසර තුළදී රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ සහභාගීත්වය පහත පරිදි වේ.

නම	සහභාගීවීමට සුදුසුකම් ලත් රැස්වීම් ගණන	සහභාගීවූ රැස්වීම් ගණන
කේෂිලා ජයවර්ධන මිය	06	06
ආචාර්ය තිරාන් ද සිල්වා මහතා	02	00
එරංග ජයවර්ධන මහතා	06	04
මනෝහරී අබේසේකර මිය	06	06
එම් ටී ජේ පෙරේරා මහතා	06	06

අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටු වාර්තාව

කමිටුවේ ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටුවේ යොමු කිරීමේ අනුදේශ කෙටුම්පත සමාලෝචනය කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. කෙසේවුවත්, 2021 පෙබරවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි කමිටුව අහෝසි කරන ලදී. එබැවින්, කමිටුවේ ප්‍රඥප්තිය සකස් නොකෙරිණ.

කමිටුවේ කාර්යභාරය සහ වගකීම්

බැංකුවේ 50 වන සංවත්සර සැමරුම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් අලෙවි උපායමාර්ග හා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය මට්ටමේ අධීක්ෂණයක් හා මගපෙන්වීමක් පවත්වා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටුව ස්ථාපිත කරන ලදී.

2020 වසර තුළදී කමිටුවේ ක්‍රියාකාරකම්

- කමිටුව වෙත පැවරිය යුතු බල සීමා තීරණය කිරීම.
- බැංකුවේ 50 වන සංවත්සරය නිමිත්තෙන් සිදු කළ යුතු ක්‍රියාකාරකම් පිළිබඳව සාකච්ඡා කිරීම සහ ඒ පිළිබඳව අවසන් නිගමනයකට එළඹීම.
- බැංකුවේ වෙළඳපොළ කොටස සහ සන්නාම වටිනාකම ඉහළ නංවාගැනීම සඳහා නිසි අවධානය යොමු කළ යුතු කරුණු සාකච්ඡා කිරීම.

කමිටු ඇගයීම

2020 අප්‍රේල් මාසයේදී කමිටුව ස්ථාපිත කරන ලද අතර 2021 පෙබරවාරි 08 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විසුරුවා හැරිණ. එබැවින්, 2020 වසර සඳහා වන ස්වයං-තක්සේරුව සමග ඇගයීමේ ක්‍රියාවලිය සිදු නොකරන ලදී.



කේෂිලා ජයවර්ධන

සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල අලෙවි උපායමාර්ගික කමිටුව

2021 මාර්තු 19
කොළඹදී.

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

ගෝලීය වසංගතයක් සමඟ, 2020 වසර වෙනත් කිසිදු වසරකට වඩා වෙනස් විය. පීඩාවට පත් ගනුදෙනුකරුවන්ට සහය ලබාදෙමින් ව්‍යාපාර මෙහෙයුම්වල රඳා පැවතීම තුළ පෙර නොදුටුවිරූ අභියෝගයන්ට මුහුණදීමට බැංකුවලට සිදුවිය. ජාතික ඉතිරි කිරීමේ බැංකුව පීඩන තත්ත්වය යටතේ රජයට සහ ගනුදෙනුකරුවන්ට සහය ලබාදෙමින් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරන ලදි.

බැංකුවේ මෙහෙයුම් වාතාවරණය කෙරෙහි පැවති අඛණ්ඩ පීඩනය සහ වයිරසය පැතිරයාම නිසා දේශීය ආර්ථිකයේ ඇතිකළ අවදානම සහ එම අවදානම් තත්වයන් තවදුරටත් අපේක්ෂා කිරීම මත ණය ගුණාත්මකභාවය, ද්‍රවශීලතාව සහ අනෙකුත් නියාමන සහන පිළිබඳ නියාමක විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවල සහය ඇතිව ජාතික ඉතිරි කිරීමේ බැංකුව ස්ථාවර කාර්යාසාධනයක් පෙන්නුම් කර ඇත.

2020 වසරේදී බැංකුවේ අපේක්ෂිත ණය අලාභ වැඩි වුවත්, ආර්ථිකයේ පැවති අඩු පොළී අනුපාත හේතුවෙන් අනුපාත සංවේදී වත්කම් හා වගකීම්වල පරිණත කාලයන්හි ප්‍රතිමිලකරණ රටාව තුළ ලාභදායිත්වය ඉහල නැංවීමට බැංකුව සමත් විය.

2019 දී, 2019 අංක 12 දරණ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝගය පරිදි දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකුවක් (D-SIB) ලෙස වර්ගීකරණය නොකිරීම හේතු කොට ගෙන බැංකුවේ නියාමන අවම ප්‍රාග්ධන අවශ්‍යතාව පහත හෙලනු ලැබීය. අතිරේක පළමු පෙළ ප්‍රාග්ධන (AT1) සුරැකුම් පත් නිකුත් කිරීමත් සමඟ, අවම අවශ්‍යතාවන්ට වඩා ඉහළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත පිළිබඳ නියාමන අවශ්‍යතා සපුරාලීමට බැංකුවට හැකි විය.

රටේ පැවති විදේශීය ණය ලබාගැනීමට ඇති සුදුසුකම හා විදේශීය ණය පියවීමේ හැකියාව (governing profile) අඩුව ගියද බැංකුවෙහි අභ්‍යන්තර අරමුදල් උපයෝගීකරගෙන, අමතර පිරවැයකින් තොරව හා අරමුදල් අවශ්‍යතා මත අමතර පීඩනයකින් තොරව බැංකුව ලබාගත් විදේශීය ණය මුදල් වල වාරික නිසිකලට ගෙවීමට බැංකුව සමත් විය.

මූල්‍ය පද්ධතිය හා ආර්ථිකය සුරක්ෂිත කිරීම පිණිස, වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාර සහ පුද්ගලයින් වෙත ලබා දෙන ලද සහන පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝග සහ රජයේ වැඩසටහන්වලට බැංකුව අනුගත විය.

කොවිඩ් 19 අර්බුදය 2007 - 2009 මූල්‍ය අර්බුදයෙන් පසු ගෝලීය මූල්‍ය පද්ධතිය මුහුණ දෙන ලද දැඩි පරීක්ෂණයක් වන අතර, අභියෝග තවදුරටත් දුෂ්කරතාවයට පත් කරමින් එහි දීර්ඝ කාලීන බලපෑම් තවමත් දැනගත නොහැක. වඩා අඩු පොළි අනුපාත සහ සේවාදායකයින්ගේ කටයුතු සහ ආයෝජන අඩුවිම හේතුවෙන් බැංකුව ආන්තික සහ පරිමා සම්පීඩනයට මුහුණ දුන්නේය. සම පාර්ශවයන් අතර ණය ගුණාත්මකභාවය පිරිහීම, වඩා ඉහළ පැහැර හැරීමේ අනුපාතවලට හේතු වූ අතර, ලාභදායිතාව සහ නියාමන ප්‍රාග්ධනය කෙරෙහි පීඩනය වැඩි විය.

බැංකුවේ යහපත් අවදානම් පාලන රාමුව මගින් සමස්ත අවදානම් පැතිකඩ, පවත්නා වසරේ කාර්යසාධනය සහ දීර්ඝ කාලීන තිරසාරත්වය කෙරෙහි අවම අහිතකර බලපෑම සමඟ පාදක වූ අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සහ දුෂ්කර වසර ගෙවා දැමීමට බැංකුව ශක්තිමත් කරන ලදී.

කොවිඩ්-19 න් පීඩිත පරිසරයක් තුළ අවදානම් සහ ප්‍රාග්ධන මට්ටම් සහ ණය ගුණාත්මකභාවය, ලාභදායිතාව, ද්‍රවශීලතාව සහ බැංකුවේ නියාමන ප්‍රාග්ධන මට්ටම කෙරෙහි අහිතකර බලපෑම් අවම කිරීමට බැංකුව විසින් ගනු ලැබූ කළමනාකරණ මූලාරම්භයන් පිළිබඳව අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණ වාර්තා සාකච්ඡා කරයි.

අවදානම් පාලනය

ජාතික ඉතිරිකිරීමේ බැංකුව එහි අවදානම් කළමනාකරණ පරිචයන් ඉහළ පාලන ප්‍රමිතියක් පිළිඹිබු කරන බව සහතික කිරීම සඳහා කැපවී සිටී. මෙමගින්, අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට ඵලදායීව හා විචක්ෂණශීලීව අවදානම දැරීමට උපකාරී වේ. අධ්‍යක්ෂ මණ්ඩලය පාලන කාර්යරාමුවේ ඉහළම මට්ටමේ ක්‍රියාත්මක වෙයි.

බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින්, බැංකුව මුහුණදෙන විවිධ අවදානම් කළමනාකරණය කිරීම සඳහා ඒකාබද්ධ කාර්යරාමුවක් සකස් කරන ලද බව, අභ්‍යන්තර ප්‍රතිපත්ති නිසි පරිදි ස්ථාපිත කර ඇති බව හා ඒවාට අනුකූල වී ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය, සිය අවදානම් අධීක්ෂණ භූමිකාව ඔස්සේ සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සහය ඇතිව කොවිඩ් 19 හමුවේ වර්ධිත අවදානම් ක්ෂේත්‍ර කළමනාකරණය කිරීමට සහ නියාමක සහ රජය විසින් ලබාදෙන ලද උපදෙස්වලට අනුකූලවීමට තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. මූල්‍ය සහ මූල්‍ය නොවන අවදානම් වර්ග කළමනාකරණය කර බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කාර්යරාමුවට අනුකූලව වාර්තා කරන ලදි.

පාලන කමිටු: අධ්‍යක්ෂ මණ්ඩල මට්ටම →

කමිටුව	වගකීම
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)	අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඵලදායී අවදානම් කළමනාකරණ කාර්යරාමුවක් නිර්දේශ කිරීම සඳහා ඊට පැවරී ඇති අවදානම් ආශ්‍රිත වගකීම් සපුරාලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වෙයි. අවදානම් අභිරුචිය ස්ථාපිත කිරීම සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (Internal Capital Adequacy Assesment Process –ICAAP) නිර්දේශ කිරීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ප්‍රධාන කාර්යභාරය වේ.
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අභ්‍යන්තර පාලන ක්‍රියාවලියේ සහ අභ්‍යන්තර විගණන කාර්යයේ ඵලදායිත්වය සහ කාර්යක්ෂමතාව නියාමනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව තොරතුරුවල අවංකකම. සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල භාවිතය සහතික කරන අතර නෛතික හා නියාමන අනුකූලතා ගැටළු නියාමනය කරයි.

වගුව 16 අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අවදානම් කළමනාකරණ කමිටු

දැනුවත් තීරණ ගැනීම සඳහා වඩා යහපත් තීක්ෂණ බුද්ධිය ලබාදෙමින් සියලූම ව්‍යාපාර මාර්ගවල පවත්නා සහ ඇතිවන අවදානම්, නැමියාවන් සහ ගැටළු හඳුනා ගැනීම සහ අවබෝධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින් කළමනාකරණ කමිටු කාර්යරාමුවක් ස්ථාපිත කිරිම මගින් මූල්‍ය සහ මූල්‍ය නොවන අවදානම් පිළිබඳ පාලනයේ දැඩිබව ශක්තිමත් කිරීමට ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය පියවර ගෙන ඇත. කොවිඩ් 19 වසංගතය සමඟ අවදානම්/ප්‍රතිඵල සහ මෙහෙයුම් කළමනාකරණය කිරීමේදි කළමනාකරණ කමිටු වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදි.

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

පාලන කමිටු: ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම →

කළමනාකරණ කමිටුව	වගකීම
ණය කමිටුව (CC)	ණය කමිටුව යනු බැංකුවේ ණයවල ණය පැහැර හැරීමේ අවදානම, මෙහෙයුම් සහ නෛතික අවදානම් ඇතුළුව ස්ථර I සහ ස්ථර II පාලනය කිරීමේ ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුවයි. ණය කමිටුව බැංකුවේ ණය ප්‍රතිපත්ති කලින් කල සමාලෝචන/ක්‍රියාත්මක කිරීම සිදුකරන අතර, ණය පහසුකම් අනුමත කිරීමට එනම් පවරන ලද බල සීමාවන් තුළ පාරිභෝගික ණය සහ ආයතනික ණය (ව්‍යාපෘති ණය, ආයතනවලට ණයදීම, බැංකු සහ මූල්‍ය ආයතනවලට ණයදීම සහ රජයට අයත් ව්‍යවසාය/රජයට ණයදීම යනාදිය) සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ණය පහසුකම් නිර්දේශ කිරීමට සහය වේ.
වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව (ALCO)	වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව යනු බැංකුවේ වෙළඳපොළ අවදානම සහ ද්‍රවශීලතා අවදානම පාලනය කිරීමේ වගකීමට බැඳි ඇති ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුවයි. මෙම කමිටුව පූර්ව නිශ්චිත පිළිගතහැකි අවදානම්/ප්‍රතිඵල අනුපාතය අත්කර ගැනීමට වත්කම් සහ වගකීම්වල පරිමාව, මුසුව, කල්පිරීම, අනුපාත සංවේදිතාව, ගුණාත්මකභාවය සහ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමට අරමුණු කරයි. වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවේ කාර්යයන්ට කෙටි කාලීන ලාභ, දිගුකාලීන ඉපයීම් සහ බැංකුවේ දිගුකාලීන නුබුන්වත්කම ස්ථාපිත කිරීමේ අරමුණ ඇතිව ප්‍රාග්ධන ව්‍යුහය, නිෂ්පාදන මිලකරණය, අරමුදල්කරණය සහ ආයෝජන සලකා බලමින් ශේෂ පත්‍රය සහ ඉන් බාහිර තත්ත්වයන් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති තීරණ ගැනීම ඇතුළත්ය.
ආයෝජන කමිටුව (IC)	ආයෝජන කමිටුව යනු බැංකුවේ ආයෝජනයට අදාළ ණය අවදානම, වෙළඳපොළ අවදානම, මෙහෙයුම් අවදානම් ඇතුළුව ස්ථර I සහ ස්ථර II පාලනය කිරීමේ ඉහළ මට්ටමේ කළමනාකරණ කමිටුවයි. මෙම කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ආයෝජන නිර්දේශ කරමින් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය, කොටස්වල ආයෝජනය [මූලික මහජන පිරිනැමීම් (IPOs) සහ ද්විතියික වෙළඳපොළ මෙහෙයුම්], සහ පවරන ලද බලතල සීමාවන් තුළ අනෙකුත් ආයෝජන අනුමත කිරීමේ නිරතවීමට බැංකුවේ ආයෝජන ප්‍රතිපත්තිය සමාලෝචනය ක්‍රියාත්මක කරයි.
මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව (ORMC)	මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව බැංකුවේ මෙහෙයුම් අවදානම කළමනාකරණය කරන අතර, මෙහෙයුම් අවදානම් කළමනාකරණ ශිල්පක්‍රම ක්‍රියාත්මක කර, බැංකුවේ මෙහෙයුම් අලාභ අවම කිරීම පිණිස අභ්‍යන්තර පාලනයේ අවංකකම පවත්වා ගැනීම, ගනුදෙනු ක්‍රියාවලිය තුළ දෝෂ අඩු කිරීම, වංචා වැළැක්වීම යනාදිය අරමුණ කරන ක්‍රියාමාර්ග ගනී.
තොරතුරු ආරක්ෂණ කමිටුව (ISC)	තොරතුරු ආරක්ෂණ කමිටුව බැංකුවේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පාලනය සඳහා ස්ථාපිත කර ඇත. සියලුම තොරතුරු පද්ධති සහ අදාළ යටිතල පහසුකම් සයිබර් තර්ජනවලින් ආරක්ෂිත සහ සුරක්ෂිත බවට තොරතුරු ආරක්ෂණ කමිටුව නියාමනය කරයි. ඊට අමතරව, මෙම කමිටුව ක්ෂේත්‍රයේ අවශ්‍ය ප්‍රමිති සහ සහතික කිරීම් සඳහා තොරතුරු ආරක්ෂණය ආශ්‍රිත නියාමන අවශ්‍යතා සහ අනුකූලතාවය නියාමනය කරයි.

වගුව 17 ▸ කළමනාකරණ කමිටු



රූපසටහන 05 ▸ අවදානම් කළමනාකරණ පාලන ව්‍යුහය

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

කොවිඩ්-19 පීඩන පරිසරයේ බලපෑම් අවබෝධ කර ගැනීමට සහ බලපෑම් අවම කිරීමට සක්‍රියව ප්‍රතිචාරාත්මකවීමට කළමනාකරණය, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවෙමින් දෙවන ආරක්ෂණ ස්ථරය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) විසින් මෙහෙයවන අවදානම් කළමනාකරණ අංශය (RMD), අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සහ කළමනාකරණ කමිටු සඳහා සහභාගි වේ. අවදානම් කළමනාකරණ අංශය ණය අවදානම් කළමනාකරණ ඒකකය (CRMU), වෙළඳපොළ අවදානම් කළමනාකරණ ඒකකය (MRMU)/භාණ්ඩාගාර මැදි කාර්යාලය (TMO) සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය (ORMU) යන ඒකක තුනකින් සමන්විත වේ. අවදානම් කළමනාකරණ අංශය අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්ති, ක්‍රියාවලි සහ අවදානම සීමාවන් අනුව සියලුම අවදානම් ස්වාධීනව නියාමනය කරයි. අවදානම් ඇගයීම්වල ස්වාධීන සොයා ගැනීම්, අවදානම් කළමනාකරණය ඇතිකිරීමට සහ වැලැක්වීමේ සහ නිවැරදි කිරීමේ පියවර ගැනීම සඳහා කළමනාකරණ කමිටු, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

අනුකූලතා නිලධාරී විසින් මෙහෙයවන අනුකූලතා අංශය බැංකුවට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ අනෙකුත් නියාමන සහ රජයේ බලධාරීන්ගේ සියලුම නිති, රෙගුලාසි, නියෝග සහ මාර්ගෝපදේශවලට අනුකූලතාව සහතික කිරීමට බැඳී සිටී. මෙම අංශය වෙනස්වන නියාමන සහ අනුකූලතා පරිසරය විධිමත් ලෙස යාවත්කාලීන කරන අතර, නව නියෝග අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර සුදුසු පරිදි සන්නිවේදනය කරන බවට අදාළ අංශ/ ශාඛා පසු විපරම් කරයි.

අවදානම් කළමනාකරණ කාර්යරාමුව →

මනා ආයතනික පාලන මූලධර්ම සමග බද්ධ වූ ත්‍රිත්ව ආරක්ෂණ ආකෘතිය (Three Lines of Defence) බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යරාමුව නිර්මාණය කරයි. විචක්ෂණශීලී අවදානම් කළමනාකරණයක් සහතික කිරීම සඳහා අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, අවම කිරීම, නියාමනය කිරීම සහ වාර්තා කිරීම පිණිස උපායමාර්ග, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නිසි පරිදි සම්පාදනයට සහ ක්‍රියාත්මක කිරීමට බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යරාමුව අවස්ථාව උදාකර දෙයි

ත්‍රිත්ව ආරක්ෂණ ආකෘතිය ඔස්සේ අවදානම් හිමිකම සම්බන්ධයෙන් වගවීම සිදුවන අතර, සම්පූර්ණ වටිනාකම් දාමය සලකා බලන ප්‍රශස්ත දිගු කාලීන අවදානම සහ ප්‍රතිඵල තීරණ ගැනීමට බැංකුව වඩාත් යහපත් මට්ටමක පවත්නා බව මෙම ආකෘතිය මගින් හඳුනාගනී. අවදානම සහ අනුකූලතා කාර්යයන් මගින් අවදානම කළමනාකරණය කිරීමට තීරණ ගැනීම සඳහා වගකීමට බැඳී සිටින ව්‍යාපාර හිමිකරුවන් සඳහා මඟපෙන්වීම, උපදේශය සහ සහතික කිරීම ලබා දෙන අතර, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනයන් සහ පාලනයේ ඵලදායිතාවය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට, නියාමකයින්ට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට අභ්‍යන්තර විගණනය මගින් ස්වාධීන සහතික කිරීම ලබා දේ.

නියාමකයින් සහ බාහිර විගණකවරුන් විසින් අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණ කාර්යරාමුව ශක්තිමත් කිරීමට වටිනා යෙදවුම් ලබා දෙන අතර, එය පාර්ශ්වකරුවන් වෙත අමතර සහතික කිරීමකි.

අවදානම් සංස්කෘතිය →

අවදානම් සංස්කෘතිය යනු නිශ්චිත රීති, රෙගුලාසි හෝ වෙළඳපොළ සංඥා නොමැති අවස්ථාවලදී අවදානම් අවබෝධ කරගැනීම සහ මනා විනිශ්චයකට එළඹීම සඳහා සේවා නියුක්තිකයන් සහ අධ්‍යක්ෂවරුන් තුළ ඇති කරන වටිනාකම්, කුසලතා සහ පරිචයන් සමූහයකි. සියළු මට්ටම්වලට අයත් සේවා නියුක්තිකයන් විසින් ඔවුන්ට අදාළ ව්‍යාපාරික මෙහෙයුම්වලදී පැන නගින අවදානම් හඳුනාගනී. අවදානම් සංස්කෘතිය, අවදානම සහ ඵල අතර තුලනය සහ අවදානම් හා ප්‍රාග්ධන මට්ටම් කළමනාකරණය සහතික කිරීම සඳහා උපකාර වන ප්‍රධාන සාධකයක් වේ.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති →

ප්‍රතිපත්තිය	ආවරණය
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය	බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කාර්යරාමුව
ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය	පාරිභෝගික ණය, ආයතනික ණය, බැංකු හා මූල්‍ය ආයතනවලට ණය, රජයට අයත් ව්‍යවසාය සහ රජයට අයත් ව්‍යාපාරික ආයතන, ණය හඳුනාගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය සහ අවම කිරීම සඳහා කාර්යරාමුව
වෙළඳපොළ හා ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය	වෙළඳපොළ සහ ද්‍රවශීලතා අවදානම හඳුනාගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය සහ අවම කිරීම සඳහා කාර්යරාමුව.
මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය	මෙහෙයුම් අවදානම හඳුනාගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය සහ අවම කිරීම සඳහා කාර්යරාමුව.
පීඩන පරීක්ෂණ ප්‍රතිපත්තිය	බැංකුවේ පීඩන පරීක්ෂණ කාර්යරාමුවේ දළ සැලැස්ම
අවදානම් කළමනාකරණ අනාවරණ ප්‍රතිපත්තිය	අවදානම් කළමනාකරණ කාර්යයන් සම්බන්ධයෙන් අනාවරණ අවශ්‍යතා
ICAAP කළමනාකරණ ප්‍රතිපත්තිය	අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) පැවැත්වීම සඳහා කාර්යරාමුව
මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති කාර්යරාමුව තුළ අනෙකුත් ප්‍රතිපත්ති	
සේවා බාහිරින් ලබා ගැනීමේ ප්‍රතිපත්තිය	බාහිර කටයුතු පිළිබඳ මාර්ගෝපදේශ, ක්‍රියාපටිපාටි, අවදානම් අවම කිරීම සහ තොරතුරු ආරක්ෂණ කළමනාකරණය
තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය	බැංකුව සහ එහි ජාලය තුළ තොරතුරුවල ආරක්ෂාවට අදාළ නීති සහ රෙගුලාසිවල දළ සැලැස්ම
ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම	ආපදා අවස්ථාවන් හි දි ව්‍යාපාරයේ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා මාර්ගෝපදේශ, ක්‍රියාපටිපාටි
අනුකූලතා ප්‍රතිපත්තිය	බැංකුවේ අනුකූලතා අවදානම කළමනාකරණය සඳහා කාර්යරාමුව
මුදල් විශුද්ධිකරණ විරෝධි (AML) ප්‍රතිපත්තිය	බැංකුවේ මුදල් විශුද්ධිකරණ විරෝධය සහතික කිරීම සඳහා මාර්ගෝපදේශ, ක්‍රියාපටිපාටි

වගුව 18 ▸ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අවදානම් කළමනාකරණ කමිටු

අවදානම් අභිරුචි කාර්යරාමුව (RAF)

අවදානම් අභිරුචි කාර්යරාමුව අවදානම් කළමනාකරණ කාර්යරාමුවේ ප්‍රධාන සංරචකයකි. ඉන් අපේක්ෂිත ඉදිරිය දකින අවදානම් පැතිකඩ පෙන්නුම් කරන අතර එය උපායමාර්ගික ප්‍රතිපත්ති ක්‍රියාවලි ලබා දේ.

බැංකුව සිය අභිමතාර්ථ ඉටු කරගැනීමේදී, දැරීමට අපේක්ෂා කරන අවදානම් මට්ටම අවදානම් අභිරුචිය වේ. එමගින් ව්‍යාපාරික සහ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා පිළිඹිබු වේ.

බැංකුවේ අවදානම් අභිරුචි කාර්යරාමුව එහි ව්‍යාපාර මෙහෙයුම් සහ අවදානම් ගැලපීම තුළින් වටිනාකම ඉහළ නංවයි. එය පිළිගතහැකි අවදානම් මට්ටම් තුළ රඳා පැවතෙමින් පිළිගත් අවදානම සඳහා ප්‍රතිඵලවල සුදුසු තුලනයක් ලබාදීමට ව්‍යාපාර කටයුතු සැලසුම් කිරීම සඳහා මඟපෙන්වීමක් ලෙස කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත අවදානම් අභිරුචි කාර්යරාමුව තුළ පැහැදිලි කළ ප්‍රධාන අංගවලට පහත දෑ ඇතුළත්ය:

- ව්‍යාපාර කිරීමේ කොටසක් ලෙස බැංකුව පිළිගන්නා අවදානම්, ඒවා සක්‍රීය අවදානම් කළමනාකරණය තුළින් පාලනය කෙරේ.
- ව්‍යාපාර කිරීමේ කොටසක් ලෙස බැංකුව දරන අවදානම්, පිළිගතහැකි රුචිය තුළ රඳා පැවතීමට සක්‍රීයව කළමනාකරණය කෙරේ.
- බැංකුවට ශුන්‍ය අවදානම් සහන සීමාසහිත අවදානම්

බැංකුවේ වටිනාකම් සහ මූල්‍ය තත්ත්වය කෙරෙහි ඇතිවිය හැකි අහිතකර බලපෑම් අවම කරන ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පරාමිති භාවිතා කරමින් බැංකුව ආයතනික මට්ටමේදී අවදානම් අභිරුචිය සකස් කිරීම සඳහා ඉහළ සිට පහළට යන ප්‍රවේශය භාවිතා කරයි. ආයතනික මට්ටමේදී ප්‍රමාණාත්මක අවදානම් අභිරුචිය මගින් ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය, ද්‍රවශීලතාවය, ලාභදායීතාවය සහ අනෙකුත් විචක්ෂණශීලී අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කෙරේ.

ගුණාත්මක ප්‍රකාශනවල බැංකුවට ශුන්‍ය අවදානම් අභිරුචියක් පවත්නා අවදානම් ප්‍රධාන වශයෙන් ඇතුළත් වේ. ව්‍යාපාරික මාර්ග මට්ටමේදී, ණය, ස්කන්ධය, පොලී අනුපාතය, විදේශ විනිමය වෙළෙඳාම සහ මෙහෙයුම් ආශ්‍රිත අවදානම් කාණ්ඩ මගින් අවදානම් අභිරුචි සීමා තීරණය කෙරේ.

වඩා විචක්ෂණශීලී අවදානම් අභිරුචියන් ස්ථාපිත කිරීමේදී ඉහළ සිට පහළට, පහළ සිට ඉහළට යන ප්‍රවේශයන් දෙයාකාරයෙන්ම, ආංශික මට්ටමින් හෝ වෙළඳ නිමැවුම් මට්ටමින් පවතින සීමා ව්‍යුහයන්, තීරණය කරන ලද අයවැය මට්ටම් හා මෙහෙයුම් අවදානම් දර්ශක භාවිතා කරයි.

අවදානම් අභිරුචි උපකරණ පුවරුව - උපායමාර්ගික මට්ටම

සංරචකය	මිනුම %	2020 - තත්‍ය	අවදානම් රුචියට අනුව
ලාභදායිතාව	ස්කන්ධය මත ඉපයීම	20.67	✔
	වත්කම් මත ඉපයීම	1.24	✔
ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව	CET 1	12.03	✔
	පළමු පෙළ	13.65	✔
	මුළු ප්‍රාග්ධනය	16.45	✔ (අළු)
ද්‍රවශීලතාව	LCR (All)	307.22	✔
	SLAR	69.10	✔
	NSFR	169.00	✔
තෝලනය	තෝලනය	6.64	✔

අවදානම් මට්ටම

✔ අවදානම් අභිරුචි සීමාව තුළ ✔ (අළු) උපරිම ඉවසුම් සීමාව තුළ ✔ (ලා අළු) උපරිම ඉවසුම් සීමාවට පහළ

වගුව 19 ‣ ප්‍රධාන අවදානම් අභිරුචි පරාමිති

බැංකුවේ ලාභදායිතාව 2019 වසරට සාපේක්ෂව 2020 දී වර්ධනය විය. ප්‍රධාන උපායමාර්ගික මට්ටමේ අවදානම් අභිරුචි දර්ශක අවදානම් අභිරුචි සීමාව තුළය.

බැංකුව ලාභදායිතාව, ද්‍රවශීලතාව සහ තෝලනය සඳහා නියමිත අවදානම් අභිරුචි සීමාවන්ට වඩා ඉහළ පැවතුණි. ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය නියාමන අවමය තුළ විය. කෙසේවෙතත්, II ස්ථරයේ අවදානම් සහ පීඩන පරීක්ෂණය ආවරණය කිරීමට ස්වාරක්ෂකයක් ලෙස ඉහළ මට්ටමේ නියාමන ප්‍රාග්ධනය පවත්වා ගැනීමට බැංකුව අපේක්ෂා කරයි.

ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාව, මෙහෙයුම්, අනුකූලතාව, කීර්තිනාමය සහ උපායමාර්ගය වැනි අභ්‍යන්තර සහ බාහිර මූලාශ්‍රයන් මගින් ඉදිරියට යන මූල්‍ය සහ මූල්‍යමය නොවන අවදානම්වලට අඛණ්ඩව නිරාවරණය වීමේ ප්‍රතිඵලයක් ලෙස, බැංකුවේ කාර්යසාධනය සහ සමස්ත කාර්යයන් කෙරෙහි අහිතකර බලපෑම අවම කිරීම සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කාර්යරාමුවක් බැංකුව විසින් ප්‍රවර්ධනය කිරීම අවශ්‍යයෙන්ම කළ යුතුය.

අවදානම් කළමනාකරණ කාර්යරාමුව ඒකාබද්ධ ආකාරයකින් ක්‍රියාත්මක කෙරෙන අතර, එය දැනට පවතින සහ ඉදිරියට ඇතිවිය හැකි අවදානම් වලට අදාළ සුදුසු පාලනක්‍රම ස්ථාපිත කර ඇත.

ණය අවදානම

ණය අවදානම යනු යම්කිසි ණය කරුවෙකු හෝ ප්‍රතිපාර්ශවයක් බැංකුවට ඉටුකල යුතු මූල්‍ය හෝ ගිවිසුම්ගත වගකීම් නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත් වීම හෝ අසමත්වීම හේතු කොට ගෙන මූල්‍ය ප්‍රවාහයට බාධාවීම හෝ අයකරගැනීමේ පිරිවැය ඉහලයාම නිසා ඇතිවිය හැකි මූල්‍ය අලාභයේ අවදානමයි. එය සෘජු ණය දීමේ කටයුතුවලින් මෙන්ම බැඳීම් සහ අවිනිශ්චිතතාවන් තුළින්ද ඇති විය හැකිය.

බැංකුව මුහුණ දෙන ණය අවදානම තුළ ප්‍රතිපාර්ශවයන් විසින් ණය පැහැරහැරීමේ අවදානම, සංකේන්ද්‍රණ අවදානම, ගිවිසුම් ප්‍රකාරව ණය නොපියවීමේ අවදානම සහ ශේෂ වූ ණය අවදානම ඇතුළත්ය.

කොවිඩ්-19 වසංගතය හේතු කොට ගෙන ප්‍රධාන වශයෙන් රටතුළ පැවති අභියෝගාත්මක ආර්ථික වාතාවරණය හමුවේ, ණය අවදානමට උපරිම නිරාවරණය 2020 දී රු.බි. 1,317 දක්වා 19.5% කින් වර්ධනය වූ අතර, එය බැංකුවේ මුළු වත්කම්වලින් 96.6% ක් නියෝජනය කරයි. ණය සහ අත්තිකාරම්, සහ ණය හා අනෙකුත් උපකරණ බැංකුවේ ණය අවදානමේ ප්‍රධාන මූලාශ්‍ර වේ.

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

දෙසැම්බර් 31 දිනට	2020 උපරිම ණය අවදානම් නිරාවරණය රු. '000	2019 උපරිම ණය අවදානම් නිරාවරණය රු. '000	වෙනස %
මුදල් හා මුදලට සමාන දෑ	**6,491,963**	5,376,715	20.7
ශ්‍රී ලංකා මහ බැංකුව සමග පවතින ශේෂ	**–**	–	–
බැංකුවල තැන්පත් කිරීම්	**13,253,499**	12,364,469	7.2
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**19,897**	11,622	71.2
ලාභ හෝ අලාභ ඔස්සේ හඳුනාගන්නා ලද මූල්‍ය වත්කම්			
– සාධාරණ වටිනාකම මත තක්සේරු කරන ලද	**11,221,746**	11,459,882	-2.1
– සාධාරණ වටිනාකම මත නම් කරන ලද	**–**	–	–
ක්‍රමක්ෂයවූ පිරිවැය මත මූල්‍ය වත්කම්			
– ණය හා අත්තිකාරම්	**516,795,160**	454,394,957	13.7
– ණය හා වෙනත් උපකරණ	**754,233,344**	615,634,321	22.5
වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකම් මත තක්සේරු කරන ලද මූල්‍ය වත්කම්	**15,271,822**	3,478,811	339.0
දළ එකතුව	**1,317,287,431**	1,102,720,778	19.5

වගුව 20 ශේෂ පත්‍රයෙන් නිරාවරණය වන උපරිම ණය අවදානම

පාරිභෝගික ණය කළඹ, ණය වර්ධනයට ඉහළම දායකත්වයක් ලබා දී ඇති අතර, එය වාර්ෂිකව 24.3%කින් වැඩි වී ඇත. එමෙන්ම ආයතනික ණය කළඹ වාර්ෂිකව 9.8%කින් වැඩි වී ඇත. පුද්ගල ණය කළඹ 58.6% දක්වා සංයුතිය වැඩි කරමින් වසර තුළ ඉහළම වර්ධනය (41.2%) වාර්තා කළේය.

ශේෂ පත්‍රයේ හා ශේෂ පත්‍රයෙන් පිටත පවතින ණය ප්‍රමාණ

ප්‍රස්තාරය 22



● ශේෂ පත්‍රයේ ණය ප්‍රමාණ
● ශේෂ පත්‍රයෙන් පිටත - ණය ප්‍රමාණ

ණය හා අත්තිකාරම් - කළඹ සංයුතිය

ප්‍රස්තාරය 23



● පුද්ගල
● ආයතන

පුද්ගල ණය කළඹ

ප්‍රස්තාරය 24



	2020	2019
අ - නිවාස හා දේපළ ණය	**21.0%**	24.4%
ආ - පුද්ගලික ණය	**58.6%**	51.6%
ඇ - තැන්පතු මත ණය	**8.3%**	10.9%
ඈ - උකස්	**11.6%**	12.5%
ඉ - රථ වාහන	**0.5%**	0.6%

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

ආයතනික ණය කළඹ ප්‍රස්තාරය 25

2020



2019



	2020	2019
අ - ආයතනික ණය - රාජ්‍ය ව්‍යවසාය හා ශ්‍රී ලංකා රජය	**71.4%**	71.3%
ආ - බැංකු සඳහා ණය	**8.2%**	10.5%
ඇ - ආයතනික ණය - වෙනත්	**2.9%**	11.1%
ඈ - වෙනත් උපකරණ	**17.5%**	7.1%

රජයට අයත් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වශයෙන්, ජාතික ඉතිරිකිරීමේ බැංකුව කොවිඩ්වලින් පීඩිත ජාතිය ගොඩ නැගීමේ රජයේ මූලාරම්භයන්හි සැලකියයුතු ලෙස දායකවිය. කොවිඩ්වලින් පීඩිත පුද්ගල සහ ව්‍යාපාර ගනුදෙනුකරුවන්ට පිරිනමන ලද පුනරුද පහසුකම් සඳහා දායකවීමට ණය විලම්භන කාලසීමා, පොළී අනුපාත සහන සහ අනෙකුත් සහනයන් බැංකුව විසින් ප්‍රදානය කරන ලදී.

2020 දී ණය වර්ධනය පරිභෝජන අරමුණු සඳහා ප්‍රදානය කරන ලද පාරිභෝගික ණය මගින් ප්‍රධාන වශයෙන් සිදු විය. වසර තුළ වැඩි වූ ණය පැහැර හැරීමේ අවදානමක් පැවතියද, එමගින් වත්කම්වල ගුණාත්මකභාවය කෙරෙහි සිදුකරන සම්පූර්ණ බලපෑම ණය විලම්භන කාලය මගින් අඩුවන ලදී. එය 2021 මාර්තු දක්වා බලාත්මක වන අතර නියාමන සහ මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වර්ගීකරණය සහ හානිකරණය හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නම්‍යතාවන් ලබාදෙන ලදී.

පූර්ව/පෙරටුගාමී ණය අවදානම් කළමනාකරණයට සහයවීම සඳහා, ණය විලම්භන කාලය කල්පිරීමෙන් පසු අක්‍රිය ණය වැඩිවීම සඳහා එමගින් වියහැකි බලපෑම, අපේක්ෂිත ණය අලාභ ආදර්ශය භාවිතා කරමින් හානිකරණ වෙන්කිරීම සහ ලාභදායිතාව කෙරෙහි එමගින් වන බලපෑම විවිධ ක්‍රමවේද යටතේ තක්සේරු කරන ලදී.

ණය අවදානම් කළමනාකරණය →

ප්‍රතිපාර්ශව අවදානම

ප්‍රතිපාර්ශව විසින් එකඟ වූ නියමයන් සහ කොන්දේසි යටතේ තම මූල්‍ය වගකීම් ඉටුනොකිරීමෙන් ප්‍රතිපාර්ශව අවදානම ඇතිවන අතර මෙය බැංකුවේ ණය අවදානමෙහි වඩාත් සැලකිය යුතු අංගය වේ.

නියාමන ආයතනය සහ බාසල් අවශ්‍යතා යටතේ නිකුත් කරන ලද රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට අනුකූලව සකස් කරන ලද ණය අවදානම් කළමනාකරණ ක්‍රමවේද සහ උපකරණ වලින් ප්‍රතිපාර්ශව ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සමන්විත වේ. ප්‍රතිපාර්ශ්ව ණය නිරාවරණ කළමනාකරණය කිරීමේදී ගණුදෙනුකරුවන් පිළිබඳ විශ්ලේෂණය (CDD), ණය සීමා කාර්යරාමුව, ණය අභිරුචිය සහ ඉවසුම් කාර්යරාමුව, ශ්‍රේණිගත කිරීමේ ආකෘති, ණය නිකුත් කිරීමෙන් පසු ණය පහසුකම් නිරීක්ෂණය සහ ණය සමාලෝචනය කිරීමේ යාන්ත්‍රණය බැංකුවට පහසුකම් සපයයි.

2020 දෙසැම්බර් 31 දිනට 2.8% ක් වූ බැංකුවේ දළ අක්‍රිය ණය අනුපාතිකය ක්ෂේත්‍රයේ අක්‍රිය ණය අනුපාතිකය වූ 4.9% ට වඩා අඩු මට්ටමක පැවතිණ. SLFRS 9 වර්ගීකරණයට අනුව, 2020 වසර සඳහා, හානිකරණය වූ ණය (අදියර 3) රු.බි. 16.9 ක් (2019 දී රු.බි. 9.1) වූ අතර එය බැංකුවේ දළ ණය හා අත්තිකාරම්වලින් 3.2% (2019 දී 2.0%)ක් විය. වසර තුළ හානිකරණය වූ ණය සහ වෙනත් උපකරණ වාර්තා වී නොමැත.

ණය අවදානම් සමාලෝචනය →

අවදානම් සාධකය	විස්තරය	නිරීක්ෂණය/කළමනාකරණය සඳහා භාවිත මෙවලම්	නිරාවරණය	බලපෑම*
ප්‍රතිපාර්ශව අවදානම	බැංකුව සමග එකඟ වූ නියමයන් ප්‍රකාරව ගිවිසුම්ගත බැඳීම් සපුරාලීමට ප්‍රතිපාර්ශ්වයන්ගේ අසමත්වීම හේතු කොට ගෙන ඇති වියහැකි බලපෑම.	• සීමා නිරීක්ෂණය • පූර්ව අනතුරු හැඟවීමේ දර්ශක නිරීක්ෂණය කිරීම, අක්‍රිය ණය ප්‍රවණතා (NPLs) • ණය සමාලෝචනය කිරීමේ යාන්ත්‍රණය (LRM) • ණය ශ්‍රේණිගත කිරීම/ලකුණු ලබාදීම, ආතති පරීක්ෂාව	ඉහළ	ඉහළයාම
සංකේන්ද්‍රණ අවදානම	කර්මාන්ත ක්ෂේත්‍රයක හෝ භූගෝලීය ප්‍රදේශයක ණය ආශ්‍රිත ප්‍රතිපාර්ශ්වකරුවන්ගේ අසම ව්‍යාප්තිය.	• හර්ෆින්ඩාල් හර්ෂ්මාන් දර්ශකය (HHI) • සීමා නිරීක්ෂණය • ආතති පරීක්ෂාව	මධ්‍යස්ථ	වෙනසක් නැත
ගිවිසුම් ප්‍රකාරව ණය නොපියවීමේ අවදානම	ණය පියවන අවස්ථාවේදී සිය ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට අසමත්වීමෙන් ඇති වියහැකි බලපෑම.	• සීමා නිරීක්ෂණය • පූර්ව අනතුරු හැඟවීමේ දර්ශක නිරීක්ෂණය කිරීම, අක්‍රිය ණය ප්‍රවණතා	මධ්‍යස්ථ	වෙනසක් නැත
ශේෂ වූ ණය අවදානම	අනෙකුත් සියළුම අවදානම් ඉවත් කිරීමෙන් අවම කරගැනීමෙන් සහ වෙනත් ආකාරයකින් වගවීමෙන් පසුව ශේෂවූ අවදානම් හේතුවෙන් ඇතිවිය හැකි බලපෑම.	• සුරැකුම්කරණය • තක්සේරු කිරීම/නැවත තක්සේරු කිරීම නිරීක්ෂණය • ණය සහ වත්කම් වටිනාකම් අනුපාතික නිරීක්ෂණය කිරීම	මධ්‍යස්ථ	වෙනසක් නැත

*ඉපයීම් සහ ප්‍රාග්ධනය මත බලපෑමෙහි වාර්ෂික වෙනස

බලපෑමෙහි ඉහළයාම | වෙනසක් නැත | බලපෑමෙහි පහළයාම

වගුව 21 ණය අවදානම් සමාලෝචනය

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

හානිකරණ වු ලෙස වර්ගීකරණය කළ අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම් තුළ දැකිය හැකි වැඩිවන ප්‍රවනතාව සමාලෝචිත වසර සඳහා රු.බි. 9.0 (2019 දී රු.බි. 4.3) ක සමුච්චිත හානිකරණ වෙන්කිරීමකට සහ රු.බි.4.9 (2019 දී රු.බි. 0.6)ක හානිකරණ අය කිරිමකට හේතු විය.

වැඩි දියුණු කළ ණය තක්සේරු කිරීම්, ණය අනුමැතින්, ඵලදායී ණය අවදානම් කළමනාකරණ කාර්යරාමුව, පශ්චාත් අනුමැති නිරීක්ෂණය සහ අයකිරිමේ උත්සාහයන් අක්‍රීය ණය අනුපාතය පහත හෙළීමට බැංකුවට සහයවන අතර, ණය කළඹෙහි ගුණාත්මකභාවය පවත්වා ගැනීමට දායක වනු ඇත.

බැංකුව තුළ ණය පිරිනැම්මේ සහ ලේඛනගතකිරිමේ ක්‍රියාවලියේ අඩුලුහුඬුකම් පිළිබඳ කඩිනම් හඳුනාගැනීම සහ නිවැරදි කිරීම මගින් ණයවල මෙහෙයුම් අවදානම අවම කිරීමට ඵලදායී මෙවලමක් වශයෙන් LRM භාවිතා කෙරේ. මේ මගින් ණය ක්‍රියාවලියේ සහ ණය ගුණාත්මකභාවයේ තත්ත්වය සහතික කරයි. හඳුනාගත් අඩුපාඩු පූර්ව නිවැරදි කිරීම සඳහා ණය කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව/අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සන්නිවේදනය කෙරේ.

ණය හා අත්තිකාරම් සහ හානිකරණ වෙන් කිරීම

ප්‍රස්තාරය 26



අක්‍රිය ණය අනුපාතය සහ අක්‍රිය ණය අනුපාතයේ වයස් විශ්ලේෂණය

ප්‍රස්තාරය 27



අක් වෙරළ ප්‍රතිපාර්ශ්ව බැංකුව අක් වෙරළ අවදානමට නිරාවරණය කරයි. විදේශීය රජයන් විසින් ගනුලබන ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස ගිවිසුම්ගත බැඳීම් ගරුකිරීම මඟහැරීම්, විදේශ විනිමය පරිවර්ත්‍යතාව සහ පැවරිමේ හැකියාවට අදාළව එම රටවල ප්‍රතිපත්ති සහ රෙගුලාසිවල ප්‍රධාන වෙනස්වීම් මගින් විදේශීය ව්‍යවහාර මුදල් අවදානමට නිරාවරණය වේ. බැංකුවේ අක් වෙරළ ණය ප්‍රමාණය මාලදිවයිනට පමණක් සීමා වන අතර එය සමස්ත වත්කම් වලින් 0.1% ක් පමණක් නියෝජනය කරයි.

සංකේන්ද්‍රණ අවදානම

බැංකුවේ ණය නිරාවරණයන්හී අවදානම් පැතිකඩ අසාමාන්‍ය ලෙස අඩුවීමකට මඟපාදමින් යම් විශේෂිත තනි ප්‍රතිපාර්ශවයක්, කර්මාන්ත ක්ෂේත්‍රයක්, නිමැවුමක් හෝ භූගෝලීය ප්‍රදේශයක් ආශ්‍රිත අහිතකර වර්ධනයක් ඇතිවීමේ අවදානම සංකේන්ද්‍රණ අවදානම ලෙස හඳුන්වාදිය හැකිය.

විවිධ ක්ෂේත්‍ර, ප්‍රතිපාර්ශ්වයන් සහ භූගෝලීය ප්‍රදේශයන් තුළ ණය කළඹ විවිධාංගීකරණය තුළින් සංකේන්ද්‍රණ අවදානම ප්‍රධාන වශයෙන් කළමනාකරණය කරනු ලබයි. සංකේන්ද්‍රණ අවදානම් මට්ටම නිරීක්ෂණය කිරීම සඳහා බැංකුව විසින් හර්ෆින්ඩාල් හර්ෂ්මාන් (HHI) දර්ශකය සහ ආතති පරීක්ෂාව වැනි ශිල්පක්‍රම භාවිතා කරනු ලබයි.

ව්‍යාපාර ආකෘතිය හා රජයේ සංවර්ධන ඉලක්ක ජයගැනීම සඳහා දක්වන ලද දායකත්ව මට්ටම සැලකිල්ලට ගනිමින් අවදානම් අභිරුචි ප්‍රකාශය මගින් ක්ෂේත්‍ර සංකේන්ද්‍රණය සම්බන්ධයෙන් මධ්‍යස්ථ අවදානම් අභිරුචියක් හඳුන්වා දෙයි.

බැංකුව ප්‍රතිපාර්ශව සීමා මත පදනම්ව ණය ප්‍රමාණය නිරීක්ෂණය කරන අතර නාම සංකේන්ද්‍රණය අවදානම් අභිරුචිය තුළ පවතින බව සහතික කරයි.

මහා පරිමාණ ණය පහසුකම් සියල්ලම පාහේ ප්‍රධාන කාර්යාලයේ ණය අංශය මගින් ලබාදීම කෙරෙන හෙයින් බස්නාහිර පළාත තුළ ඉහළ භූගෝලීය සංකේන්ද්‍රණයක් පවතී.

භූගෝලීය සංකේන්ද්‍රණය

ප්‍රස්තාරය 28



	2020	2019
අ - මධ්‍යම පළාත	**6.7%**	5.9%
ආ - නැගෙනහිර පළාත	**2.3%**	2.0%
ඇ - උතුරුමැද පළාත	**3.9%**	3.4%
ඈ - වයඹ පළාත	**6.8%**	6.0%
ඉ - උතුරු පළාත	**3.0%**	2.7%
ඊ - සබරගමුව පළාත	**5.0%**	4.3%
උ - දකුණු පළාත	**7.8%**	6.3%
ඌ - ඌව පළාත	**4.7%**	4.0%
එ - බස්නාහිර පළාත	**59.8%**	65.4%

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

ක්ෂේත්‍ර සංකේන්ද්‍රණය

ප්‍රස්තාරය 29



	2020	2019
අ - කෘෂිකාර්මික සහ ධීවර	**6.3%**	7.2%
ආ - සංචාරක	**0.0%**	0.0%
ඇ - ප්‍රවාහනය	**0.3%**	0.4%
ඈ - ඉදිකිරීම්/නිවාස	**29.0%**	27.9%
ඉ - මූල්‍ය හා ව්‍යාපාරික සේවා	**1.6%**	2.5%
ඊ - යටිතල පහසුකම්	**18.4%**	15.5%
උ - විදුලිබල හා බලශක්තිය	**3.0%**	2.8%
ඌ - අධ්‍යාපනය	**1.7%**	8.0%
එ - පුද්ගලික/උකස්/වෙනත්	**39.7%**	35.7%

පුද්ගලික ඇපකරුවන් මත පදනම්වූ පුද්ගලික ණය සංයුතියේ ඉහළ යාමත් සමග, ණය ආශ්‍රිත ශේෂවූ අවදානම ඉහළයාමේ නැඹුරුවක් ඇත. කෙසේ වුවත්, 2020 වසරේදී, බැංකුවේ ණය කළඹෙන් 25.5% ක් රාජ්‍ය ඇප මත පදනම් වන අතර ණය කළඹෙන් 14.3% ක් නිශ්චල දේපළ උකස්කර මගින් ආවරණය වේ.

නිශ්චල දේපළ උකස්කර ණයවලින් 78.3%ක් වටිනාකමට ණය අනුපාතිකය 50%කට අඩුවෙන් නිශ්චල දේපළ මත ප්‍රදානය කරන ලද ණය වේ. ඇප ලෙස පිළිගත් නිශ්චල දේපළ උකස්කර ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස්වලට අනුකූලව සම්පාදනය කර ඇත. නිශ්චල දේපළ අගය කිරීම සහ ප්‍රතිමිලකරණය පිළිබඳ බැංකුවේ ප්‍රතිපත්තිය මත පදනම් වී ප්‍රතිමිලකරණය කෙරේ.

ණය නොපියවීමේ අවදානම

ණය නොපියවීමේ අවදානම, ප්‍රතිපාර්ශව විසින් ප්‍රති වටිනාකම් සැපයීමට අසමත්වීම හේතුවෙන් පැන නගින අතර, එය සාමාන්‍යයෙන් ණය පියවන අවස්ථාවේදී ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ගිවිසුමේ ඊට පාදක වූ වත්කම හෝ මූල්‍ය වටිනාකම හෝ විය හැකිය. ණය නොපියවීමේ අවදානම එම ණය පියවීමේ යම් කාලීන වෙනස සමඟ පවත්නා පැහැර හැරීමේ අවදානම සමඟ සමීපව සම්බන්ධ වේ. ණය නොපියවීමේ අවදානම බැංකුවේ සීමා කාර්යරාමුව තුළින් කළමනාකරණය කෙරේ.

ශේෂ වූ ණය අවදානම

ණය අවදානම් අවමකරණයන් සලකා බැලීමෙන් පසු ණය අවදානමේ ඉතිරිවන අවදානම ශේෂවූ ණය අවදානම ලෙස හඳුනාගත හැක. බැංකුවේ අවදානම් අභිරුචි මට්ටමේ පවත්වා ගැනීම සඳහා සුරැකුම්කරණය සහ වටිනාකමට ණය අනුපාතික මෙන්ම ණය අය කර ගැනීමේ ක්‍රියාමාර්ග වැනි ප්‍රතිපත්ති මට්ටමේදී නිශ්චිතව දක්වා ඇති ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි සහ ණය අවදානම් අවම කිරීමේ ශිල්පක්‍රම අනුව ශක්තිමත් පාලන යාන්ත්‍රණ අවදානම් පාලන කාර්යරාමුව තුළට අන්තර්ගත කර ඇත.

සුරැකුම මත ණය කළඹ වර්ගීකරණය සහ නිශ්චල දේපල මගින් ණයවල වටිනාකමට ණය අනුපාත බෙදීයාම

ප්‍රස්තාරය 30



	2020
අ - පුද්ගල ඇප	**37.7%**
ආ - භාණ්ඩාගාර වගකීම	**25.5%**
ඇ - අනාරක්ෂිත	**4.7%**
ඈ - රන්	**7.6%**
ඉ - මුදල	**5.4%**
ඊ - වෙනත්	**4.0%**
උ - කල්බදු ලැබීම්	**0.5%**
ඌ - චංචල දේපළ	**0.3%**
එ - ආයතනික ඇප	**0.0%**
ඒ - නිශ්චල දේපළ	**14.3%**
ඓ - 50% ට අඩු LTV	**78.3%**
ඔ - 50% අතර LTV	**19.8%**
ඕ - 75% ට වැඩි LTV	**1.9%**

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

වෙළඳපොළ අවදානම

වෙළඳපොළ අවදානම යනු මූල්‍ය වෙළඳපොළ අනුපාත හෝ මිලගණන්වල අහිතකර වෙනස්වීම් හේතුකොට ගෙන ආර්ථික වටිනාකම අහිමිවීමේ විභවතාවයි. ශ්‍රී ලංකා මහ බැංකුව 2019 අංක 06 නියෝගය "භාණ්ඩාගාර මෙහෙයුම් සඳහා වෙළඳපොළ හැසිරීම සහ ව්‍යවහාර" නිකුතුවත් සමග වෙළඳපොළ අවදානම් කළමනාකරණ කාර්යයේ අවශ්‍යතාව සහ වැදගත්කම ශක්තිමත් කළේය. වෙළඳපොළ අවදානම සඳහා බැංකුවේ නිරාවරණය ප්‍රධාන වශයෙන්ම පහත සඳහන් මූලාශ්‍රයන්ගෙන් ඇති වේ:

වෙළඳ කළඹ

වෙළඳ අවදානම යනු බැංකුව විසින් මූල්‍ය වෙළඳපොළ තුළ සිදුකරනු ලබන වෙළඳ කටයුතුවලින් ඇතිවන අලාභයට ඇති හැකියාවයි. බැංකුවේ වෙළඳ කළඹ රජයේ සුරැකුම්පත්වල ආයෝජන, ස්කන්ධ සහ විදේශ විනිමය විවෘත ස්ථානවලින් සමන්විත වේ. වෙළඳ කළඹ තුළ ස්ථාන දැරීම හේතුවෙන් බැංකුව වෙළඳපොළ අවදානමට නිරාවරණය වේ. 2020 වසර අවසානයේදී, බැංකුවේ වෙළඳ කළඹ රු.බි. 11.2ක් වූ අතර, එය බැංකුවේ මුළු වත්කම්වලින් 0.8%ක් සඳහා දායක වේ.

- **පොළී අනුපාත අවදානම:** ආදායම වක්‍ර සහ ප්‍රතිමිලකරණ පැතිරීම තුළ වෙනස්වීම්වලින් ඇතිවේ.
- **ස්කන්ධ මිල අවදානම:** ස්කන්ධ ආයෝජනවල මිලගණන් හි වෙනස්වීම්වලින් ඇතිවේ.
- **විදේශ විනිමය අනුපාතික අවදානම:** විනිමය හුවමාරු අනුපාතවල වෙනස්වීම්වලින් ඇතිවේ.
- **වෙළඳ භාණ්ඩ අවදානම:** බැංකුවට වෙළඳ භාණ්ඩ මිල අවදානම සඳහා ඉතා සුළු අවදානමක් ඇති අතර, එය උකස් කළඹ මත රන් මිලෙහි උච්චාවචනයේ ප්‍රමාණයට සීමා වේ.

වෙළඳ නොවන කළඹ

බැංකුවට ප්‍රමාණවත් ද්‍රවශීල වත්කම් ස්වාරක්ෂකයක් ඇති බවත් ඉන් බොහොමයක් උසස් තත්ත්වයේ අලෙවිකළහැකි රජයේ සුරැකුම්පත්වල ඇති බවත් වත්කම් වගකීම් කළමනාකරණ අංශය සහතික කරයි. 2020 වසර අවසානයේදී, රජයේ සුරැකුම්පත්වල මුළු ආයෝජනය (ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඇතුළුව) රු.බි. 740ක් වූ අතර, එය බැංකුවේ මුළු වත්කම්වලින් 54.3%ක් සඳහා දායක වේ.

ශ්‍රී ලංකා රුපියල් හැර වෙනත් මුදල්වලින් නම්කළ විදේශ මුදල් ණය සහ ඒ ආශ්‍රිත ආදායම් ප්‍රවාහයන් තුළ බැංකුවට නිරාවරණ ඇත. මේවා වැටයීම් නොකරන තාක් දුරට, සංචිතවලින් පිළිබිඹු වන ව්‍යුහාත්මක විදේශ විනිමය අවදානමට යටත් වේ.

වෙළඳ අවදානම සමාලෝචනය

අවදානම් සාධකය	විස්තරය	නියාමන/කළමනාකරණය සඳහා භාවිත මෙවලම්	නිරාවරණය	බලපෑම*
පොලී අනුපාත අවදානම				
ප්‍රතිමිලකරණ අවදානම	ශේෂ පත්‍රයෙන් නිරාවරණය වන හෝ නොවන වත්කම් සහ වගකීම්වල අනුපාත සංවේදීතාවයේ අනුපාත වෙනස්වීම හෝ මුදල් ප්‍රවාහ අතර කාලය පිළිබඳ වෙනස්කම් හේතුවෙන් පැන නගින අවදානම	• ප්‍රතිමිලකරණ වෙනස්කම් ආශ්‍රිත සීමා නියාමනය • අනුපාත සංවේදී වත්කම් (RSA) සහ අනුපාත සංවේදී වගකීම් (RSL) මත සීමා	ඉහළ	↓
ආදායම් වක්‍ර අවදානම	දිගු කාලීන අනුපාතවල වෙනස්වීම් වලට වඩා අඩු හෝ වැඩි වශයෙන් කෙටි කාලීන අනුපාත වෙනස්වීමේ අවදානම	• සංවේදීතාවය/අනුපාත කම්පන සමග පීඩන පරීක්ෂාව	ඉහළ	↓
පදනම් අවදානම	සමාන කල්පිරීමේ කාලයක් හෝ ප්‍රතිමිලකරණ දින සහිත අනුපාත සංවේදී වත්කම් සහ අනුපාත සංවේදී වගකීම්වල අනුපාත දර්ශක තුළ අසමාන විතැන්වීමෙන් පැන නගින අවදානම	• අනුපාත සංවේදී වත්කම් සහ අනුපාත සංවේදී වගකීම්වල අනුපාත කම්පන ආශ්‍රිත සංවේදීතාවය	ඉහළ	↓
විදේශ විනිමය අවදානම	විදේශ විනිමය ස්ථානගත කිරීම්වල කල්පිරීම ආශ්‍රිත නොගැලපීම් හේතුවෙන් පැනනගින විනිමය අනුපාතවල අහිතකර වෙනස්කම්වලින් ඇතිවන ඉපයීම් සහ ප්‍රාග්ධනය මත ඇති විය හැකි බලපෑම	• සීමා නියාමනය • අවදානමේදී විදේශ විනිමය වටිනාකම • පීඩන පරීක්ෂාව	මධ්‍යස්ථ	↑
ස්කන්ධ අවදානම	ස්කන්ධ වෙළඳපොළ මිලෙහි සිදුවන වෙනස්කම් මත පදනම්ව ඇති විය හැකි පාඩු	• සීමා නියාමනය • අවදානමේදී සමකොටස් වටිනාකම • දෛනික පදනමක් මත ලාභ හා පාඩු ඔස්සේ ආසන්න වෙළඳපොළ මිලට අනුරූපී සාධාරණ වටිනාකම් සහ වෙනත් විස්තීරණ ආදායම් ඔස්සේ ආසන්න වෙළඳපොළ සාධාරණ වටිනාකම් කළඹ	පහළ	→
වෙළඳ භාණ්ඩ අවදානම	වෙළඳ භාණ්ඩවල (රන්) මිලෙහි සිදු වන වෙනස්කම් හේතුවෙන් ඇති වන සෘණ බලපෑම	• උකස් අත්තිකාරම් සඳහා වන සුරැකුම්වල වටිනාකම කෙරෙහි වන වක්‍ර බලපෑම	පහළ	↓

*ඉපයීම් සහ ප්‍රාග්ධනය මත බලපෑමෙහි වාර්ෂික වෙනස

↑ බලපෑමෙහි ඉහළයාම → වෙනසක් නැත ↓ බලපෑමෙහි පහළයාම

වගුව 22 වෙළඳපොළ අවදානම සමාලෝචනය

2020 දෙසැම්බර් 31 දිනට	මූල්‍ය ප්‍රකාශනය පරිදි ප්‍රමාණය (රු. '000)	වෙළඳ අවදානමට නිරාවරණය (රු. '000)	වෙළඳ නොවන අවදානමට නිරාවරණය (රු. '000)	වෙළඳපොළ අවදානම් වර්ගය
මූල්‍ය වත්කම්				
මුදල් හා මුදලට සමාන දෑ	**6,491,963**	**–**	**6,491,963**	**IRR, FX**
බැංකු සමඟ තැන්පතු	**13,253,499**	**–**	**13,253,499**	**IRR,FX**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**19,897**	**–**	**19,897**	**IRR**
සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්	**11,221,746**	**11,221,746**	**–**	**IRR,Equity**
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ ලැබීම්	**516,795,160**	**–**	**516,795,160**	**IRR,FX**
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අනෙකුත් උපකරණ	**754,233,344**	**–**	**754,233,344**	**IRR,FX**
අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්	**15,271,822**	**–**	**15,271,822**	**IRR,Equity**
එකතුව	**1,317,287,431**	**11,221,746**	**1,306,065,685**	
මූල්‍ය වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	**12,862,337**	**–**	**12,862,337**	**IRR, FX**
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන්ට ගෙවියයුතු	**1,237,123,791**	**–**	**1,237,123,791**	**IRR,FX**
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - ණයකරුවන්ට ගෙවියයුතු	**8,159,591**	**–**	**8,159,591**	**IRR,FX**
කල්බදු වගකීම	**1,274,713**	**–**	**1,274,713**	**IRR**
නිකුත්කළ ණය සුරැකුම්	**31,773,753**	**–**	**31,773,753**	**IRR**
එකතුව	**1,291,194,186**	**–**	**1,291,194,186**	

වගුව 23 ▸ ශේෂ පත්‍රයට වෙළඳපොළ අවදානම් අයිතම අනුරූපනය

රටතුල කොරෝනා වෛරසය පැතිරියාමත් සමග මූල්‍ය හා ප්‍රාග්ධන වෙළඳපොල අස්ථායිතාවය හා අවිනිශ්චිතතාවය වැඩිවිය. බැංකුවේ වෙළඳපොළ හා ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව වැඩිවිය.

මෙවැනි අභියෝගාත්මක ආර්ථික පරිසරයක් තුල පද්ධතිමය අවදානම ඉහල ගිය අතර එබැවින් ආර්ථිකයේ අවිනිශ්චිතතාවය හේතුකොට ගෙන, දේශිය හා විදේශිය ආයෝජකයන් ආයෝජන විකුනාදැමීම 2020 මාර්තු මාසයේදී දක්නට ලැබුනි. වසංගතය පැතිරීමත් සමගම රට වසා දැමීම හේතු කොට ගෙන කොටස් වෙළඳපොළ මාස දෙකකට ආසන්න කාලයක් ක්‍රියාත්මක නොවූ අතර, මෙම කාලය තුල රජයේ සුරැකුම්පත් වලට ඇති ඉල්ලුම ආර්ථික අවිනිශ්චිතතාව හේතු කොට ගෙන, 2020 මාර්තුවලදී දේශීය සහ විදේශීය අඩුමිලට විකිණීම සිදුවිය. ස්කන්ධ වෙළඳපොළ රට අගුළු දැමීම හේතුවෙන් මාස දෙකකට ආසන්න කාලයක් වසා දමන ලද අතර, රජයේ සුරැකුම්පත් සඳහා ඉල්ලුම වැඩි විය.

කෙසේවෙතත්, ආර්ථික කටයුතු යළි උත්තේජනය කිරීම සඳහා රජයේ මැදිහත්වීම නිසා, මූල්‍ය වෙළඳපොළ ද්‍රවශීලතා මට්ටම වසර තුළ වැඩි වූ අතර එය ආර්ථික පොළී අනුපාත අඩු කිරීමකට හේතු විය. සම්ප්‍රදායික සහ සම්ප්‍රදායික නොවන මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලින් ආවරණය වූ පොළී අනුපාතවල අඩුවීම බැඳුම්කර ආදායම්වල පහත වැටීමකට හේතු විය. අඩු වූ පොළී අනුපාත සහ ඉපයීම් සමඟ, ආයෝජක අරමුදල් වසරේ අගභාගයේදී කොටස් වෙළඳපොළට විතැන් වූ අතර, කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන දර්ශකය (ASPI) 2020 මැයි මාසයේ වාර්තාකළ අවම මට්ටමෙන් 59%ක ඉහළ අගයක් වන 6,700 මට්ටම ඉක්මවන ලදී.

තවද, පහත වැටුණු අපනයන ඉපයීම්. අඩු වූ විදේශ සේවක ප්‍රේෂණ සහ සංචාරක කර්මාන්තයේ ඉපයීම් සහ ණය ගෙවා නිදහස්වීම හේත කොට ගෙන, වසර තුළ රටේ විදේශ විනිමය සංචිත පහත වැටුණ අතර, වර්ධිත උච්ඡාවචනය සමඟ, 2.8%කින් (ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදි අනුපාතය) ශ්‍රී ලංකා රුපියලේ අගය අඩුවිය.

ආයෝජකයින් අවිනිශ්චිතතාව හේතු කොට ගෙන අවදානම් වත්කම්වලින් ආරක්ෂිත ආයෝජන කරා විතැන් වූ බැවින් 2020 වසර තුළ, ලෝක රන් මිලගණන් 28%කින් වැඩි විය. (මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව) මිල ප්‍රවනතා නියාමනය කරමින්, වසර තුළ අවස්ථා කිහිපයකදී උකස් මත අත්තිකාරම් සීමාව බැංකුව ප්‍රතිශෝධනය කළේය.

විචක්ෂණ අවදානම් සීමා, බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවලට අනුකූලතාව, වෙළඳපොළ මනා ව්‍යවහාර සහ වෙළඳපොළ සහ ද්‍රවශීල අවදානම් අඛණ්ඩ නියාමනය සහ වාර්තාකරණය වර්ධිත ක්‍රමික අවදානම්වලින් වියහැකි මෙහෙයුම් සහ ප්‍රාග්ධන අලාභ අවම කිරීමකට හේතු විය. අභ්‍යන්තර සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලවෙමින් සමාලෝචනයට යටත් කාලසීමාව තුළ සාමාන්‍ය කොටස් සහ රජයේ සුරැකුම්පත් වෙළෙඳාමෙන් ප්‍රතිලාභ අත්කර ගැනීමට බැංකුව මනාව කළමනාකරණය කරන ලදී.

වෙළඳපොළ අවදානම් කළමනාකරණය →

පළමු ආරක්ෂණ මාර්ගය ලෙස කටයුතු කරන භාණ්ඩාගාර ඉදිරි පෙළ කාර්යාලය (TFO), අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දක්වා ඇති එහි සෘජු වගකීම් පිළිබඳ විෂයපථය තුළ බැංකුවේ වෙළඳපොළ සහ වෙළඳපොළ නොවන අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය සඳහා වගකීමට බැඳී සිටී. භාණ්ඩාගාර මැදි පෙළ කාර්යාලය (TMO) දෙවැනි පෙළ පාලන කාර්යය ලෙස ක්‍රියාත්මක වන අතර, පළමු ආරක්ෂණ මාර්ගයේ වෙළඳපොළ අවදානම් කළමනාකරණය ස්වාධීනව නියාමනය සිදුකරයි.

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

ඒකාබද්ධ අවදානම් කාර්යරාමුව යටතේ, වෙළඳපොළ අවදානම් කළමනාකරණ කාර්යරාමුව මගින් වෙළඳපොළ අවදානම සහ වෙළඳපොළ නොවන අවදානමට පොදු අවදානම් ලක්ෂණ පෙන්නුම් කරමින් සියලුම අවදානම් වර්ග එකට එකතු කරයි.

කොටස් මිල අවදානම

ආදායමේ සහ සංචිත තුළ ඇති විය හැකි විචලනවලට බැංකුව නිරාවරණය කෙරෙමින් කොටස් වෙළඳපොළ වෙනස්වීම් හේතුවෙන් සාමාන්‍ය කොටස් කළඹ තුළ ආයෝජනවල වටිනාකම හීනවීමේ අවදානම ස්කන්ධ මිල අවදානම ලෙස හැඳින්වේ. සාමාන්‍ය කොටස් මෙන්ම ඒකක භාර වලට අදාළ ලැයිස්තුගත ස්කන්ධ උපකරණවල එහි ආයෝජනවලින් හටගන්නා කොටස් මිල අවදානමට බැංකුව නිරාවරණය වේ.

බැංකුවේ ලැයිස්තුගත සාමාන්‍ය කොටස් කළඹ, ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකම් කළඹ සහ වෙනත් විස්තීරණ ආදායම් මත සාධාරණ වටිනාකම් කළඹ යන දෙකෙන් සමන්විත වන අතර, කොටස් වල ආයෝජනයේ ප්‍රමාණය අවදානම් සීමා කාර්යරාමුව සහ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් තීරණය කෙරේ.

සියලු කොටස් මිල දර්ශකයේ වර්ධනය නොසලකා, ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට සාමාන්‍ය කොටස් කළඹ තුළ වෙළඳපොළ වටිනාකම 2020 අවසානයේදී රු.මි. 1,675.7 දක්වා රු.මි. 106.6කින් පහත වැටුණි. 2020 මූල්‍ය වසර සඳහා සාමාන්‍ය කොටස් වෙළෙඳාමෙන් රු.මි. 445.6ක ශුද්ධ ලාභයක් බැංකුව උපයාගෙන ඇත.

ස්කන්ධ කළඹ සංයුතිය (ආයෝජනවල පොත් වටිනාකම) ප්‍රස්තාරය 31



	2020	2019
අ - ලැයිස්තුගත කොටස් FVPL	**42.2%**	47.5%
ආ - ඒකක භාර	**1.7%**	1.5%
ඇ - ලැයිස්තුගත කොටස් FVOCI	**52.2%**	47.4%
ඈ - ලැයිස්තුගත නොකළ කොටස් FVOCI	**3.9%**	3.6%

කළඹ වර්ගය	2020		2019		උපලබ්ධි නොවූ ලාභ/(අලාභ)
	පොතේ වටිනාකම රු. '000	වෙළඳපොළ වටිනාකම රු. '000	පොතේ වටිනාකම රු. '000	වෙළඳපොළ වටිනාකම රු. '000	රු. '000
ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකම් කළඹ	**2,524,999**	**1,675,748**	3,046,421	1,782,337	414,833
වෙනත් විස්තීරණ ආදායම් මත සාධාරණ වටිනාකම් කළඹ	**3,006,094**	**2,514,374**	2,940,930	3,208,101	(758,891)
එකතුව	**5,531,093**	**4,190,122**	5,987,351	4,990,438	(344,058)

වගුව 24 ලැයිස්තුගත ස්කන්ධ කළඹේ තත්ත්වය

කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන දර්ශකය 10.5%ක ලාභයක් සමඟ 2020 වසර අවසන්කළ අතර, 2014 සිට වාර්තාකළ ඉහළම වාර්ෂික ප්‍රතිලාභය එය විය. කොවිඩ්-19 වසංගතයේ ගෝලීය පැතිරීම නිසා 2020 වසර අවිනිශ්චිතතාවන්ගෙන් පිරුණු වසරක් විය. දිවයිනේ පැතිරීගිය වසංගතයේ පළමු රැල්ල හේතු කොට ගෙන මාස දෙකකට ආසන්න කාලයක් වසා දැමීමෙන් පසු කොළඹ කොටස් හුවමාරුව විවෘත කළ විට වෙළඳපොළ දර්ශක පහළ ගිය අතර, වසර තුළ කොටස් වෙළඳපොළ චක්‍ර කිහිපයකට භාජනය වී ඇත. 2020 වසර තුළ, සියලු කොටස් මිල දර්ශකය වසර 10කින් වාර්තාවූ අවම අගය වන 4215 ට ලගාවූ අතර, වසර අවසානයේදී එය ආසන්න වශයෙන් වසර 4ක් තුළ වාර්තාවූ ඉහළ අගය වන 6774 දක්වා ඉහළ යන ලදී.

කෙසේ වෙතත්, වසර අවසානයේදී S&P SL 20 දර්ශකය 2638 ලෙස වර්තාවූ අතර එය 10.1% ක පමණ වාර්ෂික ප්‍රතිලාභයක් විය.

විදේශ විනිමය අවදානම

විදේශ විනිමය අනුපාතවල අනපේක්ෂිත හා අවාසිදායක උච්ඡාවචනවල ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ ඉපයීම් හා ප්‍රාග්ධනය කෙරෙහි ඇති විය හැකි බලපෑම විදේශ විනිමය අවදානම වේ. 2020 වසර තුළදී, එක්සත් ජනපද ඩොලරය හා ශ්‍රී ලංකා රුපියල අතර සාමාන්‍ය හුවමාරු අනුපාතය රුපියල් 181.151 හා රුපියල් 194.875 අතර පරාසයක උච්ඡාවචනය විය. (මූලාශ්‍රය: බ්ලූම්බර්ග්) වසර තුළදී රුපියල අවප්‍රමාණය වීම 2.26% කි.

2020 වසර තුළදී, බාහිර මූලාශ්‍රයන්ගෙන් විදේශ විනිමය ද්‍රවශීලතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව පියවර කිහිපයක් ගනු ලැබීය. එමෙන්ම, විදේශ සංචිත ගොඩ නැගීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය අඛණ්ඩව මිලදී ගැනීම සිදුකරන ලදී.

	මාස 1 ට අඩු	මාස 1-3	මාස 3-6	මාස 6-12	අවුරුදු 1-3	අවුරුදු 3-5	අවුරුදු 5ට වැඩි	එකතුව
ඇමෙරිකානු ඩොලර්	(12,849,451)	15,573,904	1,794,424	(23,940,000)	16,831,931	4,234,200	898,800	2,543,808
යූරෝ	2,267,437	1,471,758	2,700,484	682,459	–	–	–	7,122,138
මහා බ්‍රිතාන්‍ය පවුම්	(560,876)	1,624,867	1,137,656	(1,830,680)	139,579	–	–	510,546
සිංගප්පූරු ඩොලර්	8,764	–	–	–	–	–	–	8,764
ඕස්ට්‍රේලියානු ඩොලර්	(563,533)	978,387	2,256,003	(2,178,871)	87,011	–	–	578,997
ජපන් යෙන්	244,372	–	–	–	–	–	–	244,372
ස්විස් ෆ්‍රෑන්ක්	3,431	–	–	–	–	–	–	3,431
කැනේඩියන් ඩොලර්	26,078	–	–	–	–	–	–	26,078
අරාබි එමීර් දිරාම්	295	–	–	–	–	–	–	295

වගුව 25 විදේශ විනිමය මෙහෙයුම් සඳහා මුදල් අනුව කල්පිරීමේ පරතර

විදේශ විනිමය අවදානම සියලූම විදේශ ව්‍යවහාර මුදල්වල වැටයිම් නොකළ ස්ථානගතකිරිම් සමඟ සම්බන්ධ වේ. බැංකුව ප්‍රමිතිගත මිනුම් ප්‍රවේශය (SMA) යටතේ, ශුද්ධ විදේශ විනිමය නිරාවරණ සලකා බලමින් විදේශ විනිමය අවදානම සඳහා ප්‍රාග්ධනය වෙන් කරයි. ශුද්ධ විවෘත ස්ථානගතකිරීම අභ්‍යන්තර පරීක්ෂාකාරි සීමා අනුව දෛනික පදනමක් මත නියාමනය කෙරේ. 2020 වසර අවසානයේදී, බැංකුවේ ශුද්ධ විදේශ විනිමය නිරාවරණය ඇමෙරිකානු ඩොලර් මිලියන 11.8ක් වූ අතර, එය බැංකුවේ මුළු ප්‍රාග්ධනයෙන් 5.2%කි.

ව්‍යවස්ථාපිත සහ අභ්‍යන්තර සීමාවලට අනුකූලව දෛනික ශුද්ධ විවෘත තත්වය

ප්‍රස්තාරය 32



ව්‍යුහගත විදේශ විනිමය නිරාවරණ

ව්‍යවහාර මුදල	2020 රු. '000	2019 රු. '000
ඇමෙරිකානු ඩොලර්	**1,672**	906
මහා බ්‍රිතාන්‍ය පවුම්	**567**	511
ජපන් යෙන්	**244**	-1,935
සිංගප්පූරු ඩොලර්	**9**	3
යූරෝ	**7,191**	9,264

වගුව 26 විදේශ විනිමය මෙහෙයුම් සඳහා මුදල් අනුව කල්පිරීමේ පරතර

ස්කන්ධ වෙළෙඳ කළඹ සහ විදේශ විනිමය විවෘත තත්ත්වය සඳහා අවදානමට වටිනාකම භාවිතා කරමින් වෙළඳපොළ අවදානම වෙනස්වීම් බැංකුව මනිනු ලබයි. අවදානමට වටිනාකම බැංකුවේ අවදානම් අභිරුචි සීමාව තුළ පවතී.

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

ස්කන්ධ අවදානමේදී වටිනාකම

ප්‍රස්තාරය 33



අවදානම් අභිරුචි සීමාවට අනුව ස්කන්ධ අවදානමේදී වටිනාකම (රට වසා දැමීම නිසා 2020 මාර්තු 20 සිට 2020 මැයි දක්වා CSE වසන ලදී)

විදේශ විනිමය අවදානමේදී වටිනාකම

ප්‍රස්තාරය 34



පොලී අනුපාත අවදානම

ලාභ අලාභ තුළින් සාධාරණ අගයේ කළඹ තුළ දරණ ලද බැංකුවේ පොලී ඉපයීම් ආයෝජනවලින් වෙළෙඳ කළඹ තුළ පොලී අනුපාත අවදානම ඇති වේ. බැංකුවේ අනුපාත සංවේදී ලාභ අලාභ තුළින් සාධාරණ අගයේ ආයෝජනය 2020 අවසානයේදී රජයේ සුරැකුම්පත් තුළ මුළු ආයෝජනයෙන් 1.5%ක් වූ අතර එය භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවලින් සමන්විත වේ. රජයේ සුරැකුම්පත්වල ලාභ අලාභ තුළින් සාධාරණ අගයේ කළඹ තුළ පොලී අනුපාත අවදානම, වෙළෙඳ කළඹ තුළ දරණ සුරැකුම්පත්වල කාලසීමාව මත පදනම් වී ගණනය කළ උපලබ්ධි නොවූ ලාභ/අලාභ සහ සාධාරණ අගය මත පදනම් වූ සුරැකුම්පත්වල ප්‍රවර්තන කාලය මත ගණනය කල (duration) ප්‍රාග්ධන අවශ්‍යතාව තුළින් තක්සේරු කෙරේ.

බැංකු කළඹ තුළ පොලී අනුපාත අවදානම (IRRBB)

	මාස 1ට අඩු රු. මි.	මාස 1-3 රු. මි.	මාස 3-6 රු. මි.	මාස 6-12 රු. මි.	අවුරුදු 1-3 රු. මි.	අවුරුදු 3-5 රු. මි.	අවුරුදු 5ට වැඩි රු. මි.
කළඹ රහිත අනුපාත සංවේදී වත්කම්	39,454	66,373	43,322	133,030	322,887	308,349	385,416
අනුපාත සංවේදී වගකීම්	224,602	379,188	230,612	403,718	34,945	11,855	5,000
කාල පරතරය (අනුපාත සංවේදී වත්කම් - අනුපාත සංවේදී වගකීම්)	(185,148)	(312,815)	(187,290)	(270,688)	287,943	296,495	380,416
සමුච්චිත පරතරය	(185,148)	(497,964)	(685,253)	(955,941)	(667,998)	(371,504)	8,912
තත්‍ය පරතරය අනුපාත සංවේදී වගකීම් වල ප්‍රතිශතයක් ලෙස - 2020 (%)	-82.43	-82.50	-81.21	-67.05	823.99	2,501.06	
තත්‍ය පරතරය අනුපාත සංවේදී වගකීම් වල ප්‍රතිශතයක් ලෙස - 2019 (%)	-87.40	-90.68	-76.16	-73.56	562.44	2,289.59	

වගුව 27 පොලී අනුපාත සංවේදී පරතරය - බැංකු කළඹ

පොලී අනුපාත අවදානම යනු පොලී අනුපාතවල අහිතකර වෙනස්වීම් මත අනුපාත සංවේදී වත්කම්, වගකීම් සහ ශුද්ධ පොලී ආදායම තුළ උච්ඡාවචනයන්ට බැංකුව නිරාවරණය වන ශේෂ පත්‍රයෙන් බාහිර නිරාවරණවල පාදක වටිනාකමට බලපෑ හැකි හැකියාවයි. පොලී අනුපාත අවදානමට බැංකුවේ නිරාවරණය ප්‍රතිමිලකරණ අවදානම, ආදායම් වක්‍ර අවදානම සහ පදනම් අවදානම මගින් හඳුනාගත හැකිය.

අහිතකර පොලී අනුපාත වෙනස්වීම් හේතුවෙන් බැංකු කළඹේ ස්ථානගතකිරීම්වල වර්තමාන වටිනාකම සහ අනාගත මුදල් ප්‍රවාහවල කාලය වෙනස්වීම තුළින් බැංකුවේ ප්‍රාග්ධන සහ පොළිය කෙරෙහි බලපෑම් ඇති කරයි. පොලී අනුපාත අවදානමේ මෙම ආකාරය වෙළෙඳ නොවන වත්කම් හා වගකීම්වල කාල ව්‍යුහය සහ උපකරණ මිලකරණය කරනු ලබන ආකාරය මත පදනම් වූ පොලී අනුපාත දර්ශක අතර වෙනස්වීම්වලින් ඇති වේ. විධිමත්ව කළමනාකරණය නොකරන්නේනම්, බැංකු කළඹ තුළ පොළි අනුපාත අවදානම බැංකුවේ ප්‍රාග්ධන පදනම සහ අනාගත ඉපයීම් කෙරෙහි සැලකියයුතු අහිතකර බලපෑමක් ඇති කරනු ඇත.

වසර 1 ට අඩු කල්පිරීමේ කාල පරාසය තුළ තිබූ වත්කම් හා වගකීම්වල විශාල සෘණ නොගැලපීම්, වසංගත තත්ත්වය නිසා 2020 වසර තුළ පොලී අනුපාත අඩුවෙමින් පැවති බැවින් වසර තුළ බැංකුවේ ශුද්ධ පොලී ආදායම කෙරෙහි ධනාත්මක බලපෑම්වලට හේතු විය.

බැංකුවේ වත්කම් හා වගකීම්වලින් ආසන්න වශයෙන් 95%ක් පොළි අනුපාත සංවේදී වන බැවින් පොලී අනුපාත අවදානම කළමනාකරණය කිරීම බැංකුවේ තීරණාත්මක අංගයක් වන අතර, එහිදී බැංකුවේ ශුද්ධ පොලී ආදායම හෝ ශුද්ධ පොලී ආන්තිකය පොලී අනුපාත විචලනයන්ට යටත් වේ. එමනිසා බැංකුවේ පොලී අනුපාත අවදානම කළමනාකරණ වැඩපිළිවෙල මගින් කල්පිරීම්වල (ස්ථාවර අනුපාත වත්කම් හෝ වගකීම්) නොගැලපීම් අවම කිරීමට හෝ ප්‍රතිමිලකරණ ගැලපීමට (පාවෙන අනුපාත වත්කම් හෝ වගකීම්) අදහස් කරයි. ඉපයීම් දෘෂ්ටිකෝණය සහ ආර්ථික වටිනාකම් දෘෂ්ටිකෝණය තුළ බැංකුව පොලී අනුපාත අවදානම මනිනු ලබයි.

බැංකුව මූලික වශයෙන් පොලී අනුපාත ප්‍රතිමිලකරණ පරතරය පිළිබඳ විශ්ලේෂණයක් මගින් පොලී අනුපාත අවදානම තක්සේරු කරයි. නිශ්චිතව දක්වා ඇති කල්පිරීමේ කාල පරාසයක් තුළදී ප්‍රතිමිලකරණය වන පොලී උපයන වත්කම් සහ පොලී දරන වගකීම් අතර වෙනස පොලී අනුපාත ප්‍රතිමිලකරණ පරතර විශ්ලේෂණය මගින් මනිනු ලබයි.

ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

සාධාරණ අගයට වාර්තාකරණ සහ 2020 වසරේ අවසානයට වත්කමක් ලෙස ගෙන යනු ලබන පොළී අනුපාත swap ගිවිසුමක් බැංකුවට ඇත. swap ගිවිසුමේ සංකල්පීය ප්‍රමාණය රු.බි. 2ක් විය. ගිවිසුමේ පදනම් පොළී අනුපාතය මාස 6 AWPLR මත බරතබනලද ලාභ අලාභ අනුපාතයට ලකුණු කෙරේ. 2020 වසරේ අවසානයට, ව්‍යුත්පන්නවල වෙළඳපොළ අගය රු.මි. 19.9ක් වූ අතර ව්‍යුත්පන්නවල සාධාරණ අගයේ වෙනස්වීම් "ශුද්ධ වෙළෙඳ ආදායම" තුළ ගලපා ඇත.

ද්‍රවශීලතාව සහ අරමුදල් අවදානම

ද්‍රවශීලතාව සහ අරමුදල් අවදානම යනු පිළිගත නොහැකි අලාභ දැරීමක් නොමැතිව ගෙවීමට සිදුවන ශේෂ පත්‍රයේ හෝ ඉන් බාහිර බැඳීම් ඉටු කිරීමට ප්‍රමාණවත් ස්ථාවර හෝ විවිධ අරමුදල් මූලාශ්‍ර බැංකුවට නොමැතිවීමේ අවදානමයි. බැංකුවේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ කාර්යරාමුව මගින් බැංකුවේ මෙහෙයුම් පෙර නිශ්චිත ද්‍රවශීලතා සීමා තුළ බැංකුව ක්‍රියාත්මක වන බව සහ බැංකුවේ ද්‍රවශීලතා ප්‍රතිපත්ති, නියාමන අවශ්‍යතා සහ මනා ව්‍යවහාරවලට අනුකූලව පවත්නා බව බැංකුව විසින් සහතික කිරීම අවශ්‍ය කෙරේ.

ද්‍රවශීලතා අවදානම් සමාලෝචනය →

මූල්‍ය පද්ධතිය තුළ ද්‍රවශීලතාව වැඩි කිරීමට සහ සක්‍රීය ණයදීම තුළින් ආර්ථික කටයුතුවල ප්‍රතිසාධනයට සහයවීමට ව්‍යවස්ථාපිත සංචිතවල (SRR) අවශ්‍යතාව අඩුකිරීම, ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාතය (SDFR) සහ ස්ථාවර ණයදීමේ පහසුකම් අනුපාතය (SLFR) අඩුකිරීම වැනි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතු කොට ගෙන වසර තුළ අධික වෙළඳපොළ ද්‍රවශීලතාව පැවතුණි. තවද, බැංකුකරණ පද්ධතියේ ද්‍රවශීල වත්කම් වැඩි කිරීමට නියාමන ද්‍රවශීලතා අවශ්‍යතා (එනම් ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR), ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය) (NSFR) පහත හෙලන ලදී. එබැවින්. බැංකුවේ ද්‍රවශීලතා දර්ශක වසර තුළ හිතකරව පැවතුණි.

ද්‍රවශීලතාව සහ අරමුදල් අවදානම් කළමනාකරණයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ සාමාන්‍ය සහ පීඩන තත්ත්වයන් යටතේ නිවැරදි පිරිවැයට නිවැරදි වේලාවට බැඳීම් සපුරාලීමට අවශ්‍ය අරමුදල් කරා පිවිසීම සහ ලබාගැනීමේ හැකියාව සහතික කිරීමයි.

2020 වසර අවසානයට බැංකුවේ නියාමන ද්‍රවශීලතා අනුපාත පහත පරිදි වේ:

	2020 %	2019 %	නියාමන අවමය %	නියාමන අවමය (කොවිඩ්-19 සහන ක්‍රියාමාර්ගවලින් පසු) %
SLAR – DBU	**69**	60	20	20
ද්‍රවශීලතා ආවරණ අනුපාතය – රුපියල්	**311**	278	100	90
ද්‍රවශීලතා ආවරණ අනුපාතය – සියලුම ව්‍යවහාර මුදල්	**307**	277	100	90
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය	**169**	175	100	90

වගුව 28 නියාමන ද්‍රවශීලතා අනුපාත

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය →

කොටස් ප්‍රවේශය

ණය හා බැදීම් අනුපාතය හැර කොටස් ප්‍රවේශය යටතේ සියලුම ද්‍රවශීලතා අනුපාත ප්‍රධාන වශයෙන් වඩා අඩු ණය වර්ධනය හේතු කොට ගෙන පෙර වසරට සාපේක්ෂව සමාලෝචිත වසර තුළ වර්ධනය විය. බැංකුවේ ද්‍රවශීල වත්කම් ප්‍රධාන වශයෙන් වැඩි වූ ගනුදෙනුකාර තැන්පතු සමඟ රජයේ සුරැකුම්පත්වල වැඩි වූ ආයෝජනය හේතුවෙන් ඉහළ ගියේය.

අරමුදල් සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීමට කොටස් ප්‍රවේශය යටතේ බැංකුව පහත සඳහන් ද්‍රවශීලතා අනුපාත නියාමනය කරයි.

කොටස් ප්‍රවේශය යටතේ අනුපාත	2020 %	2019 %
මුළු වත්කම්වලට ශුද්ධ ණය	**37.9**	39.3
ගනුදෙනුකාර තැන්පතුවලට ණය	**42.5**	46.7
කෙටි කාලීන වගකීම්වලට ද්‍රවශීල වත්කම්	**64.5**	53.9
මුළු වත්කම්වලට මිලදී ගත් අරමුදල්	**20.6**	22.0
(ඉපැයීම් වගකීම් - තාවකාලික ආයෝජනවලට) (විශාල වගකීම් - තාවකාලික ආයෝජන)	**11.2**	13.8
මුළු ණය අනුපාතයට බැදීම්	**4.1**	1.7

වගුව 29 කොටස් ප්‍රවේශය යටතේ අනුපාත

ප්‍රවාහ ප්‍රවේශයː

ප්‍රවාහ ප්‍රවේශය යටතේ, ද්‍රවශීලතා පරතර විශ්ලේෂණය ද්‍රවශීලතා අවදානම් තක්සේරු කිරීමට බැංකුව විසින් භාවිතා කරන ක්‍රමයකි. ද්‍රවශීලතා පරතර, සීමාවන්ට අනුව කලින් කල නිරීක්ෂණය කරන අතර, සංවේදී විශ්ලේෂණය සහ පීඩන පරීක්ෂණය සඳහා භාවිතා කෙරේ.

ඉහළ සෘණ ද්‍රවශීලතා පරතරය වසර එකට අඩු ඉතුරුම් තැන්පතු සහ ස්ථාවර තැන්පතු වර්ගීකරණය හේතු කොට ගෙන වසර එකට අඩු කල්පිරීම් කාලසීමා තුළ නිරීක්ෂණය කළ හැකිය. කෙසේවෙතත්, ද්‍රවශීලතාව කෙරෙහි අහිතකර බලපෑම අතීත හැසිරීම මත පදනම් වී ක්‍රියාත්මක කිරීමේ නැමියාව අඩුවෙන් සලකා බලයි.

2020 වසර අවසානයේදී. මාස 12 කල්පිරීම් කාලසීමාව තුළ පැවති සෘණ පරතර අඩු වූ කෙටි කාලීන ආයෝජන හේතු කොට ගෙන වර්ධිත ද්‍රවශීලතාව පිළිබිඹු කරමින් පහත වැටුණි. ධනාත්මක පරතර ද පසුගිය වසරට සාපේක්ෂව වැඩි විය.

වත්කම් සහ වගකීම්වල කල්පිරීමේ පරතර විශ්ලේෂණ, අහිතකර ද්‍රවශීලතා මට්ටම් පුරෝකථනය කිරීමේ හැකියාව ශක්තිමත් කරයි. වෙළඳපොළ ප්‍රති විකුණුම් ණයගැනීම් අවම කරමින් රජයේ සුරැකුම්පත් කළඹ භාවිතා කරමින් වසර තුළ අරමුදල් අවශ්‍යතා කළමනාකරණය කර ගැනීමට බැංකුවට හැකි විය.

නිෂ්පාදන අනුව අරමුදල් විවිධාංගීකරණය

කොවිඩ් 19 අර්බුදය හමුවේවුවත් වසර අවසානයේදී 21.7%ක සැලකියයුතු වර්ධනයක් සමඟ බැංකුවේ තැන්පතු පදනම රු.ට්‍රි. 1.2 දක්වා ලඟා විය. බැංකුවේ තැන්පත් කෙරෙහි පැහැදිලිව ලබාදෙන ලද 100% රජයේ ඇපය අනුව ගනුදෙනුකාර තැන්පතු සඳහා වඩා ආරක්ෂිත බැංකුවක් ලෙස පවතින ගනුදෙනුකාර විශ්වාසය හේතු කොට ගෙන මෙය සිදුවී ඇත.

	මාස 0-3 (රු.මි.)	මාස 3-12 (රු.මි.)	අවුරුදු 1-3 (රු.මි.)	අවුරුදු 3-5 (රු.මි.)	අවුරුදු 5ට වැඩි (රු.මි.)	එකතුව (රු.මි.)
ගිවිසුම්ගත කල්පිරීම සහිත වත්කම්	111,629	187,556	330,285	315,863	418,475	1,363,308
ගිවිසුම්ගත කල්පිරීම සහිත වගකීම්	608,578	639,368	35,490	12,202	68,170	1,363,308
කල්පිරීම් පරතරය	(496,949)	(451,812)	294,795	303,661	350,305	(0)
සමුච්චිත පරතරය	(496,949)	(948,761)	(653,966)	(350,305)	(0)	(0)
අවදානම් සංවේදී සීමාවේ % ලෙස සත්‍ය පරතරය						
– 2020 (%)	-82	-71	831	2,489	514	0
– 2019 (%)	-87	-91	-76	-74	562	

වගුව 30 පොලී අනුපාත සංවේදී පරතරය - බැංකු කළඹ

නිෂ්පාදන අනුව අරමුදල් විවිධාංගීකරණය

ප්‍රස්තාරය 35

2020 | 2019



	2020	2019
අ - ඉතුරුම් තැන්පතු	**21.7%**	19.9%
ආ - ස්ථාවර තැන්පතු	**74.2%**	72.6%
ඇ - ප්‍රතික්‍රය ගැනුම්	**1.1%**	4.0%
ඈ - ඇ.ඩොලර් ණය ගැනුම්	**0.5%**	1.1%
ඉ - ද්විතියික ණය	**0.9%**	0.5%
ඊ - ද්විතියික නොවන ණය	**1.6%**	1.9%

බැංකුවට එහි ශාඛා ජාලය තුළින් පුද්ගල තැන්පතු සහ ආයතනික තැන්පතුවල වඩා පුළුල් රාමුවක් කරා ප්‍රවේශය ඇති අතර, ස්ථාවර අරමුදල්වල මූලික මූලාශ්‍රයක් ලෙස එය සලකයි. එමෙන්ම බැංකුවට 2019 දී ලබාගත් අඩු පිරිවැය සහිත විදේශ මූල්‍ය ණය ගැනීම් ඇත.

දිවයින පුරා ශාඛා ජාලය තුළින් පුද්ගල තැන්පතු කරා පිවිසීම (එනම් ඉතුරුම් හා ස්ථාවර තැන්පතු) අරමුදල්වල සංකේන්ද්‍රණය අඩු කිරීම සිදු කරයි.

ද්‍රවශීලතාව සහ අරමුදල් අවදානම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි භාවිතයෙන් භාණ්ඩාගාර අංශයේ වත්කම් වගකීම් කළමනාකරණ අංශය විසින් කළමනාකරණය කරනු ලබයි.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, පුද්ගලයන් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් හේතුවෙන් පැන නගින අවදානම වේ. නෛතික අවදානම, මෙහෙයුම් අවදානමට ඇතුළත් වුවත් කීර්ති නාමය හානි වීමේ අවදානම සහ උපායමාර්ගික අවදානම ඊට අයත් නොවේ. මෙහෙයුම් අවදානම පුද්ගලයන්, ක්‍රියාවලි සහ පද්ධතිවල අසම්පූර්ණත්වය හේතුවෙන් යැයි පූර්ණ වශයෙන් වර්ග කිරීම හෝ බැහැර කිරීම සිදු කළ නොහැක. කෙසේවුවත්, එය අවදානම දරාගැනීමේ මට්ටම තුළ කළමනාකරණය කළ හැක.

බැංකුව එහි දෛනික මෙහෙයුම් තුළින් පුළුල් පරාසයක පැතිරුණු මෙහෙයුම් අවදානම් රැසකට නිරාවරණය වන අතර, මතු වෙමින් තිබෙන මෙහෙයුම් අවදානම් පිළිබඳවද දැනුවත්ය.

පවත්නා සහ ඇතිවන ප්‍රවනතාවල බලපෑම සලකා බලමින් මෙහෙයුම් අවදානම් කළමනාකරණ කාර්යය වාර්ෂික පදනමක් මත සමාලෝචනය කෙරේ.

මෙහෙයුම් අවදානම් සමාලෝචනය →

අවදානම් සාධකය	විස්තරය	නියාමනය/කළමනාකරණය සඳහා භාවිත මෙවලම්	නිරාවරණය	බලපෑම*
සොරකම් සහ වංචා අවදානම	අභ්‍යන්තර හෝ බාහිර පාර්ශව විසින් සිදු කරන ලබන වංචාකාරී ක්‍රියා	• වංචා අවදානම් කළමනාකරණය සහ අනතුරු හැඟවීමේ ක්‍රියාවලිය • අභ්‍යන්තර පාලන • ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක නියාමනය • අලාභ ජනනය කරන සිදුවීම් නියාමනය • අවදානම් පාලන ස්වයං - තක්සේරුව (RCSA)	ඉහළ	බලපෑමෙහි ඉහළයාම
සයිබර් අවදානම සහ දත්ත අන්සතු වීම.	සයිබර් අපරාධ/දත්ත බිඳීම් සහ පද්ධති අක්‍රිය වීම	• අභ්‍යන්තර පාලන • තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය • ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක නියාමනය • සිදුවීම් වාර්තාකරණය	ඉහළ	වෙනසක් නැත
ව්‍යාපාර අඛණ්ඩතා අවදානම	ව්‍යාපාර බිඳවැටීම හෝ පද්ධති දෝෂවලින් ඇතිවන අලාභ	• ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක නියාමනය • ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ ක්‍රමය (BCMS) ක්‍රියාත්මක කිරීම	ඉහළ	බලපෑමෙහි ඉහළයාම
අනුකූලතා/නියාමන අවදානම	නියාමන අවශ්‍යතා සපුරාලීමට අසමත්වීම	• අනුකූලතා වැඩසටහන් සහ පරීක්ෂණ • ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක නියාමනය • අනුකූලතා අවදානම සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමවේදය	ඉහළ	වෙනසක් නැත
නෛතික අවදානම	නෛතික අවශ්‍යතා මග අනුකූලවීමට අසමත්වීම/අනුකූලතාවය ප්‍රමාණවත් නොවීම්	• සියලු ගිවිසුම්ගත වගකීම් ආශ්‍රිත නෛතික ගැටළු නිරාකරණය කිරීම • ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක නියාමන	මධ්‍යස්ථ	වෙනසක් නැත

*ඉපයීම් සහ ප්‍රාග්ධනය මත බලපෑමෙහි වාර්ෂික වෙනස

බලපෑමෙහි ඉහළයාම | වෙනසක් නැත | බලපෑමෙහි පහළයාම

වගුව 31 මෙහෙයුම් අවදානම් සමාලෝචනය

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

මෙහෙයුම් අවදානම බැංකුව සඳහා වැදගත් අවදානම් අනුව සමාලෝචනය කෙරේ.

තීරණාත්මක ව්‍යාපාර මෙහෙයුම් වල මෙහෙයුම් අවදානම සඳහා ඉතා අඩු අවදානම් දරාගැනීමේ මට්ටමක් පවත්වා ගැනීමට බැංකුව කටයුතු කර ඇත. වසර තුළ කොවිඩ්-19 හේතුකොටගෙන ව්‍යාපාර අඛණ්ඩතා අවදානම පැන නැඟුනු අතර මෙහෙයුම් සඳහා වඩා ඉහළ බලපෑමක් ඇති කරන ලදී.

2020 මූල්‍ය වසර සඳහා මෙහෙයුම් අලාභ පසුගිය වසර තුන සඳහා සාමාන්‍යය විගණනය කළ සාමාන්‍ය දළ ආදායමෙන් 0.13%ක් වූ අතර එය මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීමට ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන ව්‍යුහ, ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටිවල ඵලදායිත්වය පිළිබිඹු කරමින් අවදානම් අභිරුචි මට්ටමට හා අවදානම දරාගැනීමේ මට්ටමට වඩා බෙහෙවින් පහල මට්ටමක පවතී.

අවදානම් අභිරුචිය සහ අවදානම් දරාගැනීමේ සීමාවට අනුව සැබෑ මෙහෙයුම් අලාභ — ප්‍රස්තාරය 36



ප්‍රවණතා රේඛාව මගින් පසුගිය වසර පහක කාලසීමාව තුළ අවම මට්ටම්වල අලාභ පවත්වා ගැනීමේදී බැංකුවේ අනුරූපතාව පෙන්වයි.

කොවිඩ්-19 වසංගතය ව්‍යාපාර කරගෙන යන ආකාරයේ හදිසි වෙනසක් ඇති කර ඇති අතර එහි බලපෑම් සැලකියයුතු කාලසීමාවක් පවතිනු ඇත.

එදිනෙදා සේවය ලබාදීම තුළ මානව සම්පත්වල ඉහළ මැදිහත්වීම සහ ජනතාව සමඟ සම්බන්ධ වන මට්ටම හේතු කොට ගෙන මූල්‍ය සේවා සපයන්නෙක් ලෙස බැංකුවේ මෙහෙයුම්වලට වසංගතය දැඩි බලපෑමක් ඇති කරන ලදී. එහෙත්, ව්‍යාපාර අඛණ්ඩතා වැඩපිළිවෙල සහ සක්‍රීය තීරණ සමඟ බැංකුව අඟහු සැලසුම් සමඟ ගනුදෙනුකරුවන්ට බාධාරහිත සේවයක් ලබා දෙන ලදී.

දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද සංචලන සීමා කිරීම් හේතුකොට ගෙන සේවකයින්ට දුරස්ථව ක්‍රියාත්මක කිරීමට මෙහෙයුම් ක්‍රියාවලි සකසා දීමේදීත්, වැඩිවන ඊ-වාණිජ්‍ය ගනුදෙනු හා අන්තර්ජාල බැංකුකරණ කටයුතු කලමනාකරණය කිරීමේදීත් සයිබර් වංචාවලින් ආරක්ෂා වීම හා දත්ත ආරක්ෂණය ප්‍රමුඛතාවයෙහි ලා සලකන ලදී.

සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කළ මාර්ගෝපදේශවලට අනුකූල වෙමින් සේවකයින් සහ ගනුදෙනුකරුවන් ආරක්ෂා කර ගැනීමට සියලුම පූර්වාරක්ෂාවන් ගනු ලැබීය.

මෙහෙයුම් අවදානම් කළමනාකරණය →

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත මෙහෙයුම් අවදානම් කාර්යරාමුව මත පදනම් වි සියලුම මෙහෙයුම් ක්ෂේත්‍ර තුළ මෙහෙයුම් කළමනාකරණය කර ගැනීමට විස්තීර්ණ ප්‍රවේශයක් බැංකුව ගෙන ඇත.

ශාඛාවන් සහ අංශ වෙතට අනුයුක්ත කාර්ය මණ්ඩලය මෙහෙයුම් අවදානමේ මූලික හිමිකරුවන් වෙති. ඔවුන්ට ප්‍රමාණවත් පුහුණුව ලබාදෙන අතර එය තම වගකීම් ක්ෂේත්‍රය තුළ ආවේනික අවදානම් හඳුනා ගැනීමේදි සහය වේ.

පද්ධති පාලන, පිවිසුම් පාලන, රාජකාරි බෙදාදීම. බලතල සහ වගකීම්වල පැහැදිලි මාර්ග, ගනුදෙනු සඳහා බලය දීමේ සහ පරීක්ෂා කිරීමේ ද්විත්ව පරීක්ෂණ, වත්කම් මත භෞතික පාලනයන්, වාර්තා තැබීම, සැසැඳීම්, සහ විගණන ලොග් අභ්‍යන්තර පාලන ව්‍යුහයේ කොටස් වන අතර, එය මෙහෙයුම් අවදානම් කළමනාකරණයේ පදනම වේ.

අවදානම් කළමනාකරණ අංශයේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය ක්‍රියාවලි සහ පාලන ඌණතා ආමන්ත්‍රණය කිරීමට නිවැරදි කිරීමේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂාව ඇතිව අවදානම් හඳුනා ගනී.

මෙහෙයුම් අවදානම් නිරාවරණ කළමනාකරණය කර අවම කිරීමට බැංකුව විවිධ මෙවලම් සහ ශිල්පක්‍රම භාවිතා කරයි.

අලාභ ඇතිවන සිදුවීම් පිළිබඳ දත්ත රැස්කිරීම සහ විශ්ලේෂණය

අලාභ ඇති කරන සිදුවීම් පිළිබඳ දත්ත රැස්කිරීම යහපත් මෙහෙයුම් අවදානම් කළමනාකරණයේ ප්‍රධාන සංරචකයක් වන අතර, වඩා දියුණු ප්‍රාග්ධන ගණනය කිරීමේ ආකෘති භාවිතා කිරීම සඳහා එය නිර්ණායකයකි.

බැංකුවේ අලාභ ඇති කරන සිදුවීම් පිළිබඳ දත්ත රැස්කිරීමේ ක්‍රියාවලිය මගින් අභ්‍යන්තර මෙන්ම බාහිර පාඩු ඇති කරන ක්‍රියාකාරකම් ආවරණය කෙරේ,

කාලින නියාමන වාර්තාකරණය සහ හඳුනා ගැනීම සඳහා සියළු භූගෝලීය පිහිටීම්වල අභ්‍යන්තර අලාභ ඇති කරන සිදුවීම් පිළිබඳ දත්ත හඳුනාගැනීම සහ රැස්කිරීම සඳහා ලේඛණගත කරන ලද ක්‍රියාවලියක් බැංකුව සතුය. එමෙන්ම, එවැනි සමාන ආයතන විසින් ප්‍රකාශයට පත් කරන ලද මෙහෙයුම් අලාභ ඇති කරන සිදුවීම්ද බැංකුවේ අලාභ ඇති කරන සිදුවීම් පිළිබඳ බාහිර දත්ත ගබඩාව මගින් ග්‍රහණය කෙරේ.

එලෙස රැස් කරන ලද තොරතුරු බාසල් මට්ටම II අලාභ සිදුවීම් යටතේ වර්ගීකරණය කෙරෙන අතර, සිදුවීමේ ස්වභාවය, ඊට මූලික වූ සාධක සහ එවැන්නක් ඇතිවීමේ සම්භාවිතාව හඳුනාගැනීම සඳහා භාවිතා කෙරේ. ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සහ අවදානම අවම කිරීමේ කටයුතු අලාභ ඇතිකරන සිදුවීම් රටාවන් මත පදනම් වී නිර්දේශ කෙරේ.

2020 වර්ෂය තුලදී රැස්කළ අභ්‍යන්තර අලාභ ඇතිකරන දත්ත අනුව, පිළිවෙලින් භෞතික සම්පත් හානිවීම හා බාහිර වංචා වාර්තා වූ වාර ගණන ඉහළම අගයක් සහ උග්‍රතාවයක් ගෙන තිබුණි. සිදුවීම්වල වාරගණන සහ උග්‍රතාවය කළමනාකරණය කර ගත හැකි මට්ටමේ වූ අතර ඒවා දරාගැනීමේ මට්ටම් තුළ විය.

අලාභ ජනනය කරන සිදුවීම්වල උග්‍රතාවය

ප්‍රස්තාරය 37

2019 2020

IF – අභ්‍යන්තර වංචා

EF – බාහිර වංචා

EPWS – ක්‍රියාත්මක කිරීම, සැපයීම සහ ක්‍රියාවලි කළමනාකරණය

CPBP – භෞතික සම්පත්වලට සිදුවූ හානි

DPA – ව්‍යාපාර බිඳවැටීම් සහ පද්ධති අඩාලවීම

BDSF – ගනුදෙනුකරුවන්, නිමැවුම් සහ ව්‍යාපාර ආශ්‍රිත පරිචයන්

EDPM – සේවානියුක්තිකයන්ගේ පරිචයන් සහ කාර්යාලයේදී ආරක්ෂාව

අලාභ ජනනය කරන සිදුවීම්වල උග්‍රතාවය

ප්‍රස්තාරය 38



2019 2020

IF – අභ්‍යන්තර වංචා

EF – බාහිර වංචා

EPWS – ක්‍රියාත්මක කිරීම, සැපයීම සහ ක්‍රියාවලි කළමනාකරණය

CPBP – භෞතික සම්පත් වලට සිදුවූ හානි

DPA – ව්‍යාපාර බිඳවැටීම් සහ පද්ධති අඩාලවීම

BDSF – ගනුදෙනුකරුවන්, නිමැවුම් සහ ව්‍යාපාර ආශ්‍රිත පරිචයන්

EDPM – සේවානියුක්තිකයන්ගේ පරිචයන් සහ කාර්යාලයේදී ආරක්ෂාව

ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක නියාමනය කිරීම:

සිදුවීමේ වාර ගණන සහ බලපෑම සම්බන්ධයෙන් වන අවදානම් සාධක තුළ වෙනස්වීම් පෙන්නුම් කරන හෙයින් අවදානම් නියාමනය සහ අවදානම් වාර්තා කිරීම ඉහළ නැංවීම සඳහා ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක යොදා ගනී.

යම් ක්‍රියාවක් ආශ්‍රිතව ඇතිවිය හැකි අවදානම, ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක මගින් තක්සේරු කෙරෙන අතර බැංකුවේ මූල්‍ය, මෙහෙයුම්, කීර්තිනාම, අනුකූලතා හෝ උපායමාර්ගික ගැටළු සම්බන්ධයෙන් පූර්ව අනතුරු හැඟවීමේ පද්ධතියක් ලෙසද ක්‍රියාත්මක වේ.

විගණන ගැටළු කළමනාකරණය, ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණය, තොරතුරු ආරක්ෂණ කළමනාකරණය, නිමැවුම්වල ගුණාත්මකභාවය, ක්‍රියාවලින් හී ගුණාත්මකභාවය සහ අනුකූලතාවය යන ක්ෂේත්‍ර ආවරණය කෙරෙන අවදානම් අනුකෘතියක් තුළ මෙහෙයුම් අවදානම් පැතිකඩ හඳුනාගැනීම සහ තක්සේරු කිරීම සඳහා බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක මගින් බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික මෙහෙයුම් සහ උපකාරක සේවා ආවරණය කෙරේ. පූර්ව නිශ්චිත කඩඉම් සීමා මත පදනම්ව අවදානම තක්සේරු කිරීම සඳහා සෑම ක්ෂේත්‍රයක් යටතේම ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශක විග්‍රහ කෙරේ. මෙම කඩඉම් සීමා වාර්ෂිකව හෝ මෙහෙයුම් පරිසරයේ වෙනස්කම් සැලකිල්ලට ගෙන වර්ෂයක් තුළ එක් වරකට වඩා වැඩි වාර ගණනකදී සංශෝධනය කෙරේ.

අවදානම් පාලන ස්වයං තක්සේරුව (RCSA)

බැංකුව මුහුණපාන මෙහෙයුම් අවදානම, අවබෝධ කරගැනීම, පාලනය කිරීම සහ ඉහළ නැංවීම සඳහා අවදානම් හඳුනාගැනීමේ සහ අවදානම් කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග ඒකාබද්ධ කිරීමට හා සම්බන්ධීකරණය කිරීමට අවදානම් පාලන ස්වයං තක්සේරුව ඔස්සේ බැංකුවට අවස්ථාව සැලසෙන හෙයින් එය බැංකුවේ සමස්ත මෙහෙයුම් අවදානම් කාර්යරාමුවේ මූලික කොටසක් ලෙස හඳුන්වාදිය හැකිය. අවදානම් සහ පාලන ස්වයං තක්සේරුව, ව්‍යාපාරික ක්‍රියාවලියේ හිමිකරුවන් පළමු ආරක්ෂණ ස්ථරය ලෙස ඔවුන්ගේ අවදානම් මැනවින් හඳුනාගනී යන උපකල්පනය මත පදනම් වේ.

අවදානම් පාලන ස්වයං තක්සේරුවේ ප්‍රධාන සොයාගැනීම් අවදානම් කළමනාකරණය තුළ සිදුවියහැකි පරතර හඳුනා ගැනීමට හා උපායන් යෙදීමට බැංකුවට සහය වේ. පූර්ව නිශ්චිත අවදානම් පරාමිතිවලට අනුව නිරාවරණ ඇගයීමට ශාඛා ජාලය සහ ප්‍රධාන ව්‍යාපාරවල ක්‍රියාවලි හිමිකරුවන්ගේ සහයෝගිත්වය ඇතිව අවදානම් කළමනාකරණ අංශය විසින් අවදානම් පාලන ස්වයං තක්සේරුව සිදුකරනු ලබයි.

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි කළමනාකරණය

සියලුම පැමිණිලි නිශ්චිත කාලසීමාවක් තුළ වාර්තා කර ප්‍රතිචාර දක්වන බව සහතික කිරීම සඳහා බැංකුව ගනුදෙනුකාර පැමිණිලි නිරාකරණ ක්‍රියාවලියක් ස්ථාපිත කර ඇත.

ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි, බැංකුවේ මෙහෙයුම් දුර්වලතා සහ මෙහෙයුම් ආශ්‍රිත ගනුදෙනුකරුවන්ගේ අදහස් හඳුනාගැනීමේ මූලාශ්‍රයක් ලෙස මෙහෙයුම් අවදානම් ඒකකය විසින් සලකනු ලබයි.

ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි මෙහෙයුම් අවදානම් නිරීක්ෂණ ඒකකය විසින් කලින් කලට සමාලෝචනය කරනු ලබන අතර එහි සොයා ගැනීම් තවදුරටත් අවදානම අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ.

තොරතුරු ආරක්ෂාව

මූල්‍ය සේවා පද්ධතිය තුළ ඇතිවෙමින් තිබෙන තාක්ෂණික ප්‍රගමනය විසින් බැංකුවේ ව්‍යාපාරික ආකෘතිය බෙහෙවින් වෙනස් කරනු ලැබ ඇති අතර එමනිසා තොරතුරු තාක්ෂණ සන්නිවේදනය ආශ්‍රිතව මතුවෙමින් තිබෙන අනාරක්ෂිතතාවලින් තොරතුරුවල නිරවද්‍යභාවය, පාලනය, අඛණ්ඩභාවය සහ රහස්‍යභාවය අනුව ගනුදෙනුකරුවන්ට වඩා සුරක්ෂිත බැංකු සේවාවක් සැපයීම සඳහා බැංකුව තොරතුරු ආරක්ෂණ කළමනාකරණයෙහිලා පාලනය ක්‍රියාත්මක කරයි.

අභ්‍යන්තරිකව වශයෙන්. බැංකුව සිය වැදගත් තොරතුරු වත්කම් ආරක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවා ඇත.

තොරතුරු ආරක්ෂණ අවදානම් කළමනාකරණ කාර්යරාමුව ක්‍රියාත්මක කිරීමේ වගකීම තොරතුරු ආරක්ෂණ අංශය වෙත පැවරී ඇත. තොරතුරු ආරක්ෂණ අංශය, බාහිර විශේෂඥ, සේවා සපයන්නන් සමග එක්ව තොරතුරු පද්ධති සම්බන්ධයෙන් ස්වාධීන අවදානම් තක්සේරු කිරීම් සිදු කරන අතර, ඒවායේ ප්‍රතිඵල අවදානම් ප්‍රතිකර්ම හෝ අවදානම් වළක්වාලීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහා භාවිතා කෙරේ.

නිරන්තරයෙන් හට ගන්නා සයිබර් තර්ජනවලට මුහුණදීම ශක්තිමත් කිරීම සඳහා බැංකුව තොරතුරු ආරක්ෂණ මුලපිරීම් අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත. 2020 වසර තුළ, තොරතුරු ආරක්ෂණ අනාරක්ෂිතතා අවම කිරීම සහ ආරක්ෂිත තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කරගෙන පහත දැක්වෙන මුලපිරීම් ක්‍රියාත්මක කරන ලදී:

i. **ගෙවීම් කාඩ්පත් ක්ෂේත්‍රය - දත්ත ආරක්ෂණ ප්‍රමිතිය (PCI DSS)**

ගෙවීම් කාඩ්පත් ක්ෂේත්‍රය - දත්ත ආරක්ෂණ ප්‍රමිතිය යනු ප්‍රධාන කාඩ්පත් යෝජනා ක්‍රමවලින් සන්නාම සහිත ණය/හර කාඩ්පත් ආශ්‍රිත සේවා සපයන ආයතන සඳහා තොරතුරු ආරක්ෂණ ප්‍රමිතියකි.

එය ගෙවීම් කාඩ්පත් ආරක්ෂණය සඳහා වන වඩාත්ම පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතිය වන අතර, කාඩ්පත් මෙහෙයුම් සහ ආශ්‍රිත තොරතුරු පද්ධති සඳහා නිශ්චිත තාක්ෂණික සහ මෙහෙයුම් පාලන මත පදනම් වේ. දැනට බැංකුව ගනුදෙනුකරුවන් සඳහා මාස්ටර්කාඩ් සහ වීසා සන්නාම සහිත හර කාඩ්පත් සපයන අතර, ගෙවීම් කාඩ්පත් ක්ෂේත්‍රය - දත්ත ආරක්ෂණ ප්‍රමිතිය, කාඩ්පත් හිමියන්ගේ දත්තවල සුරක්ෂිතතාවය සහතික කරයි. ගෙවීම් කාඩ්පත් ක්ෂේත්‍රය - දත්ත ආරක්ෂණ ප්‍රමිති අනුකූලතාවය හිමිකරගත් එකම රාජ්‍ය බැංකුව ජාතික ඉතිරිකිරීමේ බැංකුව වන අතර, අනුකූලතාවය 2019 දී අත්කර ගනු ලැබීය. 2020 සඳහා,බැංකුව ගෙවීම් කාඩ්පත් ක්ෂේත්‍රය - දත්ත ආරක්ෂණ ප්‍රමිති සමග නැවත සහතික කරන ලදී.

ii. **ආරක්ෂිත මෙහෙයුම් මධ්‍යස්ථානය (SOC)**

බැංකුව විසින් ප්‍රවීණ තෙවන පාර්ශ්වයකගේ සහය ඇතිව 2020 වසර තුළ තොරතුරු ආරක්ෂණ අංශය යටතේ 24X7X365 ක්‍රියාත්මක ආරක්ෂිත මෙහෙයුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කරන ලදී. සිදුවීම්වලට ප්‍රතිචාර දැක්වීමේ ශක්‍යතාවන් ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලිය හැකි අයුරින් තව දුරටත් ශක්තිමත් කෙරිණ. තාක්ෂණ අවදානම් ස්ථායීතාවය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලද උපදේශන පත්‍රිකාවේ අවශ්‍යතා අත්කරගැනීමට පෙර සූදානමක් ලෙස, බැංකුව 2020 වසර සඳහා යෝජිත අවශ්‍යතා අත්කර ගෙන ඇත. මෙය තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කළ අතර. විධිමත් කළමනාකරණ කමිටු සමාලෝචන සහ තාක්ෂණික සමාලෝචන තුළින් ක්‍රියාත්මක කරන ලද පාලනයන්හී තව දුරටත් ශක්තිමත් කිරීම සහ පවත්වාගැනීම අඛණ්ඩව සිදු කෙරේ.

iii. **දත්ත කාන්දුවීම වැළැක්වීම (DLP)**

තොරතුරු තාක්ෂණ අංශයේ සහය ඇතිව තොරතුරු ආරක්ෂණ අංශය විසින් දත්ත ආරක්ෂා කර සුරක්ෂිත කිරීම සඳහා සහ රෙගුලාසිවලට අනුකූලවීම සඳහා 2020 වසර තුළ දත්ත කාන්දුවීම වැළැක්වීම සහ දත්ත වර්ගීකරණ විසඳුම ක්‍රියාත්මක කරන ලදී.

ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය

ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය ගනුදෙනුකරුවන් සහ පාර්ශ්වකරුවන් වෙත බිඳ වැටීම්වලින් තොර අඛණ්ඩ සේවාවක් ලබාදීම සහතික කරයි. එය, තොරතුරු තාක්ෂණය මත පදනම්ව ක්‍රියාත්මක වන බැංකු පරිසරයක් සඳහා අත්‍යාවශ්‍ය සාධකයකි.

ස්වභාවික, මිනිසා විසින් සිදු කරන හෝ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් විපත් මගින් අවම බිඳවැටීම් සංඛ්‍යාවක් සමගින් ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම හා සම්බන්ධ පාලන ව්‍යුහයක්, ප්‍රතිපත්ති ලේඛණ, ක්‍රියාවලි හා පද්ධති බැංකුව ක්‍රියාවට නංවා ඇත.

ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ප්‍රතිපත්ති කාර්යරාමුව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, පරීක්ෂා කිරීම සහ නියාමනය සඳහා සහ බැංකුවේ ආපදා පිළියම් අංශය කළමනාකරණය සඳහා වන වගකීම ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඒකකය වෙත පවරා ඇත.

අවදානම් පැවරීම →

ඵලදායී පිරිවැය අවම කරගැනීමේ ක්‍රමවේදයක් හා අවදානම් පැවරීමේ උපායමාර්ගයක් ලෙස බාහිර පාර්ශ්ව සේවයේ යෙදවීම උපයෝගී කර ගනී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බාහිර පාර්ශ්ව සේවයේ යෙදවීම පිළිබඳ ප්‍රතිපත්තිය සහ වෙනත් නියාමන අවශ්‍යතා වලට අනුකූලව බැංකුවේ බාහිර පාර්ශ්ව සේවයේ යෙදවීමේ මෙහෙයුම් සිදු කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ වලට අනුකූලවීම සහතික කිරීම සඳහා ව්‍යාපාරික මෙහෙයුම් සඳහා බාහිර පාර්ශ්වයන්ගේ සේවය ලබාගැනීමෙන් ඇතිවන අවදානම පරිපාලන අංශයේ බාහිර පාර්ශ්වයන්ගේ සේවය ලබාගැනීම නියාමනය කිරීමේ ඒකකය විසින් කළමනාකරණය කරනු ලබයි.

බාහිරින් ලබාගන්නා කාර්යයන් ඉටු කිරීම සඳහා සේවා සපයන්නන්ගේ හැකියාව තහවුරු කරගැනීම සඳහා බැංකුව තත්ත්ව විශ්ලේෂණ ක්‍රියාකාරකම් සිදු කරයි. පරිපාලන අංශය විසින් බාහිර පාර්ශව සේවයේ යෙදවීමේ කාර්යයේ සහ භාවිතා කරන අවදානම් කළමනාකරණ ක්‍රමවේදවල ඵලදායීතාව මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව විසින් නියාමනය කරනු ලබයි.

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

මෙහෙයුම් අවදානම් අඩු කිරීමේ ක්‍රමවේදයක් ලෙස රක්ෂණය කළ හැකි ප්‍රධාන අවදානම රක්ෂණ සේවා සපයන්නෙකු වෙත පැවරීම සඳහා රක්ෂණය ප්‍රධාන කාර්යයක් ඉටු කරයි. බැංකුවට අදාළ පවතින හා මතුවෙමින් තිබෙන අවදානම් සැලකිල්ලට ගනිමින් රක්ෂණ ප්‍රතිපත්තියේ ප්‍රමාණවත්භාවය අඛණ්ඩව සමාලෝචනය කෙරේ. මෙහෙයුම් අවදානම් සඳහා රක්ෂණ ප්‍රතිසාධනයේ ප්‍රගතිය අවදානම් කළමනාකරණ අංශය නියාමනය කර වාර්තා කරයි. රක්ෂණ කාර්යය පරිපාලන අංශය තුළ මධ්‍යගත කෙරෙන අතර එය මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව තුළින් නියාමනය කෙරේ.

නෛතික අවදානම →

නෛතික අවදානම මෙහෙයුම් අවදානමෙහි කොටසකි. නෛතික අවදානම යනු ව්‍යාපාරය, එහි සම්බන්ධතා, ක්‍රියාවලි, නිෂ්පාදන සහ සේවාවන්ට අදාළ නිති සහ රෙගුලාසි යනාදිය පිළිබඳ අවබෝධය නොමැතිකම හෝ වැරදි අවබෝධය, බහු අර්ථතාවය හෝ අනවධානි නොසැලකිල්ල තුළින් ඇතිවන මූල්‍ය හෝ කීර්තිනාමය අහිමිවීමේ අවදානමයි. එයට ගිවිසුම් කෙටුම්පත් කිරීමේදී දුර්වලතා, දඩ සහ දණ්ඩණීය හානි වලට මග පාදන ලිඛිත ගිවිසුම් හෝ ප්‍රමාණවත් ආකාරයේ ලිඛිත ගිවිසුම් නොමැතිව ගනුදෙනුවලට ඇතුළත්වීම හේතුවෙන් අලාභ සිදුවීමේ අවදානම ඇතුළත් වේ.

නෛතික අවදානම කළමනාකරණය යනු බැංකුවට එහි පරමාර්ථ සාර්ථකව සපුරාලීමේ හැකියාවට අවාසි පමුණුවන නීතිමය ගැටළුවල වාරගණන සහ උග්‍රතාව අඩුකරන තීරණ ගැනීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියවලියයි. නීති අංශය නිෂ්පාදන සහ ව්‍යාපාර මෙහෙයුම් සහ ගනුදෙනුකරුවන් හෝ සේවා සපයන්නන් වැනි තෙවැනි පාර්ශවයන් සමඟ ගිවිසුම්ගත සම්බන්ධතා සම්බන්ධ නිති සහ රෙගුලාසිවලට අනුකූලතාව සහතික කිරිම හා මැදිහත් වේ.

නීති අංශය ව්‍යාපාර අංශවලට මඟපෙන්විම ලබාදෙන අතර, බැංකුවේ නෛතික අවදානමේ උපාය මාර්ගික කළමනාකරණය තුළ කටයුතු කරයි.

අනුකූලතා සහ නියාමන අවදානම →

බැංකු ක්ෂේත්‍රය තුළ බලපැවැත්වෙන නීති හා රෙගුලාසි, නියෝග, ප්‍රතිපත්ති, ආචාර ධර්ම සංග්‍රහය සහ පරිචයන් ආශ්‍රිත ප්‍රමිති සමග අනුකූල නොවීම හේතුවෙන් සෘජුවම අනුකූලතා සහ නියාමන අවදානම ඇති වේ. මෙය නියාමන සම්බාධක, මූල්‍ය දණ්ඩණ, ව්‍යාපාර මෙහෙයුම් බිඳවැටීම් සහ කීර්තිනාම හානිවලට හේතු වේ. අනුකූලතා ප්‍රතිපත්ති කාර්යරාමුවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුකූලතා ප්‍රතිපත්තිය, මුදල් විශුද්ධිකරණ විරෝධී ප්‍රතිපත්තිය සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන ප්‍රතිපත්තිය සහ බැංකුව විසින් අනුකූලතාවය කළමනාකරණ ආකාරය පිළිබඳ විස්තර කරන අනුකූලතා සංග්‍රහය ඇතුළත්ය. අනුකූලතා නිළධාරී ප්‍රධානියා ලෙස කටයුතු කරන අනුකූලතා අංශය අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව ඔස්සේ සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන අතර බැංකුවේ අනුකූලතා අවදානම වළක්වාලීමට පියවර ගනී. 2020 වර්ෂය තුළදී, බැංකුවේ අනුකූලතා සහ නියාමන අවදානම අවම කිරීමට පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගෙන ඇතඃ

- අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නිසි කලට සමාලෝචනය කෙරෙන බව සහතික කිරීම.
- බැංකුවේ ශාඛා, අංශ සහ නිෂ්පාදන පිළිබඳ අනුකූලතා තක්සේරු කිරීම් පැවැත්වීම.
- පුහුණු සැසි ඔස්සේ දැනුවත් කිරීම.
- අධීක්ෂණ ප්‍රස්තුත තක්සේරු කිරීම සහ නියාමනය කිරීම.
- බැංකුව තුළ මුදල් විශුද්ධිකරණ (ML)/ත්‍රස්තවාදි අරමුදල්කරණ (TF) අවදානම් තක්සේරු කිරිම.

මුදල් විශුද්ධිකරණ විරෝධය සහ ගනුදෙනුකාර නිසි සැලකිල්ල දක්විමේ කටයුතු පවත්වා ගැනීම දුරස්ථව හෝ අභ්‍යන්තර සිදුකරනු ලැබුවද, සමාජ දුරස්ථතා ක්‍රියාමාර්ග කොවිඩ්-19 වසංගතයෙන් ඇති වූ මෙහෙයුම් සීමාකිරිම් හැරුණු විට බැංකුව විසින් මුහුණ දියයුතු අවදානමකි.

කීර්තිනාම අවදානම →

කීර්තිනාම අවදානම යනු ආයතනයේ සන්නාමයට අහිතකර ලෙස බලපාන සිද්ධියකින් හෝ සිදුවිමකින් ඇතිවන වක්‍ර අවදානමයි. බැංකුව සහ එහි ප්‍රසිද්ධිය පිළිබඳ සෘණාත්මක හැඟීමක් පිරිවැය සහගත නඩුකීමකට, ආදායම අඩුවිමකට සහ ගනුදෙනුකාර පදනම අඩුවිමකට හේතු වේ. එබැවින්. සිය මෙහෙයුම් පිළිබඳ ජනතා විශ්වාසය පවත්වා ගැනීම සඳහා කීර්තිනාම අවදානම කළමනාකරණය කිරීම මූල්‍ය ආයතන සඳහා වඩා ඉහළ වැදගත්කමකි.

ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, අචාර ධර්ම සංග්‍රහ සහ ව්‍යාපාර සාරධර්ම මගින් කළමනාකරණය කරන අනෙකුත් ව්‍යාපාර අවදානම් රාශියක් මගින් කීර්තිනාම අවදානම ඇතිවිය හැකි බැවින් අනෙකුත් සියලුම අවදානම් සඳහා යොදා ගන්නා පද්ධති සහ පාලන තුළින් කීර්තිනාම අවදානම පුළුල්ව කළමනාකරණය කෙරේ.

ශ්‍රී ලංකාව තුළ ප්‍රමුඛ බලපත්‍රලාභි විශේෂිත බැංකුවක් ලෙස දශක පහකට වැඩි කාලයක් බැංකුව වඩා උසස් කිර්තිනාමයක් පවත්වා ගෙන ඇත. එමනිසා, කීර්තිනාමය මත සෘණාත්මක බලපෑම අඩුවෙන් පැවතුණි. යහපත් කීර්තිනාමය තුළින් බැංකුවේ අවංකකම. කාර්ය මණ්ඩලයේ දක්ෂතාව සහ ගනුදෙනුකාර විශ්වාසය සඳහා පදනම නිර්මාණය කළ ගලපනලද නිෂ්පාදන හා සේවා පිළිබිඹු කරයි.

කීර්තිනාමයට හානි සිදුවීමේ අවදානම ආශ්‍රිතව ශුන්‍ය අවදානම් අභිරුචියක් බැංකුව සතුවේ. එබැවින්, පූර්ව හදුනා ගැනීමේ දර්ශක තුළින් අවදානම් කළමනාකරණ අංශය කීර්තිනාමයට හානි සිදුවීමේ අවදානම සමීපව නියාමනය කරනු ලබයි. ගනුදෙනුකරුවන්, අනෙකුත් පාර්ශ්වකරුවන් සන්නිවේදනය කිරීමට සහ අහිතකර සන්නිවේදනවලින් කිර්තිනාමය ආරක්ෂා කිරීමට බැංකුව විවිධ මාර්ග භාවිතා කරයි.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු කිරිමේ ක්‍රියාවලි මාර්ගෝපදේශ මත පදනම් වි කීර්තිනාම අවදානම තක්සේරු කිරිමට ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් මත පදනම් වූ ආකෘතියක් භාවිතා කෙරේ.

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

උපායමාර්ගික අවදානම →

උපායමාර්ගික අවදානම යනු තරඟකාරී වාතාවරණය, නියාමන කාර්යරාමුව තුළ වෙනස්වීම්වලට ප්‍රතිචාර දක්විමේදී හෝ සාර්ව ආර්ථික පරිසරය තුළ ආකර්ෂක්ෂම ස්ථානගතවිමෙන් ඉපයිම් සහ උපායමාර්ගවල ශක්‍යතාවය සඳහා වියහැකි අලාභයයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ දැක්ම, මෙහෙවර සහ අවදානම් අභිරුචියට සමගාමී වන උපායමාර්ගික සැලසුම්කරණය සහ අයවැය ක්‍රියාවලියක් ඔස්සේ උපායමාර්ගය සකස් කිරීමේ වගකීම අංශ ප්‍රධානීන් වෙත පැවරේ. උපායමාර්ග මූලික කරගනිමින්, කළමනාකරණය අත්කරගත හැකි උපායමාර්ගික අරමුණු සකස් කරන අතර, ඒවා දැකියහැකි අනාගතය සඳහා ගනුදෙනුකාර අගය නිර්මාණය කිරිමට සහ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට මනාව ස්ථානගතකරනු ලබයි.

පර්යේෂණ අංශයේ අදහස් සහ සොයාගැනීම් බැංකුව සඳහා ව්‍යාපාර උපායමාර්ග සකස් කිරිමේදී ඇතුළත් කෙරේ. උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ අවදානම අවම කිරීමට නිවැරදි දක්ෂතා, හැකියාවන්, යටිතල පහසුකම් සහ තාක්ෂණය ලබාගැනීම සහතික කිරීමට බැංකුව අවශ්‍ය පියවර ගෙන ඇත. උපායමාර්ගික ප්‍රතිවිපාත අවදානම අවම කිරිමේදී, නිරන්තර පදනමක් මත සිදුකරන උපායමාර්ගික තීරණවල ප්‍රගතිය කළමනාකරණය විසින් සමාලෝචනය කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයට බැංකුවේ උපායමාර්ගික අවදානම හා සම්බන්ධ පාලන වගකීම ඇති අතර, නිරන්තරයෙන් සිදු කෙරෙන සමාලෝචන මගින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය එය අඛණ්ඩව නිරීක්ෂණය කරයි. බැංකුව අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය යටතේ උපායමාර්ගික අවදානම තක්සේරු කිරීම සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් මත පදනම්වූ ආකෘතියක් භාවිතා කරයි.

ප්‍රාග්ධන සමාලෝචනය →

නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම, එහි තැන්පත්කරුවන්/ණය හිමියන් වෙත මූල්‍ය සුරක්ෂිතතාව සැපයීම, අනාගත ව්‍යාපාරික පුළුල් කිරීම් සඳහා ඉඩ හසර පවත්වාගැනීම සහ එහි පාර්ශ්වකරුවන් වෙත ප්‍රමාණවත් ප්‍රතිලාභ උත්පාදනය කිරීම සඳහා බැංකුව විසින් ශක්තිමත් ප්‍රාග්ධන තත්ත්වයක් පවත්වාගනු ලැබීම අත්‍යාවශ්‍ය වේ.

පාර්ශවකරුවන්ට ප්‍රතිලාභ උත්පාදනය කිරිම සඳහා අතරතුර බැංකුව සතු හැකියාව සහතික කිරීම ප්‍රාග්ධන කළමනාකරණයෙන් සිදු කෙරේ. එබැවින්, කාර්යසාධනය සහ අවදානම අතර ප්‍රශස්ත තුලනයක් තබාගනිමින් සහ වත්කම මත බරතැබූ අවදානම් මුසුව සහ අවදානම් පැතිකඩෙහි වෙනස්කම් දැඩිව නිරීක්ෂණය කිරිම ඔස්සේ ප්‍රාග්ධනය වඩා ඵලදායී ලෙස කළමනාකරණය කරගැනීමට බැංකුව උත්සාහ ගනී. ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රියාවලිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ වලට අනුකූල වේ.

2019 අංක 11 දරණ බැංකු පනත් නියමය මගින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ නියමයන්ට සංශෝධනය අනුව, 32 වගුවේ දක්වා ඇති අවම ප්‍රාග්ධන අනුපාත අවශ්‍යතාව පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව තවදුරටත් පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකුවක් ලෙස නොසලකන බැවින් (non DSIB), ඉහළ අලාභ අවශෝෂණය ආරක්ෂණයක් ආදේශ කිරීම අවශ්‍ය නොවේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොවිඩ්-19 න් පසු ආර්ථික කටයුතු පහත වැටීමේ සන්දර්භය තුළ 50bps කින් තම ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය පහළ දැමීමට පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකුවක් නොවන බැංකුවලට ඉඩදී ඇත. එමෙන්ම, අති විශේෂ නියාමන ක්‍රියාමාර්ග අවදානම බර තබන වත්කම් පහල දැමීම සඳහා ලබා දෙන ලදි.

2019 වසර තුළදී, බැංකුව විසින් රුපියල් බිලියන 3.1 ක සමස්ත මිලදි ගැනුම් ප්‍රතිෂ්ඨාවක් සඳහා ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව අත්පත් කරගන්නා ලදී. 250% ක බර තැබූ අවදානමක් යොදා ගනිමින් හිමිකම් ස්ථර I සමග සිදුකරන ලද සමස්ත ව්‍යවස්ථාපිත ගැළපීම්වලින් එම ආයෝජනය ඉවත් කිරීමට බැංකුව මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. බැංකුව පසුගිය වසරේදී ගෙවූ රුපියල් බිලියන 2 ක ලාභාංශවලට සාපේක්ෂව 2020 වර්ෂයේදී රුපියල් බිලියන 1 ක් ගෙවා ඇත.

2020 ඔක්තෝබර් 9% ක සම අනුපාතයකට (Floor rate) රු.බි. 5ක් වන බාසල් III අනුකූල නිත්‍ය අමතර ස්ථිර 1 උපකරණ බැංකුව නිකුත් කළේය.

බැංකුව 2020 වසර තුලදී ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සඳහා නිර්දේශිත අවම නියාමන අවශ්‍යතා අත්කර කරගෙන තිබේ. පොදු හිමිකම් ස්ථර I අනුපාතිකයේ ස්ථානය 2019 දෙසැම්බර් 31 දිනට 13.49% සිට 2020 දෙසැම්බර් 31 දිනට 12.03% දක්වා වැඩි විය. සුදුසුකම් සහිත අතිරේක ස්ථර I ප්‍රාග්ධන උපකරණ නිකුතුවේ ප්‍රතිඵලයක් ලෙස, බැංකුවේ ස්ථර I ප්‍රාග්ධන අනුපාතය 2020 දෙසැම්බර් 31 දිනට 13.65% දක්වා වැඩිවිය. මුළු ප්‍රාග්ධනය 2019 දෙසැම්බර් 31 දිනට පැවති 15.82%ට සාපේක්ෂව 2020 දෙසැම්බර් 31 දිනට 16.45% දක්වා වැඩි විය.

බැංකුවේ පරිපාලිත, සමූහ මට්ටමේදී ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය වෙත ධනාත්මකව දායක විය. සමූහයේ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය 2019 දෙසැම්බර්වලට පැවති 17.74%ට සාපේක්ෂව 2020 දී 18.3%ක් විය. 100% ක් රජයට අයත් ඉතිරිකිරීමේ බැංකුවක් ලෙස, බාහිර වශයෙන් ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා පවතින විකල්ප සීමිත වේ. එබැවින්, ප්‍රාග්ධනය ඉහළ නංවා ගැනීම සඳහා වඩාත්ම තෝරාගත් ප්‍රභවය රඳවාගත් ඉපයීම් වේ.

ප්‍රස්තාරය 39

ප්‍රාග්ධන මට්ටම - බැංකුව සහ සමූහය



අනුපාතික (%)	නියාමන අවමය	CCB රහිත නියාමන අවමය	2020 දෙසැම්බර් 31 දිනට තත්‍ය අගය		2019 දෙසැම්බර් 31 දිනට තත්‍ය අගය	
			බැංකුව	සමූහය	බැංකුව	සමූහය
පොදු සමකොටස් ස්ථර I ප්‍රාග්ධන අධිභාරය	7.00	6.5	**12.03**	**13.96**	13.49	15.37
ස්ථර I ප්‍රාග්ධන අධිභාරය	8.50	8.0	**13.65**	**15.57**	13.49	15.37
සමස්ත ප්‍රාග්ධනය	12.5	12.0	**16.45**	**18.30**	15.82	17.74

වගුව 32 ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය

මෙහෙයුම් කාර්යක්ෂමතා, වර්ධනය සහ නුබුන්වත්භාවය අත්කරගැනීම සඳහා අවදානම් කළමනාකරණ පරිචයන් සහ උපායමාර්ගික ව්‍යාපාර සැලසුම්කරණය සංයෝජනය කරමින් අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) ඒකාබද්ධ ප්‍රවේශයක් ප්‍රවර්ධනය කරයි.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) - ස්ථර II

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය, සියළු ප්‍රමාණාත්මක අවදානම් ග්‍රහණය කරගැනීම සඳහා යහපත් අවදානම් කළමනාකරණ කාර්යරාමුවක් සමඟ අවදානම් අභිරුචිය, පීඩන පරීක්ෂාව සහ ප්‍රාග්ධන සංකල්ප යන සාධක වලින් සමන්විත වේ. බැංකුවේ අවදානම් පැතිකඩට අනුරූපව අභ්‍යන්තර ප්‍රාග්ධන මට්ටම ස්ථාපිත කරගැනීම සඳහා ව්‍යාපාර කාර්යසාධනය, අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග සහ අවදානම් සංවේදී ප්‍රාග්ධනය වඩා තර්කානුකූල ආකාරයකින් සංයෝජනය කිරීමට හැකියාව ඇති කරයි.

අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය සහ ජාත්‍යන්තර යහපරිචයන් සම්බන්ධයෙන් බැංකු වෙත නිකුත් කරන ලද බාසල් III ස්ථර II මාර්ගෝපදේශ පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමයන්ට අනුකූලවූ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලියට අදාළ ප්‍රතිපත්තියක් බැංකුව සතුවේ.

බැංකුව සහ නියාමකයා සඳහා අත්‍යවශ්‍ය වන මූලධර්ම සතරකින් බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සමන්විත වේ. තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවදානම ඒකාබද්ධ කරගැනීම, පුළුල් වූ අවදානම් තක්සේරුකරණය, අභ්‍යන්තර පාලන සමාලෝචනය, නියාමනය, වාර්තාකරණය සහ අවදානම් පීඩන පරීක්ෂාවට ලක් කිරීම මෙම ක්‍රියාවලියට ඇතුළත් වන අතර එය අධීක්ෂණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරේ.

අවදානම් තක්සේරුකරණය ස්ථර I මෙන්ම ස්ථර II අවදානමද ආවරණය කරයි. ස්ථර I නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවය හා අදාළ වන අතර ස්ථර II ආර්ථික ප්‍රාග්ධනය හා අදාළව කටයුතු කරයි.

අවදානම් පැතිකඩ සහ අභ්‍යන්තර ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම සහ ප්‍රමාණනය කිරීම සඳහා අභ්‍යන්තර පාලන ආකෘති බැංකුව සතුවේ. ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සම්බන්ධයෙන් ඵලදායී තක්සේරුවක් සැපයීම සඳහා අභ්‍යන්තර ප්‍රාග්ධන අවශ්‍යතා ආවරණය කිරීමට අභ්‍යන්තර සීමා පනවා ඇත. පුළුල් ලෙස ලේඛණගත කර තිබෙන අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය නියාමන අධිකාරිය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම වත්කම් වගකීම් කළමනාකරණ කමිටුව මගින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කොට සාකච්ඡාවට ලක්කොට අනුමත කරනු ලැබ තිබේ.

පීඩන පරීක්ෂාව

II ස්ථරය යටතේ පීඩන පරීක්ෂාව අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය කොටසකි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පීඩන පරීක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තිය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මගින් බැංකුවේ පීඩන පරීක්ෂාව පිළිබඳ කාර්යරාමුව පාලනය කෙරේ. ණය අවදානම, වෙළෙඳ පොතේ සහ බැංකු පොතේ පොලී අනුපාත අවදානම, මෙහෙයුම් අවදානම, ද්‍රවශීලතා අවදානම, සංකේන්ද්‍රණ අවදානම සහ ශේෂවූ ණය අවදානම වැනි සියළුම ප්‍රමාණාත්මක අවදානම් ආශ්‍රිතව සිදු කෙරෙන පීඩන පරීක්ෂා බැංකුවේ පීඩන පරීක්ෂාව පිළිබඳ කාර්යරාමුවට ඇතුළත් වේ. පීඩන පරීක්ෂා අරමුණු සඳහා බැංකුව ඉහළයන සීඝ්‍රතා මට්ටම් තුනක් එනම් සුළු, මධ්‍ය සහ විශාල (හෝ පහළ, මධ්‍යම සහ ඉහළ) නිර්වචනය කර ඇත.

බැංකුව ක්‍රියාත්මක වන පරිසරය තුළ සිදුවන අහිතකර ආර්ථික, දේශපාලනික සහ භෞතික වෙනස්කම් යටතේ ඇති විය හැකි විවිධ අහිතකර අනපේක්ෂිත තත්ත්වයන් දරාගැනීම සඳහා බැංකුව සතු හැකියාව පිළිබඳ අවබෝධයක් පීඩන පරීක්ෂාව මගින් ලබා දේ.

බැංකුවේ පීඩනය කොවිඩ්-19 ක්‍රියාදාමය සහ කළමනාකරණ තීරණ ගැනීමට සහය වීම සඳහා නුබුන්වත් දර්ශක කෙරෙහි බලපෑම අවබෝධ කර ගැනිමට රෙගුලාසිවල වෙනස්වීම් සඳහා පරීක්ෂා කරන ලදී.

පොලී අනුපාත, විදේශ විනිමය අනුපාත සහ සාමානය කොටස් මිල ඇතුළු විශේෂ උපකරණ හෝ කළඹ කෙරෙහි තනි තනි වෙළඳපොළ සාධකවල විචලනවල බලපෑම මැනීම සඳහා බැංකුව විසින් සංවේදිතා විශ්ලේෂණය භාවිත කරනු ලබයි.

අහිතකර පොලී අනුපාත විචලන හේතුවෙන් වෙළෙඳ හෝ බැංකු පොත මත ඇතිවන බලපෑම හඳුනාගැනීම සඳහා බැංකුව ප්‍රධාන වශයෙන් සංවේදිතා විශ්ලේෂණය භාවිත කරන අතර, නිරන්තර පදනමක් මත වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා ඉදිරිපත් කෙරේ. බැංකුවේ වත්කම් හා වගකීම් කළමනාකරණය සහ මිලකරණ තීරණ සඳහා මෙම වාර්තා වැදගත් වේ.

අවදානම් සහ ප්‍රාග්ධන කළමනාකරණය

	ලාභ හෝ පාඩු මත සාධාරණ වටිනාකම රු. '000	වෙනත් විස්තීර්ණ ආදායම මත සාධාරණ වටිනාකම රු. '000	එකතුව රු. '000
2020 වසර අවසානයට පැවති අගය මත රාජ්‍ය සුරැකුම් කළඹෙහි උපලබ්ධ නොවූ ලාභය/(අලාභය)	143,897	73,521	217,418
ආසන්නතම වෙළඳපොළ මිල තක්සේරුවෙහි වෙනස්කම්			
ආදායමේ 100 bps ඉහළයාම	(206,648)	(253,099)	(459,747)
ආදායමේ 200 bps ඉහළයාම	(403,831)	(498,106)	(901,937)
ආදායමේ 100 bps පහළයාම	216,686	261,547	478,233
ආදායමේ 200 bps පහළයාම	516,747	531,918	1,048,665

වගුව 33 ► සංවේදිතා විශ්ලේෂණය - වෙළඳ පොතේ පොලී අනුපාත අවදානම - රජයේ සුරැකුම්පත්

සෘණ පරතරය මත 100 bps කම්පන අනුපාතිකය		මාස 1 දක්වා	මාස 1-3	මාස 3-6	මාස 6-12	අවුරුදු 1-3	අවුරුදු 3-5	අවුරුදු 5ට වැඩි	එකතුව
ස්වාධීන මට්ටම	පරතරය	(185,148)	(312,815)	(187,290)	(270,688)	287,943	296,495	380,416	8,912
	ශුද්ධ පොළී ආන්තිකය මත බලපෑම (රු.මි.)	(1,780)	(2,614)	(1,180)	(705)	–	–	–	(6,279)
ඒකාබද්ධ මට්ටම	පරතරය	(185,914)	(315,028)	(181,474)	(268,105)	295,242	298,994	384,830	28,545
	ශුද්ධ පොළී ආන්තිකය මත බලපෑම (රු.මි.)	(1,788)	(2,632)	(1,144)	(698)	–	–	–	(6,262)

වගුව 34 ► සංවේදිතා විශ්ලේෂණය - බැංකු පොතේ ආදායම් වක්‍ර අවදානම තක්සේරු කිරීම

පූර්ව තීරණ ගැනීමේ ක්‍රියාවලියට උපකාර කිරීම අරමුණු කරගෙන පීඩන පරීක්ෂාවන්හි ප්‍රතිඵල අවදානම් අභිරුචිය සහ අවදානම් සීමා පැනවීම, ප්‍රාග්ධන සැලසුම්කරණය, උපායමාර්ගික ව්‍යාපාර සැලසුම්කරණය සහ අත්‍යවශ්‍ය ව්‍යාපාර මෙහෙයුම්වල අවදානම් කළමනාකරණය කිරීම සඳහා යොදා ගනී.

අවදානම් ක්ෂේත්‍රය	සංසිද්ධිය	ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකය මත බලපෑම		
		පහළ %	මධ්‍යම %	ඉහළ %
ණය අවදානම	ණය අවදානම - ආර්ථික පසුබෑමක් හේතුවෙන් ණය ආපසු ගෙවීම පැහැරහැරීමේ සම්භාවිතාව ඉහළ යාම (පහළ - 10%, මධ්‍යස්ථ - 20%, ඉහළ - 30%)	-0.065	-0.108	-0.216
වෙළඳපොළ අවදානම	පොලී අනුපාත අවදානම : වෙළඳපොළ ප්‍රතිලාභ අනුපාතය ඉහළ යාම (පහළ 50 bps, මධ්‍යස්ථ 100 bps, ඉහළ 200 bps)	-0.03	-0.06	-0.12
	ස්කන්ධ මිල අවදානම : වෙළඳපොළ කොටස් මිලගණන්වල පහළ යාම (පහළ - 15%, මධ්‍යස්ථ - 20%, ඉහළ - 25%)	0.15	0.17	0.20
	විදේශ විනිමය අවදානම : ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම (පහළ - 5%, මධ්‍යස්ථ - 10%, ඉහළ - 15%)	-0.006	-0.012	-0.018
මෙහෙයුම් අවදානම	බාසල් II අලාභ ජනිත කරන සිදුවීම් කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලද මෙහෙයුම් අලාභවල ඉහළයාම	-0.02	-0.03	-0.04

වගුව 35 ► ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය

අවම හෙළිදරව් කිරීමේ අවශ්‍යතා – ස්ථර III

වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන පාර්ශ්වයන්ට බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සහ අවදානම් නිරාවරණ පිළිබඳව තක්සේරු කරගැනීමට අවස්ථාව ලබාදීම පිණිස බාසල් III කාර්යරාමුවේ සීමා තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවම හෙළිදරව් කිරීමේ අවශ්‍යතා හඳුන්වා දී තිබේ. 2016 අංක 01 දරණ බැංකු පනත ප්‍රකාරව අවම හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සඳහා පිටු අංක 287 සිට 300 දක්වා බලන්න.

මූල්‍ය වාර්තා 115

මූල්‍ය දින දර්ශනය – **116**

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව – **117**

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය – **123**

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය – **125**

අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතිකවීමේ වාර්තාව – **127**

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (මුදල් හා සැලසුම්) වගකීම පිළිබඳ ප්‍රකාශය – **128**

විගණකාධිපති වාර්තාව – **130**

මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගතය – **133**

ආදායම් ප්‍රකාශය – **134**

විස්තීරණ ආදායම් ප්‍රකාශය – **135**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය – **136**

හිමිකමේ වෙනස්වීමේ ප්‍රකාශය – **138**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය – **142**

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් – **144**

මූල්‍ය දින දර්ශනය

මූල්‍ය දින දර්ශනය 2020	
2020 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	2020 මැයි 29
2020 ජූනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	2020 අගෝස්තු 31
2020 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	2020 නොවැම්බර් 27
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා මූල්‍ය වාර්තා (විගණනය කළ) ප්‍රකාශයට පත් කිරීම	2021 මාර්තු 30
යෝජිත මූල්‍ය දින දර්ශනය 2021	
2021 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	2021 මැයි 31
2021 ජූනි 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	2021 අගෝස්තු 31
2021 සැප්තැම්බර් දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කිරීම	2021 නොවැම්බර් 30
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා අතුරු මූල්‍ය වාර්තා (විගණනය කළ) ප්‍රකාශයට පත් කිරීම	2022 මාර්තු 31

අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සාමාන්‍ය කරුණු

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ කටයුතු පිළිබඳ ඔවුන්ගේ වාර්ෂික වාර්තාව බැංකුවේ විගණනය කරන ලද 2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමගින් එක්ව ඉදිරිපත් කරන්නේ සතුටිනි. එය බැංකුව මගින් පසුගිය වර්ෂ පුරාද සහ අනාගතයේදීද වටිනාකම නිර්මාණය කරන්නේ සහ රඳවා ගන්නේ කෙසේද යන්න පිළිබඳව විස්තර වන බැංකුවේ ව්‍යාපාර කටයුතු වල උපායමාර්ගික සිතුවමක් ලබා දෙන බව අපි දනිමු.

විගණන කමිටු මණ්ඩලය (BAC) විසින් සමාලෝචනය කර නිර්දේශ කරන ලදවාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021 මාර්තු 19 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලදී. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 2021 මාර්තු 21 වන දින නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. තවද, වාර්තාවෙහි 1988 අංක 30 දරන බැංකු පනත සහ ඒ සඳහා වූ සංශෝධන සහ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ නිකුත් කරන ලද 2007 අංක 12 දරණ බැංකු පනත් නියමයේ උපදෙස් යටතේ අවශ්‍ය යම් හෙළිදරව් කිරීම් ද එයට පසුකාලීන සංශෝධනද ඇතුළත් වේ. වාර්ෂික වාර්තාව සහ විගණකාධිපතිගේ වාර්තාව සමගින් මූල්‍ය ප්‍රකාශන පොදු ව්‍යාවසාය දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද යහපාලනය සඳහා වන මාර්ගෝපදේශයන්ට අනුකූලව පාර්ලිමේන්තුවේදී සභාගත කිරීම සඳහා මූල්‍ය වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත මුදල් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතුය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත මඟින් ශ්‍රී ලංකාවේදී සංස්ථාපිත කරන ලද අතර 1988 අංක 30 දරන බැංකු පනත ප්‍රකාරව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක තත්ත්වය පිරිනමන ලදී. බැංකුවට ICRA ලංකා ලිමිටඩ් විසින් දිගුකාලීන SL (AAA) ස්ථාවර ණය ශ්‍රේණිගත කිරීම් ලබාදී ඇත.

ව්‍යාපාර සමාලෝචනය

බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ශ්‍රී ලාංකීය ජනතාව අතර ඉතුරුම් ප්‍රවර්ධනය කිරීම සහ එසේ සංචලනය කරන ලද ඉතුරුම් ලාභදායී අයුරින් ආයෝජන කිරීමත්ය. ඒ අනුව, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් තුළ පාරිභෝගික බැංකුකරණය, ආයතනික බැංකුකරණය, වෙළඳ මූල්‍යකරණය, භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ගනුදෙනු සහ ආයෝජන, නියෝජිත බැංකුකරණය සහ මුදල් ප්‍රේෂණ පහසුකම්, උකස් ණය, විදේශ විනිමය ගනුදෙනු සහ අනෙකුත් මූල්‍ය සේවා ඇතුළත් වේ.

දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

බැංකුවේ දැක්ම, මෙහෙවර සහ වටිනාකම් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 2 සහ 3 හි සඳහන් කර ඇත. බැංකුවෙහි දැක්ම සහ මෙහෙවර තුළ දක්වා ඇති අරමුණු ළඟා කර ගන්නා අතරතුර එහි ක්‍රියාකාරකම්වලදී ඉහළ ආචාරධර්ම ප්‍රමිති පවත්වා ගනී. සියලු ස්ථිර සේවකයන් බැංකුවේ දැක්ම සහ මෙහෙවර කරා ළඟා වීමේ දැක්මෙන් යුතුව බැංකුවේ ආයතනික චර්යාධර්ම සංග්‍රහයට සහ රජයේ ප්‍රතිඥාවට අනුකූලව කටයුතු කරයි.

රජයේ සහතික වීම

ශ්‍රී ලංකා රජය බැංකුවේ තැන්පත් කළ මුදල් සමග එහි පොලී මුදල් ආපසු ගෙවීමට සහතික වෙයි.

බැංකුවේ පරිපාලිත සමාගම්

එන්එස්බී අරමුදල් කළමනාකරණ සීමිත සමාගම සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව, බැංකුවේ පරිපාලිත සමාගම් දෙක වේ. එන්එස්බී අරමුදල් කළමනාකරණ සීමිත සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලයලත් ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ලෙස රජයේ සුරැකුම්පත් ගනුදෙනු කිරීමය.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ඉතිරිකිරීම් හා කාලීන තැන්පතු ලබාගැනීම, ණය පහසුකම් සැපයීම, කුලී පිට ගැණුම්, කල්බදු, උකස් ණය සහ වෙනත් ණය පහසුකම් සැපයීම සහ ප්‍රමුඛ ඉතුරුම් සහ සංවර්ධන බැංකුවේ පැහැර හරින ලද ඉතුරුම් තැන්පතු වගකීම් පියවීම පිණිස ණය ගිණුම් ප්‍රතිනිර්මාණය කිරීමත්ය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 24 වන සටහනෙහි පරිපාලිත සමාගම් සමඟ වූ ගනුදෙනු පිළිබඳව විස්තර ලබා දී ඇත.

සමූහයේ ව්‍යුහයට වෙනස් කිරීම්

බැංකුවෙහි සහ සමූහයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයේ සැලකිය යුතු වෙනස්කම් සිදු නොවීය.

ව්‍යාපාර කාර්යසාධනය සමාලෝචනය

2020 මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය සභාපතිතුමියගේ ලිපියේ (පිටු අංක 6 සහ 7) සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිගේ සමාලෝචනයේ (පිටු අංක 8 සිට 10) දක්වා ඇත. මූල්‍ය ප්‍රාග්ධනය සමාලෝචනය පිටු අංක 24 සිට 38 දක්වා සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන (පිටුව 134 සිට 282 දක්වා) දක්වා ඇති අතර එමගින් බැංකුවේ සහ සමූහයේ කටයුතුවල තත්වය සහ මූලික ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සපයයි.මෙම වාර්තා වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

ශාඛා ජාලය පුළුල් කිරීම

දිවයින තුළ බැංකුවේ පැතිරීම පුළුල් කරමින්, සමාලෝචනය යටතේ ඇති වර්ෂය තුළ ශාඛා ජාලයට නව ශාඛා තුනක් එක් කරන ලදී. වර්ෂය අවසානයේ දී බැංකුව සතු ශාඛා ජාලය ශාඛා 259 ක් විය. ගනුදෙනුකරුවන්ගේ පහසුව වැඩි දියුණු කරමින් ATM ජාලය තවදුරටත් පුළුල් කරන ලදී. බැංකුව වසර තුළ දිවයින පුරා නව CRM යන්ත්‍ර 24ක් සහ නව ATM යන්ත්‍ර 3 ක් ස්ථාපනය කරමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ගනුදෙනුකරුවන් හට ගනුදෙනු කළ හැකි අනෙකුත් බැංකුවල ATM යන්ත්‍ර හැර මුළු ATM/CRM යන්ත්‍ර ගණන 361 ක් දක්වා වැඩි කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම

මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති/ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRSs/ LKASs) අනුව සහ 1988 අංක 30 දරණ බැංකු පනතේ නියමයන්ට සහ එහි සංශෝධන හා විශේෂිත අනාවරණයන් ඇතුළුව නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව, පිළියෙල කර ඇත. 2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉහත සඳහන් කළ මූල්‍ය ප්‍රකාශයන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් සහ සැලසුම් විසින් සහතික කරන ලද අතර

අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ බැංකුවේ සභාපති ඇතුළු අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙක් විසින් අනුමත කර අත්සන් කරන ලද අතර, එය පිටු අංක 134 සිට 137 දක්වා ඇත. එය බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වසර තුළ වූ වෙනස් වීම්

බැංකුව සහ සමූහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRSs/LKASs) අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වාර්තාවේ පිටු අංක 144 සිට 160 දක්වා ඇතුළත් වේ. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ බැකුවේ සහ සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් සිදු නොවීය.

මූල්‍ය වාර්තාකරණය සඳහා වන අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් →

2020 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ ව්‍යාපාර කටයුතුවල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය ගැන සත්‍ය සහ සාධාරණ මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙළ කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. මූල්‍ය ප්‍රකාශනවල පිටු අංක 134 සිට 137 දක්වා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRSs/LKASs) සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන සහ 1971 අංක 30 දරණ ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතෙහි අවශ්‍යතාවලට අනුකූලව පිළියෙළ කර ඇති බව අධ්‍යක්ෂවරු විශ්වාස කරති. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිටු අංක 123 සහ 124 හි සවිස්තරාත්මකව පැහැදිලි කරන අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

විගණකගේ වාර්තාව →

2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල විගණනය විගණකාධිපති විසින් සිදු කරන ලදී. තවද, විගණකාධිපති විසින් බැංකුවේ පරිපාලිත සමාගම් වන එන්එස්බී අරමුදල් කළමනාකරණ සමාගම සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව විගණනය කරන ලදී. 2020 වසර පුරාවටම, බැංකුව සඳහා විගණනය කරගෙන යන ලදී. ඔවුන්ගේ වාර්තාවලින් හඳුනා ගන්නා ලද ගැටලු කඩිනම් ක්‍රියාමාර්ග සඳහා නිරන්තරව කළමනාකරණය වෙත ඉදිරිපත් කරන ලදී. මූල්‍ය වාර්තාකරණයේ නිවැරදි බව තහවුරු කර, මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය දත්ත සහ තොරතුරු සහිතව විගණකාධිපතිගේ පරීක්ෂාව සඳහා ලබා දෙන ලදී. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ තත්ත්වාගණනය නොකරන ලද විගණක මතය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 130 සිට 132 දක්වා දැක්වේ.

ලාභාංශ සහ සංචිත

මූල්‍ය ප්‍රතිඵල සහ විසර්ජනයන් →

බැංකුවෙහි සහ සමූහයෙහි ආදායම් බදුවලට පෙර ලාභය පිළිවෙළින් රු.මිලියන 15,645 ක් සහ රු. මිලියන 16,791 ක් විය. (2019 - රු. මිලියන 10,462 සහ රු. මිලියන 13,092) ක් විය. බැංකුවෙහි සහ සමූහයෙහි බදුවලට පසු ලාභය පිළිවෙළින් රු. මිලියන 10,108 ක් සහ රු.මිලියන 10,821 ක් විය. (2019 - රු. මිලියන 6,381 ක් සහ රු. මිලියන 8,713).

බැංකුවට අදාළ ලාභවල විස්තර පහත වගුවෙහි දී ඇත:

	2020 රු.මිලියන	2019 රු.මිලියන
සියළු වියදම් ගෙවීමෙන් පසුව ක්ෂයවීම්, අපේක්ෂිත ණය අලාභ සහ අවිනිශ්චිතතාවයන් වලට ගැලපීමෙන් පසු VAT, NBT, DRL සහ ආදායම් බදු වලට පෙර ලාභය	**19,432**	15,659
මූල්‍ය සේවා මත වූ එකතු කළ අගය මත බදු (VAT)	**3,787**	3,046
මූල්‍ය සේවා මත වූ ජාතිය ගොඩනැගීම් බද්ද (NBT)	**–**	366
ණය ආපසු ගෙවීමේ අය බදු (DRL)	**–**	1,785
ආදායම් බදු සඳහා වෙන්කිරීම	**5,537**	4,081
බදු පසු ශුද්ධ ලාභය	**10,108**	6,381
වසර සඳහා බදු පසු ශුද්ධ විස්තීරණ ආදායම්	**(4,498)**	(2,729)
වසර සඳහා මුළු විස්තීරණ ආදායම	**5,610**	3,652
විසර්ජනයන්		
ව්‍යවස්ථාපිත සංචිතයට මාරු කිරීම්	**(505)**	(335)
ජාතික රක්ෂණ භාර අරමුදලට දායකත්වය (NITF)	**(101)**	(67)
ඒකාබද්ධ අරමුදල සඳහා දායකත්වය/ලාභාංශ	**(1,000)**	(2,000)

ඉදිරි සංවර්ධනයන්

බැංකුවේ අනාගත සංවර්ධනයන් පිළිබඳ සාරාංශයක් 2020 වාර්ෂික වාර්තාවේ සභාපතිතුමියගේ පණිවිඩයෙහි (පිටු අංක 6 සහ 7 හි), සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිගේ සමාලෝචනයෙහි (පිටු අංක 8 සිට 10 දක්වා) සහ"උපාය මාර්ග සහ සම්පත් වෙන් කිරීම්" පිළිබඳ විස්තරයේ පිටු අංක 19 සිට 23 දක්වා පිටු තුළ දක්වා ඇත.

දළ ආදායම

2020 දී බැංකුවේ දළ ආදායම රුපියල් මිලියන 127,547 ක් (2019 - රුපියල් මිලියන 121,929) වූ අතර සමූහයේ ආදායම රුපියල් මිලියන 130,039 ක් (2019 - රුපියල් මිලියන 125,810) ක් විය. දළ ආදායම්වල විශ්ලේෂණය මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 03 හි දක්වා ඇත.

බදු සඳහා ප්‍රතිපාදන →

බැංකුව සහ සමූහය සඳහා එහි මෙහෙයුම් කටයුතු මත අදාළ වන ආදායම් බදු අනුපාතය 28%ක් විය. කෙසේ වෙතත් බැංකු ක්ෂේත්‍රය සඳහා අදාල වන ආදායම් බදු අනුපාතය 24% දක්වා 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි අඩුකර ඇති අතර එය තවමත් බලාත්මක කර නොමැත. බැංකුව සහ සමූහය මෙහෙයුම් මූල්‍ය සේවා මත 15%ක එකතු කළ අගය මත බද්දකට (VAT) යටත් වේ. 2% ක් වූ මූල්‍ය සේවා මත වූ ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා බැංකුව සහ සමූහය යටත් වූ අතර එය 2009 පෙබරවාරි 01 වන දින හඳුන්වා දී 2019 දෙසැම්බර් 01 දින අහෝසි කරන ලද අතර, 2018 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි හඳුන්වා දුන් මූල්‍ය සේවා මත 7% ක ණය ආපසු ගෙවීමේ බද්ද 2020 ජනවාරි 01 දින අහෝසි කරන ලදී.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS 12) - "ආදායම් බදු" පිළිබඳ ගිණුම් ප්‍රමිතියට අනුකූලව වගකීම් ක්‍රමය යටතේ බැංකුව සියළු හඳුනාගත් තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු සඳහා ප්‍රතිපාදන සිදුකොට ඇත. ආදායම් බදු වියදම් සහ විලම්බිත බදුකරණය පිළිබඳ තොරතුරු පිළිවෙළින් 171 සහ 211 පිටුවල 13 සහ 30 සටහන් යටතේ දක්වා ඇත.

ලාභාංශ, බදු සහ අයබදු/ ජාතියට සිදුකළ දායකත්වය →

බැංකුව 2020 වසරේදී බදු සහ අයබදු ලෙස රු. මිලියන 10,745 රජයට දායක කර ඇත. (2019 - රු. මිලියන 11,664). මෙයට පහත දේ ඇතුළත්ය:

	2020 රු. මිලියන	2019 රු. මිලියන
ආදායම් බදු	**5,537**	4,080
එකතු කළ අගය මත බදු	**3,787**	3,046
ජාතිය ගොඩනැගීමේ බද්ද	**–**	366
විශේෂ ගාස්තු	**320**	320
ණය ආපසු ගෙවීමේ අය බදු	**–**	1,785
ඒකාබද්ධ අරමුදලට දායකත්වය	**1,000**	2,000
ජාතික රක්ෂණ භාර අරමුදලට දායකත්වය	**101**	67
ජාතිය සඳහා කළ මුළු දායකත්වය	**10,745**	11,664

සංචිත →

2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු සංචිත රු. මිලියන 42,497 ක් විය (2019 - රු. මිලියන 36,525). බැංකුවෙහි සංචිත පහත ඒවායින් සමන්විතය:

	2020 රු. මිලියන	2019 රු. මිලියන
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	**4,068**	3,563
ප්‍රත්‍යාගණන සංචිතය	**6,679**	5,611
රඳවා ගත් ඉපැයුම්	**11,883**	8,195
වෙනත් සංචිත	**19,867**	19,156
මුළු සංචිත	**42,497**	36,525

සංචිතවල වෙනස් වීම පිළිබඳ තොරතුරු හිමිකම්වල වෙනස් වීම පිළිබඳ ප්‍රකාශයෙහි 138 සිට 141 පිටුවල දක්වා ඇත.

තැපැල් දෙපාර්තමේන්තුව සඳහා සේවා ගාස්තු →

තැපැල් දෙපාර්තමේන්තුව සඳහා සේවා ගාස්තුව 2019 වෙන්කිරීම පදනම් කරගෙන 2020 වසර වෙනුවෙන් රු.මිලියන 160 ක් වෙන්කර ඇත.

විශ්‍රාමික ප්‍රතිලාභ සහ වගකීම් →

බැංකුව විසින් විශ්‍රාම අරමුදල් දෙකක් පවත්වා ගෙන යනු ලබයි. එනම් කාර්ය මණ්ඩල විශ්‍රාම අරමුදල I සහ කාර්ය මණ්ඩල විශ්‍රාම අරමුදල II වශයෙනි. තවදුරටත් බැංකුව විසින් වැන්දඹු/වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල මෙන්ම විශ්‍රාමික වෛද්‍යාධාර ක්‍රමයක් පවත්වාගෙන යනු ලබයි. විස්තර මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල 219 සිට 229 දක්වා පිටු තුළ දක්වා ඇත.

දේපළ, පිරියත සහ උපකරණ සහ ප්‍රාග්ධන වියදම් →

2020 න් අවසන් වූ වසර සඳහා බැංකුව සහ සමූහය සතු දේපළ, පිරියත සහ උපකරණවල අගය (අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) පිළිවෙළින් රුපියල් මිලියන 16,004 ක් සහ රුපියල් මිලියන 16,892 ක් විය. (2019 දී රුපියල් මිලියන 14,163 ක් බැංකුවේ සහ රුපියල් මිලියන 14,457 ක් සමූහයේ විය).

විස්තර මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් වල පහත පරිදි ඇත.

- මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 26: දේපළ, පිරියත සහ උපකරණ පිටු අංක 200 සිට 206
- මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 29: කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම් පිටු අංක 209 සහ 210
- මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 48.1: ප්‍රාග්ධන බැඳීම් පිටු අංකය 235

වසර තුළ දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් (නොනිමි ප්‍රාග්ධන වැඩ ඇතුළුව) අත්පත් කර ගැනීමට බැංකුව විසින් දරන ලද මුළු ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 2,159 (2019 - රු. මිලියන2,207) ක් වූ අතර සමූහය සඳහා රුපියල් මිලියන 2,169ක් විය (2019 - රු. මිලියන 2,212). ඒවායෙහි විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 202 සිට 205 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 26. (අ) සහ 26. (ආ) තුළ දක්වා ඇත.

සින්නක්කර දේපළවල වෙළඳ පොළ අගය →

2020 දෙසැම්බර් මස වෘත්තීයමය සුදුසුකම්ලත් ස්වාධීන තක්සේරුකරුවන් විසින් බැංකුවේ සියලු සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනයක් සිදුකර, එය එම වසරේම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරන ලදී. "බලපත්‍රලාභී විශේෂිත වූ බැංකුවල නිශ්චල දේපළ ආගණනය" පිළිබඳ 2014 අංක 1 දරන මහ බැංකු නියමය සමග අනුකූලව බැංකුවේ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනය සිදු කරන ලදී. සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනය කළ වටිනාකම් එහි වෙළඳ පොළ අගයට වඩා නොවැඩි බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වේ.

ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ කොටස් හිමිකම →

ප්‍රකාශිත ප්‍රාග්ධනය →

බැංකුවේ අනුමත කොටස් ප්‍රාග්ධනය රුපියල් බිලියන 10ක් වන අතර එය එකක් රුපියල් 10/- ක් වූ බිලියන 01 ක සාමාන්‍ය බිලියන 01 ක කොටස්වලින් සැදී ඇත. 2020 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය රුපියල් බිලියන 9.4කි. භාණ්ඩාගාර ලේකම් ඔහුගේ නිල බලයෙන් නිකුත් කළ කොටස් සියල්ල රඳවා ගනී. විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක පිළිවෙළින් 230 සහ 231 හි සටහන් 43 ඇති ප්‍රකාශිත ප්‍රාග්ධන පවරන ලද ප්‍රාග්ධනය යටතේද සටහන් අංක 46.1 ඇති හිමිකම් තැන්පතු සංචිතය යටතේද දක්වා ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

කොටස් හිමිකම

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ එකම කොටස්කරු ශ්‍රී ලංකා රජයයි.

යටත්කාලීන ණයකර නිකුත් කිරීම

2020 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ යටත්කාලීන වගකීම රු. බිලියන 06 කි. 2016 දෙසැම්බර් 29 වන දින පුද්ගලික ස්ථානගත කිරීම මත නිකුත් කළ තක්සේරු කර ඇති ශ්‍රේණිගතකල, සුරැකුම් රහිත යටත්කාලීන සහ නැවත නිදහස් කල හැකි රු. 100.00, ණයකරවලින් සහ රු. බිලියන 05 ක 2020 ඔක්තෝබර් 27 වන දින පුද්ගලික ස්ථානගත කිරීම මත නිකුත් කළ ශ්‍රේණිගත, ලැයිස්තුගත නොකළ රු. 100.00 යේ නිත්‍ය ණයකර වලින් සමන්විතය. රු. බිලියන 06 ණයකරය බැංකුවෙහි ස්ථර 2 ප්‍රාග්ධනයට සුදුසුකම් ලබන අතර, රු.බිලියන 05 ණයකරය අතිරේක ස්ථර 1 ප්‍රාග්ධනය සඳහා සුදුසුකම් ලබයි. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනට ගෙවා අවසන් නොකළ ණයකරවල විස්තර මූල්‍ය ප්‍රකාශනවල 217 සහ 218 පිටුවල යටත්කාලීන වගකීම්වල සටහන් 37.1 හි දක්වා ඇත.

ජ්‍යෙෂ්ඨ ණයකර නිකුතුව

2020 දෙසැම්බර් 31 දින වන විට බැංකුවේ හිඟ ණයකර, 2019 අගෝස්තු 28 වන දින රු. 100/- බැගින් පුද්ගලිකව නිකුත් කරන ලද රු.බිලියන 20 ක් වටිනා ලැයිස්තුගත නොකළ, ජ්‍යෙෂ්ඨ, සුරැකුම් රහිත, නිදහස් කළ හැකි ණයකර වලින් සමන්විත විය. ජ්‍යෙෂ්ඨ ණයකරවල විස්තර වාර්ෂික වාර්තාවේ 218 පිටුවෙහි සටහන් 37.2 හි දක්වා ඇත

කොටස් පිළිබඳ තොරතුරු

සමාලෝචනය යටතේ ඇති කාල පරිච්ඡේදය සඳහා පිළිවෙළින් සමූහයේ කොටසක මූලික ඉපයුම සහ කොටසකට ශුද්ධ වත්කම් අගය වූයේ වර්ෂය 2020 දී රු. 10.75 (වර්ෂ 2019 දී - රු. 6.79) සහ රු. 55.21 (2019 වර්ෂයේදී - රු. 48.86) කි. සටහන් අංක 14 හි මෙම තොරතුරු ඇති අතර සාමාන්‍ය කොටසකට මූලික ඉපැයීම පිටුව 173 සටහන් 50 හි සහ සාමාන්‍ය කොටසකට ශුද්ධ වත්කම් අගය පිළිබඳ විස්තර පිටුව 241 දක්වා ඇත.

ආයතනික තිරසාරභාවය සහ සමාජ වගකීම

2020 වර්ෂය තුළදී බැංකුව රු.මිලියන 18.1 ක වටිනාකමින් යුතු ආයතනික සමාජ වගකීම් කටයුතු සිදු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

2020 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 11 (1) වගන්තිය සහ 1995 අංක 28 දරන පනතින් එයට කළ සංශෝධන ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති සහ නිල බලයෙන් පත් වූ මුදල් අමාත්‍යාංශය සහ තැපැල්පති නියෝජනය කරන සාමජිකයින් දෙදෙනා ඇතුළුව හත් දෙනෙකුගෙන් සමන්විතය. මුදල් අමාත්‍යවරයා සභාපති සහ අනෙකුත් අධ්‍යක්ෂවරු හතර දෙනා පත් කරයි. 2020 වසර තුළ පහත දැක්වෙන පුද්ගලයන් අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කළ අතර ඔවුන්ගේ කෙටි විස්තරයක් වාර්ෂික වාර්තාවේ පිටු අංක 40 සිට 44 දක්වා දක්වා ඇත.

බැංකුවේ පරිපාලිත සමාගම් වල අධ්‍යක්ෂකවරුන්ගේ ලැයිස්තුව

2020 වසර තුළ සී/ස එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් ලිමිටඩ්හි අධ්‍යක්ෂකවරුන්ගේ නම් පහත පරිදි වේ:

- කේෂිලා ජයවර්ධන මහත්මිය - සභාපතිනිය
- යූ ජී ආර් ආරියරත්න මහතා - අධ්‍යක්ෂක
- මනෝහාරී අබේසේකර මහත්මිය - අධ්‍යක්ෂක
- එම්.ටී.ජේ.පෙරේරා මහතා - අධ්‍යක්ෂක
- ඩබ් ඕ රොඩ්රිගෝ මහතා - අධ්‍යක්ෂක
- එම් පී ඒ ඩබ් පීරිස් මහතා - අධ්‍යක්ෂක (2020 නොවැම්බර් 4 දින සිට මේ දක්වා)
- බ්‍රිගේඩියර් (විශ්‍රාමික) ආචාර්ය තිරාන් ද සිල්වා මහතා - අධ්‍යක්ෂක (2020 ජනවාරි 17 සිට 2020 ඔක්තෝබර් 12 දක්වා)
- එස් ඩී එන් පෙරේරා මහතා - අධ්‍යක්ෂක (2014 ජූලි 26 සිට 2020 පෙබරවාරි 7 දක්වා)
- ආර් එම් ඩී කේ රත්නායක මහත්මිය - අධ්‍යක්ෂක (2020 ජූනි 2 සිට 2020 ඔක්තෝබර් 9 දක්වා)

2020 වසර තුළ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවෙහි අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත දැක්වේ.

- කේෂිලා ජයවර්ධන මහත්මිය - සභාපතිනිය
- එච් ඩී පී ගමගේ මහතා - අධ්‍යක්ෂක
- එන් පී ඉඹුල්ගොඩ මහතා - අධ්‍යක්ෂක
- ජනක අරුණශාන්ත මහතා - අධ්‍යක්ෂක
- එම් ටී ජේ පෙරේරා මහතා - අධ්‍යක්ෂක
- සුනිල් ගලගම මහතා - අධ්‍යක්ෂක (2020 ජනවාරි 13 සිට 2020 ඔක්තෝබර් 5 දක්වා)
- බ්‍රිගේඩියර් (විශ්‍රාමික) ආචාර්ය තිරාන් ද සිල්වා මහතා - අධ්‍යක්ෂක (2020 ජනවාරි 17 සිට 2020 ඔක්තෝබර් 9 දක්වා)

නම	පත් කළ දිනය	සාමාජිකත්ව තත්ත්වය
කේෂිලා ජයවර්ධන මහත්මිය - සභාපතිනිය	2020 ජනවාරි 2	විධායක නොවන/ ස්වාධීන නොවන
එරංග ජයවර්ධන මහතා - ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (2020 ජුනි 15 සිට)	2020 ජනවාරි 23	විධායක නොවන/ ස්වාධීන
යූ ජී ආර් ආරියරත්න මහතා - අධ්‍යක්ෂ නිල බලයෙන් පත්	2018 අගෝස්තු 31	විධායක නොවන/ ස්වාධීන නොවන
ආචාර්ය එම් කේ සී සේනානායක මහතා - අධ්‍යක්ෂ නිල බලයෙන් පත්	2020 ජනවාරි 11	විධායක නොවන/ ස්වාධීන නොවන
මනෝහාරී අබේසේකර මහත්මිය - අධ්‍යක්ෂ	2020 ජනවාරි 14	විධායක නොවන/ ස්වාධීන නොවන
බ්‍රිගේඩියර් (විශ්‍රාමික) ආචාර්ය තිරාන් ද සිල්වා මහතා - අධ්‍යක්ෂ (2020 ජනවාරි 17 සිට 2020 ඔක්තෝබර් 9 දක්වා)	2020 ජනවාරි 17	විධායක නොවන/ ස්වාධීන නොවන
එම ටී ජේ පෙරේරා මහතා - අධ්‍යක්ෂ	2020 අප්‍රේල් 11	විධායක නොවන/ ස්වාධීන නොවන

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු →

මහ බැංකුව විසින් ආයතනික යහපාලනය පිළිබඳව නිකුත් කළ 2007 අංක 12 දරන බැංකු පනතේ විධානයන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්පූර්ණ වගකීම සහ වගවීම භාර ගන්නා අතරතුර බැංකුවේ කටයුතු පිළිබඳ පාලනය සහතික කිරීම සඳහා අනිවාර්ය අධ්‍යක්ෂක මණ්ඩල අනුකමිටු හතරක් පිහිටුවා ඇත. එනම්; අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂක මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව, හා අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවයි.

අධ්‍යක්ෂක මණ්ඩලයට එහි වගකීම් ඉටු කිරීමේදී එයට සහාය වීමට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තවත් ස්වේච්ඡා අනුකමිටු තුනක්ද පත් කර තිබේ. එනම්; අධ්‍යක්ෂක මණ්ඩලය ණය කමිටුව, අධ්‍යක්ෂක මණ්ඩල තොරතුරු තාක්ෂණ උපායමාර්ග කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල අලෙවිකරණ උපාය මාර්ගික කමිටුවයි. කෙසේ වුවද, 2021 පෙබරවාරි 8 දින සිට බලපැවැත්වෙන පරිදි, මෙම අනිවාර්ය නොවන කමිටු, අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණයට අනුව අත්හිටුවන ලදී. අධ්‍යක්ෂක මණ්ඩල අනු කමිටුවල යොමු කිරීමේ අනුදේශ ශ්‍රී ලංකා මහ බැංකුව වැනි නියාමන ආයතන මගින් කළ ආයතනික පාලන නිර්දේශ සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් බැංකු වෙත නිකුත් කළ ස්වේච්ඡා සංග්‍රහ සමග අනුකූල වීම තහවුරු කරයි.

2020 දෙසැම්බර් 31 දිනට අනිවාර්ය සහ ස්වේච්ඡා අධ්‍යක්ෂක මණ්ඩල අනුකමිටු යන දෙකේම සංයුතිය සහ රැස්වීම්වලදී අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගීත්ව විස්තර පිටුව 53 හි හෙළිදරව් කර ඇති අතර මෙම අනුකමිටු වාර්තා පිටු 78 සිට 91 දක්වා ඇතුළත් කර ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් →

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම් යන ඒවායින් සමන්විත අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්වල විස්තර සහ රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය වාර්ෂික වාර්තාවෙහි යහපාලන පාලන වාර්තාවේ පිටුව 53 දක්වා දැක්වේ.

ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව →

ඍජු සහ වක්‍ර යන දෙයාකාරයෙන්ම, අධ්‍යක්ෂවරුන්ගේ බැංකුව සමග වන ගිවිසුම් පිළිබඳ බැඳියාවන් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 49.5.2 හි පිටු අංක 239 තුළ දැක්වේ. මෙම බැඳියාවන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සඳහන් කර ඇත. අධ්‍යක්ෂවරුන් බැංකුව සමග වෙනත් ගිවිසුම් හෝ යෝජිත ගිවිසුම් පිළිබඳ කිසිදු ඍජු හෝ වක්‍ර බැඳියාවක් නැත.

බැංකුව මගින් නිකුත් කළ ණයකරවලට අධ්‍යක්ෂකවරුන්ගේ ඇල්ම →

කිසිදු අධ්‍යක්ෂකවරයකුගේ නමින් ණයකර ලියාපදිංචි කර නොමැත.

අධ්‍යක්ෂකවරුන්ගේ පාරිතෝෂික සහ වෙනත් ප්‍රතිලාභ →

2020 මූල්‍ය වර්ෂය සඳහා බැංකුව සහ සමූහය සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ගේ වේතන සහ වෙනත් ප්‍රතිලාභ පිළිබඳ විස්තර පිටු අංක 239 හි මූල්‍ය ප්‍රකාශනවල සටහන 49.5.1 හි දක්වා ඇත.

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු →

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අදාළ කර ගන්නා ලද සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි ප්‍රකාරව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ලෙස වර්ගීකරණය කළ හැකි, ගනුදෙනු කිසිවක් තිබේ නම් ඒවාද අධ්‍යක්ෂවරුන් හෙළිදරව් කළ යුතුය. අධ්‍යක්ෂවරුන් විසින් හෙළිදරව් කරන ලද එම ගනුදෙනු, අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවෙහි කොටසක් වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 49.5.3 හි පිටු අංක 239 තුළ දැක්වේ.

පරිසර ආරක්ෂණය →

බැංකුව සහ සමූහය දැනීමේ තරමට කිසිදු පරිසරයට හානිකර හෝ කිසිදු අනතුරුදායක ක්‍රියාකාරකමක නියැලී නැත.

ව්‍යවස්ථාපිත ගෙවීම් →

අධ්‍යක්ෂ මණ්ඩලය, ඔවුන්ගේ දැනීමේ සහ විශ්වාසයේ තරමට, රජයට, නියාමන ආයතනවලට සහ සේවකයන් සම්බන්ධව ගෙවිය යුතු සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි කලට සිදු කර ඇති බවට සෑහීමට පත් වෙයි.

වාර්තාකරණ දිනෙන් පසු සිද්ධි →

පිටු අංක 242 හි මූල්‍ය ප්‍රකාශනවල සටහන් 52 හි හෙළිදරව් කළ ඒවා හැර ගිණුම්වලට ගැළපීම් හෝ හෙළිදරව් කිරීම අවශ්‍ය අවස්ථා වාර්තා කරන දින සිට පැන නැගී නැත.

අඛණ්ඩ පැවැත්ම →

බැංකුව සතුව එහි ඉදිරි පැවැත්ම තුළ මෙහෙයුම් අඛණ්ඩව කර ගෙන යාමට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂක මණ්ඩලය සමාලෝචනය කර සෑහීමකට පත් වී ඇත. තවද, සීමා කිරීම් හෝ මෙහෙයුම් අඩු කිරීම වැනි සැලසුම් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා පිළිබඳ අධ්‍යක්ෂකවරුන් දැනුවත්ව නැත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන සහ කළමනාකරණ තොරතුරු පද්ධති

අධ්‍යක්ෂක මණ්ඩලය අවදානම් කළමනාකරණය කිරීම වෙනුවෙන් සමස්ත වගකීම භාර ගනී. මෙම අරමුණ සඳහා, අධ්‍යක්ෂක මණ්ඩලය ඵලදායී සහ පුළුල් අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ කළමනාකරණ තොරතුරු පද්ධතියක් බැංකුවේ ස්ථාපිත කර ක්‍රියාත්මක කර ඇත. බැංකුව නිරාවරණය වී ඇති අවදානම් ලිහිල් කිරීමට, ප්‍රමාණාත්මක දෝෂ හෝ අලාභවලට එරෙහිව සාධාරණ තහවුරුවක් ලබා දීමට අභ්‍යන්තර පාලන පද්ධති ප්‍රතිනිර්මාණය කර ඇත. බැංකුව මුහුණදුන් අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අඛණ්ඩව පවතින ක්‍රියාපටිපාටියක් ඇත. අවදානම ලිහිල් කිරීමේදී බැංකුව මගින් ගන්නා ලද විශේෂිත ක්‍රියාමාර්ග මෙම වාර්තාවේ අවදානම් කළමනාකරණ වාර්තාවේ පිටු 92 සිට 114 දක්වා සහ අධ්‍යක්ෂක මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වාර්තාවේ පිටු 84 සිට 85 දක්වා විස්තරාත්මකව දක්වා ඇත.

විගණකවරුන් පත් කිරීම සහ ඔවුන්ගේ වේතන

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව විගණකාධිපති ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විගණක වේ.

ගිණුම් කාලපරිච්ඡේදය තුළ විගණන ගාස්තු සහ වෙනත් සේවා සම්බන්ධයෙන් දරන ලද වියදම් පිටු අංක 170 හි මූල්‍ය ප්‍රකාශන වල සටහන 12 හි දක්වා ඇත.

නියාමන අධීක්ෂණය

ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) නියාමන අධීක්ෂණ ආයතනයක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කළ නියෝගවලට අනුකූල වීම තහවුරු කිරීමට බැංකුවේ වාර්තා සහ කටයුතු පිළිබඳ කාලානුරූපව පරීක්ෂාවක් සිදු කරයි. එමෙන්ම එය ඇල්මැති පාර්ශවයන්ගේ විශේෂයෙන්ම තැන්පතුකරුවන්ගේ යහපත අයිතිවාසිකම් ආරක්ෂා වන ලෙස අවශ්‍ය මට්ටමට අවශ්‍ය මූල්‍ය දර්ශක පවත්වාගෙන යන්නේදැයි තීරණය කරයි.

ආයතනික පාලනය

බැංකුවේ පරිපාලන කටයුතු සිදු කිරීමේ දී හොඳම ආයතනික පාලන පරිචයන් සහ ක්‍රියාපටිපාටි සමග අනුකූල වීම තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අවධානය යොමු කර ඇත. ඒ අනුව, අධ්‍යක්ෂවරුන් පහත දේ හෙළිදරව් කර ඇත:

(අ) බැංකුව එහි ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී අදාළ වන නීති සහ රෙගුලාසි සමග අනුකූල වී ඇති අතර අදාළ නීති සහ රෙගුලාසි කඩ කරන කිසිදු ක්‍රියාවක නියැලී නැත.

(ආ) ඔවුන් බැංකුව හා සම්බන්ධ වන ප්‍රමාණාත්මක ඇල්මක් ඇති සියළු ගිවිසුම් හෙළිදරව් කර ඇති අතර ඔවුන් ප්‍රමාණාත්මක ඇල්ම ඇති කිසිදු කාරණයකට සම්බන්ධ වීමෙන් වැළකී ඇත.

(ඇ) ව්‍යාපාර කටයුතු අඛණ්ඩ පැවැත්මක් ඇති අතර අධ්‍යක්ෂක මණ්ඩලය උපායමාර්ගික ව්‍යාපාර සැලසුම සමාලෝචනය කර ඉදිරි අනාගතය තුළ බැංකුවෙහි අනාගත ගම්‍යතාව වේගවත් කිරීමට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට සෑහීමකට පත් වී ඇත. එනිසා, බැංකුවේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පන මත පදනම්ව පිළියෙළ කර ඇත.

(ඈ) බැංකුව සම්බන්ධිත පාර්ශ්ව සමඟ සිදු කර ඇති ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇත.

(උ) බැංකුව මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා පාලන, අවදානම් කළමනාකරණය ආවරණය කරන අභ්‍යන්තර පාලන විධික්‍රම පවත්වා ඇති අතර ඒවායේ ඵලදායීතාව සහ අනුගත වීම පිළිබඳ සාධාරණ සහතිකයක් ලබා ගෙන ඇත.

තිරසාර බව

එහි ව්‍යාපාර උපායමාර්ග සකස් කරන විට, බැංකුව තිරසාර බවේ පැති සලකා බලා ඇත,

මානව සම්පත්

බැංකුව සිය උසස් තත්ත්වයේ සේවාවක් සැපයීම ඔස්සේ තිරසාර අගය නිර්මාණය කිරීමට කැප වීමෙන් සහ ඉහළ අභිප්‍රේරණයකින් යුතුව කටයුතු කරන සේවකයන්ගේ උන්නතිය සඳහා සහ ඔවුන්ව රඳවා තබා ගැනීමට අඛණ්ඩව ක්‍රියාකරයි. බැංකුවේ මානව ප්‍රාග්ධනයෙහි සංවර්ධනය සඳහා සැලකිය යුතු ආයෝජන සිදු කර ඇත.

තිබෙන නඩුකර (නිරවුල් නොවූ)

අධ්‍යක්ෂකවරුන්ගේ සහ බැංකුවේ නීතිඥයන්ගේ මතය අනුව මූල්‍ය ප්‍රකාශ වල පිටුව 242 හි සටහන 51 අනාවරණය කර ඇති බැංකුවට එරෙහිව ඇති නඩුකරවල, බැංකුවේ මූල්‍ය තත්ත්වය හෝ එහි අනාගත මෙහෙයුම් කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් නැත.

වාර්තාවේ අන්තර්ගතයන්වල වගකීම භාර ගැනීම

අධ්‍යක්ෂක මණ්ඩලය මෙයින් වාර්තාවේ අන්තර්ගතයන් වල වගකීම භාර ගනී.

අධ්‍යක්ෂක මණ්ඩලයේ නියෝගය අනුව,



කේෂිලා ජයවර්ධන
සභාපතිනිය



අනුපමා මුහන්දිරම්
අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම්

2021 මාර්තු 19
කොළඹ.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (බැංකුව) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ සහ එහි පරිපාලිතයේ (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම මෙම ප්‍රකාශයෙන් දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන

බැංකුව සහ සමූහය සියලු ගනුදෙනුවල නිසි ගිණුම් තැබීම කරන බවට සහ අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී බැංකුවේ සහ සමූහයේ කටයුතුවල තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන බවට සහතික වීම සඳහා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වග කියයි. 2020 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, 2020 වසර සඳහා ආදායම් ප්‍රකාශය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ එයට සම්බන්ධ සටහන් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත්ය.

බැංකුවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන පහත කරුණු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙයි:

1. 2020 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය; සහ
2. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය කාර්ය සාධනය.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අධ්‍යක්ෂවරුන් පහත දේවල් පිළිබඳව තහවුරු කිරීම අවශ්‍යය:

1. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී යොදා ගන්නා ලද 144 සිට 160 දක්වා පිටුවල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති පවතින මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව යෝග්‍ය ඒවා විය. මෙම ප්‍රතිපත්ති සංගත ලෙස භාවිතා කරන අතර ඒවා ප්‍රමාණාත්මකව හෙළිදරව් කරන ලදී.
2. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ගනුදෙනුවේ නෛතික පදනම හා ආර්ථික හරය නිසි ලෙස පිළිබිඹු වන බව සහතික කිරීමට අවශ්‍ය අවස්ථාවලදී සාධාරණ සහ විචක්ෂණශීලී විනිශ්චයන් සිදු කර ඇත.
3. අදාළ වන සියළුම ගිණුම්කරණ ප්‍රමිතීන් අදාළ ලෙස අනුගමනය කර ඇත.

1971 අංක 38 දරන මුදල් පනත, 1988 අංක 30 දරන බැංකු පනත, 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 7(1) වගන්ති විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ කටයුතු සහ බැංකුවේ ව්‍යාපාර කටයුතු පාලනය සහ පරිපාලනය කිරීම අවශ්‍ය වේ.

මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කර ඇති ආකෘතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

සලකනු ලබන ඕනෑම කාල පරිච්ඡේදයක සාධාරණ නිරවද්‍යතාවක් සහිතව, බැංකුවේ මූල්‍ය තත්ත්වය නිවැරදිව වාර්තා කරන සහ විස්තර කරන අදාළ ගිණුම්කරණ වාර්තා ලබා දෙමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ හැකියාව තහවුරු කිරීම සහ සහතික කිරීම සඳහාද අධ්‍යක්ෂ මණ්ඩලය වග කිව යුතුය.

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය බව සහ විෂය මූලික බව සඳහා වන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු බව පිළිගනී (මූල්‍ය ප්‍රකාශන පිටු 134 සිට 143 දක්වා දක්වා ඇත). 2020 වර්ෂය සඳහා පිළියෙළ කළ මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත සහ 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන යන ඒවායෙහි අවශ්‍යතා සමග අනුකූල වේ.

අභ්‍යන්තර පාලනයන්

අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ සහ සමූහයේ වත්කම් ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීමට සහ විධිවිධාන ලබා දීමට, වංචා සහ අනෙකුත් අක්‍රමිකතා අනාවරණය කිරීමට වගකියන ලද අතර ඵලදායී සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ අභ්‍යන්තර විගණනයක් ඇතුළත් ඵලදායිතාව නිරීක්ෂණය කිරීමේ ඵලදායී පද්ධතියක් ද පිහිටුවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන ඔවුන් විසින් ඔවුන්ගේ විධිමත් රැස්වීම්වලදී සහ විගණන කමිටු මණ්ඩලයේදීද සමාලෝචනය කරන බව සහතික කරයි. මෙම වාර්ෂික වාර්තාවේ 125 පිටුවේ මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය ඇතුලත් කර ඇති අතර බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිගේ සහතිකකරණ වාර්තාව 127 පිටුවෙහි දක්වා ඇත.

විගණන වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන ඇතුළුව සියලු වාර්තා විගණකාධිපති වෙත ලබා දී ඇති අතර සුදුසු යැයි ඔවුන් සලකන සියලු පරීක්ෂා කිරීම් සිදු කිරීමට සෑම ඉඩ ප්‍රස්තාවක්ම ලබා දෙන ලදී. විගණකාධිපති දෙපාර්තමේන්තුව පරීක්ෂා කිරීම් කර ඇති අතර විගණකාධිපතිගේ මතය ඔහු විසින් වාර්තා කළ පරිදි මෙම වාර්ෂික වාර්තාවෙහි 130 පිටුවේ දක්වා ඇත.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සම්බන්ධ ප්‍රකාශය

අනුකූලතා වාර්තාව

අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ උපරිම දැනුමේ සහ විශ්වාසයේ තරමට බැංකුව හා සමූහය විසින් ගෙවිය යුතු සියලු බදු, ගාස්තු සහ අය බදු සහ රජයට සහ අනෙකුත් අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත අධිකාරිවලට බැංකුවේ සහ සමූහයේ සේවකයන් වෙනුවෙන් සහ ඔවුන් සම්බන්ධව ගෙවිය යුතු සියලු දායකත්ව මුදල් සහ බදු, සහ වෙනත් දන්නා සියළු ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් බැංකුව සහ සමූහය විසින් කළ යුතු සහ ගෙවිය යුතු දේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට ගෙවා ඇති බව හෝ අදාළ තැනදී වෙන් කිරීම සිදු කර ඇති බව තහවුරු කරයි. තවද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ඒකාබද්ධව නිකුත් කළ “ආයතනික යහපාලන” සංග්‍රහය තුළ දැක්වීමට අවශ්‍ය මූල්‍ය තත්ත්වය, මෙහෙයුම් තත්ත්ව සහ නියාමන සහ වෙනත් සාධක සැලකීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය එය තහවුරු කර ඇත.

බැංකුවට සහ සමූහයට ඉදිරි අනාගතයේදී මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යාමට සහ මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදා ගැනීම සාධාරණීකරණය කිරීමට ප්‍රමාණවත් තරම් සම්පත් ඇති බව සහ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති විධිවිධාන සමග අනුකූල වීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගෙන ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අනුපමා මුහන්දිරම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2021 මාර්තු 19

කොළඹ

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

වගකීම

මෙම වාර්තාව බැංකු පනතේ 2007 අංක 12 දරණ නියමයේ, 3 (8) (ii) (ආ) වගන්තිය සමග අනුකූලව නිකුත් කර ඇති අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කර ඇති යහපරිචයන් සහිත ආයතනික යහපාලන සංග්‍රහය 2017 හි D.1.5 මූලධර්ම මත පදනම්ව පිළියෙළ කළ අභ්‍යන්තර පාලනය පිළිබඳ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රමාණවත් සහ ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පිහිටුවා පවත්වාගෙන යන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය (මණ්ඩලය) වගකියයි. කෙසේ වුවද එවැනි පද්ධතියක් බැංකුවේ ව්‍යාපාර පරමාර්ථ ළඟා කර ගැනීම අසාර්ථක වීමේ අවදානම ඉවත් කරනවාට වඩා, පිළිගත හැකි අවදානම් පරාසයක් තුළ බැංකුවේ සැලකිය යුතු අවදානම් ක්ෂේත්‍ර කළමනාකරණය කිරීමට සැලසුම් කෙරේ. ඒ අනුව අභ්‍යන්තර පාලන පද්ධතියට කළමනාකරණ සහ මූල්‍ය තොරතුරු සහ වාර්තාවල සැලකිය යුතු සාවද්‍ය ප්‍රකාශ සහ වාර්තා හෝ මූල්‍යමය අලාභ හෝ වංචාවලට එරෙහිව පරම සහතිකයක් නොව සාධාරණ සහතිකවීමක් පමණක් සපයනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව මුහුණ දෙන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් ස්ථාපනය කර ඇති අතර මෙම ක්‍රියාවලියට ව්‍යාපාර පරිසරයට හෝ නියාමන අවශ්‍යතාවලට සහ අනෙකුත් මාර්ගෝපදේශවල වෙනස් කිරීම් ඇති පරිදි සහ ඇති විට මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කිරීම ඇතුළත්ය. මෙම ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරව සමාලෝචනය කරනු ලබන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශන පිළිබඳ බැංකුවේ අධ්‍යක්ෂවරුන් සඳහා මාර්ගෝපදේශය සමග අනුකූල බව තහවුරු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය එම මාර්ගෙ ්පදේශයෙහි දී ඇති අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීම සඳහා වූ මූලධර්ම සැලකිල්ලට ගෙන අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීමට ලක් කර ඇත.

අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීය බව පිළිබඳ සාධාරණ සහතිකයක් සැපයීමට තරම් යහපත් සහ ප්‍රමාණවත් බවද, බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල බවද අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වේ.

කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම සහ පාලනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමට, බැංකුව විසින් මුහුණදෙන අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම, මෙම අවදානම් ලිහිල් කිරීම සහ පාලනය කිරීම සඳහා යෝග්‍ය අභ්‍යන්තර පාලන සැලසුම් කිරීම, මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම මගින් සහාය වෙයි.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමයේ සැලසුම සහ කාර්යක්ෂමතාවය යොදා ගැනීමේදී හා සමාලෝචනය කිරීමේ දී අනුග මනය කරන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම සහ ඵලදායීතාව සමාලෝචනය කිරීමේ පද්ධතියද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාලානුරූපීව පිහිටුවනු ලැබ තිබේ. අනෙකුත් දේවල් අතර එහි මූලික ක්‍රියාවලිවල පහත දේවල් අඩංගුය:

- බැංකුවේ මෙහෙයුම්වල කාර්‍යක්‍ෂමතාව තහවුරු කිරීමටත්, අනුමත ආයතනික අරමුණු, උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සහ අනුමත කර ඇති ව්‍යාපාර නියමයන් සමග අනුකූල බව සහතික කිරීමට නිශ්චිත විෂය පථයන් සහ කාර්යයන් සහිතව අධ්‍යක්‍ෂ මණ්ඩල අනුකමිටු පිහිටුවා ඇත.
- අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) විසින් බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය, බාහිර විගණකවරුන්, නියාමන අධිකාරීන් විසින් හඳුනා ගන්නා අභ්‍යන්තර පාලන දුර්වලතා වරින්වර සමාලෝචනය කරනු ලබන අතර එම දුර්වලතා නිවැරදි කිරීමට නිසි ක්‍රියාමාර්ග ගනියි. බැංකුවේ බාහිර විගණනය විගණකාධිපති විසින් සිදුකරනු ලැබේ. රජයේ විගණන අධිකාරී වෙත සාමාන්‍යයෙන් අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් සඳහා ආරාධනා කෙරේ.
- විගණනයෙහි විෂයපථය සහ ගුණාත්මක බව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව අභ්‍යන්තර විගණන කාර්යය සමාලෝචනය කරයි. මෙම වාර්ෂික වාර්තාවේ 78 පිටුවෙහි ඇති අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ 2020 වසර තුළ අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග දක්වා ඇත. බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය වාර්ෂික විගණන සැලසුම පරිදි ශාඛාවල, අංශවල සහ අනෙකුත් ඒකකවල විගණනය සිදු කරයි. විගණනය කරන වාර ගණන තක්සේරු කළ අවදානම් මට්ටම අනුව තීරණය කෙරේ. අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව විගණන සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කරනු ලැබේ. අභ්‍යන්තර විගණන අංශය ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමග අනුකූලතාව සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායිතාව සහතික කිරීමට විගණන පරීක්ෂා සිදුකරන අතර කිනම් හෝ අනනුකූලතාවක් සම්බන්ධව එහි සොයා ගැනීම් වාර්තා කරයි. මෙහෙයුම් සහ කළමනාකරණ ක්‍රියාකාරකම් පිළිබඳ ස්වාධීන සහ විෂය මූලික වාර්තාවක් සැපයීමට විගණන සිදු කෙරේ. විගණනවල සොයා ගැනීම් අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවෙහි වරින් වර පවත්වන රැස්වීම්වලදී සමාලෝචනය සඳහා යොමු කෙරේ. කමිටු රැස්වීම්වල සටහන් සමගින්, අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ක්‍රියාකාරකම් කාලානුරූපී පදනමකින් අධ්‍යක්ෂ මණ්ඩලයේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කෙරේ.
- බැංකුවේ ප්‍රධාන අවදානම් ක්ෂේත්‍රවල සමස්ත කළමනාකරණය අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමට අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අධ්‍යක්‍ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) පිහිටුවා ඇත. බැංකුවෙහි ක්‍රියාකාරකම්, අදාළ නීති, රෙගුලාසි සහ නියාමන උපදෙස්වලට අනුකූලව සිදු කරන බව සහතික කිරීමට අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ස්වාධීන අනුකූලතා ඒකකයක්ද ස්ථාපනය කර ඇති අතර අනුකූල නොවීම පිළිබඳ යම් ගැටලු කාලානුරූපීව අධ්‍යක්‍ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ. අවදානම් තක්සේරුව පිළිබඳ වාර්තාව අධ්‍යක්‍ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් කාලානුරූපීව අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

- බැංකුවේ එදිනෙදා ව්‍යාපාර මෙහෙයුම්වලදී බැංකුවේ ප්‍රධාන ක්ෂේත්‍රවල ඵලදායී කළමනාකරණ සහ අධීක්ෂණය සහතික කිරීමට කළමනාකරණ මට්ටමේ කමිටු ද නිසි සවිබලගැන්වීමක් සමගින් ක්‍රියාත්මකව ඇත. තක්සේරු කිරීම බැංකුව විසින් යොදන ක්‍රියාවලි පමණක් ආවරණය කරන අතර එහි පරිපාලිතය විසින් කරගෙන යන ක්‍රියාවලි අඩංගු නොකරයි.

බැංකුව 2012 වසරේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් යොදා ගන්නා ලදී. එකී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීමෙහි සිට, හඳුනා ගැනීම, ඇගයීම, වර්ගීකරණය, සහ හෙළිදරව් කිරීම යන ඒවායෙහි නව අවශ්‍යතා සමග අනුකූල වීමට ක්‍රියාවලිවල නිරීක්ෂණය සහ අභිවෘද්ධිමය දියුණුව අඛණ්ඩව කරගෙන යන ලදී.

තහවුරු කිරීම

ඉහත ක්‍රියාවලි මත පදනම්ව, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීය බව පිළිබඳව සාධාරණ සහතිකයක් සැපයීමට බැංකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇති බවත් සහ බාහිර අවශ්‍යතාවයන් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවලට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

බාහිර විගණකවරුන්ගේ ප්‍රකාශය සමාලෝචනය කිරීම

බැංකුවේ බාහිර විගණක වන, විගණකාධිපති 2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන සම්බන්ධයෙන් වූ ඉහත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සමාලෝචනය කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ මූල්‍ය වාර්තාකරණය කෙරෙහි යොදන අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම සහ ඵලදායිතාව සමාලෝචනය සඳහා යොදා ගන්නා ලද ක්‍රියාවලි සම්බන්ධ ඔවුන්ගේ වැටහීම සමග සංගත නොවන බව විශ්වාස කිරීමට තරම් හේතු වන කිසිවක් ඔවුන්ගේ අවධානයට යොමු නොවූ බව වාර්තා කර ඇත. මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය කෙරෙහි ඔවුන්ගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවෙහි 127 පිටුවෙහි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

කේෂිලා ජයවර්ධන මිය
සභාපතිනිය

මනෝහරි අබේසේකර මිය
සභාපතිනිය
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව/අධ්‍යක්ෂ

ආචාර්ය එම් කේ සී සේනානායක
අධ්‍යක්ෂ

2021 අප්‍රේල් 07
කොළඹ

අභ්‍යන්තර පාලනය පිළිබඳ ස්වාධීන සහතික වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.	බීඒඑෆ්/ඒ/එන්එස්බී/අයිසී/2020/11	ඔබේ අංකය / உமது இல. / Your No.		දිනය / திகதி / Date	2021 අප්‍රේල් 07

සභාපතිනිය
ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය මත අධ්‍යක්ෂවරුන් සඳහා වන විගණකාධිපතිගේ ස්වාධීන සහතික වාර්තාව

හැඳින්වීම

මෙම වාර්තාව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අභ්‍යන්තර පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණය ("ප්‍රකාශය") මත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳව සහතික වීම සඳහා වේ.

කළමනාකාරීත්වයේ වගකීම

2007 අංක 12 දරන බැංකු පනත් නියාමනයේ 3 (8) ii (ආ) වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය මත බැංකුවේ අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශ" අනුව ප්‍රකාශය සකස් කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකාරීත්වය වෙත පැවරේ.

SLSAE 3050 සමග මගේ වගකීම් සහ අනුකූලත්වය (සංශෝධිත)

මෙම ප්‍රකාශය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්/හෝ සඳහා පිළියෙල කරන ලද ලියකියවිලි මත පදනම් වන බව හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අභ්‍යන්තර පාලන වල සැකැස්ම හා ඵලදායීතාවය සමාලෝචනය කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය මෙම ප්‍රකාශයෙන් පිළිඹිබු වන බව තක්සේරු කිරීම මාගේ වගකීම වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය මත බැංකු සඳහා වන සහතික කිරීමේ වාර්තාව - සහතිකකරණ කාර්යභාරය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති (සංශෝධිත) (SLSAE 3050) සමග අනුකූලව මම මෙම විගණන කාර්යභාරය ඉටු කළෙමි.

සියළුම ප්‍රමාණාත්මක අංශ සැලකිල්ලට ගනිමින් කළමනාකාරීත්වය විසින් අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය සකස් කරන ලද බවට සීමිත තහවුරුවක් ලබාගැනීම සඳහා මා විසින් අදාළ ක්‍රියාවලි සැලසුම් කරනු ලැබීම හා ක්‍රියාත්මක කරනු ලැබීම මෙම ප්‍රමිතිය යටතේ අත්‍යවශ්‍ය වේ.

මෙම කාර්යභාරයට අදාළව කිසිදු වාර්තාවක් යාවත්කාලීන කිරීම හෝ නැවත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මා වෙත වගකීම නොපැවරෙන අතර මෙම කාර්යභාරය අතරතුර මූල්‍ය තොරතුරු විගණනය හෝ සමාලෝචනය කිරීමද මා විසින් සිදු නොකරන ලදී.

සිදු කළ කාර්යය පිළිබඳ සාරාංශය

මෙම ප්‍රකාශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින්/ හෝ සඳහා පිළියෙල කරන ලද ලියකියවිලි මත පදනම් වන බව හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අභ්‍යන්තර පාලන වල සැකැස්ම හා ඵලදායීතාවය සමාලෝචනය කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය මෙම ප්‍රකාශයෙන් පිළිඹිබු වන බව තක්සේරු කිරීම සඳහා මා වෙත පැවරී ඇති විගණන කාර්යභාරය මම ඉටු කළෙමි.

මෙහිදී අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටි, බැංකු කාර්යමණ්ඩලයේ විමසීම් සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාවලියට සහය වන දැනට භාවිතයට ගන්නා ලේඛන අතුරින් තෝරාගත් ලේඛන වලට මූලිකවම සීමා විය.

සහතිකකරණ කාර්යභාරය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති SLSAE 3050 (සංශෝධිත) වලට අනුකූලව මා විසින් මෙම ප්‍රකාශය මගින් සියළු අවදානම් හා පාලන ආවරණය කෙරෙන බව සලකනු ලැබීම හෝ බැංකුවේ අවදානම් හා පාලන පටිපාටි වල ඵලදායීතාවය පිළිබඳව අදහසක් ඇති කරගනු ලැබීම අවශ්‍ය නොවේ. එසේම, වාර්ෂික වාර්තාවෙන් හෙළිදරව් කර ඇති සැලකිය යුතු ගැටළුවක් ආශ්‍රිත ප්‍රමාණාත්මක අභ්‍යන්තර ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා එමගින් විස්තරාත්මකව දක්වා ඇති ක්‍රියාවලිය සත්‍ය වශයෙන්ම එම ගැටළුවට විසඳුම් සපයන්නේද යන්න මා විසින් සලකා බලනු ලැබීමද සහතිකකරණ කාර්යභාරය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති (සංශෝධිත) යටතේ අවශ්‍ය නොවේ.

බැංකුවේ ස්වභාවය, මෙම ප්‍රකාශයට පදනම් වන සිදුවීම හෝ ගනුදෙනුව පිළිබඳ මගේ අවබෝධය මත පදනම්වූ මාගේ විනිශ්චය අනුව අදාළ පටිපාටි තෝරාගන්නා ලදී.

මගේ නිගමනය සඳහා පදනමක් සැපයීමට මා විසින් ලබාගන්නා ලද සාක්ෂි ප්‍රමාණවත් හා සුදුසු යැයි මම විශ්වාස කරමි.

මගේ නිගමනය

බැංකුවේ මූල්‍ය වාර්තාකරණය හා සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකැස්ම හා ඵලදායීතාවය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය පිළිබඳ මගේ අවබෝධය හා වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය අතර නොගැලපීමක් පවතින බව විශ්වාස කිරීමට හේතු වන කිසිදු කරුණක්, අනුගමනය කරන ලද පටිපාටි මත පදනම්ව මගේ අවධානයට ලක්වී නොමැත.

අත්සන් කලේ,

ඩබ්ලිව් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (මුදල් හා සැලසුම්) වගකීම් පිළිබඳ ප්‍රකාශය

අනුකූලතාව

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (බැංකුව) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ සහ එහි පරිපාලිතයේ (සමූහයේ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2020 දෙසැම්බර් 31 වන දිනට පහත සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙළ කර ඉදිරිපත් කර ඇත:

- 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ එයට සිදුකළ සංශෝධන.
- 1971 අංක 38 දරන මුදල් පනත.
- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත.
- 1988 අංක 30 දරන බැංකු පනත හා එයට කළ සංශෝධන සහ එය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ මූල්‍ය ප්‍රකාශන ආකෘති සහ තොරතුරු හෙළිදරව් කිරීම් තොරතුරුවලට අදාළ නියෝග සහ මාර්ගෝපදේශ.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් (SLFRSs/LKASs)/ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2017 දී නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ වඩා යහපත් පරිච සංග්‍රහය.
- ආයතනික පාලනය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරන බැංකු පනත් නියමය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී භාවිත කර ඇති ආකෘති සහ සිදු කර ඇති හෙළිදරව් කිරීම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 (LKAS 1) - "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" හි හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සමගද අනුකූල වන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති නිශ්චිත ආකෘති සමග අනුකූලය. බැංකුව සහ සමූහය එහි මූල්‍ය ප්‍රතිඵල එහි පරිශීලකයන්ට කාර්තුමය පදනමකින් ඉදිරිපත් කරයි.

බැංකුව සහ සමූහය විසින් නිසි ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව යොදා ගෙන ඇත. ඉහළ මට්ටමේ විනිශ්චයක් සහ සංකීර්ණතාවක් සහිත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඇස්තමේන්තු යොදා ගැනීම බැංකුවේ බාහිර විගණකවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සමග සාකච්ඡා කරන ලදී.

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත් කළ දින සිට ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගණනය කිරීම් ක්‍රමවේදයෙහි කිසිදු වෙනසක් සිදු නොවීය. ඒ අනුව වර්තමාන ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි සංසන්දනාත්මක තොරතුරු සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

අපි අපගේ දැනුමේ තරමට මෙම වාර්තාවේ අඩංගු මූල්‍ය ප්‍රකාශන, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් මූල්‍ය තොරතුරු, සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ සහ සමූහයේ වත්කම්, වගකීම්, මූල්‍ය තත්ත්වය, මෙහෙයුම්වල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහවල සියලු වැදගත් අංශ සාධාරණව නිරූපණය කරන බව සහ මූල්‍ය ප්‍රකාශනවල සත්‍ය සහ සාධාරණ දැක්මක් දී ඇති බව තහවුරු කරමු. තවද අපි මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කරගෙන යාමට බැංකුවට සහ සමූහයට ප්‍රමාණවත් තරම් සම්පත් ඇති බවත් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදි අඛණ්ඩ පැවැත්ම පදනම යොදා ගෙන ඇති බවටත් තහවුරු කරමු.

අභ්‍යන්තර පාලනය පිළිබඳ වගකීම සහ ක්‍රියාපටිපාටි

බැංකුව සහ එහි පරිපාලිතයේ අභ්‍යන්තර පාලනය ස්ථාපනය කිරීමට, ක්‍රියාත්මක කිරීමට, සහ පවත්වාගෙන යාමට අපි වගකිව යුතු වෙමු. වත්කම් ආරක්ෂා කිරීම, වංචා සහ/හෝ වැරදි මෙන්ම අනෙකුත් අක්‍රමිකතා වැළැක්වීම සහ හෙළිදරව් කිරීම සඳහා බැංකුවට සහ සමූහයට අදාළ වැදගත් තොරතුරු අපට දැන ගැනීමට හැකි බවත් සහතික කරමින් ඵලදයී අභ්‍යන්තර පාලන සහ ක්‍රියාපටිපාටි නිසි ස්ථානවල ඇති බව, සහ ඒවා අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය, ඇගයීම සහ යාවත්කාලීන කරන බව අපි සහතික කරමු. අපගේ දැනීමේ තරමට, අභ්‍යන්තර පාලන සහ ක්‍රියාපටිපාටි සැලසුම් කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ සැලකිය යුතු අඩුපාඩු සහ දුබලතා නොවූ බවට අපි සෑහීමට පත් වෙමු. අපි අපගේ ඇගයීම් මත පදනම්ව, අභ්‍යන්තර පාලනවල සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සැලකිය යුතු අඩුපාඩු හෝ කැපී පෙනෙන දුබලතා සහ කළමනාකරණ හෝ අනෙකුත් සේවකයන් සම්බන්ධ වංචා නොවූ බව තහවුරු කරමු.

මූල්‍ය වාර්තාකරණය සහ ක්‍රියාපටිපාටි සම්බන්ධව අභ්‍යන්තර පාලන සහ ක්‍රියාපටිපාටි අඛණ්ඩව අනුගමනය කරන බව සහතික කිරීමට බැංකුවේ අභ්‍යන්තර විගණකවරුන්ද කලින් කලට විමර්ශන සිදු කරයි. කෙසේ වෙතත්, ඕනෑම අභ්‍යන්තර පාලන හා ගිණුම්කරණ ක්‍රමයක් මගින් ලබාදෙන සහතිකය 100% ක් පිළිගැනීමේ යම් ආවේනික සීමාවන් පවතී.

මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රකාශය මෙම වාර්ෂික වාර්තාවේ 125 සහ 126 පිටුවල දක්වා ඇත. විගණකාධිපතිවරයා විසින් බැංකුව විසින් යොදා ගන්නා ලද මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර පාලනයේ සඵලතාවය විගණනය කර ඇති අතර ඒ පිළිබඳ තත්ත්වාගණන නොකළ මතයක් ලබා දී ඇත. මෙම වාර්ෂික වාර්තාවේ 127 පිටුවේ එය දක්වා ඇත.

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (මුදල් හා සැලසුම්) වගකීම පිළිබඳ ප්‍රකාශය

බාහිර විගණනය

බැංකුවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කරන ලදී. බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවෙහි 130 සිට 132 පිටුවල දක්වා ඇත. අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව අනෙක් කරුණු ද සමඟින්, සියලු අභ්‍යන්තර විගණන සහ පරීක්ෂණ වැඩසටහන්, අභ්‍යන්තර පාලන පද්ධති සහ ක්‍රියාපටිපාටිවල කාර්යක්ෂමතාව සමාලෝචනය කළ අතරම සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට ඒවායේ අනුකූල බවද සමාලෝචනය කළ අතර, ඒවායේ විස්තර මෙම වාර්ෂික වාර්තාව තුළ 78 සහ 79 දක්වා පිටුවල ඇති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ දී ඇත. පූර්ණ ස්වාධීනත්වය සහතික කිරීමට විගණකාධිපතිට සහ අභ්‍යන්තර විගණකවරුන්ට, වැදගත් වන කරුණු සාකච්ඡා කිරීමට අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ සාමාජිකයන් වෙත පූර්ණ සහ නිදහස් ප්‍රවේශය ඇත.

තහවුරු කිරීම

අපි අපේ දැනුමේ තරමට පහත දේවල් තහවුරු කරමු

- බැංකුව සහ සමූහය සියලු අදාළ විය හැකි නීති සහ රෙගුලාසි සහ අවශ්‍යතා සමඟ අනුකූල වී ඇත.
- සැලකිය යුතු අනුකූල නොවීමේ අවස්ථා නොමැත.
- මූල්‍ය ප්‍රකාශනවල 242 පිටුවේ 51 සටහනේ හෙළිදරව් කර ඇති තොරතුරු හැර බැංකුවට සහ සමූහයට එරෙහිව නඩු පැවරීම් නැත.
- බැංකුව සහ සමූහය විසින් ගෙවිය යුතු සියලු බදු, තීරු බදු, අය බදු සහ සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් සහ බැංකුවේ සහ සමූහයේ සේවකයන් වෙනුවෙන් සහ ඔවුන් සඳහා ගෙවිය යුතු සියලු දායක මුදල්, අය බදු සහ බදු 2020 දෙසැම්බර් 31 වන දිනට ගෙවා හෝ අවශ්‍ය පරිදි ප්‍රතිපාදනයන් කර ඇත.

එම් පී ඒ ඩබ්ලිව් පීරිස්
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී



කේ රවීන්ද්‍රන්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මුදල් හා සැලසුම්)

2021 මාර්තු 19 දින
කොළඹ

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } බීඑෆ්/ඒ/එන්එස්බී/2020/10

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2021 මාර්තු 21

සභාපතිනිය

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ("බැංකුව") සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. බැංකුවේ සහ සමූහයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 බැංකුවේ වාර්ෂික වාර්තාවේ ඇතුලත් කළ යුතු අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරු, බැංකුවේ 2020 වාර්ෂික වාර්තාවට ඇතුලත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත මාගේ විගණන වාර්තාවට ඇතුලත් නොවන තොරතුරු වලින් සමන්විත වන අතර මෙම විගණන වාර්තාවේ දිනට පසුව එය මා වෙත ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මා ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාලව මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් වෙනත් තොරතුරු ලබාගත හැකි විට එය කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපේද යන්න හෝ විගණනයේදී ලබාගත් මාගේ දැනුම හෝ එසේ නොමැතිනම් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් පෙන්වන්නේද යන්න සලකා බැලීමයි.

මා විසින් බැංකුවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වැරදි අර්ථකථන ඇති බව නිගමනය කළහොත් ඒවා නිවැරදි කිරීම සඳහා වගකිව යුතු පාලකයන් සමග එම කරුණ පිළිබඳ අදහස් හුවමාරු කරගැනීමට මට අවශ්‍ය වේ. තවදුරටත් නිවැරදි නොකළ වැරදි අර්ථකථන තිබේනම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව ඉදිරියේදී මා විසින් පාර්ලිමේන්තුවට සභාගත කරන වාර්තාවට ඇතුලත් කරනු ඇත.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම් →

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සමූහය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම →

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව විසින් පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ පාලක මණ්ඩලයේ යම්කිසි සාමාජිකයෙකුට බැංකුව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුව බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

අත්සන් කලේ,

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගතය

	පිටු අංකය
මූලික මූල්‍ය ප්‍රකාශනයන්	
ආදායම් ප්‍රකාශය	134
විස්තීරණ ආදායම් ප්‍රකාශය	135
මූල්‍ය තත්ත්වය පිළබඳ ප්‍රකාශය	136
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - බැංකුව	138
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමූහය	140
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	142
මූල්‍ය ප්‍රකාශනවල සටහන් - පොදු	
1. වාර්තාකරණ ඒකකය	144
2. ගිණුම්කරණ ප්‍රතිපත්ති	144
2.1 පිළියෙල කිරීමේ පදනම	144
2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම්	147
2.3 සාධාරණ අගය මිනීම	148
2.4 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති - පොදු	149
2.5 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති - වත්කම් හා වගකීම් හඳුනාගැනීම	150
2.6 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - මූල්‍ය උපකරණ සඳහා ආදායම් හා වියදම් හඳුනාගැනීම	159
2.7 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - බදුකරණය	159
2.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශය	160
2.9 නියාමන ප්‍රතිපාදන	160
2.10 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම්	160
2.11 නිකුත් කරන ලද මුත් වාර්තාකරණ දිනට බල නොපැවැත්වෙන ගිණුම්කරණ ප්‍රමිතීන්	160
මූල්‍ය ප්‍රකාශනවල සටහන් - ආදායම් ප්‍රකාශය	
3. දළ ආදායම	161
4. ශුද්ධ පොලී ආදායම	161
5. ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	163
6. වෙළඳාම් කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය/(අලාභය)	165
7. ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය)	165
8. මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම මගින් ලත් ශුද්ධ ලාභය/(අලාභය)	166
9. වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	166
10. හානිකරණ වියදම්	167
11. සේවක මණ්ඩල වියදම්	168
12. වෙනත් වියදම්	170
13. බදු වියදම්	171
14. කොටසක ඉපයුම් (EPS)	173
මූල්‍ය ප්‍රකාශනවල සටහන් - මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයः වත්කම්	
15. ගණනය කරන ලද පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය	174
16. මුදල් හා මුදල් සමානයන්	177
17. මහ බැංකුව වෙතැති ශේෂයන්	177
18. බැංකුවල ඇති තැන්පතු	177
19. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	178
20. ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්	180

	පිටු අංකය
21. ක්‍රමක්‍ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්	183
22. ක්‍රමක්‍ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ	192
23. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්	194
24. පාලිත සමාගම්වල ආයෝජනය	198
25. ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනය	200
26. දේපල, පිරියත සහ උපකරණ	200
27. භාවිතයට අයිතිය ඇති වත්කම්	206
28. දේපල ආයෝජන	207
29. කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම්	209
30. විලම්බිත බදු වත්කම්/වගකීම්	211
31. වෙනත් වත්කම්	213
මූල්‍ය ප්‍රකාශනවල සටහන් - මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය - වගකීම් සහ හිමිකම්	
32. බැංකුවලට ගෙවිය යුතු	213
33. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	214
34. ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම්	214
35. ක්‍රමක්‍ෂය පිරිවැය මත මූල්‍ය වගකීම්ः	214
35. තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	214
35. ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු	214
35. වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු	214
36. කල්බදු වගකීම්	215
37. නිකුත්කළ ණය සුරැකුම්පත්	216
38. සේවාවසාන ප්‍රතිලාභ බැඳීම්	219
39. ප්‍රවර්තන බදු වගකීම්	229
40. වෙනත් ප්‍රතිපාදන	230
41. වෙනත් වගකීම්	230
42. පරිපාලිත සමාගම්වලට ගෙවිය යුතු	230
43. ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	230
44. ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	231
45. රඳවාගත් ඉපයීම්	231
46. වෙනත් සංචිත	232
47. පාලනය යටත් නොවන හිමිකම	234
මූල්‍ය ප්‍රකාශනවල සටහන් - අනෙකුත් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්	
48. අසම්භාව්‍ය වගකීම් හා බැඳීම්	234
49. සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ හෙළිදරව් කිරීම	235
50. සාමාන්‍ය කොටසක ශුද්ධ වත්කම් වටිනාකම	241
51. බැංකුවට හා සමූහයට විරුද්ධව ඇති නීති කෘත්‍යයන්	242
52. මූල්‍ය ප්‍රකාශ වාර්තා කළ දිනට පසු සිදුවීම්	242
53. සංසන්දනාත්මක තොරතුරු	243
54. මූල්‍ය අවදානම් කළමනාකරණය	245
55. කල් පිරීමේ විශ්ලේෂණය	273
56. මූල්‍ය උපකරණවල සාධාරණ අගය	277
57. ප්‍රාග්ධන කළමනාකරණය (නියාමන වාර්තාකරණය අනුව)	282

ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්	බැංකුව 2020 රු. '000	බැංකුව 2019 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2020 රු. '000	සමූහය 2019 රු. '000	සමූහය වෙනස %
දළ ආදායම	3	**127,547,060**	121,929,059	5	**130,039,494**	125,810,171	3
පොලී ආදායම		**122,512,049**	118,729,784	3	**124,608,182**	120,351,774	4
අඩුකළා : පොලී වියදම		**87,621,868**	89,897,770	(3)	**88,425,490**	90,868,139	(3)
ශුද්ධ පොලී ආදායම	4	**34,890,181**	28,832,014	21	**36,182,692**	29,483,635	23
ගාස්තු සහ කොමිස් ආදායම		**2,710,487**	1,261,268	115	**2,723,087**	1,269,521	114
අඩුකළා : ගාස්තු සහ කොමිස් වියදම		**154,486**	131,954	17	**160,556**	136,838	17
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	5	**2,556,001**	1,129,314	126	**2,562,531**	1,132,683	126
වෙළඳාම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය/(අලාභය)	6	**1,273,676**	1,491,610	(15)	**1,745,329**	1,963,229	(11)
ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය)	7	**–**	–	–	**–**	–	–
මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම තුළින් ලත් ශුද්ධ ලාභය/(අලාභය)	8	**241,284**	22,021	996	**241,284**	22,021	996
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	9	**809,564**	424,376	91	**721,612**	2,203,626	(67)
මුළු මෙහෙයුම් ආදායම		**39,770,707**	31,899,335	25	**41,453,448**	34,805,194	19
අඩුකළා : හානිකරණ වියදම්	10	**4,873,768**	565,536	762	**4,932,840**	590,700	735
ශුද්ධ මෙහෙයුම් ආදායම		**34,896,939**	31,333,799	11	**36,520,608**	34,214,494	7
අඩුකළා - වියදම්							
සේවක මණ්ඩල වියදම්	11	**9,966,786**	10,157,926	(2)	**10,152,485**	10,217,978	(1)
ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වියදම්		**1,240,503**	1,042,933	19	**1,256,826**	1,048,095	20
වෙනත් වියදම්	12	**4,258,307**	4,474,053	(5)	**4,313,367**	4,461,457	(3)
මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ ණය ආපසු ගෙවීමේ බදු පෙර මෙහෙයුම් ලාභය		**19,431,342**	15,658,887	24	**20,797,931**	18,486,964	13
අඩුකළා : මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු		**3,786,717**	3,045,921	24	**4,006,877**	3,208,584	25
මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු		**–**	366,157	(100)	**–**	383,614	(100)
මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු		**–**	1,785,171	(100)	**–**	1,803,225	(100)
මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ ණය ආපසු ගෙවීමේ බදු පසු මෙහෙයුම් ලාභය		**15,644,625**	10,461,638	50	**16,791,054**	13,091,541	28
ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස		**–**	–	–	**–**	–	–
ආදායම් බදුවලට පෙර ලාභය		**15,644,625**	10,461,638	50	**16,791,054**	13,091,541	28
අඩුකළා: ආදායම් බදු වියදම	13	**5,536,709**	4,080,468	36	**5,969,936**	4,378,631	36
වර්ෂය සඳහා ලාභය		**10,107,916**	6,381,170	58	**10,821,118**	8,712,910	24
ලාභය බෙදී යන ආකාරය							
පාලක සමාගමේ හිමිකරුවන්		**10,107,916**	6,381,170	58	**10,821,118**	8,712,910	24
පාලනයට යටත් නොවන හිමිකම්		**–**	–	–	**–**	–	–
වර්ෂය සඳහා ලාභය		**10,107,916**	6,381,170	58	**10,821,118**	8,712,910	24
ලාභය මත කොටසක ඉපයීම							
සාමාන්‍ය කොටසක මූලික ඉපයීම් (රු.)	14	**10.75**	6.79	58	**11.51**	9.27	24
සාමාන්‍ය කොටසක තනුක ඉපයීම් (රු.)		**10.75**	6.79	58	**11.51**	9.27	24
වර්ෂය සඳහා ලාභය		**10,107,916**	6,381,170	58	**10,821,118**	8,712,910	24

144 පිටුවේ සිට 282 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

විස්තීරණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව			සමූහය		
	2020 රු. '000	2019 රු. '000	වෙනස %	2020 රු. '000	2019 රු. '000	වෙනස %
වර්ෂය සඳහා ලාභය	**10,107,916**	6,381,170	58	**10,821,118**	8,712,910	24
ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම්						
විදේශ ගනුදෙනු පරිවර්තනය මත වූ විනිමය වෙනස්කම්	**–**	–	–	**–**	–	–
ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ කටයුතු වලින් ලත් ශුද්ධ ලාභ/(අලාභ)	**–**	–	–	**–**	–	–
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින ණය උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ)	**–**	–	–	**–**	–	–
ආශ්‍රිත සමාගම් සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස	**–**	–	–	**–**	–	–
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පත් කළ ණය උපකරණ	**273,544**	127,928	114	**329,820**	227,305	45
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ ණය උපකරණ ඉවත් කිරීම මත සාධාරණ අගය මත ලාභ/(අලාභ) ආදායම් ප්‍රකාශයට මාරු කිරීම	**(241,284)**	(13,717)	1,659	**(241,284)**	(13,717)	1,659
ඉහත අයිතමය සඳහා විලම්බිත බදු බලපෑම	**(9,033)**	(31,979)	(72)	**(9,033)**	(31,979)	(72)
ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව	**23,227**	82,232	(72)	**79,503**	181,609	(56)
ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම්						
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින හිමිකම් උපකරණවල ආයෝජනයන්හි සාධාරණ අගයෙහි වෙනස්වීම	**(776,162)**	(324,635)	139	**(774,791)**	(320,297)	142
ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය වගකීම් මත බැංකුවේ ණය අවදානම ආරෝපණය කිරීමේ සාධාරණ වෙනස්වීම	**–**	–	–	**–**	–	–
සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් නැවත ආගණනය	**(6,684,417)**	(3,454,283)	94	**(6,681,422)**	(3,455,660)	93
ඉහත අයිතමය සඳහා විලම්බිත බදු බලපෑම	**1,871,637**	967,199	94	**1,871,637**	967,199	94
සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් නැවත ආගණනය (බදු පසු)	**(4,812,780)**	(2,487,084)	94	**(4,809,785)**	(2,488,461)	93
ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම්	**1,482,472**	–	100	**1,921,578**	–	100
ඉහත අයිතමය සඳහා විලම්බිත බදු බලපෑම	**(415,092)**	–	100	**(415,092)**	–	100
ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම් (බදු පසු)	**1,067,380**	–	100	**1,506,486**	–	100
ආශ්‍රිත සමාගම් සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස	**–**	–	–	**–**	–	–
ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණ කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව	**(4,521,563)**	(2,811,719)	61	**(4,078,090)**	(2,808,758)	45
වර්ෂයට අදාළ වෙනත් විස්තීර්ණ ආදායම්, බදු ගෙවූ පසු	**(4,498,336)**	(2,729,487)	65	**(3,998,586)**	(2,627,149)	52
වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම	**5,609,580**	3,651,683	54	**6,822,532**	6,085,762	12
ලාභය බෙදී යන ආකාරය						
පාලක සමාගමේ හිමිකරුවන්	**5,609,580**	3,651,683	54	**6,822,532**	6,085,762	12
පාලනයට යටත් නොවන හිමිකම්	**–**	–	–	**–**	–	–
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	**5,609,580**	3,651,683	54	**6,822,532**	6,085,762	12

144 පිටුවේ සිට 282 පිටුව හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන්	බැංකුව 2020 රු. '000	බැංකුව 2019 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2020 රු. '000	සමූහය 2019 රු. '000	සමූහය වෙනස %
වත්කම්							
මුදල් හා මුදල්වලට සමානයන්	16	**6,491,963**	5,376,715	21	**6,598,595**	5,564,824	19
මහ බැංකුව වෙතැති ශේෂයන්	17	**–**	–	–	**6**	58	(90)
බැංකුවල ඇති තැන්පතු	18	**13,253,499**	12,364,469	7	**17,456,660**	15,745,184	11
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	19	**19,897**	11,622	71	**19,897**	11,622	71
ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්	20						
– සාධාරණ අගයට ගණනය කළ		**11,221,746**	11,459,882	(2)	**23,617,944**	22,130,273	7
– සාධාරණ අගයට නම් කළ		**–**	–	–	**–**	–	–
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්							
– ණය හා අත්තිකාරම්	21	**516,795,160**	454,394,957	14	**517,833,067**	456,636,285	13
– ණය හා වෙනත් උපකරණ	22	**754,233,344**	615,634,321	23	**758,594,934**	619,567,786	22
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්	23	**15,271,822**	3,478,811	339	**16,059,841**	4,626,582	247
පාලිත සමාගම්වල ආයෝජනයන්	24	**4,811,000**	4,811,000	–	**–**	–	–
ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනය	25	**–**	–	–	**–**	–	–
දේපල, පිරියත සහ උපකරණ	26	**15,315,772**	13,564,578	13	**16,197,837**	13,857,882	17
භාවිතයට අයිතිය ඇති වත්කම්	27	**1,226,183**	1,073,507	14	**1,271,525**	1,130,868	12
දේපල ආයෝජන	28	**–**	–	–	**237,077**	333,315	(29)
කීර්තිනාමය හා අස්පෘශ්‍ය වත්කම්	29	**687,961**	598,876	15	**694,160**	599,612	16
විලම්බිත බදු වත්කම්	30	**1,446,249**	–	100	**1,446,249**	338	428,226
වෙනත් වත්කම්	31	**23,033,780**	35,197,923	(35)	**23,192,936**	35,370,115	(34)
මුළු වත්කම්		**1,363,808,376**	1,157,966,664	18	**1,383,220,728**	1,175,574,745	18
වගකීම්							
බැංකු වලට ගෙවිය යුතු	32	**12,862,337**	35,045,251	(63)	**13,339,705**	36,139,122	(63)
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	33	**–**	–	–	**–**	–	–
ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම්	34	**–**	–	–	**–**	–	–
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම්	35						
– තැන්පත්කරුවන්ට ගෙවියයුතු		**1,237,123,791**	1,016,574,286	22	**1,237,669,284**	1,015,635,421	22
– ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු		**–**	–		**–**	–	–
– වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු		**8,159,591**	21,203,242	(62)	**19,656,090**	32,808,023	(40)
කල්බදු වගකීම්	36	**1,274,713**	1,066,882	19	**1,320,877**	1,121,441	18
නිකුත් කළ ණය සුරැකුම්පත්	37	**31,773,753**	26,691,711	19	**31,908,279**	26,955,697	18
සේවාවසාන ප්‍රතිලාභ බැඳීම්	38	**10,885,085**	5,025,779	117	**10,916,429**	5,053,759	116
ප්‍රවර්තන බදු වගකීම්	39	**3,128,643**	–	100	**3,705,537**	565,704	555
විලම්බිත බදු වගකීම්	30	**–**	482,241	(100)	**1,121**	483,005	(100)
වෙනත් වෙන්කිරීම්	40	**–**	–	–	**–**	–	–
වෙනත් වගකීම්	41	**6,699,216**	5,951,464	13	**7,253,989**	7,430,415	(2)
පාලිත සමාගම්වලට ගෙවියයුතු	42	**3,750**	547	585	**–**	–	–
මුළු වගකීම්		**1,311,910,879**	1,112,041,403	18	**1,325,771,311**	1,126,192,586	18

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන්	බැංකුව 2020 රු. '000	බැංකුව 2019 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2020 රු. '000	සමූහය 2019 රු. '000	සමූහය වෙනස %
හිමිකම්							
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	43	**9,400,000**	9,400,000	–	**9,400,000**	9,400,000	–
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	44	**4,068,268**	3,562,872	14	**4,090,363**	3,571,214	15
රඳවාගත් ඉපයීම්	45	**11,883,168**	8,194,507	45	**16,085,184**	10,964,046	47
වෙනත් සංචිත	46	**26,546,061**	24,767,882	7	**27,873,870**	25,446,899	10
අයිතිකරුවන්ගේ මුළු හිමිකම		**51,897,497**	45,925,261	13	**57,449,417**	49,382,159	16
පාලනයට යටත් නොවන හිමිකම්	47	**–**	–	–	**–**	–	–
මුළු හිමිකම		**51,897,497**	45,925,261	13	**57,449,417**	49,382,159	16
මුළු හිමිකම් සහ වගකීම්		**1,363,808,376**	1,157,966,664	18	**1,383,220,728**	1,175,574,745	18
අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	48	**23,787,099**	10,355,197	130	**23,850,325**	10,691,602	123
නාමික තොරතුරු							
සේවක සංඛ්‍යාව		**4,641**	4,715				
ශාඛා සංඛ්‍යාව		**259**	256				

සටහන : හානිකරණයෙන් හා ක්ෂය කිරීමෙන් පසු ශුද්ධ අගයන් දක්වා ඇත.

144 පිටුවේ සිට 282 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

සහතික කිරීම

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කටයුතු සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ලාභය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පෙන්නුම් කරන බවට සහතික කරමි.

කේ රවීන්ද්‍රන්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල් හා සැලසුම්)

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

අනුමත කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

කේෂිලා ජයවර්ධන මිය	**ආචාර්ය එම් කේ සී සේනානායක**	**එම් පී ඒ ඩබ්ලිව් පීරිස් මයා**
සභාපතිනිය	අධ්‍යක්ෂ	සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

2021 මාර්තු 19

කොළඹ
ශ්‍රී ලංකාව

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

බැංකුව

	ප්‍රකාශිත ප්‍රාග්ධනය/ පවරන ලද ප්‍රාග්ධනය රු. '000	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000	ප්‍රත්‍යාගණන සංචිතය රු. '000
2019 ජනවාරි 01 දිනට ශේෂය	9,400,000	3,227,960	7,793,317
පෙර වර්ෂවල ගැලපීම්*	–	–	(2,182,129)
2019 ජනවාරි 01 දිනට නැවත අගයන ලද ආරම්භක ශේෂය	9,400,000	3,227,960	5,611,188
2019 වර්ෂය සඳහා ලාභය	–	–	–
වෙනත් විස්තීරණ ආදායම් (බදු පසු)	–	–	–
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	–	–
හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමග සිදුකළ ගනුදෙනු			
වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම්	–	334,912	–
ඒකාබද්ධ අරමුදලට දායකවීම්-ලාභාංශ/විශේෂ බදු	–	–	–
ජාතික රක්‍ෂණ භාරකාර අරමුදලට දායකවීම්	–	–	–
හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරුකිරීම්	–	–	–
හිමිකම් දරන්නන් සමග සිදුකළ මුළු ගනුදෙනු	–	334,912	–
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	9,400,000	3,562,872	5,611,188
2020 වර්ෂය සඳහා ලාභය	–	–	–
වෙනත් විස්තීර්ණ ආදායම (බදු පසු)	–	–	1,067,380
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	–	1,067,380
හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමග සිදුකළ ගනුදෙනු			
වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම්	–	505,396	–
ඒකාබද්ධ අරමුදලට දායකවීම් - ලාභාංශ/විශේෂ බදු	–	–	–
ජාතික රක්‍ෂණ භාරකාර අරමුදලට දායකවීම්	–	–	–
හිමිකම් නොපෑ තැන්පතු සංචිත වලට මාරුකිරීම්	–	–	–
හිමිකම් දරන්නන් සමග සිදුකළ මුළු ගනුදෙනු	–	505,396	–
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	9,400,000	4,068,268	6,678,568

144 පිටුවේ සිට 282 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

*කරුණාකර සටහන් අංක 53 සංසන්දනාත්මක තොරතුරු වෙත යොමුවන්න.

	වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය රු. '000	ඉදිරි රකුම් මුදල් ප්‍රවාහ සංචිතය රු. '000	වෙනත් සංචිත රු. '000	රඳවාගත් ඉපයුම් රු. '000	මුළු හිමිකම රු. '000
	528,430	–	18,160,874	3,869,070	42,979,655
	31,979	–	–	2,833,244	683,094
	560,409	–	18,160,874	6,702,314	43,662,749
	–	–	–	6,381,170	6,381,170
	(242,403)	–	–	(2,487,084)	(2,729,487)
	(242,403)	–	–	3,894,087	3,651,684
	–	–	–	(334,912)	–
	–	–	–	(2,000,000)	(2,000,000)
	–	–	–	(66,982)	(66,982)
	–	–	677,811	–	677,811
	–	–	677,811	(2,401,894)	(1,389,171)
	318,006	–	18,838,685	8,194,507	45,925,261
	–	–	–	10,107,916	10,107,916
	(752,935)	–	–	(4,812,780)	(4,498,336)
	(752,935)	–	–	5,295,136	5,609,580
	–	–	–	(505,396)	–
	–	–	–	(1,000,000)	(1,000,000)
	–	–	–	(101,079)	(101,079)
	–	–	1,463,736	–	1,463,736
	–	–	1,463,736	(1,606,475)	362,657
	(434,929)	–	20,302,421	11,883,168	51,897,497

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

සමූහය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය/ පවරන ලද ප්‍රාග්ධනය රු. '000	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000	ප්‍රත්‍යාගණන සංචිතය රු. '000
2019 ජනවාරි 01 දිනට ශේෂය	9,400,000	3,227,960	7,793,317
පෙර වර්ෂවල ගැලපීම්*	–	–	(2,182,129)
2019 ජනවාරි 01 දිනට නැවත අගයන ලද ආරම්භක ශේෂය	9,400,000	3,227,960	5,611,188
2019 වර්ෂය සඳහා ලාභය	–	–	–
වෙනත් විස්තීරණ ආදායම් (බදු පසු)	–	–	–
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	–	–
හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු			
වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම්	–	343,254	–
ඒකාබද්ධ අරමුදලට දායකවීම්-ලාභාංශ/විශේෂ බදු	–	–	–
ලාභාංශ මත රඳවා ගැනීමේ බදු	–	–	–
ජාතික රක්ෂණ භාරකාර අරමුදලට දායකවීම්	–	–	–
හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරුකිරීම්	–	–	–
හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු	–	343,254	–
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	9,400,000	3,571,214	5,611,188
පෙර වර්ෂවල ගැලපීම්	–	–	–
2020 ජනවාරි 01 දිනට පෙර වර්ෂවල ගැලපීමෙන් පසු ආරම්භක ශේෂය	9,400,000	3,571,214	5,611,188
2020 වර්ෂය සඳහා ලාභය	–	–	–
වෙනත් විස්තීර්ණ ආදායම (බදු පසු)	–	–	1,506,486
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	–	1,506,486
හිමිකමට සෘජුව ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු			
වර්ෂය තුළ සංචිත වෙත/වෙතින් මාරුකිරීම්	–	519,149	–
ඒකාබද්ධ අරමුදලට දායකවීම් - ලාභාංශ/විශේෂ බදු	–	–	–
ජාතික රක්ෂණ භාරකාර අරමුදලට දායකවීම්	–	–	–
හිමිකම් නොපෑ තැන්පතු සංචිත වලට මාරුකිරීම්	–	–	–
හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු	–	519,149	–
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	9,400,000	4,090,363	7,117,674

144 පිටුවේ සිට 282 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

*කරුණාකර සටහන් අංක 53 සංසන්දනාත්මක තොරතුරු වෙත යොමුවන්න.

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය රු. '000	ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ සංචිතය රු. '000	වෙනත් සංචිත රු. '000	රඳවාගත් ඉපයුම් රු. '000	මුළු හිමිකම රු. '000
390,210	–	18,745,544	4,445,441	44,002,475
31,979	–	–	2,833,244	683,094
422,189	–	18,745,544	7,278,685	44,685,569
–	–	–	8,712,910	8,712,910
(138,688)	–	–	(2,488,461)	(2,627,149)
(138,688)	–	–	6,224,450	6,085,762
–	–	128,852	(472,106)	–
–	–	–	(2,000,000)	(2,000,000)
–	–	–	–	–
–	–	–	(66,982)	(66,982)
–	–	677,811	–	677,811
–	–	806,663	(2,539,088)	(1,389,171)
283,501	–	19,552,207	10,964,046	49,382,159
–	–	–	882,070	882,070
283,501	–	19,552,207	11,846,116	50,264,229
–	–	–	10,821,118	10,821,118
(695,287)	–	–	(4,809,785)	(3,998,586)
(695,287)	–	–	6,011,332	6,822,531
–	–	152,037	(671,185)	–
–	–	–	(1,000,000)	(1,000,000)
–	–	–	(101,079)	(101,079)
–	–	1,463,736	–	1,463,736
–	–	1,615,773	(1,772,264)	362,657
(411,786)	–	21,167,980	16,085,184	57,449,417

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2020 රු. '000	2019 රු. '000	**2020** රු. '000	2019 රු. '000
මෙහෙයුම් කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහ				
පොළී ලැබීම්	**121,217,294**	116,116,735	**123,222,195**	117,913,757
පොළී ගෙවීම්	**(87,043,414)**	(82,583,128)	**(87,905,761)**	(83,544,584)
ශුද්ධ කොමිස් ලැබීම්	**2,556,001**	1,129,314	**2,562,531**	1,132,683
වෙළඳාම් ආදායම	**1,073,229**	415,692	**1,475,091**	507,130
සේවක මණ්ඩල ගෙවීම්	**(9,573,701)**	(9,576,038)	**(9,784,100)**	(9,636,090)
මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, ණය ආපසු ගෙවීමේ බදු	**(3,635,577)**	(4,926,687)	**(3,875,451)**	(5,092,470)
වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබීම්	**453,266**	336,670	**481,659**	2,115,916
වෙනත් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට ගෙවීම්	**(4,211,774)**	(4,449,742)	**(4,292,547)**	(4,432,794)
මෙහෙයුම් වත්කම් හා වගකීම්වල වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**20,835,323**	16,462,816	**21,883,617**	18,963,548
මෙහෙයුම් වත්කම්වල (වැඩිවීම)/අඩුවීම				
ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති ශේෂයන්	**–**	–	**–**	–
බැංකුවල ඇති තැන්පතු	**(878,260)**	5,088,591	**(1,631,768)**	1,707,876
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**29,615**	4,744,070	**29,615**	4,744,070
ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය වත්කම්	**635,258**	5,926,456	**(970,781)**	5,681,883
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්	**(96,177,753)**	(31,733,787)	**(94,958,436)**	(33,889,390)
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ	**(109,017,140)**	(94,261,299)	**(109,529,470)**	(94,172,565)
මූල්‍ය ආයෝජන විකිණීම හා කල්පිරීම මගින් ලත් මුදල්	**–**	–	**–**	–
වෙනත් වත්කම්	**11,884,067**	(4,185,579)	**11,896,995**	(4,034,303)
	(193,524,215)	(114,421,548)	**(195,163,845)**	(119,962,429)
මෙහෙයුම් වගකීම්වල වැඩිවීම/(අඩුවීම)				
බැංකු වලට ගෙවිය යුතු	**(22,288,937)**	(42,196,267)	**(22,912,312)**	(48,579,868)
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**–**	(1,533)	**–**	(1,533)
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - තැන්පත්කරුවන්ට ගෙවියයුතු	**221,909,528**	170,677,338	**223,397,260**	169,738,473
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු	**–**	–	**–**	–
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් - වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු	**(12,727,496)**	6,287,565	**(12,773,875)**	10,919,340
නිකුත්කළ ණය සුරැකුම්පත්	**–**	(25,677,100)	**–**	(25,413,114)
වෙනත් වගකීම්	**(138,401)**	(382,265)	**(140,530)**	1,698,978
	186,754,695	108,707,738	**187,570,543**	108,362,276
ආදායම් බදු පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහ	**14,065,803**	10,749,007	**14,290,315**	7,363,395
ගෙවූ ආදායම් බදු	**(2,889,044)**	(3,798,618)	**(3,271,758)**	(3,530,579)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලත් ශුද්ධ මුදල්	**11,176,759**	6,950,389	**11,018,557**	3,832,816

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව 2020 රු. '000	බැංකුව 2019 රු. '000	සමූහය 2020 රු. '000	සමූහය 2019 රු. '000
ආයෝජන කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහ				
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම්	**(976,972)**	(1,242,701)	**(994,063)**	(1,246,470)
දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල්	**6,504**	14,804	**6,504**	14,808
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය උපකරණවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	**(12,326,936)**	2,373,158	**(11,927,988)**	2,902,903
මූල්‍ය ආයෝජන විකිණීම හා කල්පිරීම මගින් ලත් මුදල්	**–**	–	**–**	–
අස්පෘශ්‍ය වත්කම් ශුද්ධ මිලදී ගැනීම්	**(389,202)**	(262,718)	**(395,250)**	(263,293)
ආයෝජන දේපළවල ශුද්ධ මිලදී ගැනීම් සහ වැඩිදියුණු කිරීම්	**–**	–	**–**	(333,315)
පාලිත හා ආශ්‍රිත සමාගම්වල ආයෝජන අත්පත් කර ගැනීම මගින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**–**	(3,111,000)	**–**	–
පාලිත හා ආශ්‍රිත සමාගම්වල ආයෝජනයෙන් ලද ලාභාංශ	**170,000**	–	**–**	–
ආයෝජන ක්‍රියාකාරකම්වල යෙදවූ/වලින් ලත් ශුද්ධ මුදල්	**(13,516,606)**	(2,228,457)	**(13,310,796)**	1,074,633
මූල්‍යනය කිරීමේ කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ				
යටත්කාලීන ණය නිකුත් කිරීම් මගින් ලත් ශුද්ධ මුදල්	**5,000,000**	–	**5,000,000**	–
යටත්කාලීන ණය ආපසු ගෙවීම්	**–**	–	**(92,454)**	–
යටත්කාලීන ණය මත ගෙවූ පොළිය	**(780,000)**	(780,000)	**(817,007)**	(780,000)
ඒකාබද්ධ අරමුදලට දායකවීම් - ලාභාංශ/ විශේෂ බදු	**(1,000,000)**	(2,000,000)	**(1,000,000)**	(2,000,000)
මූල්‍යන කටයුතු වලින් ලද ශුද්ධ මුදල්	**3,220,000**	(2,780,000)	**3,090,539**	(2,780,000)
මුදල් හා මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	**880,153**	1,941,932	**798,300**	2,127,449
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමානයන්	**5,293,907**	3,351,975	**5,482,007**	3,354,558
මුදල් හා මුදල් සමානයන්ගේ විනිමය වෙනස	**–**	–	**–**	–
වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් වලට සමානයන්	**6,174,060**	5,293,907	**6,280,307**	5,482,007
මුදල් හා මුදල් සමානයන් අයිතම සැසඳීම				
අතැති මුදල්	**1,901,551**	941,102	**1,906,210**	947,240
බැංකුව වෙතැති ශේෂයන්	**4,590,397**	4,436,403	**4,692,371**	4,618,378
ඉල්ලුම් සහ කෙටිකාලීන තැන්පතු	**112**	–	**112**	–
ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති ශේෂයන්	**–**	–	**6**	58
බැංකුවලට ගෙවිය යුතු	**(318,000)**	(83,598)	**(318,391)**	(83,669)
	6,174,060	5,293,907	**6,280,307**	5,482,007

144 පිටුවේ සිට 282 පිටුව දක්වා හෙළිදරව් කර ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ සංකලිත කොටසකි.

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

1 වාර්තාකරණ ඒකකය

1.1 ආයතනික තොරතුරු

ජාතික ඉතිරිකිරීමේ බැංකුව, 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත යටතේ 1972 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. එය 1988 අංක 30 දරන බැංකු පනත හා එහි සංශෝධන යටතේ නියාමනය වන බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. බැංකුවේ ලියාපදිංචි කාර්යාලය, අංක 255 "ඉතිරිකිරීමේ මන්දිරය" ගාලුපාර, කොළඹ 03, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

2020 දෙසැම්බර් මස 31 දිනට බැංකුවේ මුළු සේවකයන් සංඛ්‍යාව 4,641 ක් විය. (2019-4,715)

සේවා සැපයුම් ස්ථාන ලෙස ශාඛා 259 ක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 289 ක් හා සීඅාර්එම් යන්ත්‍ර 72 ක් ද බැංකුව සතුව පවතින අතර, නියෝජිත ජාල ලෙස තැපැල් කාර්යාල 653 ක් සහ උප තැපැල් කාර්යාල 3,410 ක් බැංකුව සතුව පවතී.

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට බැංකුව (මව් සමාගම) සහ එහි පූර්ණ අයිතියට යටත් එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව නම්වූ පාලිත සමාගම් ඇතුළත් වේ.

බැංකුවෙහි පූර්ණ අයිතිය ශ්‍රී ලංකා රජය සතුවේ. බැංකුව සමූහයෙහි අවසන් පරිපාලකයා වේ. බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සඳහා දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් පාදක වෙයි. සෑම වසරකදීම පාර්ලිමේන්තුවේ දී සභාගත කිරීම පිණිස, දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන මාස දොළහක කාලපරිච්ඡේදය සඳහා "බැංකුවේ" සහ "සමූහයේ" මූල්‍ය ප්‍රකාශන බැංකුව විසින් පිළියෙල කරනු ලබයි.

1.3 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

බැංකුව

පෙර පරිදිම, ශ්‍රී ලාංකික ජනතාව අතර ඉතිරිකිරීම ප්‍රගුණ කරවීමත් එසේ එක්රැස් කරගන්නා ලද ඉතුරුම් ලාභදායී අයුරින් ආයෝජනය කිරීමත් බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය. තැන්පතු භාර ගැනීම, ආයතනික සහ පාරිභෝගික ණය, ව්‍යාපාර මූල්‍යයනය, රාජ්‍ය ව්‍යාපෘති සඳහා ණය, උකස් ණය, අන්තර්ජාල බැංකුකරණය, එස් එම් එස් බැංකුකරණය යනාදී මූල්‍ය විසඳුම් රැසක් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතින් සැපයෙයි. 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත ප්‍රකාර බැංකුව එහි තැන්පතු වලින් අවම වශයෙන් 60% ක් රාජ්‍ය සුරැකුම්පත්හි ආයෝජනය කිරීමට බැඳී සිටී.

පාලිත සමාගම්

එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම

එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම, ප්‍රාථමික අලෙවිකරුවකු වශයෙන් කටයුතු කරන අතර, රජයේ සුරැකුම්පත් ගනුදෙනු කිරීමෙහි යෙදී සිටියි.

සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

ඉතුරුම් හා කාලීන තැන්පතු සංචලනය, ණය, කල්බදු, කුලී පිට ගැනුම්, උකස් ණය හා වෙනත් ණය පහසුකම් සැපයීම සහ සීමාසහිත ප්‍රමුඛ ඉතිරිකිරීමේ හා සංවර්ධන බැංකුවේ ණය ගිණුම් ප්‍රතිව්‍යුහගත කිරීමත් සමග සී.ස. ප්‍රමුඛ ඉතිරිකිරීමේ හා සංවර්ධන බැංකුවේ පැහැර හරිනු ලැබූ තැන්පතු වගකීම් පියවීම යනාදිය පසුගිය වර්ෂය තුළ බැංකුවේ මූලික ක්‍රියාකාරකම් යටතට අයත් වේ.

2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී වෙනත් ආකාරයකට දක්වා ඇති බවට සඳහනක් නොවේ නම්, සෑම කාලපරිච්ඡේදයකදීම පහත සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කරගනු ලැබ ඇත. බැංකුවේ මෙම ප්‍රතිපත්ති නොකඩවාම සමූහය විසින් උපයෝගී කරගනු ලැබ ඇති අතර ඉන් පරිබාහිර අවස්ථාවන් ඒ අනුව හෙළිදරව් කර ඇත.

2.1 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

2.1.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම දක්වන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් යනාදියෙන් සමන්විත බැංකුවේ මූල්‍ය ප්‍රකාශන හා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS සහ LKAS) අනුකූලව වන අතර, එය 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන වලටද අනුකූල වේ. මුදල් ප්‍රවාහ තොරතුරු හැරුණු කොට සෙසු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත්තේ උපචිත පදනමටය.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී භාවිත කරන ලද ආකෘතිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශනය කිරීම සඳහා නිර්දේශ කර ඇති ආකෘතියට ද අනුකූල වේ.

2.1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතෙහි හා එහි සංශෝධනවල ප්‍රතිපාදන ප්‍රකාර, බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.

2.1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 මාර්තු මස 19 වන දින අනුමත කරන ලදී.

2.1.4 මිනුම්කරණ පදනම

පහත අයිතමයන් හැරුණු කොට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගය මත ගණනය කර ඇති බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

(i) වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සටහන් අංක 23)

(ii) ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ (සටහන් අංක 19 හා 33)

(iii) ලාභ හෝ අලාභ මගින් හඳුනාගනු ලැබූ මූල්‍ය වත්කම් සහ වගකීම් (සටහන් අංක 20 හා 34)

(iv) ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම් සහ වගකීම් (සටහන් අංක 20)

(v) අත්පත් කර ගැනීමේදී පිරිවැයට මතිනු ලබන හා පසුව සාධාරණ අගය මත ප්‍රත්‍යාගණිත අගයන් අනුව මිනුම් කරනු ලබන ඉඩම් හා ගොඩනැගිලි (සටහන් අංක 26)

(vi) නිශ්චිත ප්‍රතිලාභ වගකීම් වර්තමාන වටිනාකමෙන් සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය ඉන් අඩු කිරීමෙන් පසු සේවක නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වගකීම හඳුනාගනු ලබයි. (සටහන් අංක 38)

2.1.5 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරනු ලබන ව්‍යවහාර මුදල

සමූහයේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (රු.) වලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර, විශේෂයෙන් දක්වා ඇති අවස්ථාවලදී හැරුණු කොට සියලුම අගයන් ආසන්න දහස් ස්ථානයට වටයා ඇත. සමාලෝචිත වර්ෂය තුළ සමූහයේ ඉදිරිපත් කළ වාර්තා වල ක්‍රියාකාරී හා ඉදිරිපත් කරනු ලැබූ ව්‍යාපාර මුදල් හි වෙනසක් වාර්තා නොවිනි.

2.1.6 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කර ඇති බැංකුවේ සහ සමූහයේ වත්කම් හා වගකීම්, ඒවායෙහි ස්වභාවය අනුව වර්ගකර, කල්පිරීමේ රටාව හා සාපේක්ෂ ද්‍රවශීලතා අනුපිළිවෙල පිළිබිඹු වන අයුරින් ලැයිස්තුගත කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සම්බන්ධයෙන් ගැලපීමක් සිදුකර නොමැත. බැංකුවේ හා සමූහයේ වත්කම් හා වගකීම් වල කල්පිරීමේ රටාවන්හි විශ්ලේෂණය සටහන් අංක 55 (පිටු අංක 273 සිට 276) හි දක්වා ඇත.

2.1.7 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පදනමක් මත ඉදිරියට පැවතීමට බැංකුවට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් සිදුකර ඇති අතර, ඉදිරි අනාගතයේ දී ව්‍යාපාර කටයුතුවල නිරතවීමට එය සතු ශක්‍යතාව පිළිබඳ සෑහීමට පත්වී ඇත.

තවද අඛණ්ඩ පැවැත්ම සඳහා බැංකුවට ඇති හැකියාව පිළිබඳ සැක පහළ වන සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි සාධකයක් කළමනාකාරිත්වයට හමු වී නොමැත. එහෙයින් අඛණ්ඩ පැවැත්ම යන පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම තව දුරටත් සිදුකෙරෙයි.

2.1.8 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන්ව ඉදිරිපත් කරනු ලබයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.ගි.ප්‍ර. 01) "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" මගින් ඉඩදී ඇති පරිදි අසමාන ස්වභාවයේ අයිතමයන් හෝ කාර්යයන් ප්‍රමාණාත්මක නොවන දෑ ලෙස නොසලකයි නම් පමණක් ඒවා වෙන වෙනම ඉදිරිපත් කරනු ලබයි.

2.1.9 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වැඩි අවබෝධයක් ලබාගැනීම සඳහා සහ කාලපරිච්ඡේද දෙක සංසන්දනය කිරීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා මූල්‍ය ප්‍රකාශනයෙහි පසුගිය කාලපරිච්ඡේදයට අදාළ සංසන්දනාත්මක තොරතුරු ප්‍රමාණාත්මකව, විස්තරාත්මකව හෙළිදරව් කර ඇත. වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් අරභයා මෙන්ම ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් සමග අනුරූපවීමට අවශ්‍ය අවස්ථාවලදීද සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ග කර දක්වා ඇත. පිටු අංක 243 හි මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 53 යටතේ අදාළ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත.

2.1.10 වැටයීම

"මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" පිළිබඳ ශ්‍රී ල.ගි.ප්‍ර. 01 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් අනුමත පරිදි වෙනයම් අයුරකින් දක්වා ඇති අවස්ථාවලදී හැරුණු විට මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති අගය ආසන්න රුපියල් දහසට වටයා ඇත.

2.1.11 හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් කරනු ලබන්නේ හඳුනාගත් අගයන් හිලව් කිරීම නෛතිකව බලාත්මක කළ හැකි වූ හා ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එක්වරම වත්කම් උපලබ්ධි කර වගකීම් පියවීමට අදහස් කරන විට පමණි. ගිණුම්කරණ ප්‍රමිතියක්/අර්ථකථනයක් (අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන් අර්ථකථන කමිටුව සහ ප්‍රමිතීන් අර්ථකථන කමිටුව විසින් නිකුත් කරන ලද) සහ බැංකුවේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මගින් නිශ්චිතව අනුමත කර හෝ අවශ්‍ය බව දක්වා ඇති විටකදී හැර ආදායම් සහ වියදම්, ආදායම් ප්‍රකාශයේ හිලව් කරනු නොලැබේ.

2.1.12 සැලකිය යුතු ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලව වන පරිදි බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්වල අගයන් තීරණය කිරීම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතය සම්බන්ධයෙන් තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන උපයෝගී කර ගැනීමට කළමනාකාරීත්වයට සිදු වේ.

ඇස්තමේන්තු හා උපකල්පන අඛණ්ඩව සමාලෝචනයට භාජනය කරයි. ගිණුම් ඇස්තමේන්තුවල යම් සංශෝධනයක් වෙතොත් එම සංශෝධනය කෙරෙන කාලපරිච්ඡේදය තුළදී, එම සංශෝධන ඉදිරි කාලපරිච්ඡේදයකට බලපාන්නේ නම්, ඉදිරි කාලපරිච්ඡේදවලදී ද ගිණුම්ගත කරනු ලැබේ.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයන් මත වැඩිම බලපෑමක් ඇති කිරීමට හැකි ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතයේ දී යොදාගත් සැලකිය යුතු තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන පහත දක්වා ඇත.

අ. සැලකිය යුතු ගිණුම්කරණ තීන්දු

මෙම මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති අගයන් සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති කරලන අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලදී ගනු ලබන තීන්දු, පිළිබඳව තොරතුරු පහත සටහන් අංක 2.1.12.1 මගින් දැක්වේ.

2.1.12.1 මූල්‍ය වත්කම් සහ වගකීම් වර්ගීකරණය

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 අනුව පහත නිර්නායක මත පදනම්ව ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගය, ලාභය හෝ අලාභ මගින් සාධාරණ අගය යන විවිධ කාණ්ඩවලට මූල්‍ය වත්කම් වර්ග කිරීමට හා මිනීමට සමූහයේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මගින් අවකාශය සැලසේ.

- පිටු අංක 150 හි සටහන් අංක 2.5.1.4.1 හි දක්වා ඇති මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමේ ආයතනික ව්‍යාපාරික ආකෘතිය
- පිටු අංක 150 හි සටහන් අංක 2.5.1.4.2 හි දක්වා ඇති මූල්‍ය වත්කම්හි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ගුණාංග

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

ආ. උපකල්පන සහ අවිනිශ්චිතතා තක්සේරු කිරීම

සැලකියයුතු වෙනස්වීම්වලට තුඩු දිය හැකි අන්දමේ උපකල්පන හා අවිනිශ්චිතතා තක්සේරු පිළිබඳ තොරතුරු පහත සටහන් අංක 2.1.12.2 සිට 2.1.12.9 මගින් දක්වා ඇත.

2.1.12.2 මූල්‍ය උපකරණ වල සාධාරණ අගය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තා කර ඇති මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වල සාධාරණ අගයන්, සක්‍රීය වෙළඳපොළ තුළින් ලබාගත නොහැකි විට, එය තීරණය කිරීම සඳහා ගණිතමය ආකෘතීන් භාවිතය ද ඇතුළත් තක්සේරුකරණ ක්‍රමවේද යොදා ගැනෙයි. මෙකී ආකෘතීන් සඳහා යෙදවුම්, නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්ත වෙතින් හැකි අවස්ථාවලදී ලබා ගන්නා අතර, නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්ත නොමැති විට සාධාරණ අගයක් ස්ථාපිත කර ගැනීමට තීන්දුවක් ගත යුතු වේ.

මූල්‍ය උපකරණ අගය කිරීම පිණිස යොදාගන්නා ක්‍රමවේද සහ සාධාරණ අගයන්හි ධූරාවලිය සටහන් අංක 56 මගින් මූල්‍ය ප්‍රකාශනයෙහි පිටු අංක 277 හි සවිස්තරාත්මකව දක්වා ඇත.

2.1.12.3 මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභ

සියලුම මූල්‍ය වත්කම් කාණ්ඩ, ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 සහ ශ්‍රී.ල.ගි.ප්‍ර.39 යටතේ හානිකරණ අලාභ මිනීම සඳහා විශේෂයෙන්ම හානිකරණ අලාභ නිශ්චය කිරීමේදී ඉදිරි මුදල් ප්‍රවාහ වල අගය හා කාල වකවානුව සහ ඇප වටිනාකම්වල අගය පිළිබඳව නිසි තීන්දු ගැනීම අවශ්‍ය වේ.

ඒ අනුව, ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ අලාභ වාර්තා කළ යුතු දැයි තක්සේරු කිරීම පිණිස මූල්‍ය තත්ත්ව පිළිබඳව වාර්තා කරනු ලබන සෑම දිනයකදීම සමූහය විසින් එහි සැලකිය යුතු ණය හා අත්තිකාරම් පිළිබඳව තනි තනිව සමාලෝචනය කෙරෙයි. හානිකරණ අලාභ නිශ්චය කිරීමේ දී විශේෂයෙන්ම අනාගත මුදල් ප්‍රවාහ වල කාලය හා වටිනාකම තීරණය කිරීමට කළමනාකාරීත්වයේ තීන්දු අවශ්‍ය වේ. මෙකී ඇස්තමේන්තු පදනම් වනුයේ සාධක රාශියක් පිළිබඳ උපකල්පන ගණනාවක් මත වන හෙයින් සත්‍ය ප්‍රතිඵල මීට වෙනස් විය හැකිය.

හානිකරණය සඳහා කේවල ඇගයීමට ලක් කරනු ලබන මූල්‍ය වත්කම් සහ ඉදිරියේදී ලැබෙතැයි අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහවල වත්මන් අගය පිළිබඳ කළමනාකාරිත්වයේ නිසි ඇස්තමේන්තුව මත කේවල හානිකරණ ප්‍රතිපාදන පදනම් වේ. මෙම මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමේදී ණයකරුගේ මූල්‍ය තත්ත්වය හා පාදක වූ ඇපවල ශුද්ධ උපලබ්ධි අගය පිළිබඳ කළමනාකාරිත්වය විසින් සලකා බැලෙයි. සෑම හානිකරණ වත්කමක්ම එහි වටිනාකම හා ප්‍රායෝගික උපාය මාර්ග, ආපසු ලබාගත හැකි යැයි සැලකෙන මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තුව මත ඇගයීමට ලක් කෙරෙයි.

පහත පරිදි සාමූහික හානිකරණ ප්‍රතිපාදන ස්ථාපිත කර ඇත.

- කේවල වශයෙන් නොසැලකෙන සමජාතීය ණය හා අත්තිකාරම් කාණ්ඩ
- කේවල වශයෙන් සැලකූ නමුත් කේවල වශයෙන් හානිකරණය වී නොමැති වත්කම් කාණ්ඩ

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 අනුව සමූහයේ අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම, විචල්‍ය යෙදවුම් විකල්ප සහ ඒ මත වන අන්තර් යැපීමට පාදක උපකල්පන ගණනාවකින් යුත් සංකීර්ණ ආකෘතිවල ප්‍රතිඵලයකි. ගිණුම්කරණ තීන්දු හා ඇස්තමේන්තු ගණයෙහි ලා සැලකෙන අපේක්ෂිත ණය පාඩු ආකෘතිවලට පහත සාධක ඇතුළත් වේ.

- ණය අවදානමෙහි සැලකියයුතු වැඩිවීමක් වී ඇත්දැයි ගුණාත්මක ඇගයීම සඳහා සමූහයේ නිර්නායක සහ අපේක්ෂිත ජීවකාල ණය පාඩු පදනම මත මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා වන දීමනා
- සාමූහික පදනමක් මත අපේක්ෂිත ණය පාඩු අගයනු ලබන අවස්ථාවේ මූල්‍ය වත්කම් වර්ගීකරණය
- විවිධ සංඛ්‍යාත්මක සූත්‍ර සහ යෙදවුම් විකල්ප ඇතුළත් අපේක්ෂිත ණය පාඩු ආකෘති සංවර්ධනය
- දළ දේශීය නිෂ්පාදිත වර්ධනය, උද්ධමනය, පොළී අනුපාතික, විනිමය අනුපාතික, විරැකියාව, ණය පැහැර හැරීමේ සම්භාවිතාවය (PD) හැරුණුවිට නිරාවරණයවීම් (EAD) හා පැහැර හැරීමකදී සිදුවිය හැකි පාඩුව (LGD) ආදී සර්ව ආර්ථික යෙදවුම් අතර සම්බන්ධතාවය තීරණය කිරීම.
- ආර්ථික යෙදවුම්, අපේක්ෂිත ණය පාඩු ආකෘති වලට අදාළ කර ගැනීම සඳහා ඉදිරි දැක්මැති සාර්ව ආර්ථික සංසිද්ධීන් හා එහි සම්භාවිතාව පිළිබඳ බර තැබීම් තෝරා ගැනීම.

2.1.12.4 දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

බැංකුවේ හා සමූහයේ සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි ඒවායේ ප්‍රත්‍යාගණිත අගයට පවත්වාගෙන යයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.13) "සාධාරණ අගය මැනීමට" අනුකූලව සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය නීර්ණය කිරීම සඳහා සමූහය විසින් ස්වාධීන වෘත්තීය තක්සේරුකරුවන් යොදවන ලදී.

සින්නක්කර ගොඩනැගිලි සහ ඉඩම්වල සාධාරණ අගය නීර්ණය කිරීම සඳහා භාවිතා කල ක්‍රමවේද හා ප්‍රධාන උපකල්පන මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.3 හි තවදුරටත් විස්තර කර දක්වා ඇත.

2.1.12.5 දේපල, පිරියත හා උපකරණවල ඵලදායී ජීවකාලය

සමූහය, දේපල, පිරියත හා උපකරණවල සුන්බුන් වටිනාකම, ඵලදායී ජීවකාලය හා ක්ෂය ක්‍රමය, සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කරයි. මෙම අගයන්, අනුපාත හා ක්‍රම ඇස්තමේන්තු කිරීමේ දී කළමනාකාරිත්වයේ තීරණ භාවිතා කෙරෙන හෙයින් ඒවායෙහි අගයන් අවිනිශ්චිතතාවයකින් යුක්ත වෙයි.

2.1.12.6 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විලම්බිත බදු වත්කම් හැර අනෙකුත් වත්කම් හානිකරණය වූ බවට කිසියම් හෝ හැඟවීමක් ඇත්දැයි සමූහය විසින් අගයනු ලබයි. එබඳු හැඟවීමක් ඇත්නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවක් සිදුකිරීම අවශ්‍ය වන්නේ නම්, සමූහය විසින් වත්කමෙන් නැවත අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි නැවත අයකරගත හැකි වටිනාකම ඉක්මවයි නම්, එම වත්කම හානිකරණය වී ඇතැයි සලකනු ලබන අතර, එම වත්කමේ අගය නැවත අයකරගත හැකි අගය දක්වා කපා හරියි.

2.1.12.7 විලම්බිත බදු වත්කම්

විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ එම බදු අලාභ අයකර ගත හැකි, බදු වන අනාගත ලාභ ලැබීමේ හව්‍යතාවක් ඇතිතාක් දුරට පමණි. හඳුනාගත හැකි විලම්බිත බදු වත්කමේ අගය

නිර්ණය කිරීම පිණිස අනාගතයේ විය හැකි බදු වන ලාභයන්හි කාලසීමාව හා ප්‍රමාණය සහ අනාගත බදු සැලසුම්කරණ උපායමාර්ග මත පදනම්ව තීරණ ගත යුතු වේ.

2.1.12.8 නිර්වචිත ප්‍රතිලාභ වගකීම්

ආයුගණක තක්සේරු උපයෝගී කරගනිමින් නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය සහ එම වගකීම්වල වර්තමාන අගය තීරණය කෙරෙයි. වට්ටම් අනුපාත, වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත, ඉදිරි වැටුප් වැඩිවීම්, සේවක මර්ත්‍යතාව හා ඉදිරි විශ්‍රාම වැටුප් වැඩිවීම් පිළිබඳ උපකල්පන ආයුගණක තක්සේරුව හා සම්බන්ධ වේ.

යෝග්‍ය වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී විශ්‍රාම අරමුදලේ කාලසීමාවට බර තැබූ සාමාන්‍ය ශේෂයට සමාන ඉහළ ගුණාත්මකබවින් යුතු ආයතනික බැඳුම්කරයක ප්‍රතිලාභ කළමනාකරණය විසින් සලකා බලනු ලැබෙයි. වෙළඳපළ තුළ ගැලපෙන ඉහළ ගුණාත්මකබවින් යුතු ආයතනික බැඳුම්කර නොමැති අවස්ථාවකදී සමාන කාලසීමාවකට අවදානම ගලපන ලද රාජ්‍ය බැඳුම්කර ප්‍රතිලාභ, වට්ටම් අනුපාතයලෙෂ යොදා ගනු ලැබිණි.

පොදුවේ භාවිත මර්ත්‍යතා වක්‍ර අනුව මර්ත්‍යතා අනුපාතිකය තිරණය වෙයි. අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාත හා බැංකුවේ අපේක්ෂිත අනාගත වැටුප් වර්ධක මත ඉදිරි වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩිවීම් තීරණය වෙයි.

මෙම සැලසුම්වල දීර්ඝ කාලීන ස්වභාවය හේතුකොට ගෙන එම ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකින් යුක්ත වෙයි.

2.1.12.9 ප්‍රතිපාදන, බැඳියාවන් හා අසම්භාව්‍යයන්

සමූහයේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී සමූහයට එරෙහි නෛතික හිමිකම් ඉල්ලීම් ඉදිරිපත්වූ විට එම හිමිකම් ඉල්ලීම් සාර්ථක වීමේ ඉඩකඩ සම්බන්ධයෙන්, ප්‍රතිපාදන සැලසීම කළමනාකාරිත්වය විසින් තීරණය කරයි. නීතිමය හිමිකම් සම්බන්ධ ක්‍රියාමාර්ග අවසන් කිරීමට ගතවන කාලසීමාව මෙන්ම ආර්ථික ප්‍රතිලාභ ගලායෑමේ ප්‍රමාණය ද අවිනිශ්චිත වේ. මේ සඳහා ගතවන කාලසීමාව සහ පිරිවැය අවසාන වශයෙන් තීරණය වනුයේ අදාළ නෛතික බලසීමාව මතය.

2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම් →

2020 වර්ෂය තුළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි ප්‍රධාන පෙළේ වෙනස්කම් සිදු නොවිණි.

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.16) - කල්බදු

කල්බදු හඳුනා ගැනීම, මිනීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීමට අදාළ මූලධර්ම මෙම ප්‍රමිතීන් මගින් දැක්වෙයි. කල්බදු ගැණුම්කරුවන් හා කල්බදුහිමියන් විසින් අදාළ ගනුදෙනු විශ්වසනීය ලෙස නිරූපණය වන අන්දමට අදාළ තොරතුරු ඉදිරිපත් කරනු ලබන බවට වගබලාගැනීම මෙහි අරමුණයි. මූල්‍ය ප්‍රකාශන භාවිත කරන්නන්හට යම් ආයතනයක මූල්‍ය තත්ත්වය, මූල්‍යමය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය යනාදිය මත කල්බදු මගින් ඇති කරන බලපෑම තක්සේරු කිරීම සඳහා අවශ්‍ය පදනම මෙම තොරතුරු මගින් සැපයෙයි. පහත දැක්වෙන ප්‍රමිතීන් හා අර්ථකථන මෙම ප්‍රමිතිය මගින් අවලංගු කෙරෙයි.

(අ) ල.ගි.ප්‍ර.17 කල්බදු

(ආ) IFRIC 4 - යම් විධිවිධානයකට කල් බදු අඩංගු වේදැයි තීරණය කිරීම

(ඇ) SIC - 15 මෙහෙයුම් කල්බදු - දිරි දීමනා සහ

(ඈ) SIC – 27 කල් බද්දක නෛතික ආකෘතිය අන්තර්ගත ගනුදෙනුවල සාධක තක්සේරු කිරිම.

2019 ජනවාරි 01 වන දින සිට මූලික වශයෙන් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.16 ආදේශ කර ගැනීමෙන් අනතුරුව බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය පහත දක්වා ඇත.

2.2.1.1 කල් බදු හඳුනා ගැනීම

යම් කාලපරිච්ඡේදයක් සඳහා සලකා බැලීම වෙනුවෙන් හඳුනාගත් වත්කමක භාවිතය පාලනය කිරීමේ අයිතිය යම් ගිවිසුමක් මගින් පිළිඹිබු වන්නේ නම් එම ගිවිසුම කල්බද්දක් ලෙස සැලකෙයි. එම නිසා ගිවිසුමක් සමාරම්භයේදී පහත සඳහන් සාධක සලකා බලමින් බැංකුව විසින් ගිවිසුම කල්බද්දක් ද නොඑසේ නම් ඊට කල්බද්දක් ඇතුළත්ද යන්න තක්සේරු කරනු ලැබෙයි.

1. හඳුනාගත් වත්කම්වල උපයෝජ්‍යතාව
2. හඳුනාගත් වත්කමේ භාවිතාව පාලනය කිරීමට බැංකුවට ඇති අයිතිය
3. හඳුනාගත් වත්කමේ භාවිතාව තුළින් සියලු ආර්ථික ප්‍රතිලාභ ලැබීමට බැංකුවට ඇති අයිතිය
4. හඳුනාගත් වත්කමේ භාවිතාව මෙහෙයවීමට බැංකුවට ඇති අයිතිය

ඒ අනුව, ශාඛාවක් මෙහෙයවීම සඳහා හෝ යන්ත්‍රෝපකරණ භාවිතය සඳහා බැංකුව එළඹෙන ලද සියලුම කුලී ගෙවීම් පිළිබඳ එකඟතා සියල්ල (මාස 12ට අඩු හා අඩු අගයකින් යුතු එකඟතා ආදී කෙටිකාලීන එකඟතා හැරුණු විට) ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.16 කල් බදු යටතේ කල් බදු අන්තර්ගත බව හඳුනාගනු ලැබෙයි.

2.2.1.2 භාවිතයට අයිතිය ඇති වත්කම්

කල්බදු ආරම්භක දිනයේදී (එනම්, කල්බදු එකඟතා ගිවිසුමෙහි නිශ්චය කර ඇති දින.) භාවිතයට අයිතිය ඇති වත්කම් බැංකුව විසින් හඳුනාගනු ලැබෙයි. භාවිතයට අයිතිය ඇති වත්කම්, සමුච්චිත ක්ෂයවීම් හා හානිකරණ පාඩු අඩුකර පිරිවැයට මනිනු ලබන අතර කිසියම් කල්බදු වගකීම් ප්‍රතිමිනුම් වේ නම් ඊට ගලපනු ලැබෙයි. හඳුනාගනු ලැබූ කල්බදු වගකීම් අගය සහ ලද කල්බදු දිරිදීමනා වේ නම් එය අඩු කළ පසු ආරම්භක දිනට හෝ ඊට පෙර සිදු කරනු ලද කල්බදු ගෙවීම්, භාවිතයට අයිතිය ඇති වත්කම්වල පිරිවැයට අන්තර්ගත වේ. කල්බදු කාලසීමාව අවසානයේදී කල්බදු වලට අදාළ වත්කමෙහි හිමිකාරිත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් බැංකුව සතු නොවේ නම් මිස, භාවිතයට අයිතිය ඇති වත්කම්, එහි අපේක්ෂිත ඵලදායී ජීවකාලය හා කල්බදු කාලසීමාව යන දෙකෙන් අඩු සීමාව තුළ සරල රේඛීය පදනම මත ක්ෂය කරනු ලැබෙයි. භාවිතයට අයිතිය ඇති වත්කම් හානිකරණයට බඳුන් වෙයි.

2.2.1.3 කල්බදු වගකීම්

කල්බදු සමාරම්භක දිනට බැංකුව විසින් කල්බදු කාලසීමාව තුළ කළ යුතු ගෙවීම්වල වත්මන් අගයට මනිනු ලබන කල්බදු වගකීම් හඳුනා ගැනෙයි. ස්ථාවර ගෙවීම්, ලැබිය හැකි කල්බදු දීමනා අඩු කළ පසු දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම්වන විචල්‍ය කල්බදු ගෙවීම් සහ ඇපකර වටිනාකම් යටතේ ගෙවීමට අපේක්ෂිත අගයන් කල්බදු ගෙවීම්වලට අයත් වේ. බැංකුව විසින් උපයෝගී කරගනු ලැබීමට හේතු සහගත ගැනුම් විකල්පයක පුරුදු මිල හා ගිවිසුම අවසන් කළ හැකිය යන විකල්පය බැංකුවට භාවිත කිරීමේ අයිතිය කල්බදු කොන්දේසි වලින් පිළිඹිබු වේ නම්, කල්බදු ගිවිසුමක් අවසන් කිරීමට අදාළ දඩ මුදල් ද කල්බදු ගෙවීම්වලට ඇතුළත් වේ. ගෙවීම් කිරීමට තුඩු දෙන යම් සිදුවීමක් හෝ තත්ත්වයක් උදාවූ කාලසීමාව තුළ යම් දර්ශකයක් හෝ අනුපාතිකයක් මත පදනම් නොවූ විචල්‍ය කල්බදු ගෙවීම් වියදම් ලෙස හඳුනා ගැනෙයි. කල්බදු ගෙවීම්වල වත්මන් අගය ගණනය කිරීමේදී කල්බදු වලට අදාළ පොලී අනුපාතිකය එක්වරම තීරණය කළ නොහැකි වන විටක කල්බදු ආරම්භක දිනට

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

පවතින භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතිකය (භාණ්ඩාගාර බැඳුම්කර කාලසීමාව කල්බදු ගිවිසුම් කාලසීමාවට සමාන විය යුතුයි.) බැංකුව විසින් උපයෝගී කරගනු ලැබෙයි.

සමාරම්භක දිනට පසුව පොලිය එකතුවීම පිළිඹිබු කිරීමට කල්බදු වගකීම් ප්‍රමාණය වැඩිකර ගෙවන ලද කල්බදු ගෙවීම් ප්‍රමාණය අඩු කරනු ලබයි. ඊට අමතරව වෙනස් කිරීමක්, කල්බදු කාලසීමාවෙහි වෙනසක්, ප්‍රධාන වශයෙන් ස්ථාවර කල්බදු ගෙවීම්හි වෙනසක් හෝ පාදක වූ වත්කම මිලදී ගැනීමේදී තක්සේරුකරණයේ වෙනසක් යනාදිය ඇති අවස්ථාවලදී කල්බදු වගකීම්හි ධාරණ අගය ප්‍රත්‍යාගණනය කෙරෙයි.

2.2.1.4 කෙටිකාලීන කල්බදු හා අඩු වටිනාකමැති වත්කම් කල්බදු

බැංකුව එහි කෙටිකාලීන කල්බදු වලට (එනම්, මිලදී ගැනීමේ විකල්පයක් නොමැති හා ආරම්භක දින සිට මාස 12 ක හෝ ඊට අඩු කල්බදු කාලසීමාවක් සහිත කල්බදු වලට) කෙටිකාලීන කල්බදු හඳුනාගැනීම් නිදහස් කිරීම අදාළ කර ගනියි. එමෙන්ම අඩු වටිනාකමක් ඇති බවට සලකනු ලබන අවස්ථාවලදී ද බැංකුව අඩු වටිනාකමැති වත්කම් කල්බදු හඳුනාගැනීම් නිදහස් කිරීම අදාළ කර ගනියි. කෙටිකාලීන කල්බදු මත හා අඩු වටිනාකමැති වත්කම් මත කල්බදු ගෙවීම්, කල්බදු කාලසීමාව තුළදී සරල රේඛීය පදනමක් මත වියදම් ලෙස හඳුනාගනු ලබයි. බැංකුව විසින් පාදක වූ වත්කමෙහි අගය රු.මි. 1ට සමාන හෝ අඩු නම්, අඩු වටිනාකමැති වත්කම්වල කල්බදු සලකා බැලෙයි.

2.2.1.5 අළුත්කිරීමේ විකල්පය සහිත ගිවිසුම්වල කල්බදු කොන්දේසි තීරණය කිරීමේදී වැදගත් තීරණ

උපයෝගී කරගත හැකි බවට පිළිගත හැකි පරිදි තහවුරු කළ හැකි, දීර්ඝ කළ හැකි විකල්පයක් මගින් ආවරණය වන කිසියම් කාලච්ඡේද සමග හෝ උපයෝගී කරගනු ලබන බවට පිළිගත හැකි පරිදි තහවුරු කළ නොහැකි විටකදී කල්බදු අවසන් කිරීමට විකල්පයක් මගින් ආවරණය වන කාලච්ඡේද සමග අවලංගු කළ නොහැකි කල්බදු කොන්දේසි, බැංකුව විසින් කල්බදු කොන්දේසි ලෙස තීරණය කරනු ලබයි. අළුත්කිරීමේ විකල්පය උපයෝගී කරගනු ලබන බවට පිළිගත හැකි පරිදි තහවුරු කර ගැනීම උදෙසා බැංකුව තීරණ ගනු ලබයි. එනම්, අළුත්කිරීම උපයෝගී කර ගැනීම සඳහා ආර්ථිකමය දිරිදීමනාවක් උත්පාදනය කරන අදාළ සියලු සාධක එය සලකා බලනු ලබයි. ආරම්භක දිනට පසු, සිය පාලනය යටතේ ඇති හා අළුත්කිරීමේ විකල්පය උපයෝගී කර ගැනීමට (හෝ උපයෝගී කර නොගැනීමට) ඇති හැකියාව බලපානු ලබන වාතාවරණයන්හි වෙනසක් හෝ වැදගත් සිද්ධියක් වේ නම්, බැංකුව විසින් කල්බදු කොන්දේසි යළි ඇගයීමට ලක් කෙරෙයි. කල්බදු දීර්ඝ කර ගැනීමේ හෝ අවසන් කිරීමේ විකල්ප අඩංගු ගිවිසුම්හි කල්බදු කොන්දේසි තීරණය කිරීමේදී බැංකුව පසුදැක්මක් යොදා ගනියි. ඒ අනුව, බැංකුව හා බදුහිමියා විසින් අත්සන් කරන ලද කුලී එකඟතාව මගින් ආවරණය වන කාලච්ඡේදය තුළ වසර ගණන මත පදනම්ව බැංකුව විසින් කල්බදු කොන්දේසි හඳුනාගනු ලබයි.

2.2.1.6 මිනීම

2019 ජනවාරි 01 දින මූලිකව උපයෝගී කරගනු ලැබූ දිනය ලෙස ගනිමින් බැංකුව විසින් නවීකරණය කරන ලද අතීතයේ සිට බලපාන පරිදි උපයෝගී කර ගැන්මේ ක්‍රමවේදය යොදා ගනිමින් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 16 භාවිත කරන ලදී. මෙම ක්‍රමවේදය යටතේ, මූලිකව උපයෝගී කරගනු ලැබූ දිනයට හඳුනාගත් ප්‍රමිතිය මූලිකව අදාළ කර ගැනීමේ බලපෑම සමග අදාළ ප්‍රමිතිය, අතීතයේ සිට බලපාන පරිදි යොදාගනු ලබයි. එහෙයින් බැංකුව විසින් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 16 ප්‍රත්‍යාවලෝකන උපයෝගී කර ගැන්මේ ක්‍රමවේදය භාවිත කරයි.

- පෙර වාර්තා කළ පරිදි බැංකුව සන්සන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කරයි.
- ආරම්භයේදී හඳුනාගත් වත්කම් හා වගකීම් අතර වෙනස්කම් සංක්‍රමණයේදී රඳවාගත් ඉපයීම් ලෙස
- කල්බදු ආරම්භයේදී (එනමුත් සංක්‍රමණ දිනට වට්ටම් අනුපාතික යොදා ගනිමින්) ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 16 අදාළ කරගත් අයුරින් වත්කම් භාවිතයට ඇති අයිතිය මනිනු ලැබෙයි.

භාවිතයට අයිතිය ඇති වත්කම් හා කල්බදු වගකීම් හි මූලික මිනීම

2019 ජනවාරි 01 දිනට ගෙවිය යුතු වූ ඕනෑම අත්තිකාරමකට ගලපන ලද සියලු කල්බදු කුලීවල වත්මන් අගයට වත්කම් භාවිතා කිරීමේ අයිතිය මූලිකව මනිනු ලැබෙයි. අනාගත කල්බදු කුලී වල ආරම්භක දිනට ශේෂව පවතින කල්බදු කාලසීමාව තුළ වත්මන් අගයට කල්බදු වගකීම මූලිකව මනිනු ලැබෙයි.

භාවිතයට අයිතිය ඇති වත්කම් හා කල්බදු වගකීම්හි පසුකාලීන මිනීම

ආරම්භක දිනට පසුව බැංකුව විසින් පිරිවැය ආකෘතියක් උපයෝගී කරමින් වත්කම් භාවිතයට ඇති අයිතිය මනිනු ලැබෙයි. සරල රේඛීය ක්‍රමවේදය උපයෝගී කරගනිමින් 2019 ජනවාරි 01 දිනට වත්කම්, ඉතිරි කල්බදු කාලසීමාවට ක්‍රමක්ෂය කෙරෙයි. කල්බදු පොලිය එකතු කරමින් හා කල්බදු ගෙවීම් අඩුකර කල්බදු වගකීම පසුව මනිනු ලබයි.

වට්ටම් අනුපාතිකය

ඉදිරි කුලී ගෙවීම් වට්ටම් කිරීම සඳහා වර්ධනාත්මක ණය අනුපාතික උපයෝගී කර ගැනීමට බදු ගැණුම්කරුට සිදු වේ. එනම්, ඊට සමාන ණය කාලීමාවකදී ඒ හා සමාන සුරැකුම් මත ණය ලබාගැනීම සඳහා ණය ගැණුම්කරුවෙකු විසින් ගෙවිය යුතු පොළී අනුපාතිකයයි. ඒ හා සමාන ආර්ථික වාතාවරණයකදී භාවිතයට අයිතිය ඇති වත්කමකට සමාන වටිනාකමක් ඇති වත්කමක් ලබාගැනීමට අවශ්‍ය අරමුදලයි. එක හා සමාන කල්බදු කාලසීමා සහිත කල්බදු සඳහා එක් වට්ටම් අනුපාතිකයක් බැංකුව විසින් යොදා ගැනෙයි.

- **ගිවිසුමක උප අංග වෙන්කර දැක්වීම**
  බැංකුව විසින් ප්‍රායෝගික ක්‍රියාවලියේදී නිරන්තරයෙන් කල්බදු නොවන උප අංග සහ කල්බදු ගිවිසුමක උප අංග වෙන් කිරීමට කටයුතු නොකරන අතර ඒ වෙනුවට සෑම කල්බදු උප අංගයක්ම හා ඒ ආශ්‍රිත කල්බදු නොවන උප අංග, එක් කල්බදු අගයක් සේ ගිණුම්කරණය කරයි.
- **මූලික සෘජු පිරිවැය**
  ප්‍රායෝගික අවශ්‍යතාවයක් ලෙස බැංකුව විසින් මූලික යෙදවුම් දිනයේදී පරිහරණයට අයිතිය හිමි වත්කම් මිනීමේදී වන මූලික සෘජු පිරිවැය ඉවත් කරනු ලැබෙයි.

2.3 සාධාරණ අගය මිනීම →

"සාධාරණ අගය" වූ කලී විධිමත් ගනුදෙනුවකදී වත්කමක් විකිණීමට හෝ වගකීමක් ගෙවා නිදහස් වන මිල සඳහා ගෙවීමේදී හෝ එසේ නොමැති විටක මනිනු ලබන දින වෙළඳපළ පාර්ශවකරුවන් අතර සිදුවන නිසි ගනුදෙනුවකදී සමූහයට එදිනට පිවිසිය හැකි වඩා ප්‍රතිලාභදායී වෙළඳපළකදී ලැබෙන මිලකි. වගකීමක සාධාරණ අගය එහි කාර්යසාධනමය නොවන අවදානම පිළිඹිබු කරයි.

යම් උපකරණයක් සඳහා සක්‍රිය වෙළඳපළක් තුළ ප්‍රකාශිත මිල භාවිත කරමින් සමූහය විසින් එකී උපකරණයෙහි සාධාරණ අගයට මනිනු ලබයි. අඛණ්ඩ පදනමක් මත මිලකරණ තොරතුරු සැපයීමට ප්‍රමාණවත් ධාරිතාවක් හා තීව්‍රතාවයක් සහිත වත්කමක හෝ වගකීමක ගනුදෙනු සිදුවන්නේ නම්, එකී වෙළඳපළ සක්‍රිය යැයි සැලකෙයි.

සක්‍රිය වෙළඳපළක් තුළ ප්‍රකාශිත මිලකරණයක් නොවේ නම් නිරීක්ෂණය කළ හැකි අදාළ යෙදවුම්වල භාවිතය උපරිම කරවන සහ නිරීක්ෂණය කළ නොහෙන යෙදවුම්වල භාවිතය අවම කරවන තක්සේරු විධික්‍රම සමූහය විසින් භාවිත කෙරෙයි. මිලකරණ ගනුදෙනුවකදී වෙළඳපළ පාර්ශවකරුවන්

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

ආර්ථික අතින් ඔවුන්ගේ උපරිම යහපත තකා කටයුතු කරන්නේ නම්, වත්කම හෝ වගකීම මිලකරණයේදී ඔවුන් සාධාරණ අගයෙහි ධූරාවලිය උපයෝගී කරගනු ඇතැයි යන උපකල්පනය මත වත්කමක/වගකීමක සාධාරණ අගය මනිනු ලැබේ.

වෙනස්වීම් සිදුවී ඇති වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී සාධාරණ අගයෙහි ධූරාවලි මට්ටම් අතර මාරුවීම් සමූහය විසින් හඳුනාගනු ලබයි.

මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේදී වත්කමක් එහි ඉහළම/හොඳම භාවිතය තුළින් හෝ එලෙස ඉහළම/හොඳම ලෙස භාවිත කරනු ලබන වෙනත් වෙළඳපළ පාර්ශ්වකරුවෙකු හට විකිණීම තුළින් ආර්ථික ප්‍රතිලාභ ජනනය කිරීමට වෙළඳපළ පාර්ශ්වකරුවකු සතු හැකියාව සලකා බලනු ලබයි.

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගය මිනීමේ/විශ්ලේෂණයක් පිටු අංක 277 සිට 282 දක්වා සටහන් අංක 56 හි දක්වා ඇත.

2.4 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති - පොදු →

2.4.1 ඒකාබද්ධ කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 10) "ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන" සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.27) "ඒකාබද්ධ හා තනි මූල්‍ය ප්‍රකාශන" ප්‍රකාර බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන, බැංකුවේ සහ එහි පාලිතයේ මූල්‍ය ප්‍රකාශන වලින් සමන්විත වේ.

2.4.1.1 ව්‍යාපාරික ඒකාබද්ධවීම්

පාලනය සමූහය වෙත සංක්‍රමණය වන අවස්ථාවේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 3 – "ව්‍යාපාරික ඒකාබද්ධවීම්" යටතේ අත්පත් කර ගැනීමේ ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් ව්‍යාපාරික ඒකාබද්ධවීම් ගිණුම්ගත කෙරෙයි. අත්පත් කර ගැනීමේදී සංක්‍රමණය කෙරෙන ප්‍රතිලාභ හා අත්පත් කරගනු ලබන ශුද්ධ හඳුනාගත හැකි වත්කම් සාධාරණ අගයට මනිනු ලැබෙයි. පැන නගිනු ලබන යම් කීර්තිනාමයක් වේ නම්, වාර්ෂිකව හානිකරණය සඳහා පරීක්‍ෂා කරනු ලබයි. කේවල් කර මිලදී ගැනීමකදී ඇති වන ඕනෑම ලාභයක් වහාම ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි. ණය හෝ හිමිකම් කොටස් සුරැකුම් නිකුතුවට අදාළ නම් හැර ගනුදෙනු පිරිවැය සිදු වූ වියදම් ලෙස ගණනය වෙයි.

පෙර පැවති සබඳතා පියවීමට අදාළ ප්‍රතිලාභ සංක්‍රමණය වූ ප්‍රතිලාභ වලට ඇතුළත් නොවෙයි. එබඳු ප්‍රමාණ සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභවල හඳුනාගනු ලැබෙයි.

අත්පත් කරගනු ලබන ඕනෑම අසම්භාව්‍ය ප්‍රතිලාභයන් එය අත්පත් කරගන්නා දිනට එහි සාධාරණ වටිනාකමට මනිනු ලබයි. හිමිකම් ලෙස වර්ගීකරණය කර ඇති විට එය ප්‍රත්‍යාගණනය නොකරන අතර හිමිකම් තුළ පියවීම ගිණුම්කරණය කෙරෙයි. අඛණ්ඩ සලකා බැලීමත්. ගෙවීමට ඇති බැඳියාව මූල්‍ය උපකරණ වර්ගීකරණයෙහි හිමිකම නිර්වචනය යටතට ගැනෙන විට එය ප්‍රත්‍යාගණනය නොකරන අතර පියවීමද හිමිකම් ඇතුලත ගිණුම්ගත කරයි. නොඑසේ නම් අඛණ්ඩ සලකා බැලීමක සාධාරණ වටිනාකම පසුකාලීන වෙනස්වීම් ලාභයට හෝ අලාභයට හඳුනා ගනියි. මූල්‍ය උපකරණයක නිර්වචනයට සරිලන අසම්භාව්‍ය ප්‍රතිලාභ ගෙවීමට ඇති බැඳියාව, නොඑසේ නම්, අසම්භාව්‍ය ප්‍රතිලාභයන්හි සාධාරණ වටිනාකමෙහි පසුකාලීන වෙනස්කම් ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි.

2.4.1.2 පාලනයට යටත් නොවන හිමිකම

ඉහත විස්තර පිටු අංක 88 හි සටහන් අංක 234 යටතේ දක්වා ඇත.

2.4.1.3 පරිපාලිත සමාගම්

බැංකුව වෙත පාලනය පැවරෙන දින පටන් පාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන මුලුමනින්ම ඒකාබද්ධ කෙරෙන අතර, එබඳු පාලනයක් අවසන් වනතුරු ඒකාබද්ධ කිරීම සිදුවෙයි. පාලනයක් පවතින්නේ බැංකුවට එකී පාලිත සමාගමේ ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි, එහි මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කිරීමට බලයක් ඇති විටදීය. ඒකාබද්ධ කිරීමේදී භාවිතා වන බැංකුවේ පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන, ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණ කාලපරිච්ඡේදය අදාළ වන අතර ඊට සමාන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කරමින් පිළියෙල කරනු ලබයි.

2.4.1.4 පාලනය අහිමිවීම

පාලිත සමාගමක පාලනය, සමූහය සතු නොවන විට එය විසින් පාලිත සමාගමෙහි වත්කම් හා වගකීම් සහ අදාළ ඕනෑම පාලනයකට යටත් නොවන හා හිමිකම්වල වෙනත් උපාංග හඳුනාගනු නොලැබෙයි. එහි ප්‍රතිඵල ලෙස උත්පාදිත ලාභ හෝ අලාභ ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි. පාලනය සතු නොවන විට පෙර පාලිත සමාගමෙහි රඳවාගත් ඕනෑම හිමිකමක් සාධාරණ වටිනාකමට මනිනු ලබයි.

2.4.1.5 ඒකාබද්ධ කිරීමේදී ඉවත් කරනු ලැබූ ගනුදෙනු

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියලුම අන්තර් සමාගම් ශේෂයන්, ආදායම් හා වියදම් මෙන්ම එවැනි අන්තර් සමාගම් ගනුදෙනුවලින් පැන නගින ලද උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ සම්පූර්ණයෙන් ඉවත් කර ඇත. පිටු අංක 237 හා 238 හි දක්වා ඇති පාලිත සමාගම සමග ගනුදෙනුවලට අදාළ සටහන් අංක 49.3 හා 49.4 වෙත යොමු වන්න.

2.4.2 විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂ

විදේශීය ව්‍යවහාර මුදලින් කරනු ලබන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවූ අවස්ථාවේදී පැවති විනිමය අනුපාතික මත වාර්තාකරන/ක්‍රියාකාරී මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබයි.

ශේෂපත්‍ර දිනට විදේශ ව්‍යවහාර මුදලින් සමන්විත මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තාකරණ දිනට පවතින මධ්‍යම විනිමය අනුපාතය යොදාගනිමින් ශ්‍රී ලංකා රුපියල් වලට යළි පරිවර්තනය කරනු ලබයි. මූල්‍ය අයිතම පියවීම මත හෝ මුලින් වාර්තා කළ අනුපාතයකට වඩා වෙනස් අනුපාත වලට මූල්‍ය අයිතම පරිවර්තනය මත පැන නගින සියලුම විනිමය වෙනස්කම්, එකී වෙනස්කම් පැනනගින කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබෙයි.

ඓතිහාසික පිරිවැයට අගය කරනු ලබන මූල්‍ය නොවන විදේශ මුදලින් ප්‍රකාශිත අයිතම, ආරම්භක ගනුදෙනු සිදු වූ දින පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් ව්‍යවහාරික මුදල් වලට පරිවර්තනය කරනු ලබේ. විදේශ මුදලින් ප්‍රකාශිත සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය නොවන අයිතම සාධාරණ අගය තීරණය කළ දින පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

විදේශ මුදල් බැංකු ඒකකයෙහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය වාර්තා කරන දිනයේ දී පැවති මධ්‍යම විනිමය අනුපාතයට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබයි. ඉහත ප්‍රතිපත්තියට අනුව විදේශ මුදල් බැංකු ඒකකයෙහි ගනුදෙනු වාර්තා කර ඇති අතර, ඉන් ජනිතවූ ලාභ/අලාභ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

2.5 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති - වත්කම් හා වගකීම් හඳුනාගැනීම →

මූල්‍ය උපකරණ

2018 ජනවාරි මස 01 දින හෝ ඉන් පසුව එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 "මූල්‍ය උපකරණ" මගින් ශ්‍රී ල.ගි.ප්‍ර 39 ආදේශ වෙයි. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේ අනුමත ප්‍රතිපත්තිමය විකල්පයක් ලෙස ශ්‍රී ල.ගි.ප්‍ර 39 ප්‍රකාර ඉදිරි ගිවිසුම් ගිණුම්කරණ අඛණ්ඩවම යොදාගැනීමට බැංකුව තීරණය කරන ලදී.

2.5.1 මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම්, වර්ගීකරණය සහ පසුව මිනීම

2.5.1.1 හඳුනා ගැනීමේ දිනය

සමූහය විසින් ආරම්භයේදී ණය හා අත්තිකාරම්, තැන්පතු හා යටත්කාලීන වගකීම් යනාදිය ඒවා ඇති වූ දිනට හඳුනාගනු ලැබෙයි. ගනුදෙනුකරුවන්ට ලබාදෙන ණය හා අත්තිකාරම් හඳුනාගනු ලබන්නේ ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලට අරමුදල් බැර වූ පසුවය. ගනුදෙනුකරුවන්ගේ අරමුදල් බැංකුවට ලැබූ පසුව තැන්පත්කරුවන්ට ගෙවිය යුතු ශේෂ ලෙස බැංකුව හඳුනාගනී.

අනෙකුත් සියලුම මූල්‍ය උපකරණ (සාමාන්‍ය ක්‍රමයට මිලදී ගැනීම් හා මූල්‍ය වත්කම් විකිණීම ඇතුළත්ව) මූලිකව ගනුදෙනු කරන දිනට එනම්, උපකරණවල ගිවිසුම්ගත ප්‍රතිලාභ සඳහා සමූහය පාර්ශ්වකරුවකු වන දිනට හඳුනා ගැනේ.

2.5.1.2 මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මූලික ගණනය කිරීම

මූලික ගණනය කිරීම් සඳහා මූල්‍ය උපකරණ වර්ගීකරණය කිරීම තීරණය වනුයේ, සටහන් අංක 2.5.1.4.1 සහ 2.5.1.4.2 හි විස්තර කර ඇති පරිදි උපකරණ කළමනාකරණය කිරීමේ ව්‍යාපාරික ආකෘතිය සහ ගිවිසුම්ගත කොන්දේසි මතය.

ලාභය හෝ පාඩුව හරහා වාර්තා කළ මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වලදී හැරණුවිට මූල්‍ය උපකරණ මූලික ගණනය කිරීමේදී ඒවායේ සාධාරණ වටිනාකමට (සටහන් අංක 56 හි නිර්වචිත අයුරින්) මනිනු ලබන අතර ඊට වෙළඳ ගනුදෙනු පිරිවැය එකතු කිරීම හෝ අඩු කිරීම සිදු කෙරෙයි.

වෙළඳාම් මගින් ලැබීම් ගනුදෙනු මිලට මනිනු ලබයි. මූලික ගණනය කිරීමේ මූල්‍ය උපකරණවල සාධාරණ අගය වෙළඳ ගනුදෙනු මිලෙන් වෙනස් වන අවස්ථාවේදී බැංකුව සහ සමූහය විසින් පහත සඳහන් පරිදි දින 1 ලාභය හෝ අලාභය සඳහා ගිණුම්කරණය කෙරෙයි.

2.5.1.3 දින 1 ලාභය හෝ අලාභය

නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළහි දත්ත ඇතුළත් විචල්‍යයන් මත වූ ඇගයීමේ ශිල්පක්‍රම පදනම්ව ගණනය කළ සාධාරණ අගය හෝ එකම නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ ගනුදෙනු පදනම් කරගෙන නිර්ණය කළ සාධාරණ අගය ගනුදෙනු මිලෙන් වෙනස් වන විට වෙනස සමූහය විසින් වහාම හඳුනාගනී. නිරීක්ෂණය කළ නොහැකි දත්ත උපයෝගී කර ගනිමින් සාධාරණ අගය තීරණය කරනු ලබන අවස්ථාවල දී යෙදවුම් දත්ත නිරීක්ෂණය කළ හැකි වන විට හෝ අයිතමය හඳුනා නොගන්නා විට ගනුදෙනු කරන මිල හා ආකෘතියෙහි අගය අතර වෙනස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි පමණක් හඳුනාගනු ලබයි. ගනුදෙනුකරන මිලෙහි සහ සාධාරණ අගයෙහි වෙනස ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

පොදු යෝජනා ක්‍රමයක් යටතේ සහනදායී පොළී අනුපාතයට සේවකයන්ට ප්‍රදානය කරන ලද ණය වලින් ජනිත වන දින 1 අලාභය සේවකයන්ගේ ඉදිරියට ඇති සේවා කාලය හෝ ණය කාලසීමාව යන දෙකෙන් අඩු අගයට පොළී ආදායම් හා පුද්ගල වියදම් හි සඵල පොළී අනුපාතය භාවිතයෙන් හඳුනාගනු ලබයි.

2.5.1.4 මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ පසුව මිනීම

බැංකුව විසින් පහත කවරාකාරයෙන් හෝ මනින ලදුව වත්කම්වල ගිවිසුම්ගත කාලසීමා කළමනාකරණය කිරීමේ ව්‍යාපාරික ආකෘතිය මත පදනම්ව එහි සියලු මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරෙයි.

- ක්‍රමක්ෂය පිරිවැය
- වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය
- ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය

සටහන් අංක 2.5.1.6 හි විස්තර කොට ඇති පරිදි බැංකුව හා සමූහය විසින් ව්‍යුත්පන්න සහ ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට අගය කරන වෙළඳ කළඹ වර්ගීකරණය කර අගය කරනු ලබයි. බැංකුව විසින් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට මූල්‍ය උපකරණ නියම කරනු ලබන අතුරින් එමගින් අගය කිරීමේ හෝ හඳුනාගැනීමේ අසමානතා සැලකියයුතු ලෙස අඩු කෙරෙයි.

2.5.1.4.1 ව්‍යාපාරික ආකෘති ඇගැයීම

සිය අරමුණු ඉටුකර ගැනීමට මූල්‍ය වත්කම් කළමනාකරණය කරන අයුරු හොඳින්ම පිළිඹිබු වන මට්ටමට බැංකුව සහ සමූහය විසින් එහි ව්‍යාපාරික ආකෘතිය තීරණය කරනු ලබයි.

බැංකුවේ ව්‍යාපාරික ආකෘතිය, උපකරණයෙන් උපකරණය යන පදනම නොව වඩාත් ඉහළ මට්ටමේ කළඹ එකතුව මත ඇගයීමට ලක්වන අතර, පහත සඳහන් නිරීක්ෂණය කළහැකි සාධක මත පදනම් වේ.

- ව්‍යාපාරික ආකෘතියෙහි කාර්ය සාධනය සහ එකී ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ගනු ලබන මූල්‍ය වත්කම් අගයන අයුරු හා ආයතනයේ ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස් වෙත වාර්තා කරනු ලබන අයුරු.
- ව්‍යාපාරික ආකෘතියෙහි කාර්ය සාධනයට බලපානු ලබන අවදානම් (සහ එකී ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ගනු ලබන මූල්‍ය වත්කම්) හා විශේෂයෙන්ම එකී අවදානම් කළමනාකරණය කරන අයුරු.
- ව්‍යාපාරයේ කළමනාකරුවන් හානිපූරණය කෙරෙන අයුරු (උදා: වශයෙන් කළමනාකරණය කරනු ලබන වත්කම්වල සාධාරණ වටිනාකම මත නැතහොත් රැස් කරනු ලබන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මත හානිපූරණය කෙරේද)
- අපේක්ෂිත වාර ගණන, වටිනාකම හා විකුණුම් සිදු කරනු ලබන කාලසීමාව යනාදිය ද බැංකු මගින් කරනු ලබන ඇගයීමේදී වැදගත් අංගයක් වේ.

ආතති සිදුවීම් හා වියහැකි නරකම සිදුවීම් සැලකිල්ලට නොගෙන පිළිගත හැකි අපේක්ෂිත සිදුවීම් මත පදනම්ව ව්‍යාපාරික ආකෘතිය ඇගයීම සිදුකෙරේ. මූලික හඳුනාගැනීමෙන් පසුව බැංකුවේ මුල් අපේක්ෂාවට වඩා වෙනස් අයුරින් මුදල් ප්‍රවාහ හඳුනාගනු ලැබේ නම්, එකී ව්‍යාපාරික ආකෘතියෙහි රඳවාගනු ලබන සෙසු මූල්‍ය වත්කම් වල වර්ගීකරණය බැංකුව විසින් වෙනස් නොකරන අතර අලුතින් ජනිත හෝ අලුතින් මිලට ගනු ලැබූ මූල්‍ය වත්කම් අගය කිරීමේදී එකී විස්තර අන්තර්ගත කරනු ලැබේ.

2.5.1.4.2 ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හුදු මුල් මුදල සහ පොළිය ගෙවීමේ ඇති ඇගැයීම (SPPI Test)

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පරීක්ෂාව වශයෙන් මුල් මුදල හා පොළිය ගෙවීම සම්බන්ධයෙන් පමණක් අදාළ වේදැයි හඳුනාගැනීම පිණිස බැංකුව විසින් මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් අගයනු ලබයි.

මූල්‍ය ප්‍රකාශවලට
අදාළ සටහන්

මෙම පරීක්ෂාවේදී මුල් මුදල නිර්වචනය කරනු ලබන්නේ මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කමෙහි සාධාරණ අගය ලෙස වන අතර, මූල්‍ය වත්කමෙහි ජීවකාලය තුළ එය වෙනස් වියහැකිය. (උදා: වශයෙන් මුල් මුදල යළි ගෙවීම හෝ අධිමිල/වට්ටම් ක්‍රමක්ෂයවීම් මත)

ණයදීමේ ක්‍රියාවලිය තුළ වඩාත් වැදගත් පොළී සම්බන්ධ සාධක වන්නේ ණය අවදානම සහ මුදල්වල කාලීන අගය පිළිබඳ සලකා බැලීමයි. ඉහත කී ඇගයීම සිදුකිරීම පිණිස මූල්‍ය වත්කම පවතින මුදල් වර්ගය සහ පොළී අනුපාතිකය අදාළ වන කාලසීමාව ආදී කරුණු බැංකුව විසින් සලකා බලා විනිශ්චයකට එළඹෙයි.

අවදානමට ඇති අවම නිරාවරණයවීම් හෝ වෙනස්වීම් හඳුන්වාදෙනු ලබන ගිවිසුම්ගත නිරාවරණයවීම් වලට වඩා මූලික ණයදීමේ ක්‍රියාවලියට සම්බන්ධ නොමැති ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ, හිඟ මුදල් මත පමණක් මුල් මුදල් හා පොළී ගෙවීම් වලට තුඩු නොදෙයි. එවන් අවස්ථාවලදී මූල්‍ය වත්කම් සාධාරණ අගය මත ලාභ අලාභ අනුව ගණනය කළ යුතු වේ.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති විවිධ මූල්‍ය වත්කම් කාණ්ඩ පිළිබඳ විස්තර සඳහා සටහන් අංක 2.5.1.4.3 සිට 2.5.1.4.5 දක්වා යොමු වන්න.

2.5.1.4.3 ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්

පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නියම නොකෙරේ නම්, මූල්‍ය වත්කම ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබෙයි.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම් සඳහා වත්කම් රඳවාගැනීම අරමුණ වන ව්‍යාපාරික ආකෘතියක් තුළ වත්කම රඳවාගනු ලැබීම.
- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි නිශ්චිත දිනයන්හි ගෙවියයුතු සම්පූර්ණ මුදලෙහි මුල් මුදල හා පොළිය ගෙවීම් පමණක් වන මුදල් ප්‍රවාහ ඇතිකරවීම.

ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම් පහත දැක්වේ.

(අ) මුදල් හා මුදල්වලට සමානයන්

මුදල් හා මුදල්වලට සමානයන් පිළිබඳ විස්තර පිටු අංක 177 හි සටහන් අංක 16 හි දැක්වේ.

(ආ) මහ බැංකුව වෙතැති ශේෂයන්

මහ බැංකුව වෙතැති ශේෂයන් පිළිබඳ විස්තර පිටු අංක 177 හි සටහන් අංක 17 හි දැක්වේ.

(ඇ) බැංකුවල ඇති තැන්පතු

බැංකුවල ඇති තැන්පතු පිළිබඳ විස්තර පිටු අංක 177 හි සටහන් අංක 18 හි දැක්වේ.

(ඈ) ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්

ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් පිළිබඳ විස්තර පිටු අංක 183 හි සටහන් අංක 21 හි දැක්වේ.

(ඉ) ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ

ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ පිළිබඳ විස්තර පිටු අංක 192 හි සටහන් අංක 22 හි දැක්වේ.

2.5.1.4.4 වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම්

වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන ණය හා හිමිකම් උපකරණ යනාදිය වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් වලට ඇතුළත්ය.

වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් පිළිබඳව පහත සඳහන් සටහන් (අ) සහ (ආ) මගින් දැක්වේ.

(අ) වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කරන ලද ණය උපකරණ

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සඳහා වත්කම් රඳවාගැනීම අරමුණු වන ව්‍යාපාරික ආකෘතියක් තුළ වත්කම රඳවාග නු ලබන්නේ නම් හෝ ගෙවියයුතු මුළු මුදලින් මුල් මුදල හා පොළිය ගෙවීම ගෙවීම පමණක් නියෝජනය කරනු ලබන වත්කමක මුදල් ප්‍රවාහ විකිණීම සිදු කරනු ලබන්නේ නම්, වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට ණය උපකරණ ගණනය කරනු ලබයි.

ඉහත විස්තර පිටු අංක 194 සිට 197 දක්වා සටහන් අංක 23 මගින් දැක්වේ.

(ආ) වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට නියම කරන ලද හිමිකම් උපකරණ

මූලික හඳුනාගැනීමේදී වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කරන ලද හිමිකම් උපකරණ ලෙස උපාය මාර්ගික හා ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා රඳවාගන්නා හිමිකම් ආයෝජන අතරින් ඇතැම්වා යළි වෙනස් නොකළ හැකි සේ වර්ගීකරණය කිරීමට සමූහය තීරණය කරනු ලබයි.

ඉහත විස්තර පිටු අංක 194 සිට 197 දක්වා සටහන් අංක 23 හි දැක්වේ.

2.5.1.4.5 ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම්

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ට අනුව ක්‍රමක්ෂය පිරිවැයට හෝ වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් හැර අනෙකුත් සියලු මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට දක්වනු ලබයි.

කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහ රැස්කිරීමට හෝ මූල්‍ය වත්කම් විකිණීම සඳහා යන කරුණු හේතුවෙන් රඳවා නොගන්නා බැවින් සාධාරණ අගය යන පදනම මත අගයනු ලබන වෙළඳාම සඳහා රඳවාගන්නා හෝ කළමනාකරණය කරන මූල්‍ය වත්කම් ලාභය/අලාභය මගින් සාධාරණ අගයට මූලිකව හඳුනාගැනීමෙන් නියම කරන ලද මූල්‍ය වත්කම් පහත සාකච්ඡාවට භාජනය කර ඇත.

(අ) ලාභය/අලාභය මගින් සාධාරණ අගයට නියම කරන ලද මූල්‍ය වත්කම්

ලාභය/අලාභය මගින් සාධාරණ අගයට නියම කරනු ලබන මූල්‍ය වත්කම්, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට වාර්තා කරනු ලබයි. සාධාරණ අගයෙහි වෙනස්කම්, "ලාභය/අලාභය හරහා සාධාරණ අගයට නියම කරනු ලබන මූල්‍ය වත්කම් සහ වගකීම් මත ශුද්ධ ලැබීම් හෝ අලාභයන්හි" වාර්තා කරනු ලබයි. උපයනු ලබන පොළිය සඵල පොළී අනුපාත උපයෝගී කර ගනිමින් "පොළී ආදායම්" හි උපචිත වන අතර මුදල ලැබීමේ අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම "වෙනත් මෙහෙයුම් ආදායම්හි" වාර්තා කෙරෙයි.

කාලපරිච්ඡේදය අවසානයේදී ලාභය/අලාභය මගින් සාධාරණ අගයට ගණනය කිරීමේදී මූලිකව හඳුනාගනු ලබන නියම කරන ලද මූල්‍ය වත්කම් සමූහය සතුව නැත.

2.5.1.5 මූල්‍ය වගකීම් වර්ගීකරණය සහ පසුව මිනීම

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ප්‍රකාර මූල්‍ය ඇප සහ ණය බැඳීම් හැරුණු විට අනෙක් මූල්‍ය වගකීම්, සමූහය විසින් පහත කාණ්ඩ අතුරින් එකකට වර්ගීකරණය කෙරෙයි.

- ලාභ/අලාභ මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වගකීම්
  - වෙළඳාම සඳහා රඳවාගත්
  - ලාභ/අලාභ මගින් සාධාරණ අගයට නම්කළ
- ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම්හි පසු කාලීන මිණුම් ඒවායෙහි වර්ගීකරණය මත පදනම් වේ. මූල්‍ය වර්ගීකරණයෙහි ලා පැවති ශ්‍රී ල.ගි.ප්‍ර. 39 නිර්නායක බොහොමයක් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේ ද පවතී.

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

2.5.1.5.1 ලාභය/අලාභය මගින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වගකීම්

වාර්තාකරන කාලය අවසානයේදී ලාභ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ කිසිම මූල්‍ය වගකීමක් සමූහය සතුව නැත.

2.5.1.5.2 ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කළ මූල්‍ය වගකීම්

සමූහය විසින් එළඹ ඇති ගිවිසුම්වලට අනුව, දරා සිටින්නාට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් භාරදීමට බැඳියාවක් පවතින විට හෝ බැඳියාවක් පියවීම සඳහා නිශ්චිත හිමිකම් කොටස් සංඛ්‍යාවක් නිශ්චිත මුදලකට හෝ නිශ්චිත වෙනත් මූල්‍ය වත්කම් අගයකට හුවමාරු වන අවස්ථාවක් හැරුණුවිට, සමූහය විසින් නිකුත් කරන ලද ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් නොකළ මූල්‍ය වගකීම්, "බැංකු වලට ගෙවියයුතු", "වෙනත් තැන්පත්කරුවන්ට ගෙවිය යුතු", "ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු" හෝ "නිකුත් කළ ණය සුරැකුම්පත්" මෙම වර්ගීකරණයට අයත්ය.

උපකරණයේ ගිවිසුම්ගත කොන්දේසි ප්‍රකාර සමූහය විසින් ප්‍රධාන උපකරණ මූල්‍ය වගකීම් හෝ හිමිකම් උපකරණ ලෙස වර්ගීකරණය කෙරෙයි.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, සඵල පොළී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් එම මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. අත්පත් කර ගැනීමට අදාළ වට්ටම් හෝ අධි මිල සහ සඵල පොළී අනුපාතිකයෙහි අත්‍යන්ත කොටසක් වන ගාස්තු හා පිරිවැය ද සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබයි. සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂයවීම් ආදායම් ප්‍රකාශයෙහි "පොළී වියදම්" යටතේ හඳුනා ගනී. සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය ක්‍රියාවලිය හරහා වගකීම් හඳුනා ගැනීම අත්හරින විට ලාභ හා අලාභ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

(අ) බැංකු වලට ගෙවිය යුතු

බැංකු වලට ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 213 හි සටහන් අංක 32 මගින් දැක්වේ.

(ආ) තැන්පත්කරුවන්ට ගෙවිය යුතු

තැන්පත්කරුවන්ට ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 214 හි සටහන් අංක 35 මගින් දැක්වේ.

(ඇ) ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු

ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 214 හි සටහන් අංක 35 මගින් දැක්වේ.

(ඈ) වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු

වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු පිළිබඳ විස්තර පිටු අංක 214 හි සටහන් අංක 35 මගින් දැක්වේ.

(ඉ) නිකුත් කළ ණය සුරැකුම්පත්

නිකුත් කළ ණය සුරැකුම්පත් පිළිබඳ විස්තර පිටු අංක 216 හි සටහන් අංක 37 මගින් දැක්වේ.

2.5.1.6 ව්‍යුත්පන්න වත්කම් සහ වගකීම්

ව්‍යුත්පන්න වත්කම් සහ වගකීම් මූලික වශයෙන් ලාභය/අලාභය මගින් සාධාරණ අගයට වාර්තාකරණ ලද ව්‍යුත්පන්න සහ අවදානම් කළමනාකරණ අරමුණු සඳහා රඳවාගත් ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කෙරෙයි.

2.5.1.6.1 ලාභ/අලාභ මගින් සාධාරණ අගයට වාර්තා කළ ව්‍යුත්පන්න

ව්‍යුත්පන්න වූ කලී පහත සඳහන් ගුණාංග තුනෙන්ම සමන්විත මූල්‍ය උපකරණයක් හෝ වෙනත් ගිවිසුමකි.

- මූල්‍ය නොවන විචල්‍ය අතින් ගිවිසුමෙහි පාර්ශ්වයකට එය සීමා නොවේ නම්, නිශ්චිත පොළී අනුපාත, මූල්‍ය උපකරණ මිළ, වෙළෙඳ ද්‍රව්‍ය මිල, විදේශ විනිමය අනුපාත, මිල හෝ අනුපාත දර්ශක, ණය ශ්‍රේණිගත කිරීම් හෝ ණය දර්ශක හෝ වෙනත් විචල්‍ය වල වෙනස්කම්වලට ප්‍රතිචාර ලෙස එහි අගය වෙනස් වෙයි.
- ඊට මූලික ශුද්ධ ආයෝජන හෝ වෙළෙඳපළ සාධක වල වෙනස්වීම්වලට සමාන ප්‍රතිචාර දැක්වීමට අපේක්ෂිත වෙනත් ගිවිසුම් වර්ගවලට අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු මූලික ශුද්ධ ආයෝජන අවශ්‍ය නොවේ.
- එය ඉදිරි දිනයකදී පියවනු ලැබේ.

බැංකුව විවිධ පාර්ශ්ව සමග ව්‍යුත්පන්න ගනුදෙනුවලට එළඹෙයි. පොළී අනුපාත හුවමාරු, ණය පැහැර හැරීම් හුවමාරු, විවිධ විනිමය හුවමාරු, ඉදිරි විදේශ හුවමාරු ගිවිසුම් සහ විදේශ ව්‍යවහාර මුදල් ඊට ඇතුළත්ය. ව්‍යුත්පන්න සාධාරණ අගයට වාර්තා කරන අතර එම අගය ධන වන විට වත්කම් ලෙස සලකන අතර, සාධාරණ අගය සෘණ වන විට වගකීම් ගණයෙහිලා සැලකෙයි. එවන් ව්‍යුත්පන්නවල සාධාරණ අගය සහ නාමික අගය සටහන් අංක 19 හි වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත. ඉදිරි ගිවිසුම් ගිණුම්කරණය අදාළ කර නොගන්නේ නම් ව්‍යුත්පන්න වල සාධාරණ අගයෙහි වෙනස්වීම්, ශුද්ධ වෙළෙඳ ආදායම් හි ඇතුළත් කෙරෙයි. ඉදිරි ගිවිසුම් ගිණුම්කරණ හෙළිදරව් කිරීම් පිටු අංක 178 - 179 දක්වා සටහන් අංක 19 හි දක්වා ඇත.

2.5.1.6.2 අවදානම් කළමනාකරණ අරමුණු සහ ඉදිරි ගිවිසුම් ගිණුම්කරණය සඳහා රඳවාගන්නා ව්‍යුත්පන්න

වෙළෙඳ වත්කම් හා වගකීම් ලෙස වර්ගීකරණය නොකළ සියලු ව්‍යුත්පන්න වත්කම් හා වගකීම්, අවදානම් කළමනාකරණ අරමුණු සඳහා රඳවා ගන්නා ව්‍යුත්පන්න වලට අයත්වේ. අවදානම් කළමනාකරණ අරමුණු සඳහා රඳවා ගන්නා ව්‍යුත්පන්න මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට මනිනු ලබයි.

2.5.1.6.2.1 සාධාරණ අගයෙහි ඉදිරි ගිවිසුම්

ලාභයට/අලාභයට බලපෑම් ඇති කරලිය හැකි බැඳීමක හෝ යම් වත්කමක හෝ වගකීමක සාධාරණ අගය වෙනස්වීමෙහි ඉදිරි ගිවිසුමක ඉදිරි ගිවිසුම් උපකරණ ලෙස ව්‍යුත්පන්න නියම කර ඇති විට එකී ව්‍යුත්පන්වල සාධාරණ අගයෙහි වෙනස්කම් ඉදිරි ගිවිසුම් අවදානමට දායක විය හැකි ඉදිරි ගිවිසුම් අයිතම ලෙස වහාම හඳුනා ගනු ලැබෙයි.

ඉදිරි ගිවිසුම් ව්‍යත්පන්න කල්පිරී හෝ විකුණා අවසන් කර හෝ ක්‍රියාත්මක කර ඇති විට හෝ සාධාරණ අගයන් ඉදිරි ගිවිසුම් ගිණුම්කරණ සඳහා වන නිර්නායක සඳහා ඉදිරි ගිවිසුම තවදුරටත් අදාළ නොවන විට හෝ ඉදිරි ගිවිසුම් නියම කිරීම් අවලංගු කර ඇති විටක ඉදිරි ගිවිසුම් ගිණුම්කරණය නවතාලනු ලැබේ. කෙසේ වුවද නීති රෙගුලාසි හේතු මත නවීකරණය සඳහා අවශ්‍ය කොන්දේසි හැර සෙසු වෙනස්වීම් නොමැතිව දෙපාර්ශ්වයම මගින් පොදු පාර්ශ්වයන් සඳහා ව්‍යුත්පන්න නවීකරණය කෙරෙයි නම්, එබඳු ව්‍යුත්පන්න කල් ඉකුත්වී හෝ අවසන් වී ඇතැයි නොසැලකේ.

සඵල පොළී ක්‍රමවේද උපයෝගී කරගනු ලබන ඉදිරි ගිවිසුම්ගත අයිතමයක් ඉදිරියට පවත්වා නොගැනීමේ සීමාව දක්වා සිදු කරනු ලබන ගැලපීම් ක්‍රමක්ෂය ලාභ/අලාභ ලෙස ගනු ලබන අතර අයිතමයන් එහි අවශේෂ ජීව කාලය සඳහා සඵල පොළී අනුපාතය යළි ගණනය කෙරෙයි. වාර්තා කරන කාලසීමාව අවසානය වනවිට, සමූහය සතුව කිසිදු සාධාරණ අගයෙහි ඉදිරි ගිවිසුමක් නොමැත.

2.5.1.6.2.2 මුදල් ප්‍රවාහ ඉදිරි ගිවිසුම්

ලාභය/අලාභයට බලපෑ හැකි හඳුනාගනු ලැබූ වත්කම්/වගකීම් ආශ්‍රිත එක්තරා අවදානමකට හේතුවිය හැකි මුදල් ප්‍රමාණවල ඉදිරි ගිවිසුම් විචල්‍යතාව සම්බන්ධ ඉදිරි ගිවිසුම් උපකරණ ලෙස ව්‍යුත්පන්න නියම කළ විට ව්‍යුත්පන්න වල සාධාරණ අගයන්වල සඵලදායී කොටසක් වෙනත් විස්තීර්ණ ආදායම් හි හඳුනාගනු ලබන අතර හිමිකම් තුළ ඉදිරි ගිවිසුම් සංචිතයෙහි ඉදිරිපත් කෙරෙයි. ව්‍යුත්පන්න වල සාධාරණ අගයන් හි වෙනස්වීම් වල සඵලදායී නොවන කොටස් එවෙලෙහිම ලාභ/අලාභ තුළ හඳුනා ගැනෙයි.

වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනා ගැනෙන අගය, එකම කාලසීමාව තුළ ලාභයට/අලාභයට බලපාන මුදල් ප්‍රවාහ ඉදිරි ගිවිසුම් ලෙස වෙනත් විස්තීර්ණ ආදායම් හා ලාභය/අලාභය පිළිබඳ ප්‍රකාශයෙහි ආශ්‍රිත අයිතමයක් ලෙස නැවත වර්ගීකරණය ගැලපුම් වශයෙන් ලාභයට/අලාභයට නැවත වර්ගීකරණය කෙරෙයි.

ඉදිරි ගිවිසුම් ව්‍යුත්පන්න කල් ඉකුත් වී හෝ විකුණා අවසන් කර හෝ ක්‍රියාත්මක කර ඇත්නම් හෝ මුදල් ප්‍රවාහ ඉදිරි ගිවිසුම් ගිණුම්කරණය සඳහා වන නිර්නායක සඳහා ඉදිරි ගිවිසුම් තවදුරටත් අදාළ නොවන විට හෝ ඉදිරි ගිවිසුම් නියම කිරීම් අවලංගු කර ඇති විටක ඉදිරි ගිවිසුම් ගිණුම්කරණය නවතාලනු ලැබේ. කෙසේ වුවද නීතිමය/රෙගුලාසිමය හේතු මත නවීකරණය සඳහා අවශ්‍ය කොන්දේසි හැර සෙසු වෙනස්වීම් නොමැතිව ඉදපාර්ශවයම මගින් පොදු ප්‍රතිපාර්ශ්වයකට ව්‍යුත්පන්න නවීකරණය කෙරෙයි නම්, එවිට ව්‍යුත්පන්න කල් ඉකුත්වී/අවසන් වී ඇතැයි නොසැලකේ. වාර්තාකරන කාලපරිච්ඡේදය අවසන් වන විට සමූහය සතුව කිසිදු මුදල් ප්‍රවාහ ඉදිරි ගිවිසුමක් නොමැත.

2.5.1.6.3 බද්ධ ව්‍යුත්පන්න

බද්ධ ව්‍යුත්පන්න වූ කලී තනි ව්‍යුත්පන්නකට එක් අයුරකින් සමාන සංයුක්ත උපකරණයක මුදල් ප්‍රවාහවල වෙනස්වීම් සහිත ගිවිසුම්, ව්‍යුත්පන්න නොවන දෙමුහුන් උපකරණයක කොටසකි. වෙනත් අවස්ථාවකදි මූල්‍ය නොවන විචල්‍ය සම්බන්ධයෙන් නම්, නිශ්චිත පොළී අනුපාතිකයකට, මූල්‍ය උපකරණ මිලකට, පාරිභෝගික මිලකට, විදේශ විනිමය අනුපාතිකයකට, මිල හෝ අනුපාත දර්ශකයකට, ණය ශ්‍රේණිගත කිරිමට/ණය දර්ශකය හෝ වෙනත් විචල්‍ය මත ගිවිසුම් මගින් නවීකරණය විය යුතුව තිබූ මුදල් ප්‍රවාහ සියල්ල හෝ ඇතැම් වා ගිවිසුමෙහි එක් පාර්ශ්වයකට විශේෂ නොවන ලෙස තැබීමට බද්ධ ව්‍යුත්පන්න ඉවහල් වේ. මූල්‍ය උපකරණයකට සම්බන්ධ නමුත් ගිවිසුම් අනුව එකී උපකරණයක් ස්වාධීනව මාරු කළ හැකි හෝ එකී උපකරණයක් වෙනස් ප්‍රතිපාර්ශ්වයක් සහිත නම් එය වෙනත් මූල්‍ය උපකරණයක් විනා බද්ධ ව්‍යුත්පන්නයක් නොවේ.

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ට අනුව ව්‍යුත්පන්න, වෙනත් ගිවිසුමක් හා බද්ධ වී තිබිය හැකිය. පහත පරිදි වේ නම්, මූල්‍ය වගකීම් සහ මූල්‍ය නොවන ධාරක ගිවිසුම්වල බද්ධ ව්‍යුත්පන්න වෙන් වෙන් ව්‍යුත්පන්න ලෙස සමූහය විසින් සලකනු ලබයි.

- ධාරක ගිවිසුම, ලාභ/අලාභ මගින් සාධාරණ අගයට නොපැවතීම
- වෙනම ගිවිසුමක රඳවා තිබුනේ නම්, බද්ධ ව්‍යුත්පන්නයක කොන්දේසි, ව්‍යුත්පන්න නිර්නායක වලට සරිලනු ඇත.
- බද්ධ ව්‍යුත්පන්නයක ආර්ථික ගුණාංග හා අවදානම් ධාරක ගිවිසුමෙහි ආර්ථික ගුණාංග හා අවදානම්වලට සමීප සම්බන්ධයක් නොපවතී.

වාර්තා කරනු ලබන දිනට සමූහයට බද්ධ ව්‍යුත්පන්න නොපවතී.

2.5.1.7 මූල්‍ය වත්කම් හා වගකීම් නැවත වර්ගීකරණය

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ට අනුව මූල්‍ය වත්කම් ඒවායේ මූලික හඳුනාගැනීමෙන් අනතුරුව අත්පත් කර ගැනීම, ඉවතලීම හෝ ව්‍යාපාරික ක්‍රියාදාමයක් නැවතීම යනාදිය ඇතුළත්ව එවන් මූල්‍ය වත්කම් කළමනාකරණය කිරිම සඳහා ව්‍යාපාරික ආකෘතියක අරමුණ සමූහය විසින් වෙනස් කරනු ලබන දුර්ලභ අවස්ථාවලදී පමණක් හැර ඒවායේ මූලික හඳුනාගැනීමට පසුව නැවත වර්ගීකරණය නොකෙරෙයි.

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ප්‍රකාර නැවත වර්ගීකරණය කිරීම්වලට අවසර නොමැති හෙයින් මූල්‍ය වගකීම් නැවත වර්ගීකරණය නොකෙරෙයි.

2.5.1.7.1 මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණ මිනීම

2.5.1.7.1.1 ලාභ/අලාභ මගින් සාධාරණ අගයට මූල්‍ය උපකරණ නැවත වර්ගීකරණ

- **වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගය**
  නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගය නව දළ ධාරණ අගය බවට පත් වෙයි. නව දළ ධාරණ අගය මත පදනම්ව සඵල පොළී අනුපාතිකය ගණනය කෙරෙයි. සාධාරණ අගයෙහි පසුකාලීන වෙනස්කම් වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනාගනු ලැබෙයි.
- **ක්‍රමක්ෂය පිරිවැය**
  නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගය නව ධාරණ අගය බවට පත් වෙයි. නව දළ ධාරණ අගය මත පදනම්ව සඵල පොළී අනුපාතිකය ගණනය කෙරෙයි.

2.5.1.7.1.2 වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මූල්‍ය උපකරණ නැවත වර්ගීකරණය

- **ලාභ/අලාභ මගින් සාධාරණ අගය**
  වෙනත් විස්තීර්ණ ආදායම්හි සමුච්චිත ශේෂය, නැවත වර්ගීකරණ දිනට ලාභයට/අලාභයට නැවත වර්ගීකරණය කෙරෙයි.
- **ක්‍රමක්ෂය පිරිවැය**
  මූල්‍ය වත්කම්, සාධාරණ අගයට නැවත වර්ගීකරණ කරයි. වෙනත් විස්තීර්ණ ආදායම් හි සමුච්චිත ශේෂය, ඉවත් කර නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගයට ගැලපීම් කරයි. ගලපන ලද අගය, ක්‍රමක්ෂය පිරිවැය බවට පත් වෙයි.

මූලික හඳුනාගැනීමේදී තීරණය කරන ලද සඵල පොළී අනුපාතිකය හා දළ ධාරණ අගය, නැවත වර්ගීකරණ ප්‍රතිඵල ලෙස ගලපනු නොලබයි.

2.5.1.7.1.3 ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය උපකරණ නැවත වර්ගීකරණය

- **වෙනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගය**
  වත්කම සාධාරණ අගයට යළි මනිනු ලබන අතර වෙනස වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනාගනු ලබයි. මූලික හඳුනාගැනීමේදී තීරණය කරනු ලබන සඵල පොළී අනුපාතික, නැවත වර්ගීකරණයෙහි ප්‍රතිඵල ලෙස සලකනු නොලබයි.
- **ලාභ/අලාභ මගින් සාධාරණ අගය**
  නැවත වර්ගීකරණ දිනට සාධාරණ අගය නව ධාරණ අගය බවට පත් වෙයි. ක්‍රමක්ෂය පිරිවැය සහ ධාරණ අගය අතර වෙනස ලාභ සහ අලාභ ලෙස හඳුනාගනු ලැබෙයි.

වාර්තා කරනු ලබන කාලසීමාව සඳහා බැංකුව හා සමූහය විසින් කිසිදු මූල්‍යමය උපකරණ නැවත වර්ගීකරණය කිරීමක් සිදු නොවිණි.

2.5.1.8 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනා නොගැනීම

2.5.1.8.1 මූල්‍ය වත්කම්

වත්කම මගින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය ඉකුත්වී ඇති විට හෝ වත්කම වෙතින් මුදල් ප්‍රවාහ ලැබිමේ අයිතිය සමූහය විසින් වෙනත් පාර්ශ්වයකට පවරා ඇති විට හෝ වත්කමෙහි සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් සැලකියයුතු මට්ටමකට වෙනත් පාර්ශ්වයකට පවරා හෝ සමූහය විසින් වත්කමට අදාළ සියලුම අවදානම් හා ලාභ සැලකියයුතු මට්ටමකට රඳවාගෙන පවරා නොමැති මුත් වත්කමෙහි පාලනය පවරා ඇති විට, සමූහය විසින් මූල්‍ය වත්කමක් (හෝ අදාළ අවස්ථාවලදී මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනා ගනු නොලබයි.

මූල්‍ය වත්කම් හඳුනා නොගැනීම තුළ වත්කමක ධාරණ අගය (වත්කමක හඳුනා ගනු නොලබන කොටසට වෙන් කරන ලද ධාරණ අගය) සහ ලද මුදල්වල (ලද නව වත්කම් අඩු කිරීම නව වගකීම් ඇතුළත්ව) වෙනස සහ වෙනත්

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

විස්තීර්ණ ආදායමෙහි හඳුනා ගන්නා ලද සමුච්චිත ලැබීම්/අලාභ, ලාභයට/අලාභයට හඳුනාගනු ලබයි.

කෙසේ වුවද ධාරණ අගයට වෙනස් විස්තීරණ ආදායම් හි නියම කරන ලද හිමිකම් ආයෝජන සුරැකුම් සම්බන්ධයෙන් වෙනත් විස්තීරණ ආදායම් හි හඳුනාගනු ලබන සමුච්චිත ලැබීම්/අලාභ, ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 අනුව එවන් සුරැකුම් හඳුනා ගැනීම මත ලාභයට/අලාභයට හඳුනාගනු නොලබයි. සමූහය විසින් ජනිත/රඳවාගනු ලැබූ මාරු කරන ලද මූල්‍ය වත්කම්වල පොලිය හඳුනාගනු නොලැබීමට හසු වන අතර වෙනත් වත්කමක්/වගකීමක් ලෙස හඳුනාගනු ලැබෙයි.

මූල්‍ය තත්වය පිළිබඳ වත්කම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති වත්කම් මාරු කරනු ලබන ගනුදෙනුවලට සමූහය ඇතුළත් වන නමුත් මාරු කරන ලද වත්කම්වල සියලු අවදානම් සහ ප්‍රතිලාභ සියල්ල හෝ සැලකිය යුතු ප්‍රමාණයක් හෝ කොටසක් රඳවා ගනු ලබයි.

එවන් අවස්ථාවලදී මාරු කරන ලද වත්කම් හඳුනා ගනු නොලබයි. මාරු කරන ලද වත්කම් මත සංගාමී මුළු ඉදිරි ගිවිසුම්වල සීඝ්‍රතාව සමග වත්කම් නොවන පාර්ශ්වයකට විකුණූ විට සමූහය විසින් එවන් වත්කම්වල සියලු අවදානම් හා ප්‍රතිලාභ හිමිකම් සියල්ල හෝ සැලකිය යුතු ප්‍රමාණයක් රඳවා ගන්නා හෙයින් විකුණුම් හා ප්‍රතිවිකුණුම් ගනුදෙනුවලට සමාන සුරක්ෂිත මූල්‍ය ගනුදෙනුවක් ලෙස එකී ගනුදෙනුව සලකනු ලබයි.

වත්කම මගින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය සමූහය විසින් වෙනත් පාර්ශ්වයකට පවරා ඇති විට හෝ මුදල් ප්‍රවාහ මුළුමනින්ම තෙවන පාර්ශ්වයකට ගෙවීමට බැඳීමක් ඇති කරගත් විට සමූහය විසින් වත්කම්ට අදාළ සියලුම අවදානම් හා ලාභ සැලකිය යුතු මට්ටමකට රඳවාගෙන හෝ පවරා නොමැති මුත් වත්කමෙහි පාලනය පවරා ඇති විට වත්කමෙහි කටයුතු සම්බන්ධයෙන් සමූහයේ සහභාගීත්වයේ ප්‍රමාණය අනුව අදාළ වත්කම හඳුනාගනු ලබයි. එබඳු අවස්ථාවලදී සමූහය විසින් ආශ්‍රිත වගකීමක් ද හඳුනාගනු ලබයි. සමූහය විසින් රඳවාගනු ලැබූ අයිතීන් හා වගකීම් පිළිබිඹු වන ආකාරයට පවරන ලද වත්කම් හා ආශ්‍රිත වගකීම් මනිනු ලබයි.

2.5.1.8.2 මූල්‍ය වගකීම්

වගකීම් යටතට ගැනෙන ගිවිසුම්ගත බැඳියාව ඉකුත් වී හෝ අවලංගු වී හෝ නිදහස් කර ඇති විට මූල්‍ය වගකීම හඳුනාගැනීම සමූහය විසින් අත් හරිනු ලබයි.

2.5.1.9 මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් නවීකරණය

2.5.1.9.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම් පිළිබඳ කොන්දේසි නවීකරණය කෙරෙයි නම්, නවීකරණය කරන ලද වත්කම්වල මූල්‍ය ප්‍රවාහ සැලකිය යුතු ලෙස වෙනස් වන්නේදැයි සමූහය ඇගයීමට ලක් කරයි. මුදල් ප්‍රවාහ සැලකිය යුතු ලෙස වෙනස් වන්නේ නම්, මුල් මූල්‍ය වත්කමෙහි සිට මුදල් ප්‍රවාහවලට ඇති ගිවිසුම්ගත අයිතීන් කල් ඉකුත් වී ඇති බවට සැලකෙයි. මෙහිදී හඳුනාගත් මුල් මූල්‍ය වත්කම් ඉවත් කර නව මූල්‍ය වත්කමක් සාධාරණ අගයට හඳුනාගනු ලබයි.

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 ට අනුව, ක්‍රමක්ෂය පිරිවැයට පවතින නවීකරණය වූ වත්කම්වල මූල්‍ය ප්‍රවාහ සැලකිය යුතු ලෙස වෙනස් නොවේ නම්, එකී නවීකරණය, හඳුනාගත් මූල්‍ය වත්කම් ඉවත් කිරීමකට තුඩු නොදෙයි.

මේ අවස්ථාවේදී මූල්‍ය වත්කම් දළ ධාරණ අගයට, සමූහය විසින් නැවත ගණනය කර එම දළ ධාරණ අගය ගැලපීම තුළින් ඇති වන ලාභය/අලාභය නවීකරණ ලාභය/අලාභය ලෙස ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී. ණයකරුගේ මූල්‍ය අපහසුතා හේතුවෙන් එවන් නවීකරණය කිරීමක් සිදුවන්නේ නම්, අදාළ ලාභය/අලාභය හානිකරණ පාඩු සමගින් ඉදිරිපත් කෙරෙයි. අනෙක් අවස්ථාවන්හිදී එය පොළී ආදායමක් ලෙස ඉදිරිපත් කෙරෙයි.

2.5.1.9.2 මූල්‍ය වගකීම්

පවතින මූල්‍ය වගකීමක් එකී ණයකරුගේම වෙනත් මූල්‍ය වගකීමකින් ආදේශ වන විට, පවත්නා කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් වන්නේ නම් සහ පවතින වගකීමක කොන්දේසි සැලකියයුතු ලෙස නවීකරණය වන්නේ නම්, එවන් හුවමාරු කිරීමක්/නවීකරණය කිරීමක් මුල් වගකීමෙහි ඉවත් කිරීමක් සිදුවන අතර එය නව වගකීමක් ලෙස හඳුනා ගැනෙයි. මෙහිදී නවීකරණය වූ කොන්දේසි මත පදනම් වූ නව මූල්‍ය වගකීමක් සාධාරණ අගයට හඳුනාගනු ලබයි. ඉවත් වූ මූල්‍ය වගකීමෙහි සහ නවීකරණය වූ කොන්දේසි සහිත නව මූල්‍ය වගකීමෙහි ධාරණ අගයෙහි වෙනස ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලබයි.

2.5.1.10 මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනාගනු ලැබූ අගයන් හිලව් කිරීමට දැනට ක්‍රියාත්මක කළහැකි නීතිමය අයිතියක් වේ නම් පමණක් සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එකවර වත්කම් උපලබ්ධිවීමට හෝ වගකීම් පියවීමට අරමුණක් වේ නම්, මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කෙරෙයි. බැංකුව හා සමූහය විසින් වාර්තා කරනු ලබන කාලසීමාව තුළ කිසිදු මූල්‍ය උපකරණ හිලව් කිරීමක් සිදු නොකෙරිණි.

2.5.1.11 ක්‍රමක්ෂය පිරිවැය සහ දළ ධාරණ අගය

මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වගකීමක ක්‍රමක්ෂය පිරිවැය යනු මූලික හඳුනාගැනීමේ පිරිවැයෙන් මුල් ආපසු ගෙවීම් අඩුකර, මූලික අගය හා කල් පිරුණු අගය අතර වෙනස සඵල පොළී අනුපාත ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් ගණනය කළ සමුච්චිත ක්‍රමක්ෂය එකතුකර හෝ අඩුකර මනිනු ලබන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල අගයයි. මූල්‍ය වත්කම්වලට අපේක්ෂිත ණය පාඩු දීමනා ද ගලපනු ලබයි.

මූල්‍ය වත්කමක දළ ධාරණ අගය වූ කලී, කිසියම් අපේක්ෂිත ණය පාඩු දීමනාවක් සඳහා ගැලපීමට ප්‍රථම මූල්‍ය වත්කමක ක්‍රමක්ෂය පිරිවැයයි.

2.5.1.12 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

සාධාරණ අගයෙහි ධූරාවලිය ඇතුළත්ව මූල්‍ය උපකරණවල සාධාරණ අගය මිනීම පිළිබඳ අංක 148 හා 277 යන පිටුවල සටහන් අංක 2.3 හි හා 56 හි දක්වා ඇත.

2.5.2 මූල්‍ය වත්කම් හානිකරණය

2.5.2.1 හානිකරණයෙහි කේවල තක්සේරුව

පෙර තීරණය කරන ලද සීමාවකට (වෙන් වෙන් වශයෙන් ගත්විට වැදගත් වන මූල්‍ය වත්කම්) වඩා ඉහළ මූල්‍ය වත්කම් සඳහා හානිකරණ පාඩුවක් සිදුවී ඇති බවට විෂයානුබද්ධ සාක්ෂි පවතී නම්, වත්කමෙහි ධාරණ අගය සහ අනාගත මුදල් ප්‍රවාහ (අනාගත අපේක්ෂිත ණය පාඩු ඉවත් කළ විට) වල තක්සේරුගත වත්මන් අගය අතර වෙනස, අලාභ අගය ලෙස මනිනු ලබයි.

සුරැකුම් ලෙස තබා ඇති මූල්‍ය වත්කම්වල තක්සේරුගත ඉදිරි මුදල් ප්‍රවාහවල වත්මන් අගය ගණනය කිරීම මගින් පූර්වාවරණය කිරීම හෝ නොකිරීම කෙසේ වුවද වත්කම අත්පත් කර ගැනීම හා විකිණීම සඳහා වන පිරිවැය අඩුකර පූර්වාවරණය කිරීමේ ප්‍රතිඵල ලෙස ඇති වන මුදල් ප්‍රවාහ පිළිඹිබු වේ. පිටු අංක 185 හි ඇති සටහන් අංක 21 (ඇ) මගින් කේවල හානිකරණ තක්සේරුව පිළිබඳ විස්තර දැක්වේ.

2.5.2.2 වෙන් වෙන්ව ගත් විට සැලකිය යුතු වෙන් වෙන්ව හානිකරණය නොවූ ණය

අපහානය නොවූ නමුත් වෙන් වෙන්ව ගත් විට සැලකිය යුතු ණය ආරම්භයේ පටන් සැලකිය යුතු ණය ක්ෂයවීම් තිබී ඇත්දැයි යන නිර්ණායක මත පදනම්ව 1 වන හෝ 2 වන අදියර යටතේ හානිකරණය සඳහා සාමූහිකව අගයනු ලබයි.

බැංකුවේ සැලකියයුතු ණය අපහායනයන් සනිටුහන් කර ගැනීමේදී පහත නිර්ණායක සලකා බලනු ලබයි.

- දැනට පවතින මූල්‍ය උපකරණවලට අදාළ කොන්දේසි හෝ අනුපාතිකවල මූලාරම්භයට වඩා ඇති සැලකිය යුතු උපකරණ වෙනස්කම්
- විශේෂිත මූල්‍ය උපකරණ හෝ සමාන මූල්‍ය උපකරණවල ණය අවදානම පිළිබඳ බාහිර වෙළඳපොළ දර්ශකවල සැලකියයුතු වෙනස්කම්
- ණයකරුවෙකුගේ ණය/හිමිකම් කොටස් උපකරණවල අගයෙහි වෙනස්කම් ආදී ණයකරුට සම්බන්ධ වෙනත් තොරතුරු
- ණයකරු සඳහා සත්‍ය/අපේක්ෂිත අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම හෝ අභ්‍යන්තර වශයෙන් ණය අවදානම ඇගයීමට යොදා ගනු ලබන චර්යාත්මක ලකුණුවල පහත වැටීම.
- ණයකරුවෙකුට සිය බැඳියාවන් පියවීමට ඇති හැකියාවට සැලකිය යුතු බලපෑම් සිදු කරන දැනට පවතින හෝ ඉදිරියට පුරෝකථනය කළ අහිතකර ව්‍යාපාරික වෙනස්වීම්, මූල්‍ය හෝ ආර්ථික තත්ත්වයන්.
- ආදායමෙහි තත්‍ය හෝ අපේක්ෂිත අඩුවීම, මෙහෙයුම් අවදානම ඉහළයාම, කාරක ප්‍රාග්ධන හිඟය, වත්කමෙහි ගුණාත්මක බව අඩුවීම, තෝලනය ඉහළ යාම, ද්‍රවශීල කළමනාකාරීත්වයට අදාළ ගැටළු නිසා ණයකරුගේ මෙහෙයුම් ප්‍රතිඵල වල සත්‍ය හෝ අපේක්ෂිත සැලකිය යුතු වෙනස්වීම්
- එකම ණයකරුගේ වෙනත් මූල්‍ය උපකරණ මත ණය අවදානම සැලකියයුතු ලෙස වර්ධනය වීම.
- ණය බැඳීම්වලට මුහුණදීමට ණයකරුවෙකු සතු හැකියාවෙහි සැලකිය යුතු වෙනස්වීම්වලට තුඩු දෙන ණයකරුගේ නියාමන, ආර්ථික හෝ තාක්ෂණික පරිසරයෙහි සිදුවන සත්‍ය හෝ අපේක්ෂිත සැලකිය යුතු අහිතකර වෙනස්වීම්

2.5.2.3 අපේක්ෂිත ණය පාඩු ප්‍රතිපත්තිය

2018 ජනවාරි 01 දින සිට ලාභ/අලාභ මගින් සාධාරණ අගයට රඳවා නොගත් වෙනත් මූල්‍ය වත්කම් හා සියලුම ණය සඳහා අපේක්ෂිත ණය පාඩු දීමනා මෙම කොටසෙහි "මූල්‍ය උපකරණ" ලෙස දක්වා ඇති ණය බැඳීම් සහ මූල්‍ය ඇපකර ගිවිසුම් සමගින් බැංකුව විසින් වාර්තා කරනු ලැබ ඇත. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 යටතේ හිමිකම් උපකරණ හානිකරණයට ලක් නොවේ.

ආරම්භයේ පටන් සැලකියයුතු ණය අවදානම් වර්ධනයක් නොමැති විටකදී හැර ණය පාඩු දීමනාව මාස 12 කට අපේක්ෂිත ණය පාඩු ලෙස ගණනය වෙයි. එසේ නොමැති වූ විට වත්කමක ජීවකාලය තුළ පැන නැගීමට ඉඩ ඇති ණය පාඩු මත පදනම්ව අපේක්ෂිත ණය පාඩු දීමනාව තීරණය වෙයි.

ණය අවදානමෙහි සැලකියුතු වර්ධනයක් සිදුවී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා වූ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ පිටු අංක 156 හි සටහන් අංක 2.5.2.7 හි දක්වා ඇත. මාස 12 තුළ අපේක්ෂිත ණය පාඩු යනු වාර්තාකරනු ලබන දිනෙන් මාස 12 ක් තුළ මූල්‍ය උපකරණ මත පැහැර හැරීමේ සිදුවීම් මගින් අපේක්ෂිත ණය පාඩු මගින් නියෝජනය කරනු ලබන ජීවකාල අපේක්ෂිත ණය පාඩුවල කොටසකි.

සලකනු ලබන මූල්‍ය උපකරණ කළඹේ ස්වභාවය මත පදනම්ව ජීවකාල අපේක්ෂිත ණය පාඩු සහ මාස 12 තුළ අපේක්ෂිත ණය පාඩු යන ද්විත්මයටම කේවල පදනම මත හෝ සාමූහික පදනම මත ගණනය කෙරෙයි.

මූල්‍ය උපකරණවල අවශේෂ ජීවකාලය පුරාවට ණය පැහැර හැරීම් සිදුවීමේ අවදානම වෙනස්වීම සලකා බලමින් බැංකුව විසින් සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදීම යම් මූල්‍ය උපකරණයකට ණය අවදානම මූලික හඳුනාගැනීමේ පටන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇතිදැයි ඇගයීමක් කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇත.

එබඳු ක්‍රියාවලි මත පදනම්ව බැංකුව විසින් 1 අදියර, 2 අදියර, 3 අදියර ලෙස ණය කාණ්ඩ ගත කරනු ලබයි.

1 වන අදියර

- ණය පළමුව හඳුනාගනු ලැබූ විට බැංකුව විසින් මාස 12 තුළ අපේක්ෂිත ණය පාඩු මත පදනම් වූ දීමනාවක් හඳුනාගනු ලබයි. ණය අවදානම යහපත් වී ඇති විට සහ 2 වන අදියරෙන් ණය නැවත වර්ගීකරණය කර එම පහසුකම් 1 වන අදියරේ ණය වලට ඇතුළත් කරයි.

2 වන අදියර

- ආරම්භයේ පටන් ණය අවදානමෙහි සැලකිය යුතු වර්ධනයක් පෙන්වනු ලබන විට බැංකුව විසින් ජීවකාල අපේක්ෂිත ණය පාඩු සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. ණය අවදානම යහපත් වී 3 වන අදියරෙන් නැවත වර්ගීකරණය කර ණය පහසුකම් ද 2 වන අදියරේ ණය යටතට අයත් වේ.
- ගනුදෙනුකාර ගිවිසුම්ගත ගෙවීම් සිදුකළ යුතු කාලසීමාව දින 30 ඉක්මවන අවස්ථාවලදී පහත 3 අදියර යටතේ වර්ගීකරණය කර ඇති ණය පහසුකම්වලදී හැර ශ්‍රී ල.මූ.වා.ප්‍ර.9 හි ප්‍රකාශිත උපකල්පනයට යටත්ව ණය පහසුකම් ලබාදෙයි.

3 වන අදියර

- ගනුදෙනුකාර ගිවිසුම්ගත ගෙවීම් සිදු කළයුතු කාලසීමාව දින 90 ඉක්මවන අවස්ථාවලදී ශ්‍රී ල.මූ.වා.ප්‍ර. 9 හි ප්‍රකාශිත උපකල්පනවලට යටත් ණය පහසුකම්
- දෙවරකට වඩා ප්‍රතිව්‍යුහගත කරන ලද සියළු ණය
- සියලුම නැවත සැලසුම් කළ ණය
- ශ්‍රී ලංකා මහ බැංකු නියාමන ප්‍රකාර අක්‍රීය ලෙස වර්ගීකරණය කරන ලද සියලු ණය පහසුකම්/ගනුදෙනුකරුවන්
- ගනුදෙනුකරුවකුගේ හෝ උපකරණයක අවදානම් ශ්‍රේණිගත කිරීම, ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් මගින් B+ දක්වා පහත දැමූ අවස්ථාවලදී සහ/හෝ බැංකුවල අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය මාපාංක 2 කින් පහත දැමූ අවස්ථාවලදී
- ණය පහසුකම්/ගනුදෙනුකාර ණය අවදානම් කැපී පෙනෙන ලෙස වර්ධනය (සටහන් අංක 2.5.2.7 වෙත යොමු වන්න)

මූල්‍ය වත්කම්, උදෙසා මුළු හිඟ මුදල හෝ ඉන් කොටසක් හෝ යළි අයකර ගැනීමට බැංකුව සතු සාධාරණ අපේක්ෂාවන් නොපවතින විටදී මූල්‍ය වත්කම් හි දළ ධාරණ අගය අඩු කෙරෙයි. මෙය මූල්‍ය වත්කම් (අර්ධ වශයෙන්) හඳුනාගැනීම අත්හැරීමක් යැයි සැලකේ.

2.5.2.4 අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම

සඵල පොළී අනුපාතිකයට ආසන්න වට්ටම් අගයක් යොදාගෙන අපේක්ෂිත මුදල් පාඩු මිනීමට බැංකුව විසින් අපේක්ෂිත ණය පාඩු ගණනය කරනු ලබයි. මුදල් හිඟය යනු ගිවිසුම් අනුව ආයතනයකට ගෙවිය යුතු මුදල් ප්‍රවාහ හා ගිවිසුම ප්‍රකාර යම් ආයතනයක් විසින් ලබා ගැනීමට අපේක්ෂිත මුදල් ප්‍රවාහ අතර පරතරයයි.

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීමේ යාන්ත්‍රණය පහත සඳහන් පරිදි සැකෙවින් දක්වා ඇති අතර ප්‍රධාන සාධක පහත පරිදි වේ.

- **පැහැර හැරීමේ සම්භාවිතාවය (PD)**
  මෙය වූ කලී යම් කාලසීමාවක් තුළ ණය ගෙවීම පැහැර හැරීමේ හැකියාව පිළිබඳ ඇස්තමේන්තුවයි. යම් ණය පහසුකමක් මීට පෙර හඳුනාගෙන නොතිබිණි නම් සහ තවමත් කළඹට අයත් නම්, ඇගයීමට බඳුන් වූ කාල පරිච්ඡේදය තුළ නිශ්චිත කාලසීමාවකදී පමණක් පැහැර හැරීම සිදුවිය හැකිය.
- **පැහැර හැරීමට නිරාවරණයවීම (EAD)**
  මෙය වූ කලී ගිවිසුම් මත හෝ වෙනත් හේතූන් මත මුල් මුදල සහ පොළිය ආපසු ගෙවීමද අතපසු වූ ගෙවීම්වල සමුච්චිත පොළිය ද ඇතුළුව වාර්තා කළ දිනට පසුව නිරාවරණයවීම්හි අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් ඉදිරි පැහැර හැරීම් දිනකදී නිරාවරණය වීමේ තක්සේරුවයි.
- **පැහැර හැරීමකදී සිදුවියහැකි පාඩුව (LGD)**
  මෙය වූ කලී යම් අවස්ථාවකදී පැහැර හැරීමක් සිදුවූ විටක උද්ගත වන පාඩුව ඇස්තමේන්තු කිරීමයි. කිසියම් පාර්ශ්වයක් ඇප සුරැකුම් උපලබ්ධිවීම් ද ඇතුළුව ණය හිමියන් විසින් ලබා ගැනීමට අපේක්ෂිත සහ ලබාගැනීමට නියමිත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ අතර වෙනස මත එය පදනම් වේ. එය සාමාන්‍යයෙන් පැහැර හැරීමට නිරාවරණය වීමෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරනු ලබයි.

ඊට ප්‍රථම කාලසීමාවක් තුළ ඇරැයුම් කිරීමට බැංකුව සතුව නීතිමය අයිතියක් වේ නම් හැර ණය පාඩු තීරණය කරනු ලබන උපරිම කාලසීමාව, මූල්‍ය උපකරණයකට ගිවිසුම්ගත ජීව කාලයයි. හානිකරණ පාඩු සහ මුදාහැරීම්, මූල්‍ය වත්කම්වල දළ ධාරණ අගයෙහි ගැලපීමක් ලෙස ගණනය කරනු ලබන අතර නවීකරණය මගින් ජනිත වූ අලාභ/ලැබීම් වලින් වෙන්කර හෙළිදරව් කරනු ලබයි.

අපේක්ෂිත ණය පාඩු ක්‍රමවේද යාන්ත්‍රණ පහත සැකෙවින් දක්වා ඇත.

1 අදියර

වාර්තා කරනු ලබන දිනෙන් පසුව එළඹෙන මාස 12 ක කාලසීමා තුළ පැවතිය හැකි මූල්‍ය උපකරණ මත ආපසු ගෙවීම් පැහැර හැරීම්වල ප්‍රතිඵල ලෙස ඇති වියහැකි අපේක්ෂිත ණය පාඩු, ජීව කාලය පුරා අපේක්ෂිත ණය පාඩුවල කොටසක් ලෙස මාස 12 ක් තුළ අපේක්ෂිත ණය පාඩු ගණනය කෙරෙයි. වාර්තා කරන දිනට පසුව එළඹෙන මාස 12 තුළ අපේක්ෂිත, පැහැර හැරීමේ සම්භාවිතාව පදනම් කරගෙන මාස 12 ක් තුළ අපේක්ෂිත ණය පාඩු ගණනය කරයි. එම අපේක්ෂිත මාස 12 ක් තුළ පැහැර හැරීමේ අවදානම් පැහැර හැරීම් නිරාවරණ පුරෝකථනයට යොදා ගනිමින් අපේක්ෂිත පැහැර හැරීම් නිසා ඇති වන අලාභය හෝ ගුණිත කර මුල් සඵල පොළී අනුපාතිකයට ආදේශකයක් ලෙස යොදා ගනු ලැබෙයි.

2 අදියර

ආරම්භයේ පටන් ණය අවදානමෙහි කැපී පෙනෙන වර්ධනයක් ණය මගින් පෙන්නුම් කර ඇති විට බැංකුව විසින් ජීව කාල අපේක්ෂිත ණය පාඩු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරයි. එහිදී අදාළ කරගනු ලබන යාන්ත්‍රණය ඉහත විස්තර කර ඇති කරුණු වලට සමාන වන නමුත් උපකරණයෙහි ජීව කාලය අරභයා පැහැර හැරීමේ සම්භාවිතාව සහ පැහැරහැරීම මත අලාභ තක්සේරු කෙරෙයි. මුල් සඵල පොළී අනුපාතිකය ආසන්න වශයෙන් සැලකීමෙන් අපේක්ෂිත මුදල් හිඟ වට්ටම් කෙරෙයි.

3 අදියර

හානිකරණය වී ඇතැයි සැලකෙන ණය සඳහා බැංකුව විසින් ජීවකාල අපේක්ෂිත ණය පාඩු හඳුනාගනු ලබයි. මෙම ක්‍රමවේදයේ, ණය පැහැර හැරීමේ සම්භාවිතාව 100% ලෙස සලකන අතර අනෙකුත් දෑ අදියර 2 වත්කම් සඳහා වූ ක්‍රමවේදයට සමාන වේ.

2.5.2.5 වෙනත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ

වෙනත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ අගයට මනින ලද ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය පාඩු මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය වත්කම්වල ධාරණ අගය අඩු නොකෙරෙයි. ඒ වෙනුවට ක්‍රමක්ෂය පිරිවැයට වත්කම් අගය කිරීමෙන් ඇති වන වෙන් කිරීමට සමාන අගයක් සමුච්චිත හානිකරණ අගයක් ලෙස වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනාගනු ලබන අතර අදාළ අනෙක් සටහන ආදායම් ප්‍රකාශයට ගලපනු ලබයි. විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගත් සමුච්චිත පාඩු වත්කම ඉවත් කිරීමේදී නැවත ආදායම් ප්‍රකාශයට ගලපනු ලබයි. වාර්තාකරණ කාලසීමාව තුළ හානිකරණයට භාජනය වූ වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමට මනින ලද ණය උපකරණ කිසිවක් බැංකුව හා සමූහය සතු නොවිණි.

2.5.2.6 ප්‍රක්ෂේපිත තොරතුරු

අපේක්ෂිත ණය පාඩු ආකෘතියේ දී බැංකුව විසින් ආර්ථික සාධක ලෙස පහත සඳහන් ආකාරයේ පුළුල් පරාසයක ප්‍රක්ෂේපිත තොරතුරු මත රඳා පවතී.

- දළ දේශීය නිෂ්පාදිත වර්ධන වේගය
- විරැකියා අනුපාත
- උද්ධමනය අනුපාත
- විනිමය හුවමාරු අනුපාතික
- පොළී අනුපාත

අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම සඳහා උපයෝගී කරගනු ලබන යෙදවුම් සහ ආකෘති සෑම විටකම මූල්‍ය ප්‍රකාශනයෙහි දිනට වෙළඳපළ හැසිරෙන ආකාරය මුළුමනින්ම ග්‍රහණය කරගනු නොලැබීය. මෙය පිළිඹිබු කිරීම සඳහා එවන් සැලකිය යුතු වෙනස්වීම් පවතින අවස්ථාවලදී තාවකාලික ගැලපුම් ලෙස ප්‍රමාණාත්මක ගැලපුම් සිදුකරයි.

2.5.2.7 ණය අවදානය සැලකියයුතු ලෙස වර්ධනය වීම

යම් උපකරණයක් හා උපකරණ කළඹක් මාස 12 අපේක්ෂිත ණය පාඩු හෝ ජීවකාල අපේක්ෂිත ණය පාඩු සඳහා බඳුන්වී දැයි තීරණය කරගනු පිණිස අපේක්ෂිත ණය පාඩු යටතට ගැනෙන සියලු වත්කම් බැංකුව විසින් අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. මූලික හඳුනා ගැනීමේ පටන් ණය අවදානමෙහි සැලකියයුතු වර්ධනයක් සිදු වී ඇත්දැයි සමූහය විසින් තක්සේරු කරනු ලබයි. අනවශ්‍ය පිරිවැයක් හෝ පරිශ්‍රමයක් රහිතව උපයෝජ්‍ය හා අදාළ වන සහය වන පිළිගත හැකි තොරතුරු බැංකුව විසින් සලකා බලනු ලැබෙයි. බැංකුවේ ඓතිහාසික කරුණු හා ප්‍රක්ෂේපිත තොරතුරු ඇතුළුව විශේෂඥ ණය තක්සේරු මත පදනම් වූ ප්‍රමාණාත්මක හා ගුණාත්මක විස්තර විශ්ලේෂණ මීට ඇතුළත්ය. ඒ අනුව, පහත සඳහන් නිර්ණායක වලින් එකක් හෝ සපුරාලන ලද විට ණය අවදානම සැලකියයුතු ලෙස වර්ධනය වී ඇති බව බැංකුව විසින් සලකනු ලබයි.

- ගෙවීමට නියමිතව දින 30 ඉක්මවූ ගනුදෙනුකාර ගිවිසුම්ගත ගෙවීම්
- බාහිර ණය වර්ගීකරණ නියෝජිතායතනයක් මගින් ගනුදෙනුකාර/උපකරණයක අවදානම් ශ්‍රේණිගත කිරීම B+ දක්වා පහත දමා ඇති විටක
- ප්‍රතිව්‍යුහගත පහසුකම්
- ගනුදෙනුකරුවෙකු/පහසුකමක් නිරීක්ෂක ලැයිස්තුවට මාරු කිරීම ආදී වත්කමක ණය අවදානම සැලකිය යුතු ලෙස වර්ධනය කරනු ලබන ද්විතීයික ගුණාත්මක දර්ශක
- සාධාරණ හා එකඟවිය හැකි ඉදිරි ආර්ථික කොන්දේසි පිළිබඳ පුරෝකථන ගනුදෙනුකරුවන්/ගනුදෙනුකාර කණ්ඩායම්, කළඹ හෝ උපකරණවලට සෘජුවම බලපාන අවස්ථාවලදී.
- භූගෝලීය පිහිටීම හෝ ස්වාභාවික විපත් ආශ්‍රිතව ඇති වන කැපී පෙනෙන වෙනස්වීම් මගින් ගනුදෙනුකරුවකුගේ/ගනුදෙනුකාර කණ්ඩායම හෝ උපකරණයක කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපාන අවස්ථාවලදී
- ඇප සුරැකුම් වල අගය සැලකිය යුතු ලෙස අඩු වූ විට/එය උපලබ්ධිවීමේ හැකියාව අවිනිශ්චිත වූ විට
- ගනුදෙනුකරුවකු නීතිමය බේරුම් කිරීමකට යටත් වන විට/එය ණය පහසුකම්වල කාර්යසාධනයට සැලකිය යුතු ලෙස බලපාන විට.
- ආයතනික ගනුදෙනුකරුවන්ගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය නිරතුරුව වෙනස්වීමට භාජනය වන විට

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

- මුල් අවස්ථාවේදී එකඟ වූ දින පටන් වසර 2කින් හෝ ඊට වැඩි කාල සීමාවකින් ව්‍යාපාරික මෙහෙයුම්/ව්‍යාපෘති ආරම්භය කල්යෑම
- ගෙවීම් සඳහා ලබාදෙන කාලසීමාව දීර්ඝ කිරීම, ගෙවීම් විලම්භනය, ගිවිසුම් අත්හැරීම යනාදිය මගින් සහන ලබාදීමට හේතු වන ආකාරයේ කොන්දේසි වෙනස්වීම
- ගනුදෙනුකරු මියගිය විට/බුන්වත් වූ විට
- ගනුදෙනුකරු හා සම්බන්ධවීමට හෝ ගනුදෙනුකරු සොයා ගැනීමට බැංකුව අපොහොසත් වන අවස්ථාවලදී
- පෙර වර්ෂය හා සසඳන විට ගනුදෙනුකරුගේ බදු පෙර ලාභය සහ/හෝ පිරිවැටුම 50% කින් අඩු වන අවස්ථාවලදී
- පෙර වර්ෂය හා සසඳනවිට ශුද්ධ වටිනාකම 25% කට වඩා ඉහළ ප්‍රතිශතයකින් පහළ ගිය අවස්ථාවලදී

2.5.2.8 ණය හානිකරණය වූ හා පැහැර හැරි වත්කම් පිළිබඳ නිර්වචනය

පහත සඳහන් අවස්ථාවලදී සමූහය විසින් වෙනත් ගනුදෙනුකරුවන් ලබා දෙන ණය හා අත්තිකාරම් පැහැර හැරීම් ලෙස සලකනු ලබයි.

- සුරකුම් උපලබ්ධි කිරීම (සුරකුම් කිසිවක් රඳවාගෙන ඇත්නම්) ආදී ක්‍රියාමාර්ගවලට යොමුවීම හැර ණයකරු විසින් අදාළ බැඳීම් මුළුමනින්ම ගෙවීමට අපොහොසත් අවස්ථාවලදී හෝ
- ණයකරු තම ගිවිසුම්ගත ගෙවීම් කළ යුතු දිනය ඉක්මවා දින 90 ක් ඉකුත් වී තිබීම.

වැඩිමනත් වශයෙන්, සමූහය විසින් යම් ආයෝජනයකට පවරා ඇති බාහිර ණය ශ්‍රේණිගත කිරීම, පැහැර හැරීමක් වන විට 3 වන අදියර යටතේ මූල්‍ය ආයෝජන වර්ගීකරණය කරනු ලබයි.

2.5.3 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ පිළිබඳ විස්තර පිටු අංක 200 හි සටහන් අංක 26 මගින් දැක්වේ.

2.5.3.1 ක්ෂයවීම්

පිටු අංක 200 දක්වා ඇති සටහන් අංක 26 යටතේ ක්ෂයවීම් තොරතුරු දැක්වේ.

2.5.3.2 ණය ගැනීමේ පිරිවැය

ණය ගැනීමේ පිරිවැය පිළිබඳ ල.ගි.ප්‍ර.23 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාර අත්පත් කර ගැනීම්, ඉදිකිරීම් හෝ වත්කමෙහි පිරිවැයෙන් කොටසක් ලෙස නිෂ්පාදිත යන කරුණු උදෙසා සෘජුවම දායක වන ණය හා අදාළ පිරිවැය මත සමූහය වැඩි බරක් තබයි. අපේක්ෂිත භාවිතාව හෝ විකිණීම සඳහා සූදානම් කිරීමේදී සැලකිය යුතු කාලසීමාවක් ගතවන වත්කම්, සුදුසුකම් ලබන වත්කම් නම් වේ. අනෙකුත් ණය ගැනීමේ පිරිවැය එම පිරිවැය හටගන්නා කාලසීමාව තුළ ඇති ලාභයට හෝ අලාභය මත හඳුනාගනී. වාර්තා කරන ලද කාලසීමාව තුළ බැංකුව හා සමූහය විසින් කිසිදු ණය ගැනීමේ පිරිවැයක් ප්‍රාග්ධනික නොකරන ලදී,

2.5.4 අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ විස්තර පිටු අංක 209 හි සටහන් අංක 29 මගින් දැක්වේ.

2.5.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විලම්බිත බදු වත්කම් නොවන වත්කම් හානිකරණය වූ බවට කිසියම් හෝ සළකුනක් ඇත්දැයි සමූහය විසින් අගයනු ලබයි. එබඳු හැඟවීමක් ඇත්නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවක සිදුකිරීම අවශ්‍ය වන්නේ නම්, සමූහය විසින් වත්කමෙන් නැවත අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි නැවත අයකරගත හැකි වටිනාකම ඉක්මවයි නම්, එම වත්කම හානිකරණය වී ඇතැයි සලකනු ලබන අතර, වත්කමේ ධාරණ අගය එහි නැවත අයකරගත හැකි වටිනාකම අඩු කරයි.

2.5.6 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

2.5.6.1 නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්

2.5.6.1.1 සේවක විශ්‍රාම අරමුදල - I

1995 ඔක්තෝබර් 01 දිනට ප්‍රථම බැංකුවට බැඳුනු ස්ථිර කාර්යමණ්ඩල සාමාජිකයින් සඳහා නිර්වචිත විශ්‍රාම සැලසුම් ක්‍රමයක් බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා වෙනම පාලනය කෙරෙන අරමුදලක් වෙත බැංකුව විසින් සාමාජිකයන්ගේ දායකත්වය ලබාදෙනු ලබයි. පුරෝකථන ඒකක ණය ජීව ගණක තක්සේරු කිරීමේ ක්‍රමය භාවිතා කරමින් නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ සැපයීමේ පිරිවැය වෙන වෙනම තීරණය කරනු ලබයි. ජීවගණක ලාභ හා අලාභ ඒවා ඇතිවන කාලපරිච්ඡේදය තුළ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ වාර්තා කරනු ලබයි.

නිර්වචිත ප්‍රතිලාභ වත්කම් හෝ වගකීම්, මින් පෙර හඳුනා නොගත් අතීත සේවා පිරිවැය හා බැඳීම් පියවීමට සෘජුවම අවශ්‍ය කෙරෙන සැලසුම් වත්කම්වල සාධාරණ අගය හා මින් පෙර හඳුනා නොගත් ජීව ගණක අලාභ අඩු කළ පසුව එළඹෙන නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්හි වත්මන් අගය ලෙස ගණනය කෙරේ. නිර්වචිත ප්‍රතිලාභ වගකීමෙහි අගය, බැංකුව විසින් දරනු ලබන අතර, ලාභ හෝ අලාභ යටතේ වාර්තා කරනු ලබයි. යම් වත්කමක අගය කිසියම් ජීව ගණක අලාභයක් සහ මින් පෙර හඳුනා නොගත් පැරණි සේවා පිරිවැය හා විශ්‍රාම සැලසුමට අදාළ ඉදිරි දායකත්ව මුදල් අඩු කිරීමක් හෝ ආර්ථික ප්‍රතිලාභයක වත්මන් අගය යනාදියෙහි ඓක්‍යයට, සීමා වෙයි.

වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ජීව ගණක හා කළමනාකරණ උපදේශක පෞද්ගලික සමාගමෙහි එම්.පූපලානාදන් මහතා විසින් 2020 දෙසැම්බර් 31 දිනට නවතම ජීව ගණක ඇගයීමක් සිදුකරන ලදී.

2020 දෙසැම්බර් 31 දිනට යෙදුනු ඇගයීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත පරිදි වේ.

පොළී/වට්ටම් අනුපාතය (වාර්ෂිකව)	8.00%
ජීවන වියදම් දීමනාවේ ඉහළයාම (වාර්ෂිකව)	4.50%
මූලික වැටුප් සාමාන්‍යයෙහි ඉහළයාම (වාර්ෂිකව)	6.50%

විශ්‍රාම අරමුදලෙහි වත්කම්, බැංකුවේ වත්කම් වලින් වෙන්ව පවත්වාගෙන යනු ලබන අතර, භාරකාර අරමුදලෙහි ප්‍රතිපාදන අනුව භාරකරුවන් විසින් ස්වාධීනව පරිපාලනය කරනු ලැබෙයි. එමෙන්ම එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට භාජනය වේ. සේවක විශ්‍රාම අරමුදල් - I හි මූල්‍ය ප්‍රකාශන මෙන්ම විගණන වාර්තාවද සහාගත කිරීමෙන් අනතුරුව භාරකාර මණ්ඩලය හා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබයි. අරමුදල් සැපයීම, ප්‍රශස්ත මට්ටමින් සිදුවන බවට වගබලා ගැනීමට බැංකුව බැඳී සිටින බැවින් මෙකී මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව ද බැංකුවේ හෙළිදරව් කිරීම් වලදී සමාලෝචනයට ඉදිරිපත් කෙරෙයි. මෙම අරමුදලට දායක වූ සාමාජිකයෙකුගේ දිවි ඇති තෙක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලබයි.

සේවක විශ්‍රාම අරමුදල - I පිළිබඳ විස්තර පිටු අංක 220 සිට 222 දක්වා සටහන් අංක 38 (අ) 1 හි දැක්වේ.

2.5.6.1.1.1 අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීම - සේවක විශ්‍රාම අරමුදල - I

ජීවගණක ඇගයීම සිදු කළ වහාම අරමුදල් නොයෙදවූ පසුගිය සේවා පිරිවැය වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි. 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 7,049 අතීත සේවා පිරිවැය හිඟයක් ජීවගණක ඇගයීම් තක්සේරුවෙහි ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන අතර, එය මුළුමනින්ම ප්‍රතිපාදනය කර ඇත. අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීමෙහි විස්තර පිටු අංක 220 සිට 222 දක්වා සටහන් අංක 38 (අ) 1 හි දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

2.5.6.1.2 සේවක විශ්‍රාම අරමුදල - II

1995 ඔක්තෝබර් මස 01 දින හෝ ඉන් අනතුරුව බැංකු සේවයට බැඳුනු ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා, බැංකුව විසින් අදාළ සාමාජිකයාගේ මාසික දළ වැටුපින් 12% ක දායකත්වයක් වෙනම පාලනය වන අරමුදලක් වෙත මාසිකව දායක කළ යුතු වන නිර්වචිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමක් බැංකුව විසින් ස්ථාපනය කර මෙහෙයවනු ලබයි.

පුරෝකථන ඒකක ප්‍රතිලාභ, ජීවදත්ත ඇගයීම් ක්‍රමයක් භාවිත කරමින් නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම් යටතේ ප්‍රතිලාභ සැපයීමේ පිරිවැය වෙනම තීරණය කරනු ලබයි. ආයු ගණනයෙන් ඇති වූ ලාභ හා පාඩු, ඒවා පැන නගිනු ලබන කාලපරිච්ඡේදය තුළ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි.

නිර්වචිත ප්‍රතිලාභ වත්කම් හෝ වගකීම්, මින් පෙර හඳුනා නොගත් අතීත සේවා පිරිවැය හා බැඳීම් පියවීමට සෘජුවම අවශ්‍ය කෙරෙන සැලසුම් වත්කම්වල සාධාරණ අගය හා මින් පෙර හඳුනා නොගත් ජීවගණක අලාභ අඩු කළ පසුව එළඹෙන නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්හි වත්මන් අගය ලෙස ගණනය කෙරේ. නිර්වචිත ප්‍රතිලාභ වගකීමෙහි අගය, බැංකුව විසින් දරනු ලබන අතර, ලාභ හෝ අලාභ යටතේ වාර්තා කරනු ලබයි. යම් වත්කමක අගය කිසියම් ජීව ගණක අලාභයක් සහ මින් පෙර හඳුනා නොගත් පැරණි සේවා පිරිවැය හා විශ්‍රාම සැලසුමට අදාළ ඉදිරි දායකත්ව මුදල් අඩු කිරීමක් හෝ ආර්ථික ප්‍රතිලාභයක වත්මන් අගය යනාදියෙහි ඓක්‍යයට, සීමා වෙයි.

වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ජීවගණක හා කළමනාකරණ උපදේශක පෞද්ගලික සමාගමෙහි එම් පූපලානාදන් මහතා විසින් 2020 දෙසැම්බර් 31 දිනට නවතම ජීවගණක ඇගයීමක් සිදුකරන ලදී.

2020 දෙසැම්බර් 31 දිනට යෙදුණු ඇගයීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත පරිදි වේ.

පොළී/වට්ටම් අනුපාතය (වාර්ෂිකව)	8.50%
ජීවන වියදම් දීමනාවේ ඉහළයාම (වාර්ෂිකව)	4.50%
මූලික වැටුප් සාමාන්‍යයෙහි ඉහළයාම (වාර්ෂිකව)	6.50%

විශ්‍රාම අරමුදලෙහි වත්කම්, බැංකුවේ වත්කම් වලින් වෙන්ව පවත්වාගෙන යනු ලබන අතර, භාරකාර අරමුදලෙහි ප්‍රතිපාදන අනුව භාරකරුවන් විසින් ස්වාධීනව පරිපාලනය කරනු ලැබෙයි. එමෙන්ම එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට භාජනය වේ. සේවක විශ්‍රාම අරමුදල - II හි මූල්‍ය ප්‍රකාශන මෙන්ම විගණන වාර්තාවද සහාගත කිරීමෙන් අනතුරුව භාරකාර මණ්ඩලය හා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබයි. අරමුදල් සැපයීම, ප්‍රශස්ත මට්ටමින් සිදුවන බවට වගබලා ගැනීමට බැංකුව බැඳී සිටින බැවින් මෙකී මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව ද බැංකුවේ හෙළිදරව් කිරීම් වලදී සමාලෝචනයට ඉදිරිපත් කෙරෙයි. මෙම අරමුදලට දායක වූ සාමාජිකයෙකුගේ දිවි ඇති තෙක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලබයි.

සේවක විශ්‍රාම අරමුදල - II හි විස්තර පිටු අංක 223 - 225 හි සටහන් අංක 38 (අ) 2 මගින් දැක්වේ.

2.5.6.1.2.1 අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීම - සේවක විශ්‍රාම අරමුදල - II

ජීවගණක ඇගයීම සිදු කළ වහාම අරමුදල් නොයෙදවූ පසුගිය සේවා පිරිවැය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි. 2020 දෙසැම්බර් 31 දිනට රු.මි. 316 ක අතීත සේවා පිරිවැය හිඟයක් ජීවගණක ඇගයීම් තක්සේරුවෙහි ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන අතර, එය මුළුමනින්ම ප්‍රතිපාදනය කර ඇත. අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීමෙහි විස්තර පිටු අංක 223 සිට 225 දක්වා සටහන් අංක 38 (අ) හි දක්වා ඇත.

2.5.6.1.3 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදල

2013 දෙසැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි බැංකුව විසින් සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II හි සාමාජිකයන් වෙනුවෙන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ස්ථාපනය කරන ලදී. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය II හි සාමාජිකයින්හට ඔවුන්ගේ කැමැත්ත අනුව වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා ගැනීමේ අවස්ථාව ඇත. බැංකුව විසින් මෙම අරමුදල සඳහා දායක නොවන අතර බැංකු සේවකයන් විසින් ඔවුන්ගේ මූලික වැටුපින් 5%ක් මාසිකව දායක මුදල් ලෙස ගෙවනු ලබයි.

2.5.6.2 විශ්‍රාම පාරිතෝෂික

සේවක විශ්‍රාම වැටුප් II යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීමත් සමග 1995 ඔක්තෝබර් මස 01 දින හෝ ඉන් පසුව බැංකු සේවයට බැඳුනු සේවකයින් සේවක විශ්‍රාම වැටුප් II යෝජනා ක්‍රමයට ඇතුළත් වේ. එහෙයින් ඔවුන් සේවා පාරිතෝෂික ක්‍රමය යටතේ හිමිවන අයිතීන් හා වරප්‍රසාද සඳහා හිමිකම් නොකියයි. කෙසේ වුවද, මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ හිමිකර ගැනීම සඳහා අවම වශයෙන් මාස 120 ක අඛණ්ඩ සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුව පවතී. එහෙයින් වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර විශ්‍රාම යනු ලබන හෝ විශ්‍රාම යාම හැරුණු කොට වෙනත් හේතු මත වසර 05 කට පසු සේවා කාලය අවසන් වන සේවකයින්හට 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා ගෙවීමේ පනත යටතේ සේවාවසාන පාරිතෝෂික දීමනා හිමිකර ගැනීමේ අවස්ථාව හිමි වේ. මේ යටතේ සිය සේවය අවසන් කරන ලද මූල්‍ය වර්ෂයේ අවසන් මාසය සඳහා ගෙවන ලද දළ වැටුප මෙන් මාස 1/2 ක අනුපාතයක් යටතේ අඛණ්ඩ සේවයේ නියැළුණු සෑම වසරක් වෙනුවෙන්ම පාරිතෝෂික දීමනා ගෙවනු ලබයි.

කළමනාකාරිත්වයේ අදහස හා පසුගිය අත්දැකීම්වලට අනුව එබඳු සිදුවීමක් ඇතිවීමේ සම්භාවිතාවය විරලය. වාර්තා කරන දිනට සැලකිය යුතු වගකීමක් වාර්තා නොවුනහොත්, සේවා පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශයෙහි ප්‍රතිපාදන වෙන් කරනු නොලබයි. 1983 අංක 12 දරණ සේවා පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ඉහත දැක්වූ අන්දමේ සිදුවීමක් මත සේවකයෙකුහට සේවා පාරිතෝෂික ගෙවීම සිදු කළහොත්, එය ගෙවූ වර්ෂයේ ආදායම් ප්‍රකාශයෙහි පාරිතෝෂික වියදමක් ලෙස හඳුනාගනු ලබයි.

2.5.6.3 විශ්‍රාමික සේවක වෛද්‍ය ප්‍රතිලාභ

විශ්‍රාමික සේවකයින් වෙනුවෙන් බැංකුව විසින් දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක් පවත්වාගෙන යනු ලබයි. මේ සැලසුම යටතේ ඇති වත්කම් බැංකුවේ සෙසු වත්කම් වලින් ස්වාධීනව පවත්වා ගෙන යනු ලබන අතර, එම අරමුදලෙහි භාරකාර ඔප්පුවෙහි ප්‍රතිපාදන ප්‍රකාර බැංකුවේ කළමනාකාරිත්වය හා සේවකයින් නියෝජනය කරනු ලබන කළමනාකාර/භාරකාර මණ්ඩලයක් මගින් පරිපාලනය කරනු ලබයි. ප්‍රක්ෂේපිත ඒකක භාර ජීවගණක ඇගයීම් ක්‍රමවේදය උපයෝගී කර ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ ලබාදීමේ පිරිවැය තීරණය කෙරෙයි. ජීවගණක ලාභ හා අලාභ එම අගයන් පැවති කාලසීමාවට අදාළ වෙනත් විස්තීරණ ආදායම්වල හඳුනාගනු ලැබේ.

වරින් වර සිදු කරනු ලබන ජීවගණක නිර්දේශ මත බැංකුවේ කළමනාකාරිත්වය විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණය බැංකුව විසින් දායකත්ව වෛද්‍යාධාර සැලසුම් ක්‍රමය වෙත දායක කරනු ලබයි. ඒ අනුව 2020 වර්ෂයේ ලාභයෙන් රුපියල් මිලියන 302.3 ක් මේ සඳහා ප්‍රතිපාදනය කර ඇත.

වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ජීවගණක හා කළමනාකරණ උපදේශක පෞද්ගලික සමාගමෙහි එම්.පූපලානාදන් මහතා විසින් 2020 දෙසැම්බර් 31 දිනට නවතම ජීවගණක ඇගයීමක් සිදුකරන ලදී.

2020 දෙසැම්බර් 31 දිනට යෙදුනු ඇගයීමේදී යොදාගන්නා ලද ප්‍රධාන මූල්‍ය උපකල්පන පහත පරිදි වේ.

පොළී/වට්ටම් අනුපාතය (වාර්ෂිකව)	8.00%
වෛද්‍ය පිරිවැය උද්ධමන අනුපාතය (වාර්ෂිකව)	4.50%

විශ්‍රාම අරමුදලෙහි වත්කම්, බැංකුවේ වත්කම්වලින් වෙන්ව පවත්වාගෙන යනු ලබන අතර, භාරකාර අරමුදලෙහි ප්‍රතිපාදන අනුව භාරකරුවන් විසින් ස්වාධීනව පරිපාලනය කෙරෙනු ලැබෙයි. එමෙන්ම එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට භාජනය වේ. විශ්‍රාමික සේවක වෛද්‍ය ප්‍රතිලාභ අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන මෙන්ම විගණන වාර්තාව ද සහාගත කිරීමෙන් අනතුරුව භාරකාර මණ්ඩලය වෙත බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබයි. අරමුදල් සැපයීම, ප්‍රශස්ත මට්ටමින් සිදුවන බවට වගබලා ගැනීමට බැංකුව බැඳී සිටින බැවින් මෙකී මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව ද බැංකුවේ හෙළදරව්කිරීම් වලදී සමාලෝචනයට ඉදිරිපත් කෙරෙයි. මෙම අරමුදලට දායක වූ සාමාජිකයෙකුගේ දිවි ඇති තෙක් ප්‍රතිලාභ ගෙවනු ලබයි.

විශ්‍රාමික සේවක වෛද්‍ය ප්‍රතිලාභ පිළිබඳ විස්තර පිටු අංක 226 හි සටහන් අංක 38 (අ) 3 මගින් දැක්වේ.

2.5.6.3.1 අරමුදල් නොයෙදූ වගකීම් - විශ්‍රාමික සේවක වෛද්‍ය ප්‍රතිලාභ

ජීවගණක ඇගයීම සිදුකළ වහාම අරමුදල් නොයෙදූ පසුගිය සේවා පිරිවැය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගනු ලබයි. 2020 දෙසැම්බර් 31 දිනට රු.මි.3520 ක අතීත සේවා පිරිවැය හිඟයක් ජීවගණක ඇගයීම් තක්සේරුවෙහි ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන අතර, එය මුළුමනින් ප්‍රතිපාදනය කර ඇත. අරමුදල් නොයෙදූ විශ්‍රාම වගකීමෙහි විස්තර පිටු අංක 226 හි සටහන් අංක 38 (අ) 3 හි දක්වා ඇත.

2.5.6.4 නිර්වචිත දායකත්ව සැලසුම්

නිර්වචිත දායකත්ව සැලසුම් පිළිබඳ විස්තර පිටු අංක 168 හි සටහන් අංක 11 මගින් දැක්වේ.

2.5.7 වෙනත් වගකීම්

වෙනත් වගකිම් පිළිබඳ විස්තර පිටු අංක 230 හි සටහන් අංක 41 මගින් දැක්වේ.

2.5.8 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සමූහය හමුවේ ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) ඇති විට හා එකී බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ වලින් යුතු සම්පත් පිටතට ගලායාම අවශ්‍යවීම හව්‍ය වන විටක සහ බැඳීම් ප්‍රමාණයෙහි විශ්වසනීය ඇස්තමේන්තුවක් කළ හැකි විටකදී ප්‍රතිපාදන හඳුනාගනු ලබයි. කිසියම් ප්‍රතිපාදනයකට අදාළ වියදම්, ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලබන්නේ කිසියම් ප්‍රතිපූරණයක් වේ නම් එය අඩු කිරීමෙන් අනතුරුවය.

2.5.8.1 වංචා සහගතව මුදල් ආපසු ගැනීම් වෙනුවෙන් සිදුකළ ප්‍රතිපාදන

2020 දෙසැම්බර් 31 දිනට හඳුනාගනු ලැබූ වංචා සහගත මුදල් ආපසු ගැනීම්වලට අදාළ මුළු වටිනාකම රු.මිලියන 77.8 ක් විය. රු.මිලියන 75.5 ක ප්‍රතිපාදන මේ වනවිටත් ගිණුමෙහි පවතී.

2.5.9 අසම්භාව්‍ය වගකීම් හා බැඳියාවන්

මේ යටතට බැංකු ඇපකර, ණයවර ලිපි, නොලැබූ ණය පහසුකම්, වෙනත් වක්‍ර ණය පහසුකම් සහ ප්‍රාග්ධන බැඳියාවන් ඇතුළත් වේ. බැංකු ඇපකර වූ කලී, ණය උපකරණයක නියාමනවලට අනුව යම් ණයකරුවෙකු නිසි දිනට ගෙවීම් සිදු කිරීමට අපොහොසත් වන අවස්ථාවලදී ඇති වියහැකි අලාභය වෙනුවෙන් සමූහය විසින් නිශ්චිත ගෙවීමක් සිදු කිරීමට අදාළ ගිවිසුම්ය. නොගෙවූ ණය බැඳියාවන්, ණයවර ලිපි යනු බැඳියාවට අදාළ කාලසීමාව තුළ ඇති බැඳියාවන් යටතේ බැංකුව විසින් පූර්ව නිශ්චිත කොන්දේසි යටතේ ගනුදෙනුකරු හට ණයක් ලබාදිය යුතු අවස්ථාය.

2018 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී.ල.මූ.ගි.ප්‍ර. 09 යටතේ හානිකරණ ඇගයීම්වලට මෙකී ගිවිසුම් යටතේ වේ. අසම්භාව්‍ය වගකීම් හා බැඳියාවන් පිළිබඳ විස්තර පිටු අංක 234 හි දක්වා සටහන් අංක 48 හි දක්වා ඇත.

2.5.10 කොටසක් සඳහා ඉපයීම්

කොටසක මූලික සහ තනුක ඉපයීම් පිළිබඳ විස්තර පිටු අංක 173 හි සටහන් අංක 14 හි දක්වා ඇත.

2.6 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - මූල්‍ය උපකරණ සඳහා ආදායම් හා වියදම් හඳුනාගැනීම →

ආදායම විශ්වසනීය ලෙස අගය කළ හැකි සහ ආර්ථික ප්‍රතිලාභ, බැංකුව වෙත ගලාඒමේ සම්භාවිතාව ඇති තාක් දුරට ආදායම හඳුනාගනු ලබයි. ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර පිටු අංක 161 සිට 173 දක්වා සටහන් අංක 03 සිට 14 හි දක්වා ඇත.

2.6.1 පොලී ආදායම් සහ වියදම්

පොළී ආදායම් සහ වියදම් පිළිබඳ පිළිබඳ විස්තර පිටු අංක 161 සිට 163 දක්වා සටහන් අංක 03 හා 04 හි දක්වා ඇත.

2.6.2 ගාස්තු සහ කොමිස් ආදායම

ගාස්තු සහ කොමිස් ආදායම විස්තර පිටු අංක 163 සිට 164 හි දක්වා සටහන් අංක 05 මගින් දැක්වේ.

2.6.3 ශුද්ධ වෙළඳ ආදායම

වෙළඳාම මගින් ලත් ශුද්ධ ලාභ/(අලාභ) පිටු අංක 165 හි සටහන් අංක 06 මගින් දැක්වේ.

2.6.4 ලාභාංශ ආදායම

ආදායමක් ලැබීමට ඇති අයිතය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබෙයි. සාමාන්‍යයෙන් මෙය ලැයිස්තුගත කොටස සඳහා ලාභාංශ රහිත දිනයයි. ලාභාංශ ආදායම් පිළිබඳ විස්තර පිටු අංක 166 හි සටහන් අංක 09 මගින් දැක්වේ.

2.6.5 කුලී ආදායම

කුලී ආදායම, උපචිත ආදායම මත ලාභයට හෝ අලාභයට හඳුනාගනු ලැබෙයි. කුලී ආදායම පිළිබඳ විස්තර පිටු අංක 166 හි සටහන් අංක 09 මගින් දැක්වේ.

2.7 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති - බදුකරණය →

2.7.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන බදු පිළිබඳ විස්තර පිටු අංක 171 හි සටහන් අංක 13 මගින් දැක්වේ.

2.7.2 විලම්බිත බදුකරණය

විලම්බිත බදු පිළිබඳ විස්තර පිටු අංක 171 හා 211 හි පිළිවෙලින් සටහන් අංක 13 හා 30 මගින් දැක්වේ.

2.7.3 මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි 25 (අ) වගන්තිය සහ එහි සංශෝධන ප්‍රකාර මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු ගණනය කෙරෙයි.

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

ආර්ථික ක්ෂයවීම් හා සේවක පාරිශ්‍රමික සඳහා ගලපන ලද මෙහෙයුම් ලාභයෙන් මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමට පෙර, 15% ක් මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු ලෙස ගෙවිය යුතුවේ.

2.7.4 මූල්‍ය සේවා සඳහා ජාතිය ගොඩනැගීමේ බදු

2014 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධිත) පනතෙහි ප්‍රතිපාදන ප්‍රකාර මූල්‍ය සේවා සඳහා ජාතිය ගොඩනැගීමේ බදු ගණනය කරනු ලබයි. මූල්‍ය සේවා සඳහා එකතුකළ අගය මත බදු සඳහා වූ බදු පදනම මත, මූල්‍ය සේවා සඳහා ජාතිය ගොඩනැගීමේ බදු 2% ක් ගෙවිය යුතුය. 2019 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි රජය විසින් ජාතිය ගොඩනැගීමේ බදු අහෝසි කරන ලදී.

2.7.5 මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු

2018 අයවැය මගින් දක්වා ඇති පරිදි 2018 අංක 35 දරන නව මුදල් පනත මගින් ණය ආපසු ගෙවීමේ බදු ලෙස නම් කරන ලද නව බද්දක් තාවකාලික බද්දක් ලෙස (2018 ඔක්තෝබර් 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා) බැංකු හා මූල්‍ය ආයතන මත පනවා ඇත. මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු ගෙවිය යුතු අනුපාතය 7% වන අතර ඊට මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදුවලට අයත් පදනමම අයත් වේ. 2020 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක පරිදි රජය විසින් ණය ආපසු ගෙවීමේ බදු අහෝසි කෙරිණි.

2.7.6 ආර්ථික සේවා ගාස්තු

2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනතෙහි ප්‍රතිපාදන ප්‍රකාර සහ ඊට පසුකාලීනව එක් කරන ලද සංශෝධන ප්‍රකාර ඊට පසුකාලීනව එක් කරන ලද සංශෝධන ප්‍රකාරව ආර්ථික සේවා ගාස්තුව ලෙස බැංකුවේ දළ පිරිවැටුපෙන් 0.5% ක් ගෙවිය යුතු වන අතර ආදායම් බදු වෙතින් එය අඩු කරනු ලැබේ.

හිමිකම් නොකී ආර්ථික සේවා ගාස්තු වේ නම් එය ඉදිරියට ගෙන යා හැකි අතර ඉදිරි අවුරුදු 2 ක කාලය තුළ ගෙවිය යුතු ආදායම් බදු වලට එය හිලව් කළ හැකිය. කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි හා මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික සේවා ගාස්තු අවලංගු කර ඇත.

2.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශය →

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.ගි.ප්‍ර.7) අනුව මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලැබ ඇත්තේ සෘජු ක්‍රමය පදනම් කර ගෙනය. මුදල් හා මුදල් සමානයන්, කිසියම් මුදල් ප්‍රමාණයකට පහසුවෙන් පරිවර්තනය කළ හැකි, කෙටි කාලීන, ඉහළ ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජනවලින් සමන්විත වන අතර, ඒවායේ වටිනාකම වෙනස්වීමේ අවධානම නොසැලකිය යුතු තරම් වේ. අතැති මුදල්, බැංකු වල තැන්පත් කර ඇති මුදල් ශේෂයන් හා කෙටි දැනුම්දීමකින් ලබා ගත හැකි මුදල්, මුදල් හා මුදල් සමානයන්ට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිටු අංක 142 හි දක්වා ඇත.

2.9 නියාමන ප්‍රතිපාදන →

2.9.1 තැන්පතු සඳහා රක්ෂණ යෝජනා ක්‍රමය

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය මත පදනම්ව අදාළ වන ව්‍යවස්ථාපිත අනුපාතිකය වන 0.10% ක් ලෙස, බැංකුව විසින් අදාළ තැන්පතු පදනම මත රක්ෂණ වාරිකය ගණනය කරයි. රක්ෂණ නියාමන මගින් දක්වා ඇති පරිදි සෑම කාර්තුවක් අවසානයේ සිටම දින 15 ක කාලසීමාවක් ඇතුළත අදාළ වාරිකය බැංකුව විසින් ප්‍රේෂණය කරනු ලැබේ.

2.9.2 බෝග රක්ෂණ අයබදු (CIL)

2013 අංක 12 දරණ මුදල් පනතෙහි 14 වන වගන්තියෙහි ප්‍රතිපාදන ප්‍රකාර 2013 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බෝග රක්ෂණ අයබද්ද හඳුන්වා දෙනු ලැබූ අතර, එය ජාතික රක්ෂණ භාරකාර අරමුදලට ගෙවිය යුතු වේ. මේ වන විට බදු පසු ලාභයෙන් 1% ක් බෝග රක්ෂණ අයබදු ලෙස ගෙවිය යුතුය.

2.10 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් →

වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදුවීම් පිළිබඳ විස්තර පිටු අංක 242 හි සටහන් අංක 52 මගින් දැක්වේ.

2.11 නිකුත් කරන ලද මුත් වාර්තාකරණ දිනට බල නොපැවැත්වෙන ගිණුම්කරණ ප්‍රමිතීන් →

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් පහත සඳහන් නව ගිණුම්කරණ ප්‍රමිතීන් සහ පවත්නා ප්‍රමිතීන්ට සංශෝධන/වැඩිදියුණු කිරීම නිකුත් කරන ලදී. එම නව ප්‍රමිතීන් සහ ප්‍රමිති සංශෝධන 2020 ජනවාරි 01 වනදායින් පසු ඇරඹෙන වාර්ෂික කාලසීමාවන් සඳහා බලපැවැත්වෙන අතර පූර්ව අනුගතවීමට අවසර ඇත. කෙසේ වෙතත්, මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමූහය මෙම නව ප්‍රමිති/සංශෝධනයන්ට පූර්ව අනුගත වී නොමැත.

2.11.1 පොලී අනුපාත මිනුම දණ්ඩ ප්‍රතිසංස්කරණය (IBOR) (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9, ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 39, සහ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 7 සඳහා සංශෝධන)

IBOR ප්‍රතිසංස්කරණ මගින් සමූහයේ බලපෑමට ලක් වූ වත්කම් හා වගකීම්වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහනයන් තීරණය කිරීමේ පදනමෙහි වෙනසක් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. IBOR ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් ලෙස සඵලදායී පොලී අනුපාතය යාවත්කාලීන කිරීම මගින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තීරණය කිරීමේ පදනම වෙනස්වීම ගිණුම්ගත කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රියාමාර්ගයන් මෙම සංශෝධන මගින් සපයයි. සමූහය සිය මූල්‍ය ප්‍රකාශන සඳහා නව ප්‍රමිතියේ බලපෑම තක්සේරු කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

2.11.2 ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 16 සංශෝධන - කොවිඩ් - 19 ආශ්‍රිත කුලී සහන

කොවිඩ් - 19 වසංගතයේ සෘජු ප්‍රතිඵලයක් ලෙස පැන නගින කුලී සහන සඳහා කල්බදු වෙනස් කිරීමේ ගිණුම්කරණය ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 16 මාර්ගෝපදේශයන් යොදා ගැනීම සම්බන්ධයෙන් කල්බදු ගැණුම්කරුට මෙම සංශෝධනයෙන් සහන ලබාදී ඇත.

මෙම සංශෝධනය අනාගතයේදී සමූහයේ/බැංකුවේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

3 දළ ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමූහයට ආර්ථික ප්‍රතිලාභ ගලාඒම හා ආදායම, විශ්වසනීය ලෙස ගණනය කිරීමට හැකි මට්ටම දක්වා දළ ආදායම් හඳුනාගනු ලබයි. ආදායම් හඳුනා ගැනීමට ප්‍රථම වෙනත් විශේෂිත නිර්ණායක ඒ ඒ ආදායමට අදාළ සටහන් යටතේ දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව 2020 රු. '000	බැංකුව 2019 රු. '000	සමූහය 2020 රු. '000	සමූහය 2019 රු. '000
පොළී ආදායම	**122,512,049**	118,729,784	**124,608,182**	120,351,774
ගාස්තු හා කොමිස් ආදායම	**2,710,487**	1,261,268	**2,723,087**	1,269,521
වෙළඳාම් කටයුතු වලින් ශුද්ධ ලාභය/(අලාභය)	**1,273,676**	1,491,610	**1,745,329**	1,963,229
ලාභය/අලාභය මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණවලින් ශුද්ධ සාධාරණ අගය ලාභ/(පාඩු)	**–**	–	**–**	–
මූල්‍ය වත්කම් හඳුනා ගැනීම අත්හැරීම තුළින් ශුද්ධ ලාභ/(අලාභ)	**241,284**	22,021	**241,284**	22,021
වෙනත් මෙහෙයුම් ශුද්ධ ආදායම්	**809,564**	424,376	**721,612**	2,203,626
දළ ආදායම	**127,547,060**	121,929,059	**130,039,494**	125,810,171

4 ශුද්ධ පොළී ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොළී ආදායම සහ පොළී වියදම හඳුනා ගැනීම

ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරන ලද සියලු මූල්‍ය උපකරණ සඳහා හා වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ලෙස වර්ග කරන ලද පොළී සහිත මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණ සඳහා පොළී ආදායම හෝ වියදම වාර්තා කරනුයේ සඵල පොළී අනුපාත භාවිතයෙනි. මෙය මූල්‍ය උපකරණයෙන් අපේක්ෂිත ජීව කාලය තුළ හෝ ඊට අඩු කාලසීමාවක් තුළ තක්සේරු කළ ඉදිරි මූල්‍ය ගෙවීම් හෝ ලැබීම් සුදුසුවිටකදී මූල්‍ය වත්කමෙහි හෝ වගකීමෙහි පවතින ශුද්ධ අගයට නිශ්චිතව අඩුකරන අනුපාතයයි. මෙම ගණනය කිරීම සඳහා මූල්‍ය උපකරණයෙහි සියලුම ගිවිසුම් ප්‍රකාර කොන්දේසි (උදාහරණ වශයෙන් කලින් ගෙවීමේ විකල්ප) සැලකිල්ලට ගනු ලබන අතර මූල්‍ය උපකරණයට සෘජුවම සම්බන්ධ හා සඵල පොළී අනුපාතයෙහි සංකලිත කොටසක් වන කිසියම් ගාස්තු හෝ වර්ධක පිරිවැය මීට ඇතුළු වන මුත් අනාගත ණය පාඩු ඊට අන්තර්ගත නොවේ.

සමූහය විසින් එහි ගෙවීම් හෝ ලැබීම්වල තක්සේරු අගයන් සංශෝධනය කෙරෙයි නම්, මූල්‍ය වත්කම් හෝ වගකීම් හි ධාරණ අගයද ගලපනු ලබයි. මුල් සඵල පොළී අනුපාත මත පදනම්ව අදාළ ගැලපීම් වලින් පසු ධාරණ අගය ගණනය කෙරෙන අතර, ධාරණ අගයෙහි වෙනස වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස වාර්තා කරනු ලබයි. කෙසේ වුවද, ලද මුදලෙහි ඉහළ ගිය අයකර ගැනීම් හැකියාවෙහි ප්‍රතිඵලයක් ලෙස බැංකුව විසින් අනාගත මුදල් ලැබීම් පිළිබඳ තක්සේරු පසුව වැඩි කරනු ලබන නැවත වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් සඳහා තක්සේරුව වෙනස් කළ දින සිටම එම වැඩිකිරීම්වල බලපෑම සඵල පොළී අනුපාතිකයට කළ ගැලපීමක් ලෙස හඳුනාගනු ලබයි.

ණය හානිකරණය වූ වත්කම් හැර අනෙකුත් මූල්‍ය උපකරණ සඳහා සඵල පොළී අනුපාත ගණනය කිරීමේදී අපේක්ෂිත ණය පාඩු හැරුණුකොට මූල්‍ය උපකරණවල සියලු ගිවිසුම්ගත කොන්දේසි සලකා බලමින් බැංකුව විසින් ඉදිරි මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කරයි. අදියර 3 යටතේ වර්ගීකරණය කරන ලද ණය හානිකරණය වූ මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය පාඩු ඇතුළත් කරමින් තක්සේරු කළ ඉදිරි මුදල් ප්‍රවාහ භාවිත කරමින් ණය ගලපන ලද අපේක්ෂිත පොළී අනුපාත ගණනය කෙරෙයි. ණය ගලපන ලද අපේක්ෂිත පොළී අනුපාත යනු මුල් හඳුනා ගැනීමේදී (ණය පාඩුද ඇතුළත්ව) තක්සේරු කළ ඉදිරි මුදල් ප්‍රවාහ ක්‍රමක්ෂය පිරිවැයට වට්ටම් කරන පොළී අනුපාතයයි.

හානිකරණ අලාභය හේතු කොට ගෙන මූල්‍ය වත්කමක හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක වාර්තා කළ අගය අඩුවූ විටද හානිකරණ අලාභය ගණනය කිරීම සඳහා අනාගත මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගත් පොළී අනුපාතයම භාවිත කරමින් පොළී ආදායම හඳුනාගැනීම සිදු කෙරෙයි.

4. ශුද්ධ පොලී ආදායම (සම්බන්ධයි)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
4. (අ) පොලී ආදායම				
මුදල් හා මුදල් සමානයන්	**45,288**	39,263	**47,754**	39,263
මහ බැංකුව වෙතැති ශේෂයන්	**–**	–	**–**	–
බැංකුවල ඇති තැන්පතු	**670,783**	1,416,393	**1,014,739**	1,530,935
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**–**	–	**–**	–
ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්				
– සාධාරණ අගයට ගණනය කරන ලද	**746,742**	1,051,706	**1,686,296**	1,908,594
– සාධාරණ අගයට නම් කළ	**–**	–	**–**	–
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්				
– ණය හා අත්තිකාරම්	**50,453,489**	58,097,923	**50,683,407**	58,186,998
– ණය හා වෙනත් උපකරණ	**70,275,947**	58,021,604	**70,740,943**	58,477,881
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්	**319,800**	102,895	**435,042**	208,103
මුළු පොලී ආදායම	**122,512,049**	118,729,784	**124,608,182**	120,351,774
4. (ආ) පොලී වියදම්				
බැංකුවලට ගෙවිය යුතු	**1,500,550**	4,482,281	**1,745,125**	4,655,295
ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම්	**–**	–	**–**	–
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම්				
– තැන්පත්කරුවන්ට ගෙවිය යුතු	**82,272,680**	79,645,008	**82,207,530**	79,615,032
– ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවිය යුතු	**–**	–	**–**	–
– වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු	**771,380**	2,691,377	**1,395,577**	3,513,319
නිකුත් කළ ණය සුරැකුම්පත්	**3,077,258**	3,079,104	**3,077,258**	3,084,493
මුළු පොලී වියදම්	**87,621,868**	89,897,770	**88,425,490**	90,868,139
ශුද්ධ පොලී ආදායම	**34,890,181**	28,832,014	**36,182,692**	29,483,635

පොලී ආදායම එදිරිව පොලී වියදම ප්‍රස්තාරය 40



4. ශුද්ධ පොලී ආදායම (සම්බන්ධයි)

4. (ඇ) ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වලින් ලද ශුද්ධ පොලී ආදායම →

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුව, පහත දැක්වෙන රජයේ සුරැකුම්පත් සඳහා පොලී ආදායම සහ පොලී වියදම් පිළිවෙලින් 4 (අ) සහ 4 (ආ) සටහන් වන දක්වා ඇති පොලී ආදායමෙන් සහ පොලී වියදම් වලින් උපුටා ගෙන වෙන වෙනම අනාවරණය කර ඇත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
පොලී ආදායම				
ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්				
– සාධාරණ අගයට ගණනය කරන ලද	**746,742**	1,051,706	**1,680,925**	1,908,595
– සාධාරණ අගයට නම් කළ	**–**	–	**–**	–
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්				
– ණය හා අත්තිකාරම් (ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්)	**365,666**	249,813	**365,666**	249,813
– ණය හා වෙනත් උපකරණ	**66,105,095**	56,465,866	**66,561,963**	56,912,554
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්	**319,800**	102,895	**435,042**	208,103
	67,537,303	57,870,281	**69,043,597**	59,279,065
අඩු කළා : පොලී වියදම්				
බැංකුවලට ගෙවිය යුතු (ප්‍රතිවිකුනුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්)	**1,041,680**	3,678,530	**1,286,255**	3,862,403
වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු (ප්‍රතිවිකුනුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත්)	**771,380**	2,703,823	**1,406,036**	3,540,676
	1,813,060	6,382,353	**2,692,291**	7,403,079
රජයේ සුරැකුම්පත් වලින් ලත් ශුද්ධ පොලී ආදායම	**65,724,243**	51,487,927	**66,351,306**	51,875,986

4. (ඈ) ණය තාවකාලික අත්හිටුවීම සහ කල්දැමීම නිසා පොලී ආදායමට වූ බලපෑම →

ණය සහනය හෝ ගෙවීම් කල්දැමීම ප්‍රතික්ෂේප කළ අය හැර සෙසු සියළු ගනුදෙනුකරුවන්ට බැංකුව සිය ණය සහනය සහ ගෙවීම් කල් දැමීම ලබාදී ඇත. ණය සහනය 7% ක අනුපාතයකට ලබාදී ඇති අතර, ණය කාලය අවසන් වන තෙක් ගෙවීම් කල්දමා ඇත. ණය සහන කාලසීමාව මාස දෙකක සිට මාස හයක් දක්වා වෙනස් වී ඇති අතර ඉතා සීමිත අවස්ථාවක එය මාස හයකට වඩා වැඩි කර ඇත.

ගිවිසුම්ගත අනුපාතයට පොලිය එකතුකර ඇත්නම්, මූල්‍ය වර්ෂය තුළ බැංකුවට රුපියල් මිලියන 4,805 ක් උපයා ගත හැකිව තිබුණි. කෙසේ වෙතත්, බැංකුව උපචිත පදනම මත 7% ක සහන අනුපාතයකින් රුපියල් මිලියන 2,585 ක පොලී ආදායමක් වාර්තා කර ඇති අතර ණය කාලසීමාව අවසානයේ එය එකතු කිරීමට එකඟ වේ. එබැවින් පොලී ආදායම මත බැංකුවට සිදු වූ දින 1 අලාභය රුපියල් මිලියන 1,391 කි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති මෙම ණය සහනය හේතු කොට ගෙන සමස්ථයක් වශයෙන් බැංකුවට රුපියල් මිලියන 3,611 ක පාඩුවක් සිදු වී ඇත.

5 ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගනුදෙනුකරුවන්ට සපයනු ලබන විවිධ වූ සේවාවන්ගෙන් සමූහය, ගාස්තු සහ කොමිස් ආදායම උපයාගන්නා අතර, එම සේවාවන් කාණ්ඩ දෙකකට බෙදා වෙන් කළ හැකිය.

(අ) යම් කාලසීමාවක් පුරා සපයනු ලබන සේවාවන්ගෙන් උපයාගන්නා ගාස්තු හා කොමිස් ආදායම

යම් කාලසීමාවක් පුරා සපයනු ලැබූ සේවාවන් වෙනුවෙන් ලැබෙන ගාස්තු සහ කොමිස් ආදායම එම කාලසීමාව පුරා උපචිත කර හඳුනාගනු ලැබේ.

(ආ) ගනුදෙනු සේවා සැපයීම වෙනුවෙන් ලද ගාස්තු හා කොමිස් ආදායම

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

5. ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම (සම්බන්ධයි)

තෙවන පාර්ශව වෙනුවෙන් සිදුකරන ගනුදෙනු සාකච්ඡා කිරීම් හෝ යළි සලකා බැලීම් වලින් ලද ගාස්තු හා කොමිස් ආදායම් එම ගනුදෙනු සම්පූර්ණ වීමෙන් අනතුරුව හඳුනාගනු ලබයි. කිසියම් කාර්යයක් ඉටුකිරීම හා සම්බන්ධවී ඇති ගාස්තු හෝ ගාස්තු කොටස් එම කාර්යය ඉටුකිරීමෙන් අනතුරුව හඳුනාගනියි.

ගනුදෙනු හා සේවා ගාස්තු වලට අදාළ ගාස්තු හා කොමිස් වියදම් එම සේවාවන් ලැබීමෙන් පසුව හඳුනාගනියි. ගාස්තු හා කොමිස් වියදම් උපචිත පදනමට ගිණුම්ගත කරයි.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
ගාස්තු හා කොමිස් ආදායම	**2,710,487**	1,261,268	**2,723,087**	1,269,521
ගාස්තු හා කොමිස් වියදම	**(154,486)**	(131,954)	**(160,556)**	(136,838)
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	**2,556,001**	1,129,314	**2,562,531**	1,132,683
උපයන ලද්දේ				
ණය	**2,491,151**	1,070,717	**2,494,441**	1,071,091
කාඩ්පත්	**5,530**	(10,320)	**5,530**	(10,320)
වාණිජ හා ප්‍රේෂණ	**–**	–	**–**	–
ආයතනික බැංකුකරණය	**9,937**	19,672	**9,937**	19,673
තැන්පතු	**27,964**	26,743	**27,964**	26,752
ඇපකර	**7,528**	8,778	**7,650**	8,778
වෙනත්	**13,891**	13,724	**17,009**	16,709
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	**2,556,001**	1,129,314	**2,562,531**	1,132,683

ගාස්තු හා කොමිස් ආදායම එදිරිව ගාස්තු හා කොමිස් වියදම්

ප්‍රස්තාරය 41



6 වෙළඳාම් කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය/(අලාභය)

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොළී ආදායම හැරුණු විට විදේශ විනිමය හුවමාරුවෙන් ලත් ආදායම, ලාභ හෝ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් වලට අදාළ ලාභාංශ සහ සියලුම ලාභ/අලාභ වෙළඳාම් කටයුතු වලින් ලත් ශුද්ධ ලාභය/(අලාභය)ට ඇතුළත්ය.

ගෙවීම් ලබාගැනීම සඳහා සමූහය සතු අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලබයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
විදේශ විනිමය				
බැංකුවලින්	**–**	–	**–**	–
අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන්	**211,796**	140,567	**211,796**	140,567
ස්ථාවර ආදායම් සුරැකුම්පත්	**578,353**	1,178,660	**1,050,006**	1,650,279
හිමිකම් සුරැකුම්පත්	**445,637**	156,797	**445,637**	156,797
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**37,889**	15,586	**37,889**	15,586
එකතුව	**1,273,676**	1,491,610	**1,745,329**	1,963,229

7 ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණයන්ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය)

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ලාභය හෝ අලාභය මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්වල සාධාරණ අගයහි වෙනස්වීම් වලින් ලත් සියලු උපලබ්ධි නොවූ ලාභ හා අලාභ වලට අයත් වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
ලාභ/අලාභ මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් මත ලාභ	**–**	–	**–**	–
ලාභ/අලාභ මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් මත අලාභ	**–**	–	**–**	–
ලාභ/අලාභ මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය වගකීම් මත ලාභ	**–**	–	**–**	–
ලාභ/අලාභ මගින් සාධාරණ අගයට ඇති මූල්‍ය වගකීම් මත අලාභ	**–**	–	**–**	–
එකතුව	**–**	–	**–**	–

8 මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම මගින් ලත් ශුද්ධ ලාභය/(අලාභය)

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගැනීම අත්හරින ලද වත්කම් සහ වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් වලට අදාළ ලාභයෙන් අලාභය අඩු කළ විට මූල්‍ය වත්කම් හඳුනාගැනීම අත්හැරීම මගින් ලත් ශුද්ධ ලාභ/(අලාභ) ගණනය වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
හඳුනාගැනීම				
ලාභ/අලාභ මගින් සාධාරණ අගයට	**–**	–	**–**	–
ක්‍රමක්ෂය පිරිවැයට	**–**	–	**–**	–
වෙනත් විස්තීර්ණ ආදායම මගින් සාධාරණ අගයට	**241,284**	22,021	**241,284**	22,021
එකතුව	**241,284**	22,021	**241,284**	22,021

9 වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)

ගිණුම්කරණ ප්‍රතිපත්ති

i. දේපල, පිරියත, උපකරණ ඉවත් කිරීමෙන් ලද ලාභය/(අලාභය)

ඉවත් කරනු ලබන දිනට වත්කම්වල ධාරණ අගය හා ශුද්ධ විකුණුම් මිල අතර වෙනස මගින් දේපල, පිරියත, උපකරණ ඉවත් කිරීමෙන් ලද ලාභ/(අලාභ) තීරණය වේ. සැලකිය යුතු අවදානම් හා ප්‍රතිලාභ හිමිකම විකුණුම්කරු වෙත මාරු කරනු ලබන වර්ෂයේදී මෙය වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගනු ලබයි.

ii. විදේශ විනිමය ලාභ/(අලාභ)

සෑම වාර්තාකරණ දිනකටම විදේශ විනිමය තත්ත්වය යළි පරිවර්තනය කෙරෙයි. විනිමය අනුපාතික වෙනස්වීම මත ඇතිවන ලාභ/(අලාභ) ඒවා පැන නගින කාලපරිච්ඡේදයේ ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලබයි.

iii. ලාභාංශ ආදායම

ගෙවීම් ලබාගැනීම සඳහා සමූහය සතු අයිතිය ස්ථාපිත වූ විට වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් වලින් ඉපයෙන ලාභාංශ හඳුනාගනු ලබයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
ආයෝජිත දේපල ලාභ/අලාභ	**–**	–	**53,762**	–
දේපල, පිරියත, උපකරණ විකිණීමෙන් ලත් ලාභ/අලාභ	**593**	11,432	**593**	11,436
විදේශ විනිමය යළි අගය කිරීමෙන් ලත් ලාභ/(අලාභ)	**185,750**	77,838	**185,750**	77,838
ලියා හරින ලද ණය අයකර ගැනීම	**–**	–	**14,831**	–
අඩුකළා = ලියා හරින ලද ණය	**–**	–	**–**	–
ලාභාංශ ආදායම	**421,681**	218,717	**252,993**	218,717
කුලී ආදායම	**21,158**	15,842	**21,158**	14,143
වෙනත් ආදායම	**180,382**	100,547	**192,525**	232,002
කේවල් කර මිලදී ගැනීමෙන් ලත් ලාභය	**–**	–	**–**	1,649,490
එකතුව	**809,564**	424,376	**721,612**	2,203,626

*2019 ඔක්තෝබර් මස 11 වන දින බැංකුව විසින් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ 100% ක හිමිකාරිත්වය අත්පත් කර ගැනීම සඳහා රු.මි. 3111 ක් බැංකුව විසින් ගෙවන ලදී. අත්පත් කරගත් දිනට ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ ශුද්ධ වත්කම රු.මි. 4,760.49 ක් වූ අතර කේවල් කර මිලදී ගැනීමේ ලාභය ලෙස ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් එහි වෙනස 2019 වර්ෂය සඳහා හඳුනාගෙන ඇත.

10 හානිකරණ වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 - ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් මගින් ඇගයීමට ලක් කරන සියලු මූල්‍ය උපකරණ වෙනුවෙන් සිදුකළ හානිකරණ ප්‍රතිපාදනයේ වෙනස්වීම් සමූහය විසින් හඳුනාගනු ලබයි. සියලු මූල්‍ය වත්කම් ප්‍රභේද ඔස්සේ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර .09 යටතේ හානිකරණ අලාභ මිනීමේදී විශේෂයෙන්ම ණය අවදානමෙහි සැලකියයුතු වැඩිවීම් ඇගයීම, අනාගත මුදල් ප්‍රවාහ ප්‍රමාණය හා කාලය ඇස්තමේන්තු කිරීම, හානිකරණ අලාභ වලදී සුරකුම් අගය තීරණය කිරීම යනාදිය සම්බන්ධයෙන් නිසි තීරණවලට එළඹිය යුතුය. මෙය ඇස්තමේන්තු සාධක ගණනාවක් මගින් මෙහයවනු ලබන අතර වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස විවිධ මට්ටමේ දීමනා ලැබිය හැක. බැංකුවේ අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම් විචල්‍ය යෙදවුම් සහ ඒවායෙහි අන්තර් සම්බන්ධතාවයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් පාදක වන උපකල්පන ගණනාවක් සහිත සංකීර්ණ ආකෘතියක නිමයුමකි. හානිකරණ ඇගයීම වෙනුවෙන් උපයෝගී කරගත් ක්‍රමවේදය මූල්‍ය ප්‍රකාශයෙහි සටහන් අංක 21 (ඈ) මගින් විස්තර කෙරෙයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
හානිකරණ වියදම් (සටහන 10.1)	**4,847,692**	549,912	**4,906,764**	575,076
ණය කපාහැරීම	**12,358**	15,624	**12,358**	15,624
වෙනත් කපාහැරීම	**13,718**	–	**13,718**	–
එකතුව	**4,873,768**	565,536	**4,932,840**	590,700

10.1 හානිකරණ වියදම්

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
මුදල් හා මුදල්වලට සමානයන්				
1 අදියර	**(692)**	563	**(696)**	567
බැංකුවල ඇති තැන්පතු				
1 අදියර	**(275)**	(1,035)	**1,408**	(275)
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් [සටහන් අංක 21 (ඈ)]				
1 අදියර	**1,346,820**	(9,458)	**1,351,953**	11,876
2 අදියර	**626,810**	(1,347)	**659,654**	(1,476)
3 අදියර	**2,751,251**	431,437	**2,770,675**	434,631
ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ [සටහන් අංක 22 (ආ)]				
1 අදියර	**92,711**	(471)	**92,705**	(470)
2 අදියර	**(4,162)**	5,852	**(4,162)**	5,852
3 අදියර	**–**	–	**–**	–
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් [සටහන් අංක 23 (ආ)]	**–**	–	**–**	–
අසම්භාව්‍ය වගකීම් හා බැඳියාවන් (සටහන් අංක 48)	**–**	–	**–**	–
පාලිත සමාගම්වල ආයෝජන [සටහන් අංක 24 (ඇ)]	**–**	–	**–**	–
ආශ්‍රිත සමාගම් හා බද්ධ ව්‍යාපාරවල ආයෝජන (සටහන් අංක 25)	**–**	–	**–**	–
දේපළ, පිරියත, උපකරණ (සටහන් අංක 26)	**35,228**	–	**35,228**	–
දේපල ආයෝජන (සටහන් අංක 28)	**–**	–	**–**	–
වෙනත් (සටහන 31.1)	**–**	124,372	**–**	124,372
එකතුව	**4,847,692**	549,912	**4,906,764**	575,076

10. හානිකරණ වියදම් (සම්බන්ධයි)

10.2 හානිකරණය සඳහා කොවිඩ්-19 හි බලපෑම →

කොවිඩ් - 19 වසංගතය දේශීය හා ගෝලීය වශයෙන් ව්‍යාපාර කෙරෙහි විශාල බලපෑමක් ඇති කර ඇත. කොවිඩ් - 19 වසංගතය හා ගෝලීය දේශීය ආර්ථිකයන් කෙරෙහි එහි බලපෑම සම්බන්ධ සාධක ගණනාවක් ඇති අතර එමගින් බැංකුවේ ලාභදායීතාව, ප්‍රාග්ධනය හා ද්‍රවශීලතාවයට ප්‍රමාණාත්මක වශයෙන් අහිතකර බලපෑමක් ඇති කළ හැකිය. 2020 දෙසැම්බර් 31 දින වන විට බැංකුව විසින් පැහැර හැරීමේ සම්භාවිතාව (PD) ගණනය කර ඇත. ආර්ථික සාධක ගැලපුම් (EFA) ගණනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රක්ෂේපණය භාවිතා කර කළමනාකරණ විනිශ්චය මත පදනම්ව ආර්ථිකයට සිදුවන අහිතකර බලපෑම පිළිබිඹු කිරීම සඳහා නරකම අවස්ථාව (10%) වැඩි කිරීමෙනි. එහි ප්‍රතිඵලයක් ලෙස 2019 ට සාපේක්ෂව ආර්ථික සාධක ගැලපුම් අගය ඉහළ අගයක් ගනී.

අගුළු දැමීමේ නීතිය ක්‍රියාත්මක වූ විගසම මාර්තු මස අවසානයේදී පළමු වරට ගෙවීම් කල්දැමීම් ඉදිරිපත් කරන ලද අතර ගනුදෙනුකරුවන්ගේ තත්ත්වයන් පිළිබඳ අල්ප තොරතුරු ලබාගත හැකි විය. ගෙවීම් සහන භාවිතා කරන ගනුදෙනුකරුවන් පිළිබඳ වැඩිදුර තක්සේරු කිරීම සඳහා දිගු කාලයක් ලබා දී ඇති අතර අමතර දත්ත දැන් ලබාගත හැකිය. තක්සේරුව තනි මට්ටමින් සහ සාමූහික නිරාවරණ මට්ටමින් පවත්වා ඇත. ණය සහනය ලබා දී ඇති ගනුදෙනුකරුවන් සඳහා ණය හානිකරණය තක්සේරු කිරීම සඳහා බැංකුව පහත පියවර ගෙන ඇත.

අ. තාවකාලික ආදායම් අඩු කිරීමක් හෝ දීර්ඝ කාලීන මූල්‍ය අර්බුදයක් ඇති ගනුදෙනුකරුවන් සහ අපේක්ෂිත ප්‍රකෘති කාලය සහ අවස්ථාව

ආ. ණය ගැනුම්කරුවන්ගේ ඓතිහාසික ගෙවීම් රටාව (නිතර පැහැර හරින අය)

ඇ. ගෙවීම් කල්දැමීම් ඉල්ලා සිටින අවස්ථේදී ගනුදෙනුකරුවන්ගෙන් ලබාගත් තොරතුරු

ඈ. කළමනාකරණ විනිශ්චය යෙදීම

කොවිඩ් - 19 වසංගතය (සංචාරක හා සංචාරක, ගුවන් සේවා, ආගන්තුක සත්කාරය සහ විවේකය, ප්‍රවාහන, පාරිභෝගික භාණ්ඩ, මෝටර් වාහන, විනෝදාස්වාද අංශ වැනි) ඍජුවම බලපාන ඇතැම් අංශවල නිරාවරණ සඳහා වන පැහැර හැරීම් මට්ටම් හේතුවෙන් අපේක්ෂිත ණය පාඩුව සඳහා අහිතකර ලෙස බලපා ඇත.

සියළුම ආයතනික සේවාදායකයින් ඔවුන්ගේ ඓතිහාසික ගෙවීම් රටා, ඔවුන්ගේ අංශයට හා භූගෝලීය ප්‍රදේශයට කොවිඩ් 19 ආර්ථික බලපෑම, ක්ෂේත්‍රයේ අපේක්ෂිත ප්‍රකෘතිය, ආයතනයේ මූල්‍ය ශක්තිය, රජයේ සහ මහ බැංකු සහාය සහ වෙනත් සාධක මත පදනම්ව තනි තනිව ඇගයීමට ලක් කරන ලදී. අපගේ තක්සේරුව මත පදනම්ව සමහර ණය ගැතියන් පළමු අදියර සිට දෙවන අදියර දක්වා (SICR) ගෙන ගිය අතර සමහර ණය ගැතියන් ඔවුන්ගේ අතීත ගෙවීම් තත්ත්වය නොතකා දෙවන අදියර සිට තුන්වන අදියර දක්වා (අපේක්ෂිත මුදල් ප්‍රවාහ දුර්වලතා හේතුවෙන්) ගෙන යන ලදී.

සියළුම ආයතනික සේවාදායකයින් ඔවුන්ගේ ඓතිහාසික ගෙවීම් රටා, ඔවුන්ගේ අංශයට හා භූගෝලීය ප්‍රදේශයට කොවිඩ් 19 ආර්ථික බලපෑම, ක්ෂේත්‍රයේ අපේක්ෂිත ප්‍රකෘතිය, ආයතනයේ මූල්‍ය ශක්තිය, රජයේ සහ මහ බැංකු සහාය සහ වෙනත් සාධක මත පදනම්ව තනි තනිව ඇගයීමට ලක් කරන ලදී. අපගේ තක්සේරුව මත පදනම්ව සමහර ණය ගැතියන් පළමු අදියර සිට දෙවන අදියර දක්වා (SICR) ගෙන ගිය අතර සමහර ණය ගැතියන් ඔවුන්ගේ අතීත ගෙවීම් තත්ත්වය නොතකා දෙවන අදියර සිට තුන්වන අදියර දක්වා (අපේක්ෂිත මුදල් ප්‍රවාහ දුර්වලතා හේතුවෙන්) ගෙන යන ලදී.

11 සේවක මණ්ඩල වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

i. නිර්වචිත දායකත්ව සැලසුම

සමූහය විසින් නිර්වචිත දායකත්ව සැලසුමක් මෙහෙයවනු ලබයි. නිශ්චිත දායකත්ව සැලසුමක් වෙත දැක්විය හැකි දායකත්වය තීරණය වනුයේ සේවකයින් විසින් සමූහය වෙත ලබා දෙන සේවයට සමානුපාතිකව වන අතර, එය “සේවක මණ්ඩල වියදම්” යටතේ වාර්තා කරනු ලබයි. ගෙවිය යුතු දායකත්ව මුදල්, වගකීමක් ලෙස වාර්තා කරනු ලබයි. සමූහය විසින් පහත සඳහන් නිර්වචිත දායකත්ව සැලසුම් වෙනුවෙන් එහි දායකත්වය දක්වනු ලබයි.

(අ) සේවක අර්ථසාධක අරමුදල

බැංකුව හා සේවකයින් විසින් සේවකයාගේ මාසික දළ වැටුපෙන් (අතිකාල දීමනා හැරුණු විට) පිළිවෙලින් 12% ක් හා 8% ක් බැගින් අර්ථසාධක අරමුදලට දායක වනු ලබයි. බැංකුවේ අර්ථසාධක අරමුදල වූ කලී සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ අනුමැතිය ලද අරමුදලකි. බැංකුව විසින් සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයින් හට වාර්ෂිකව 8% ක ප්‍රතිලාභයක් සහතික කරනු ලබයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලට පාලිත සමාගම් සහ එහි සේවකයින් විසින් 12% සහ 8% බැගින් පිළිවෙලින් දායක කරනු ලබයි.

11. සේවක මණ්ඩල වියදම් (සම්බන්ධයි)

(ආ) සේවක භාරකාර අරමුදල

සමූහය විසින් අතිකාල දීමනා හැර සේවකයින්ගේ මාසික දළ වැටුපින් 3% ක් සේවක භාරකාර මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන සේවක භාරකාර අරමුදලට දායක කරනු ලබයි.

ii. නිර්වචිත ප්‍රතිලාභ සැලසුම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.ගි.ප්‍ර. 19) සේවක ප්‍රතිලාභවලට අනුව සෑම නිර්වචිත ප්‍රතිලාභ සැලසුමකම මත පදනම්ව ඒ ඒ නිර්වචිත ප්‍රතිලාභ සැලසුම සඳහා වෙන වෙනම කරනු ලබන ස්වාධීන ජීවගණක තක්සේරුවක් මත දායකත්වය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබෙයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
වැටුප් සහ ප්‍රසාද දීමනා	**7,758,229**	8,274,021	**7,918,431**	8,317,516
නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්වය	**762,496**	736,058	**778,724**	746,725
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය [සටහන (11. අ, ආ, ඇ, ඈ) සහ (38)]	**1,220,620**	851,466	**1,227,783**	855,599
කොටස් මත පදනම් වූ වියදම්	**–**	–	**–**	–
වෙනත්	**225,441**	296,381	**227,547**	298,138
එකතුව	**9,966,786**	10,157,926	**10,152,485**	10,217,978

11. (අ) දායකත්වය - සේවක විශ්‍රාම වැටුප් අරමුදල - 1 →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
වියදම් ලෙස හඳුනාගත් මුදල	**489,286**	400,483	**489,286**	400,483

වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ජීවගණක හා කළමනාකරණ උපදේශක පෞද්ගලික සමාගමෙහි එම් පූපලානාදන් මහතා විසින් 2020 දෙසැම්බර් 31 දිනට ආසන්නතම ජීවගණක ඇගයීම සිදුකරන ලදී. (යොමුව සටහන් අංක 38. අ. 1 පිටු අංක 220)

11. (ආ) දායකත්වය - සේවක විශ්‍රාම වැටුප් අරමුදල - 11 →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
වියදම් ලෙස හඳුනාගත් මුදල	**429,015**	263,549	**429,817**	264,257

1995 ඔක්තෝබර් මස 01 දින හෝ ඉන් පසුව බැංකු සේවයට බැඳුනු ස්ථිර සේවකයින් සඳහා බැංකුව විසින් සේවක විශ්‍රාම වැටුප් අරමුදල II ස්ථාපිත කර ඇත. වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ජීවගණක හා කළමනාකරණ උපදේශක පෞද්ගලික සමාගමෙහි එම්. පූපලානාදන් මහතා විසින් 2020 දෙසැම්බර් 31 දිනට ජීවගණක ඇගයීම සිදුකරන ලදී. (යොමුව සටහන් අංක 38. අ. 2 පිටු අංක 223)

11. (ඇ) දායකත්වය - විශ්‍රාමික සේවක වෛද්‍යාධාර ක්‍රමය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
වියදම් ලෙස හඳුනාගත් මුදල	**302,320**	187,434	**302,320**	187,434

11. සේවක මණ්ඩල වියදම් (සම්බන්ධයි)

සියලුම බැංකු සේවකයින් සඳහා විශ්‍රාමික සේවක වෛද්‍යාධාර ක්‍රමය ස්ථාපිත කර ඇත. වෘත්තීමය ජීවගණක සමාගමක් වන සී/ස ජීවගණක හා කළමනාකරණ උපදේශක පෞද්ගලික සමාගමෙහි එම්.පූපලානාදන් මහතා විසින් 2020 දෙසැම්බර් 31 දිනට ජීවගණක ඇගයීම සිදුකරන ලදී. (යොමුව සටහන් අංක 38.අ.3 පිටු අංක 226)

11. (ඈ) දායකත්වය - විශ්‍රාම පාරිතෝෂිකය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
වියදම් ලෙස හඳුනාගත් මුදල	**–**	–	**6,360**	3,425

පරිපාලිත සමාගම්වල සේවක මණ්ඩලය විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් නොලබන අතර ඔවුන් 1983 අංක 12 දරණ පාරිතොෂික දීමනා පනත යටතේ ප්‍රතිපාදන සඳහා හිමිකම් ලබයි. [පිටු අංක 228 - සටහන් අංක 38 (අ) 4]

12 වෙනත් වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

දැරියයුතු වන පිරිවැය සහ ආදායමට සම්බන්ධ නිශ්චිත අයිතමවල ඉපයීම් අතර ඍජු සම්බන්ධතාව මත පදනම්ව ආදායම් ප්‍රකාශයෙහි වෙනත් මෙහෙයුම් වියදම් හඳුනාගනු ලබයි. කාර්යක්ෂම තත්ත්වයන් යටතේ දේපළ, පිරියත හා උපකරණ පවත්වාගෙන යාමේදී හා ව්‍යාපාර කටයුතු ඉටු කිරීමේදී පැන නගින සියලු වියදම් වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී ආදායම් ප්‍රකාශයෙහි දක්වා ඇත. පසුගිය සිදුවීමක් හේතුවෙන් සමූහය වෙත වත්මන් බැඳීමක් ඇති විට (නෛතික හෝ සම්ප්‍රයුක්ත) එකී බැඳීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කෙරෙන සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය වියහැකි අතර එමගින් බැඳීමේ ප්‍රමාණය පිළිබඳ පිළිගත හැකි ඇස්තමේන්තුවක් කළ හැකි වන අතර සෙසු වියදම්වලට අදාළ ප්‍රතිපාදන හඳුනාගනු ලබයිග දේපළ පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම් අනෙකුත් වියදම් වලින් වෙන්කර ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමිකයන්	**2,350**	1,086	**5,984**	2,206
විගණක පාරිශ්‍රමිකයන්	**5,014**	3,840	**7,745**	8,177
විගණිත නොවන ගාස්තු විගණකවරුන් සඳහා	**–**	–	**–**	–
වෘත්තීය හා නෛතික වියදම්	**23,331**	34,663	**31,776**	34,663
මෙහෙයුම් කල්බදු වියදම්	**–**	–	**–**	–
භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ ගාස්තු	**320,000**	320,000	**320,000**	320,000
කාර්යාල පරිපාලන හා ආයතනික වියදම්	**3,312,262**	3,484,954	**3,332,813**	3,496,756
වෙනත්	**595,350**	629,510	**615,050**	599,655
එකතුව	**4,258,307**	4,474,053	**4,313,367**	4,461,457

13 බදු වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.ගි.ප්‍ර.12) හි ආදායම් බදු අනුව බදු වියදම් යනු කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය හෝ අලාභය තීරණය නිශ්චය කිරීමේදී ප්‍රවර්තන බද්ද සහ විලම්භිත බදු සඳහා ඇතුලත් කරනු ලබන සමාහාර අගයයි. හිමිකම් හෝ වෙනත් විස්තීර්ණ ආදායම්හි ඍජුවම දක්වනු ලබන අයිතමවලට අදාළ වන සීමාව හැරුණුවිට ආදායම් බදු ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි.

ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන වර්ෂය මෙන්ම ඊට පෙර වර්ෂ සඳහා දේශීය ආදායම් බදු කොමසාරිස් වෙත ගෙවිය යුතු හෝ අය කර ගත යුතු ප්‍රමාණයන්ගෙන් ප්‍රවර්තන බදු වත්කම් හා වගකීම් සමන්විත වේ. එම ප්‍රමාණ ගණනය කිරීම සඳහා යොදා ගන්නා ලද බදු අනුපාත හා බදු නීති, ශේෂපත්‍ර දිනට හෝ ඉන් පසුව නීතිගත කර ඇත. ඒ අනුව, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත හා එහි පරිශිෂ්ඨයන්හි ප්‍රතිපාදනයන්ට අනුව සටහන් අංක 13 (අ) හි ඇති අනුපාත යොදා ගනිමින් වර්ෂයට අදාල ලාභය මත පදනම්ව බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

විලම්බිත බදුකරණය

වගකීම් ක්‍රමය උපයෝගී කරගනිමින් වාර්තාකරණ දිනට වත්කම් හා වගකීම් වල බදු පදනම සහ මූල්‍ය වාර්තා කිරීමේ අරමුණ පිණිස හඳුනාගන්නා අගය අතර, ඇති සියලුම තාවකාලික වෙනස්වීම් මත විලම්භිත බද්ද සඳහා ප්‍රතිපාදනය කෙරේ.

සියලුම අඩුකළ හැකි තාවකාලික වෙනස්වීම් වලට අදාළ විලම්බිත බදු වත්කම් හඳුනාගෙන ඇත. ඉදිරියට ගෙන ආ පාවිච්චි නොකළ බදු බැර සහ පාවිච්චි නොකළ බදු අලාභ සඳහා ඊට යොදාගත හැකි අනාගත බදුවල ලාභ ලැබෙතැයි ගම්‍ය වනතාක් දුරට හඳුනාගත යුතුය.

සෑම වාර්තාකරන දිනකටම විලම්බිත බදු වත්කමක ධාරණ අගය සමාලෝචනය කරනු ලබන අතර, විලම්බිත බදු වත්කමෙන් කොටසක් හෝ සම්පූර්ණයෙන්ම කපාහැරීමට උපයෝගී කර ගැනීමේ වාසිය ලැබීමට ප්‍රමාණවත් තරම් බදු වන ලාභ ලැබෙතැයි තවදුරටත් හව්‍ය නොවන තෙක් විලම්බිත බදු වත්කමේ ධාරණ අගය අඩු කරනු ලබයි. හඳුනාගනු නොලැබ ඇති විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරන දිනක දීම යළි තක්සේරු කරන අතර අනාගත බදු වන ලාභ වලින් විලම්බිත බදු වත්කම් අයකර ගැනිමට ඇති හැකියාව දැන් හව්‍ය වන තාක් දුරට හඳුනා ගනු ලබයි.

වාර්තාකරණ දිනට නීතිගත කර ඇති හෝ ඉන්පසුව බොහෝ දුරට නීතිගත තත්වයට පත්ව ඇති බදු අනුපාත සහ බදු නීති පදනම් කරගෙන වත්කම් උපලබ්ධි වූ හෝ වගකීම් පියවූ වර්ෂයට උපයෝගී කර ගැනිමට අපේක්ෂිත බදු අනුපාතය මත විලම්බිත බදු වත්කම් හා වගකීම් මනිනු ලැබේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
ප්‍රවර්තන බදු වියදම්				
ප්‍රවර්තන වර්ෂය	**6,017,687**	3,798,619	**6,449,560**	4,096,283
පසුගිය වර්ෂ සඳහා (අධි)/ඌණ වෙන් කිරීම්	**–**	–	**659**	–
විලම්බිත බදු වියදම්				
බදු අනුපාතිකවල වෙනසෙහි බලපෑම	**–**	–	**–**	–
තාවකාලික වෙනස්වීම් [යොමුව සටහන 13 (ආ)]	**(480,978)**	281,849	**(480,284)**	282,348
පෙර වර්ෂයේ ප්‍රතිපාදන	**–**	–	**–**	–
එකතුව	**5,536,709**	4,080,468	**5,969,936**	4,378,631
සඵල බදු අනුපාතිකය (%)	**35.39**	39.00	**35.55**	33.45
සඵල බදු අනුපාතිකය (විලම්බිත බදු හැර) (%)	**38.46**	36.31	**38.41**	31.29

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

13. බදු වියදම් (සම්බන්ධයි)

13. (අ) බදු වියදම් සැසඳුම →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
බදු පෙර ලාභය	**15,644,625**	10,461,638	**16,791,054**	13,091,541
වර්ෂය සඳහා ආදායම් බදු (ගිණුම්කරණ ලාභය මත 28%)	**4,380,495**	2,929,259	**4,701,495**	3,665,632
පෙර වර්ෂවල ප්‍රවර්තන බදු ගැලපීම්				
එකතුකළා : බදු කටයුතු සඳහා අඩු කළ නොහැකි වියදම් මගින් බදු සඳහා ඇතිවූ බලපෑම	**2,853,538**	1,501,792	**2,926,713**	2,065,735
අඩුකළා : බදු කටයුතු සඳහා අඩු කළහැකි වියදම් මගින් බදු සඳහා ඇතිවූ බලපෑම	**739,430**	527,288	**749,332**	1,529,941
: බදු නිදහස් ආදායම සඳහා බදු බලපෑම	**476,916**	105,143	**429,316**	105,143
වර්ෂය සඳහා බදු වියදම	**6,017,687**	3,798,620	**6,449,560**	4,096,283

13. (ආ) ආදායම් ප්‍රකාශයට ගලපන ලද විලම්බිත බදු (බැර)/වියදම සකස් වී ඇත්තේ පහත පරිදිය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
විලම්බිත බදු වත්කම්	**(621,711)**	317,062	**(621,711)**	316,797
විලම්බිත බදු වගකීම්	**140,733**	(35,213)	**141,427**	(34,449)
ආදායම් ප්‍රකාශයට ගලපන ලද විලම්බිත බදු (බැර)/වියදම	**(480,978)**	281,849	**(480,284)**	282,348

*2020 පෙබරවාරි 12 දිනැති නිවේදනයට අනුව, බැංකු සඳහා අදාළ වන ආදායම් බදු අනුපාතය 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි 24% දක්වා අඩුකර ඇත. කෙසේ වෙතත්, එම සංශෝධන බලාත්මක කර නොමැති බැවින් 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අදායම් බදු සහ විලම්බිත බදු ප්‍රතිපාදන 28% ක අනුපාතයකින් ගණනය කරන ලදී,

වර්තමාන ආදායම් බදු සහ විලම්බිත බදු ගණනය කිරීමේදී 24% ක සංශෝධිත අනුපාතය බැංකුව සලකා බැලුවේ නම්, ආදායම් ප්‍රකාශයට හඳුනාගෙන ඇති ආදායම් බදු ගාස්තුව රුපියල් මිලියන 861 කින් අඩු වනු ඇත. ආදායම් බදු වියදම රුපියල් මිලියන 851 ක් සහ විලම්බිත බද්ද රුපියල් මිලියන 9.5 ක් අඩුවීම මෙයට ඇතුළත් ය. මීට අමතරව, විස්තීරණ ආදායම් ප්‍රකාශයට අදාළ විලම්බිත බදු වියදම් රුපියල් මිලියන 207 කින් අඩු වනු ඇත.

14 කොටසක ඉපැයුම

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමූහය විසින් එහි සාමාන්‍ය කොටස්වල මූලික හා තනුක කොටසක ඉපයීම් දත්ත ඉදිරිපත් කරනු ලබයි. බැංකුවේ සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට අදාළ වන වර්ෂය සඳහාවූ ලාභය හෝ අලාභය එම වර්ෂය තුළ බලාත්මක හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් ගණනින් බෙදීමෙන් මූලික කොටසක ඉපයුම ගණනය කරනු ලැබේ. සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට අදාළ වන වර්ෂය සඳහාවූ ලාභය හෝ අලාභය වර්ෂය තුළ බලාත්මක හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් ගණනින් බෙදා ඊට සියළුම තනුකික භව්‍ය සාමාන්‍ය කොටස් සඳහා වූ බලපෑම ගැලපීමෙන් තනුක කොටසක ඉපයුම ගණනය කෙරෙයි. 2020 දෙසැම්බර් 31 වන දිනට බැංකුව සතුව තනුකික භවය සාමාන්‍ය කොටස් නොමැත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව 2020 රු. '000	බැංකුව 2019 රු. '000	සමූහය 2020 රු. '000	සමූහය 2019 රු. '000
සාමාන්‍ය කොටස් හිමිකරුවන් සඳහා වන ශුද්ධ ලාභය	**10,107,916**	6,381,170	**10,821,118**	8,712,910
සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට බෙදාහරින ලද ශුද්ධ ලාභය තනුකවීමේ බලපෑම සඳහා ගැලපීමෙන් පසු	**10,107,916**	6,381,170	**10,821,118**	8,712,910
කොටසක මූලික ඉපයුම් සඳහා හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් සංඛ්‍යාව	**940,000**	940,000	**940,000**	940,000
තනුක වීමේ බලපෑම	**–**	–	**–**	–
තනුක වීමේ බලපෑම ගැලපීමෙන් පසු හරිත මධ්‍යක සාමාන්‍ය කොටස් සංඛ්‍යාව	**940,000**	940,000	**940,000**	940,000
සාමාන්‍ය කොටසක මූලික ඉපයීම්	**10.75**	6.79	**11.51**	9.27
සාමාන්‍ය කොටසක තනුක ඉපයීම්	**10.75**	6.79	**11.51**	9.27

14. (අ) කොටසක මූලික හා තනුක ඉපයුම් සඳහා බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	පවතින සාමාන්‍ය කොටස් සංඛ්‍යාව 2020 රු. '000	පවතින සාමාන්‍ය කොටස් සංඛ්‍යාව 2019 රු. '000	බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව 2020 රු. '000	බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව 2019 රු. '000
ජනවාරි 01 දිනට නිකුත් වූ කොටස් සංඛ්‍යාව	**940,000**	940,000	**940,000**	940,000
එකතුකළා : වර්ෂය තුළ නිකුත් කළ කොටස් සංඛ්‍යාව	**–**	–	**–**	–
කොටසක මූලික හා තනුක ඉපයුම් සඳහා බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව	**940,000**	940,000	**940,000**	940,000

අතිරේක තොරතුරු
මූල්‍ය වාර්තා
පාලනය
දළ විශ්ලේෂණය

15 ගණනය කරන ලද පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ල.ගි.වා.ප්‍ර.9) මූල්‍ය උපකරණ අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වර්ගීකරණය යටතේ මූල්‍ය උපකරණවල ධාරන අගය පහත පරිදි සාරාංශගත කර ඇත.

15. (අ) බැංකුව - 2020

	සටහන	ක්‍රමක්ෂය පිරිවැය රු. '000	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000	වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය රු. '000	එකතුව රු. '000
වත්කම්					
මුදල් හා මුදල් සමානයන්	16	**6,491,963**	–	–	**6,491,963**
මහ බැංකුව වෙතැති ශේෂයන්	17	–	–	–	–
බැංකුවල ඇති තැන්පතු	18	**13,253,499**	–	–	**13,253,499**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	19	–	**19,897**	–	**19,897**
ණය සහ අත්තිකාරම්	21	**516,795,160**	–	–	**516,795,160**
ණය උපකරණ	20 , 22 & 23	**754,233,344**	**9,545,998**	**12,501,874**	**776,281,216**
හිමිකම් උපකරණ	20 & 23	–	**1,675,748**	**2,769,948**	**4,445,696**
මූල්‍ය වත්කම් එකතුව		**1,290,773,966**	**11,241,643**	**15,271,822**	**1,317,287,431**

	සටහන	ක්‍රමක්ෂය පිරිවැය රු. '000	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000	එකතුව රු. '000
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	32	**12,862,337**	–	**12,862,337**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	33	–	–	–
මූල්‍ය වගකීම්				
– තැන්පත්කරුවන්ට ගෙවියයුතු	35	**1,237,123,791**	–	**1,237,123,791**
– ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු	35	–	–	–
– වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු	35	**8,159,591**	–	**8,159,591**
නිකුත් කළ ණය සුරැකුම්පත්	37	**31,773,753**	–	**31,773,753**
මූල්‍ය වගකීම් එකතුව		**1,289,919,472**	–	**1,289,919,472**

15. ගණනය කරන ලද පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය (සම්බන්ධයි)

15. (ආ) බැංකුව - 2019 →

	සටහන	ක්‍රමක්ෂය පිරිවැය රු. '000	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000	වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය රු. '000	එකතුව රු. '000
වත්කම්					
මුදල් හා මුදල් සමානයන්	16	5,376,715	–	–	5,376,715
මහ බැංකුව වෙතැති ශේෂයන්	17	–	–	–	–
බැංකුවල ඇති තැන්පතු	18	12,364,469	–	–	12,364,469
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	19	–	11,622	–	11,622
ණය සහ අත්තිකාරම්	21	454,394,957	–	–	454,394,957
ණය උපකරණ	20 , 22 & 23	615,634,321	9,677,546	–	625,311,867
හිමිකම් උපකරණ	20 & 23	–	1,782,337	3,478,811	5,261,148
මූල්‍ය වත්කම් එකතුව		1,087,770,462	11,471,505	3,478,811	1,102,720,778

	සටහන	ක්‍රමක්ෂය පිරිවැය රු. '000	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000	එකතුව රු. '000
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	32	35,045,251	–	35,045,251
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	33	–	–	–
මූල්‍ය වගකීම්				
– තැන්පත්කරුවන්ට ගෙවියයුතු	35	1,016,574,286	–	1,016,574,286
– ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු	35	–	–	–
– වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු	35	21,203,242	–	21,203,242
නිකුත් කළ ණය සුරැකුම්පත්	37	26,691,711	–	26,691,711
මූල්‍ය වගකීම් එකතුව		1,099,514,490	–	1,099,514,490

15. (ඇ) සමූහය - 2020 →

	සටහන	ක්‍රමක්ෂය පිරිවැය රු. '000	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000	වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය රු. '000	එකතුව රු. '000
වත්කම්					
මුදල් හා මුදල් සමානයන්	16	**6,598,595**	**–**	**–**	**6,598,595**
මහ බැංකුව වෙතැති ශේෂයන්	17	**6**	**–**	**–**	**6**
බැංකුවල ඇති තැන්පතු	18	**17,456,660**	**–**	**–**	**17,456,660**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	19	**–**	**19,897**	**–**	**19,897**
ණය සහ අත්තිකාරම්	21	**517,833,067**	**–**	**–**	**517,833,067**
ණය උපකරණ	20 , 22 & 23	**758,594,934**	**21,638,390**	**13,149,882**	**793,383,206**
හිමිකම් උපකරණ	20 & 23	**–**	**1,979,554**	**2,909,959**	**4,889,513**
මූල්‍ය වත්කම් එකතුව		**1,300,483,262**	**23,637,841**	**16,059,841**	**1,340,180,943**

15. ගණනය කරන ලද පදනම මත මූල්‍ය උපකරණවල විශ්ලේෂණය (සම්බන්ධයි)

15. (ආ) බැංකුව - 2019 →

	සටහන	ක්‍රමක්ෂය පිරිවැය රු. '000	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000	එකතුව රු. '000
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	32	**13,339,705**	–	**13,339,705**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	33	–	–	–
මූල්‍ය වගකීම්				
– තැන්පත්කරුවන්ට ගෙවියයුතු	35	**1,237,669,284**	–	**1,237,669,284**
– ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු	35	–	–	–
– වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු	35	**19,656,090**	–	**19,656,090**
නිකුත් කළ ණය සුරැකුම්පත්	37	**31,908,279**	–	**31,908,279**
මූල්‍ය වගකීම් එකතුව		**1,302,573,358**	–	**1,302,573,358**

15. (ඇ) සමූහය - 2019 →

	සටහන	ක්‍රමක්ෂය පිරිවැය රු. '000	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000	වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය රු. '000	එකතුව රු. '000
වත්කම්					
මුදල් හා මුදල් සමානයන්	16	5,564,824	–	–	5,564,824
මහ බැංකුව වෙතැති ශේෂයන්	17	58	–	–	58
බැංකුවල ඇති තැන්පතු	18	15,745,184	–	–	15,745,184
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	19	–	11,622	–	11,622
ණය සහ අත්තිකාරම්	21	456,636,285	–	–	456,636,285
ණය උපකරණ	20 , 22 & 23	619,567,786	20,347,936	1,009,706	640,925,428
හිමිකම් උපකරණ	20 & 23	–	1,782,337	3,616,876	5,399,213
මූල්‍ය වත්කම් එකතුව		1,097,514,137	22,141,895	4,626,582	1,124,282,614

	සටහන	ක්‍රමක්ෂය පිරිවැය රු. '000	ලාභාලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද රු. '000	එකතුව රු. '000
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	32	36,139,122	–	36,139,122
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	33	–	–	–
මූල්‍ය වගකීම්				
– තැන්පත්කරුවන්ට ගෙවියයුතු	35	1,015,635,421		1,015,635,421
– ණය සුරැකුම්පත් හිමියන්ට ගෙවියයුතු	35	–	–	–
– වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු	35	32,808,023	–	32,808,023
නිකුත් කළ ණය සුරැකුම්පත්	37	26,955,697	–	26,955,697
මූල්‍ය වගකීම් එකතුව		1,111,538,263	–	1,111,538,263

16 මුදල් හා මුදල් සමානයන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

වටිනාකම වෙනස්වීම නොසැලකිය හැකි තරම් වන අවදානමකට යටත් අතැති මුදල්, බැංකුවල ඇති තැන්පතු, කෙටි දැනුම් දීමකින් ලබාගත හැකි මුදල් යනාදිය මුදල් හා මුදල් සමානයන් යන්නට ඇතුළත්ය. දළ අගයෙන් හානිකරණ අඩු කොට මෙම මූල්‍ය වත්කම්වල වටිනාකම මූල්‍ය වාර්තාවන දක්වා ඇත. එම බැංකුවල බාහිර ශ්‍රේණිගත කිරීම් මත පදනම්වල ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 "මූල්‍ය උපකරණ" අනුව සමූහය විසින් හානිකර ප්‍රතිපාදන ගණනය කර ඇත.

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
අතැති මුදල්	**1,901,551**	941,102	**1,906,210**	947,240
බැංකුවල ඇති ශේෂයන්	**4,590,397**	4,436,403	**4,692,371**	4,618,378
කෙටි දැනුම් දීමකින් ආපසු ලබා ගතහැකි මුදල්	**112**	–	**112**	–
දළ මුදල් හා මුදල් සමානයන් (*)	**6,492,060**	5,377,505	**6,598,693**	5,565,618
අඩුකළා - හානිකරණය	**(97)**	(790)	**(98)**	(794)
ශුද්ධ මුදල් හා මුදල් සමානයන් (*)	**6,491,963**	5,376,715	**6,598,595**	5,564,824

(*) දළ මුදල් සහ මුදල් සමානයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා ඇත.

17 මහ බැංකුව වෙතැති ශේෂයන්

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
ශ්‍රී ලංකා මහ බැංකුව වෙතැති ව්‍යාවස්ථාපිත ශේෂයන්	**–**	–	**6**	58
එකතුව	**–**	–	**6**	58

18 බැංකුවල ඇති තැන්පතු

ගිණුම්කරණ ප්‍රතිපත්ති

බැංකුව සහ සමූහය එහි කෙටිකාලීන බැඳීම් කළමනාකරණය සඳහා යොදවනු ලබන හා සාධාරණ අගය වෙනස්වීමේ අවදානම නොසැලකිය හැකි තරම් වන බැංකුවල ඇති කෙටිකාලීන තැන්පතු මේ යටතට අයත් වේ. ඒවා මූල්‍ය ප්‍රකාශයන්හි ඒවායේ නාමික අගයට හෝ දළ වටිනාකමෙන් හානිකරණය අඩුකර අවශ්‍ය තැන්හි දක්වා ඇත. අදාළ බැංකුවේ බාහිර ශ්‍රේණිගත කිරීම් වලට අනුව ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 මූල්‍ය උපකරණ ප්‍රකාර සමූහය විසින් හානිකරණ ප්‍රතිපාදන ගණනය කර ඇත.

18. බැංකුවල ඇති තැන්පතු (සම්බන්ධයි)

	ඊබන		ඨරදමව	
දෙසැම්බර් 31 දිනට	**2020** **රු. '000**	2019 රු. '000	**2020** **රු. '000**	2019 රු. '000
ශ්‍රී ලංකාවේ බැංකු වල ඇති තැන්පතු				
ශ්‍රී ලංකා රුපියල්	**–**	–	**4,206,751**	3,382,622
ඇමරිකානු ඩොලර්	**8,809,168**	8,485,286	**8,809,168**	8,485,286
යූරෝ	**1,940,426**	1,568,305	**1,940,426**	1,568,305
මහා බ්‍රිතාන්‍ය පවුම්	**1,345,015**	1,270,574	**1,345,015**	1,270,574
ඕස්ට්‍රේලියානු ඩොලර්	**1,160,601**	1,042,290	**1,160,601**	1,042,290
දළ බැංකුවල ඇති තැන්පතු	**13,255,210**	12,366,455	**17,461,961**	15,749,077
අඩුකළා - හානිකරණය	**(1,711)**	(1,986)	**(5,301)**	(3,893)
ශුද්ධ බැංකුවල ඇති තැන්පතු	**13,253,499**	12,364,469	**17,456,660**	15,745,184

19 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොළී අනුපාතික, මූල්‍ය උපකරණවල මිල, වෙළඳ ද්‍රව්‍ය මිල, විදේශ විනිමය අනුපාතික, ණය අවදානම් හා දර්ශක වල වෙනස්වීම් මත අගය, සකස් කර ගන්නා මූල්‍ය උපකරණ, ව්‍යුත්පන්නයන් වේ. ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් කර නොමැති විට ව්‍යුත්පන්න වෙළඳාම සඳහා ඇති ලෙස වර්ගීකරණය වෙයි. සමූහය විසින් පොළී අනුපාතික (Swaps) හා විදේශ විනිමය ඉදිරි ගිවිසුම් යනාදි ව්‍යුත්පන්න භාවිතා කරනු ලබයි.

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට වාර්තා කළ ව්‍යුත්පන්න

ඉදිරි රැකුම් උපකරණ ලෙස භාවිත වන ව්‍යුත්පන්න හැරුණුවිට සෙසු ව්‍යුත්පන්න සාධාරණ අගයට වාර්තා කරන අතර, එකී සාධාරණ අගය ධනාත්මක වන්නේ නම් වත්කම් ලෙස සලකන අතර සාධාරණ අගය සෘණාත්මක වන්නේ නම් වගකීම් ලෙස සැලකෙයි. ව්‍යුත්පන්නවල සාධාරණ අගයේ වෙනස්වීම්, වෙළඳාම් කටයුතු වලින් ලද ශුද්ධ ආදායම්වලට ඇතුළත් වේ.

ඉදිරි රැකුම් උපකරණ ලෙස භාවිත ව්‍යුත්පන්න

විදේශ විනිමය අනුපාතික හෝ පොළී අනුපාතික සම්බන්ධ අවදානම් රැකුම්ගත කිරීම සඳහා සමූහය විසින් ව්‍යුත්පන්න ගිවිසුම් වලට එළඹෙයි. මෙකී ව්‍යුත්පන්න සාධාරණ අගයට මනිනු ලබයි. ඉදිරි රැකුම් කාර්යක්‍ෂම වන අවස්ථාවලදී, සාධාරණ අගයට මනිනු ලැබූ ව්‍යුත්පන්න සහ පිරිවැයට/ක්‍රමක්‍ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම් හෝ වගකීම් මගින් මූල්‍ය ප්‍රකාශනය තුළ පැන නගින අස්ථාවර භාවය ඉවත් කිරීම සඳහා සමූහය විසින් ඉදිරි රැකුම් ගිණුම්කරණ නොගැලපීම් යොදා ගනී.

මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම්

වාර්තා කරනු ලබන සෑම කාලසීමාවක් අවසානයේදීම මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් සාධාරණ අගයට ගණනය කරනු ලබයි.

මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් ලෙස නම් කෙරෙන සහ එසේ නම් කිරීමට සුදුසු වන ව්‍යුත්පන්නයන්හි සාධාරණ අගයෙහි වෙනස්කම්වල සඵල කොටස, මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් සාධාරණ අගයේ ලාභ/අලාභ යටතේ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වනු ලැබේ. එසේ සඵල නොවන කොටසකට අදාළ සාධාරණ අගයෙහි කිසියම් ලාභයක් හෝ අලාභයක් ආදායම් ප්‍රකාශයෙන් එක්වරම හඳුනාගනු ලැබේ.

19. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ (සම්බන්ධයි)

ඉදිරි රැකුම් අයිතම මගින් ලාභය හෝ අලාභයට බලපෑමක් ඇති කෙරෙන කාල සීමාවන්හි දී වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගෙන ඇති සමුච්චිත ලාභ හෝ අලාභ, ආදායම් ප්‍රකාශයට යළි වර්ගීකරණය කරනු ලබයි. කෙසේ වුවද ඉදිරි රැකුම්ගත පුරෝකථන ගනුදෙනුවල ප්‍රතිඵල ලෙස මූල්‍ය නොවන වත්කම් හෝ මූල්‍ය නොවන වගකීමක් හඳුනා ගැනෙන විට වෙනත් විස්තීර්ණ ආදායම්හි කලින් හඳුනාගන්නා ලද ලාභ හා අලාභ, හිමිකම් වෙතින් ඉවත්කර වත්කමෙහි හෝ වගකීමෙහි මූලික පිරිවැය ගණනය කිරීමෙහි ඇතුළත් කරනු ලබයි.

ඉදිරි රැකුම්ගත උපකරණයක් කල් ඉකුත්වන විට හෝ විකුණනු ලබන විට හෝ ඉදිරි රැකුමක් තවදුරටත් අදාළ ගිණුම්කරණ නිර්නායක සමග අනුකූල නොවන විට ආදායම් ප්‍රකාශයෙහි පුරෝකථන ගනුදෙනුව හඳුනා ගැනෙන තෙක් ඒ වන විට වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගෙන ඇති කිසියම් සමුච්චිත ලාභයක් හෝ අලාභයක් හිමිකම් වෙත රඳවා ගැනෙයි. පුරෝකථන ගනුදෙනුවක් තවදුරටත් සිදු වෙතැයි අපේක්ෂා නොකරන විට වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගනු ලැබ ඇති සමුච්චිත ලාභය හෝ අලාභය, එක්වරම ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කරනු ලබයි.

19.1 ව්‍යුත්පන්න වත්කම් →

බැංකුව සහ සමූහය

දෙසැම්බර් 31 දිනට	වත්කම් 2020 රු. '000	නාමික වටිනාකම 2020 රු. '000	වත්කම් 2019 රු. '000	නාමික වටිනාකම 2019 රු. '000
පොළී අනුපාත ව්‍යුත්පන්න				
පොළී අනුපාත හුවමාරු ගිවිසුම් [සටහන් - (19.2)]	**19,897**	**2,000,000**	11,622	2,000,000
විදේශ විනිමය ව්‍යුත්පන්න				
විනිමය හුවමාරු කිරීම්	**–**	**–**	–	–
එකතුව	**19,897**	**2,000,000**	11,622	2,000,000

19.2 විදේශ විනිමය හුවමාරු ගිවිසුම →

විස්තර	ඉදිරි රැකුමෙහි විස්තර
හුවමාරු ගිවිසුම් උපකරණ	සමපාර්ශ්විකය - ඩී එෆ් සී සී බැංකුව
	කාල්පිත අගය - ශ්‍රී.ල.රු.මි. 2,000
හුවමාරු ගිවිසුම් අයිතම	ඩී එෆ් සී සී බැංකුව වෙතින් ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත කාලීන ණය මි. 2000
මුදල් ප්‍රවාහ ජනිතවීමට අපේක්ෂිත කාලසීමාව	අර්ධ වාර්ෂික පොළී ගෙවීම
ගිවිසුම අවසන් කිරීම	2021 පෙබරවාරි 20
පාදක පොළී අනුපාතිකය	සාමාන්‍ය බර තැබූ මූලික ණය අනුපාතිකය මාස 06 (AWPLR)

20 ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය වත්කමක් ප්‍රධාන වශයෙන් අත්පත් කරගෙන ඇත්තේ නුදුරු කාලයේදී විකිණීමේ හෝ ප්‍රතිමිළදී ගැනීමේ අරමුණින් හෝ කෙටිකාලීන ලාභාපේක්ෂාවන් එක්ව කළමනාකරණය කරනු ලබන ආයෝජන කළඹක කොටසක් ලෙස රඳවා තබාගෙන ඇති විට හෝ සාධාරණ අගයට වාර්තා කර ඇති විට ඒවා ලාභය/අලාභය මගින් හඳුනාගනු ලැබූ මූල්‍ය වත්කමක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ඉදිරි රැකුම් ගිවිසුම් යටතේ ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් නොකරන ලද ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ද මෙම කාණ්ඩයට ඇතුළත් වේ. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 09 - මූල්‍ය උපකරණ අනුව වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට හෝ ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන්නේ නම් හැර මූල්‍ය වත්කම් ලාභය/අලාභය මගින් සාධාරණ අගයට මනිනු ලබයි.

ලාභය/අලාභය හරහා හඳුනාගනු ලබන මූල්‍ය වත්කම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට වාර්තා කරනු ලබයි. සාධාරණ අගයෙහි වෙනස්වීම්,, වෙළඳාම් කටයුතු වලින් ලද ශුද්ධ ලාභ/අලාභ යටතේ හඳුනාගනු ලබන අතර ගිවිසුම්වල කොන්දේසි ප්‍රකාර හෝ ගෙවීම් සිදු කිරීමේ අයිතිය ස්ථාපිත වූ පොළී ආදායම් හා වියදම් ශුද්ධ පොළී ආදායමෙහි වාර්තා කරයි. ලාභාංශ ආදායම හා උපලබ්ධි ලාභ/අලාභ වෙළඳාම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභ/අලාභ යටතේ වාර්තා කෙරෙයි.

නුදුරු කාලයේදී විකිණීමට ඇති අපේක්ෂාව තව දුරටත් අදාළ වන්නේ දැයි තීරණය කිරීමට සමූහය විසින් ව්‍යුත්පන්නයන් නොවන ලාභය/අලාභය හරහා හඳුනාගත් මූල්‍ය වත්කම් අගයනු ලබයි. සක්‍රීය වෙළඳපළක් නොමැතිවීම හේතුකොට ගෙන මෙම මූල්‍ය වත්කම් වෙළඳාම් කිරීමට අපොහොසත් වනවිට සහ නුදුරු අනාගතයේදී ඒවා විකිණීම සඳහා වන කළමනාකරණ අපේක්ෂාව සැලකිය යුතු ලෙස වෙනස් වී ඇති විට, සමූහයට ඉතා විරල අවස්ථාවන්හි දී පමණක් මෙම මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය සඳහා සලකා බැලිය හැකිය.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
සාධාරණ අගයට ගණනය කළ				
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත්				
භාණ්ඩාගාර බිල්පත්	**3,940,500**	–	**9,879,603**	6,655,355
භාණ්ඩාගාර බැඳුම්කර	**5,605,498**	9,677,545	**11,758,787**	13,692,581
හිමිකම් සුරැකුම්පත් [යොමුව සටහන 20 (ආ)]	**1,675,748**	1,782,337	**1,675,748**	1,782,337
ඒකක භාර	**–**	–	**303,806**	–
උප එකතුව	**11,221,746**	11,459,882	**23,617,944**	22,130,273
සාධාරණ අගයට නම් කළ	**–**	–	**–**	–
එකතුව	**11,221,746**	11,459,882	**23,617,944**	22,130,273

20. (අ) විශ්ලේෂණය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
සුරැකුම්කරණය තුළින්				
සුරැකුම් ලෙස ගිවිසින ලද	**–**	–	**9,355,916**	10,216,289
තබා නොමැති	**11,221,746**	11,459,882	**14,262,028**	11,913,984
දළ එකතුව	**11,221,746**	11,459,882	**23,617,944**	22,130,273
ව්‍යවහාර මුදල් ඒකක වශයෙන්				
ශ්‍රී ලංකා රුපියල්	**11,221,746**	11,459,882	**23,617,944**	22,130,273
ඇමෙරිකානු ඩොලර්	**–**	–	**–**	–
දළ එකතුව	**11,221,746**	11,459,882	**23,617,944**	22,130,273

20. ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

20. (ආ) හිමිකම් සුරැකුම්පත් (නිල ලැයිස්තුගත) - බැංකුව හා සමූහය →

දෙසැම්බර් 31 දිනට	2020			2019		
	කොටස් ගණන	පිරිවැය රු. '000	වෙළඳ අගය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	වෙළඳ අගය රු. '000
1. බැංකු රක්ෂණ සහ මූල්‍ය ක්ෂේත්‍රය						
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී	**1,030,963**	**143,015**	**83,405**	1,007,399	141,001	95,703
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ඡන්දය රහිත)	**285,726**	**34,889**	**20,029**	278,511	34,332	23,116
ඩී එෆ් සී සී බැංකුව	**432,556**	**86,002**	**28,246**	430,000	85,787	39,517
හැටන් නැෂනල් බැංකුව (ඡන්දය රහිත)	**300,837**	**30,652**	**30,264**	293,163	50,465	39,724
එල් ඕ එල් සී ෆිනෑන්ස් පීඑල්සී	**3,628,769**	**40,148**	**13,064**	3,628,769	40,148	14,152
සම්පත් බැංකුව	**556,917**	**147,608**	**75,518**	556,917	147,608	90,443
නේෂන් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී	**2,331,061**	**143,948**	**139,864**	–	–	–
		626,261	**390,390**		499,341	302,655
2. රසායනික හා ඖෂධ ක්ෂේත්‍රය						
සී අයි සී හෝල්ඩින්ග්ස් පීඑල්සී	–	–	–	68,029	7,792	4,082
හේකාබ් පීඑල්සී	–	–	–	169,474	31,751	32,200
		–	–		39,543	36,282
3. ඉදිකිරීම් හා ඉංජිනේරු ක්ෂේත්‍රය						
ඇක්සෙස් ඉන්ජිනියරින් පීඑල්සී	**3,470,023**	**132,692**	**85,363**	3,470,023	132,692	75,647
කලම්බු ඩොක්යාර්ඩ් පීඑල්සී	**1,212,327**	**270,607**	**103,411**	1,212,327	270,607	75,164
		403,299	**188,774**		403,299	150,811
4. විවිධාංගකෘත ක්ෂේත්‍රය						
එයිට්කන් ස්පෙන්ස් පීඑල්සී	**2,493,516**	**294,681**	**144,125**	2,493,516	294,681	115,948
බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට් පීඑල්සී	**2,327,153**	**11,636**	**10,007**	2,927,153	14,636	14,636
හේලීස් පීඑල්සී	–	–	–	123,026	41,512	21,517
හේමාස් හෝල්ඩින්ග්ස් පීඑල්සී	**673,843**	**47,288**	**67,317**	673,843	71,659	53,907
ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී	**1,361,630**	**190,726**	**203,700**	911,630	152,795	152,789
රිචර්ඩ් පීරිස් ඇන්ඩ් කම්පනි පීඑල්සී	–	–	–	2,924,320	27,557	34,507
වැලිබල් වන් පීඑල්සී	**2,485,454**	**57,397**	**64,622**	3,269,832	75,511	57,222
		601,729	**489,771**		678,351	450,526
5. හෝටල් හා සංචාරක ක්ෂේත්‍රය						
ඒෂියන් හොටෙල්ස් ඇන්ඩ් ප්‍රොපටීස් පීඑල්සී	**1,366,132**	**106,609**	**58,607**	1,366,132	106,609	55,328
එයිට්කන් ස්පෙන්ස් හොටෙල් හෝල්ඩින්ග්ස් පීඑල්සී	**2,102,133**	**188,903**	**67,899**	2,102,133	188,903	56,968
සිලෝන් හොටෙල්ස් කෝපරේෂන් පීඑල්සී	**3,975,017**	**128,776**	**53,663**	3,975,017	128,776	46,905
ජෝන් කීල්ස් හොටෙල්ස් පීඑල්සී	**2,011,205**	**37,557**	**22,123**	2,011,205	37,557	23,330
ලයිට් හවුස් හොටෙල්ස් පීඑල්සී	**1,175,667**	**71,492**	**41,854**	1,175,667	71,492	43,382
මාරවිල රිසෝට්ස් පීඑල්සී	**699,556**	**5,915**	**1,469**	699,556	5,915	1,399
කින්ග්ස්බරි පීඑල්සී	**2,871,666**	**65,038**	**34,173**	2,871,666	65,038	37,619
ජෙට්වින්ග් සිම්ෆනි ලිමිටඩ්	**1,300,000**	**19,500**	**12,480**	1,300,000	19,500	14,690
		623,791	**292,268**		623,790	279,621

20. ලාභ/අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

20. (ආ) හිමිකම් සුරැකුම්පත් (නිල ලැයිස්තුගත) - බැංකුව හා සමූහය (සම්බන්ධයි)

දෙසැම්බර් 31 දිනට	2020			2019		
	කොටස් ගණන	පිරිවැය රු. '000	වෙළඳ අගය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	වෙළඳ අගය රු. '000
6. ආයෝජන භාර						
රේණුකා හෝල්ඩින්ග්ස් පීඑල්සී (ඡන්දය රහිත)	**466,438**	**11,307**	**5,131**	466,438	11,307	6,297
		11,307	**5,131**		11,307	6,297
7. ඉඩම් සහ දේපළ ක්ෂේත්‍රය						
ඕවර්සීස් රියැලිටි(සිලෝන්) පීඑල්සී	**943,473**	**23,777**	**13,586**	943,473	23,777	15,096
		23,777	**13,586**		23,777	15,096
8. නිෂ්පාදන ක්ෂේත්‍රය						
ටීජේ ලංකා පීඑල්සී	**–**	**–**	**–**	360,404	11,954	14,704
ලංකා සෙරමික් පීඑල්සී	**89,190**	**12,069**	**12,308**	89,190	12,068	12,362
රෝයල් සෙරමික්ස් ලංකා පීඑල්සී	**–**	**–**	**–**	1,748,679	221,888	154,758
ටෝකියෝ සිමෙන්ට් කම්පනි (ලංකා) පීඑල්සී	**–**	**–**	**–**	473,992	19,971	22,752
ටෝකියෝ සිමෙන්ට් කම්පනි (ලංකා) පීඑල්සී (ඡන්දය රහිත)	**–**	**–**	**–**	611,060	22,602	23,954
ඇලුමෙක්ස් පීඑල්සී	**–**	**–**	**–**	121,295	2,074	1,795
		12,069	**12,308**		290,557	230,325
9. බලශක්ති ක්ෂේත්‍රය						
එල් වී එල් එනර්ජි ෆන්ඩ් පීඑල්සී	**4,606,600**	**46,066**	**46,987**	4,606,600	46,066	34,550
		46,066	**46,987**		46,066	34,550
10. විදුලි සංදේශ සේවා ක්ෂේත්‍රය						
ඩයලොග් ඇක්සියාටා පීඑල්සී	**3,738,360**	**81,332**	**46,356**	3,738,360	81,332	45,982
		81,332	**46,356**		81,332	45,982
11. වෙළඳ ක්ෂේත්‍රය						
බ්‍රවුන්ස් සහ සමාගම පීඑල්සී	**811**	**259**	**85**	793,717	253,948	57,862
		259	**85**		253,948	57,862
12. ඒකක භාර						
කොම්ට්‍රස්ට් ඉක්විටි ෆන්ඩ්	**556,793**	**10,000**	**9,365**	556,793	10,000	9,321
සී බැන්ක් යුනිට් ට්‍රස්ට්	**7,604,797**	**85,110**	**180,728**	7,604,797	85,110	163,009
		95,110	**190,093**		95,110	172,330
එකතුව		**2,524,999**	**1,675,748**		3,046,421	1,782,337

21 ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ණය හා අත්තිකාරම් අතරට පහත දෑ හැර සක්‍රීය වෙළඳපළක මිල ප්‍රකාශ කර නොමැති ස්ථාවර හෝ නිශ්චය කළහැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් අයත් වේ.

- සමූහය විසින් වහාම හෝ නුදුරු කාලයේදී විකිණීමට අපේක්ෂිත හෝ මූලික හඳුනා ගැනීමේදී ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කළ දෑ.
- සමූහය විසින් මූලික හඳුනා ගැනීමේදී වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් ලෙස නම් කල දෑ

ණය හා අත්තිකාරම් යන්නට බැකුවලින් හා වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබියයුතු වටිනාකම් අයත් වේ. මූලික ගණනය කිරීම් වලින් අනතුරුව ණය හා අත්තිකාරම්, සඵල පොළී අනුපාතික භාවිත කරමින් අගය අඩුවීම සඳහා හානිකරණ ප්‍රතිපාදන තබමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබන්නේ සඵල පොළී අනුපාතිකයෙහි සංකලිත කොටසක් වන ගාස්තු සහ පිරිවැය හා අත්පත් කර ගැනිමේදී අත්වන කිසියම් වට්ටමක් හෝ අධිමිලක් සැලකිල්ලට ගැනීමෙනි. ආදායම් ප්‍රකාශයේ පොළී ආදායම් යටතට ක්‍රමක්ෂය අන්තර්ගත වේ. හානිකරණය මගින් උද්ගතවූ අලාභ ආදායම් ප්‍රකාශයෙහි .ණය සහ අනෙකුත් අලාභ හානිකරණ. යටතේ වාර්තා කරනු ලබයි.

2018 ජනවාරි මස 01 දින සිට පහත සඳහන් කොන්දේසි ද්විත්වයට අදාල වන අවස්ථාවලදී බැංකුව විසින් ණය හා අත්තිකාරම් ක්‍රමක්ෂය පිරිවැයට පමණක් මනිනු ලබයි.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම පිණිස මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ අරමුණ ඇතිව ව්‍යාපාරික ආකෘතියක් තුළ මූල්‍ය වත්කම් රඳවා ගනු ලබයි.
- මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත නියමයන් මගින් ගෙවියයුතු මුල් මුදල මත පොළිය හා මුල් මුදලෙහි පූර්ණ ගෙවීම් සඳහා මූල්‍ය ප්‍රවාහ නිශ්චිත දිනවල එළඹේ.

ව්‍යාවාරික ආකෘතියෙහි විස්තර පිටු අංක 150 සහ 151 හි දක්වා ඇති සටහන් අංක 2.5.1.4.1 හා 2.5.1.4.2 හි දැක්වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
දළ ණය හා අත්තිකාරම්				
ණය හානිකරණය නොවන*	**34,409,823**	31,896,777	**33,396,807**	31,916,413
1 අදියර	**453,892,412**	387,398,241	**455,676,339**	389,417,668
2 අදියර	**20,543,620**	30,227,995	**20,842,025**	30,437,953
3 අදියර	**16,941,127**	9,138,886	**18,489,542**	10,668,447
දළ ණය හා අත්තිකාරම්	**525,786,983**	458,661,898	**528,404,713**	462,440,480
අඩුකළා - පහත පරිදි සමුච්චිත හානිකරණය				
1 අදියර	**2,948,093**	1,601,273	**3,059,041**	1,707,088
2 අදියර	**897,811**	271,001	**973,686**	314,032
3 අදියර	**5,145,919**	2,394,667	**6,538,919**	3,783,076
මුළු හානිකරණය	**8,991,823**	4,266,941	**10,571,646**	5,804,195
ශුද්ධ ණය හා අත්තිකාරම්	**516,795,160**	454,394,957	**517,833,067**	456,636,285

*ප්‍රතිව්කුණුම් ගිවිසුම් යටතේ මිළදී ගත් සුරැකුම්පත් සහ තැන්පතු වලට එරෙහි ණය මේ යටතේ ප්‍රධාන වශයෙන් ඇතුලත් වේ.

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

21. (අ) නිමැවුම් අනුව විශ්ලේෂණය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
නිමැවුම් අනුව				
වෙළඳ මූල්‍ය	**–**	–	**–**	–
ශ්‍රී ලංකා මහ බැංකු භාණ්ඩාගාර බිල්පත්	**–**	–	**–**	–
කල් බදු කුලී හා ලැබිය යුතු කුලී පිට ගැනුම් (21.ඉ)	**–**	–	**521,293**	472,747
උකස්	**42,398,950**	36,754,318	**42,437,557**	36,792,150
සේවක මණ්ඩල ණය	**11,330,749**	7,565,685	**11,479,896**	7,689,104
කාලීන ණය				
කෙටි කාලීන	**595,322**	922,161	**1,112,147**	922,161
දිගු කාලීන	**462,663,155**	408,213,779	**465,085,825**	411,338,726
වෙනත්				
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	**–**	–	**–**	–
රජය ණය ලබාදීම්	**2,075,000**	2,075,000	**2,075,000**	2,075,000
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	**6,723,807**	3,130,955	**5,692,995**	3,150,592
දළ එකතුව	**525,786,983**	458,661,898	**528,404,713**	462,440,480

21. (ආ) ව්‍යවහාර මුදල් වශයෙන් විශ්ලේෂණය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
ව්‍යවහාර මුදල් වශයෙන්				
ශ්‍රී ලංකා රුපියල්	**520,402,382**	447,213,959	**523,020,112**	450,992,541
ඇමරිකානු ඩොලර්	**5,384,601**	11,447,939	**5,384,601**	11,447,939
දළ එකතුව	**525,786,983**	458,661,898	**528,404,713**	462,440,480

21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

21. (ඇ) කර්මාන්ත වශයෙන් විශ්ලේෂණය →

දෙසැම්බර් 31 දිනට	බැංකුව 2020 රු. '000	බැංකුව 2019 රු. '000	සමූහය 2020 රු. '000	සමූහය 2019 රු. '000
කර්මාන්ත වශයෙන්				
කෘෂිකාර්මික සහ ධීවර	**33,067,190**	32,854,359	**33,728,060**	33,543,973
නිෂ්පාදන	**–**	–	**767,442**	960,704
සංචාරක	**63,691**	46,264	**162,693**	136,981
ප්‍රවාහන	**1,643,128**	1,695,189	**1,720,111**	1,763,130
ඉදිකිරීම්/නිවාස	**152,457,313**	128,128,654	**152,905,473**	128,361,035
වෙළඳාම්	**–**	–	**623,817**	708,986
නව ආර්ථිකය	**–**	–	**40,889**	13,462
වෙනත්				
මූල්‍ය හා ව්‍යාපාරික සේවා	**8,540,220**	11,663,968	**8,775,528**	11,663,968
යටිතල	**96,579,186**	71,020,455	**96,742,844**	71,020,455
විදුලිබල හා බලශක්ති	**15,963,463**	12,674,792	**15,963,463**	12,674,792
අධ්‍යාපනය	**9,071,736**	36,724,769	**9,084,023**	36,724,769
පුද්ගලික/උකස්/වෙනත්	**208,401,056**	163,853,448	**207,890,370**	164,868,223
දළ එකතුව	**525,786,983**	458,661,898	**528,404,713**	462,440,480

සටහන: මාර්තු 11 වන දිනට කොතලාවල ආරක්ෂක විද්‍යාලයේ අයවිය යුතු හිඟ ණය රුපියල් මිලියන 26,907.85 ක් ණයකර ලෙස (භාණ්ඩාගාර ඇපකරයෙන් ආවරණය වන පරිදි) පරිවර්තනය කර ඇත. එබැවින් එය 2020 දෙසැම්බර් 31 දිනට ණය සහ අත්තිකාරම් සිට ණය සහ වෙනත් උපකරණ ලෙස වර්ගීකරණය කර ඇත.

තවද, 2021 ජනවාරි 01 වෙනිදා සිට බලපැවැත්වෙන පරිදි බැංකුව විසින් මාර්ග සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු රුපියල් මිලියන 59,365.66 ක ණය මුදල, ණයකරයක් (භාණ්ඩාගාර ඇපකරයෙන් ආවරණය වන පරිදි) බවට පරිවර්තනය කොට ඇත.

21. (ඈ) වර්ෂය තුළ හානිකරණයන්ගේ වෙනස්වීම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

කේවල හානිකරණ ඇගයීම

ක්‍රමක්ෂය පිරිවැයට පවතින (බැංකුවලින් අයවිය යුතු මුදල්, ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා ලැබිය යුතු දෑ මෙන්ම කල් පිරෙන තෙක් දරා සිටින ආයෝජන වැනි) මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, වෙන් වෙන්ව ගත්විට හෝ සාමූහිකව ගත්විට සැලකිය යුතු මූල්‍ය වත්කම්වල හානිකරණය පිළිබඳ හෝ වෙන් වෙන්ව ගත්විට සැලකිය යුතු නොවන මූල්‍ය වත්කම් වල හානිකරණය පිළිබඳ විෂයය මූලික සාක්ෂි ඇත්දැයි සමූහය විසින් පළමුව ඇගයීමක් සිදුකරනු ලබයි. වෙන් වෙන්ව ඇගයීමක් සිදුකරන ලද මූල්‍ය වත්කම්වල හානිකරණය සම්බන්ධයෙන් විෂය මූලික සාක්ෂි නොමැති බවට සමූහය තීරණය කරන්නේ නම් එකී වත්කම් සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කණ්ඩායමකට ඇතුලත් කර, ඒ සියල්ලම හානිකරණය පිළිබඳ සාමූහික ඇගයීමකට ලක් කරයි.

වෙන් වෙන් වශයෙන් හානිකරණය සම්බන්ධව කළ ඇගයීමේදී හානිකරණය පිළිබඳ අගය අඩුවීම් ඇති බවට හෝ දිගටම පවතින බවට හඳුනා ගන්නා මූල්‍ය වත්කම් මෙකී සාමූහික ඇගයීමට යොදා නොගනී.

21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

21. (ඇ) වර්ෂය තුළ හානිකරණයන්ගේ වෙනස්වීම් (සම්බන්ධයි)

හානිකරණයක් සිදුවී ඇති බවට විෂය මුලික සාක්ෂි ඇත්නම්, වත්කමෙහි ධාරණ අගය සහ තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහයෙහි වත්මන් අගය (දැනට ඇති නොවුණු අනාගතයේදී ඇති විය හැකි බවට අපේක්ෂිත ණය පාඩු හැරුණු කොට) අතර වෙනස අනුව එකී අලාභය මනිනු ලබයි. වත්කමෙහි ධාරණ අගය ගැලපීම ගිණුමක් මගින් අඩු කරනු ලබන අතර, ආදායම් ප්‍රකාශයෙහි එම අලාභය වාර්තා කරනු ලබයි. හානිකරණය වන්නා වූ අලාභ ගණනය කිරීමේ අරමුණ සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගත් පොළී අනුපාතය භාවිතා කරමින් වත්කමෙහි අඩුකළ ධාරණ අගය මත පොළී ආදායම නොකඩවා උපචිත කිරීම සිදු කරයි. පොළී සහ ඒ හා සමාන ආදායම්හි කොටසක් ලෙස පොළී ආදායම වාර්තා කෙරෙයි.

ඇස්තමේන්තු කරන ලද අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි වත්මන් අගය මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාත මත වට්ටම් කරනු ලබයි. යම් ණය මුදලක පොළී අනුපාතය විචල්‍ය නම්, හානිකරණ අගය ගණනය කිරීම සඳහා වත්මන් සඵල පොළී අනුපාතය යොදා ගනී. සමූහය විසින් ගනුදෙනු කළ හැකි වත්කම්, ණය හා ලැබිය යුතු දෑ ලෙස නැවත වර්ගීකරණය කර ඇත්නම් හානිකරණ අලාභ ගණනය කිරීම සඳහා යොදා ගන්නේ යළි වර්ගීකරණ දිනයේදී තීරණය කරනු ලබන නව සඵල පොළී අනුපාතයයි. සුරැකුම් වශයෙන් තබන ලද මූල්‍ය වත්කම්වල ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහ වර්තමාන වටිනාකමට ගණනය කිරීමේදී එම උකස් තබන ලද දේපළ විකිණීමට හැකි හෝ නොහැකි වුවද, අදාළ මුදල් ප්‍රවාහයෙන් තීරණය වන්නේ එම සුරැකුම් ලබාගැනීමේ හා විකිණීමේ පිරිවැය අඩුකළ වටිනාකමය.

අනාගතයේදී යළි අයකර ගතහැකි බවට යථාර්තවාදී අදහසක් නොමැතිවිට සහ සියලු සුරක්ෂිතයන් උපලබ්ධි වී ඇති විට හෝ සමූහයට මාරුකර ඇති විට ණය ඊට අනුබද්ධ ගැලපීම් මගින් ලියා හැරීම සිදුකරනු ලැබේ. පසුකාලීන වර්ෂයකදී හානිකරණය සඳහා අදාළ ගැලපීම් සිදුකිරීමෙන් පසු සිදුවූ සිද්ධියක් නිසා තක්සේරු කරන ලද හානිකරණ අලාභය ඉහළ යාමක් හෝ පහළ යාමක් සිදුවුවහොත් ගැලපුම් ගිණුම ගලපා මීට පෙර හඳුනාගත් හානිකරණ පාඩුව වැඩිකිරීම හෝ අඩුකිරීම සිදු කරනු ලබයි. අනාගතයේදී, ලියාහරින ලද හානිකරණයන් අය කර ගනු ලැබුවහොත් එය ණය අලාභ වියදම් වෙත බැර කරනු ලබයි.

සාමූහික හානිකරණ ඇගයීම

වෙන් වෙන්ව අගයනු ලබන මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් හානිකරණය පිළිබඳ විෂය මූලික සාක්ෂි නොමැති බවට සමූහය විසින් තීරණය කරනු ලැබුවහොත් සමාන ණය අවදානම් ගුණාංග පවතින මූල්‍ය වත්කම් සහිත කණ්ඩායමක වත්කමක් ලෙස එම මූල්‍ය වත්කම ඇතුළත් කර හාණිකරණය සම්බන්ධයෙන් සාමූහිකව ඇගයීමට ලක් කරනු ලැබේ.

හානිකරණය පිළිබඳව සාමූහිකව අගයනු ලබන මූල්‍ය වත්කම් කාණ්ඩයක අනාගත මූල්‍ය ප්‍රවාහ තක්සේරු කරනුයේ කාණ්ඩයේ වත්කම් වලට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත වත්කම් වල අතීත අලාභ අත්දැකීම් මත පදනම් වෙමිනි.

අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි තක්සේරු කළ වෙනස්වීම්, වසරින් වසර නිරීක්ෂණය කළ හැකි අන්තවලට, සම්බන්ධ වෙනස්වීම් (විරැකියා අනුපාත, දේපළ මිල, පාරිභෝගික භාණ්ඩ මිල, ගෙවීමේ තත්ත්වයන් හෝ කාණ්ඩයට ඇති වූ අලාභ හා ඒවායේ ප්‍රමාණය දක්වන වෙනත් කරුණු ආදියේ වෙනස්වීම්) පිළිබිඹු කරයි. තක්සේරු කරන ලද අලාභ හා සත්‍ය අලාභ අත්දැකීම් අතර වෙනස්කම් අවම කිරීම සඳහා අනාගත මූල්‍ය ප්‍රවාහ තක්සේරු කිරීම සඳහා යොදගනු ලබන ක්‍රමවේද හා උපකල්පන නිරතුරුව සමාලෝචනය කෙරෙයි.

ණය හා අත්තිකාරම් කපා හැරීම

ශ්‍රී ල.ගි.ප්‍ර.39 යටතේ වූ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.9 යටතේද එලෙසම පවතී. අයකරවා ගැනීමට හැකි සෑම පියවරක්ම ගෙන අවසන් වූ පසුව සහ ආපසු ණය අයකර ගැනීමේ යථාර්ථවාදී පසුබික් නොමැති අවස්ථාවලදී සාමාන්‍යයෙන් මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් ණය කපා හරිනු ලැබේ. ණය සඳහා සුරැකුම් ඇති විට සාමාන්‍යයෙන් සුරැකුම් උපලබ්ධියෙන් මුදල් ලැබීමෙන් පසු කරනු ලැබේ. කපා හැරිය යුතු දීමනාව සමුච්චිත අලාභ දීමනාව වඩා වැඩිවන අවස්ථාවකදී එකී වෙනස, දීමනාවට එක් වියයුතු එකතුවක් ලෙස පළමුව සලකනු ලබන අතර අනතුරුව දළ ධාරණ අගයට එරෙහිව යොදාගනු ලැබේ. කපාහැරීමක් පසුව හඳුනාගත හොත් එය වෙනත් මෙහෙයුම් ආදායමට බැර කෙරෙයි.

සුරැකුම් තක්සේරුකරණය

මූල්‍ය වත්කම්වල අවදානම අවම කර ගැනීම පිණිස සමූහය විසින් හැකි අවස්ථාවලදී සුරැකුම් උපයෝගී කරගනු ලබයි. මුදල්, රත්රන්, රාජ්‍ය සුරැකුම්පත් යනාදී විවිධ ස්වරූපයෙන් සුරැකුම් පවතියි. මෙලෙස සුරැකුම් ලෙස රඳවාගනු ලබන මූල්‍ය වත්කම් ආගණනය කිරීම සඳහා බැංකුව විසින් හැකිතාක් දුරට සක්‍රීය වෙළඳපළ දත්ත උපයෝගී කර ගනු ලබයි.

හානිකරණ ප්‍රතිපත්ති පිළිබඳ විස්තර පිටු අංක 154 හි සටහන් අංක 2.5.2 මගින් දැක්වේ.

21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

21. (ඈ) වර්ෂය තුළ හානිකරණයන්ගේ වෙනස්වීම් (සම්බන්ධයි)

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
1 අදියර				
ජනවාරි 01 දිනට ශේෂය	**1,601,273**	1,610,731	**1,707,088**	1,610,731
ව්‍යාපාරික ඒකාබද්ධකිරීම් හරහා අත්පත් කර ගැනීම්	**–**	–	**–**	84,481
ආදායම් ප්‍රකාශයට ගැලපීම	**1,346,820**	(9,458)	**1,351,953**	11,876
වර්ෂය තුළ කපාහැරීම්	**–**	–	**–**	–
වෙනත් සංචලන	**–**	–	**–**	–
දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,948,093**	1,601,273	**3,059,041**	1,707,088
2 අදියර				
ජනවාරි 01 දිනට ශේෂය	**271,001**	272,348	**314,032**	272,348
ව්‍යාපාරික ඒකාබද්ධකිරීම් හරහා අත්පත් කර ගැනීම්	**–**	–	**–**	43,159
ආදායම් ප්‍රකාශයට ගැලපීම	**626,810**	(1,347)	**659,654**	(1,476)
වර්ෂය තුළ කපාහැරීම්	**–**	–	**–**	–
වෙනත් සංචලන	**–**	–	**–**	–
දෙසැම්බර් 31 දිනට ශේෂය	**897,811**	271,001	**973,686**	314,032
3 අදියර				
ජනවාරි 01 දිනට ශේෂය	**2,394,667**	1,963,230	**3,783,076**	1,963,230
ව්‍යාපාරික ඒකාබද්ධකිරීම් හරහා අත්පත් කර ගැනීම්	**–**	–	**–**	1,389,693
ආදායම් ප්‍රකාශයට ගැලපීම	**2,763,609**	447,061	**2,783,032**	450,255
වර්ෂය තුළ කපාහැරීම්	**(12,358)**	(15,624)	**(12,358)**	(15,624)
වෙනත් සංචලන	**–**	–	**(14,831)**	(4,478)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**5,145,919**	2,394,667	**6,538,919**	3,783,076
දෙසැම්බර් 31 දිනට මුළු හානිකරණ ප්‍රතිපාදන	**8,991,823**	4,266,941	**10,571,646**	5,804,195

21. (ඉ) ලැබිය යුතු කල්බදු හා කුලී පිට ගැණුම් →

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
ලැබිය යුතු දළ කල්බදු හා කුලී පිට ගැණුම්	**–**	–	**521,565**	473,018
නොපියූ පොලී වත්කම්	**–**	–	**148,555**	133,040
නොපියූ පොලී වගකීම්	**–**	–	**(148,827)**	(133,311)
ශුද්ධ ලැබිය යුතු කල්බදු හා කුලී පිට ගැණුම්	**–**	–	**521,293**	472,747

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

21. (ඊ) ණය හා අත්තිකාරම් සහ අපේක්ෂිත ණය පාඩු ප්‍රතිපාදන මත කොවිඩ් - 19 හි බලපෑම →

දළ විශ්ලේෂණය

2020 මාර්තු 11 වන දින ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් කොවිඩ් - 19 ව්‍යාප්තිය වසංගතයක් ලෙස නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. කොවිඩ් - 19 වසගතය ගෝලීය ආර්ථිකයට සැලකිය යුතු අහිතකර බලපෑමක් ඇති කරමින් පවතී. දෙවන කාර්තුවේදී වෛරසය පැතිරීම සඳහා අත්‍යවශ්‍ය නොවන ව්‍යාපාර වසා දැමීම හේතුවෙන් ආරම්භයේදී කොවිඩ් - 19 ව්‍යාප්තිය මැඩපැවැත්වීමට සමත්වූ අතර තෙවන හා සිව්වන කාර්තුවලදී මෙම පියවර අර්ධ වශයෙන් ලිහිල් කිරීමට ඉඩ ලබාදෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකයේ ඇතැම් අංශවල ක්‍රියාකාරීත්වය නැවත ආරම්භ වී තිබේ. කෙසේ වෙතත් ආසාදන අනුපාත නැවත ඉහළ යාමට ප්‍රතිචාර වශයෙන් රජය සහ ව්‍යාපාර විසින් මෑතකදී තීව්‍ර කරවා පනවන ලද පුද්ගල/සමාජ දුරස්ථ ක්‍රියාමාර්ග හේතුවෙන් ආර්ථික කටයුතු කෙරෙහි කලින් අපේක්ෂා කළ මට්ටමට වඩා බලපෑමක් ඇතිවීමේ අවදානමක් ඇත.

ආර්ථික වර්ධනය හා විරැකියාව සම්බන්ධ අඛණ්ඩ අවිනිශ්චිතතාවයන් සමඟ සමස්ත ආර්ථිකය පූර්ව වසංගත මට්ටමට වඩා අඩු මට්ටමින් ක්‍රියාත්මක වන අතර අවසානයේ එය විසඳිය හැකි වන්නේ කොවිඩ් - 19 සඳහා සාර්ථක එන්නතක් බෙදා හැරීමෙන් පමණි. එහි ප්‍රතිඵලයක් ලෙස අපි දිගටම ක්‍රියාත්මක වන්නේ අවිනිශ්චිත සාර්ව ආර්ථික පරිසරයක් තුළය. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකරණය විසින් වත්කම්, වගකීම්, ශුද්ධ ආදායම, විස්තීර්ණ ආදායම සහ අදාළ අනාවරණයන් හඳුනා ගැනීම සහ ඇගයීම කෙරෙහි බලපාන ඇස්තමේන්තු හා උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ. මූල්‍ය උපකරණ තක්සේරු කිරීම, ණය හානිකරණ පාඩු, වත්කම් හානිවීම, ආදායම් බදු, ප්‍රතිපාදන සහ අසම්භාව්‍ය වගකීම්, සේවාවසාන ප්‍රතිලාභ සහ වෙනත් දිගු කාලීන ප්‍රතිලාභ සැලසුම් යන ක්ෂේත්‍රවල සැලකිය යුතු ඇස්තමේන්තු හා උපකල්පන යොදා ගැනේ. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු හා උපකල්පන වලට වඩා වෙනස් විය හැකිය. කොවිඩ් - 19 වසංගතය ගිණුම්කරණ ඇස්තමේන්තු හා උපකල්පන කෙරෙහි ඉහළ අවිනිශ්චිතතාවයකට තුඩුදෙන බැවින් ආර්ථික හා වෙළඳපළ පරිසරය විශ්ලේෂණය කිරීමේදී සහ සැලකියයුතු ඇස්තමේන්තු සඳහා එහි බලපෑම තක්සේරු කිරීමේදී, විනිශ්චයන් යොදාගැනීමේ අවශ්‍යතාවය වැඩි කරයි. ණය හානිකරණය සඳහා දීමනාව, මූල්‍ය උපකරණ තක්සේරු කිරීම සහ වත්කම් හානි කිරීම සම්බන්ධ ඇස්තමේන්තු හා උපකල්පනවලට මෙය විශේෂයෙන් බලපායි.

මූල්‍ය උපකරණ තක්සේරු කිරීම

සාධාරණ වටිනාකම තක්සේරු කිරීම සඳහා විනිශ්චයන් යොදා ගැනීම අවශ්‍ය වේ. අවශ්‍ය වන විනිශ්චය වර්ගය සහ එහි මට්ටම බොහෝ දුරට රඳා පවතින්නේ ලබා ගත හැකි වෙළඳපල තොරතුරු ප්‍රමාණය මතය. කොවිඩ් - 19 වසංගතය වෙළඳපළ අස්ථාවරත්වය වැඩිකර ඇති අතර, ඇතැම් මූල්‍ය උපකරණවල වෙළඳපොළ වටිනාකමට අහිතකර ලෙස බලපා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සහ මූල්‍ය උපකරණ සාධාරණ වටිනාකම තීරණය කිරීමේ අපගේ ක්‍රියාවලියේ කොටසක් ලෙස වසංගතය ආරම්භයේ සිටම එම මූල්‍ය උපකරණ වලින් බොහොමයක් නියෝජනය වන සාධාරණ වටිනාකම තීරණය කිරීමට පුළුල් පරාසයක මූල්‍ය උපකරණ සඳහා ඉහළ මට්ටමේ විනිශ්චයක් අප විසින් යොදාගෙන ඇත. ණය හානිකරණ දීමනාව, මූල්‍ය උපකරණ තක්සේරු කිරීම සහ වත්කම් හානි කිරීම සම්බන්ධ ඇස්තමේන්තු හා උපකල්පනවලට මෙය විශේෂයෙන් බලපායි.

කොවිඩ් - 19 වසංගතයට ප්‍රතිචාර වශයෙන් රජයේ ණය වැඩසටහන්

අපගේ ආර්ථික දෘෂ්ටියෙන් ගම්‍ය වන්නේ වෛරසයේ දෙවන හා පසුව ඇති වන රැළි රජය ප්‍රතිචාර දක්වන ආකාරය සහ ඵලදායී ලෙස නිපදවන ලද එන්නතක් බෙදා හැරීම මත 2021 තුළ ආර්ථිකය අඛණ්ඩව යථා තත්ත්වයට පත්වීමට ඉඩ දෙනු ඇතැයි යන්නයි. ආර්ථික සංකෝචනයේ කාලසීමාව හා බරපතලකම සහ අනාගත ප්‍රකෘතියක් ඇතිවන කාලය හා ප්‍රමාණය ඇතුළුව තථ්‍ය අත්දැකීම් මෙම අපේක්ෂාවන්ට වඩා ප්‍රමාණාත්මක වශයෙන් වෙනස් විය හැකිය. එමඟින් ණය අයකර ගත හැකි ප්‍රමාණය අඩු කිරීමට හේතු වියහැකි අතර ණය හානිකරණ පාඩු සිදුවිය හැකිය. ආයතන හා පුද්ගලයන්ගේ මූල්‍ය දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව හරහා බොහෝ මූල්‍ය ආධාර වැඩසටහන් ආරම්භ කර ඇත. ණය තාවකාලිකව අයකර ගැනීම පමා කිරීමේ වැඩසටහන්, ප්‍රති මූල්‍ය පහසුකම්, කාරක ප්‍රාග්ධන ණය සහ අනුග්‍රාහක මූල්‍ය ප්‍රතිපත්ති දේශීය ආර්ථිකයට සැලකිය යුතු ධනාත්මක බලපෑමක් ඇති කරන අතර එම සියලු ක්‍රියාමාර්ග සාමූහිකව ආර්ථිකය යථා තත්වයට පත් කරනු ඇත. ණය සහන වැඩසටහන් සහ ගෙවීම් කල් දැමීමේ වැඩසටහන් වැනි ඇතැම් ක්‍රියා බැංකුවේ සඵලදායී පොළියට අහිතකර ලෙස බලපායි. කෙසේ වෙතත් පවත්නා අඩු පොලී අනුපාතයන් (තැන්පතු සඳහා) අඩු සඵලදායී පොලී අනුපාත කෙරෙහි යම් මට්ටමක් දක්වා ඇති සෘණාත්මක බලපෑම අවම කර ඇත. ඇතැම් අංශවල ඉහළ ණය ගෙවීම් පැහැර හැරීම් සහ ප්‍රමාදවීමේ සම්භාවිතාවයක් දැකිය හැකි අතර, එම අංශයන්හි ඉහළ ණය හානිකරණයක් අපේක්ෂා කළ හැකිය.

ණය සහනය හෝ ගෙවීම් කල්දැමීම ප්‍රතික්ෂේප කළ අය හැර සෙසු සියලු ගනුදෙනුකරුවන්හට බැංකුව සිය පළමු ණය සහනය සහ ගෙවීම් කල් දැමීම ලබා දී ඇත. ණය සහනය සියයට 7 ක අනුපාතයකට ලබා දී ඇති අතර ණය කාලය අවසන් වන තෙක් ගෙවීම් කල්දමා ඇත. ණය සහන කාලසීමාව මාස දෙකේ සිට මාස හයක් දක්වා ලබාදී ඇති අතර, ඉතා සීමිත අවස්ථාවලදී එය මාස හයකට වඩා දීර්ඝ කර ඇත. කොවිඩ් - 19 දෙවන රැල්ලට ප්‍රතිචාර දක්වමින් බැංකුව සිය දෙවන ණය විරාමය ඔක්තෝබර් මාසයේදී ලබාදී ඇත. සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම මාස හයක කාලයක් සඳහා කල්දැමීමට හැකියාව ඇති අතර, ණය සහන කාලය අවසානයේදී එම කාලය තුළදී අයවීමට නියමිත මුල් ණය මුදල සහ පොලිය භාණ්ඩාගාර බිල්පත් අනුපාතයට එකතු කළ පොලියක් යටතේ කාලීන ණයක් බවට පරිවර්තනය කර ඇත.

21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

21. (ඊ) ණය හා අත්තිකාරම් සහ අපේක්ෂිත ණය පාඩු ප්‍රතිපාදන මත කොවිඩ් - 19 හි බලපෑම (සම්බන්ධයි)

ණය පාඩු සඳහා දීමනාව

කොවිඩ් - 19 ව්‍යසනය හේතුවෙන් ණය අවදානමෙහි සැලකියයුතු වැඩිවීමක් ඇතිවී තිබේද යන්න තීරණය කිරීමේදී ක්‍රමයෙන් වර්ධනය වන සාර්ව ආර්ථික පරිසරය ඇගැයීම අප විසින් ගනුදෙනුකරුවන් වෙත ලබා දී ඇති විවිධ ණය සහන වැඩසටහන් ඇගයීම ඇතුලුව ව්‍යාපාර සහ පුද්ගලයන් වෙත රජය විසින් ලබාදී ඇති පෙර නොවූ විරූ සහනයන් යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ විනිශ්චයන් යොදා ගැනීම අවශ්‍ය වේ. අපගේ පුද්ගල ව්‍යාපාර සහ රජයේ සේවාදායකින් සඳහා ලබා දී ඇති විවිධ සහන වැඩසටහන්වලට අනුකූලව පොලිය හෝ මුල් මුදල ගෙවීම කල්දැමීම් ස්වයංක්‍රීයව සැලකිය යුතු ණය අවදානමක් ඇති කර නොමැති අතර හුදෙක් පෙර සඳහන් කළ ණය සහන වැඩසටහන් පමණක් දෙවන අදියර වෙත සංක්‍රමණයවීමට හේතු පාදක නොවනු ඇත.

කෙසේ වුවද, ණය මුදලක අපේක්ෂිත ජීව කාලය තුළ ණය පැහැර හැරීමේ අවදානමෙහි වෙනස්වීම් පිළිබඳ අපගේ තක්සේරුව මත පදනම්ව ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇති බව අපි තීරණය කළහොත් , එය ණය සහන වැඩසටහනට ඇතුළත්ව තිබුණද අදියර 2 ට සංක්‍රමණයවීම නොවැළැක්වෙයි. කොවිඩ් - 19 වසංගතයෙන් වඩාත් බලපෑමට ලක් වූ කර්මාන්ත තීරණය කිරීමේදී අපගේ විනිශ්චනයන් යොදාගත් අතර රජයේ ආධාර සහ ප්‍රතිලාභ සලකා බැලීමෙන් පසු අවදානම් ශ්‍රේණිගත කිරීම්වලට අදාළ බලපෑම තක්සේරු කළෙමු. ජීවකාල අපේක්ෂිත ණය පාඩු සහ මාස 12 තුළ අපේක්ෂිත ණය පාඩු යන ද්විත්වයම ගණනය කිරීමේදී බැංකුවේ අපේක්ෂිත ණය පාඩ ක්‍රමවේදය මගින් පැහැර හැරීමේ සම්භාවිතාවය (PD) පැහැර හැරීමට නිරාවරණයවීම (EAD) සහ පැහැර හැරීමකදී සිදුවිය හැකි පාඩුව (LGD) යන ප්‍රධාන සාධක තෝලනය කොට ඇත.

ප්‍රමිතිගත ව්‍යාපාර සහ රජයේ ණය කළඹ සඳහා අදාළ පැහැර හැරීමේ සම්භාවිතාවය (PD) පැහැර හැරීමට නිරාවරණයවීම (EAD) පැහැර හැරීමකදී සිදුවිය හැකි පාඩුව (LGD) යන ප්‍රධාන සාධක ශ්‍රී.ල.මූ.වා.ප්‍ර 9 යටතේ අපේක්ෂිත ණය පාඩු මැනීම සඳහා ඉදිරි දැක්මැති තොරතුරු ඇතුළත් කිරීම තුළින් තත්කාලීන පරාමිතීන් බවට පරිවර්තනය කර ඇත. ණය කළඹට අදාළ ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් තීරණය කිරීම සඳහාත්, යම්කිසි කාල පරාසයක් තුළ පවතින පරාමිතීන් තීරණය කිරීම සඳහා ඉදිරි දැක්මැති තොරතුරු ගැලපිය යුතු ප්‍රමාණය තීරණය කිරීමේදී සැලකිය යුතු විනිශ්චයන් කළයුතු වේ. කාල පරාසයක් තුළ පවතින පැහැර හැරීමේ සම්භාවිතාවය (PD) පැහැර හැරීමට නිරාවරණයවීම (EAD) පැහැර හැරීමකදී සිදුවිය හැකි පාඩුව (LGD) යම්කිසි අවස්ථාවක පවතින පරාමිතීන් බවට පරිවර්තනය කිරීම සඳහා භාවිතා කරන ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්ගේ වෙනස්වීම එක්තරා කාලපරාසයකදී අපේක්ෂිත ණය පාඩු දීමනා වැඩිකිරීමට හෝ අඩු කිරීමට හේතු විය හැකි අතර ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් ණය සිතියම්ගත කිරීමෙහි වෙනස්කම් කලාතුරකින් අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, අපගේ අනාවැකි කාර්තුමය පදනමින් යාවත්කාලීන වන බැවින් කිසියම් නිශ්චිත අවස්ථාවක පවතින පරාමිතීන් ගණනය කිරීම සඳහා භාවිතා කරන විශේෂිත ඉදිරි දැක්මැති තොරතුරු පරාමිතීන්හි වෙනස්කම් නිතර සිදු කෙරේ. ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්හි අශුභවාදී මට්ටමේ වැඩිවීම අපේක්ෂිත ණය පාඩු වැඩි කිරීමට හේතු වන අතර ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්හි සුභවාදී වෙන්වීම් අපේක්ෂිත ණය පාඩුවෙහි අඩුවීමට හේතු වේ. මෙම වැඩිවීම් හා අඩුවීම් කිසියම් විශේෂිත කාල පරිච්ඡේදයක් තුළ සැලකිය යුතු විය හැකි අතර අනාගතය පිළිබඳ අපගේ දැක්ම වෙනස් වන කාල පරිච්ඡේදයේදී එය සිදුවීමට පටන් ගනී.

මූල්‍ය උපකරණයක ජීව කාලය සම්බන්ධයෙන් ගත් කල, අපේක්ෂිත ණය අලාභය මැනීමේදී සලකා බලන උපරිම කාලසීමාව වන්නේ අප ණය අවදානමට නිරාවරණය වන උපරිම ගිවිසුම් කාලයයි. අපගේ ආකෘතිවල පෙර අත්දැකීම් හා සැසඳීමේදී පෙර නොවූ විරූ මට්ටමේ රාජ්‍ය සහයෝගයක් ඇති වර්තමාන පරිසරය තුළ ඇති ණය පාඩු සමඟ ඉදිරි දැක්මැති තොරතුරු කොතරම් දුරට සහසම්බන්ධ වනු ඇත්ද යන්න පිළිබඳ අපේ අපේක්ෂාවන් ද ඇතුළත්ව කොවිඩ් - 19 වසංගතයේ අපේක්ෂිත ණය අලාභය මැනීම සඳහා ක්ෂේත්‍ර ගණනාවකට අදාළව ඉහළ මට්ටමේ නිරීක්ෂණයන් යො ගැනීමට සිදුවිය.

කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ඇතැම් කර්මාන්ත සහ කළඹ වෙත ඇති විය හැකි සෘණාත්මක බලපෑමේ ප්‍රමාණය තීරණය කිරීම සඳහාත් රජයේ විවිධ ආධාර වැඩසටහන් මඟින් ණය පාඩු සීමා කළහැකි ප්‍රමාණය තීරණය කිරීම සඳහාත් අප විසින් නිරීක්ෂණයන් යොදා ගතිමු. බහුවිධ අවස්ථා සඳහා ඉදිරි දැක්මැති තොරතුරු පුරෝකථනය කිරීම සහ ඉහත දක්වා ඇති පරිදි සිදුවීම් සඳහා බර තැබීමේ සම්භාවිතාව තීරණය කිරීමේ දී මූල්‍ය වත්කමක් එහි මූලික හඳුනාගැනීමෙන් පසු ණය අවදානමෙහි සැලකිය යුතු වැඩිවීමක් අත්විඳ තිබේද යන්න පිළිබඳ අපේ තක්සේරුව සහ අපේක්ෂිත ණය අලාභය පිළිබඳ අපගේ තක්සේරුව යන දෙකම ඇතුළත් කළෙමු.

ප්‍රධාන ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්ට දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, විරැකියා අනුපාතය, උද්ධමන අනුපාතය, විනිමය අනුපාතය, පොලී අනුපාතය ඇතුළත් වේ. අපගේ ණය කළඹේ බහුතරයක් සඳහා ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් පිළිබඳ පුරෝකථනයන් ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී අපගේ කළමනාකාරීත්වය විසින් අභ්‍යන්තර සැලසුම් සහ පුරෝකථනයන් සඳහා යොදාගනු ලබන මූලික සිද්ධි සහ ඇතිවීමේ වැඩි සම්භාවිතාවයක් ඇති සිද්ධි යොදා ගැනේ. මූලික සිද්ධි සැකසීමේදී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර සංවිධාන සහ ශ්‍රී ලංකා මහ බැංකුව වැනි මූල්‍ය බලධාරීන්ගේ මෙන්ම පෞද්ගලික අංශයේ ආර්ථික විද්‍යාඥයින්ගේ පුරෝකථනයන් අපි සලකා බලන්නෙමු. ඇති විය හැකි මූලික සිද්ධි ත්ත්ත්වයට ඉහළින් සහ පහළින් ඇති බාහිර පුරෝකථනයන් සහ කළමනාකරණ විනිශ්චයන් යොදා ගනිමින් වාසිදායක සිද්ධි ත්ත්ත්වය සහ අවාසිදායක සිද්ධි තත්ත්වයන්ට අදාළව සම්භාවිතාවය බර තැබීම සඳහා අප විසින් කළමනාකරණ විනිශ්චයන් යොදා ගැනේ. ඉදිරි දැක්මැති තොතුරු පිළිබඳ අපගේ අපේක්ෂාව සුබවාදී නොවීම සිදුවිය හැකි අවාසි සිද්ධි තත්ත්වයේ සම්භාවිතාවය වැඩිවීමක් හෝ වාසිදායක සිද්ධි තත්ත්වයේ සම්භාවිතාවය අඩුවීම ඇස්තමේන්තුගත අපේක්ෂිත ණය පාඩු දීමනාව වැඩි කරයි.

21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

21. (ඊ) ණය හා අත්තිකාරම් සහ අපේක්ෂිත ණය පාඩු ප්‍රතිපාදන මත කොවිඩ් - 19 හි බලපෑම (සම්බන්ධයි)

ණය පාඩු සඳහා දීමනාව (සම්බන්ධයි)

ඊට හාත්පසින්ම වෙනස්ව, පුරෝකථනය කරන ලද ඉදිරි දැක්ම තොරතුරු පිළිබඳ අපගේ දෘෂ්ටියේ වැඩි දියුණුවක්, වාසිදායක සිද්ධි ත්ත්ත්වයේ සම්භාවිතාවය වැඩිවීමක් හෝ අවාසිදායක සිද්ධි තත්ත්වයේ සම්භාවිතාවය අඩුවීමක් ප්‍රතිවිරුද්ධ බලපෑමක් ඇති කරයි. විචල්‍යයන්ගේ අන්තර් සම්බන්ධතාවය, යම් සිද්ධියකට ආවේණික වූ අශුභවාදී මට්ටම සහ එය සම්භාවිතාවයේ අන්තර් සම්බන්ධතාවය හේතුවෙන්, යම් සිද්ධියකට අදාළව පවතින විවිධ ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන්ගේ වෙනස්වීමේ බලපෑම අර්ථවත් ලෙස වෙන් වෙන්ව ගත නොහැක. අපගේ පුරෝකථන මගින් කොවිඩ් - 19 වසංගතයේ ආර්ථික බලපෑම පිළිබඳ බොහෝ උපකල්පන සහ අවිනිශ්චිතතාවයන් පිළිබිඹු වන බැවින් කොවිඩ් 19 වසංගතයට අදාළව ඉදිරි දැක්මැති තොරතුරු පුරෝකථනය කිරිමට සහ එම තත්ත්වයන්ට අදාළව බර තැබීම් තීරණය කිරීම සඳහා ක්ෂේත්‍ර ගණනාවකට අදාළව විනිශ්චයන් ඉහළ නැංවීමට සිදුවිය. එය අවසානයේදී රඳා පවතින්නේ ඵලදායී එන්නතක් මහා පරිමාණයෙන් නිපදවා පරිපාලනය කළ හැකි වේගය සහ අතරමැදි කාලය තුළ වෛරසය නැවත ව්‍යාප්තවීම තුළ ඇතිවිය හැකි වසංගත හා ආර්ථික බලපෑම්, ඵලදායී ලෙස සීමා කිරීමට රජය, ව්‍යාපාර සහ සෞඛ්‍ය සේවා පද්ධති සතු හැකියාව මතය. වර්තමාන වර්ෂයට අදාළව අපගේ පුරෝකථනයන්හි සැලකිය යුතු වෙනස්කම් සිදු කරන ලදී. අපගේ අපේක්ෂිත ණය අලාභය තක්සේරු කිරීම සඳහා භාවිතා කරන තොරාගත් ඉදිරි දැක්මැති තොරතුරු විචල්‍යයන් සඳහා මූලික සිද්ධි තත්ත්වය, වාසිදායක සිද්ධි තත්ත්වය සහ අවාසිදායක සිද්ධි තත්ත්වයන්ට අදාළ අවස්ථා පිළිබඳ පුරෝකථනයන් පහත වගුව මගින් සපයයි.

මූලික සිද්ධි පුරෝකථනය (25%)	2021	ඊළඟ අවුරුදු 6ක සාමාන්‍ය
දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය	2.80%	4.65%
උද්ධමනය (YoY)	4.88%	5.03%
පොලී අනුපාතය	6.56%	6.55%
විනිමය අනුපාතය (ඇ.ඩො.රු.)	197.05	244.62
විරැකියාව	5.42%	5.42%
වාසිදායක සිද්ධි පුරෝකථනය (25%)		
දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය	4.73%	6.62%
උද්ධමනය (YoY)	4.61%	4.56%
පොලී අනුපාතය	6.24%	5.77%
විනිමය අනුපාතය (ඇ.ඩො.රු.)	189.50	204.23
විරැකියාව	5.37%	5.30%
අවාසිදායක සිද්ධි පුරෝකථනය (50%)		
දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය	-3.00%	-0.18%
උද්ධමනය (YoY)	6.58%	7.00%
පොලී අනුපාතය	6.91%	7.45%
විනිමය අනුපාතය (ඇ.ඩො.රු.)	221.47	330.00
විරැකියාව	5.47%	5.54%

21. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා අත්තිකාරම් (සම්බන්ධයි)

21. (ඊ) ණය හා අත්තිකාරම් සහ අපේක්ෂිත ණය පාඩු ප්‍රතිපාදන මත කොවිඩ් - 19 හි බලපෑම (සම්බන්ධයි)

කළමනාකරණ ආවරණ භාවිතයි

අපේක්ෂිත ණය අලාභ දීමනා ඇස්තමේන්තු සඳහා කළමනාකරණ ආවරණ යනු අපගේ පවත්නා යෙදවුම්, උපකල්පන සහ ආකෘති ශිල්පීය ක්‍රම අදාළ සියලු අවදානම් සාධක ග්‍රහණය කර නොගන්නා බවට අප විනිශ්චය කරන අවස්ථාවන්හිදී භාවිතා කරන ගැලපුම් වේ. නව සාර්ව ආර්ථික, ක්ෂුද්‍ර ආර්ථික හෝ දේශපාලන සිදුවීම්වල මතුවීම්, අපගේ වර්තමාන පරාමිතීන් තුළ ඇතුළත් නොවන පරාමිතීන්, ආකෘති හෝ දත්තවල අපේක්ෂිත වෙනස්කම්, අභ්‍යන්තර අවදානම් ඇගයීම් සංක්‍රමණ හෝ ඉදිරි දැක්මැති තොරතුරු එවැනි තත්වයන්ට උදාහරණ වේ.

වත්මන් ආවරණය තුළ ගැබ්වී ඇති අවිනිශ්චිතතාවට පිළියම් ලෙස ඇතැම් ව්‍යාපාර සංක්‍රමණ කෙරෙහි කොවිඩ් 19 මගින් ඇති කළහැකි බලපෑම් සම්බන්ධයෙන් සහ එම නිරාවරණ සඳහා අපේක්ෂිත ණය අලාභය මැනීම සම්බන්ධයෙන් සහ එම අවදානම්වලට වඩාත් ලක්විය හැකි බවට අපි විශ්වාස කරනු ලබන රාජ්‍ය නිරාවරණයවීම් සම්බන්ධයෙන් අපි කළමනාකරණ ආවරණ භාවිත කළෙමු. මෙම ආවරණ තීරණය කිරීමේදී රජයේ සහන ක්‍රියාමාර්ග මගින් අපගේ ආකෘතීන් මත දැනටමත් පිළිඹිබු නොවන මට්ටමට සලකා බැලිණි. මීට අමතරව, පාරිභොගික නිරාවරණ විතැන් කිරීම සඳහා රජයේ සහාය සහ සේවාදායකයින්ගේ සහන ක්‍රියාමාර්ගවල බලපෑම සහ එම නිරාවරණ සඳහා අපේක්ෂිත ණය අලාභය මැනීම සම්බන්ධයෙන් කළමනාකරණ ආවරණ යොදන ලදී. කළමනාකරණ ආවරණ භාවිත කිරීම සඳහා පිළිගත් අපේක්ෂිත ණය පාඩු දීමනා ප්‍රමාණයට බලපාන සැලකිය යුතු විනිශ්චයක් යෙදීම අවශ්‍ය වේ. තථ්‍ය ණය පාඩු අපගේ ඇස්තමේන්තු වලින් බොහෝ සෙයෙන් වෙනස් විය හැකිය.

ගනුදෙනුකරුවකුට ණය අත්හිටුවීමක් හෝ ගෙවීම් කල්දැම්මක් ලබාදී නොමැති නම් (පාරිභෝගිකයා එය ලබා ගැනීම ප්‍රතික්ෂේප කරන ලදුව) එම ගනුදෙනුකරුවන් සාමාන්‍ය ණය හානිවීමේ ක්‍රියාවලිය හරහා ගමන් කරයි. කෙසේ වෙතත් ණය අත්හිටුවීම ගෙවීම්කල්දැම්ම යන කාණ්ඩවලට ඇතුළත් වුවද සියලුම පාරිභෝගිකයන් සඳහා ඉදිරි පැහැර හැරීම්වල සම්භාවිතාව අදාළ වේ.

අගුළු ගැමීමේ නීති ක්‍රියාත්මක වූ විගසම මාර්තු මස අවසානයේදී පළමු වරට ගෙවීම් කල්දැමීම ඉදිරිපත් කරන ලද අතර ගනුදෙනුකරුවන්ගේ තත්වයන් පිළිබඳ වැඩි තොරතුරු ලබාගත නොහැකි විය. ගෙවීම් සහන භාවිත කරන ගනුදෙනුකරුවන් පිළිබඳ වැඩිදුර තක්සේරු කිරීම සඳහා කාලය දීර්ඝ කර ඇති අතර අමතර දත්ත දැන් ලබාගත හැකිය. තක්සේරුව තනි මට්ටමින් සහ සාමූහික නිරාවරණ මට්ටමින් පවත්වා ඇත. ණය සහන ලබාදී ඇති ගනුදෙනුකරුවන් සඳහා ණය හානිකරණය තක්සේරු කිරීම සඳහා බැංකුව පහත පියවර ගෙන ඇත.

- තාවකාලික ආදායම් අඩු කිරීමක් හෝ දීර්ඝ කාලීන මූල්‍ය අර්බුදයක් ඇති ගනුදෙනුකරුවන් සහ අපේක්ෂිත ප්‍රකෘති කාලය සහ අවස්ථාව
- ණය ගැනුම්කරුවන්ගේ අතීත ගෙවීම් රටාව (නිතර පැහැර හරින අය)
- ගෙවීම් කල්දැමීම් ඉල්ලා සිටින අවස්ථාවේදී ගනුදෙනුකරුවන්ගෙන් ලබාගත් තොරතුරු
- කළමනාකරණ විනිශ්චය උපයෝගී කර ගැනීම

කොවිඩ් 19 වසංගතය (සංචාරක, ගුවන් සේවා, ආගන්තුක සත්කාරය සහ විවේකය, ප්‍රවාහන, පාරිභෝගික භාණ්ඩ, මෝටර් වාහ, විනෝදාස්වාද අංශ වැනි) සෘජුවම බලපාන ඇතැම් අංශවල නිරාවරණ සඳහා වන පැහැර හැරීම් මට්ටම් හේතුවෙන් අපේක්ෂිත ණය පාඩුව සඳහා අහිතකර ලෙස බලපානු ඇත. මුලදී අදියර 1 යටතේ වර්ග කල ඉහත ක්ෂේත්‍රයන්ට අදාල පුද්ගලික ණය හා අත්තිකාරම් අදියර 2ට මාරු කරන ලදී. එම හේතුවෙන් රු. මිලියන 4791.5ක ණය හා අත්තිකාරම් අදියර 1 සිට අදියර 2ට මාරු කල අතර ඒ හේතුවෙන් හානිකරණ ප්‍රතිපාදන රු. මිලියන 374.4 කින් 2020 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂයට වැඩිවිය.

	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	ශුද්ධ බලපෑම රු. '000
නිරාවරණය	(4,791,567)	4,791,567	–
හානිකරණ ප්‍රතිපාදන	(53,378)	427,770	374,393

සියලුම ආයතනික සේවාදායකයින් ඔවුන්ගේ අතීත ගෙවීම් රටා, ඔවුන්ගේ අංශයට හා භූගෝලීය ප්‍රදේශයට කොවිඩ් 19 ආර්ථික බලපෑම, ක්ෂේත්‍රයේ අපේක්ෂිත ප්‍රකෘතිය, ආයතනයේ මූල්‍ය ශක්තිය, රජයේ සහ මහ බැංකු සහාය සහ වෙනත් සාධක මත පදනම්ව තනි තනිව ඇගයීමට ලක් කරන ලදී. අපගේ තක්සේරුව මත පදනම්ව සමහර ණය ගැතියන් පළමු අදියර සිට දෙවන අදියර දක්වා (SICR) ගෙන ගිය අතර සමහර ණය ගැතියන් ඔවුන්ගේ අතීත ගෙවීම් තත්ත්වය නොතකා දෙවන අදියර සිට තුන්වන අදියර දක්වා (අපේක්ෂිත මුදල් ප්‍රවාහ දුර්වලතා හේතුවෙන්) ගෙන යන ලදී.

තනි ණය ගැනුම්කරුවන් සඳහා කළඹ මට්ටමේ හානිකරණ තක්සේරු කිරීම් සිදු කරන ලදී. කෙසේ වෙතත්, සමහර වඅස්ථාවලදී, දිගුකාලීන ණය සහන හෝ කල් දැම්ම පිළිබඳ පාරිභෝගික ඉල්ලීමෙහි සාධාරණත්වය තක්සේරු කිරීමට කළමනාකරණ විනිශ්චය භාවිත කරන ලදී. ණය ගැනුම්කරුවන්ට ඔවුන්ගේ අංශය සහ කළමනාකරණ විනිශ්චය මත පදනම්ව අදියර අතර වෙන් කරන ලදී. අපගේ තක්සේරුව මත පදනම්ව සමහර ණයගැතියන් පළමු අදියර සිට දෙවන අදියර දක්වා (SICR) ගෙනගිය අතර සමහර ණය ගැතියන් ඔවුන්ගේ අතීත ගෙවීම් තත්ත්වය නොතකා දෙවන අදියර සිට තුන්වන අදියර දක්වා (අපේක්ෂිත මුදල් ප්‍රවාහ දුර්වලතා හේතුවෙන්) ගෙන යන ලදී.

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

22 ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමූහයට කල්පිරීම තෙක් රඳවා ගැනීමට අදහස් කරන හා හැකියාව තිබෙන ක්‍රමක්ෂය පිරිවැය - ණය ගණනය කරන මූල්‍ය වත්කම් හා වෙනත් උපකරණ නිශ්චිත කල්පිරීම් සීමා හා නිශ්චිතව තීරණය කළ හැකි ගෙවීම් සීමා සමග ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් මූලික මිනීමෙන් අනතුරුව ක්‍රමක්ෂය පිරිවැය - ණය ගණනය කරන මූල්‍ය වත්කම් හා වෙනත් උපකරණ, සඵල පොළී අනුපාතික යොදා ගනිමින් හානිකරණය අඩුකර ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. සඵල පොළී අනුපාතිකයෙහි අත්‍යන්ත කොටසක් වන අත්පත් කර ගැනීමෙහිලා අදාළ වාරික සහ ගාස්තු හෝ වට්ටම් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබයි. ආදායම් ප්‍රකාශයෙහි පොළී හා සමාන ආදායම් හි ක්‍රමක්ෂය ඇතුළත් වේ. එවන් ආයෝජන වලින් පැන නගින හානිකරණය ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ ගාස්තු යටතේ හඳුනා ගැනෙයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට ශේෂය	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත්				
භාණ්ඩාගාර බිල්පත්	**30,153,175**	21,007,006	**30,153,175**	21,007,006
භාණ්ඩාගාර බැඳුම්කර	**684,825,110**	581,623,525	**688,509,857**	585,301,537
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	**3,893,458**	416,550	**3,893,458**	416,550
ආයතනික ණය උපකරණ	**34,188,346**	9,163,833	**34,555,055**	9,419,428
භාරකාර සහතිකපත්	**1,276,258**	3,437,861	**1,276,258**	3,437,861
වාණිජ පත්‍රිකා	**–**	–	**316,270**	6,000
වෙනත් ආයෝජන	**–**	–	**165,595**	165,595
දළ එකතුව	**754,336,347**	615,648,775	**758,869,668**	619,753,977
අඩුකළා - හානිකරණය	**(103,002)**	(14,454)	**(274,734)**	(186,191)
ශුද්ධ එකතුව	**754,233,344**	615,634,321	**758,594,934**	619,567,786

22. (අ) විශ්ලේෂණය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට ශේෂය	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
සුරැකුම්කරණය මගින්				
සුරැකුම් ලෙස ගිවිසින ලද	**13,119,100**	48,813,600	**16,989,266**	52,120,996
ණය නොමැති	**741,217,247**	566,835,175	**741,880,402**	567,632,981
දළ එකතුව	**754,336,347**	615,648,775	**758,869,668**	619,753,977
ව්‍යවහාර මුදල් ඒකක අනුව				
ශ්‍රී ලංකා රුපියල්	**750,442,889**	615,232,225	**754,976,210**	619,337,427
ඇමෙරිකානු ඩොලර්	**3,893,458**	416,550	**3,893,458**	416,550
දළ එකතුව	**754,336,347**	615,648,775	**758,869,668**	619,753,977

22. ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ (සම්බන්ධයි)

22. (ආ) වර්ෂය තුළ හානිකරණ සංචලන →

දෙසැම්බර් 31 දිනට ශේෂය	බැංකුව 2020 රු. '000	බැංකුව 2019 රු. '000	සමූහය 2020 රු. '000	සමූහය 2019 රු. '000
1 අදියර				
ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**8,601**	9,072	**8,745**	9,117
ව්‍යාපාරික ඒකාබද්ධකිරීම් හරහා අත්පත් කර ගැනීම්	**–**	–	**–**	98
ආදායම් ප්‍රකාශයට ගැලපීම	**92,711**	(471)	**92,705**	(470)
වර්ෂය තුළ කපාහැරීම්	**–**	–	**–**	–
වෙනත් සංචලන	**–**	–	**–**	–
දෙසැම්බර් 31 දිනට ශේෂය	**101,312**	8,601	**101,450**	8,745
2 අදියර				
ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**5,852**	–	**5,852**	–
ආදායම් ප්‍රකාශයට ගැලපීම	**(4,162)**	5,852	**(4,162)**	5,852
වර්ෂය තුළ කපාහැරීම්	**–**	–	**–**	–
වෙනත් සංචලන	**–**	–	**–**	–
දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,690**	5,852	**1,690**	5,852
3 අදියර				
ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**–**	–	**171,595**	–
ව්‍යාපාරික ඒකාබද්ධකිරීම් හරහා අත්පත් කර ගැනීම්	**–**	–	**–**	171,595
ආදායම් ප්‍රකාශයට ගැලපීම	**–**	–	**–**	–
වර්ෂය තුළ කපාහැරීම්	**–**	–	**–**	–
වෙනත් සංචලන	**–**	–	**–**	–
දෙසැම්බර් 31 දිනට ශේෂය	**–**	–	**171,595**	171,595
දෙසැම්බර් 31 දිනට මුළු හානිකරණ ප්‍රතිපාදන	**103,002**	14,454	**274,734**	186,191

23 වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් ණයට හිමිකම් සහ ණය සුරැකුම්පත් අයත්වේ. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය ලෙසින් වර්ගීකරණය කරනු ලබන හිමිකම් ආයෝජන, උපාය මාර්ගික ආයෝජන ලෙස පවතින අයිතමයන්ය. වෙළඳපළ තත්වයන්ගේ වෙනස්වීම් වලට ප්‍රතිචාර ලෙසින් හෝ ද්‍රවශීලතාව අවශ්‍යතාවන්ට ප්‍රතිචාර ලෙසින් විකුණනු ලබන මෙම ප්‍රභේදයට අයත් ණය සුරැකුම්පත් නිශ්චිත නොවන කාලපරිච්ඡේදයකට රඳවා ගැනීමට අපේක්ෂා කරනු ලබන අයිතමයන්ය.

මූලික මිනුමෙන් පසුව වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් පසුව සාධාරණ අගයට මනිනු ලබයි. වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් පහත පරිදි ප්‍රභේද දෙකකට වර්ග කළ හැකිය.

i. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ඇති හිමිකම් උපකරණ

මූලික හඳුනාගැනීමෙන් පසුව, ශ්‍රී ල.ගි.ප්‍ර.32 මූල්‍ය උපකරණ යටතේ හිමිකම් යන්නෙහි නිර්වචනයට සරිලන අවස්ථාවලදී බැංකුව විසින් ඇතැම් විටෙක එහි හිමිකම් ආයෝජන වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට ඇති හිමිකම් උපකරණ ලෙස ආපසු හැරවිය නොහැකි පරිදි වර්ගීකරණය කරනු ලබයි. එවන් වර්ගීකරණයක් උපකරණයෙන් උපකරණය යන පදනම මත තීරණය වෙයි.

උපලබ්ධි නොවූ ලැබීම් හා අලාභ, වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතයෙහි සෘජුවම හිමිකම් ලෙස හඳුනාගනු ලබයි. මෙකී හිමිකම් උපකරණ මත ඇති වන ලැබීම් හා අලාභ යළි ලාභයක් ලෙස කිසි විටෙක ප්‍රතිචක්‍රීකරණය කරනු නොලබයි. උපකරණයෙහි පිරිවැයෙහි කොටසක් ලෙස යළි අයකර ගැනීමෙහිදී එකී අරමුදලින් බැංකුව ප්‍රතිලාභ ලබන අවස්ථාවලදී හැර ගෙවීමේ අයිතිය ස්ථාපිත කර ගන්නා අවස්ථාවලදී ලාභාංශ, වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස ලාභයට/අලාභයට හඳුනාගනු ලබයි. එබඳු අවස්ථාවලදී එකී ලැබීම්, වෙනත් විස්තීර්ණ ආදායම්හි වාර්තා කරනු ලබයි. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ඇති හිමිකම් උපකරණ හානිකරණ ඇගයීමට යටත් නොවේ.

කෙසේ වෙතත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගය යටතේ ඇති ප්‍රකාශිත වෙළඳපොළ මිලක් නොමැති සහ සාධාරණ අගය විශ්වසනීය ලෙස මිනිය නොහැකි හිමිකම් ආයෝජන පිරිවැයට මනිනු ලබයි.

ii. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ඇති ණය උපකරණ

පහත කොන්දේසි ද්විත්වයටම අනුකූල වන අවස්ථාවලදී වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට මනිනු ලබන ණය උපකරණ සඳහා සමූහය විසින් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.9 යටතේ නව වර්ගීකරණය අදාළ කරගනු ලබයි.

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම මගින් සාක්ෂාත් කරගත හැකි අරමුණු සහිත උපකරණ ව්‍යාපාරික ආකෘතියක් යටතේ රඳවාගනු ලබයි.
- මූල්‍ය වත්කම් ගිවිසුම්ගත නියමයන් SPPI පරීක්ෂාවට බඳුන් වෙයි.

වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ඇති ණය උපකරණ පාඩුව සාධාරණ අගයට මනිනු ලබන අතර එමගින් ඇතිවන ලැබීම් සහ අලාභ වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තා කරනු ලබයි. පොලී ආදායම, අපේක්ෂිත ණය පාඩු සහ ආපසු හැරවීම ආදායම් ප්‍රකාශයට හඳුනා ගනු ලබයි. හඳුනාගැනීම අත්හැරීමේදී, වෙනත් විස්තීර්ණ ආදායමට කලින් වාර්තා කරන ලද මුළු ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කරනු ලැබේ.

23. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට ශේෂය	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් [(සටහන 23 (ඇ)]				
භාණ්ඩාගාර බිල්පත්	**1,475,952**	–	**1,475,952**	–
භාණ්ඩාගාර බැඳුම්කර	**11,025,922**	–	**11,673,930**	1,009,706
හිමිකම් සුරැකුම්පත්				
නිල ලැයිස්තුගත හිමිකම් සුරැකුම්පත් [(සටහන 23 (ඈ)]	**2,514,374**	3,208,101	**2,652,221**	3,344,002
නිල ලැයිස්තුගත නොවන හිමිකම් සුරැකුම්පත් [(සටහන 23 (ඉ)]	**255,574**	270,710	**300,215**	315,351
(අඩුකළා) : හානිකරණය	**–**	–	**(42,476)**	(42,476)
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ශුද්ධ මූල්‍ය වත්කම්	**15,271,822**	3,478,811	**16,059,841**	4,626,582

23. (අ) විශ්ලේෂණය →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට ශේෂය	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
සුරැකුම්කරණය මගින්				
සුරැකුම් ලෙස ගිවිසින ලද	**–**	–	**524,981**	582,476
තබා නොමැති	**15,271,822**	3,478,811	**15,534,860**	4,044,106
දළ එකතුව	**15,271,822**	3,478,811	**16,059,841**	4,626,582
ව්‍යවහාර මුදල් ඒකක අනුව				
ශ්‍රී ලංකා රුපියල්	**15,271,822**	3,478,811	**16,059,841**	4,626,582
ඇමෙරිකානු ඩොලර්	**–**	–	**–**	–
දළ එකතුව	**15,271,822**	3,478,811	**16,059,841**	4,626,582

23. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

23. (ආ) වර්ෂය තුළ හානිකරණ සංචලන

වර්ෂය තුළ හානිකරණ සංචලන වාර්තා නොවීය.

23. (ඇ) - ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත්

	2020 - බැංකුව			2019 - බැංකුව		
	මුහුණත අගය රු. '000	ආයෝජන පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000	මුහුණත අගය රු. '000	ආයෝජන පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් - භාණ්ඩාගාර බිල්පත්	**1,500,000**	**1,401,869**	**1,475,952**	–	–	–
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් - භාණ්ඩාගාර බැඳුම්කර	**10,450,000**	**10,852,162**	**11,025,922**	–	–	–
		12,254,031	**12,501,874**			

	2020 - සමූහය			2019 - සමූහය		
	මුහුණත අගය රු. '000	ආයෝජන පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000	මුහුණත අගය රු. '000	ආයෝජන පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් - භාණ්ඩාගාර බිල්පත්	**1,500,000**	**1,401,869**	**1,475,952**	–	–	–
ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත් - භාණ්ඩාගාර බැඳුම්කර	**11,016,666**	**11,482,250**	**11,673,930**	900,000	1,104,773	1,009,706
		12,884,119	**13,149,882**		1,104,773	1,009,706

23. (ඈ) නිල ලැයිස්තුගත ආයෝජන - හිමිකම් සුරැකුම්පත් - බැංකුව සහ සමූහය

	2020 - බැංකුව			2019 - බැංකුව		
	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000
හැටන් නැෂනල් බැංක් පීඑල්සී	**11,773,268**	**1,730,274**	**1,489,318**	11,515,728	1,689,969	1,983,008
ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී	**13,158,700**	**445,643**	**440,816**	13,158,700	445,643	419,763
පීපල්ස් ලීසිං කම්පනි පීඑල්සී	**47,116,037**	**830,177**	**584,239**	44,990,502	805,318	805,330
		3,006,094	**2,514,374**		2,940,930	3,208,101

23. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

23. (ඈ) නිල ලැයිස්තුගත ආයෝජන - හිමිකම් සුරැකුම්පත් - බැංකුව සහ සමූහය (සම්බන්ධයි)

	2020 - සමූහය			2019 - සමූහය		
	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය රු. '000
හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී	**11,773,268**	**1,730,274**	**1,489,318**	11,515,728	1,689,969	1,983,008
ශ්‍රී ලංකා ටෙලිකොම්	**13,158,700**	**445,643**	**440,816**	13,158,700	445,643	419,763
පීපල්ස් ලීසිං කම්පනි පීඑල්සී	**47,116,037**	**830,177**	**584,239**	44,990,502	805,318	805,330
ජාතික සංවර්ධන බැංකුව	**16,397**	**1,283**	**1,281**	15,634	971	1,563
කොමර්ෂල් බැංකුව	**216**	**10**	**17**	212	7	20
ලංකා ඔරික්ස් ලීසිං සමාගම	**200**	**1**	**27**	200	1	36
සම්පත් බැංකුව	**3,609**	**311**	**489**	3,609	83	586
වටවල ප්ලාන්ටේෂන් පීඑල්සී	**4,046**	**21**	**229**	4,046	20	105
ට්‍රාන්ස් ඒෂියා හොටෙල්ස් පීඑල්සී	**4,000**	**35**	**264**	4,000	35	279
ලංකා සෙරමික්ස් පීඑල්සී	**917**	**24**	**126**	917	24	127
ලංකා වෝල්ටයිල් පීඑල්සී	**117**	**2**	**17**	117	2	8
කැළණි වැලි ප්ලාන්ටේෂන් පීඑල්සී	**5,500**	**198**	**435**	5,500	198	490
හපුගස්තැන්න ප්ලාන්ටේෂන් පීඑල්සී	**100**	**3**	**2**	100	3	2
එයිට්කන් ස්පෙන්ස් පීඑල්සී	**18,000**	**160**	**1,040**	18,000	160	837
පැන්ඒෂියා බැන්ක් පීඑල්සී	**10,298,499**	**96,012**	**133,880**	10,298,499	96,012	131,821
හැටන් ප්ලාන්ටේෂන් පීඑල්සී	**4,000**	**30**	**40**	4,000	–	28
		3,104,184	**2,652,221**		3,038,446	3,344,002

23. (ඉ) නිල ලැයිස්තුගත නොවන ආයෝජන - හිමිකම් සුරැකුම්පත් →

	2020 - බැංකුව			2019 - බැංකුව		
	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය/පිරිවැය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය/පිරිවැය රු. '000
ආයෝජනය - ණය තොරතුරු කාර්යාංශය	**30,450**	**57,364**	**57,364**	30,450	57,364	57,364
ආයෝජනය - ඇසෝසියේටඩ් නිව්ස් පේපර්ස් සිලෝන් ලිමිටඩ්	**20,000**	**127**	**127**	20,000	127	127
ආයෝජනය - ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	**16,452,126**	**164,521**	**198,083**	16,452,126	164,521	213,219
(අඩුකළා) : හානිකරණය		**–**	**–**		–	–
		222,012	**255,574**		222,012	270,710

23. වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් (සම්බන්ධයි)

23. (ඉ) නිල ලැයිස්තුගත නොවන ආයෝජන - හිමිකම් සුරැකුම්පත (සම්බන්ධයි)

	2020 - සමූහය			2019 - සමූහය		
	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය/පිරිවැය රු. '000	කොටස් ගණන	පිරිවැය රු. '000	සාධාරණ අගය/පිරිවැය රු. '000
ආයෝජනය - ණය තොරතුරු කාර්යාංශය	**32,093**	**57,528**	**57,528**	32,093	57,528	57,528
ආයෝජනය - ඇසෝසියේටඩ් නිව්ස් පේපර්ස් සිලෝන් ලිමිටඩ්	**20,000**	**127**	**127**	20,000	127	127
ආයෝජනය - ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	**16,452,126**	**164,521**	**198,083**	16,452,126	164,521	213,219
ආයෝජනය - ශ්‍රී ලංකා මූල්‍ය සේවා කාර්යාංශය	**200,000**	**2,000**	**2,000**	200,000	2,000	2,000
ප්‍රමුඛ මර්චන්ට් කෝපරේෂන්	**500,000**	**5,000**	**5,000**	500,000	5,000	5,000
ප්‍රයිම් ඩිවෙලොප්මන්ට් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස්	**230,000**	**2,300**	**2,300**	230,000	2,300	2,300
ජනශක්ති ලයිෆ්	**2,500,000**	**25,000**	**25,000**	2,500,000	25,000	25,000
ජනශක්ති හෝල්ඩිංග්ස්	**1,000,000**	**10,000**	**10,000**	1,000,000	10,000	10,000
වණික් ඉන්කෝපරේෂන්	**17,000**	**176**	**176**	17,000	176	176
		266,652	**300,215**		266,652	315,351
(අඩුකළා) : හානිකරණය		**–**	**(42,476)**		–	(42,476)
		266,652	**257,739**		266,652	272,874

නිල ලැයිස්තුගත නොකළ විකිණීම සඳහා පවතින හිමිකම් කොටස් සියල්ල (ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හැරුණු විට) ඒවායේ සාධාරණ අගය පිළිගත හැකි පරිදි ඇස්තමේන්තු කළ නොහැකි නිසා, පිරිවැයට වාර්තා කර ඇත. මෙකී ආයෝජන සඳහා වෙළඳපලක් නොමැති අතර, ඒවා දීර්ඝ කාලීනව රඳවා ගැනීමට බැංකුව අපේක්ෂා කරයි. නිරීක්ෂණය කළහැකි දත්ත පදනම් කරගත් ඇගයීම් ආකෘතියක් යොදා ගනිමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කොටස් ආයෝජනයන්හි සාධාරණ අගය තීරණය කර ඇත.

24 පාලිත සමාගම්වල ආයෝජනයන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පාලිත සමාගම්වල ආයෝජන, හානිකරණය වෙනුවෙන් දීමනා අඩු කළ පසු පිරිවැයට ගණනය කර බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වේ. කිසියම් හානිකරණ ඇඟිවීමක් ඇත්දැයි තීරණය කිරීම පිණිස සෑම වාර්තාකරන දිනකදීම පාලිත සමාගම්වල ශුද්ධ වත්කම්, සමාලෝචනය කරනු ලබයි. කිසියම් හානිකරණයක් සිදුවී ඇති බවට ඇඟිවීමක් වේ නම්, ආයෝජනයේ යළි අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලබන අතර, ශුද්ධ වත්කම්වල අලාභයෙහි මට්ටමට හානිකරණ අලාභය හඳුනාගනු ලබයි.

දෙසැම්බර් 31 දිනට	2020 %	2019 %	2020 පිරිවැය රු. '000	2020 තක්සේරුව* රු. '000	2019 පිරිවැය රු. '000	2019 තක්සේරුව* රු. '000
නිල ලැයිස්තුගත නොවන හිමිකම් කොටස්						
එන්.එස්.බී.ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් (එකක් රු.10 බැගින්වූ සාමාන්‍ය කොටස් 170,000,000)	**100**	100	**1,700,000**	**3,833,071**	1,700,000	3,337,123
ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (සාමාන්‍ය කොටස් 8,204,464)	**100**	100	**3,111,000**	**6,529,849**	3,111,000	4,930,776
අඩුකළා : හානිකරණය [සටහන් 24. (ඇ)]			**–**	**–**	–	–
ශුද්ධ එකතුව			**4,811,000**	**10,362,920**	4,811,000	8,267,899

* පාලිත සමාගම්වල ආයෝජන පිළිබඳ තක්සේරුකරණය, ශුද්ධ වත්කම් මත 2020 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශ මත පදනම්ව සිදුකර ඇත.

24. පාලිත සමාගම්වල ආයෝජනයන් (සම්බන්ධයි)

24. (අ) පාලිත සමාගම් අත්පත් කර ගැනීම හා විකිණීම →

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ අනුමැතිය සහිතව 2019 ඔක්තෝබර් මස 11 වන දින රු.මි. 3111 ක මුදලක් ගෙවීමෙන් සී.ස. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ 100% හිමිකම් මුළුමනින්ම අයිතිමය හිමි පාලිත සමාගමක් ලෙසින් අත්පත් කර ගන්නා ලදී. 2020 වර්ෂය තුළ කිසිදු අත්පත් කර ගැනීමක් හෝ විකිණීමක් සිදුවී නොමැත. ආයෝජනයට ලක්වූ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් හා වගකීම්හි සාධාරණ අගය පහත දැක්වේ.

දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව රු. '000	2019 රු. '000
බැංකුවල ඇති තැන්පතු	5,693,179	5,693,179
ණය හා අත්තිකාරම්	2,205,551	2,205,551
ණය හා වෙනත් උපකරණ	716,931	716,931
වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම්	131,728	131,728
දේපල, පිරියත සහ උපකරණ	288,695	288,695
භාවිත කිරීමට අයිතිය ඇති වත්කම්	16,462	16,462
දේපල ආයෝජන	333,315	333,315
අස්පෘශ්‍ය වත්කම්	287	287
වෙනත් වත්කම්	65,625	65,625
තැන්පත්කරුවන්ට ගෙවියයුතු	(1,089,200)	(1,089,200)
වෙනත් ණය ගැනීම් සඳහා ගෙවියයුතු	(1,371,915)	(1,371,915)
කල්බදු වගකීම්	(15,772)	(15,772)
නිකුත් කළ ණය සුරැකුම්පත්	(264,130)	(264,130)
සේවාවසාන ප්‍රතිලාභ බැදීම්	(21,195)	(21,195)
ප්‍රවර්තන බදු වගකීම්	(418,858)	(418,858)
වෙනත් වගකීම්	(1,588,729)	(1,588,729)
හඳුනාගත හැකි ශුද්ධ වත්කම් හා වගකීම්	4,681,974	4,681,974
කේවල් කර මිලදී ගැනීමෙන් ලාභය (සටහන් අංක 09 යොමුවන්න)	1,649,490	1,649,490
	3,032,484	3,032,484

24. (ආ) ඉහත දෑ අඩංගු වනුයේ →

දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව රු. '000	2019 රු. '000
පාලිත සමාගම අත්පත් කර ගැනීමේදී මුදල් හා මුදල්වලට සමාන දෑ විශ්ලේෂණය		
මුදල් ප්‍රතිලාභ	3,111,000	3,111,000
අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල් (අත්පත් කරගත්)	(97,201)	(97,201)
බැංකුවට ගෙවියයුතු/අයිරා	18,685	18,685
	3,032,484	3,032,484

24. (ඇ) පොලී ආදායම හා අත්පත් කරගැනීමේ ලාභය →

2020 වර්ෂය තුළ කිසිදු අත්පත් කර ගැනීමක් හෝ විකිණීමක් සිදු කර නොමැත.

24. (ඈ) වර්ෂය තුළ හානිකරණ සංචලන →

2020 වර්ෂය තුළ හානිකරණ සංචලන වාර්තා නොවීය.

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්

25 ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනය

2020 දෙසැම්බර් 31 දිනට ආශ්‍රිත හා බද්ධ ව්‍යාපාරවල ආයෝජනයන් වාර්තා නොවීය.

26 දේපල, පිරියත සහ උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්ති

හඳුනාගැනීමේ පදනම

වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කළ හැකි නම් සහ වත්කම් හා සබැඳි අනාගත ප්‍රතිලාභ, සමූහය වෙත ගලා ඒමේ සම්භාවිතාවයන් ඇති විටක දේපල, පිරියත හා උපකරණ පොත්වල හඳුනාගනු ලබයි. වත්කම අත්පත් කර ගැනීමට සෘජුවම අදාළ වන පිරිවැයද ඇතුළත්ව දේපල, පිරියත හා උපකරණ මූලිකවම පිරිවැයට ගණනය කරනු ලබයි.

මිනීමේ පදනම

වත්කමක් ලෙස හඳුනා ගැනීමට සුදුසුකම් ලබන දේපල, පිරියත හා උපකරණ අයිතමයක් මුල් වරට එහි පිරිවැයට මනිනු ලබයි. පිරිවැය යන්නට වත්කම අත්පත් කර ගැනීම සඳහා සෘජුව අදාළ කලහැකි පිරිවැය සහ පසුකාලීන පිරිවැය ඇතුලත් වේ. තමන් විසින්ම ඉදිකල වත්කමක පිරිවැය යන්නට සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය සහ වත්කම කළමනාකාරීත්වය විසින් අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාකරවිය හැකි තත්ත්වයට ගෙන ඒමට සෘජුව අදාළ කලහැකි අනෙකුත් පිරිවැය මෙන්ම වත්කම ස්ථානගත කර ඇති වැඩ බිමෙන් ගලවා දැමීම, ඉවත් කිරීම සහ භූමිය ප්‍රතිසංස්කරණ කිරීම සඳහා වන පිරිවැයෙහි මුල් ඇස්තමේන්තුව සහ ප්‍රාග්ධනීත කරන ලද ණය ගැණුම් පිරිවැය ඇතුළත් වේ. පරිගණක උපකරණවල ක්‍රියාකාරීත්වයේ සංකලිත කොටසක් වන මිලදී ගත් පරිගණක මෘදුකාංග, පරිගණක උපකරණ යටතේ ප්‍රාග්ධනීත කරයි.

දේපල, පිරියත හා උපකරණ අයිතමයක කොටස් විවිධ වූ ඵලදායී ජීවකාල වලින් යුක්ත වන විට එම කොටස් වෙන් වෙන් වූ දේපල, පිරියත හා උපකරණ අයිතමයන් ලෙස හඳුනාගනු ලැබේ.

පිරිවැය ආකෘතිය

සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි හැරුණුවිට සෙසු දේපල, පිරියත හා උපකරණ සඳහා සමූහය විසින් පිරිවැය ආකෘතිය උපයෝගී කරගනු ලබන අතර, මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සහ ඒ සම්බන්ධ අමතර පිවැයද ඇතුලත්ව, සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකල පසු අගයට වර්තා කරනු ලබයි.

ප්‍රත්‍යාගණන ආකෘතිය

සමූහය විසින් සමස්ත සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි කාණ්ඩයටම ප්‍රත්‍යාගණන ආකෘති උපයෝගි කරගනු ලබයි. ප්‍රත්‍යාගණනය කරනු ලබන දිනට වත්කමෙහි සාධාරණ අගයෙන් පසුකාලීනව සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභයන් අඩුකල පසු අගය වන ප්‍රත්‍යාගණිත අගයට එම දේපල පවත්වාගෙන යනු ලබයි. වාර්තාකරන දිනට ඇති සාධාරණ අගය හා ධාරණ අගය අතර සැලකියයුතු වෙනසක් නොමැති බව සහතික කරනු වස් චක්‍රීය පදනම මත සමූහයෙහි සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සෑම තෙවසරකටම වරක් ප්‍රත්‍යාගණනය කරනු ලබයි. වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේදී ධාරණ අගයෙහි සිදුවන කිසියම් වැඩිවීමක් වෙනත් විස්තීර්ණ ආදායම් හි වාර්තා කරනු ලබන අතර, ප්‍රාග්ධන සංචිතය යටතේ හිමිකම්වලට එකතු කිරීම හෝ ආදායම් ප්‍රකාශයට සටහන් කරන ලද එම වත්කමට අදාළ පෙර ප්‍රත්‍යාගණිත අඩුවීමක් ප්‍රතිවර්තනය කිරීම සඳහා යොදාගනු ලබයි.

මෙබඳු වාතාවරණයක් යටතේ, ඇතිවන ඉහළයාම පෙර ලියා හැරීමේ අගය දක්වා ආදායමක් ලෙස වාර්තා කරනු ලබයි. ධාරණ අගයෙහි යම් අඩුවීමක් වේ නම්, එය ආදායම් ප්‍රකාශයෙහි වියදමක් ලෙස හඳුනා ගත යුතුය. කෙසේ වුවද එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි පවතින යම් බැර ශේෂයක් වේ නම් එම අගය තෙක් ප්‍රත්‍යාගණය අඩුවීමක් වෙනත් විස්තීර්ණ ආදායම් වෙත හර කරනු ලබයි. වෙනත් විස්තීර්ණ ආදායම් හි වාර්තා කරනු ලබන එම අඩුවීම මගින් ප්‍රත්‍යාගණන සංචිත යටතේ සමුච්චිත හිමිකම් වල අගය අඩුවෙයි. යම් වත්කමකට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි ඉතිරි වන යම් ශේෂයක් වේ නම්, එය විශ්‍රාම යාම මත හෝ එම වත්කම් ඉවත් කිරීම මත රඳවාගනු ලබන ඉපයීම් වෙත සෘජුවම මාරු කරනු ලබයි.

26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

හඳුනාගැනීම අත්හැරීම

විකුණා බැහැර කිරීමේදී හෝ එය පාවිච්චි කිරීමෙන් අනාගත ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විට දේපල, පිරියත හා උපකරණ පොත් වලින් ඉවත් කරනු ලැබේ. වත්කම් ඉවත් කිරීමේදී පැන නගින කිසියම් ලාභයක් හෝ අලාභයක් (වත්කමෙහි ධාරණ අගය සහ බැහැරලීමේ ශුද්ධ අගය අතර වෙනස ලෙස ගණනය කෙරෙයි) එම වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයෙහි ණිවෙනත් මෙහෙයුම් ආදායම්෴ යටතේ හඳුනාගනු ලබයි.

ප්‍රාග්ධනිත කල හැකි කෙරීගෙන යන වැඩ

ප්‍රාග්ධනීත කිරීමට අපේක්ෂා කරන, ගොඩනැගිලි ඉදිකිරීම්, ප්‍රධාන යන්ත්‍රෝපකරණ සහ පද්ධති වැඩි දියුණු කිරීම සඳහා දරණ ලද ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් මේ යටතට අයත් වේ. මේවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සමුච්චිත හානිකරණ අලාභ අඩු කරන ලද පිරිවැයට දක්වා ඇත. කළමනාකාරීත්වය විසින් අපේක්ෂිත ආකාරයට ක්‍රියා කල හැකි තත්ත්වයට සහ ස්ථානයට පත්වූ පසු එම ප්‍රාග්ධනිත කළ හැකි කෙරීගෙන යන වැඩ, අදාළ වත්කම වෙත මාරු කරනු ලැබේ.

ණය පිරිවැය

බැංකුව විසින් දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීමට අදාළ ප්‍රාග්ධනිත කළහැකි ණය පිරිවැය නොවිය.

කුලියට/බදු දීම සඳහා ගොඩනැගිලිවලට සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම්

2017.01.01 දින සිට කුලියට/බදු දීම සඳහා ගොඩනැගිලිවලට සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම් ප්‍රාග්ධනිත කිරීම සඳහා බැංකුව විසින් තීරණය කර ඇත. එදින සිට බලපැවැත්වෙන පරිදි බදු කාලසීමාව තුළදී එකී වැඩිදියුණු කිරීම් ක්‍රමක්ෂය කරනු ලැබේ.

ක්ෂයවීම්

දේපල පිරියත සහ උපකරණ පිරිවැය, ඒවායේ තක්සේරු කළ ඵලදායී ජීවකාලය තුළ අවශේෂ වටිනාකම දක්වා සරළ මාර්ග ක්‍රමය උපයෝගී කරගනිමින්, ක්ෂයවීම් ගණනය කර ලාභ/අලාභ යටතේ වාර්තා කරනු ලබයි. ඉඩම් වල ක්ෂයවීමක් නොසැලකෙයි. හඳුනාගනු ලැබූ වත්කම් කාණ්ඩවලට අදාළ ක්ෂයවීම් අනුපාතික පහතින් දක්වා ඇත.

වත්කම් වර්ගය	වාර්ෂික ක්ෂයවීම් අනුපාතිකය
කල්බදු දේපල, කුලියට/බදු දීම සඳහා සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම්	බදු කාලසීමාව තුළදී
සින්නක්කර ගොඩනැගිලි	වසර 20 - 40
කාර්යාල හා විවිධ උපකරණ සහ ලීබඩු හා සවිකිරීම්	වසර 5 - 10
මෝටර් වාහන	වසර 5
පරිගණක දෘඩාංග	වසර 4 - 5
පරිගණක මෘදුකාංග	වසර 4 - 5

සමූහය විසින් පරිහරණය කිරීමට හැකි දින සිට භාවිතයෙන් ඉවත් කරන දිනය දක්වා ක්ෂයවීම් ප්‍රතිපාදනය කරයි.

26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

26. (අ) දේපල, පිරියත සහ උපකරණ - බැංකුව - 2020 →

	ඉඩම් හා ගොඩනැගිලි රු. '000	බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි* රු. '000	පරිගණක දෘඩාංග රු. '000	කාර්යාලීය හා විවිධඋපකරණ, ලී බඩු හා සවිකිරීම්** රු. '000	මෝටර් රථවාහන රු. '000	කෙරීගෙන යන වැඩ-ගොඩනැගිලි රු. '000	එකතුව රු. '000
පිරිවැය/සාධාරණ අගය							
2020 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**10,672,859**	**703,401**	**2,994,552**	**2,237,731**	**459,285**	**408,370**	**17,476,198**
එකතු කිරීම්	**543,035**	**191,574**	**424,316**	**230,431**	**863**	**258,524**	**1,648,743**
ප්‍රත්‍යාගණන ලාභය/(අලාභ)	**1,468,754**	**–**	**–**	**–**	**–**	**–**	**1,468,754**
ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම්	**(188,845)**	**–**	**–**	**–**	**–**	**–**	**(188,845)**
ඉවත් කිරීම්	**(2,760)**	**–**	**(78,537)**	**(24,249)**	**(5,700)**	**–**	**(111,245)**
මාරු කිරීම්/ගැලපීම්	**(66,000)**	**(110,313)**	**(1,118)**	**(2,915)**	**–**	**(490,480)**	**(670,826)**
2020 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	**12,427,043**	**784,662**	**3,339,213**	**2,440,999**	**454,448**	**176,414**	**19,622,780**
අඩුකළා : සමුච්චිත ක්ෂයවීම්							
2020 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**114,505**	**135,408**	**2,058,621**	**1,268,960**	**334,128**	**–**	**3,911,621**
වර්ෂය තුල අයකිරීම්	**74,340**	**51,307**	**335,107**	**155,531**	**37,109**	**–**	**653,392**
ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්ෂයවීම් ගැලපීම්	**(188,845)**	**–**	**–**	**–**	**–**	**–**	**(188,845)**
ඉවත් කිරීම්	**–**	**–**	**(78,522)**	**(21,142)**	**(5,670)**	**–**	**(105,334)**
මාරු කිරීම්/ගැලපීම්	**–**	**–**	**–**	**946**	**–**	**–**	**946**
2020 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	**–**	**186,714**	**2,315,205**	**1,404,295**	**365,566**	**–**	**4,271,779**
අඩුකළා : හානිකරණය	**–**	**–**	**–**	**–**	**–**	**35,228**	**35,228**
2020 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	**12,427,043**	**597,947**	**1,024,008**	**1,036,704**	**88,882**	**141,186**	**15,315,772**

26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

26. (අ) දේපල, පිරියත සහ උපකරණ - බැංකුව - 2019 →

	ඉඩම් හා ගොඩනැගිලි රු. '000	බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි* රු. '000	පරිගණක දෘඩාංග රු. '000	කාර්යාලීය හා විවිධඋපකරණ, ලී බඩු හා සවිකිරීම්** රු. '000	මෝටර් රථවාහන රු. '000	කෙරීගෙන යන වැඩ-ගොඩනැගිලි රු. '000	එකතුව රු. '000
පිරිවැය/සාධාරණ අගය							
2020 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	10,234,299	634,944	2,618,916	1,960,815	365,656	508,847	16,323,477
එකතු කිරීම්	438,560	183,870	428,332	359,522	106,804	427,295	1,944,383
ඉවත් කිරීම්/මාරු කිරීම්	–	(115,413)	(52,696)	(82,606)	(13,175)	(527,772)	(791,662)
2019 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	10,672,859	703,401	2,994,552	2,237,731	459,285	408,370	17,476,198
අඩුකළා : සමුච්චිත ක්ෂයවීම්							
2019 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	52,203	96,077	1,835,348	1,138,244	311,926	–	3,433,797
වර්ෂය තුල අයකිරීම්	62,302	39,331	274,965	152,457	35,377	–	564,432
ඉවත් කිරීම්/මාරු කිරීම්	–	–	(51,692)	(21,741)	(13,175)	–	(86,608)
2019 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	114,505	135,408	2,058,621	1,268,960	334,128	–	3,911,621
අඩුකළා : හානිකරණය	–	–	–	–	–	–	–
2019 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	10,558,354	567,993	935,931	968,771	125,157	408,370	13,564,578

26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

26. (ආ) දේපල, පිරියත සහ උපකරණ - සමූහය - 2020 →

	ඉඩම් හා ගොඩනැගිලි රු. '000	බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි* රු. '000	පරිගණක දෘඩාංග රු. '000	කාර්යාලීය හා විවිධඋපකරණ, ලී බඩු හා සවිකිරීම්** රු. '000	මෝටර් රථවාහන රු. '000	කෙරීගෙන යන වැඩ-ගොඩනැගිලි රු. '000	එකතුව රු. '000
පිරිවැය/සාධාරණ අගය							
2020 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**10,959,379**	**703,401**	**3,041,507**	**2,293,586**	**503,525**	**408,370**	**17,909,769**
එකතු කිරීම්	**543,035**	**191,574**	**425,594**	**232,525**	**863**	**258,524**	**1,652,116**
ප්‍රත්‍යාගණන ලාභය/(අලාභ)	**1,907,860**	**–**	**–**	**–**	**–**	**–**	**1,907,860**
ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්‍ෂයවීම් ගැලපීම්	**(185,983)**	**–**	**–**	**–**	**–**	**–**	**(185,983)**
ඉවත් කිරීම්	**(2,760)**	**–**	**(78,537)**	**(24,249)**	**(5,700)**	**–**	**(111,245)**
ආයෝජන දේපළ මාරු කිරීම්	**144,924**	**5,076**	**–**	**–**	**–**	**–**	**150,000**
මාරු කිරීම්/ගැලපීම්	**(66,000)**	**(110,313)**	**(1,118)**	**(2,915)**	**–**	**(490,480)**	**(670,826)**
2020 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	**13,300,456**	**789,738**	**3,387,446**	**2,498,947**	**498,688**	**176,414**	**20,651,691**
අඩුකළා : සමුච්චිත ක්‍ෂයවීම්							
2019 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	**117,151**	**135,408**	**2,102,352**	**1,318,607**	**378,369**	**–**	**4,051,887**
වර්ෂය තුල අයකිරීම්	**74,556**	**51,307**	**336,850**	**157,289**	**37,109**	**–**	**657,110**
ප්‍රත්‍යාගණිත වත්කම් සඳහා ක්‍ෂයවීම් ගැලපීම්	**(185,983)**	**–**	**–**	**–**	**–**	**–**	**(185,983)**
ඉවත් කිරීම්	**–**	**–**	**(78,522)**	**(21,142)**	**(5,670)**	**–**	**(105,334)**
මාරු කිරීම්/ගැලපීම්	**–**	**–**	**–**	**946**	**–**	**–**	**946**
2020 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	**5,724**	**186,715**	**2,360,680**	**1,455,700**	**409,807**	**–**	**4,418,626**
අඩුකළා : හානිකරණය	**–**	**–**	**–**	**–**	**–**	**35,228**	**35,228**
2020 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	**13,294,731**	**603,023**	**1,026,766**	**1,043,247**	**88,881**	**141,186**	**16,197,837**

26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

26. (ආ) දේපල, පිරියත සහ උපකරණ - සමූහය - 2019 →

	ඉඩම් හා ගොඩනැගිලි රු. '000	බදු දේපල, කුලියට/බදු දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි* රු. '000	පරිගණක දෘඩාංග රු. '000	කාර්යාලීය හා විවිධඋපකරණ, ලී බඩු හා සවිකිරීම්** රු. '000	මෝටර් රථවාහන රු. '000	කෙරීගෙන යන වැඩ-ගොඩනැගිලි රු. '000	එකතුව රු. '000
පිරිවැය/සාධාරණ අගය							
2019 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	10,234,299	634,944	2,624,715	1,962,946	365,655	508,847	16,331,406
ව්‍යාපාරික ඒකාබද්ධකිරීම් හරහා අත්පත් කර ගැනීම්	286,520	–	40,325	51,582	44,241	–	422,668
එකතු කිරීම්	438,560	183,870	429,274	362,799	106,804	427,295	1,948,601
ඉවත් කිරීම්/මාරු කිරීම්	–	(115,413)	(52,808)	(83,741)	(13,175)	(527,772)	(792,908)
2019 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	10,959,379	703,401	3,041,507	2,293,586	503,525	408,370	17,909,768
අඩුකළා : සමුච්චිත ක්ෂයවීම්							
2019 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	52,203	96,077	1,839,213	1,139,554	311,926	–	3,438,973
ව්‍යාපාරික ඒකාබද්ධකිරීම් හරහා අත්පත් කර ගැනීම්	2,592	–	38,880	48,292	44,210	–	133,973
වර්ෂය තුල අයකිරීම්	62,356	39,331	276,063	153,339	35,409	–	566,498
ඉවත් කිරීම්/මාරු කිරීම්	–	–	(51,804)	(22,578)	(13,175)	–	(87,557)
2019 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	117,151	135,408	2,102,352	1,318,607	378,369	–	4,051,887
අඩුකළා : හානිකරණය	–	–	–	–	–	–	–
2019 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	**10,842,228**	**567,993**	**939,155**	**974,979**	**125,156**	**408,370**	**13,857,882**

* බදුකර දේපල, බදු/කුලියට දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි යටතට 2020.12.31 දිනට ඇතුළත් බදු/කුලියට දීම සඳහා වැඩිදියුණු කරන ලද ගොඩනැගිලි ආශ්‍රිත නොනිම් වැඩ අගය රුපියල් මිලියන 24.42 කි.

** කාර්යාලීය උපකරණ, ලී බඩු හා සවිකිරීම් සඳහා 2020.12.31 දිනට රුපියල් මිලියන 144.43 ක් අගයට සරිලන කාර්යල උපකරණ ආශ්‍රිත කෙරීගෙන යන වැඩ ද ඇතුළත්ය.

26. (ඇ) ප්‍රත්‍යාගණනය/සාධාරණ තක්සේරුව →

වෘත්තීමය වශයෙන් සුදුසුකම්ලත් ස්වාධීන තක්සේරුකරුවන් විසින් බැංකුවෙහි ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන ලදී. අතේ දුරින් සිදුවූ මෑත කාලීන වෙළඳපළ ගනුදෙනුවලදී හෝ සක්‍රීය වෙළඳපොලෙහි නිරීක්ෂණය කළ හැකි මිල සැලකිල්ලට ගනිමින් ප්‍රත්‍යාගණනය සිදු කරන ලදී. ඒ අනුව රුපියල් මිලියන 1,482.47 ක ප්‍රත්‍යාගණිත අතිරික්තයක් 2020 වසරේදී ප්‍රත්‍යාගණිත සංචිතයට බැර කරන ලදී. තනි වත්කම් පදනම මත කලින් හඳුනාගෙන ඇති ඉහත ප්‍රත්‍යාගණන සංචියට අදාළව රුපියල් මිලියන 13.72 ක හානිකරණයක් 2020 වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයට අයකර ඇත.

26. (ඈ) බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි →

2020.12.31 දිනට ඉඩම් හා ගොඩනැගිලි ශේෂයට රු.මි. 9,568.82 ක සින්නක්කර ඉඩම් අගයක් ඇතුළත්ය.

26. (ඉ) වගකීම් සඳහා ඇප ලෙස සහතික කරන ලද දේපල, පිරියත හා උපකරණ →

දේපල, පිරියත හා උපකරණ කිසිවක් වගකීම් සඳහා ඇප වශයෙන් තබා නොමැත.

26. දේපල, පිරියත සහ උපකරණ (සම්බන්ධයි)

26. (ඊ) සම්පූර්ණයෙන්ම ක්‍ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ →

වාර්තාකරණ දින දක්වා භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණවල (අස්පෘශ්‍ය වත්කම්/පරිගණක මෘදුකාංග ඇතුලුව) මූලික පිරිවැය පහත දක්වා ඇති පරිදි වේ.

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
පරිගණක දෘඩාංග	**1,483,960**	1,367,666	**1,524,045**	1,407,813
කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම්	**426,052**	368,154	**470,511**	403,394
අස්පෘශ්‍ය වත්කම්/පරිගණක මෘදුකාංග	**587,213**	472,864	**587,213**	474,834
විවිධ උපකරණ/මෝටර් රථවාහන සහ වෙනත් දෑ	**591,841**	526,666	**636,082**	571,821

27 භාවිතයට අයිතිය ඇති වත්කම් →

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමූහයේ භාවිතයට අයිතිය ඇති වත්කම් ප්‍රාග්ධනිත කල්බදු ගිවිසුමෙහි වටිනාකමින් සමන්විතය.

හඳුනාගැනීමේ පදනම

කල්බදු ආරම්භක දිනට (කල්බදු ගිවිසුමෙහි නිශ්චිතව දක්වා ඇති දින පරිදි) භාවිතයට අයිතිය ඇති වත්කම් එනම් කල්බදු කාලසීමාව තුළ සිදු කළයුතු කල්බදු ගෙවීම්වල වත්මන් අගය සමූහය විසින් හඳුනාගනු ලැබෙයි.

මැනීමේ පදනම

ඕනෑම සමුච්චිත ක්‍ෂයවීම් හා හානිකරණ පාඩු අඩුකර, කල්බදු වගකීම්වල කිසියම් ප්‍රතිමිනීම් සඳහා ගැලපීම් සිදුකර භාවිතයට අයිතිය ඇති වත්කම් පිරිවැයට මනිනු ලැබෙයි. හඳුනාගත් කල්බදු වගකීම්වල අගය හා ලද කල්බදු දීමනා අඩුකර, ආරම්භක දිනට හෝ ඊට පෙර සිදුකළ කල්බදු ගෙවීම්, භාවිතයට අයිතිය ඇති වත්කම්වලට ඇතුළත්ය.

ඵලදායී ජීවකාලය හා ක්‍රමක්‍ෂය වීම්

කල්බදු කාලසීමාව අවසානයේදී කල්බදු වත්කමෙහි හිමිකාරිත්වය ලබාගැනීමට පිළිගත හැකි සහතිකයක් බැංකුව සතුවේ නම්, හැර කල්බදු කාලසීමාව හා අපේක්ෂිත ඵලදායී ජීවකාලය යන්නෙන් කෙටි කාලසීමාව තුළ හඳුනාගත් පරිහරණය කිරීමේ අයිතිය හිමි වත්කම්, සරල රේඛීය පදනමක් මත ක්‍ෂය කරනු ලැබේ. භාවිතයට අයිතිය ඇති වත්කම්, හානිකරණයට බඳුන්වෙයි.

27. (අ) භාවිතයට අයිතිය ඇති වත්කම්හි ප්‍රාග්ධනිත අගය →

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
ආරම්භක ශේෂය	**1,312,091**	–	**1,378,340**	–
ව්‍යාපාරික ඒකාබද්ධකිරීම් හරහා අත්පත් කර ගැනීම්	**–**	–	**–**	22,647
එකතු කිරීම්	**434,079**	1,312,091	**434,079**	1,355,693
ගැලපීම්	**5,591**	–	**5,591**	–
අඩුකළා				
ඉවත්කිරීම්	**–**	–	**–**	–
අවසන්කිරීම්/මාරුකිරීම්	**–**	–	**–**	–
හානිකරණය	**–**	–	**–**	–
අවසාන ශේෂය	**1,751,761**	1,312,091	**1,818,010**	1,378,340

27. භාවිතයට අයිතිය ඇති වත්කම් (සම්බන්ධයි)

27. (ආ) භාවිතයට අයිතිය ඇති වත්කම්හි සමුච්චිත ක්ෂය →

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
ආරම්භක ශේෂය	**238,584**	–	**247,472**	–
ව්‍යාපාරික ඒකාබද්ධකිරීම් හරහා අත්පත් කර ගැනීම්	**–**	–	**–**	6,185
වර්ෂය සඳහා අයකිරීම්	**286,994**	238,584	**299,013**	241,287
ඉවත්කිරීම්	**–**	–	**–**	–
අවසන්කිරීම්/මාරුකිරීම්	**–**	–	**–**	–
අවසාන ශේෂය	**525,578**	238,584	**546,485**	247,472
දෙසැම්බර් 31 දිනට ධාරණ වටිනාකම	**1,226,183**	1,073,507	**1,271,525**	1,130,868

28 දේපළ ආයෝජන

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ඉපයීමට රඳවාගත් කුලී හෝ ප්‍රාග්ධන ඇගයීම් හෝ ගොඩනැගිල්ලක කොටසක් හෝ ද්විත්වයම දේපළ ආයෝජන ලෙස වර්ගීකරණය කෙරෙයි.

පිරිවැය ආකෘතිය

ගනුදෙනු පිරිවැය ඇතුළත්ව ගොඩනැගිලි ආයෝජන හැර දේපළ ආයෝජන (මූලිකව) පිරිවැයට (ල.ගි.ප්‍ර.40 - 56 වගන්තිය) මනිනු ලබයි. කළමනාකාරිත්වය විසින් දේපළ ආයෝජනවල සාධාරණ අගය වාර්ෂික පදනම මත මනිනු ලබන අතර එය මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ වෙනම දක්වනු ලබයි.

සාධාරණ වටිනාකම

යම් පසුකාලීන සමුච්චිත ක්ෂයවීම් හා පසුකාලීන සමුච්චිත හානිකරණ පාඩු අඩු කළ පසු ප්‍රත්‍යාගණිත දිනට සාධාරණ අගය වන හා ඒවායෙහි සාධාරණ වටිනාකම පිළිගත හැකි අයුරකින් මැනිය හැකි ඉඩම් ආයෝජන ලෙස හඳුනාගැනීමෙන් අනතුරුව ප්‍රත්‍යාගණිත අගයට සලකනු ලැබේ. සෑම වසර 3කට වරක්ම ධාරණ අගය, වාර්තාකරණ කාලසීමාව අවසානයේදී සාධාරණ වටිනාකම උපයෝගී කර ගනිමින් තීරණය කරගත හැකි, සැලකිය යුතු ලෙස නොවෙනස් වන බවට වගබලා ගනු පිණිස ප්‍රත්‍යාගණනය කෙරෙයි. කල්බදු සීමාව තුළ සරල රේඛීය පදනමක් මත ලැබිය හැකි කුලී පැතිරී පවතී. කල්බදු කාලසීමාව තුළදී දිරිමත් කිරීම්, කල්බදු ලබන්නෙකුහට ලබාදෙන අවස්ථාවකදී මෙම පදනම යටතේ කුලී ආදායම හඳුනාගැනීමේ ප්‍රතිඵල ලෙස දේපළ ආයෝජනවල ධාරණ අගයෙන් වෙන් වෙන් වත්කම් ලෙස වාර්තා කරනු ලබන අගයන් ඉවත් කෙරෙයි.

28. දේපළ ආයෝජන (සම්බන්ධයි)

28. (අ) දේපළ ආයෝජනවල සාධාරණ අගය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
ඉඩම්				
ආරම්භක ශේෂය	**–**	–	**316,095**	–
ව්‍යාපාරික ඒකාබද්ධකිරීම් හරහා අත්පත් කර ගැනීම්	**–**	–	**–**	316,095
එකතු කිරීම්	**–**	–	**–**	–
ප්‍රත්‍යාගණිත ලැබීම්	**–**	–	**56,714**	–
දේපළ, පිරියත හා උපකරණ වලින් මාරුකිරීම්	**–**	–	**–**	–
දේපළ, පිරියත හා උපකරණ වෙත මාරුකිරීම්	**–**	–	**(144,924)**	–
හානිකරණය	**–**	–	**–**	–
අවසාන ශේෂය	**–**	–	**227,885**	316,095
ගොඩනැගිලි				
ආරම්භක ශේෂය	**–**	–	**17,220**	–
ව්‍යාපාරික ඒකාබද්ධකිරීම් හරහා අත්පත් කර ගැනීම්	**–**	–	**–**	17,220
එකතු කිරීම්	**–**	–	**–**	–
ප්‍රත්‍යාගණිත ලැබීම්	**–**	–	**(2,952)**	–
දේපළ, පිරියත හා උපකරණ වලින් මාරුකිරීම්	**–**	–	**–**	–
දේපළ, පිරියත හා උපකරණ වෙත මාරුකිරීම්	**–**	–	**(5,076)**	–
හානිකරණය	**–**	–	**–**	–
අවසාන ශේෂය	**–**	–	**9,192**	17,220

28. (ආ) දේපළ ආයෝජනවල සමුච්චිත ක්ෂය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2020 රු. '000	2019 රු. '000	2020 රු. '000	2019 රු. '000
ආරම්භක ශේෂය	**–**	–	**–**	–
වර්ෂය සඳහා අයකිරීම්	**–**	–	**–**	–
දේපළ, පිරියත හා උපකරණ වලින් මාරුකිරීම්	**–**	–	**–**	–
දේපළ, පිරියත හා උපකරණ වෙත මාරුකිරීම්	**–**	–	**–**	–
අවසාන ශේෂය	**–**	–	**–**	–
දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය	**–**	–	**237,077**	333,315

දේපොළ ආයෝජනවල සාධාරණ අගයෙහි වැඩිවීම වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව, සෑම වසර 03 කට වරක් දේපළ ආයෝජන යළි මැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කෙරෙයි. එහෙයින් ල.ගි.ප්‍ර.40 අනුව දේපළ ආයෝජන, සාධාරණ අගයට මනිනු ලබන අතර, සෑම වසර 03 කට වරක්ම ප්‍රත්‍යාගණනය කෙරෙයි.

29 කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මිලදී ගත් පරිගණක මෘදුකාංගවල වටිනාකම සමූහයේ අස්පෘශ්‍ය වත්කම් ගණනයට ඇතුළත් වේ.

හඳුනාගැනීමේ පදනම

අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලබන්නේ, එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනීමට හැකි විට සහ ඊට අදාළව අනාගතයේදී අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒමේ හව්‍යතාවයක් ඇති විටදීය.

මැනීමේ පදනම

වෙන් වෙන්ව අත්පත් කර ගන්නා අස්පෘශ්‍ය වත්කම් මුල් වරට හඳුනා ගැනිමේදී අගය කරනු ලබන්නේ ඒවායේ පිරිවැයටයි. ව්‍යාපාර සංයෝජනයේදී අත්පත් කර ගත් අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය වනුයේ එසේ අත්පත් කර ගත් දිනට ඒවායේ සාධාරණ අගයයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත ප්‍රත්‍යාගණන හානිකරණ අලාභයක් අඩු කල පසු අගයට ඉදිරියට ගෙනයා යුතුයි.

ඵලදායී ජීවකාලය හා ක්‍රමක්ෂය වීම්

සමූහය අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ජීවකාලය සීමිත හෝ අසීමිත ද යන්න තක්සේරු කරනු ලබයි. සීමිත ජීව කාලයකින් යුත් අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ඵලදායී ජීව කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබයි. සීමිත ජීව කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක ක්‍රමක්ෂය කාලපරිච්ඡේදය සහ ක්‍රමක්ෂය, ක්‍රමය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතුවේ. වත්කම්වල අපේක්ෂිත ඵලදායී ජීව කාලයක් හෝ වත්කම් වල අන්තර්ගත අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පාරිභෝජන රටාවේ වෙනස්වීම් සඳහා ගිණුම් තබනු ලබන්නේ සුදුසු පරිදි ක්‍රමක්ෂය කාලසීමාව හෝ ක්‍රමක්ෂය ක්‍රමය වෙනස් කිරීමෙනි. මේවා ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් වශයෙන් සලකනු ලැබේ. සීමිත ජීව කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය වියදම ආදායම් ප්‍රකාශනයේ අදාල අස්පෘශ්‍ය වත්කම්වල කාර්යයට අනුරූප වියදම් කාණ්ඩය යටතේ හඳුනාගනු ලබයි.

හඳුනා ගැනීම අත්හැරීම

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගැනීම අත්හරිනු ලබන්නේ එය ඉවත් කිරීමකදී හෝ එය භාවිතා කිරීම මගින් අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ නොලැබෙන විටදීය. අස්පෘශ්‍ය වත්කම් ඉවත් කිරීමෙන් පැන නගින ලාභය හෝ අලාභය (ශුද්ධ විකුණුම් මිල සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරනු ලබන) වත්කම ඉවත් කළ වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගනු ලබයි.

අසීමිත ඵලදායී ජීවකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සමූහය සතුව නොපවතී. සමූහයේ පරිගණක මෘදුකාංගවල තක්සේරු කරන ලද ඵලදායී ජීවකාලය වසර 4 හෝ 5 කි. (වාර්ෂිකව 20% සිට 25% බැගින්)

කීර්තිනාමය

කීර්තිනාමය මූලිකව පිරිවැයට අගය කරනු ලබයි. හුවමාරු ගැණුම් ප්‍රතිෂ්ඨව, අත්පත් කරගැනීමට භාජනය වන්නාගේ පාලනයට යටත් නොවන හිමිකම් වටිනාකම සහ කලින් දරණ ලද ස්කන්ධ හිමිකමෙහි අත්පත් කරගන්නා දිනට සාධාරණ වටිනාකම යන සමාහාරයට අතිරික්තව ඇති අත්පත් කරගන්නා දිනට හඳුනාගතහැකි, අත්පත්කරගත් වත්කම් සහ පවරාගත් වගකීම්වල ශුද්ධ අගය කීර්තිනාමය ලෙස මූලිකව හඳුනාගැනේ.

මූලිකව හඳුනාගැනීමෙන් පසුව කීර්තිනාමය මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත හානිකරණ පාඩු අඩුකිරීමෙනි. පසුකාලී මිනුම්කරණයේදී කීර්තිනාමය අත්පත්කරගත් දිනට හඳුනාගත් පිරිවැයේ යම් සමුච්චිත හානිකරණ අලාභ ඇතොත් අඩුකර මිනුම්කරයි. හානිකරණ පරීක්ෂා කිරීමේ අරමුණු සඳහා ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගත් කීර්තිනාමය අත්පත් කරගත් දිනයේ සිට අත්කරගන්නාසේ වෙනත් වත්කම් හෝ වගකීම් මුදල් උත්පාදන එකකුවලට පවරා තිබේද යන්න නොසලකා සංයෝජනය නිසා අපේක්ෂිත ප්‍රතිලාභ ලබන සෑම මුදල් උත්පාදන ඒකක වලට කීර්තිනාමය බෙදාහැරිය යුතුය.

පරිගණක මෘදුකාංග

සමූහය මිලදීගත් පරිගණක මෘදුකාංග එහි පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත හානිකරණ අලාභයන් අඩුකිරීමෙන් පසු අගයට අගය කරනු ලබයි. අභ්‍යන්තර උත්පාදිත මෘදුකාංග සඳහා වන වියදම වත්කමක් ලෙස හඳනාගත හැක්කේ සමූහය විසින් එම මෘදුකාංගය අනාගත අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ලබාගත හැකි පරිද්දෙන් සම්පූර්ණ කර භාවිතයට ගැනීමේ අභිප්‍රාය සහ ශක්‍යතාවය තහවුරු කිරීම මත සහ අභ්‍යන්තර උත්පාදනය සම්පූර්ණ කිරීම සඳහා වැය වන පිරිවැය විශ්වසනීය ලෙස නිශ්චය කළහැකි නම් පමණි. අභ්‍යන්තර උත්පාදිත මෘදුකාංගවල ප්‍රාග්ධනීකරණය කරන ලද පිරිවැයට එම මෘදුකාංග උත්පාදනය කිරීම සඳහා ඍජුවම ආරෝපනය කළ හැකි සියලු වියදම් සහ ප්‍රාග්ධනීකරණයකළ ණය ගැනීමේ පිරිවැය ඇතුළත් වන අතර එම පිරිවැය එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවටම ක්‍රමක්ෂය කර ඇත. අභ්‍යන්තර උත්පාදිත මෘදුකාංගවල ප්‍රාග්ධනීකරණය කරන ලද පිරිවැය එහි සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසු වටිනාකමට දැක්වේ.

29. කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම් (සම්බන්ධයි)

පරිගණක මෘදුකාංග (සම්බන්ධයි)

පහත හෙළිදරව් කර ඇති මිලදී ගත් පරිගණක මෘදුකාංග හැර බැංකුවට සහ සමූහයට වෙනත් අස්පෘශ්‍ය වත්කම් නොමැත.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2020** **රු. '000**	2019 රු. '000	**2020** **රු. '000**	2019 රු. '000
පරිගණක මෘදුකාංග (සටහන් 29.1)	**652,850**	535,870	**659,049**	536,606
සංවර්ධනය කරමින් පවතින මෘදුකාංග (සටහන් 29.2)	**35,111**	63,006	**35,111**	63,006
එකතුව	**687,961**	598,876	**694,160**	599,612

29.1 පරිගණක මෘදුකාංග →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2020** **රු. '000**	2019 රු. '000	**2020** **රු. '000**	2019 රු. '000
පිරිවැය/තක්සේරුව				
ආරම්භක ශේෂය	**1,542,038**	1,310,520	**1,555,363**	1,312,890
ව්‍යාපාරික ඒකාබද්ධකිරීම් හරහා අත්පත් කර ගැනීම්	**–**	–	**–**	10,380
වර්ෂය තුළ එකතු කිරීම්	**417,097**	231,518	**423,146**	232,093
වර්ෂය තුළ ඉවත්කිරීම්	**–**	–	**–**	–
අවසාන ශේෂය	**1,959,135**	1,542,038	**1,978,509**	1,555,363
අඩුකළා : සමුච්චිත ක්‍රමක්ෂය				
ආරම්භක ශේෂය	**1,006,168**	766,251	**1,018,758**	768,355
ව්‍යාපාරික ඒකාබද්ධකිරීම් හරහා අත්පත් කර ගැනීම්	**–**	–	**–**	10,093
වර්ෂය සඳහා අයකිරීම්	**300,117**	239,917	**300,702**	240,310
ඉවත්කිරීම්	**–**	–	**–**	–
අවසාන ශේෂය	**1,306,285**	1,006,168	**1,319,460**	1,018,758
අඩුකළා : හානිකරණය	**–**	–	**–**	–
ශුද්ධ පොත් අගය	**652,850**	535,870	**659,049**	536,606

29.2 සංවර්ධනය කරමින් පවතින මෘදුකාංග →

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2020** **රු. '000**	2019 රු. '000	**2020** **රු. '000**	2019 රු. '000
පිරිවැය/තක්සේරුව				
ආරම්භක ශේෂය	**63,006**	31,806	**63,006**	31,806
ව්‍යාපාරික ඒකාබද්ධකිරීම් හරහා අත්පත් කර ගැනීම්	**–**	–	**–**	–
වර්ෂය තුළ එකතු කිරීම්	**93,304**	31,200	**93,304**	31,200
වර්ෂය තුළ ඉවත්කිරීම්	**–**	–	**–**	–
මාරුකිරීම්/ගැලපීම්	**(121,199)**	–	**(121,199)**	–
අවසාන ශේෂය	**35,111**	63,006	**35,111**	63,006

30 විලම්බිත බදු වත්කම්/වගකීම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

හිලව් කිරීමට කිසිදු නීතිමය බලාත්මක අයිතියක් නොපවතින බැවින් සමූහයේ එක් ආයතනයක විලම්බිත බදු (වත්කම්)/වගකීම් තවත් ආයතනයක විලම්බිත බදු වගකීම්/(වත්කම්) හා හිලව් කළ නොහැක. විලම්බිත බදු සඳහා අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය පිළිබඳ විස්තර පිටු අංක 171 හි 13 වන සටහනෙහි දක්වා ඇත.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කර ඇති විලම්බිත බදු සහ ආදායම් බදු වියදමට වාර්තා වී ඇති වෙනස්කම් පහත වගුවෙන් දැක්වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2020 රු. '000**	2019 රු. '000	**2020 රු. '000**	2019 රු. '000
වත්කම් යටතේ හඳුනාගත් [30.(අ)]	**(1,446,249)**	–	**(1,446,249)**	(338)
වගකීම් යටතේ හඳුනාගත් [30.(ආ)]	**–**	482,241	**1,121**	483,005
ශුද්ධ විලම්බිත බදු (වත්කම්)/වගකීම් [30.(ඇ) සහ (ඈ)]	**(1,446,249)**	482,241	**(1,445,128)**	482,668

30. (අ) විලම්බිත බදු වත්කම්

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2020 රු. '000**	2019 රු. '000	**2020 රු. '000**	2019 රු. '000
ආරම්භක ශේෂය	**(482,241)**	–	**(481,903)**	73
විලම්බිත බදු වගකීම් වෙත මාරු කිරීම්	–	–	**(338)**	–
වර්ෂය සඳහා හඳුනාගත් ගෙවීම්				
– ආදායම් ප්‍රකාශය [සටහන් 13 (ආ)]	**480,978**	–	**480,978**	265
– වෙනත් විස්තීර්ණ ආදායම් ශේෂය	**1,447,512**	–	**1,447,512**	–
අවසාන ශේෂය	**1,446,249**	–	**1,446,249**	338

30. (ආ) විලම්බිත බදු වගකීම්

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	**2020 රු. '000**	2019 රු. '000	**2020 රු. '000**	2019 රු. '000
ආරම්භක ශේෂය	**–**	1,135,612	**764**	1,135,878
විලම්බිත බදු වත්කම් වෙත මාරු කිරීම්	**–**	–	**(338)**	–
වර්ෂය සඳහා හඳුනාගත් ගෙවීම්				
